තෝරාගත් කෘති 11 වැනි වෙළුමෙහි ලෙනින්ගේ
පහත දැක්වෙන කෘති හා වෙනත් කෘතිද පළ වේ:

තරුණ සංගම්වලට භාර කර්තව්‍යයන්

ද්‍රව්‍ය බද්ද

තැටි ගත කරන ලද කථා

ලෙනින්

✻

තෝරාගත් කෘති

10

ලෙනින්

තෝරාගත් කෘති

වෙළුම් දෙළහ

✻

වෙළුම

10

රාජ්‍යය

නිර්ධන පන්ති ආඥාදායකත්වය සමයේදී ආර්ථිකය
හා දේශපාලනය

''වාමාංශික කොමියුනිස්ට්වාදය'' — ළදරු
වලිප්පුවකි

ප්‍රගති ප්‍රකාශක මන්දිරය

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

LIBERATIONBASE

සූචිකරණ දත්ත

කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 10
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 288
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 10
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 288
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

ලෙනින්

තෝරාගත් කෘති
වෙළුම් දෙළහ

*

වෙළුම
10

මොස්කව්
ප්‍රගති ප්‍රකාශක මන්දිරය

පටුන

රාජ්‍යය 7
කොල්චාක් පරදවා ජයග්‍රහණය ලැබීම සම්බන්ධයෙන් කම්කරුවන්ට හා ගොවිජනතාවට ලිපියක් 28
පෙත්‍රොග්‍රාද් කම්කරුවන්ගේ ආදර්ශය 38
මොස්කව් නගරයේ පක්ෂ සතිය සහ අපගේ කර්තව්‍යයන් . . . 41
නිර්ධන පන්ති ආඥාදායකත්වය සමයේදී ආර්ථිකය හා දේශපාලනය 46
පෙරදිග ජනතාවන්ගේ කොමියුනිස්ට් සංවිධානවල දෙවැනි සමස්ත රුසියා සම්මේලනයට කළ කතාව. 1919 නොවැම්බර් 22 58
රු. කො. (බො.) ප. අටවැනි සමස්ත රුසියා සාකච්ඡා සභාව. 1919 නොවැම්බර් 2–4. විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ කෙටුම්පත් යෝජනාව 71
කෘෂිකාර්මික කොමියුනවල හා කෘෂිකාර්මික ආටලවල ප්‍රථම සම්මේලනයට කළ කතාව. 1919 දෙසැම්බර් 4. 73
දෙනිකින් පරදවා ලැබූ ජයග්‍රහණ නිමිත්තෙන් උක්‍රේනියාවේ කම්කරුවන් හා ගොවි ජනයා වෙත යැවූ ලිපිය 84
යුනිවර්සල් සර්විස් ප්‍රවෘත්ති සේවයේ බර්ලින් වාර්තාකරු කාල් විගන්ද් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු 92
ද වර්ල්ඩ් නැමති ඇමෙරිකානු ප්‍රවෘත්ති පත්‍රයේ වාර්තාකරු ලින්කන් අයර් සමග කළ පුවත් පත් සාකච්ඡාව 96
- මිතුරු බලවත්තු වෙස් ක්‍රීඩාවෙහි යෙදෙති 96
- එක්සත් ජනපදය සමාජවාදීන්ට පීඩා කරයි 98
- රුසියාවේ ආධාරය යුරෝපයට අවශ්‍යය 99
- අභ්‍යන්තර තත්වය බලාපොරොත්තු සහගතය 101
- සමාජවාදී නායකයන් ගැන කරන ලද දැඩි විවේචනය . . . 102

https://liberationbase.wordpress.com

රු. කො. (බො.) ප. නවවැනි සම්මේලනය. 1920 මාර්තු 29 — අප්‍රේල් 5 104
මධ්‍යම කාරක සභාවේ වාර්තාව. මාර්තු 29 104
පැරණි සමාජ ක්‍රමය වැනසීමේ සිට නව සමාජ ක්‍රමය නිර්මාණය කිරීම දක්වා 127
වාමාංශික කොමියුනිස්ට් වාදය — ළදරු වලිප්පුවකි 130
I රුසියානු විප්ලවයේ ජාත්‍යන්තර වැදගත්කම ගැන අපට කථා කළ හැක්කේ කුමණ අර්ථයක් අනුවද? . . . 130
II බොල්ෂෙවික්වරුන්ගේ ජයග්‍රහණයට හේතු වූ වැදගත් කොන්දේසියක් 133
III බොල්ෂෙවික්වාදයේ ඉතිහාසයේ ප්‍රධාන අවධි . . . 136
IV බොල්ෂෙවික්වාය වර්ධනදය වී, ශක්තිමත් වී, පන්නරය ලැබීමට උපකාරී වූයේ කම්කරු පන්ති ව්‍යාපාරය තුළ සිටින කුමණ සතුරන්ට විරුද්ධව අරගල කිරීමද? . . . 142
V ජර්මනියේ "වාමාංශික" කොමියුනිස්ට්වාදය. නායකයෝ, පක්ෂය, පංතිය, පොදු ජනතාව 151
VI විප්ලවවාදීන් ප්‍රතිගාමී වෘත්තීය සමිති තුළ වැඩ කළ යුතුද? 160
VII ධනපති පාර්ලිමේන්තුවට අප සහභාගි විය යුතුද? . . 170
VIII සම්මුති එපා? 182
IX මහා බ්‍රිතාන්‍යයේ "වාමාංශික කොමියුනිස්ට්වාදය" . . 195
X නිගමන කීපයක් 210
අතිරේකය 227
I ජර්මන් කොමියුනිස්ට්වරුන් අතර භේදය 227
II ජර්මනියේ කොමියුනිස්ට්වරුන් සහ ස්වාධීනයන් . . 229
III ඉතාලියේ තුරාටි සහ පිරිස 232
IV නිවැරදි තර්ක මූලයන්ගෙන් බැස ගන්නා වැරදි නිගමන 234
V 239
වයින්කොප්ගේ ලිපිය 240
සංස්කාරකගේ සටහන් 241
නාමාවලිය 267

https://liberationbase.wordpress.com

අපට හැකි වනු ඇත. කථා හා දේශනවලට කන් දීමට අමතරව මාක්ස්ගේ හා එංගල්ස්ගේ කෘති අතුරෙන් යටත් පිරිසෙයින් ඉතාමත් වැදගත් ඒවා ස්වල්පයක් හෝ කියවීමටද ඔබ කාලය මිඩංගු කරනු ඇතැයි මම තවදුරටත් බලාපොරොත්තු වෙමි. සෝවියට් සහ පක්ෂ පාසලේ ශිෂ්‍යයන් සඳහා වූ ඔබගේ පුස්තකාලයෙන් ලබා ගත හැකි පොත් සහ අත්පොත් අතර මෙම ඉතාමත් වැදගත් කෘති ඇතැයි යනු මම නිසැකව විශ්වාස කරමි. නැවතත්, විවරණය වටහා ගැනීමේ අපහසුතාවයන් නිසා ඔබ මුල් වරම එයින් විමතියට පත් නොවිය යුතු බව කියන්නෙමි. මුල් වර කියවීමේදී පැහැදිලි නොවන දෙය දෙවැනි වර කියවන විට පැහැදිලි වනු ඇත. එසේ නැතහොත් පසුව තරමක් වෙනස් පැත්තකින් ප්‍රශ්නය වෙත සමීප වන කල ඔබට එය වැටහෙනු ඇත. මෙම ප්‍රශ්නය ඉතාමත් සංකීර්ණ නිසා සහ ධනපති උගතුන් හා ලේඛකයන් එය බොහෝ සේ ව්‍යාකූල කර තිබෙන නිසා, එය ගැන බරපතල ලෙස අධ්‍යයනය කිරීමට හා ස්වාධීනව එය අවබෝධ කර ගැනීමට අපේක්ෂා කරන අයෙක්, එය ගැන පැහැදිලි සහ හොඳ වැටහීමක් ලබා ගනු සඳහා ප්‍රශ්නයට කීප වරක්ම පහර දිය යුතු බවත්, නැවත නැවතත් එය වෙත හැරෙමින් විවිධ පැතිවලින් එය සලකා බැලිය යුතු බවත්, මම නැවතත් කියමි. එය සියලුම දේශපාලනයට පදනම් වන මූලික ප්‍රශ්නයක් වන නිසා සහ වර්තමානය වැනි කුණාටු සහිත හා විප්ලවීය කාලවලදී පමණක් නොව ඉතාමත් සාමකාමී කාලවලදී පවා, ඕනෑම ආර්ථික හා දේශපාලන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඕනෑම ප්‍රවෘත්ති පත්‍රයකින් සෑම දිනකදීම ඔබට හමුවනු ඇති ප්‍රශ්නයක් වන නිසා, එය වෙත ආපසු හැරී ඒම වඩාත් පහසු වේ. සෑම දිනකම එක හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් ඔබ මෙම ප්‍රශ්නය වෙත ආපසු එනු ඇත: රාජ්‍යය යනු කුමක්ද? එහි ඇති වැදගත් කම කුමක්ද? අපගේ පක්ෂය, එනම්, ධනපති ක්‍රමය පෙරළා දැමීමට සටන් කරන පක්ෂය වන කොමියුනිස්ට් පක්ෂය එය කෙරෙහි දක්වන ආකල්පය කුමක්ද? රාජ්‍යය කෙරෙහි එය දක්වන ආකල්පය කුමක්ද? ඒ හා සම්බන්ධයෙන් ප්‍රධාන වන දෙය මෙයයි. ඉතාමත් විවිධාකාර අවස්ථාවලදී, ඉතාමත් අවශේෂ ප්‍රශ්නවලට අදාළව, ඉතාමත් අනපේක්ෂිත කරුණුවලට අදාළව සහ ප්‍රතිපාක්ෂිකයන් සමග කරන සාකච්ඡාවලදී හා විවාදවලදී ඔබට මෙම ප්‍රශ්නය හමු වනු ඇති නිසා, ඔබ ඒ ගැන කියවන දෙයින් සහ අසන කථා හා දේශන වලින්, එය වෙත ස්වාධීන ලෙස සමීප වීමේ හැකියාවක් ඔබ ඇති කරගත යුතුය. ඔබගේ අවබෝධය ස්ථිර එකකැයිද, ඕනෑම කෙනෙකුට විරුද්ධව ඕනෑම අවස්ථාවක සාර්ථක ලෙස එය ආරක්ෂා කිරීමෙහි යෙදීමට ඔබට හැකි වනු ඇතැයිද, ඔබට සිතා ගත හැක්කේ .මෙම ප්‍රශ්නය හා සම්බන්ධයෙන් ස්වාධීන ලෙස ඔබගේ මග සොයා ගැනීමට ඔබ උගෙන ගත් පසු පමණකි.

මෙම සංක්ෂිප්ත අදහස් කීපය ඔබ හමුවේ තැබීමෙන් පසුව ප්‍රධාන ප්‍රශ්නය ගැන කරුණු ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. රාජ්‍යය යනු කුමක්ද? එය උද්ගත වූයේ කෙසේද? ධනපති ක්‍රමය සම්පූර්ණයෙන්ම පෙරළා දැමීමට සටන් කරන කම්කරු පංතියේ පක්ෂය වන කොමියුනිස්ට් පක්ෂය රාජ්‍යය කෙරෙහි දැක්විය යුතු ආකල්පය මූලික වශයෙන් කුමක් විය යුතුද?

රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය තරම්, ධනපති විද්‍යාව, දර්ශනය, නීති විද්‍යාව, දේශපාලන අර්ථ ශාස්ත්‍රය හා පුවත් පත් කලාව විසින් සිතාමතාම සහ නොදැනුවත්වද ව්‍යාකූල කරන ලද වෙනත් ප්‍රශ්නයක් ඔබට සොයා ගත නොහැකි වනු ඇතැයි මම මුලින් කීවෙමි. අද දක්වාම බොහෝ විට එය ආගම් ප්‍රශ්න සමග පටලවනු ලැබේ. ආගමික ධර්ම අදහන අය (ඔවුන් එසේ කිරීම බලාපොරොත්තුවිය හැකිය) පමණක් නොව, තමන් ආගමික දූර්මතවලින් නිදහස් යයි සිතන අය පවා, රාජ්‍යය දේවත්වයට අයත් දෙයකැයිද, අද්භූත දෙයකැයිද, එය මනුෂ්‍ය අර්ථයට අයත් නැති හා මිනිසාට පිටස්තරින් දෙන ලද කිසියම් දෙයක් ජනතාවට ප්‍රදානය කරන, නැතහොත්, ප්‍රදානය කිරීමට තිබෙන එසේත් නැතහොත්, ගෙන එන දේව සම්භවයක් ඇති බලවේගයකැයිද, එය මිනිස් වර්ගයාගේ පැවැත්මට හේතුභූත වූ කිසියම් බලවේගයකැයිද, කියන ධර්මයක් බිහි කිරීමට උත්සාහ කරමින් රාජ්‍යය හා සම්බන්ධ නිශ්චිත ප්‍රශ්නය ව්‍යාකූල කරති. ඔවුන් බිහි කිරීමට උත්සාහ කරන එම ධර්මය බොහෝවිට දෘෂ්ටිමය, දර්ශනික ප්‍රවේශයක් සහ තර්ක සහිත සංකීර්ණ එකකි. මෙම ධර්මය සූරාකන පංතිවල, ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ උවමනාවන් සමග ඉතාමත් තදින් බැඳී තිබෙන බවත්, එය ඔවුන්ගේ උවමනාවන් ඉටු කිරීමට කැපවී තිබෙන බවත් කිව යුතුය. ධනපති ක්‍රමය නියෝජනය කරන මහත්වරුන්ගේ සිරිත්, අදහස් සහ විද්‍යාව මෙම ධර්මය සිය ලහම පාරගමනය කොට ඇත. එනිසා එම ධර්මයේ සටහන් ලකුණු ඔබට සෑම අතින්ම මුණ ගැසෙනු ඇත. රාජ්‍යය ගැන තමන්ට බුද්ධිමත් දෘෂ්ටියක් අනුව සැලකිය හැකි යයි මෙන්ෂෙවික්වරුන් සහ එස්ආර් වරුන් විශ්වාස කරතත් හා ඔවුන් ආගමික දූර්මතවල බලපෑමට හසුව ඇතැයි යන අදහස ඔවුන් කෝපයෙන් ඉවත ලතත්, ඔවුන් පවා රාජ්‍යය සම්බන්ධයෙන් දරන අදහසෙහිදීද, ඔබට එම ධර්මයේ සටහන් ලකුණු හමුවන්නේය. මෙම ප්‍රශ්නය අන් කවර ප්‍රශ්නයකටත් වඩා පාලක පංතිවල උවමනාවන් කෙරෙහි බලපාන නිසා (ඒ අතින් එය දෙවැනි වන්නේ අර්ථික විද්‍යාවේ අත්තිවාරම්වලට පමණකි) එය ව්‍යාකූල කර සහ සංකීර්ණ කර තිබේ. සමාජ වරප්‍රසාදයන් තිබීම,සූරාකෑම පැවතීම සහ ධනපති ක්‍රමයේ පැවැත්ම යුක්ති යුක්ත බවක් පෙන්වීම සඳහා රාජ්‍යය පිළිබඳ ධර්මය ප්‍රයෝජනවත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වන්නේය. මෙම ප්‍රශ්නයෙහි දී අපක්ෂපාතිත්වය අපේක්ෂාකිරීමත්, තමන් විද්‍යාත්මක යයි කියා ගන්නා අය මෙම විෂය ගැන පිරිසිදු විද්‍යාත්මක අදහසක් ඔබට ප්‍රකාශ කිරීමෙහි සමත් වෙතැයි සිතීමත්, බලවත් වරදක් වන්නේ එබැවිනි. රාජ්‍යය ගැන, රාජ්‍යය පිළිබඳ ධර්මය ගැන, රාජ්‍යය පිළිබඳ න්‍යායය ගැන වූ මෙ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔබට වඩාත් හොඳ අවබෝධයක් ලැබුණු පසු හා ඔබ ඒ ගැන වඩාත් ගැඹුරට අධ්‍යයනය කළ පසු, විවිධ පංති අතර කෙරෙන අරගලය ඔබට නිතරම එතුළින් පෙනෙනු ඇත. එම අරගලය පිළිබිඹු වන්නේ, නැතහොත්, ප්‍රකාශ වන්නේ රාජ්‍යය පිළිබඳ අදහස් මුල්කොට ගෙන, රාජ්‍යයේ කාර්ය කොටස සහ එහි වැදගත්කම ගැන කරන තක්සේරුව මූල්කොටගෙන සිදුවන ඝට්ටනයෙනි.

හැකිතාක් දුරට විද්‍යාත්මක ලෙස මෙම ප්‍රශ්නය වෙත ළඟාවනු පිණිස, රාජ්‍යයේ ඉතිහාසය, එහි උද්ගමනය හා සංවර්ධනය ගැන යටත් පිරිසෙයින් ඉක්මන් බැල්මක් හෝ හෙළිය යුතුය. සමාජ විද්‍යා ප්‍රශ්නයකදී ඉතාමත් විශ්වාසදයක දෙයද, මෙම ප්‍රශ්නය වෙත නිවැරදි ලෙස සමීප වීමේ සහ විස්තර කරුණු රාශියක් අතර, නැතහොත්, ඝට්ටනය වන මතවල අති බහුලත්වය නිසා මංමුළා නොවීමේ, පුරුද්ද ඇති කර ගනු පිණිස ඉතාමත් අවශ්‍ය දෙයද වන්නේත්, අයෙක් මෙම ප්‍රශ්නය වෙත විද්‍යාත්මක ලෙස ළඟා වීමට නම් ඉතාමත් වැදගත් වන්නේත්, පතුලෙහි ඇති ඓතිහාසික සම්බන්ධය අමතක නොකිරීමය; නියමිත ප්‍රපංචයක් ඉතිහාසයේදී උද්ගත වූයේ කෙසේද, එහි සංවර්ධන අවධි මොනවාද යන ස්ථාවරයෙන් සැම ප්‍රශ්නයක්ම පරීක්ෂා කිරීම හා අද එය ගෙන තිබෙන ස්වරූපය එහි සංවර්ධනයේ ස්ථාවරයෙන් පරීක්ෂා කිරීමය.

මෙම ප්‍රශ්නය අධ්‍යයනය කරන විට ඔබ එංගල්ස්ගේ “පවුල, පෞද්ගලික දේපළ සහ රාජ්‍යය ඇති වූ සැටි” යන කෘතිය කියවා වටහා ගනු ඇතැයි මම අපේක්ෂා කරමි. මෙය නවීන සමාජවාදයේ මූලික කෘතීන්ගෙන් එකකි. එහි සැම වගන්තියක්ම ඓතිහාසික හා දේශපාලන කරුණු සම්භාරයක් මත පදනම් වී ඇතැයිද, නොසැලකිල්ලෙන් නොකියන ලදැයිද යන විශ්වාසයෙන් යුතුව පිළිගත හැකිව තිබේ. මෙම කෘතියෙහි සැම කොටසක්ම සමාන සේ සරල හා සුබෝධ ආකාරයෙන් විස්තර කර නැතැයි යන්න ගැන සැකයක් නැත. පාඨකයාට ඉතිහාසය සහ ආර්ථික විද්‍යාව ගැන එක්තරා දැනුමක් ඇතැයි එම කොටස් සමහරකින් අපේක්ෂා කෙරේ. නමුත් මෙම කෘතිය කියවූ විට ඔබට එක්වරම එය නොවැටහේ නම්, ඒ ගැන කැලඹිල්ලට පත් නොවන ලෙස මම නැවතත් ඔබට මතක් කරමි. එය එක්වරම වටහා ගත හැක්කේ ඉතා ස්වල්ප දෙනෙකුට පමණකි. නමුත් ඔබගේ උනන්දුව කිතිකැවුනු පසු, නැවතත් ඒ වෙත යොමුවුනු

කල, එම මුළු කෘතියම නොවේ නම්, ඉන් වැඩි කොටසක් ඔබට වටහා ගනු හැකි වනු ඇත. මා මෙම කෘතිය ගැන සඳහන් කරන්නේ, එය, ඉහත සඳහන් අර්ථයෙන් ප්‍රශ්නය වෙත නිවැරදි සමීප වීමක් පෙන්නුම් කරන හෙයිනි. එය ආරම්භ වන්නේ රාජ්‍යය ඇති වූ සැටි ගැන ඉදිරිපත් කෙරෙන කෙටි ඓතිහාසීය විස්තරයකිනි.

අන් සැම ප්‍රශ්නයකදී මෙන්ම — නිදසුන් ලෙසට ධනපති ක්‍රමයේ, මිනිසා විසින් මිනිසා සූරා කැමේ ආරම්භයත්, සමාජවාදය, එය උද්ගත වූ ආකාරය හා එය උද්ගත වීමට හේතුභූත වූ කොන්දේසිත්, පිළිබඳ ප්‍රශ්නවලදී මෙන්ම — මෙම ප්‍රශ්නයට ද බුද්ධිමත් ලෙස හා විශ්වාසයෙන් යුතුව සමීප වීමට අපට හැකි වන්නේ එහි සමස්ත සංවර්ධනයේ ඉතිහාසය දෙස ආපසු හැරී බලන්නෙමු නම් පමණකි. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් වූ කල රාජ්‍යය සැමද පැවති දෙයක් නොවන බව සටහන් කරගත යුත්තේය. රාජ්‍යය නොපැවති කාලයක් විය. සමාජ පංතිවලට බෙදීම දක්නට ලැබෙන සැම තැනෙකම, සූරාකන්නන් හා සූරාකනු ලබන්නන් දක්නට ලැබෙන සැම තැනෙකම, එය දක්නට ලැබේ.

මිනිසා විසින් මිනිසා සූරාකනු ලැබීමේ ප්‍රථම ආකෘතිය මතුවීමට පෙර, පංති බෙදීමේ ප්‍රථම ආකෘතිවලට — වහල් හිමියන් හා වහලුන් ඇති වීමට — පෙර පීතෘ මූලික පවුල, නැතහොත්, එය සමහර විට හඳුන්වන ලෙසට, වංශ පවුල පැවැත්තේය. (වංශය — ගෝත්‍රය; එකල එක පරපුරේ ජනයා එකට විසූහ.) මෙම ආදිකල්පික කාලවලට අදාළ වූ බොහෝ දුරට පැහැදිලි සටහන් ආදිකල්පික ජනතාවන්ගේ ජීවිතයෙහි රැඳී ඉතිරි විය. එනිසා ඔබ ආදිකල්පික ශිෂ්ටාචාරය ගැන ඕනෑම කෘතියක් ගන්නේ නම්, සමාජය වහල් හිමියන් හා වහලුන් ලෙසට බෙදී නොපැවැති, අඩු වැඩි වශයෙන් ආදිකල්පික කොමියුනිස්ට් ක්‍රමයට සමවන කාලයක් තිබුණු බව කියන, අඩුවැඩි වශයෙන් පැහැදිලි විස්තර, සලකුණු හා මතක සටහන් නොවරදවාම ඔබට හමු වනු ඇත. එම කාලවලදී රාජ්‍යයක් නොතිබිණි. ක්‍රමානුකූල ලෙස බලහත්කාරය යෙදීම සහ ජනතාව බලහත්කාරයෙන් යටහත් කිරීම සඳහා විශේෂ යන්ත්‍රයක් එකල නොතිබුණි. රාජ්‍යය යනුවෙන් හඳුන්වනු ලබන්නේ එවැනි යන්ත්‍රයකි.

මිනිසුන් ම්ලේච්ඡත්වයට සමවූ — වර්තමාන ශිෂ්ටාචාර මිනිස් සමාජයෙන් අවුරුදු දහස් ගණනකට ඉහත යුගයක — තවමත් සංවර්ධනයේ ඉතාමත් පහළම අවධිවල වූ කුඩා පවුල් කණ්ඩායම් වශයෙන් වෙසෙමින් සිටි ආදිකල්පික සමාජය වන විට, රාජ්‍යයක පැවැත්ම සහවන සලකුණු තවමත් ඇති වී තිබුණේ නැත. චාරිත්‍රයේ බලවත් කම, වංශයේ වැඩිහිටියන් සතුව තිබුණු අධිකාරය, ගෞරවය සහ බලය අපට දක්නට ලැබේ. සමහර විට මෙම බලය ස්ත්‍රීන්ට දෙන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලද බව අපට දක්නට ලැබේ. එකල ස්ත්‍රීන්ගේ තත්වය අද මෙන් පෑගීමට පත් සහ පීඩිත තත්වයක් නොවීය. නමුත්, පාලනය කිරීම සඳහා වෙන් වී සිටින්නාවූද, පාලනය සලකා හා ඒ උදෙසා තමන්ගේ පරිහරණය සඳහා කිසියම් බලකිරීමේ යන්ත්‍රයක්, නැතහොත්, වර්තමානයේ ඔබ කවුරුත් දන්නා ලෙසට ආයුධ සන්නද්ධ හමුද සේනාංකවලින්, සිරගෙවලින් හා අන්‍යයන්ගේ කැමැත්ත බලහත්කාරය යොද යටපත් කරන වෙනත් අවයව වලින් සෑදුනු රාජ්‍යයේ ප්‍රධාන කොටස්වලින් නියෝජනය වන වැනි ප්‍රචණ්ඩත්වයේ යන්ත්‍රයක් ක්‍රමානුකූල ලෙස හා ස්ථාවර ලෙස පවත්වා ගන්නාවූද, විශේෂ ජන කොට්ඨාශයක් අපට කොතැනකවත් දක්නට නොලැබේ.

ආගමික උගැන්වීම් ලෙසට හැඳින්වෙන දෙයින්ද, ධනපති උගතුන් විසින් ඉදිරිපත් කරනු ලබන සියුම් නිර්වචනයන්, දර්ශනවාදී තර්ක හා විවිධ මත මතාන්තර කෙරෙන්ද, අපි බැහැර වන්නෙමු නම්, අපි මේවායින් ඉවත්ව කාරණයෙහි නියම හරය වෙත ළඟා වීමට උත්සාහ කරන්නෙමු නම්, රාජ්‍යය යනු ඇත්ත වශයෙන්ම සමස්තමය සමාජයෙන් පරිබාහිරව පවතින එවැනි පාලන යන්ත්‍රයක් වන බව අපට පෙනෙනු ඇත. හුදෙක්ම ආණ්ඩු කිරීම පිණිස වෙන්වුනු සහ පාලනය කිරීම සඳහා අන්‍යයන්ගේ කැමැත්ත බලහත්කාරයෙන් යටපත් කිරීමට විශේෂ බලකිරීමේ යන්ත්‍රයක්, එනම්, සිරගෙවල්, විශේෂ බල පිරිස්, යුද්ධ හමුද ආදිය පිළිබඳ අවශ්‍යතාවය ඇති, එවැනි විශේෂ මිනිසුන් කණ්ඩායමක් දක්නට ලැබෙන කල — එවිට රාජ්‍යය දක්නා ලැබේ.

නමුත් රාජ්‍යයක් නොපැවති කාලයක් තිබුණේය. එකල පොදු බැඳීම් හා මුළු ප්‍රජාවත්, විනය හා වැඩ කටයුතුවල ක්‍රමවත් කමත්, පවත්වා ගන්නා ලද්දේ සිරිතෙහි හා සම්ප්‍රදයයෙහි බලයද, වංශයේ වැඩිහිටියන්, නැතහොත්, ස්ත්‍රීන් — එකල ස්ත්‍රීන් පුරුෂයන් සමග සමාන තත්වයන් ගත් අවස්ථා බොහෝ වූවා පමණක් නොව, ස්ත්‍රීන් පුරුෂයන්ට වඩා උසස් තත්වයන් ගත් අවස්ථාද දුලබ නොවීය — සතුව තිබූ අධිකාරය, නැතහොත්, ගරුත්වය ද මගිනි. සමාජය පංතිවලට බෙදීමක්, එනම්, එක් කොටසක් අන්‍යයන්ගේ ශ්‍රමය අත්පත් කර ගැනීමේ ස්ථිර හැකියාවක් ලබන පරිදි, සමහරු අන්‍යයන් සූරාකෑමෙහි යෙදෙන පරිදි, ජනතාව කණ්ඩායම්වලට බෙදීමක් දක්නා ලද සෑම විටෙකම සහ සෑම තැනෙකම, ජනතාවට බලකිරීම සඳහා වූ විශේෂ යන්ත්‍රයක් ලෙසින් රාජ්‍යය උද්ගත විය.

තවද, සමාජය මෙසේ පංතිවලට බෙදීම ඉතිහාසයේ මූලික සත්‍යයක් ලෙසට නිතරම පැහැදිලි ලෙස සිත්හි දරාගත යුතු වේ. සියලුම රටවල සියලුම මිනිස් සමාජවල අවුරුදු දහස් ගණනක සංවර්ධනය පොදු වශයෙන්

නියාම අනුකූල බවක්, ක්‍රමානුකූල බවක් හා සසංගත බවක් පෙන්නුම් කරයි.ඒ අනුව ප්‍රථමයෙන්ම අපට දක්නට ලැබුණේ පංති රහිත සමාජයකි— ප්‍රාථමික, පීතෘ මූලික ආදිකල්පික සමාජයය. එහි ප්‍රභූ වරුන් සිටියේ නැත. ඊ ළඟට වහල් ක්‍රමය මත පදනම් වූ සමාජයක් අපට දක්නට ලැබුණි. එය වහල් හිමි සමාජයක් විය. මුළු මහත් ශිෂ්ටාචාර යුරෝපයම මෙම අවධිය ගත කළේය. අවුරුදු දෙදහසකට පෙර වහල් ක්‍රමය ඉතාමත් ප්‍රබලව පැවැත්තේය. ලෝකයේ අන් කොටස්වල ජනතාවන්ගෙන් අති බහුතරයද මෙම අවධිය ගෙවා ඇත. දියුණුවෙන් අඩු ජනතාවන් අතර වහල් ක්‍රමයේ සටහන් අද දක්වාම ඉතිරිවී ඇත්තේය. නිදසුනක් ලෙසට, වර්තමාන අප්‍රිකාවේ වහල් ආයතනය පවතින බව ඔබට දක්ක හැකිය. වහල් හිමියන් සහ වහලුන් වශයෙන් බෙදීම ප්‍රථම වැදගත් පංති බෙදීම විය. මෙයින් මුලින් සඳහන් කණ්ඩායමට සියලුම නිෂ්පාදන මාර්ග — ඉඩම් සහ එකල ඉතාමත් නොදියුණු හා ආදිකල්පික තත්වයෙන් වූව පැවති උපකරණ — පමණක් නොව ජනයාද අයත් විය. මෙම කණ්ඩායම වහල්හිමියන් වශයෙන් හැඳින්විනි. ඒ අතර ශ්‍රමකාරී වූ සහ අන්‍යයන් සඳහා ශ්‍රමය සැපයූ අය වහලුන් ලෙසට හැඳින්විනි.

ඉතිහාසයේ මෙම ආකෘතියට අනතුරුව තවත් ආකෘතියක්, එනම් වැඩවසම් ක්‍රමය ඇතිවිය. රටවල් බොහොමයකම වැඩවසම් ක්‍රමය සංවර්ධනය වීමෙහි දී එය ප්‍රවේණි දස ක්‍රමය ලෙසට පරිණාම විය. එවිට සමාජය මූලික වශයෙන් බෙදුනේ වැඩවසම් අධිපතියන් සහ ගොවි ප්‍රවේණි දසයන් යනුවෙනි. ජනතාව අතර සම්බන්ධකම් පිළිබඳ ආකෘතිය වෙනස් වූනේය. වහල් හිමියෝ වහලුන් තමන්ගේ දේපළක් සේ සැලකූහ. නීතිය විසින් මෙම අදහස ස්ථිර කරන ලද අතර, වහලා වහල් හිමියාට සම්පූර්ණ වශයෙන් අයත් භාණ්ඩයක් ලෙසට සලකන ලදී. ගොවි ප්‍රවේණි දසයා හා සම්බන්ධයෙන් වූ කල, පංති පීඩනය සහ යටහත් බව ඔහු කෙරෙහි රැඳී පැවති නමුත්, වැඩවසම් අධිපතියන්ගේ භාණ්ඩ මෙන් ගොවි ජනයා ඔවුන්ට අයත් සේ නොසලකන ලදී. වැඩවසම් අධිපතියාට තිබුණේ ගොවි ජනයාගේ ශ්‍රමය ලබාගැනීම සඳහා නැතහොත්, ඔවුන් ලවා කිසියම් සේවාවන් අනිවාර්ය ලෙස කරවා ගැනීම සඳහා අයිතිය ය. ව්‍යවහාරික වශයෙන් ගත් කල, ඔබ දන්නා පරිදි වැඩවසම් ක්‍රමය වැඩිම කාලයක් ආරක්ෂා වී පැවතුනු සහ ඉතාමත් ගොරහැඩි ආකෘති ගත් රුසියාවේ එය, වහල් ක්‍රමයට වඩා කිසිසේත් වෙනස් නොවීය. වෙළෙඳ භාණ්ඩ, වෙළෙඳ භාණ්ඩ හුවමාරුව සහ මුදලේ බලය වර්ධනය වීම හේතු කොට ගෙන ප්‍රාග්ධනයෙහි බලය උපත ලැබුවේය. දහඅටවැනි ශත වර්ෂය තුළ, නැතහොත්, දහ අටවැනි ශත වර්ෂයේ අග භාගයේ පටන් හා දහනව වැනි ශත වර්ෂය තුළ ලෝකය මුළුල්ලේම විප්ලව ඇති විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බටහිර රටවල් සියල්ලෙහිම වැඩ වසම් ක්‍රමය අහෝසි කරන ලදී. මෙය සිදුවූ අවසාන රට රුසියාව විය. 1861 වර්ෂයේදී රුසියාවේද මූලික වෙනසක් සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එක සමාජ ක්‍රමයක් වෙනුවට තවත් එකක් ආදේශ විය. වැඩවසම් ක්‍රමය වෙනුවට ධනපති ක්‍රමය ආදේශ විය. ධනපති ක්‍රමය යටතේද පංති බෙදීමත්, එමෙන්ම, ප්‍රවේණි දාස ක්‍රමයේ විවිධ ලක්ෂණ සහ නෂ්ටාවශේෂයනුත් රැඳී පැවැත්තේය. නමුත් පංති බෙදීම මූලික වශයෙන් වෙනස් ආකෘතියක් ගත්තේය.

ධනපති රටවල් සියල්ලෙහිම ප්‍රාග්ධනය හිමියෝ, එනම් ඉඩම් හිමියෝ සහ පැක්ටරි හිමියෝ, ජනගහනයෙන් ඉතා කුඩා අල්පතරයක් වූහ. දැනුදු එසේම ය. ඔවුහු මුළු ජනතාවගේම ශ්‍රමය හැසිරවීමේ සම්පූර්ණ බලතල ඇතිව සිටිති. ඒ අනුව ඔවුහු ශ්‍රමකරුවන් මුළු සමස්තයම හසුරුවති, පීඩනයට පත් කරති සහ සූරාකති. ඒ අතර එම ශ්‍රමකරුවන්ගෙන් බහුතරය, නිෂ්පාදන ක්‍රියාදාමයේදී තමන්ගේ කම්කරු අත්, එනම් ස්වකීය ශ්‍රම ශක්තිය විකිණීමෙන් පමණක් ජීවනෝපාය ලබා ගන්නා නිර්ධනයෝ, වේතන කම්කරුවෝ වෙති. ධනපති ක්‍රමයට සංක්‍රමනය වීමත් සමග, වැඩවසම් කාලවලදී පැගීමට පත් ගොවි ජනයාගෙන් කොටසක් (වැඩි පිරිස) නිර්ධනයන් බවට හා කොටසක් (අඩු පිරිස) තමන්ම ශ්‍රමකරුවන් කුලියට ගන්නා සහ ගම්බද ධනපති පංතියක් වන පොහොසත් ගොවීන් බවට පරිවර්තනය විය.

මෙම මූලික කරුණ ගැන, එනම්, සමාජය ආදිකල්පික වහල් ආකෘතිවල සිට ප්‍රවේණිදාස ක්‍රමයට සහ අවසානයේ ධනපති ක්‍රමයට සංක්‍රමනය වීම ගැන, ඔබ නිතරම මතක තබා ගත යුතුය. එසේ කියන්නේ, සියලුම දේශපාලන ධර්මයන් නිසි ලෙස අගය කිරීමට හා ඒවායින් කියන දේ වටහා ගැනීමට හැකි වන්නේ මෙම මූලික කරුණ මතක තබා ගැනීමෙන්, පමණක්ද, එම ධර්මයන් මෙම සිද්ධි මාලාව සමග ගලපා පරීක්ෂා කිරීමෙන් පමණක්ද, වන හෙයිනි. මිනිස් වර්ගයාගේ ඉතිහාසයේ වහල් හිමි, වැඩවසම් හා ධනපති යන මෙම මහා කාලපරිච්ඡේද හැම එකක්ම ශත වර්ෂ දුසිම් ගණන් හා සිය ගණන් වසා පැතිරී ගිය අතර, දේශපාලන ආකෘති මහා රාශියක් හා ඉතාමත් විවිධාකාර දේශපාලන ධර්මයන්, මති මතාන්තර හා විප්ලවද ඉදිරිපත් කර ඇත. ඒවායේ (විශේෂයෙන්ම ධනපති උගතුන්ගේ හා දේශපාලනඥයන්ගේ දේශපාලන, දර්ශනික හා වෙනත් ධර්මයන් සම්බන්ධයෙන් වූ) ප්‍රභේද බහුලත්වය හා විවිධත්වය කොතරම්ද යත්, ඒවා ගැන වටහා ගත හැකි වන්නේ, සමාජයේ මෙම පංති බෙදීම සහ පංති පාලනයේ ආකෘති වෙනස් වීම මග පෙන්වීමට එලූ නූලක් මෙන් තරයේ ගැනීමෙන්ද ආර්ථික, දේශපාලන,

අධ්‍යාත්මික, ආගමික යනාදී සියලුම සමාජ ප්‍රශ්න එම ස්ථාවරය අනුව පරීක්ෂා කිරීමෙන්ද, පමණකි.

මෙම මූලික බෙදීම පිළිබඳ ස්ථාවරය අනුව ඔබ රාජ්‍යය ගැන විමසා බලන්නෙහි නම්, මා දැනටමත් කියා ඇති පරිදි, සමාජය පංතිවලට බෙදීමට පෙර රාජ්‍යය නොපැවැති බව ඔබට පෙනෙනු ඇත. නමුත්, සමාජයේ පංති බෙදූම උද්ගත වී තදින් තහවුරු වීම සමග, පංති සමාජය උද්ගත වීම සමග, රාජ්‍යයද උද්ගත වී තදින් තහවුරු විය. වහල් ක්‍රමය, වැඩවසම් ක්‍රමය හා ධනපති ක්‍රමය පසු කර ගිය, නැතහොත්, තවමත් පසුකර යමින් සිටින රටවල් දුසිම් ගණන් සහ සියගණන් ගැන ඉතිහාසය දන්නේය. මෙම රටවල් සෑම එකකම ඇති වූ අති දැවැන්ත ඓතිහාසික වෙනස්වීම්ද, මිනිස් වර්ගයාගේ මෙම සංවර්ධනය නිසා, වහල් ක්‍රමයේ සිට, වැඩවසම් ක්‍රමය ඔස්සේ ධනපති ක්‍රමය කරා සහ ධනපති ක්‍රමයට විරුද්ධව කෙරෙන වර්තමාන ලෝක ව්‍යාප්ත අරගලය කරා සංක්‍රමනය වීම නිසා, ඇතිවූ දේශපාලන විපර්යාසයන් සියල්ලම හා විප්ලව සියල්ලමද, එසේ තිබියදී, රාජ්‍යය මතු වී ඒම ඔබට දැකගත හැකි වනු ඇත. සෑම විටම එය සමාජයෙන් බාහිරව පවතින කිසියම් අවයවයක් වූ අතර, එය තනිකරම, නැතහොත්, තනිකරම පාහේ, එසේත් නැතහොත්, ප්‍රධාන වශයෙන් පාලනය කිරීමෙහි නියැලි ජන කණ්ඩායමකින් සමන්විත විය. මෙම යන්ත්‍රය, මෙම කණ්ඩායම, නිතරම බලකිරීමේ, එනම්, ශාරීරික හිංසනයේ මාධ්‍යයන් සතුව සිටින්නේ වෙයි. ජනතාව කෙරෙහි පාන මෙම හිංසනය ප්‍රකාශිත වන්නේ ආදිකල්පික මුගුරෙන්ද වහල් යුගයේ වඩා හොඳින් තනාගත් ආයුධ වර්ගවලින්ද, මධ්‍යකාලීන සමයේ මතුවූ තුවක්කුවලින්ද, එසේ නැතහොත්, අවසාන වශයෙන්, විසිවැනි ශත වර්ෂයේ කාර්මික ශිල්පීය විස්මයන් වන හා සම්පූර්ණයෙන්ම නවීන කාර්මික ශිල්පයේ ජයග්‍රහණයන් මත පදනම්ව තිබෙන නවීන ආයුධවලින්ද, වීම නිසා මෙහිලා විශේෂත්වයක් ඇති නොකරයි. හිංසනයේ විධි ක්‍රම වෙනස් විය. නමුත් රාජ්‍යයක් පැවති සෑම විටෙකම, සෑම සමාජයකම, පාලනය කරන පුද්ගලයන් කණ්ඩායමක් විය. ඔවුහු විධාන කළහ. අධිපතිකම් කළහ. ඔවුහු ඔවුන්ගේ බලය පවත්වා ගැනීම පිණිස ශාරීරික බලකිරීමේ යන්ත්‍රයක්, හිංසනයේ යන්ත්‍රයක් හිමි කරගෙන සිටියහ. එම හිංසනයේ යන්ත්‍රය අදාළ යුගයේ තාක්ෂණික මට්ටමට ගැලපෙන ආයුධවලින් යුක්ත එකක් විය. රාජ්‍යයේ ස්වභාවය සහ වැදගත්කම කුමක්ද යන ප්‍රශ්නයට පිළිතුරක් සොයා ගැනීමට අපට හැකි වන්නේ මෙම පොදු ප්‍රපංචයන් පරීක්ෂා කිරීමෙන්ද, පංති නොමැති කල, සූරාකන්නන් හා සූරාකනු ලබන්නන් නොමැති කල, රාජ්‍යයක් නොපැවැතියේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මන්දයි හා පංති මතුවන විට එය මතුවූයේ මන්දයි අපගෙන් අසා ගැනීමෙන්ද, පමණකි — මේ මාර්ගයෙන් පමණකි.

රාජ්‍යය යනු එක් පංතියක් අභිභවා වෙනත් පංතියක පාලනය පවත්වා ගැනීම පිණිස වන යන්ත්‍රයකි. සමාජයේ පංති නැතිව තිබුණු කල, වහල් යුගයට පෙර, වඩාත් සමාන ආදිකල්පික කොන්දේසි යටතේ ජනතාව වැඩ කළ කල, ශ්‍රම ඵලදායකත්වය ඉතාමත් පහත් මට්ටමේ පැවති කල හා ඉතාමත් අසංස්කෘත හා ඉතාමත් ආදිකල්පික පැවැත්ම සඳහා වුව අවශ්‍ය දෑ ලබාගැනීම ආදිකල්පික මිනිසාට අපහසුව තිබූ කල, අන් අය පාලනය කිරීම හා ඔවුන්ට අධිපතිකම් කිරීම ස්වකීය කාර්ය කොටගත් විශේෂ පුද්ගල කණ්ඩායමක් මතු වී තිබුණේ නැත. මතුවිය හැකිව තිබුණේ නැත. රාජ්‍යය උද්ගත වීම අවශ්‍ය වූයේ, සමාජය පංතිලවට බෙදීමේ ප්‍රථම ආකෘති මතු වූ කල පමණකි — වහල් ක්‍රමය මතුවූ කල, ඉතාමත් ප්‍රාථමික ගොවිතැන් ආකෘති වෙත සංකේන්ද්‍රණය වීමෙන් කිසියම් ජන පංතියකට එක්තරා අතිරික්තයක් නිපදවා ගත හැකි වූ කල, මෙම අතිරික්තය වහලාගේ ඉතාමත් දීන පැවැත්ම සඳහා නැතිවම බැරි නොවූ සහ වහල් හිමියා අතට පත්වූ කල, මේ ආකාරයෙන් වහල් හිමියන්ගේ මෙමෙ පංතියේ පැවැත්ම සුරක්ෂිත වූ කල පමණකි. වහල් හිමි පංතිය තහවුරු වීම පිණිස රාජ්‍යය උද්ගත වීම අවශ්‍ය විය.

ඒ අනුව එය, එනම්, වහල් හිමි රාජ්‍යය ඇති විය. එය, වහලුන් යටත් කොට වහල් හිමියන්ට බලය හා පාලනය කිරීමේ හැකියාව දුන් යන්ත්‍රයක් විය. එකල සමාජය සහ රාජ්‍යය යන දෙකම පැවතියේ ඒවා අද පවතිනවාට වඩා බොහෝ කුඩා පරිමාණයකිනි. එකල සමාජය හා රාජ්‍යය සතුව තිබුණු ගමනාගමන හා පණිවුඩ හුවමාරු මාධ්‍යයන් මෙතෙකැයි කිව නොහැකි තරම් අයහපත් විය. වර්තමානයේ තිබෙන එම මාධ්‍යයන් එකල පැවතියේ නැත. කඳු, ගංගා සහ මුහුදු අදට වඩා අතිශයින් දුෂ්කර බාධක විය. එනිසා අදට වඩා බොහෝ පටු භූමිශාස්ත්‍රීය සීමාවන් තුළ රාජ්‍යය හැඩ ගැසුනේය. තාක්ෂණික වශයෙන් දුර්වල රාජ්‍ය යන්ත්‍රයක්, සාපේක්ෂ වශයෙන් පටු දේශ සීමා තුළ කොටු වූ සහ පටු ක්‍රියාකාරිත්ව ක්ෂේත්‍රයක් සහිත වූ රාජ්‍යයකට සේවය කළේය. එය එසේ වුවත්, වහල් ක්‍රමය යටතේ සිටින සේ වහලුන්ට බල කළ සහ සමාජයේ එක් කොටසක් එහි තවත් කොටසක පීඩනයට යටත් කළ යන්ත්‍රයක් එහි පැවැත්තේය. බලකිරීමේ ස්ථිර යන්ත්‍රයක් නොමැතිව, සමාජයෙන් වැඩි කොටසක් එහි අනිත් කොටස සඳහා වැඩ කරන සේ එම වැඩි කොටසට බල කිරීම කිසිසේත් කළ නොහැකිය. පංති නොමැති වූ තාක් කල් මෙමෙ ස්වභාවයේ යන්ත්‍රයක්ද නොවීය. පංති ඇතිවූ කල, ඒ සෑම විටම හා සෑම තැනම, බෙදීම වර්ධනය වී තහවුරු වීමත් සමග, විශේෂ ආයතනයක්, එනම් රාජ්‍යයද, ඇති විය.

රාජ්‍ය ආකෘති ඉතාමත් විවිධාකාර විය. වහල් යුගය තරම් ඈත කාලයක, එකල තත්ත්වයන් අනුව වඩාත් දියුණු, සංස්කෘතික හා ශිෂ්ටාචාර වූ, නිදසුන් ලෙසට පුරාණ ග්‍රීසිය සහ රෝමය වැනි, සම්පූර්ණයෙන්ම වහල් ක්‍රමය මත පදනම් වූ රටවල, විවිධාකාර රාජ්‍ය ආකෘති පැවති බව අපට දැක්ක හැකිය. ඒ කාලය වන විටම, රාජාණ්ඩුව සහ සමූහාණ්ඩුව අතරත්, ප්‍රභූ තන්ත්‍රය හා ප්‍රජාතන්ත්‍රය අතරත් වෙනසක් තිබුණි. රාජාණ්ඩුව යනු තනි පුද්ගලයෙකුගේ බලය ය. සමූහාණ්ඩුව යනු තෝරා පත් නොකළ කිසිම අධිකාරියක් නොතිබීමය. ප්‍රභූතන්ත්‍රය යනු සාපේක්ෂ වශයෙන් කුඩා අල්පතරයක බලයය. ප්‍රජාතන්ත්‍රය යනු ජනතාවගේ බලය ය (ග්‍රීක භාෂාවේ democracy යන්නෙහි පදගත අර්ථය, ජනතාවගේ බලය වේ). මේ සියලුම වෙනස් කම් උද්ගත වූයේ වහල් ක්‍රමයේ යුගයෙහිය. මෙම වෙනස්කම් එසේ තිබියදී, වහල් හිමි ජනයාගේ රාජ්‍යය රාජාණ්ඩුවක්ද, නැතහොත්, සමූහාණ්ඩුවක්ද, රදළ තන්ත්‍රයක්ද, නැතහොත්, ප්‍රජාතන්ත්‍රයක්ද යන්න නොතකාම, එය වහල් හිමි රාජ්‍යයක් විය.

පුරාණ කාලයේ ඉතිහාසය ගැන උගන්වන සෑම පාඨමාලාවකදීම, මෙම විෂය ගැන කරන ඕනෑම දේශනයකදීම, රාජාණ්ඩු සහ සමූහාණ්ඩු රාජ්‍යයන් අතර කෙරුනු අරගලය ගැන ඔබට අසන්නට ලැබෙනවා ඇත. නමුත්, මෙහි මූලික කාරණය නම්, වහලුන් මිනිසුන් ලෙසට ගණන් නොගන්නා ලද බවයි. ඔවුන් පුරවැසියන් ලෙසට පමණක් නොව මිනිසුන් ලෙසට පවා ගණන් නොගන්නා ලදී. රෝම නීතිය අනුව ඔවුන් බඩු බාහිර ලෙසට ගැනින. මිනිසුන් ඝාතනය කිරීම ගැන වූ නීතිය වහලුනට අදළ වූයේ නැත. මේ අනුව අන්‍ය නීති ගැන කීම අවශ්‍ය නොවේ. එම නීතියෙන් ආරක්ෂා කෙරුනේ වහල් හිමියන් පමණකි. ඒ අනුව පූර්ණ අයිතිවාසිකම් ඇති පුරවැසියන් ලෙසට සැලකුනේ ඔවුන් පමණකි. නමුත් රාජාණ්ඩුවක් පිහිටුවා තිබුණත්, සමූහාණ්ඩුවක් තිබුණත්, එය වහල් හිමියන්ගේ රාජාණ්ඩුවක්, නැතහොත්, වහල් හිමියන්ගේ සමූහාණ්ඩුවක් විය. නීතිය හමුවේ වහලා භාණ්ඩයක් වූ අතර, වහල් හිමියෝ සියලු අයිතිවාසිකම් භුක්ති වින්දහ. ඒ අනුව වහලා ඕනෑම ආකාරයක හිංසනයකට භාජනය කිරීමට හැකි විය. එපමණක් නොව වහලෙක් මැරීම වුව අපරාධයක් සේ නොසලකන ලදී. වහල් හිමි සමූහාණ්ඩු ඒවායේ අභ්‍යන්තර සංවිධානය අනුව විවිධාකාර විය. ඒවා අතර ප්‍රභූතන්ත්‍ර සමූහාණ්ඩු සහ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩු විය. ප්‍රභූ තන්ත්‍ර සමූහාණ්ඩුවක මැතිවරණවලට සහභාගි වූයේ වරප්‍රසාදලත් පුද්ගලයන් සුළු පිරිසක් පමණකි. ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක සියලු දෙනාම ඊට සහභාගි වූහ. නමුත් මෙහි සියලු දෙනාම යනුවෙන් අදහස් වූයේ වහල් හිමියන්ය. එනම්, වහලුන් හැර සියලු දෙනාම ය. මෙම මූලික කරුණ මතක තබා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගත යුතුය. මන්ද යත්, අන් කිසිම කරුණකට වඩා හොඳින් එයින් රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය පැහැදිලි වන හා රාජ්‍යයේ ස්වභාවය පෙන්නුම් කෙරෙන හෙයිනි.

රාජ්‍යය වූකලී, එක පංතියක් විසින් තවත් පංතියක් පීඩනයට පත් කරනු ලැබීම සඳහා වූ යන්ත්‍රයකි. එක පංතියකට, අනිත්, යටත් කෙරුණු පංතිය කීකරු කර තැබීම සඳහා වූ යන්ත්‍රයකි. මෙම යන්ත්‍රයේ විවිධ ආකෘති ඇත. වහල් හිමි රාජ්‍යය රාජාණ්ඩුවක්, නැතහොත්, ප්‍රභූතන්ත්‍ර සමූහාණ්ඩුවක් විය හැක. ඇත්ත වශයෙන්ම, ආණ්ඩු ආකෘති ඉතාමත් විවිධාකාර විය. නමුත් නිතරම, ඒවායේ සාරාර්ථය එකක්ම විය. වහලුන් කිසිම අයිතිවාසිකමක් භුක්ති නොවිඳි අතර, පීඩිත පන්තියක් විය. ඔවුන් මිනිසුන් ලෙසට නොසලකන ලදී. වැඩවසම් රාජ්‍යයෙහිද, අපට එයම දැක්ක හැකිය.

සූරාකෑමේ ආකෘතිය වෙනස් වීම නිසා වහල් හිමි රාජ්‍යය වැඩවසම් රාජ්‍යයක් බවට පරිවර්තනය විය. මෙය බෙහෙවින් වැදගත් වෙනසක් විය. වහල් හිමි සමාජයේ වහලාට කිසිම අයිතිවාසිකමක් තිබුණේ නැත. ඔහු මිනිසෙක් ලෙසට නොසලකන ලදී. වැඩවසම් සමාජයේ ගොවියා ඉඩමට බැඳ තබන ලදී. ප්‍රවේනිදස ක්‍රමය ගැන හඳුන්වන ප්‍රධාන අංග ලක්ෂණය වූයේ ගොවීන් (එකල ගොවි ජනයා බහුතරය විය; නාගරික ජනගහනය තවමත් ඉතා කුඩා විය) ඉඩමට බැඳුනු සේ සැලකීමය. ප්‍රවේණිදස ක්‍රමයේ පදනමම මෙය වූයේය. ඉඩම් හිමියා විසින් ගොවියාට වෙන් කරන ලද ඉඩම් කැබැල්ලෙහි තමා සඳහාම නිශ්චිත දින ගණනක් වැඩ කිරීමට ගොවියාට හැකි වූ අතර, අනිත් දිනවල ගොවි දාසයා ඔහුගේ ස්වාමියා සඳහා වැඩ කළේය. පංති සමාජයේ සාරාර්ථය ඉතිරිව තිබුණේය. සමාජය පංති සූරා කෑම මත පදනම් විය. සම්පූර්ණ අයිතිවාසිකම් භුක්ති විඳිය හැකි වූයේ ඉඩම් හිමියන්ට පමණකි. ගොවීන්ට කිසිම අයිතිවාසිකමක් තිබුණේ නැත. ව්‍යවහාරික වශයෙන් ඔවුන්ගේ තත්වය වහල් හිමි රාජ්‍යයේ වහලුන්ට වඩා වෙනස් වූයේ ඉතා ස්වල්ප වශයෙනි. එය එසේ වුවත්, ගොවි දාසයා එක එල්ලේම ස්වාමියාට හිමි දේපලත් ලෙසට නොසලකන ලද නිසා, ඔවුන්ගේ විමුක්තිය සඳහා, ගොවි ජනයාගේ විමුක්තිය සඳහා, වඩාත් පුළුල් මාවතක් විවෘත විය. තමාගේ කාලයෙන් කොටසක් තමා සඳහාම වැඩ කිරීමට මිඩංගු කිරීමට ගොවිදාසයාට හැකි වූ නිසා, ඔහු එක්තරා දුරකට ඔහුටම අයත් වූ බව කිව හැකිය. තවද, හුවමාරු සහ වෙළෙඳ සම්බන්ධකම් සංවර්ධනය වීමේ අවස්ථා පුළුල් වීමත් සමග වැඩවසම් ක්‍රමය අනවරතයෙන්ම දුර්වල වීම නිසා, ගොවි ජනතාවගේ විමුක්තිය සඳහා ඉඩකඩ නොනැවතම පුළුල් විය. වැඩවසම් සමාජය සැම විටම වහල් සමාජයට වඩා සංකීර්ණ විය. වෙළෙඳාමෙහි

සහ කර්මාන්තයේ වැඩි සංවර්ධනයක් සිදු විය. ඒ අනුව, එකල පවා ධනපති ක්‍රමයට මඟ හෙළි විය. මධ්‍ය කාලීන සමයේදී වැඩවසම් ක්‍රමය ප්‍රබල වූයේය. මෙහි ද රාජ්‍ය ආකෘති විවිධාකාර විය. මෙහිදීද, රාජාණ්ඩුව සහ සමූහාණ්ඩුව යන දෙකම අපට දක්නට ලැබේ. නමුත් ඉන් පසු කී ආකෘතිය බොහෝ දුර්වල ආකාරයෙන් පිළිබිඹු වූයේ විය. නමුත් සැම විටම, වැඩවසම් සාමිවරයා එකම පාලකයා ලෙසට සලකන ලදී. ගොවි දාසයන්ට සැම සියලු දේශපාලන අයිතියක්ම අහිමි කර තිබිණි.

වහල් ක්‍රමය යටතේ වේවා, එසේ නැතහොත්, වැඩවසම් ක්‍රමය යටතේ වේවා, බලකිරීම නොමැති වී නම්, අති මහත් බහුතරය යටත් කොට අධිපතිකම් කිරීමේ හැකියාවක් කුඩා අල්පතරයකට නොතිබිණි. පීඩනය ඉවත දැමීම සඳහා පීඩිතයන් දරූ නිරන්තර ප්‍රයත්නයන්ගෙන් ඉතිහාසය ගහන ය. වහල් ක්‍රමයෙන් විමුක්තිය ලැබීම සඳහා දශක ගණන් තිස්සේ පැවති විමුක්ති යුද්ධ පිළිබඳ වාර්තා වහල් ක්‍රමයේ ඉතිහාසයෙහි ඇත. ධනපති වියගසට විරුද්ධව නියම වශයෙන් සටන් කරන එකම ජර්මන් පක්ෂය වන ජර්මන් කොමියුනිස්ට්වරුන් ''ස්පාර්ටසිස්ට්''[2] යන නම ගෙන තිබෙන්නේ, ස්පාර්ටකස්, අවුරුදු දෙදහසකට පමණ පෙර ඇතිවූ ශ්‍රේෂ්ඨතම වහල් කැරැල්ලක ඉතාමත් ප්‍රමුඛ නායකයා වූ හෙයින් බව මෙහිලා අමතර වශයෙන් සඳහන් කළ යුතුය. සම්පූර්ණයෙන්ම වහල් ක්‍රමය මත රැඳී පැවතුනු, සර්වබලධාරී සේ පෙනුනු රෝම අධිරාජ්‍යය, ස්පාර්ටකස්ගේ නායකත්වය යටතේ ආයුධ සන්නද්ධ වූ සහ මහා හමුදවක් ලෙසට එක්සත් වූ වහලුන්, විශාල ලෙස පැතිරීගිය ආකාරයෙන් ගැසූ කැරැල්ලකින් අවුරුදු ගණනාවක්ම යන තෙක් ඇති වූ කම්පනයට හා වැදුනු පහරවලට ලක් විය. අවසානයේ ඔවුන් පරාජයට පත් වූයෙන්, වහල් හිමියන් විසින් අල්වා දරුණු වධයට භාජනය කරන ලදී. පංති සමාජය පැවැත්මේ මුළු ඉතිහාසයම එවැනි සිවිල් යුද්ධවලින් සලකුණු වී තිබේ. වහල් යුගයේ ඇති වූ මෙම සිවිල් යුද්ධ අතුරෙන් විශාලතම එකක් ගැන මම දැන් ඔබට සඳහන් කෙළෙමි. වැඩවසම් ක්‍රමයේ මුළු යුගයම, ගොවිජනයාගේ එවැනිම නිරන්තර කැරලිගැසීම්වලින් සලකුණු වී තිබේ. නිදසුනක් ලෙසට මධ්‍ය කාලීන සමයේ ජර්මනියේ පංති දෙකක් අතර, ඉඩම් හිමියන් හා ප්‍රවේණිදාසයන් අතර ඇති වූ අරගලය පුළුල් ලෙස පැතිරී ගොස් ඉඩම් හිමියන්ට විරුද්ධ ගොවිජනයාගේ සිවිල් යුද්ධයක් බවට පරිවර්තනය විය. රුසියාවේ වැඩවසම් ඉඩම් හිමියන්ට විරුද්ධව ගොවිජනයා නැවත නැවතත් ගැසූ කැරලි පිළිබඳ නිදර්ශන ගැන ඔබ දන්නෙහිය.

වැඩවසම් අධිපතියන්ගේ පාලනය පවත්වා ගැනීම සහ බලය රැකගැනීම පිණිස ඔවුන් වසමේ විශාල සංඛ්‍යාවක් ජනයා එක්සත් කර, එම ජනයා

https://liberationbase.wordpress.com

යම් යම් නීතිවලට හා රෙගුලාසිවලට යටත් කරනු සඳහා උපයෝගි කර ගත හැකි යන්ත්‍රයක් වැඩවසම් අධිපතියන්ට තිබිය යුතු විය. අනිත් අතට මෙම නීති සියල්ලම මූලික වශයෙන් එක අර්ථයක් දැරුවේය. ඒ සියල්ලම ගොවිදාසයින් යටත් කොට සාමිවරුන්ගේ බලය පවත්වා ගැනීම සඳහා සකස් වී තිබුණි. මෙම යන්ත්‍රය වැඩවසම් රාජ්‍යය විය. නිදසුනක් ලෙසට රුසියාවේ, නැතහොත්, ඉතාමත් නොදියුණු ආසියාතික රටවල (එම රටවල අද දක්වාම වැඩවසම් ක්‍රමය පවතී) එය ආකෘතියෙන් වෙනස් විය. එය එක්කෝ සමූහාණ්ඩුවක්, නැතහොත්, රාජාණ්ඩුවක් විය. රාජ්‍යය රාජාණ්ඩුවක් වන විට, එක් පුද්ගලයෙකුගේ පාලනය පිළිගන්නා ලදී. එය සමූහාණ්ඩුවක් වන විට ඉඩම් හිමි සමාජයේ තෝරා පත්කළ නියෝජිතයින්ගේ සහභාගිත්වය එක් හෝ තවත් ප්‍රමාණයකට පිළිගන්නා ලදී. මෙසේ වූයේ වැඩවසම් සමාජයෙහිය. වැඩවසම් සමාජයෙන් පංති බෙදීමක් නියෝජනය වුනු අතර, එය යටතේ අති බහුතරය, එනම්, ගොවිදාසයෝ, ඉතා සුළු අල්පතරයකට, එනම්, ඉඩම් හිමියන්ට සම්පූර්ණයෙන්ම යටත්වී සිටියහ.

වෙළෙඳාම සංවර්ධනය වීම නිසා, වෙළෙඳ භාණ්ඩ හුවමාරුව සංවර්ධනය වීම නිසා, නව පංතියක් වන ධනපතියන් මතු වී ඒමට හේතු විය. මධ්‍ය කාලීන යුගය අවසානයේදී, ඇමෙරිකාව සොයා ගැනීමෙන් පසුව ලෝක වෙළෙඳාම විශාල වශයෙන් සංවර්ධනය වූ කල, අගනා ලෝහ වර්ගවල ප්‍රමාණය වැඩි වූ කල, රිදී හා රන් හුවමාරු මාධ්‍ය බවට පත් වූ කල, මුදල් සංසරණය නිසා පුද්ගලයන්ට ඉමහත් ධන සම්භාරයන් හිමි කොට ගැනීමට හැකියාව ලැබුණු කල, ප්‍රාග්ධන යථානුරූප ලෙස හැඩ ගැසුනේය. රිදී සහ රන් ලෝකය මුළුල්ලේම ධනය ලෙසට පිළිගන්නා ලදී. ඉඩම් හිමි පංතියේ ආර්ථික බලය හීන වී ගිය අතර, නව පංතියේ — ප්‍රාග්ධනයෙහි නියෝජිතයින්ගේ — බලය වර්ධනය විය. සමාජය යම් සේ ප්‍රතිසංස්කරණය වීද යත්, සියලුම පුරවැසියන් එක සමාන සේ පෙනින. වහල් හිමියන් සහ වහලුන් ලෙසට වූ පැරණි බෙදීම අතුරුදහන් විය. එක් එක් පුද්ගලයා සතු ප්‍රාග්ධන ප්‍රමාණය කුමක් වුවත්, නීතිය හමුවේ සියලු දෙනාම සමාන සේ පිළිගන්නා ලදී. නීතිය සැම දෙනාටම සම සේ ආරක්ෂාව දෙයි. එය, දේපල හිමි නැති, තමන්ගේ ශ්‍රම ශක්තිය හැර අන් කිසිවක් හිමි නැති, තව තවත් දුප්පත් වෙමින් හා විනාශයට පත් වෙමින්ද, නිර්ධනයන් බවට පරිවර්තනය වෙමින්ද සිටින පොදු ජනයාගේ ප්‍රහාරයෙන් දේපල හිමි අයගේ දේපල ආරක්ෂා කරයි. ධනපති සමාජය එසේය.

මට මේ ගැන වැඩි විස්තර ඉදිරිපත් කිරීමට ඉඩක් නැත. පක්ෂයේ වැඩ පිළිවෙළ සාකච්ඡා කරන විට ඔබ නැවතත් මෙය වෙත යොමු වනු

ඇත. එවිට ඔබට ධනපති සමාජය ගැන විස්තරයක් අසන්නට ලැබෙනවා ඇත. ප්‍රවේණිදාස ක්‍රමයට විරුද්ධව, පැරණි වැඩවසම් ක්‍රමයට විරුද්ධව, මෙම සමාජය ඉදිරිපත් වෙන්නේ නිදහස පිළිබඳ සටන් පාඨය යටතේය. නමුත් එය දේපල හිමි අය සඳහා නිදහස විය. දහ අට වැනි ශත වර්ෂය අගදී සහ දහ නව වැනි ශත වර්ෂය මුලදී, වැඩවසම් ක්‍රමය දෙදරා ගිය පසු — රුසියාවේ එය සිදුවූයේ අන් රටවලට වඩා ප්‍රමාදව, 1861 දී ය — වැඩවසම් රාජ්‍යය වෙනුවට ආදේශ වූයේ, මුළු ජනතාවම සඳහා නිදහස තමන්ගේ සටන් පාඨය බව ප්‍රකාශයට පත්කරන, තමන් මුළු ජනතාවගේම කැමැත්ත පිළිබිඹු කරන බව කියන හා තමන් පංති රාජ්‍යයක් බව පිළිගැනීම ප්‍රතික්ෂේප කරන, ධනපති රාජ්‍යය විය. මෙහිදී මුළු ජනතාවගේම නිදහස සඳහා සටන් කරන සමාජවාදීන් සහ ධනපති රාජ්‍යය අතර අරගලයක් ඇති විය. සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව ඇති වීමට මග පෙන්වූයෙන්, ලෝකය මුළුල්ලේම සිදුවෙමින් පවතින්නේත්, එම අරගලය ය.

ලෝක ප්‍රාග්ධනයට විරුද්ධව ආරම්භ කර තිබෙන අරගලය ගැන අවබෝධ කර ගැනීමට, ධනපති රාජ්‍යයේ ස්වභාවය ගැන අවබෝධ කර ගැනීමට, අප මතක තබා ගත යුතු දෙයකි, ධනපති රාජ්‍යය වැඩවසම් රාජ්‍යයට විරුද්ධව ඉදිරිපත් වෙමින් සටනට අවතීර්ණ වූයේ නිදහස පිළිබඳ සටන් පාඨය යටතේ බව. ප්‍රවේණි දාස ක්‍රමය බිඳ වැටෙමින් පැවති නිසාත්, ගොවිජනයා වන්දි ගෙවීමෙන් හෝ හිලව් බදු ගෙවීමෙන් හෝ ඔවුන් විසින් මිළට ගන්නා ලද ඉඩම් තමන්ට සම්පූර්ණයෙන් අයත් දේපල ලෙසට හිමිකර ගැනීමේ හැකියාව ගොවීන්ට ලැබී තිබුණු නිසාත් — මෙය රාජ්‍යය හා සම්බන්ධ දෙයක් නොවීය — වැඩවසම් ක්‍රමය අහෝසි කිරීම යන්නෙන් අදහස් වූයේ ධනපති රාජ්‍යයේ නියෝජිතයන් සඳහා නිදහසය. එය ඔවුන්ගේ උවමනාව ඉටු කර ගැනීම සඳහා ප්‍රයෝජනවත් විය. පෞද්ගලික දේපලවල සම්භවය ගැන නොතකාම රාජ්‍යය එම දේපල ආරක්ෂා කළේය. එසේ වූයේ රාජ්‍යය පෞද්ගලික දේපල පදනම් කොටගෙන පිහිටා තිබුණ හෙයිනි. නවීන ශිෂ්ටාචාර රාජ්‍යයන් සියල්ලම තුළ ගොවිජනයා පෞද්ගලික අයිතිකරුවෝ වූහ. ඉඩම් හිමියා ඔහුගේ ඉඩමෙන් කොටසක් ගොවියාට දෙන කල පවා, රාජ්‍යය පෞද්ගලික දේපල වෙනුවෙන් පෙනී සිටිමින්, ඉඩම් හිමියාට වන්දි ලබා දීමෙන්, ඉඩම් වෙනුවට මුදල් ගැනීමට ඔහුට ඉඩ දීමෙන් ඔහුට වාසි සැලසුවේය. සියලු පෞද්ගලික දේපල සම්පූර්ණයෙන්ම ආරක්ෂා කරන බවට රාජ්‍යය විසින් ප්‍රකාශයක් කරන ලද කලෙක මෙන් විය. රාජ්‍යය පෞද්ගලික දේපලට සැම ආධාරයක්ම හා ආරක්ෂාවක්ම දුන්නේය. රාජ්‍යය සැම වෙළෙන්දෙකුගේම, කර්මාන්තකරුවෙකුගේම සහ නිෂ්පාදකයෙකුගේම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පෞද්ගලික දේපල අයිතිය පිළිගත්තේය. පෞද්ගලික දේපල මත, ප්‍රාග්ධනයේ බලය මත, දේපල අහිමි කම්කරුවන් සහ ශ්‍රමකරු පොදු ජනතාව සම්පූර්ණයෙන්ම යටත් කිරීම මත පදනම් වූ මෙම සමාජය එහි පාලනය නිදහස මත පදනම් වූ පාලනයක් බව ප්‍රකාශයට පත් කළේය. වැඩවසම් ක්‍රමයට විරුද්ධව සටන් කිරීමේදී දේපල පිළිබඳ නිදහස ප්‍රකාශයට පත්කළ එය විසින් කියන ලද පරිදි, රාජ්‍යය පංති රහිත රාජ්‍යයක් වීම ගැන එය විශේෂයෙන් උදම් විය.

එසේ වුවත්, රාජ්‍යය තවදුරටත් දුප්පත් ගොවීන් හා කම්කරු පංතිය යටත් කර තබා ගැනීමට ධනපතියන්ට ආධාර කළ යන්ත්‍රයක් ලෙසටම පැවැත්තේය. නමුත් පිටතින් පෙනෙන ලෙසට එය නිදහස් රාජ්‍යයක් විය. එය සර්වජන ඡන්දය ප්‍රකාශයට පත් කළේය. එය පංති සහිත රාජ්‍යයක් නොවන බව එහි නායකයන්, දේශකයන්, උගතුන් සහ දර්ශනිකයන් ලවා කියෙව්වේය. දැන්, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව රාජ්‍යයට විරුද්ධව සටන් කිරීමට පටන් ගෙන තිබෙන විට පවා, ඔවුහු අපට චෝදනා කරමින්, අප නිදහස උල්ලංඝනය කරන බවත්, බල කිරීම මත, එක් පිරිසක් තවත් අය විසින් මර්දනය කරනු ලැබීම මත පදනම් වූ රාජ්‍යයක් ගොඩනගන බවත්, ඒ අතර ඔවුන් පොදුජන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් නියෝජනය කරන බවත් කියති. දැන්, ලෝක සමාජවාදී විප්ලවය ආරම්භ වී තිබෙන කල, සමහර රටවල විප්ලවය සාර්ථක වී තිබෙන කල, ලෝක ප්‍රාග්ධනයට විරුද්ධව කරන සටන විශේෂයෙන්ම තියුණු වී තිබෙන කල, රාජ්‍යය පිළිබඳ මෙම ප්‍රශ්නය ඉමහත් සේ වැදගත් වී ඇත. එය, අයෙකුට කිව හැකි ලෙසට, වඩාත්ම ගිනිගෙන දැල්වෙන ප්‍රශ්නයද, අද දේශපාලන ප්‍රශ්න හා විවාද සියල්ලෙහිම යොමු ලක්ෂයද වන්නේය.

රුසියාවේ, නැතහොත්, වඩාත් ශිෂ්ටාචාර රටවල් අතුරෙන් ඕනෑම එකක, කුමණ පක්ෂය ගත්තත්, දේශපාලන විවාද, අසමථයන් හා මති මතාන්තර සියල්ලම දැන් රාජ්‍යය පිළිබඳ සංකල්පය වටා ගෙතී තිබෙන බව අපට පෙනේ. ධනපති රටක, ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක, විශේෂයෙන්ම, ස්විට්සර්ලන්තයේ, නැතහොත්, ඇමෙරිකා එක්සත් ජනපදයේ වැනි සමූහාණ්ඩුවක, නිදහස්තම ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවල රාජ්‍යය, පොදුජන කැමැත්ත එනම් ජනතාවගේ පොදු තීරණයේ එකතු සමස්තය ප්‍රකාශ කරන්නක් ද? ජාතික කැමැත්ත යනාදිය ප්‍රකාශ කරන්නක්ද? එසේ නැතහොත්, රාජ්‍යය යනු කම්කරු පංතිය සහ ගොවි ජනතාව යටත් කොට එරටවල ධනපතියන්ගේ බලය පවත්වා ගැනීම සඳහා එම ධනපතියන්ට ආධාර කරන යන්ත්‍රයක්ද? ලෝකය මුළුල්ලේම සිදුවන දේශපාලන විවාද සියල්ලම දැන් ගෙතී ඇත්තේ මෙම මූලික

ප්‍රශ්නය නැමති මධ්‍ය ලක්ෂය වටාය. ඔවුහු බොල්ෂෙවික්වාදය ගැන කුමක් කියත්ද? ධනපති පුවත්පත් බොල්ෂෙවික්වරුන්ට බැන වදිති. බොල්ෂෙවික්වරු පොදුජන පාලනය උල්ලංඝනය කරතියි යන වැරැහැලි වූ චෝදනාව නැවත ඉදිරිපත් නොකරන එකද ප්‍රවෘත්ති පත්‍රයක්වත් ඔබට සොයාගත නොහැකි වනු ඇත. මෙම චෝදනාව නිපදවාගත්තේ හා නිර්මාණය කර ගත්තේ තමන් යයි අපගේ මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී විප්ලවවාදීහු, ඔවුන්ගේ නිවටකම නිසා (සමහරවිට එය නිවට කම නොවේ; එසේ නැතහොත්, එය සොරකමට වඩා නරක යයි ප්‍රස්තා පිරුළෙන් කියවෙන නිවටකමය) සිතති නම්, ඔවුන්ට සිදුවී තිබෙන්නේ හාස්‍ය ජනක වැරදීමකි. අද ඉතාමත් පොහොසත් රටවල තිබෙන ඉතාමත් පොහොසත් පුවත් පත්, කෝටි ගණන් මුදල් වැය කරමින්, ඒවායේ කෝටි ගණන් පිටපත් මගින් ධනපති බොරු සහ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්ති පතුරුවා හරිති. මෙම පුවත් පත් සෑම එකක්ම, බොල්ෂෙවික්වාදයට විරුද්ධව දමා ගසන මෙම මූලික තර්ක හා චෝදනා, එනම්, ඇ. එ. ජ., බ්‍රිතාන්‍යය හා ස්විට්සර්ලන්තය පොදුජන පාලනයේ පදනම මත පිහිටි දියුණු රාජ්‍ය යයිද, ඒ අතර බොල්ෂෙවික් රාජ්‍යය කිසිම නිදහසක් නැති වෛරව රාජ්‍යයකැයිද, එය පොදුජන පාලනය පිළිබඳ අදහස උල්ලංඝනය කර ඇතැයිද, එසේ කිරීමේදී ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය[3] විසුරුවා හැරීම තරම් දුරට ගොස් ඇතැයිද, යනු පුනරුච්ඡාරනය කරන්නේය. බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව ලෝකය මුළුල්ලේම මෙම චෝදනා පුනරුච්ඡාරනය කරනු ලැබේ.

මෙම චෝදනා නිසා අප එක එල්ලේම යොමු වන්නේ, රාජ්‍යය යනු කුමක්ද? යන ප්‍රශ්නය වෙතය. මෙම චෝදනා වටහා ගනු පිණිස, ඒවා අධ්‍යයනය කිරීම සහ ඒවා කෙරෙහි සම්පූර්ණයෙන් ඥානාන්විත ආකල්පයක් ඇතිකර ගනු පිණිස, ඒවා ගැන ආරංචි මාත්‍රයෙන් පරීක්ෂා නොකර අපගේම දැඩි අදහසක් ඇතිව එසේ කිරීම පිණිස, රාජ්‍යය කුමක්දැයි යන පැහැදිලි අදහසක් අපට තිබිය යුතුය. අප හමුවේ සෑම වර්ගයකම ධනපති රාජ්‍යයන් සහ ඒවාට ආරක්ෂාව දෙන න්‍යායයන් සියල්ලද ඇත. එම න්‍යායයන් යුද්ධයට පෙර නිර්මාණය කරන ලද ඒවාය. ප්‍රශ්නයට නිසි ලෙස පිළිතුරු දෙනු සඳහා මෙම න්‍යායයන් සියල්ලම ගැන විවේචනාත්මක ලෙස විමසා බැලිය යුතුය.

ආධාර ලබා ගනු පිණිස එංගල්ස්ගේ ''පවුල, පෞද්ගලික දේපල සහ රාජ්‍යය ඇතිවූ සැටි'' යන කෘතිය වෙත හැරෙන ලෙස මම ඔබට මුලින් කීවෙමි. ඉඩම් සහ නිෂ්පාදන මාර්ග පිළිබඳ පෞද්ගලික අයිතිය පවතින, ප්‍රාග්ධනයේ ආධිපත්‍යය පවතින සෑම රාජ්‍යයක්ම, එය කොතරම් ප්‍රජාතන්ත්‍රවාදී වුවත්, ධනපති රාජ්‍යයක් වන බවත්, කම්කරු පංතිය හා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දුප්පත් ගොවිජනයා යටත් කර තබා ගැනීමට ධනපති පංතිය විසින් යොදගනු ලබන යන්ත්‍රයක් වන බවත්, ඒ අතර, සර්ව ජන ඡන්දය, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයක්, පාර්ලිමේන්තුවක් යනු හුදෙක්ම එක්තරා ආකාරයක, එක්තරා වර්ගයක පොරොන්දු නෝට්ටුවක් පමණක් බවත්, එයින් පවතින තත්වය වෙනස් නොවන බවත්, එම පොතෙහි කියා ඇත.

රාජ්‍යයේ ආධිපත්‍යය පවත්වාගන්නා ආකාරයන් වෙනස් විය හැක: එක ආකෘතියක් ඇති තැනක එක් ආකාරයකින්ද, තවත් ආකෘතියක් ඇති තැනක තවත් ආකාරයකින්ද, ප්‍රාග්ධනය එහි බලය පෙන්නුම් කරයි. නමුත්, ඡන්ද විමසීමේ සුදුසුකම්, නැතහොත්, වෙනත් අයිතිවාසිකම් තිබුණත්, නැතත්, බලය මූලික වශයෙන් ප්‍රාග්ධනය අතෙහි පවතී. ඇත්ත වශයෙන්ම, ධනපති ක්‍රමය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වූ තරමට එහි පාලනය වඩාත් ගොරෝසු සහ කුඩුකේඩු ස්වභාවයක් ගන්නේය. ඇමෙරිකා එක්සත් ජනපදය ලෝකයේ තිබෙන ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකි. නමුත්, මුළු සමාජයම අභිභවා ගිය ප්‍රාග්ධනයේ බලය, අතලොස්සක් කෝටිපතියන්ගේ බලය, ඇමෙරිකාවේ තරම් ගොරෝසු හා විවෘත ලෙසම දූෂිත වූ වෙනත් රටක් නැත (1905 පටන් එරටට ගිය අය මේ බව සමහරවිට දන්නවා ඇත). ප්‍රාග්ධනය පවතින කල්හි එය මුළු සමාජයම එහි ආධිපත්‍යයට යටත් කරයි. කිසිම ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකට, කිසිම ඡන්ද විමසීමකට එහි ස්වභාවය වෙනස් කළ හැකි නොවේ.

වැඩවසම් ක්‍රමය සමග සසඳන කල, සමූහාණ්ඩුව හා සර්වජන ඡන්දය දැවැන්ත ප්‍රගතිශීලී ඉදිරි ගමනක් නියෝජනය කළේය. එනිසා, නිර්ධන පංතියට එහි වර්තමාන සමගිය සහ සහයෝගිතාවය ඇති කර ගැනීමටත්, ප්‍රාග්ධනයට විරුද්ධව ක්‍රමානුකූල අරගලයක් කරමින් සිටින ඒ දෘඩ සහ විනය සම්පන්න පිරිස් සංවිධානය කර ගැනීමටත්, හැකි විය. මෙයට ගව් ගණනකින්වත් සමාන වන කිසිවක් ගොවි දසයන් අතර නොවීය. ඒ අනුව වහලුන් අතර එවැන්නක් නොතිබුණු බව කිවමනා නොවේ. අප දන්නා පරිදි වහල්ලු කැරළි ගැසූහ. ප්‍රතිරෝධය පෑහ. සිවිල් යුද්ධ ආරම්භ කළහ. නමුත් පංති විඥනය සහිත බහුතරයක් ඇති කිරීම සහ අරගලයට නායකත්වය දීමට පක්ෂ ඇති කිරීම ඔවුනට කිසි කලෙකත් කළ නොහැකි විය. තමන්ගේ අරමුණු මොනවාදැයි පැහැදිලිව වටහා ගැනීමට ඔවුන් අපොහොසත් විය. ඉතිහාසයේ ඉතාමත් විප්ලවවාදී අවස්ථාවලදී පවා ඔවුන් පාලක පංති වල ඉත්තන් විය. ලෝකයේ සමාජ වර්ධනයේ ස්ථාවරයෙන් බලන කල, ධනපති සමූහාණ්ඩුව, පාර්ලිමේන්තුව, සර්වජන ඡන්දය යන මේ සියල්ලෙන් නියෝජනය වන්නේ මහත් දියුණුවකි. මිනිස් වර්ගයා ධනපති ක්‍රමය කරා ගමන් ගත්තේය. පීඩිත නිර්ධන පංතියට තමන් ගැන අවබෝධ කර ගැනීමට සහ ලෝක කම්කරු පංති ව්‍යාපාරය ඇති කිරීමට, එනම්, ලෝකය මුළුල්ලේම පක්ෂ වශයෙන් සංවිධානය වුනු, පොදුජනතාවගේ අරගලයට විඥන නායකත්වයක් දෙන සමාජවාදී පක්ෂ තුළ සංවිධානය වුනු කෝටි සංඛ්‍යාත කම්කරුවන්ගේ ව්‍යාපාරය ඇති කිරීමට හැකි වූයේ ධනපති ක්‍රමය නිසාම පමණකි. ඔවුන්ට එම හැකියාව ලැබුනේ නාගරික සංස්කෘතිය හේතු කොටගෙනය. පාර්ලිමේන්තුවාදය නොමැතිව, තෝරා පත්කිරීමේ ක්‍රමයක් නොමැතිව, කම්කරු පංතියේ මෙම සංවර්ධනය සිදු වීමට ඉඩක් නොවීය. මේ සියල්ල පුළුල් ජනතාවගේ ඇස් හමුවේ මෙතරම් වැදගත් තත්වයකට පත් වූයේ එබැවිනි. මූලික වෙනසක් කිරීම එතරම් අපහසු සේ පෙනෙන්නේ එබැවිනි. රාජ්‍යය නිදහස්ය, එහි මෙහෙය නම් සියලු දෙනාගේම උවමනාවන් ආරක්ෂා කිරීමය යන ධනපති බොරුව පිළිගන්නේ සහ ආරක්ෂා කරන්නේ විඥත රැවටිලි කාරයෝත්, විද්‍යාඥයෝ සහ පූජකවරුත් පමණක් නොවෙති. අවංකවම පැරණි දුර්මත කෙරෙහි තදින් එල්බ ගෙන සිටින හා පැරණි ධනපති සමාජයේ සිට සමාජවාදයට සංක්‍රමණය වීම ගැන වටහා ගත නොහැකි අය බොහෝ දෙනෙක්ද එයම කරති. කෙළින්ම ධනපතියන්ගෙන් යැපෙන අය පමණක් නොව, ප්‍රාග්ධනයේ වියගස යටතේ වෙසෙන අය හා ප්‍රාග්ධනය විසින් අල්ලස් දෙන ලද අය (ප්‍රාග්ධනයට සේවය කරන විවිධාකාර විද්‍යාඥයන්, කලාකරුවන්, පූජකයන්, ආදීන් රැසක් ඇත) පමණක් නොව, ධනපති නිදහස පිළිබඳ දුර්මතයෙන් හුදෙක් වසඟ වූ අයද පවා ලෝකය මුළුල්ලේම බොල්ෂෙවික්වාදයට විරුද්ධව ආයුධ අතට ගත්හ. එයට හේතු වූයේ සෝවියට් සමූහාණ්ඩුව පිහිටුවන කල එය මෙම ධනපති බොරු ප්‍රතික්ෂේප කරමින් මෙසේ කීමය: නුඹලාගේ රාජ්‍යය නිදහස් යයි නුඹලා කියන්නාහුය. නමුත් පෞද්ගලික දේපල තිබෙන තාක් කල්, නුඹලාගේ රාජ්‍යය ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව වුවත්, එය කම්කරුවන් මර්දනය කිරීමට ධනපතියන් විසින් යොදගනු ලබන යන්ත්‍රයක් මිස අන් කිසිවක් නොවේ. එමෙන්ම රාජ්‍ය වඩාත් නිදහස් වූ තරමට ඒ බව වඩාත් පැහැදිලි ලෙස ප්‍රකාශිත වන්නේය. යුරෝපයේ ස්විට්සර්ලන්තයත්, ඇමෙරිකාවේ එක්සත් ජනපදයත්, මෙයට නිදර්ශන වෙති. ඒවා ප්‍රජාතන්ත්‍රවාදී සමූ සමූහාණ්ඩු වුවත්, ඒවා කොතරම් රුවට සායම් කර තිබුණත්, ශ්‍රම ප්‍රජාතන්ත්‍රවාදය සහ සියලුම පුරවැසියන්ගේ සමානත්වය ගැන කොතෙක් කථා කළත්, ඒවායේ ප්‍රාග්ධනයේ- පාලනය තරම් කුඩුකේඩු සහ නිර්දය පාලනයක් වෙනත් කිසිම රටක නැත. ප්‍රාග්ධනයේ පාලනය එතරම් පැහැදිලි ලෙස දක්නට ලැබෙන වෙනත් රටක්ද නැත. සත්‍ය කරුණ නම් ස්විට්සර්ලන්තය සහ එක්සත් ජනපදය තුළ ප්‍රාග්ධනයේ අධිපතිත්වය බලපවත්වන බවයි; කම්කරුවන් ස්වකීය ජීවන තත්වයන්හි අල්පමාත්‍ර

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

හෝ සැබෑ දියුණුවක් ඇති කර ගැනීමට දරන සෑම ප්‍රයත්නයක්ම හමුවට වහාම සිවිල් යුද්ධය පැමිණෙන බවයි. මෙම රටවල සිටින සොල්දාදුවන් සංඛ්‍යාව නොවැඩිය; ඒවායේ තිබෙන ස්ථිර යුද්ධ හමුද නොවිශාලය. ස්විට්සර්ලන්තයේ මිලීෂියා හමුදවක් ඇති අතර, සෑම ස්විස් ජාතිකයෙකුටම ගෙදර තුවක්කුවක් ඇත. ඇමෙරිකාවේ මෑතක් වන තෙක් ස්ථිර යුද්ධ හමුදවක් නොවීය. එනිසා වැඩ වර්ජනයක් ඇතිවන කල සන්නද්ධ කොට හා කුලියට ගෙන වැඩ වර්ජනය කඩාකප්පල් කරති. කම්කරු ව්‍යාපාරය මර්දනය කිරීමේදී ස්විට්සර්ලන්තයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ තරම් නිර්දය දරුණු ක්‍රියා යොද ගැනීම දක්නට ලැබෙන වෙනත් කිසිම රටක් නැත. මෙරටවල තරම් බලවත් ලෙස පාර්ලිමේන්තුව තුළ ප්‍රාග්ධනයේ බලය ප්‍රදර්ශනය වන වෙනත් කිසිම රටක් නැත. සියලු බලය ඇත්තේ ප්‍රාග්ධනයෙහිය; සියලු බලය ඇත්තේ ව්‍යාපාර පොළෙහිය. ඒ අතර පාර්ලිමේන්තුව සහ මැතිවරණ රූකඩ සහ පඹයෝ වෙති... නමුත් කම්කරුවන්ගේ ඇස් එන්න එන්නම පැදෙන්නේය. එනිසා සෝවියට් ආණ්ඩුව පිළිබඳ අදහස තවත් ඈතට විහිදී යන්නේය. අප අත්දුටු සංහාරයෙන් පසුව විශේෂයෙන්ම එය පැතිරී යන්නේය. ධනපතියන්ට විරුද්ධව බුරුලක් නොදෙන යුද්ධයක් කිරීමේ අවශ්‍යතාවය කම්කරු පංතියට වඩ වඩාත් පැහැදිලි වෙමින් පවතී.

සමූහාණ්ඩුව කුමණ වේශයක් ගත්තත්, එය කොතරම් ප්‍රජාතන්ත්‍රවාදී වුවත්, එය ධනපති සමූහාණ්ඩුවක් නම්, එය ඉඩම් හා පැක්ටරිවල පෞද්ගලික හිමිකම දිගටම තබාගන්නේ නම්, එසේම පෞද්ගලික ප්‍රාග්ධනය විසින් මුළු සමාජයම වේතන වහල් භාවයේ තබාගනු ලැබේ නම්, වෙනත් වචනවලින් කියතොත්, සමූහාණ්ඩුව, අපගේ පක්ෂ වැඩපිළිවෙළෙන් සහ සෝවියට් ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කර ඇති දේ ක්‍රියාත්මක නොකරන්නේ නම්, එවිට රාජ්‍යය සමහර අය විසින් අනිත් ජනයා මර්දනය කිරීම සඳහා වූ යන්ත්‍රයක් වන්නේය. අපි මෙම යන්ත්‍රය ප්‍රාග්ධනයේ බලය පෙරළා දැමීමට සිටින පංතියේ අතට පත් කරන්නෙමු. රාජ්‍යයෙන් අදහස් කෙරෙන්නේ සියලු දෙනාගේම සමානත්වයකැයි යන සෑම පැරණි දුර්මතයක්ම ඉවත ලන්නෙමු. එසේ කීම වංචාවකි. සූරාකෑම තිබෙන තාක් කල් සමානත්වය තිබිය නොහැකිය. ඉඩම් හිමියා කම්කරුවාගේ සමානයෙක් නොවේ. නැතහොත්, සාගින්නේ පෙළෙන මිනිසා, කුස පුරවා ගත් මිනිසාට සමාන නොවේ. මෙම යන්ත්‍රය රාජ්‍යය යනුවෙන් හැඳින්වේ. පොදුජන පාලනය ගැන පැරණි කථා විශ්වාස කළ ජනයා, එය හමුවේ මිථ්‍යා බියකින් යුතුව එයට ගෞරව දැක්වූහ. එම පැරණි කථා ධනපති බොරුවක් බව නිර්ධන පංතිය ප්‍රකාශ කරයි.

නිර්ධන පංතිය මෙම යන්ත්‍රය විනාශ කරනු නිසැකය. මේ දක්වා අප කර තිබෙන්නේ ධනපතියන්ට මෙම යන්ත්‍රය අහිමි කිරීමය. අපි එය අත්පත් කර ගෙන සිටිමු. අපි මෙම යන්ත්‍රය, නැතහොත්, මුගුර සියලු සූරාකෑම විනාශ කිරීම සඳහා යොද ගන්නෙමු. සූරාකෑමේ හැකියාව මුළු ලොවෙහිම කිසිම තැනක තවත් නොපවතින කල, ඉඩම් හිමියන් සහ පැක්ටරි හිමියන් තවත් නොමැති කල, සමහරුන් කුසගින්නේ සිටිද්දී සමහරුන් ගිල දමන තත්වයක් තවත් නොමැති කල, එවැනි දේ සඳහා ඉඩ කඩ තවත් නොමැති වූ කල, අපි මෙම යන්ත්‍රය කසළ ගොඩට දමන්නෙමු. එවිට රාජ්‍යයක් හා සූරාකෑමක් නොපවතිනු ඇත. අපගේ කොමියුනිස්ට් පක්ෂයේ අදහස එයයි. පසුව කරනු ලබන දේශනවලදී අපට නැවතත් මෙම මාතෘකාව වෙත ආපසු ඒමට, එය වෙත නැවත නැවතත් ආපසු ඒමට ලැබෙතැයි මම බලාපොරොත්තු වෙමි.

ප්‍රථමයෙන්, 1929 ජනවාරි 18 දින ප්‍රාව්ද අංක 15 හි පළකරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 29, පිටු 64–84.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොල්චාක් පරදවා ජයග්‍රහණය ලැබීම සම්බන්ධයෙන් කම්කරුවන්ට හා ගොවිජනතාවට ලිපියක්

සහෝදරවරුනි, මුළු උරාල් ප්‍රදේශයම කොල්චාක්ගෙන් මුද ගත් රතු යුද්ධ සේනාවෝ සයිබීරියාව නිදහස් කර ගැනීම ආරම්භ කර ඇත්තාහ. දරුණු අයබදු, නින්ද අපහාස, කස පහර දීම හා සාර්වාදී පීඩනය යළිත් ක්‍රියාත්මක කිරීම මගින් ජනතාව ඔබාගෙන, යටකරගෙන සිටි ඉඩම් හිමි සහ ධනපති අධමයන් අයෝමය කොස්සකින් මෙන් අතුගා දැමීම ගැන උද්දාම වූ උරාල් ප්‍රදේශයේ සහ සයිබීරියාවේ කම්කරුවෝ හා ගොවි ජනයා උද්‍යෝගිමත් ලෙස සෝවියට් බලය පිළිගනිති.

උරාල් ප්‍රදේශය මුද ගැනීම සහ රතු හමුද සයිබීරියාවට ඇතුළු වීම ගැන අප සියලු දෙනාම ප්‍රීති ප්‍රමෝදයට පත්වන නමුත්, සුරක්ෂිතතාවය පිළිබඳ හැඟීමකින් නැළවෙන්නට අපට පුළුවන් කමක් නැත. සතුරා තවමත් කිසිසේත් විනාශ වී නැත. ඒ තබා, ඔහු තවමත් නිශ්චිත වශයෙන් පරාජය වී පවා නොමැත.

කොල්චාක්ද, ජපනුන් සහ වෙනත් විදේශ මංකොල්ලකරුවන්ද, සයිබීරියාවෙන් බැහැරට පළවා හැරීම සඳහා සෑම ධෛර්යයක්ම යෙදිය යුතුය. සතුරාගේ මංකොල්ලය නැවත නැවතත් ආරම්භ කිරීම වලක්වනු පිණිස, ඔහු විනාශ කිරීමට යෙදිය යුතු ධෛර්යය ඊටත් වඩා විශාලය.

මෙය කළ හැක්කේ කෙසේද?

උරාල් ප්‍රදේශයේ දී හා සයිබීරියාවේදී ලබන ලද සංවේග ජනක අත්දැකීම්වලින් හා අධිරාජ්‍යවාදී යුද්ධයේ සතර අවුරුද්දක දුක් වේදනා වින්ද රටවල අත්දැකීම්වලින්, අප උගත යුතු පාඩම් නැත්තේ නොවේ.

කොල්චාක් පාලනය වැනි බේදවාචකයන් නැවත ඇතිවීම වලක්වා තමනට ආරක්ෂාව සලසා ගැනීම පිණිස, මෙම අත්දැකීමෙන් කම්කරුවන්, ගොවීන් සහ සියලුම වැඩ කරන ජනයා උගත යුතු ප්‍රධාන පාඩම් පහ මෙසේය.

පළමු පාඩම. මංකොල්ල කාරයන් ගෙන්, එනම්, ඉඩම් හිමියන්ගෙන් හා ධනපතියන්ගෙන්, කම්කරු හා ගොවි බලය ආරක්ෂා කර ගැනීම සඳහා අපට බලවත් රතු හමුදවක් අවශ්‍යය. අප එය ගොඩනැගීමෙහි සමත් බවද, අප එය මෙහෙයවීමටත්, ධනපතියන් පරාජය කිරීමටත්, ඔවුනට ලෝකයේ ධනවත්ම රටවලින් ආයුධ හා උපකරණ ආධාර විශාල වශයෙන් ලැබෙද්දීම ඔවුන් පරාජය කිරීමටත්, උගෙන ගෙන තිබෙන බවද, අපි වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන්ද ඔප්පු කර ඇත්තෙමු. බොල්ෂෙවික්වරුන් ඇත්ත වශයෙන්ම කර තිබෙන දෙයින් ඒ බව ඔප්පු වී තිබේ. කම්කරුවන් හා ගොවීන් පංති විඥනය ඇතිව සිටිත් නම්, ඔවුන් සියලු දෙනාම එම බොල්ෂෙවික්වරුන් කෙරෙහි විශ්වාසය තැබිය යුතුය. ඔවුන් විශ්වාසය තැබිය යුත්තේ බොල්ෂෙවික්වරුන්ගේ වචනවල ශක්තිය කෙරෙහි නොව (මිනිසෙකුගේ වචනවල ශක්තිය සලකා ඔහු කෙරෙහි විශ්වාසය තැබීම මෝඩ කමකි), උරාල් ප්‍රදේශයේ සහ සයිබීරියාවේ කෝටි සංඛ්‍යාත ජනතාවගේ අත්දැකීම්වල ශක්තිය කෙරෙහිය.කම්කරුවන් හා ගොවීන් ආයුධ සන්නද්ධ කිරීමත්, අණදීම ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට බොහෝ දුරට පක්ෂපාත පැරණි යුද්ධ නිලධාරීන්ට පැවරීමත්, යන කරුණු දෙක එකට සම්බන්ධ කර ගැනීම විසඳීමට ඉතාමත් අසීරු ගැටළුවකි. එය විසඳිය හැක්කේ විශිෂ්ට සංවිධාන හැකියාවකුත්, දැඩි විනයකුත්, මාර්ග දේශක බලවේගය වන කම්කරු කොමිසාර්වරුන් කෙරෙහි පුළුල් ජනතාවගේ විශ්වාසයකුත් තිබුණහොත් පමණකි. බොල්ෂෙවික්වරු මෙම ඉතාමත් දුෂ්කර ප්‍රශ්නය විසඳූහ. පැරණි යුද්ධ නිලධාරීන් ද්‍රෝහී වූ අවස්ථා බොහෝ වුවද, රතු හමුදව අප සතුව තිබෙනවා පමණක් නොව, සාර්ගේ සේනාධිපතියනුත්, එංගලන්තයේ, ප්‍රන්සයේ සහ ඇමෙරිකාවේ සේනාධිපතියනුත්, පරාජය කිරීමටද, එය උගෙන ගෙන තිබේ. එනිසා තමන් කොල්චාක් පාලනයෙන් නිදහස් විය යුතුයයි බරපතල ලෙස කල්පනා කරන සෑම කෙනෙක්ම, රතු හමුදව ගොඩනැගීම හා ශක්තිමත් කිරීම සඳහා තමන් සතු සියලු ශක්තිය, වස්තුව හා හැකියාවන් සම්පූර්ණයෙන්ම කැප කළ යුතු වේ. රතු හමුදව පිළිබඳ සියලුම නීතිවලට සහ සියලුම නියෝගවලට හැඟීමෙන් යුතුව හා එකහෙළාම අවනත විය යුතුය. එය විනය සම්පන්න කර ගැනීමට සෑම ආකාරයකින්ම ආධාර කළ යුතුය. රතු හමුදවට ආධාර කළ යුතුය. හැම දෙනාම තමන්ට හැකි උපරිම පමණින් මේ අනුව කටයුතු කළ යුතුය. කොල්චාක් පාලනය නොකැමති, අවබෝධයෙන් යුත් සෑම කම්කරුවෙකුගේම හා සෑම ගොවියෙකුගේම ප්‍රථම, මූලික හා ප්‍රධාන කර්තව්‍යය එයයි.

උරාල් ප්‍රදේශයේදී, සයිබීරියාවේදී සහ උක්‍රේනියාවේදී දක්නා ලද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පරිදි, විනයට අඩංගු නැති සේනාංකවල ගරිල්ලා ස්වභාවයේ හැඟීම හා හිතුවක්කාර කටයුතුද, මධ්‍යම අධිකාරිවලට අකීකරු වීමද, විනාශය කැඳවන නිසා, වසංගතයකට මෙන් එයට බිය විය යුතුය.

රතු හමුදුවට හෝ එය තුළ ක්‍රමවත් භාවය හා විනය පවත්වා ගැනීමට හෝ, කොන්දේසි විරහිත සහ ආත්මාර්ථයෙන් තොරව තමන්ගේ මුළු ශක්තියෙන් ආධාර නොකරන තැනැත්තේ, පාවා දෙන්නෙක් හා ද්‍රෝහිත්වය පතුරුවන්නෙක් වේ. ඔහුට කිසිම අනුකම්පාවක් නොදැක්විය යුතුය.

අපට ශක්තිමත් රතු හමුදුවක් තිබෙන කල අපි අනභිභවනීය වන්නෙමු. අපට ශක්තිමත් රතු හමුදුවක් නොමැති කල අනිවාරණීය වශයෙන්ම අප කොල්චාක්ට, දෙනීකින්ට හා යූදෙනිච්ට ගොදුරු වනු ඇත.

දෙවැනි පාඩම. ගබඩා කරගත් විශාල ධාන්‍ය තොග නොමැති කල රතු හමුදුව ශක්තිමත් විය නොහැකිය. ධාන්‍ය තොග නොමැති කල යුද්ධ හමුදුවක් නිදහස් ලෙස තැනින් තැන ගෙන යාම හෝ නිසි ලෙස පුහුණු කිරීම හෝ කළ නොහැකිය. එමෙන්ම, ධාන්‍ය තොග නොමැති කල හමුදුවට අවශ්‍ය දෑ නිපදවන කම්කරුවන් නඩත්තු කිරීමටද නොපුළුවන.

දැන් රතු හමුදුවේ ජයග්‍රහණ ප්‍රමාණවත් තරම් ඉක්මන් හා ස්ථිර නොවන්නේ ප්‍රධාන වශයෙන් රජයේ ගබඩාවල ධාන්‍ය තොග අඩු පාඩු වීමේ හේතුවෙන් බව පංති විඥනය ඇති සෑම කම්කරුවෙක්ම දැන ගත යුතුය — මතක තබා ගත යුතුය. තමන්ගේ අතිරික්ත ධාන්‍ය රජයට භාර නොදෙන තැනැත්තා කොල්චාක්ට ආධාර කරන්නෙකි. ඔහු ද්‍රෝහියෙකි. කම්කරුවන් හා ගොවීන් පාවා දෙන්නෙකි. ඔහු රතු හමුදුවේ දස දහස් ගණන් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ මරණවලට හා දුක් පීඩාවලට වග කිව යුත්තේ වෙයි.

හොරු, අධිලාභ ලබන්නෝ හා අන්ත අඥාන ගොවියෝ මෙසේ තර්ක කරති: මගේ ධාන්‍ය විවෘත වෙළෙඳ පොළේ විකිණීම වඩා හොඳයි. එවිට, ඒ සඳහා රජයෙන් නියම කළ මිළට වඩා මුදලක් මට ලැබෙන්නේය.

එහෙත්, නිදහස් අලෙවිය අධිලාභ ලැබීමට ආධාර වෙයි. ප්‍රධාන කරුණ එයයි. එයින් කීප දෙනෙක් පොහොසත් වෙති. පොහොසතුන් පමණක් තෘප්තිය ලබති. ඒ අතර වැඩ කරන පොදු ජනයා සාගින්නට හසු වෙති. සයිබීරියාවේ හා උක්‍රේනියාවේ ධාන්‍ය නිපදවන ඉතාමත් සාරවත් දිස්ත්‍රික්කවල එය සිදුවනු අපි ව්‍යවහාරයෙන් දුටුවෙමු.

නිදහස් ධාන්‍ය අලෙවිය සමගම ප්‍රාග්ධනය ජයග්‍රාහී වන්නේය. ඒ අතර ශ්‍රමිකයෝ සයින් පෙළෙති — දුක් විඳිති.

නිදහස් ධාන්‍ය අලෙවිය සමගම, ධාන්‍ය පූඩයක මිළ රූබල් දහස් ගණනක් දක්වා නගියි. එයින් මුදලෙහි අගය ක්ෂය වේ. ජනතාව තව

තවත් දුප්පත් වන අතර, අධිලාභ ලබන්නෝ අතලොස්සක් එයින් වාසි ලබති.

නිදහස් ධාන්‍ය අලෙවිය සමග ආණ්ඩුවේ ධාන්‍ය ගබඩා හිස් වෙයි. යුද්ධ හමුදුව ශක්තියෙන් පිරිහෙයි. කර්මාන්ත මැරී යයි. එවිට කොල්චාක්ගේ සහ දෙනීකින්ගේ ජයග්‍රහණය වැලැක්විය නොහැකිය.

විඥත ලෙස නිදහස් ධාන්‍ය අලෙවියට පක්ෂ වන්නේ පොහොසතුන්ද, කම්කරු හා ගොවි ආණ්ඩුවේ පරම සතුරන්ද පමණකි. නිදහස් ධාන්‍ය අලෙවියෙන් අදහස් වන්නේ කොල්චාක්ගේ සහ දෙනීකින්ගේ ජයග්‍රහණය බව සයිබීරියාවේ හා උක්‍රේණියාවේ නිදර්ශනයෙන් වටහා ගැනීමට, එයට අවිඥත ලෙස පක්ෂ වන අය උගත යුතුය.

පහත සඳහන් පරිදි තර්ක කරන, කාරණා නොදත් ගොවීහු තවමත් සිටිති. ප්‍රථමයෙන්ම, මගේ ධාන්‍යවලට හුවමාරු වශයෙන් යුද්ධයෙන් පෙර පැවති මිළට රජයෙන් හොඳ භාණ්ඩ දිය යුතුය. එවිට මම මගේ අතිරික්ත ධාන්‍යය දෙන්නෙමි. නො එසේ නම් නොදෙමි. මෙවැනි තර්ක ඉදිරිපත් කිරීමෙන්, හොරුන්ගේ සහ ඉඩම් හිමියන්ගේ ආධාර කරුවෝ බොහෝ විට නූගත් ගොවීන් රවටති.

කොන්ස්තන්තිනෝපලය නිසා කරන ලද් කොල්ලකාරී යුද්ධයේ සතර අවුරුද්දක් තුළ ධනපතියන් විසින් සම්පූර්ණයෙන්ම විනාශ කරන ලද රටක, දැන් පළිගැනීම් වස් කොල්චාක්ලා හා දෙනීකින්ලා විසින් මුළු ලෝකයේම ධනපතියන්ගේ ආධාර ඇතිව නැවතත් වනසනු ලබන රටක, කර්මාන්තය ඇනහිට තිබෙන නිසා, මෙම අවස්ථාවේදී ගොවියාට භාණ්ඩ සැපයීම එහි කම්කරු රාජ්‍යයට කළ නොහැකි බව තේරුම් ගැනීම අපහසු දෙයක් නොවනු ඇත. ආහාර නැත. ඉන්ධන නැත. කර්මාන්ත නැත.

අතිරික්ත ධාන්‍ය වෙනුවට කාර්මික භාණ්ඩ ලැබීමේ කොන්දේසිය මත අතිරික්ත ධාන්‍යය කුසගින්නේ සිටින කම්කරුවන්ට ණයට දිය යුතු බව සිහිබුද්ධිය ඇති සෑම ගොවියෙක්ම පිළිගන්නවා ඇත.

දැන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය එයයි. කිසිම විශේෂයක් නොමැතිව සියලුම අතිරික්ත ධාන්‍ය ණයක් ලෙසට කම්කරු රජයට භාර දිය යුතු බවත්, කර්මාන්ත යළි නගා සිටුවා ගොවීනට කාර්මික භාණ්ඩ සැපයීම රජයට කළහැකි වන්නේ එවිට බවත්, පංති හැඟීමක් ඇති හා කල්පනාකාරී සියලුම ගොවීහු පිළිගනිති. හොරුන් හා අධිලාභ ලබන ජාවාරම් කාරයින් හැර අන් සියල්ලෝම එය පිළිගනිති.

එහෙත්, ගොවීන්ගේ අතිරික්ත ධාන්‍ය ණයට දීමට තරම් විශ්වාසය, ඔවුහු කම්කරු රජය කෙරෙහි තබත්දැයි යන ප්‍රශ්නය අපෙන් අසන්නට ඉඩ තිබේ.

ණය සඳහා භාණ්ඩාගාර නෝට්ටු ස්වභාවයේ ඔප්පු රජයෙන් දෙන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බව අපගේ ප්‍රථම පිළිතුර ය. දෙවැනිව, කම්කරු රාජ්‍යය වැඩ කරන ජනතාවට ආධාර කරන බවත්, ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට විරුද්ධව සටන් කරන බවත්, සියලුම ගොවියෝ පළපුරුද්දෙන් දනිති. සෝවියට් රාජ්‍යය කම්කරු-ගොවි රාජ්‍යයක් යයි කියනු ලබන්නේ එනිසාය. තුන්වැනිව ගොවියනට අනුගමනය කළහැකි වෙනත් විකල්පයක් නොමැත. ඔහු එක්කෝ කම්කරුවා විශ්වාස කළ යුතුය. නැතහොත් ධනපතියා විශ්වාස කළ යුතුය. ඔවුන්ගේ විශ්වාසයත්, ඡන්දයත්, එක්කෝ කම්කරු රජයට, නැතහොත්, ධනපති රජයට දිය යුතුය. රුසියාවේ හෝ අන් කිසිම රටක හෝ, වෙනත් විකල්පයක් නොමැත. ගොවීන්ගේ පංති විඥානය වැඩි වූ තරමට ඔවුහු තරයේ කම්කරුවාගේ පැත්ත ගනිති. එවිට, ඉඩම් හිමියන්ගේ හා ධනපතියන්ගේ බලය යළි ස්ථාපිත වීම වැලැක්වීම පිණිස සෑම අතින්ම කම්කරු රාජ්‍යයට ආධාර කිරීමට ඔවුන් ගන්නා තීරණය වඩාත් අධිෂ්ඨාන සහගත වන්නේය.

තුන්වැනි පාඩම. කොල්චාක් හා දෙනිකින් සම්පූර්ණයෙන්ම පරාජය කිරීමට නම්, විප්ලවවාදී ක්‍රමානුකූලභාවය ඒකාන්ත ලෙසම පවත්වා ගත යුතුය. සෝවියට් ආණ්ඩුවේ නීති සහ උපදෙස් නොවෙනස් ලෙස පිළිපදිනු ලැබිය යුතුය. සියලු දෙනාම ඊට අවනත වන බවට සුපරීක්ෂාකාරී ලෙස වග බලා ගත යුතුය.

ඉතා සුළු වශයෙන් හෝ පවතින අවුල් තත්වය වුවද, සුළු වශයෙන් හෝ සෝවියට් නීති උල්ලංඝනය කිරීම වුවද, යම්තමින් හෝ දක්වන ලිහිල, නැතහොත්, නොසැලකිළිමත්භාවය වුවද, ඉඩම් හිමියන් හා ධනපතියන් ශක්තිමත් වීමට සැනෙකින් හේතුවන බව ඔප්පු කරන පැහැදිලි නිදර්ශනයක්, කොල්චාක් සයිබීරියාවේදී සහ උරාල් ප්‍රදේශයේදී ලැබූ ජයග්‍රහණයන්ගෙන් අප සියලු දෙනාටම දැක ගත හැකි විය. ඉඩම් හිමියන් හා ධනපතියන් විනාශ වී නැත. තමන් සම්පූර්ණයෙන්ම පරාජය වීයයි ඔවුහු නොසිතති. වරක් පරාජය වූ ඔවුන් සැඟවී සිටින බවත්, නිශ්ශබ්දව සිටින බවත්, බොහෝ විට "ආරක්ෂාව සලසන" "සෝවියට් වර්ණය" ගෙන වෙස් මාරු කරගෙන සිටින බවත්, සෑම ඥානවන්ත කම්කරුවෙක්ම හා ගොවියෙක්ම දනියි. ඉඩම් හිමියන් බොහෝ දෙනෙක් රජයේ ගොවිපල වලට රිංගාගෙන ඇත. බොහෝ ධනපතියෝ "ප්‍රධාන පරිපාලන ආයතනවලට" හා "මධ්‍යම මණ්ඩලවලට" රිංගාගෙන සිටිති. ඔවුහු සෝවියට් නිලධාරීන් මෙන් රඟපාති. සෝවියට් ආණ්ඩුව ගන්නා සෑම පියවරක්ම සුපරීක්ෂාකාරී ලෙස බලා සිටින ඔවුන්, එය වරදක් කරන තෙක්, දුර්වල කමක් පෙන්වන තෙක් බලා සිටින්නේ, එය බලයෙන් නෙරපා දැමීමේ අටියෙනි. ඔවුන් බලා සිටින්නේ අද චෙකොස්ලොවැකියානුන්ටත්,[4] හෙට දෙනිකින්ටත්, උදව් කිරීමේ අදහසිනි.


Российская Социалистическая Федеративная Советская Республика.

„Пролетарии всех стран, соединяйтесь!"

№ 6. Речи и беседы агитатора. № 6.

В. И. Ленин.

ПИСЬМО К РАБОЧИМ И КРЕСТЬЯНАМ

по поводу победы над Колчаком.

Цена 1 руб.

Государственное Издательство.
Москва.—1919.

වී. අයි. ලෙනින් ලියූ "කොල්චාක් පරදවා ජයග්‍රහණය ලැබීම සම්බන්ධයෙන් කම්කරුවන්ට හා ගොවිජනතාවට ලිපියක්" නැමති පොත් පිංචෙහි පිට කවරය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හිස ඔබාගෙන සිටින මෙම සොරුන්, ඉඩම් හිමියන් හා ධනපතියන්, කුමන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමට සුදුසු අවස්ථාව එළඹෙන තෙක් ඉවසිලිමත් ලෙස බලා සිටින නිසාත්, ඔවුන් වැඩ කරන ජනතාවට විරුද්ධ ඉතාමත් ශූර, කපටි හා කෘතහස්ත සතුරන් වන නිසාත්, ඔවුන් සොයාගෙන එළියට ඇද දමා, ඔවුන් ගෙන සිටින වේෂය ගැන නොතකා ඔවුන් හෙළිදරව් කර, අනුකම්පා විරහිත ලෙස ඔවුන්ට දඬුවම් දීමට අවශ්‍ය සියල්ලක්ම කළ යුතුය. ඔවුහු, සෝවියට් බලයට හානි පැමිණවීම සඳහා කුමණ හෝ අපරාධයක් වුවද කිරීමට පසුබට නොවන කඩාකප්පල් කාරයෝ වෙති. වැඩ කරන ජනතාවගේ මෙම සතුරන්ට, ඉඩම් හිමියන්ට, ධනපතියන්ට හා කඩාකප්පල් කාරයින්ට හා ප්‍රතිවිප්ලවවාදීන්ට, අපි කිසිම අනුකම්පාවක් නොදැක්විය යුත්තෙමු.

මොවුන් අල්ලාගත හැකි වනු පිණිස අපි දක්ෂ ලෙස, ප්‍රවේසම් සහිතව හා පංති විඥනයෙන් යුතුව කටයුතු කළ යුත්තෙමු. ඉතාමත් සුළු වශයෙන් හෝ ඇතිවන අවුල් වියවුල් ගැනත්, සෝවියට් ආණ්ඩුවේ නීති විඥත ලෙස අනුගමනය කිරීම ස්වල්ප ලෙස හෝ මග හරින අවස්ථා ගැනත්, දැන ගැනීමට අපි සුපරීක්ෂාකාරී විය යුත්තෙමු. ඉඩම් හිමියන් හා ධනපතියන් ශක්තිමත්ව සිටින්නේ ඔවුන්ගේ දැනුම, පළපුරුද්ද හා ලෝකයේ ධනවත්ම රටවලින් ලැබෙන ආධාර නිසා පමණක්ම නොවේ. ‘‘පරණ පුරුදු ක්‍රමයට’’ ජීවත් වීමට කැමති පුළුල් ජනතාවගේ ගති සිරිත් හා නොදැනුවත් කම නිසාද, සෝවියට් නීති තරයේ හා අවබෝධයෙන් යුතුව අනුගමනය කිරීමේ අවශ්‍යතාවය ගැන එම ජනතාවට වැටහීමක් නොමැති නිසාද, ඉඩම් හිමියෝ සහ ධනපතියෝ ශක්තිමත් වෙති.

මඳ වශයෙන් හෝ නීතියෙන් පිට පැනීම, සුළු වශයෙන් හෝ සෝවියට් නීතිය හා සාමය කඩ කිරීම වැඩ කරන ජනතාවගේ සතුරන් විසින් වහාම ප්‍රයෝජනයට ගනු ලබන දුර්වල කමක් වන්නේය. එය කොල්චාක්ගේ හා දෙනීකින්ගේ ජයග්‍රහණවලට මුල පිරීමක් වන්නේය. චෙකොස්ලොවැකියානුන් සම්බන්ධයෙන් දැක්වූ ඉතාමත් සුළු අපරීක්ෂාකාරිත්වයක් මගින්, රෙජිමේන්තු සමහරක් දැක්වූ ඉතාමත් නොවැදගත් ස්වභාවයේ අකීකරු කමක් මගින් කොල්චාක් ව්‍යාපාරය ආරම්භවූ බව අමතක කිරීම අපරාධයකි.

හතරවැනි පාඩම. කොල්චාක් ව්‍යාපාරය ඉතාමත් සුළු කරුණුවලින් ආරම්භ වූ බව පමණක් නොව, මෙන්ෂෙවික්වරුන් (‘‘සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්’’) සහ එස්ආර්වාදීන් (‘‘සමාජවාදී-විප්ලවවාදීන්’’) එහි උපතට හවුල් වූ බවත්, එයට කෙළින්ම ආධාර කළ බවත්, අමතක කිරීම අපරාධයක් වනු ඇත. දේශපාලන පක්ෂ කියන දේ අනුව නොව, කරන දේ අනුව ඒවා ගැන විනිශ්චයකට එළඹීමට අප දැන් උගත යුතුය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙන්ෂෙවික්වරු හා සමාජවාදී-විප්ලවවාදීහු තමන් සමාජවාදීන් යයි කියා ගනිති. එහෙත් සත්‍ය වශයෙන් ඔවුහු ප්‍රතිවිප්ලවවාදීන්ට අනුබල දෙන්නෝ වෙති; ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට අනුබල දෙන්නෝ වෙති. තනි වූ එක් සිද්ධිවලින් පමණක් නොව, රුසියානු විප්ලවයේ විශාල අදියර දෙකකින්ද මෙය ඔප්පු වී තිබේ. එම කාල සීමා නම්, 1) කෙරෙන්ස්කි ව්‍යාපාරය[5] හා 2) කොල්චාක් ව්‍යාපාරය ය. මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු තමන් ''සමාජවාදීන්'' හා ''ප්‍රජාතන්ත්‍රවාදීන්'' වන බව ප්‍රකාශ කරමින්, මෙම අදියර දෙකෙහිදීම, ඇත්ත වශයෙන් සුදු හමුදාවට අනුබල දීමේ කාර්ය කොටසක් ඉටු කළහ. එසේ වූ කල, ඔවුන්ට ''නැවත උත්සාහ කර බැලීමට'' අවස්ථාවක් දෙන ලෙස යෝජනා කරමින් ''එක්සත් වාමාංශික (නැතහොත්, ප්‍රජාතන්ත්‍රවාදී) පෙරමුණක්'' සඳහා ඔවුන් අපට ආයාචනා කරන නිසා පමණක්ම, දැන් ඔවුන් විශ්වාස කිරීමට තරම් අපි මෝඩයෝ වෙමුද? කොල්චාක් පිළිබඳ අත්දැකීමෙන් පසුව, මෙන්ෂෙවික් වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් සමග ''එක්සත් පෙරමුණක්'' යන්නෙහි අර්ථය වන්නේ, කොල්චාක්ට අනුබල දුන්නවුන් සමග එක්සත් පෙරමුණක්ය යන්න බව තවමත් වටහා ගත නොහැකි ගොවීහු සිටිත්ද? සිටියත් ඒ තනි පුද්ගලයන් කීප දෙනෙක් පමණකි.

මෙන්ෂෙවික්වරුන්ට හා සමාජවාදී-විප්ලවවාදීන්ට ඔවුන්ගේ වරද අවබෝධ වී ඇතැයිද, ඔවුන් ධනපති පංතිය සමග වූ ඔවුන්ගේ සන්ධානය අතහැර දමා ඇතැයිද යන්න මීට විරුද්ධ අදහසක් ලෙසට ඉදිරිපත් කිරීමට ඉඩ තිබේ. නමුත් එය ඇත්තක් නොවේ. ප්‍රථමයෙන්ම, දක්ෂිණාංශික මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදීන් එවැනි සන්ධානයක් අත් හැර දමා නොමැත. එමෙන්ම, මෙම 'දක්ෂිණාංශිකයිනට'' තමන් අන්‍යයන්ගෙන් වෙන් කරන සීමා රේඛාවක්ද නොමැත. එවැනි සීමා රේඛාවක් නැත්තේ ''වාමාංශික'' මෙන්ෂෙවික්වරුන්ගේ සමාජවාදී-විප්ලවවාදීන්ගේ වරදිනි. ඔවුන් කට වචනයෙන් ඔවුන්ගේ ''දක්ෂිණාංශිකයන්'' හෙළා දකින නමුත්, ඔවුන් මොනවා කීවත්, දක්ෂිණාංශිකයන් සමග සසඳන කල, ඇත්ත වශයෙන්ම ඔවුහු දුබලයෝ වෙති. දෙවැනිව, ඉතාමත්ම හොඳ මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදීන් පවා ඉදිරිපත් කරන්නේ ඇත්ත වශයෙන්ම කොල්චාක් අදහස්ය — ධනපතියන්ට, කොල්චාක්ට හා දෙනිකින්ට ආධාර දෙන හා ඔවුන්ගේ කැත, මිනීමරු ධනපති අදහස්වලට හොඳ මුහුණුවරක් දීමට ආධාර කරන අදහස්ය. එම අදහස් නම්, ප්‍රජාතන්ත්‍රය, සර්වජන, සමාන හා ඍජු ඡන්දය, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය, පුවත් පත් නිදහස, ආදිය හා සම්බන්ධ ඒවාය. මෙම ''ප්‍රජාතන්ත්‍රවාදය'' යන බොරුවම යොදා ගනිමින් ධනපති පාලනයත්, යටත් විජිත වහල් කර ගැනීමේ යුද්ධත්, සාධාරණ බව කියා

පාන ධනපති සමූහාණ්ඩු ලෝකයේ සැම තන්හිම අපට දක්නට ලැබේ. අපගේ රටෙහිම, කොල්චාක්, දෙනිකින්, යුදේනිච් හෝ වෙනත් ඕනෑම සේනාධිපතියෙක්, හිටිවනම එවැනි ''ප්‍රජාතන්ත්‍රවාදී'' පොරොන්දු දෙන බව අපට පෙනෙන්නට තිබේ. වාචක පොරොන්දු කෙරෙහි පමණක් විශ්වාසය තබමින්, ප්‍රසිද්ධ මංකොල්ලකාරයෙකුට ආධාර කරන මිනිසෙක් කෙරෙහි අපට විශ්වාසය තැබිය හැකිද? මෙන්ෂෙවික්වරු හා සමාජවාදී-විප්ලවවාදීහු සියලු දෙනාම, කිසිම විශේෂයක් නොමැතිව, සුප්‍රසිද්ධ මංකොල්ල කාරයින්ට, එනම් අධිරාජ්‍යවාදීන්ට ආධාර දෙති — ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී සටන් පාඨ උපයෝගි කර ගනිමින් ඔවුන්ගේ රාජ්‍ය බලයත්, රුසියාවට විරුද්ධ ඔවුන්ගේ ප්‍රහාරක ව්‍යාපාරයත්, ඔවුන්ගේ ප්‍රතිපත්තියත්, දීප්තිමත් වර්ණයෙන් අලංකාර කරති. මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු සියලු දෙනාම අප සමග ''සන්ධානයකට'' ඒමට කැමැත්ත පළ කරන්නේ, අප ධනපතියන්ට හා ඔවුන්ගේ නායකයන් වන කොල්චාක්ට හා දෙනිකින්ට සහනයක් දිය යුතුය යන කොන්දේසිය මතය. නිදසුනක් වශයෙන් (මුළු මිත්‍ර ගිවිසුමෙහිම[6] කෝටිපතියන්ගේද, රුසියාවට විරුද්ධව කුමන්ත්‍රණ මෙහෙයවන ධනවත්ම රටවල් සියල්ලෙහිම සන්ධානයෙහිද අපට විරුද්ධව ත්‍රස්තය එල්ල කර තිබියදී) අප ''ත්‍රස්තය අත් හළ යුතුයැ'' යිද, නැතහොත්, ධාන්‍ය වෙළෙඳාමේ නිදහස සඳහා මාර්ගය විවෘත කළ යුතු යයිද, යනාදී වූ කොන්දේසි ඉදිරිපත් කරනු ලැබේ. මෙන්ෂෙවික්වරුන්ගේ සහ සමාජවාදී-විප්ලවවාදීන්ගේ එම ''කොන්දේසි'' වල අර්ථය මෙයයි. මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් වන අපි, සැම සහනයක්ම තමන්ගේ වාසියට හරවා ගනිමින් බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව සටන් කරන ධනපතියන් දිශාවට වැනෙන්නෙමු. එමෙන්ම, අපට බොල්ෂෙවික්වරුන් සමග ''එක්සත් පෙරමුණක්'' අවශ්‍යය. මගේ මෙන්ෂෙවික් හා සමාජවාදී-විප්ලවවාදී මහත්වරුනි, ඔබ කෙරෙහි විශ්වාසය තැබීමෙහි සමත් අය තවදුරටත් රුසියාව තුළ සෙවීමෙන් පළක් නොවේ. මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් සුදු හමුදාවට අනුබල දෙන බවත්, ඉන් සමහර දෙනෙක්, දැන දැනම හා ද්වේශ සහගත ලෙස එසේ කරන බවත්, අන් අය ඔවුන්ගේ පැරණි වැරදි කෙරෙහි එල්බ සිටීම නිසා එසේ කරන බවත්, කෙසේ හෝ වේවා, ඔවුන් සුදු හමුදාවට ආධාර දෙන්නන්ම වන බවත්, රුසියාවේ පංති හැඟීමෙන් යුතු කම්කරුවෝ හා ගොවීහු දනිති.

පස්වැනි පාඩම. කොල්චාක් හා ඔහුගේ පාලනය යළිත් හිස නො ඔසවන සේ විනාශ කිරීමට නම් ගොවීන් සියලු දෙනාම නොපැකිල තමන්ගේ තීරණය ගත යුත්තේ කම්කරු රාජ්‍යයට පක්ෂවය. බොල්ෂෙවික්වරුන්ගේ, නැතහොත්, කොමියුනිස්ට්වරුන්ගේ ''එක පක්ෂයක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආඥාදායකත්වය'' බිල්ලෙකුසේ පෙන්වමින්, සමහරු (විශේෂයෙන්ම, මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු සියලු දෙනාම — ''වාමාංශිකයන්'' පවා ඔවුන් අතර වෙති), ගොවීන් බියවැද්දීමට උත්සාහ කරති.

මෙම බිල්ලාට බිය නොවීමට තරම් සෑහෙන පාඩම් ගොවීන්ට කොල්චාක් පාලනයෙන් ලැබී ඇත.

එක්කෝ ඉඩම් හිමියන්ගේ ආඥාදායකත්වය (එනම්, අයෝමය පාලනය) ඇති වන්නේය. නැතහොත් කම්කරු පංතියේ ආඥාදායකත්වය ඇති වන්නේය.

මැද මාවතක් නොමැත. රදළ උරුමක්කාරයින්ද, බුද්ධිවාදීන්ද, වංශවත් පුංචි මහත්වරුන්ද, නරක පොත්වලින් නරකට උගත් අයද, මැද මාවතක් ගැන සිහින දකිති. ලෝකයේ කිසිම තැනක මැද මාවතක් නැත. තිබෙන්නට පුළුවන් කමක්ද නැත. එක්කෝ (සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික් වරුන් කියන ජනතා ආණ්ඩුව, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය, නිදහස, යනාදී වූ සටන් පාඨ නැමති පිරුවටයෙන් අලංකාර වූ) ධනපති ආඥාදායකත්වය; නැතහොත්, නිර්ධන පංතියේ ආඥාදායකත්වයය. දහනව වැනි ශත වර්ෂයේ මුළු ඉතිහාසයෙන්ම මෙය උගෙන ගැනීමට අසමත් වූ අයෙක් වෙතොත්, හේ අන්ත මෝඩයෙකි. කෙරෙන්ස්කි හා කොල්චාක් යටතේ මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදීන් මැද මාවතක් පිළිබඳ සිහින මැව්වේ කෙසේද යන්න, රුසියාවේ අපි සියලු දෙනාම දැක ඇත්තෙමු.

මෙම සිහිනවලින් සේවයක් වූයේ කාටද? ඒවා ආධාරයක් වූයේ කාටද? කොල්චාක්ට හා දෙනිකින්ටය. මැද මාවතක් ගැන සිහින දකින්නෝ කොල්චාක්ට අනුබල දෙන්නෝ වෙති.

ධනපති පංතියේ ආඥාදායකත්වයත්, කම්කරු පංතියේ ආඥාදායකත්වයත් සංසන්දනය කර බැලීමේ අවස්ථාවක් උරාල් ප්‍රදේශයේ සහ සයිබීරියාවේ කම්කරුවන්ට ලැබිනි. කම්කරු පංති අංඥාදායකත්වය ක්‍රියාත්මක කරනු ලබන්නේ, 1905 පටන් ඇත කාලයක සිට මුළු මහත් විප්ලවවාදී නිර්ධන පංතියම සමග එකට සංයෝග වුනු බොල්ෂෙවික් පක්ෂය විසිනි.

කම්කරු පංති ආඥාදායකත්වය යනුවෙන් අදහස් වන්නේ, කම්කරු රාජ්‍යය විසින් කිසිම පැකිලීමක් නොමැතිව, ඉඩම් හිමියන් හා ධනපතියන්ද, මෙම සූරාකන්නන්ට උදව් දෙන පාවාදෙන්නන් හා ද්‍රෝහීන්ද, මර්දනය හා පරාජය කරනු ලබන බවයි.

කම්කරු රාජ්‍යය යනු, ඉඩම් හිමියාගේ හා ධනපතියාගේත්, අධිලාභ ලබන ජාවාරම් කාරයාගේ හා වංචා කාරයාගේත් පරම සතුරෙකි. එය පෞද්ගලික ඉඩම් හා ප්‍රාග්ධනය හිමිකමෙහිද, මුදල් බලයෙහිද සතුරෙකි.

වැඩ කරන ජනතාවට සහ ගොවි ජනතාවට සිටින එකම පක්ෂපාත මිතුරා සහ ආධාර කරුවා කම්කරු රාජ්‍යයයි. ව්‍යවහාරයේදී ''කම්කරු පංතියේ ආඥාදායකත්වය'' යනුවෙන් අදහස් වන්නේ ප්‍රාග්ධනය දෙසට නැඹුරු වීමක් නොව, එයට විරුද්ධව සටන් කිරීම සඳහා වූ වැඩ කරන ජනතාවගේ සන්ධානයකි, කම්කරුවන්ගේ හා ගොවිජනයාගේ රාජ්‍ය බලයකි, සෝවියට් රාජ්‍ය බලයකි.

මෙම කම්කරු ආඥාදායකත්වය යන වචනවලින් ගොවීන් බිය වැද්දීමට මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු අපේක්ෂා කරති. ඔවුන්ගේ එම අපේක්ෂාවන් සාර්ථක වන්නේ නැත. මෙම වචනවලින් අදහස් කරන්නේ, කොල්චාක්ගෙන් ගැලවීම ලැබීම සඳහා නැතිවම බැරි දෙය වන බව කොල්චාක්ගෙන් පසුව, ඉතාමත් දුරබැහැර ප්‍රදේශවල ගොවීහු පවා දනිති.

වැනෙන එවුන් ද, ප්‍රාග්ධනයට ආධාර වන ආකාරයට වැරදි කරන සහ ප්‍රාග්ධනයේ සටන් පාඨ හා පොරොන්දුවලින් වසඟ වූ එවුන්ද, භංග වේවා! කොල්චාක් පාලනයෙන් උගත යුතු අන්තිම හා ඉතාමත් වැදගත් පාඩම ප්‍රාග්ධනයට විරුද්ධව සමා නැති සටනත්, වැඩ කරන ජනතාවගේ සන්ධානයත්, ගොවි ජනයා හා කම්කරු පංතිය අතර සන්ධානයත්, අවශ්‍යය යනුයි.

1919 අගෝස්තු 24

ප්‍රාව්ද අංක 190
1919 අගෝස්තු 28

වි. අයි ලෙනින්. සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 39, පිටු 151–159

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පෙත්‍රොග්‍රාද් කම්කරුවන්ගේ ආදර්ශය

පෙත්‍රොග්‍රාදයේ කම්කරුවන් බලගතු ලෙසින් සේනා සංවිධානය කිරීමෙහිත්, හොඳම කම්කරුවන් දකුණු පෙරමුණට යැවීමෙහිත්, යෙදී සිටින බව දැනටමත් පුවත් පත්වල වාර්තා වී තිබේ.

LIBERATIONBASE

දෙනීකින් විසින් කුර්ස්ක් අල්ලාගෙන තිබීමෙන්ද, ඔහු ඕර්යෝල් බලා ඉදිරියට එමින් සිටීමෙන්ද, පෙත්‍රොග්‍රාද් නිර්ධන පංතියේ ධෛර්යමත් ක්‍රියාවට හේතුව පැහැදිලි වේ. අනිත් කාර්මික මධ්‍යස්ථානවල කම්කරුවන්ද පෙත්‍රොග්‍රාද් කම්කරුවන්ගේ ආදර්ශය අනුගමනය කළ යුතුය.

දෙනීකින් කල්ලිය බලාපොරොත්තු වන්නේ අපගේ පිරිස් අතර තැතිගැන්ම පැතිරවීමටය. ආරක්ෂාව ගැන පමණක්, දැනට ඉදිරිපත්ව ඇති කරුණ ගැන පමණක් කල්පනා කරන තත්වයට අපගේ පිරිස ඇද දැමීමටය. ප්‍රංශුවන් හා බ්‍රිතාන්‍යයන් කොතරම් උත්සුක්ත ලෙස දෙනීකින්ට උදව් කරන්නේද යනු, අවි ආයුධ එවීමෙන් හා රූබල් දශ කෝටි ගණනින් මුදල් දීමෙන් ඔවුන් ඔහුට කෙසේ ආධාර කරන්නේද යනු, විදේශීය ගුවන් විදුලියෙන් පැහැදිලි වේ. මොස්කව් නගරයට මාර්ගය විවෘත වී ඇති බව විදේශ ගුවන්විදුලිය ප්‍රකාශ කරයි. ධනපතියන් අප බිය ගැන්වීමට අපේක්ෂා කරන්නේ ඒ ආකාරයෙනි.

නමුත් අප බිය ගැන්වීමට ඔවුන් සමත් නොවනු ඇත. අපගේ හමුද රැඳවීම සුපරීක්ෂාකාරී ලෙස සැලසුම් කර නියමාකාරයෙන් ක්‍රියාත්මක කර තිබේ. සතුරාගේ ශක්තියෙහි ප්‍රධාන ප්‍රභව මූලය වෙත එල්ල කළ අපගේ ප්‍රහාරය දිගටම කෙරීගෙන යන්නේය. දෙනීකින්ට බරපතල හමුදවක් සංවිධානය කර ගැනීමට එකම ආධාරය වූ සහ තවමත් ආධාර වන කොසැක් ප්‍රදේශය මධ්‍යයට අපගේ හමුද සාර්ථක ලෙස ඉදිරියට යමින් සිටින බව මෑතදී අප ලත් ජයග්‍රහණවලින් — බොගුචාර් ප්‍රදේශයේ තුවක්කු 20 ක් අල්වා ගැනීමෙන් හා වේෂෙන්ස්කයා ගම අල්ලා ගැනීමෙන්

— පෙනේ. කොල්චාක් සුන් කර දමන ලද මෙන්ම, දෙනීකින්ද සුන් කර දැමීම නියතය. අප බියගැන්වීම ඔවුන්ට කළ නොහැකි වනු ඇත. අපි අපගේ සටන ජයග්‍රාහී නිමාවකට පත් කරන්නෙමු.

සතුරා විසින් කුර්ස්ක් අල්වා ගනු ලැබීමත්, ඔහු ඕර්යෝල් බලා ඉදිරියට ඒමත් නිසා, ඔහු එතැනින් පලවා හැරීම සඳහා අතිරේක බල හමුද අවශ්‍ය විය. පෙත්‍රොග්‍රාද් කම්කරුවන් කර්තව්‍යය නිවැරදි ලෙස වටහා ගෙන සිටින බව, ඔවුන් දී තිබෙන ආදර්ශයෙන් පෙනේ. මතුවී තිබෙන අන්තරායන් අපෙන් සඟවන්නේ නැතිව, ඒවා යම් ආකාරයකින් හෝ අඩුවෙන් තක්සේරු නොකර අපි මෙසේ කියන්නෙමු: අපට අතිරේක බලහමුද තිබෙන බව පෙත්‍රොග්‍රාදය අපට පෙන්නුම් කර තිබේ. ඕර්යෝල් වෙත එල්ල කරන ප්‍රහාරය පසු බැස්වීම සහ කුර්ස්ක් සහ හාර්කව් යන දෙකට විරුද්ධව ප්‍රහාරයක් දීම සඳහා, දැනට අපට තිබෙන හමුදවලට අමතරව හොඳම නිර්ධන පංතිකයන් හමුදවලට සංවිධානය කර ගත යුතුය. කුර්ස්ක් අපට අහිමි වීම බරපතල අන්තරායකි. මීට පෙර කිසි කලෙකත් සතුරා මොස්කව් නගරයට මෙතරම් සමීප වූයේ නැත. මෙම අන්තරාය දුරලීම සඳහා, පසු බසිමින් සිටින හමුදවල මනෝභාවය වෙනස් කළ හැකි වනු පිණිස, කලින් තිබුණු යුද්ධ හමුදවලට අමතරව අපි දියුණු කම්කරුවන්ගෙන් සැදුනු අළුත් කණ්ඩායම් පෙරමුණට යවන්නෙමු.

දකුණේ අපගේ හමුද අතර, හමුදවෙන් පලාගිය හා නැවත ආපසු පැමිණි සේනා ප්‍රමුඛ තැනක් ගනිති. ඔවුන් අතුරෙන් ඉතා වැඩි පිරිසක් ආපසු පැමිණ ඇත්තේ ස්වේච්ඡාවෙනි. ඔවුන්ගේ යුතුකම කුමක්ද යනුත්, ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ පාලනය යළිත් ස්ථාපිත වීමේ තර්ජනය කොතරම් බරපතලද යනුත්, පෙන්වා දුන් ප්‍රචාරයෙහි බලපෑම යටතේය. නමුත් පලා ගිය අයගේ ඔරොත්තු දෙන ස්වභාවය අඩුය; දැඩිතර බව අඩුය. බොහෝ විට ඔවුහු සටන් නොකර පසුබැසීමට පටන් ගනිති.

නිර්ධන පංති බලවේගයන් අළුතෙන් ඇතුළු කිරීමෙන් යුද්ධ හමුදව ශක්තිමත් කිරීම ඉතාමත් වැදගත් වන්නේ එනිසාය. එවිට අස්ථාවර කොටස්වලට ශක්තිය ලැබෙනු ඇත; ඔවුන්ගේ ධෛර්‍ය ශක්තිය වැඩිවනු ඇත; තත්වය යහපත් වීමට පටන් ගනු ඇත. අපගේ විප්ලවයේදී නිරන්තරවම සිදු වූ පරිද්දෙන්, නිර්ධන පංතිය වැඩ කරන ජනගහනයේ වැනෙනසුලු කොටස්වලට ආධාර දී, මග පෙන්වනු ඇත.

අන් කාර්මික මධ්‍යස්ථානවල කම්කරුවන්ට වඩා මහත් බරක් ඉසිලීමට දැන් බොහෝ කලක සිටම පෙත්‍රොග්‍රාද් කම්කරුවන්ට සිදු වී තිබේ. සාගතය නිසා සහ රුසියාව මුළුල්ලේ සෝවියට් සභා කටයුතු කිරීම සඳහා හොඳම කම්කරුවන් පිටත් කර යැවීම නිසා, අන් ප්‍රදේශවල

https://liberationbase.wordpress.com

නිර්ධන පංතියට වඩා පෙත්‍රොග්‍රාද් නිර්ධන පංතිය දුක් කරදර වින්දේය.

එසේ වී නමුත්, පෙත්‍රොග්‍රාද් කම්කරුවන් අතර ස්වල්ප හෝ දුර්මුඛභාවයක්, ස්වල්ප හෝ ධෛර්ය හීන බවක් අපට දක්නට නොලැබේ. ඊට ප්‍රතිකූල වශයෙන් ඔවුහු දැඩි වී සිටිති. අළුත් ශක්තියක් උපදවා ගත් ඔවුහු අළුත් සටන් කරුවන් පෙරමුණ වෙත ගෙන ආහ. ඔවුහු, වැඩියෙන්ම ආධාර අවශ්‍ය තැනට ආධාර යවමින්, විශිෂ්ට ලෙස නායක සේනාංකයක කර්තව්‍යය ඉටු කරති.

අපගේ හමුදාවේ දුර්මුඛ වූ සේනාංක ශක්තිමත් කිරීමට අළුත් බල පිරිස් යවන විට වැඩ කරන පොදු ජනතාවට, ගොවි පරපුරෙන් එන සොල්දාදුවන්ට, තමන්ගේම වර්ගයේ නව නායකයන්, වඩාත් දියුණු, වැඩි දේශපාලන විඥානයක් ඇති සහ වඩාත් දැඩි සිත් ඇති වැඩ කරන ජනතාව අතරින් එන නායකයන් ලැබෙන්නේය. අපගේ යුද්ධ හමුදාවට එවැනි ආධාර යැවීමෙන් සතුරාට වඩා තීරණාත්මක වාසියක් හිමි තත්වයට අප පත්වන්නේ එහෙයිනි. සතුරාගේ ගොවි යුද්ධ හමුදාව ශක්තිමත් කිරීමට ඔහු යවන්නේ ඉඩම් හිමියන්ගේ පුතුන් පමණකි. ඔහුගේ යුද්ධ හමුදාව මෙසේ ''ශක්තිමත් කිරීම'' නිසා කොල්චාක් විනාශයට පත්විය. එමෙන්ම දෙනීකින් ද එයින් විනාශ වනු ඇත.

සහෝදර කම්කරුවනි! පෙත්‍රොග්‍රාද් කම්කරුවන් දුන් ආදර්ශය අනුව යමින් ඔබ සියලු දෙනාම අලුත් කටයුත්තෙහි යෙදෙන්න! හමුදාවේ කටයුතු සඳහා වැඩි ධෛර්යයක් යොදන්න. වැඩි ක්‍රියාරම්භකත්වයක් හා එඩිතර බවක් පාන්න. පෙත්‍රොග්‍රාද් නුවරුන්ට වඩාත් සමාන වන ලෙසින් තරඟ වදින්න. එවිට වැඩ කරන ජනතාව ජය ලබනු ඇත. එවිට ඉඩම් හිමියා සහ ධනපති ප්‍රතිවිප්ලවවාදියා පරාජයට පත් වනු ඇත.

පසු සටහන: ඉතාමත් කැප වූ සහෝදරවරු දුසිම් ගණනක් මොස්කව් නගරයෙන්ද පෙරමුණ වෙත ගොස් ඇති බව මට දූත් දනගන්නට ලැබුණි. පෙත්‍රොග්‍රාදයට අනතුරුව මොස්කව් නගරය ක්‍රියාත්මක වී තිබේ. මොස්කව් නගරයෙන් අනතුරුව අන් අය ක්‍රියාත්මක විය යුතුය.

1919 ඔක්තෝබර් 3. එන්. ළෙ.

ප්‍රාව්දා අංක 211, 1919 ඔක්තෝබර් 4.

වී. අයි. ලෙනින් සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 39, පිටු 206–208.

මොස්කව් නගරයේ පක්ෂ සතිය සහ අපගේ කර්තව්‍යයන්

මොස්කව් නගරයේ පක්ෂ සතිය තුළදී සාමාජිකයින් 13,600 ක් පක්ෂයට බඳවා ගන්නා ලදී.

මෙය ඉතා විශාල හා බලාපොරොත්තු නොවූ සාර්ථකත්වයකි. තැතිගැන්ම පතුරුවා හැරීමට සහ දූත් දූත්ම සෝවියට් බලය බිඳ වැටෙන බවටත්, දෙනීකින් ඉක්මණින්ම ජය ගන්නා බවටත් අනාවැකි පැතිරවීමට, මුළු ධනපති පංතිය සහ ස්වකීය ''පාලක'' තත්වය අහිමිවීම ගැන අඳෝනා නගන විශේෂඥයන්, නිලධාරීන් සහ කාර්යාල කාරකවරුන් ඇතුළු නාගරික සුළු ධනපති පංතිය, මෑතදී, විශේෂයෙන්ම මොස්කව් පක්ෂ සතිය තුළදී, ඔවුන්ට හැකි සියල්ලක්ම කර ඇත.

මෙම ''බුද්ධිවාදී'' ජනයා මෙම තැති ගැන්ම පිළිබඳ අවිය කොතරම් දක්ෂ ලෙස හා හැඩ වැඩ ඇතිව මෙහෙයවත්ද! ඒ අනුව එය නිර්ධන පංතියට විරුද්ධව ධනපතියන් කරන පංති අරගලයේ නියම අවියක් බවට පත් වී තිබේ. අප දැනට ගත කරමින් සිටින සමය වැනි කාලසීමාවලදී සුළු ධනපති පංතිය එකම ප්‍රතිගාමී රැළක් ලෙසට ධනපතියන් සමඟ සංයෝග වී ''උද්වේගකර'' ලෙස මෙම අවිය අල්ලා ගනියි.

අන් කවර ප්‍රදේශයකටත් වඩා වෙළෙඳ පිරිස් විශේෂයෙන්ම බලවත් වූයේද, සූරාකන්නන්, ඉඩම්හිමියන්, ධනපතියන් සහ බදු ලබන්නන් වැඩියෙන් සංකේන්ද්‍රණය වී සිටියේද, එසේම, ධනපති සංවර්ධනය නිසා ධනපති බුද්ධිමතුන් එක් තැන් වූයේද, මධ්‍යම රාජ්‍ය පරිපාලනය නිසා අතිශයින් විශාල නිලධාරි පිරිසක් ඇතිවූයේද, මොස්කව් නගරයෙහිය. ධනපති ප්‍රලාප, ද්වේශ සහගත ධනපති කථා සහ තැතිගැන්ම පැතිරවීමට ධනපතියන්ට ඉතාමත් පහසු පසුබිමක් සැපයුනේ මොස්කව් නගරයෙනි. ධනපතියන්ගේ මෙම අවිය ඉතාමත් ''සාර්ථක වීමට'' එක ''සාධකයක්'' වූයේ දෙනීකින්ගේ සහ යුදේනිච්ගේ සාර්ථක ප්‍රහාරය ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එය එසේ වුවත්, දෙනීකින්ගේ "සාර්ථකත්වය" දුටු සහ මෙම සමයේදී කොමියුනිස්ට්වරයෙක් යන නම සහ කොමියුනිස්ට්වරයෙකුට පැවරෙන වගකීම් සම්බන්ධ දුෂ්කරතාවයන්, කරදර සහ අන්තරායන් සියල්ල වටහා ගත් නිර්ධන පංති පොදුජනකාය, ඔවුන් අතුරෙන් දහස් ගණන් පිරිස්, කොමියුනිස්ට්වරුන්ගේ පක්ෂය ශක්තිමත් කිරීමට, රාජ්‍ය පරිපාලනයේ නොඇදහිය හැකි තරම් මහත් බර ඉසිලීමට නැගී සිටියහ.

සෝවියට් බලයේ සාර්ථකත්වය අපගේ පක්ෂයේ සාර්ථකත්වය, පුදුම එලවනසුලු ය!

සෝවියට් බලයට ශක්තිය සහ කල් පවත්නා ගුණය දෙන ප්‍රභව මූලය ඇත්තේ නිර්ධන පංති වටපිටාව තුළ බව, වැඩ කරන ජනතාවගේ නියම නියෝජිතයන් අතර බව, අගනුවර ජනතාවටත්, ඊළඟට මුළු සමූහාණ්ඩුවට සහ මුළු ලෝකයටත්, මෙම සාර්ථකත්වයෙන් ඔප්පු කර තිබේ. දුෂ්කරතාවය සහ අන්තරාය උපරිම මට්ටමින් බලපවත්වන විටෙක ස්වේච්ඡාවෙන් පක්ෂයට ඇතුළත් වීම මෙසේ සාර්ථක වීම වූ කලී, පොදු ජනතාව කෙරෙහි (රාජ්‍ය බලය හසුරුවන) නිර්ධන පංතිය විහිදුවන සදචාර බලපෑමෙහි (වචනයේ හොඳම අර්ථයෙනි) විශේෂ ශක්තිය හා එම බලපෑම ගෙන එන ආකාරයන් පෙන්නුම් කරන්නකි. ධනපති වියගසෙන් ශ්‍රමය මුදා ගැනීමේ මිතුරෝ මෙම බලපෑම නිර්ධන පංති ආඥාදායකත්වයේ අන් සියල්ලටම වඩා අගනා අංගය ලෙසට සලකන නමුදු, එහි සතුරෝ ඔවුන්ගේ කුහකත්වය නිසා එය නොපිළිගනිති.

රාජ්‍ය බලය තම අතෙහි ඇතිව සිටින නිර්ධන පංතියේ ප්‍රමුඛතම කොටස් පෑ ඔවුන්ගේ ආදර්ශය කෙබඳුද යත්, ඔවුන් මුළු අවුරුදු දෙකක්ම (අපගේ දේශපාලන සංවර්ධනයේ ඉතාමත් සීඝ්‍ර වේගීතාවයක් ඉසිලූ විශාල කාලසීමාවක්) මුළුල්ලේ වැඩ කරන ජනතාවගේ උවමනාවන් සඳහා කැපවීමෙන්, වැඩ කරන ජනතාවගේ සතුරන්ට විරුද්ධව (පොදු වශයෙන් සූරා කන්නන්ට විරුද්ධව සහ විශේෂයෙන්ම "දේපල හිමියන්ට" සහ ලාභ ගරන්නන්ට විරුද්ධව) බලවත්සේ අරගල කිරීමෙන්, දුෂ්කර අවස්ථාවලදී නොසැලී ස්ථිරව සිටීමෙන් සහ ලෝක මංකොල්ල කරුවන්ට විරුද්ධව දැඩි ලෙස ප්‍රතිරෝධය දක්වීමෙන්, ගෙන හැර පෑ මහා ආදර්ශය කොතරම් බලවත්ද යත්, කම්කරුවන් හා ගොවිජනතාව ඔවුන්ගේ පෙරමුණු බල ඇණිය කෙරෙහි දක්වන හිතවත්කම ම ප්‍රාති-හාර්යයන් ජනික කිරීමෙහි සමත් වන බව වැඩ කරන පොදු ජනතාවට පෙනී ගොස් තිබේ.

එය ඇත්තෙන්ම ප්‍රාතිහාර්යයකි. අභූත පූර්ව ලෙස සාගිනි දුකින්, ශීතලෙන්, ආර්ථික විනාශයෙන් හා නස්පැත්තියෙන් පෙළෙන කම්කරු-වෝ ඔවුන්ගේ ප්‍රසන්න ජීවගුණය, එනම්, සෝවියට් බලයට සම්පූර්ණ

කැප වීම, ආත්ම පරිත්‍යාගයේ සම්පූර්ණ ධෛර්යය සහ වීරත්වය රැක ගන්නවා පමණක් නොව, ඔවුන්ට පුහුණුවක් හා පළපුරුද්දක් නොමැතිව තිබියදී වුව, රාජ්‍යය නැමති නැව පැදවීමේ බරටද කර ගසති! තවද, එසේ කරන්නේත් කුණාටුව එහි රෞද්‍රභාවයේ උච්ඡ අවස්ථාවට පත්වූ විටය...

අපගේ නිර්ධන පංති විප්ලවයේ ඉතිහාසය එවැනි විප්ලවවලින් ගහනය. හමුවන දුෂ්කරතාවයන් කොතරම් බරපතල වුවත්, ඔවුන් නොවැළැක්විය හැකි ලෙසටම හා නිශ්චිත වශයෙන්ම ලෝක සෝවියට් විප්ලවයේ පූර්ණ ජයග්‍රහණය වෙත මග පෙන්වනවා ඇත.

අළුත් පක්ෂ සාමාජිකයන්ගෙන් නිසි ප්‍රයෝජන ගනු ලබන බවට අපි දූන් වග බලාගත යුත්තෙමු.

ධනපති ක්‍රමය කම්කරුවන් හා වැඩ කරන ගොවි ජනයා තුළ වූ කුසලතාවයන් සම්භාරයක් කේඩැරි කොට, මර්දනය කොට සහ මරා දමා ඇත. අග හිඟ කමේ, දුප්පත් කමේ සහ මිනිස් ගරුත්වය කෙළෙසීමේ පීඩනය යටතේ මෙම කුසලතාවයන් නැසී ගියේය. මෙම කුසලතාවයන් අනාවරණය කොට ගෙන ඒවා උපයෝගි කර ගැනීම දූන් අපගේ යුතුකම වී තිබේ. පක්ෂ සතිය තුළ පක්ෂයට බැඳුනු නව සාමාජිකයන් බොහෝ දෙනෙක් පළ පුරුදුකම් නැති හා රාජ්‍ය පරිපාලන කටයුතු ගැන දැනුමක් නැති අය වෙනවාට සැකයක් නැත. එසේම මෙම ජනයා, ධනපති ක්‍රමය විසින් කෘතීම ලෙස ඔබා තබන ලද, පහළම මට්ටමට හෙළන ලද හා හිස එසවීමට ඉඩ නොදෙන ලද සමාජ කොටස්වලින් එන ඉතාමත් කැපවූ, ඉතාමත් අවංක හා ඉතාමත් දක්ෂ අය බවටද සැකයක් නැත. කෙසේ හෝ වේවා අන් කොටස් අතර දක්නට ලැබෙනවාට වැඩි ශක්තියක්, වේගයක්, දැඩි බවක්, රිජු බවක් හා අවංක බවක් ඔවුන් අතර ඇත.

එනිසා පක්ෂ සංවිධාන සියල්ලම මෙම නව පක්ෂ සාමාජිකයන් වැඩට යොදා ගැනීම ගැන කල්පනාව යොමු කළ යුතුය. ඔවුන් විවිධ වර්ගයේ රාජ්‍ය වැඩකටයුතු සඳහා වඩාත් නිර්භය ලෙස යොදා ගත යුතුය. එසේම සීඝ්‍ර ආකාරයෙන් ඔවුන් ව්‍යවහාරයේ පරීක්ෂණයට භාජනය කළ යුතුය.

මෙහිදී නිර්භය කම යන්නෙහි අර්ථය, නව සාමාජිකයන්ට නොමැති දැනුම අවශ්‍යවන වගකිව යුතු තනතුරු ඔවුන්ට එක්වරම පැවරීම ලෙසට වටහා ගත යුතු නොවේ. අනුබැඳියාවට විරුද්ධව සටන් කිරීමේදී අපි නිර්භය විය යුත්තෙමු. නිලධාරිවාදී ක්‍රම එක්තරා දුරකට හිස එසවීමට හේතුවූ කරුණු අපගේ පක්ෂ වැඩ පිළිවෙළෙන් ඉතාමත් නිශ්චිත ලෙස මතුකර, ඊට විරුද්ධව සටන් කරන විධි ගැන එහි සඳහන් කර තිබෙන්නේ නිකරුණේ නොවේ. ජනතාවගේ තත්වයන්, උවමනා එපා කම් සහ අපේක්ෂාවන් ගැන මැනවින් දන්නා නව සාමාජිකයන් යොදා ප්‍රථම කොටම කාර්යාල සේවකයන්ගේ, නිලධාරීන්ගේ සහ විශේෂඥයන්ගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වැඩ ගැන අධීක්ෂණය කරවීමට අපි නිර්භය විය යුත්තෙමු. මෙම නව සාමාජිකයන්ට සංවර්ධනය වීමට සහ පුළුල් පරිමාණයකින් වැඩ කිරීමෙන් ස්වකීය හැකියාවන් ගෙන හැර පෑමට අවස්ථාවන් වහාම සලසා දීමේදී අපි නිර්භය විය යුත්තෙමු. සුපුරුදු අනුබැඳියාවෙන් බිඳී වෙන්වීමෙහි දී අපි නිර්භය විය යුත්තෙමු. (අප අතරද — කණගාටුවකට මෙන්, බොහෝ විට ස්ථාපිත සෝවියට් අනුබැඳියාව බිඳීමට බලවත් බියක් ඇත. සමහර විට එය ''ස්ථාපිත කර'' තිබෙන්නේ ද පංති විඥනය ඇති කොමියුනිස්ට්වරුන් විසින් නොව, පැරණි නිලධාරීන් හා කාර්යාල සේවකයන් විසිනි.) නව සාමාජිකයන් වඩාත් ඉක්මණින් පරීක්ෂාවට භාජන කිරීම සහ ඔවුන්ට සුදුසු තැන සොයා ගැනීම පිණිස ඔවුන් සඳහා වැඩ ආකෘති විප්ලවවාදී සීඝ්‍රතාවයකින් වෙනස් කිරීමට අප සූදනම් විය යුතුය යන අර්ථයෙන්, අපි නිර්භීත විය යුත්තෙමු.

පැරණි නිලධාරීන්ට භාර කර්තව්‍යයන් ඔවුන් කොතරම් අවංක ලෙස ඉටු කරන්නේද යන්න පරීක්ෂා කිරීමේදී, මෙම නව සාමාජිකයෝ තමන්ම කාර්යය ඉටු කිරීමට ඉක්මණින් උගෙන ගනිත් නම් හා තමන්ම ස්වාධීන ලෙස එම කාර්යයන් භාර ගැනීමට පොහොසත් බව ලබත් නම්, එවැනි බොහෝ අවස්ථාවල නව සාමාජිකයන්ට එම තනතුරු පැවරිය හැකිය. අන් අවස්ථාවලදී, එක් අතකින් කම්කරු සහ ගොවි පොදු ජනතාවද, අනික් අතින් රාජ්‍ය යන්ත්‍රයද, අතර අන්තර් සම්බන්ධය පවත්වන පුරුක් අළුත් කිරීමට හා ශක්තිමත් කිරීමට අදළ කටයුතු සඳහා ඔවුන් යෙදිය හැක. අපගේ කාර්මික ප්‍රධාන පරිපාලන ආයතනවල සහ මධ්‍යම මණ්ඩලවල, අපගේ කෘෂිකාර්මික රාජ්‍ය ගොවිපලවල, තවමත් බොහෝ දෙනෙක්, දැරිය හැකි පමණට වඩා බොහෝ දෙනෙක්, කඩා කප්පල් කාරයෝ, ඉඩම් හිමියෝ සහ ධනපතියෝ සැඟවී සිටිති. ඔවුහු සෑම අතින්ම සෝවියට් බලයට හානි කරති. මධ්‍යස්ථානයේ සහ ප්‍රදේශවල සිටින පළපුරුදු පක්ෂ සාමාජිකයින්, මෙම නපුරට විරුද්ධව සටන් කිරීම සඳහා නව පක්ෂ බලවේගයන් තරයේ උපයෝගි කර ගැනීමෙන් තමන්ගේ කාර්යක්ෂමතාවය පෙන්නුම් කළ යුතුය.

සෝවියට් සමූහාණ්ඩුව එකම යුද්ධ කඳවුරක් විය යුතුය. එහි ප්‍රයත්නය උපරිම පරිමාණයේ විය යුතුය. එහි බලවේගයන් උපරිම ලෙසින් පිරිමසා ගත යුතුය. එහි සියලු අනුබැඳියා සහ විධිමාත්‍ර පුරුදු, හැකි වැඩිම දුරට අඩු කළ යුතුය. එමෙන්ම එහි පරිපාලන යන්ත්‍රය උපරිම පමණින් සරල කළ යුතු අතර, එය හැකි තරම් දුරට පොදු ජනතාවගේ අවශ්‍යතාවයන්ට සමීපවූ පමණක් නොව, එක වරම ඔවුන්ට වටහා ගත හැකි වන සහ ස්වාධීන ලෙස සහභාගි වීමට ඉඩ සලසන්නාවූ ද එකක් විය යුතුය.

යුද්ධ හමුද කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ පක්ෂ සාමාජිකයන් බඳවා ගැනීම සිදුවෙමින් පවතී. මෙම කටයුත්ත කිසි ලෙසකින් හෝ දුර්වල නොකළ යුතුය. එය වඩ වඩාත් උත්සන්න කළ යුතුය. එසේ වූවද, ඒ අතරම, යුද්ධයෙන් ජය ගැනීමේ අරමුණ ඇතිව අපගේ සිවිල් පාලනය වැඩි දියුණු කළ යුතුය, සරල කළ යුතුය, තවත් පණ ගැන්විය යුතුය.

අතිරේක බලවේගයන් වැඩියෙන් ඇති, ශක්තිය දෙන මාර්ග වැඩියෙන් ඇති සහ ඉවසා දරා ගැනීමේ වැඩි හැකියාවක් ඇති ජනතාව සිටින පැත්ත යුද්ධයේ දී ජය ගන්නේය.

සුදු හමුදවලට වඩා, ''සර්වබලධාරී'' ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදය නැමති, මැටියෙන් තැනූ පාද සහිත යෝධයාට වඩා, මෙම ගති ගුණ සියල්ලම අප වෙත ඇත. කම්කරුවන් සහ ගොවි ජනතාව කෙරෙන්, ධනපති පංති විසින් පීඩිත වූ සහ සෑම තන්හිම ජනගහනයෙන් අති බහුතරය වන ඒ පංති වලින්, අපට ශක්තිය ලබා ගත හැකි නිසා, එමෙන්ම දීර්ඝ කලක් තිස්සේ වඩ වඩාත් ගැඹුරින් අප එම ශක්තිය දිගටම ලබා ගැනීමට යන නිසා අප කෙරෙහි එම ගති ගුණ ඇත. මෙම ඉතාමත් විශාල ජලාශයක් බඳු ජනකාය කෙරෙන් අපට ශක්තිය ලබා ගත හැකිය. එසේ කියන්නේ, සමාජවාදය ගොඩනැගීමේදී ඉතාමත් අවංක වන, එසේම, ජීවිතයේ කම්කටොළුවලින් දැඩි වූ සහ කම්කරුවන්ටත් ගොවිජනතාවටත් ඉතාමත් සමීපව සිටින, කම්කරු සහ ගොවි නායකයින් එයින් අපට ලැබෙන හෙයිනි.

රුසියානු හෝ වේවා, ලෝක ධනපති හෝ වේවා, අපේ සතුරන්ට මෙම ජලාශයට යම්තමින් වත් සමාන වන කිසිවක් නොමැත්තේය. ඔවුන්ගේ පාද යටින් එන්න එන්නම පස සෝදා ගෙන යයි. කම්කරුවන් හා ගොවිජනයා අතර වූ ඔවුන්ට කලින් ආධාර කළ පිරිස් වැඩි වැඩියෙන් ඔවුන් කෙරෙන් ඉවත් වෙමින් ඔවුන් හැර දමති.

අවසාන වශයෙන් බලන කල සෝවියට් බලය ලෝකය මුළුල්ලේම ජයග්‍රහණයට පත් වීම ඒකාන්ත හා නොවැලැක්විය හැකි වන්නේ එහෙයිනි.

1919 ඔක්තෝබර් 21.

ඉස්වෙස්තිය' අංක 7,
1919 ඔක්තෝබර් 22

වී. අයි. ලෙනින්. සම්පූර්ණ
කෘති, 5 වැනි මුද්‍රණය,
වෙළුම 39, පිටු 233–237

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිර්ධන පන්ති ආඥාදායකත්වය සමයේදී ආර්ථිකය හා දේශපාලනය

සෝවියට් බලය පිහිටුවීමේ දෙවැනි සංවත්සරය නිමිති කොට ගෙන' උක්ත මාතෘකාව ගැන කුඩා පොතක් ලිවීමට මම බලාපොරොත්තු වුනෙමි. එහෙත් දිනපතා කරන්නට සිදුවන වැඩ අධික වීම නිසා, එයින් සමහර කොටස් සඳහා අවශ්‍ය මූලික කරුණු සූදානම් කිරීමට දුර යාමට මට නොහැකි විය. එනිසා මෙම විෂය සම්බන්ධයෙන්, ඉතාමත් වැදගත් වන්නේ යයි මා කල්පනා කරන අදහස් ගැන සංක්ෂිප්ත විස්තරයක් කිරීමට මම තීරණය කෙළෙමි. එහෙත් සංක්ෂිප්ත විස්තරයක බොහෝ දුර්වලකම් හා අඩුපාඩු ඇත්තේය. එසේ වුවත් සඟරාවක පළ කරන කෙටි ලිපියකින්, සමහර විට මා අපේක්ෂා කරන අරමුණු ඉටු කර ගත හැකි වනු ඇත. මගේ අරමුණ වන්නේ, ප්‍රස්තුත ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සහ එය විවිධ රටවල කොමියුනිස්ට්වරුන්ගේ සාකච්ඡාවට භාජනය කිරීම සඳහා අවශ්‍ය අත්තිවාරම් සැලැස්ම ඉදිරිපත් කිරීම ය.

1

ධනපති ක්‍රමය හා කොමියුනිස්ට් ක්‍රමය අතර ඒ දෙකෙහිම අංග ලක්ෂණ හා ගතිගුණ ඒකාබද්ධ කර ගත් නිශ්චිත පරිවර්තනීය කාල පරිච්ඡේදයක් පවතින බවට න්‍යායික වශයෙන් සැකයක් තිබිය නොහැකිය. මෙම පරිවර්තනීය කාල පරිච්ඡේදය අභාවයට යන ධනපති ක්‍රමයත්, වැඩීගෙන එන ළදරු කොමියුනිස්ට් ක්‍රමයත් අතර කෙරෙන අරගලයක කාලයක් විය යුතුය. නැතහොත්, වෙනත් වචනවලින් කිවහොත්, පරාජය කර ඇති, එහෙත් විනාශ කර නැති ධනපති ක්‍රමයත්, උපත ලබා ඇති, එහෙත් තවමත් දුර්වලව තිබෙන කොමියුනිස්ට් ක්‍රමයත්, අතර අරගලයක කාලයක් විය යුතුය.

මෙම පරිවර්තනීය අංගලක්ෂණ සහිත මුළු ඓතිහාසික යුගයක්ම තිබීමේ අවශ්‍යතාවය මාක්ස්වාදීන්ට පමණක් නොව, සංවර්ධනය පිළිබඳ න්‍යායය ගැන යම් තරමක් දුරට හෝ දන්නා ඕනෑම උගත් පුද්ගලයෙකුට වුවද, මැනවින් පැහැදිලි විය යුතුය. සමාජවාදයට පරිවර්තනය වීම පිළිබඳව වර්තමාන සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ගෙන් අපට අසන්ට ලැබෙන කථා, මෙම පැහැදිලි සත්‍යය කිසිසේත් සැලකිල්ලට නොගෙන කියන ඒවා බව පෙනේ (මැක්ඩොනල්ඩ්, ජාන් ලොංගේ, කෞට්ස්කි හා ෆ්‍රෙඩරික් අඩ්ලර් යන පුද්ගලයන්ද ඇතුළුව දෙවැනි ජාත්‍යන්තරයේ[7] නායකයන් සියලු දෙනාම ව්‍යාජ සමාජවාදී ලේබලයක් අලවා ගෙන සිටියත්, ඔවුහු එම ගනයට අයත් වෙති). පංති අරගලය කෙරෙහි අප්‍රිය ගතියක් දැක්වීම, පංති අරගලය මග හැරීම ගැන සිහින මැවීම, සමතලා කිරීමට, සමාදන කිරීමට සහ නොගැලපෙන කොන් කපා ඉවත් කිරීමට ඔවුන් දරන ප්‍රයත්න සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විශේෂ ලක්ෂණයකි. ඒ අනුව, එවැනි ප්‍රජාතන්ත්‍රවාදීහු, එක්කෝ, ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමය දක්වා පරිවර්තනය වීමේ මුළු ඓතිහාසික කාල පරිච්ඡේදයක අවශ්‍යතාවය පිළිගැනීම මග හරිති. නැතහොත්, මෙම අරගලකාරී බලවේගයන් දෙක සමාදන කිරීමට ක්‍රම ඇටවීම තම යුතුකම කොට සලකති.

2

රුසියාවේ පවතින ඉතාමත් නොදියුණු තත්වය හා සුළු ධනේශ්වර ස්වරූපය නිසා, අප රටේ නිර්ධන පංති ආඥාදායකත්වය, සමහර කරුණු අතින්, එය දියුණු රටවල පැවතිය යුතු ආකාරයට වඩා අනිවාර්‍යණීය වශයෙන් වෙනස් විය යුතුය. එහෙත් රුසියාවේ හා වෙනත් ඕනෑම ධනපති රටක පවත්නා මූලික බලවේගයන්ද, සමාජ ආර්ථිකයේ මූලික ආකෘතිද, එක හා සමාන වන හෙයින්, විශේෂත්වය අදාළ විය හැක්කේ අඩු වැදගත් කමක් ඇති කරුණුවලටය.

සමාජ ආර්ථිකයේ එම මූලික ආකෘති නම්, ධනපති ක්‍රමය, සුළු අළෙවි භාණ්ඩ නිෂ්පාදනය හා කොමියුනිස්ට් ක්‍රමයයි. මූලික බලවේග නම්, ධනපති පංතිය, සුළු ධනපති පංතිය (විශේෂයෙන්ම ගොවි ජනතාව) හා නිර්ධන පංතියයි.

නිර්ධන පංති ආඥාදායකත්වය යුගයේ රුසියාවේ පවතින ආර්ථික ක්‍රමයෙන් පිළිබිඹු වන්නේ, කොමියුනිස්ට් ප්‍රතිපත්ති පදනම් කරගෙන ඇති විශාල රාජ්‍යයක පරිමාණයෙන් එක්සත් වූ සහ එහි ප්‍රථම පියවරයන් ගනිමින් සිටින ශ්‍රමයේ අරගලය ය. එනම්, සුළු අළෙවි භාණ්ඩ නිෂ්පාදන-යටත්, තවමත් නොනැසී පවතින ධනපති ක්‍රමයටත්, සුළු අළෙවි භාණ්ඩ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

නිෂ්පාදනය පදනම් කරගෙන අළුතෙන් පැන නගින ධනපති ක්‍රමයටත්, විරුද්ධව කරන අරගලය ය.

ප්‍රථමයෙන්ම, රුසියාවේ පෞද්ගලික නිෂ්පාදන මාර්ග හිමිකම් ක්‍රමය අහෝසි කර තිබෙන නිසාද, දෙවැනිව, නිර්ධන පංති රාජ්‍යය, රජය සතු ඉඩම්වල හා රජය සතු ව්‍යවසායයන්හි මහා පරිමාණ නිෂ්පාදනය ජාතික පරිමානයෙන් සංවිධානය කරන නිසාද, නිෂ්පාදනයේ විවිධ අංශ අතර ශ්‍රම ශක්තිය බෙදා හරින නිසාද, එම කටයුතු කෙරෙන තාක් දුරට ශ්‍රමය කොමියුනිස්ට් ක්‍රමය අනුව එක්සත් කර තිබේ.

අපි රුසියාවේ කොමියුනිස්ට් ක්‍රමයේ ප්‍රථම පියවරවල් ගැන කථා කරන්නෙමු (එය 1919 මාර්තු මස අනුමත කරන ලද අපගේ පක්ෂ වැඩ පිළිවෙළෙහි දක්වා තිබෙන්නේද එලෙසටය). අප එසේ සඳහන් කරන්නේ, අප රටේ මේ සියල්ලම කර තිබෙන්නේ අර්ධ වශයෙන් පමණක් වන හෙයිනි. වෙනත් ආකාරයකින් කියතොත්, ඒවා ඉටු කිරීම තවමත් පවතින්නේ මුල් අවධියේය. වහාම ඉටු කළ හැකි සියලු දේම, අපි එක විප්ලවවාදී පහරකින් එක හෙළාම ඉටු කෙළෙමු. නිදර්ශනයක් ලෙසට, නිර්ධන පංති ආඥාදායකත්වයේ ප්‍රථම දිනයේම, 1917 ඔක්තෝබර් 26 (නොවැම්බර් 8) දිනම, ලොකු ඉඩම් හිමියන්ට වන්දි නොදී පෞද්ගලික ඉඩම් හිමිකම අවලංගු කරන ලදී. ලොකු ඉඩම් හිමියන්ගේ දේපල අසන්තක කරන ලදී. මාස කීපයක් ඇතුලත ලොකු ධනපතියන් සියලු දෙනාගේම පාහේ දේපල, පැක්ටරි, බද්ධ ව්‍යාපාර, වස්තු සමාගම්, බැංකු, දුම්රිය ව්‍යාපාර යනාදිය හිමිකරුවන් සියලු දෙනාගේම දේපල වන්දි නොගෙවා අසන්තක කරන ලදී. රජය මගින් මහා පරිමාණ නිෂ්පාදන කර්මාන්ත සංවිධානය කිරීම හා පැක්ටරිවල හා දුම්රිය සේවාවන්හි 'කම්කරු පාලනය' 'කම්කරු කළමනාකරණය' දක්වා පරිවර්තනය කිරීම බොහෝ දුරට සාර්ථක කර තිබේ. එහෙත් කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් එය ('සෝවියට් ගොවිපළවල්', එනම්, කම්කරු රාජ්‍යය රජයේ ඉඩම්වල සංවිධානය කරන විශාල ගොවිපළවල්) යම්තම් පටන් ගත්තා පමණකි. එමෙන්ම, සුළු අලෙවි භාණ්ඩ නිෂ්පාදනයේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීම සඳහා යොමු වීමක් වශයෙන් සුළු ගොවීන්ගේ විවිධාකාර සමුපකාර සංවිධාන කිරීමද ආරම්භ කළා පමණකි.*

---

*දැනගන්නට තිබෙන පමණට සෝවියට් රුසියාවේ තිබෙන 'සෝවියට් ගොවිපළවල්' හා ''කෘෂිකාර්මික කොමියුන'' සංඛ්‍යාව, පිළිවෙළින් 3536 ක් සහ 1961 ක් වේ. කෘෂිකාර්මික ආටල ගණන 3696 කි. දැනට අපගේ මධ්‍යම සංඛ්‍යා ලේඛන මණ්ඩලය සියලුම සෝවියට් ගොවිපළවල හා කොමියුනවල නිවැරදි සංගණනයක් ගනිමින් සිටී. 1919 නොවැම්බරය වන විට එහි ප්‍රතිඵල ලැබෙන්නට පටන් ගනු ඇත.

පෞද්ගලික වෙළෙඳාම වෙනුවට රජය මගින් සංවිධානය කළ බෙදා හැරීම, එනම්, රජයෙන් ධාන්‍ය එකතු කර නගරවලට යැවීම හා කාර්මික භාණ්ඩ එකතු කර ගම්බද පෙදෙස්වලට යැවීම ගැනද කිවයුත්තේ එයමය. මේ සම්බන්ධයෙන් තිබෙන සංඛ්‍යා ලේඛන දත්තයන් පහත දැක්වේ.

ගොවිජන ගොවි තැන තවදුරටත් සුළු අලෙවි භාණ්ඩ නිෂ්පාදනයක තත්වයේ පවතී. මෙහි ධනපති ක්‍රමයට අදළ වන ඉතා පුළුල් හා ඉතා ශක්තිමත්, එමෙන්ම, ගැඹුරට විහිදුනු පදනමක් ඇත. එම පදනම මත සිටින ධනපති ක්‍රමය කොමියුනිස්ට් ක්‍රමයට විරුද්ධව තියුණු අරගලයක් කරමින් තවදුරටත් පවතියි. නැතහොත් අළුතෙන් පැන නගියි. රජය මගින් ධාන්‍ය හා අනෙකුත් නිෂ්පාදිතයන් එකතු කිරීමට හා පොදුවශයෙන් රජය මගින් නිෂ්පාදිත භාණ්ඩ බෙදා හැරීමට විරුද්ධව කරන පෞද්ගලික සමපේක්ෂණය හා අධිලාභ ලබන ජාවාරම්, මෙම අරගලයේ ආකෘති වේ.

3

මෙම වියුක්ත න්‍යායානුකූල අදහස් පැහැදිලි කිරීම පිණිස යථා භූත සංඛ්‍යා විස්තර පහත දක්වන්නෙමු.

ආහාර පිළිබඳ කටයුතු භාර මහජන කොමිසාර් අංශයේ තිබෙන සංඛ්‍යා ලේඛන අනුව 1917 අගෝස්තු 1 සිට 1918 අගෝස්තු 1 දක්වා කාලය තුළ රජය එකතු කළ ධාන්‍ය ප්‍රමාණය පූද් 3,00,00,000 ක් පමණ විය. ඊළඟ අවුරුද්දේ එකතු කළ ප්‍රමාණය පූද් 11,00,00,000 ක් පමණ විය. ඊළඟ (1919–1920) එකතු කිරීමේ ව්‍යාපාරයේ ප්‍රථම තුන් මස තුළ එකතු වන ධාන්‍ය දළ වශයෙන් පූද් 4,50,00,000 ක් වෙතැයි අපේක්ෂා කෙරේ. මේ හා සසඳන කල 1918 අවුරුද්දේ මෙම කාලය තුළ (අගෝස්තු — ඔක්තෝබර්) එකතු වූ ධාන්‍ය ප්‍රමාණය පූද් 3,70,00,000 ක් විය.

ධනපති ක්‍රමය පරදවා කොමියුනිස්ට් ක්‍රමය ජයගැනීම පිළිබඳ දෘෂ්ටි කෝනය අනුව බලන කල, තත්වය හෙමින් වුවත්, ස්ථිර ලෙසම දියුණු වන බව මෙම ගණන් හිලව් වලින් පෙනේ. මෙම වැඩි දියුණුව අත් කර ගෙන ඇත්තේ, ලෝකයේ මීන් පෙර නොවූ විරූ තරම් වන දුෂ්කරතා මධ්‍යයේය. ලෝකයේ බලවත්ම රටවල සියලුම බලවේගයන් යොදා ගනිමින් රුසියානු සහ විදේශ ධනපතියන් සංවිධානය කළ සිවිල් යුද්ධය නිසා ඇති වූ දුෂ්කර තත්වයන් මධ්‍යයේය.

එනිසා, සියලුම රටවල ධනපතීන් සහ ඔවුන්ගේ විවෘත හා වෙස් මුහුණු පැළඳගත් (දෙවැනි ජාත්‍යන්තරයේ ''සමාජවාදීන්'') බැලයන් දෙසා බාන බොරු හා අපවාද කොතෙක් තිබුණත්, නිර්ධන පංති ආඥාදායකත්වයේ මූලික ආර්ථික ප්‍රශ්නය සම්බන්ධයෙන් වූ කල, අප රටේ ධනපති ක්‍රමය පරදවා කොමියුනිස්ට් ක්‍රමය ජයග්‍රහණය කරන බව

https://liberationbase.wordpress.com

ඒකාන්තය. ලෝකය මුළුල්ලේම ධනපතියෝ බොල්ෂෙවික්වාදීන්ට විරුද්ධව ගොරවමින්, ඔරවමින්, ඔවුනට විරුද්ධව යුද්ධ ප්‍රහාර හා කුමන්ත්‍රණ ආදිය සංවිධාන කරති. ඔවුන් එසේ කරන්නේ යුද්ධ බලයෙන් අප මර්දනය නොකළහොත්, අප අපගේ සමාජ ආර්ථිකය සාර්ථක ලෙස ප්‍රකෘතිමත් කර ගන්නා බව ඔවුන් හොඳින් අවබෝධ කර ගෙන තිබෙන හෙයිනි. එහෙත් අප මර්දනය කිරීමට ඔවුන් දරන මෙම ප්‍රයත්නයද සාර්ථක නොවන්නේමය.

අපට ලැබුණු කෙටි කාලය තුළ, අපගේ වැඩ කටයුතුවලදී අපට දරාගන්නට සිදු වූ නොඇදහිය හැකි තරමේ දුෂ්කරතාවයන් මධ්‍යයේම අප කොතරම් දුරට ධනපති ක්‍රමය පරදවා තිබේද යන්න, පහත සඳහන් පිඬු කොට ගත් සංඛ්‍යා ලේඛනවලින් පෙනේ.මුළු සෝවියට් රුසියාවේම නොව, ගුබේර්නියා පළාත් විසි හයක පමණක් පාරිභෝගික ධාන්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් දත්තයන් පුවත් පත්වල පළ කිරීම සඳහා මධ්‍යම සංඛ්‍යා ලේඛන මණ්ඩලය විසින් දැන් සූදානම් කර තිබේ.

එහි ප්‍රතිඵලය පහත සඳහන් පරිදි ය.*

මේ අනුව බලන කල නගරවලට ලැබෙන ධාන්‍යවලින් දළ වශයෙන් අඩක් ආහාර පිළිබඳ කොමිසාර් අංශයෙන්ද, අනිත් අර්ධය ලාභ ලබන්නන් විසින්ද, සපයනු ලැබේ. නාගරික කම්කරුවන් පරිභෝජනය කරන ආහාර පිළිබඳව 1918 දී කරන ලද සුපරීක්ෂාකාරී සමීක්ෂණයකින්ද හෙළිදරව් වූයේ එම අනුපාතයමය. රජයෙන් සපයන පාන් සඳහා කම්කරුවා ගෙවන්නේ ලාභගරන්නාට ගෙවන මුදලින් නවයෙන් පංගුවකටත් වඩා අඩුවෙන් බව සිත තබා ගත යුතුය. පාන් සඳහා ලාභ ලබන්නා අය කරන මිළ රජයේ මිළ මෙන් දශ ගුණයකින් වැඩිය. කම්කරුවන්ගේ අයවැය පිළිබඳ විස්තරාත්මක විග්‍රහයකින් මෙය හෙළිදරව් විය.

4

වර්තමාන රුසියානු ආර්ථිකයේ නිවැරදි පින්තූරයක් මෙම සංඛ්‍යා ලේඛනවලින් පිළිබිඹු වන බව ඒවා සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කළ විට පෙනේ.

වැඩ කරන ජනයා, ඔවුන්ගේ චිරාගත පීඩකයන්ගෙන් හා සූරාකන්නන්ගෙන්, එනම්, ඉඩම් හිමියන්ගෙන් හා ධනපතියන්ගෙන් නිදහස ලබා ඇත. මෙය සැබෑ නිදහස සහ සමානාත්මතාවය දෙසට නැඹුරු වූ පියවරකි. එහි දැවැන්ත භාවය, පරිමාණය හා වේගවත් භාවය අතින් ඊට සම වන වෙනත් දෙයක් ලොවෙහි නොවීය. එහෙත් නිදහස සහ සමානාත්මතාවය

* 51 පිටුව බලන්න. — සංස්කාරක

සෝවියට් රුසියාවේ ගුබේර්නියා 26	ජනගහනය. දශලක්ෂ ගණනින්		ධාන්‍ය නිෂ්පාදනය (බීජ හා සත්වාහාර හැර) පූද් දශලක්ෂ ගණනින්	භාර දුන් ධාන්‍ය පූද් දශලක්ෂ ගණනින්		ජනතාවන්ගේ ප්‍රයෝජනයට තිබෙන මුළු ධාන්‍ය ප්‍රමාණය පූද් දශලක්ෂ ගණනින්	ධාන්‍ය පාරිභෝජන ඒක පුද්ගල පූද් ගණන
				ආහාර කොමිසාර් අංශය	ලාභ ලබන්නෝ		
නිෂ්පාදනය කරන ගුබේර්නියා	නාගරික	4.4	—	20.9	20.6	41.5	9.5
	ගම්බද	28.6	625.4	—	—	481.8	16.9
පරිභෝජක ගුබේර්නියා	නාගරික	5.9	—	20.0	20.0	40.0	6.8
	ගම්බද	13.8	114.0	12.1	27.8	151.4	11.0
එකතුව (ගුබේර්නියා 26)		52.7	739.4	53.0	68.4	714.7	13.6

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගැන කථාකරන විට, ධනපති පාර්ලිමේන්තුවාදය ගැන අදහස් කරමින්, එය සාමාන්‍ය "ප්‍රජාතන්ත්‍රවාදය" නැතහොත් "පිරිසිදු ප්‍රජාතන්ත්‍රවාදය" (කෞට්ස්කි) යනුවෙන් ව්‍යාජ ලෙස විස්තර කරන ධනපති පංතියේ ආධාර කරුවන් (සුළු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන් ඇතුළත්ව) එම පියවර අමතක කරති.

එහෙත් වැඩ කරන ජනතාව උනන්දුවක් දක්වන්නේ සැබෑ ස්වාධීනත්වය හා සැබෑ නිදහස (ඉඩම් හිමියන්ගෙන් සහ ධනපතියන්ගෙන් නිදහස) ගැන පමණකි. ඔවුන් එතරම් ශක්ති සම්පන්න ලෙස සෝවියට් ආණ්ඩුවට ආධාර කරන්නේ එනිසාය.

මෙම ගොවි රටේ නිර්ධන පංති ආඥාදායකත්වයෙන් ප්‍රථම වාසිය අත්වූයේ සහ වැඩියෙන්ම වාසි ලැබුණේ සමස්ථයක් වශයෙන් ගොවි ජනතාවටය. රුසියාවේ ගොවියා, ඉඩම් හිමියන් සහ ධනපතියන් යටතේ සාගින්නේ සිටියේය. ශත වර්ෂ ගණන් වූ අපගේ ඉතිහාසයේ කිසිම කලෙක තමන් සඳහා වැඩ කිරීමේ අවස්ථාව ගොවියාට නොලැබුණි. නගරවලට හා විදේශවලට යැවීම සඳහා ධාන්‍ය පූද් කොටි ගණන් ධනපතියන්ට භාර දුන් ගොවියා, ඒ අතර කුසගින්නේ දවස ගෙවීය. ප්‍රථම වතාවට නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ ගොවියා තමන්ම සඳහා වැඩ කළ අතර නගර වැස්සාට වඩා හොඳින් ආහාර ගෙන තිබේ. ප්‍රථම වතාවට ගොවියා සැබෑ නිදහස දක ඇත. තමා නිපදවන ආහාර භුක්ති විඳීමේ, කුස ගින්න පිටුදැකීමේ සැබෑ නිදහස දක ඇත. අප දන්නා ලෙසට ඉඩම් බෙදා දීමේදී උපරිම සමානාත්මතාවය තහවුරු කර තිබේ. අති බහුතරයක් අවස්ථාවලදී "අනුභව කරන කටවල්" ගණන අනුව ගොවීහු ඉඩම් බෙදා ගනිති.

සමාජවාදය යනු පංති නැති කිරීමයි.

පංති නැති කිරීම සඳහා ප්‍රථමයෙන් ඉඩම් හිමියන් හා ධනපතියන් නෙරපා දැමීම අවශ්‍යය. අපගේ කර්තව්‍යයේ මෙම කොටස සාර්ථක කර තිබේ. එහෙත් එය එක කොටසක් පමණක් වන අතර, කර්තව්‍යයේ ඉතාමත් දුෂ්කර කොටස නොවේ. පංති නැති කිරීම පිණිස දෙවැනිව, පැක්ටරි කම්කරුවන් හා ගොවියන් අතර වෙනස නැති කිරීම, ඔවුන් සියලු දෙනාම වැඩ කරන්නන් බවට පත් කිරීම අවශ්‍යය. මෙය එක් වරම, එක මොහොතකින් කළ හැකි දෙයක් නොවේ. මෙය පමණ නොකළ හැකි තරම් දුෂ්කරය. ඒ සඳහා අවශ්‍යයෙන්ම දීර්ඝ කාලයක් ගත වනු ඇත. එය මොනයම් හෝ පංතියක් නෙරපා දැමීමෙන් විසඳිය හැකි ප්‍රශ්නයක් නොවේ. එය විසඳිය හැක්කේ මුළු මහත් සමාජ ආර්ථිකයම සංවිධානාත්මක ලෙස නැවත ගොඩ නැගීමෙනි. එය කළ හැක්කේ, තනි තනිව හා අසමගි ලෙස කරන සුළු වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනයේ සිට

විශාල පරිමාණ නිෂ්පාදනය දක්වා පරිවර්තනය වීමෙනි. මෙම පරිවර්තනය අවශ්‍යයෙන්ම දිග්ගැස්සුනු එකකි. ඉක්මන්කාරී, අපරීක්ෂාකාරී පරිපාලන හා ව්‍යවස්ථාදායක පියවරයන් ගැනීමෙන් සිදුවිය හැක්කේ එය ප්‍රමාද වීම සහ අවුල් වීම පමණකි. එය වේගවත් කළ හැක්කේ, ගොවියාට ඔහුගේ මුළු ගොවි ශිල්පයම විශාල වශයෙන් වැඩි දියුණු කර ගැනීමට, එය මූලික වශයෙන් වෙනස් කිරීමට හැකි වන සේ ඊට අදාළ ආධාර දීමෙන් පමණකි.

ධනපති පංතිය පරාජය කිරීමෙන් පසු, ප්‍රශ්නයේ වඩාත් දුෂ්කර කොටස විසඳීම සඳහා නිර්ධන පංතිය ගොවිජනයා කෙරෙහි දක්වන එහි ප්‍රතිපත්තිය පහත සඳහන් මූලික ක්‍රියා මාර්ගය ඔස්සේ ඒකාන්ත ලෙස ඉදිරියට ගෙන යා යුතුය. වැඩ කරන ගොවියා ගොවි අයිති කරුවාගෙන් ද, ගොවි කම්කරුවා ගොවි මුදලාලිගෙන්ද, ශ්‍රමික ගොවියා ලාභ ගරන ගොවියාගෙන්ද, වෙන් කොට සීමා සලකුණු හැඳින ගැනීමට නිර්ධන පංතිය කටයුතු කළ යුතුය.

මෙම කොටස් වෙන් කරන සීමා සලකුණු හැඳින ගැනීම, සමාජවාදයේ සම්පූර්ණ හරය වේ.

වචනයෙන් පමණක් සමාජවාදී වන, ඇත්ත වශයෙන්ම සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් වන (මාර්තව්ලා, චෙර්නොව්ලා, කෞට්ස්කිලා සහ වෙනත් අය) සමාජවාදීන්ට මෙම හරය වටහා ගත නොහැකි වීම පුදුමයට කරුණක් නොවේ.

අප මෙහි සඳහන් කරන පරිදි සීමා සලකුණු හැඳින ගැනීම ඉතා දුෂ්කර කටයුත්තකි. එසේ වන්නේ ගොවීන් කොතරම් විවිධාකාර වුවත්, ඔවුන් අතර කොතරම් ප්‍රති විරෝධතා තිබුණත්, සැබෑ ජීවිතයේදී ඔවුන්ගේ අංගලක්ෂණ සියල්ලම එක සමස්තයක් වශයෙන් බැඳී තිබෙන හෙයිනි. එසේ වුවද, මෙම සීමා සලකුණු හැඳින ගත හැකිය. එය කළ හැකි දෙයක් පමණක් නොව, එම සීමා ගොවිජන ගොවිතැනෙහි කොන්දේසිවලින් හා ගොවිජන ජීවිතයෙන් පැන නගින්නේද වේ. කාලාන්තරයක් තිස්සේම, ඉඩම් හිමියන්, ධනපතියන්, මුදලාලියන් හා ලාභ ගරන්නන්ද, ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව ඇතුළත්වූ ඔවුන්ගේ රාජ්‍යයද විසින් වැඩ කරන ගොවි ජනයා පීඩාවට පත් කරන ලදී. කාලාන්තරයක් තිස්සේම මෙම පීඩකයන්ට හා සූරා කන්නන්ට වෛර කිරීමටත්, ඔවුන් පිළිකුල් කිරීමටත්, ගොවියා ස්වයං පුහුණුවක් ලබා ඇත. එසේම ජීවිතයේ කොන්දේසි විසින් ජනිත කරන ලද මෙම පුහුණුව, ධනපතියාට විරුද්ධවත්, ලාභ ගරන්නාට හා මුදලාලිට විරුද්ධවත්, කම්කරුවා සමග සන්ධානයක් ඇති කර ගැනීමට යොමුවන ලෙස ගොවියාට බල කරයි. එහෙත්, ඒ අතරම, වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනයේ කොන්දේසි නිසා ගොවියා (සැම විටම නොව, එහෙත්, බොහෝ විටම පාහේ)

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අනිවාරණීය ලෙසටම මුදලාලියෙකු සහ ලාභ ගරන්නෙකු බවට හැරේ.

ඉහත සඳහන් සංඛ්‍යා ලේඛනවලින්, වැඩ කරන ගොවියාත් ලාභ ගරන ගොවියාත් අතර තිබෙන සිත් කාවදින වෙනසක් හෙළිදරව් වේ. 1918–1919 කාලයේදී, නගරවල කුසගින්නේ තැවෙමින් සිටි කම්කරුවන්ට රජයේ නියමිත මිළට ධාන්‍ය පූද් 4,00,00,000 ක් දුන්නේද, රජයේ ආයතනවල අඩුපාඩුකම් සියල්ලක්ම තිබිය දී, කම්කරු ආණ්ඩුව දූන සිටි, එහෙත්, සමාජවාදයට පරිවර්තනය වීමේ මුල් අවධියේදී නොවැලැක්විය හැකි වූ දුර්වලකම් තිබියදී, එම ධාන්‍ය රජයේ ආයතනවලට භාර දුන්නේද, වැඩ කරන ගොවියාය. සමාජවාදී කම්කරුවාගේ සහෝදරයාය. ඔහුගේ සමානයාය. ප්‍රාග්ධනයේ වියගසට විරුද්ධව කරන සටනේ සිටින ඔහුගේ විශ්වාසවත් මිත්‍රයාය. ඔහුගේ එක ලේ ඇති සහෝදරයාය. ඒ අතර රජයෙන් නියමිත මිළ මෙන් දශ ගුණයක් අය කරමින් හොරෙන් ධාන්‍ය පූද් 4,00,00,000 ක් විකුණා නාගරික කම්කරුවාගේ සාගින්න හා ඔහුගේ අවශ්‍යතාවය ස්වකීය වාසිය බවට හරවා ගත්, රජය රැවටූ සහ සැම තැනකම රැවටිල්ල, මංකොල්ලය හා වංචාව වැඩි කළ ගොවියා ලාභ ගරන්නෙකි. ධනපතියාගේ මිත්‍රයෙකි. කම්කරුවාගේ පංති සතුරෙකි. සූරාකන්නෙකි. මුළු රජයටම අයත් ඉඩමෙන්, ගොවියාගේ පමණක් නොව, එක් හෝ තවත් ආකාරයකින් කම්කරුවාගේ ද ශ්‍රමය අන්තර්ගත උපකරණවල ආධාරයෙන්, යනාදී ක්‍රමයෙන්, එකතු කරන ලද අතිරික්ත ධාන්‍ය හිමි කුමණ හෝ අයෙක්, එයින් අධිලාභ ලබයි නම්, ඔහු කුස ගින්නේ සිටින කම්කරුවා සූරා කන්නෙකි.

නුඹලා නිදහස, සමානාත්මතාවය හා ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරන්නහු යයි සැම පැත්තෙන්ම ඝෝෂා කරමින්, ඔවුහු අපගේ ව්‍යවස්ථාවේ කියැවෙන කම්කරුවා සහ ගොවියා අතර අසමානාත්මතාවය, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසුරුවා හැරීම, අතිරික්ත ධාන්‍ය බලෙන් රාජ සන්තක කිරීම, යනාදිය වෙත ඇඟිල්ල දික්කර පෙන්වති. අපි එයට මෙසේ පිළිතුරු දෙන්නෙමු. ගොවියා ශත වර්ෂ ගණනක් තිස්සේ වින්ද සැබෑ අසමානතාවය සහ නිදහස නැතිකම දුරලීමට මෙතරම් කටයුතු කළ වෙනත් එකද රජයක් වත් ඉතිහාසයේ නොවීය. එපමණක් නොව ලාභ ගරන්නා සමග සමානාත්මතාවය, අපි කිසි කලෙකත් පිළිගන්නේද නොවෙමු. යම්සේද යත් සූරා කන්නා හා සූරාකනු ලබන්නා අතර ''සමානාත්මතාවය'' ද, කුස පුරවාගත් තැනැත්තා හා සාගින්නේ පෙළෙන තැනැත්තා අතර සමානාත්මතාවයද, එසේ නැතහොත්, පසු කී අය කොල්ලකනු පිණිස වූ මුලින් කී අයගේ නිදහසද, අප විසින් කිසි කලෙකත් පිළිගනු නොලබන ලෙසිනි. මෙම වෙනස පිළිගැනීම ප්‍රතික්ෂේප කරන උගතුන් තමන් ප්‍රජාතන්ත්‍රවාදීන්, සමාජවාදීන්, ජාත්‍යන්තරවාදීන්,

කෞට්ස්කිලා, වෙර්නොව්ලා, නැතහොත්, මාර්තව්ලා යන කුමණ නමින් හඳුන්වා ගත්තත්, අපි ඔවුන් සුදු හමුදව ලෙස සලකන්නෙමු.

5

සමාජවාදය යනු පංති නැති කිරීමයි. පංති නැති කිරීම සඳහා නිර්ධන පංති ආඥාදායකත්වය එයට හැකි සියල්ලක්ම කර තිබේ. එහෙත් පංති නැති කිරීම එක පහරින් කළ හැක්කේ නොවේ.

එමෙන්ම, පංති තවමත් පවතින්නේය. ඒවා නිර්ධන පංති ආඥාදායකත්වයේ කාලය තුළ පවතිනු ඇත. පංති නැතිව ගිය පසු ආඥාදායකත්වය අනවශ්‍ය වනු ඇත. නිර්ධන පංති ආඥාදායකත්වය නොමැතිව ඒවා අහෝසි නො වනු ඇත.

පංති පැවති නමුත්, නිර්ධන පංති ආඥාදායකත්වය සමයේදී සැම පංතියක්ම වෙනසකට භාජනය විය. පංති අතර සම්බන්ධතාවයන්ද වෙනස් විය. නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ පංති අරගලය අහෝසි වන්නේ නැත. සිදුවන්නේ එය වෙනත් ආකාරයන් ගැනීම පමණකි.

ධනපති ක්‍රමය යටතේ, නිර්ධන පංතිය පීඩිත පංතියක් විය. එය වෙතින් නිෂ්පාදන මාධ්‍යයන් ඉවත් කර තිබුණි. ඍජු ලෙසම හා සම්පූර්ණයෙන්ම ධනපති පංතියට ප්‍රතිපාක්ෂික වූ එකම පංතිය එය විය. එනිසාම අවසානය දක්වාම විප්ලවවාදී වීමේ හැකියාව තිබුණේ එයට පමණකි. ධනපති පංතිය බලයෙන් පහකර දමා, බලය අල්වා ගත් නිර්ධන පංතිය, පාලනය කරන පංතිය බවට පත්විය. එය බලය ක්‍රියාත්මක කරයි. දැනටමත් සමාජ සන්තක කර තිබෙන නිෂ්පාදන මාර්ගයන් පාලනය කරයි. වැනෙන සුලු අන්තර් කොටස්වලට හා පංතිවලට එය මඟ පෙන්වයි. එය, එන්න එන්නම වැඩි වන ප්‍රතිරෝධයක් දක්වන සූරාකන්නන් මැඩලයි. මේ සියල්ලම නිර්ධන පංතියට භාර නිශ්චිත කර්තව්‍යයන් වන්නේය. ඉහත දී එය මෙම කර්තව්‍යයන් ඉටු කිරීමට භාර ගත්තේ නැත. ඒවා භාර ගැනීමේ හැකියාවක් එයට තිබුණේද නැත.

සූරා කන්නන්ගේ, ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ පංතිය තවමත් අහෝසි වී නැත. නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ එය එක් වරම අහෝසි වීම බලාපොරොත්තු වීමටද නොහැක. සූරා කන්නන් තලා දමා ඇති නමුත්, ඔවුන් තවමත් විනාශ වී නැත. ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ ස්වරූපය ගත් ජාත්‍යන්තර පදනමක් තවමත් ඔවුන් සතුව ඇත. ඔවුහු තවමත් නිෂ්පාදන මාර්ග සමහරක් අර්ධ වශයෙන් රඳවා ගෙන සිටිති. තවමත් ඔවුන් වෙත මුදල් ඇත. ඔවුහු පැතිරී ගිය සමාජ සම්බන්ධතාවයන් ඇතිව සිටිති. ඔවුන් පරාජයට පත් කර සිටින නිසා, ඔවුන්ගේ ප්‍රතිරෝධය සිය ගුණයෙන් සහ දහස් ගුණයෙන් බලවත් වී තිබේ. රාජ්‍ය, යුද්ධමය හා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආර්ථික පරිපාලනය පිළිබඳ කලාව අතින් ඔවුනට ඇත්තේ අති විශාල වාසියකි. එනිසා ජනගහනය තුළ සිටින ඔවුන්ගේ සංඛ්‍යාව හා සසඳන කල ඔවුන්ගේ වැදගත් කම පමණ නොකළ හැකි තරම් ඉමහත්ය. ජයග්‍රාහී සූරා කනු ලබන්නන්ගේ, එනම්, නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණියට විරුද්ධව, බලයෙන් පහකරන ලද සූරාකන්නන් විසින් ගෙන යනු ලබන අරගලය අසම සම තරමට දරුණු වී තිබේ. මෙම සංකල්පය වෙනුවට (දෙවැනි ජාත්‍යන්තරයේ සියලුම වීරයන් කරන මෙන්), ප්‍රතිසංස්කරණවාදී මායා මත ආදේශ නොකළ හොත්, විප්ලවයේ දී වෙනත් දෙයක් සිදු වෙතැයි බලාපොරොත්තු නොවිය හැකිය.

නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ වුවද, ගොවිජනයා, පොදුවශයෙන් සුළු ධනපති පංතිය මෙන්ම, අතර මැද අන්තර් තත්වයක් ගන්නා බව අවසාන කරුණ ලෙසට සඳහන් කළ යුතුය. එක් අතකින් ඔවුන් විශාල (නොදියුණු රුසියාවේ අති විශාල) පොදු ජන කොට්ඨාශයකි. ඉඩම් හිමියා-ගෙන් සහ ධනපතියාගෙන් නිදහස් වීමට වැඩ කරන සියලු ජනයා තුළ ඇති පොදු උවමනාවෙන් ඔවුහු එක්සත් වී සිටිති. අනිත් අතට, ඔවුහු අසමගි සුළු දේපල හිමියෝ, දේපල හිමියෝ සහ වෙළෙන්දෝ වෙති. එවැනි ආර්ථික තත්වයක් නිසා, ඔවුන්ට අනිවාර්‍යණීය වශයෙන්ම නිර්ධන පංතියත්, ධනපති පංතියත් අතර එහා මෙහා වැනෙන්නට සිදු වේ. මෙම පංති දෙක අතර පංති අරගලය අතිශයින් තියුණු වී ඇති ස්වභාවයද, සිතා ගත නොහැකි තරමට බරපතල ලෙස සියලු සමාජ සම්බන්ධකම් බිඳ වැටීමද, පැරණි සිරිත් හා වෙනස් නොවන දේ කෙරෙහි ගොවි ජනයා සහ සුළු ධනපති පංතිය දක්වන බලවත් ඇල්මද, ගැන සලකා බලන කල, ඔවුන් එක පැත්තක සිට අනිත් පැත්තට වැනෙමින් සිටිනු දක්නට ලැබීම, ඔවුන් දෙගිඩියාවෙන්, වෙනස්වෙමින්, අවිනිශ්චිත ස්වභාවයෙන්, යනාදී ලෙසින් සිටිනු අපට දක්නට ලැබීම, සැබැවින්ම ස්වාභාවිකය.

මෙම පංතිය, නැතහොත්, මෙම සමාජ කොට්ඨාශයන් සම්බන්ධයෙන් නිර්ධන පංතිය කළ යුත්තේ, ඒවා කෙරෙහි තමන් පාන බලය තහවුරු කිරීමට හා ඒවාට මග පෙන්වීමට කටයුතු කිරීමය. ඒ හා සම්බන්ධයෙන් නිර්ධන පංතියේ කර්තව්‍යය නම් වැනෙනසුලු හා අස්ථිර කොටස්වලට නායකත්වය දීමය.

නිර්ධන පංති ආඥාදායකත්වය විසින් වෙනස්කරන ලද පරිදි සියලුම මූලික බලවේගයන් සහ ඒවායේ අන්තර් සම්බන්ධතාවයන් ගැන අපි සැලකිල්ලට ගන්නමෝ නම්, දෙවැනි ජාත්‍යන්තරයේ සියලුම නියෝජිතයන් විසින් දරනු ලබන සාමාන්‍ය "ප්‍රජාතන්ත්‍රයේ මාර්ගයෙන්" සමාජවාදයට පරිවර්තනය විය හැකිය යන පොදු සුළු ධනපති අදහස මොනතරම් අර්ථ ශූන්‍ය විකාරයක්ද හා න්‍යායික වශයෙන් කොතරම් අමනොඥද යනු, අපට අවබෝධ වනු ඇත. මෙම වරදෙහි මූලික ප්‍රභවය රැඳී තිබෙන්නේ, ධනපති පංතියෙන් උරුම කොටගත් "ප්‍රජාතන්ත්‍රවාදය" පරිසමාප්ත හා පංතිවලට ඉහළින් සිටින එකක්ය යන අදහස තුළය. නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ, ප්‍රජාතන්ත්‍රවාදයද සම්පූර්ණයෙන්ම අළුත් අවධියකට පත්වන අතර, එහි සෑම සියලු ආකෘතියක්ම කෙරෙහි බලපාන පංති අරගලය වඩාත් උසස් තත්වයකට නැගෙයි.

නිදහස, සමානාත්මතාවය හා ප්‍රජාතන්ත්‍රවාදය ගැන පොදු වශයෙන් කථා කිරීම යනු, සැබැවින්ම වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනයේ සම්බන්ධ-තාවයන් විසින් හැඩගස්වන ලද සංකල්පයන් අන්ධානුකරණයෙන් ප්‍රතිරාවය කිරීමක් පමණකි. නිර්ධන පංති ආඥාදායකත්වයේ යථාර්ථ ගැටළු, එවැනි සාමාන්‍යතාවයන් උපයෝගි කරගෙන විසඳන්ට උත්සාහ දැරීම යනු, ධනපති පංතියේ න්‍යාය සහ ප්‍රතිපත්ති එහැම පිටින්ම පිළි ගැනීමකට සමාන වේ. නිර්ධන පංතියේ පැත්තෙන් ප්‍රශ්නය මෙසේ ඉදිරිපත් කළ හැකිය. නිදහස, කුමණ පංතියේ පීඩාවෙන්ද? කුමණ පංතියක් සමග කිනම් පංතියේ සමානාත්මතාවයද? ප්‍රජාතන්ත්‍රවාදය, පෞද්ගලික දේපල පදනම් කොට ගෙනද, නැතහොත්, පෞද්ගලික දේපල අහෝසි කිරීම සඳහා වූ අරගලය පදනම් කර ගෙනද? යනාදී ප්‍රශ්න මතු කළ හැකිය.

"සමානාත්මතාවය" යනු, වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදන සම්බන්ධතා නැමති අච්චුවෙන් සකස් වූවක් බවත් සමානාත්මතාවය නම් පංති අහෝසි කිරීමය යන අර්ථයෙන් එය වටහා නොගතහොත් එය දූර්මතයක් වන බවත්, බොහෝ කලකට පෙර එංගල්ස් ඔහුගේ 'ඩූරිං විරෝධය' නැමති ග්‍රන්ථයෙහි විස්තර කළේය. සමානාත්මතාවය පිළිබඳ වූ ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයත්, සමාජවාදී සංකල්පයත් අතර වෙනස ගැන කියන මෙම මූලික සත්‍යය නිතර අමතක කරනු ලැබේ. එහෙත් එය අමතක කරනු නොලැබේ නම්, ධනපති පංතිය බලයෙන් පහකර දමන නිර්ධන පංතිය, එමගින් කරන්නේ, පංති නැති කිරීම වෙත එල්ලවූ ඉතාමත් තීරණාත්මක පියවරක් ගැනීම බවත්, එම ක්‍රියාදමය සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය බලය නැමති යන්ත්‍රය උපයෝගි කර ගනිමින්, බලයෙන් පහකර දමන ලද ධනපති පංතියට හා වැනෙමින් සිටින, සුළු ධනපති පංතියට විරුද්ධව සටන් කිරීමට, ඔවුන්ට බලපෑමට හා බලකිරීමට විවිධ විධි යොදා ගනිමින්, නිර්ධන පංතිය එහි පංති අරගලය තවදුරටත් ඉදිරියට ගෙන යායුතු බවත්, ඒකාන්ත ලෙස පැහැදිලි වනු ඇත.

(මතු සම්බන්ධයි)*.

1909 ඔක්තෝබර් 30.

1919 නොවැම්බර් 7 ප්‍රාව්දා අංක 250

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 39, පිටු 271–282

---

*මෙම ලිපිය අවසන් කර නොතිබුණි. — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පෙරදිග ජනතාවන්ගේ කොමියුනිස්ට් සංවිධානවල දෙවැනි සමස්ත රුසියා සම්මේලනයට කළ කථාව[8]

1919 නොවැම්බර් 22

සහෝදරවරුනි, පෙරදිග මුස්ලිම් සංවිධාන නියෝජනය කරන කොමියුනිස්ට් සහෝදරවරුන්ගේ මෙම සම්මේලනයට ශුභ ප්‍රාර්ථනා ඉදිරිපත් කිරීමට සහ රුසියාවේ හා ලෝකය මුළුල්ලේම දැන් පවතින තත්වය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මට අවස්ථාවක් ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙමි. මගේ කථාවේ මාතෘකාව වර්තමාන තත්වය යනුයි. මා අදහස් කරන ලෙසට, වර්තමානයේදී මෙම ප්‍රශ්නයේ වැදගත්ම අංශය වන්නේ, පෙරදිග ජනතාවන් අධිරාජ්‍යවාදය කෙරෙහි දක්වන ආකල්පය සහ එම ජනතාවන් අතර වන විප්ලවීය ව්‍යාපාරයයි. පෙරදිග ජනතාවන්ගේ විප්ලවීය ව්‍යාපාරයට දැන් සාර්ථක ලෙස සංවර්ධනය වීමේ හැකියාව ලැබෙන්නේ සහ එයට සාර්ථක ප්‍රතිඵල ලැබීමට හැකිවන්නේ, අපේ සෝවියට් සමූහාණ්ඩුව ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයට විරුද්ධව කරන විප්ලවවාදී අරගලය හා සමග කෙළින්ම සම්බන්ධ වීමෙන් පමණක් බව නිරායාසයෙන්ම පැහැදිලි වේ. රුසියාවේ නොදියුණු කම, ඇය වර්ග ප්‍රමාණයෙන් විශාල රටක් වීම, ඇය යුරෝපයත් ආසියාවත් අතර හා බටහිරත් නැගෙනහිරත් අතර දේශ සීමාව වීම ඇතුළු කරුණු රාශියක් නිසා, අධිරාජ්‍යවාදයට විරුද්ධව කරන ලෝක අරගලයේ පුරෝගාමීන් වීමේ සම්පූර්ණ බරට කර ගැසීමට අපට සිදු විය. අපි එය මහත් ගෞරවයක් කොට සලකමු. ඉහත සඳහන් තත්වය යටතේ, නුදුරුතම අනාගතයේ සමස්ත සංවර්ධන මාවතෙන් පෙන්නුම් කෙරෙන්නේ ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයට විරුද්ධව වඩාත් පුළුල් සහ වඩාත් බරපතල අරගලයක් කිරීමට සිදුවන බව හා එම අරගලය අධිරාජ්‍යවාදයේ — ජර්මනියේ, ප්‍රංශයේ, බ්‍රිතාන්‍යයේ හා ඇමෙරිකාවේ — එක්සත් බලවේගයන්ට විරුද්ධව සෝවියට් සමූහාණ්ඩුව කරන අරගලයත් සමග අනිවාර්යය වශයෙන් සම්බන්ධව පවතින බවය.

කාරණයේ යුද්ධමය පැත්ත ගැන බලන කල, සියලුම පෙරමුණුවල තිබෙන්නේ කොතරම් වාසිදායක තත්වයක්දැයි යන්න ඔබ දන්නෙහිය. මෙම ප්‍රශ්නය ගැන විස්තර නොකරමි. ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය විසින් බලෙන් අප මත දමන ලද සිවිල් යුද්ධය, අවුරුදු දෙකක කාලය තුළ දී රුසියානු සමාජවාදී ඒකාබද්ධ සෝවියට් සමූහාණ්ඩුවට සිදුකළ අලාභහානි අපරිමිතය. එය සෝවියට් සමූහාණ්ඩුවේ ජනතාව මත දැමූ නොඉවසිය හැකි අමාරුකම් ඔවුන්ට දරාගත නොහැකි සේ බොහෝ විට පෙනුනේය. නමුත්, ඒ අතරම, සමාජවාදී විප්ලවයට පෙර පවා අප කොල්ල කෑ අපගේ ඊනියා මිතුරන්, වනසතුන් බවට හැරෙමින් ක්‍රියාත්මක කළ තිරශ්චීන හිංසනයත්, ගැසූ කෲරතර ම්ලේච්ඡ ප්‍රහාරයත්, නිසා යුද්ධයෙන් ප්‍රාතිහාර්යයක් පැන නගින කලෙක මෙන්, සටනෙන් විඩාපත් සහ තවත් යුද්ධයක් දරාගත නොහැකි වැනි පෙනුමක් ඇතිව සිටි ජනතාව දෙ අවුරුද්දක් මුළුල්ලේ යුද්ධයට ඔරොත්තු දුන්නා පමණක් නොව, එය ජයග්‍රාහී නිමාවකටද පත් කරමින් සිටිති. කොල්චාක්, යුදේනිච් සහ දෙනිකින් පරදවමින් අප දැන් ලබන ජයග්‍රහණයන්ගෙන් සලකුණු වන්නේ, ස්වකීය විමුක්තිය සඳහා නැගී සිටින රටවලට හා ජනතාවන්ට විරුද්ධව අධිරාජ්‍යවාදය කරන අරගලයේ ඉතිහාසයෙහි නව අදියරක් උදා වී තිබෙන බවයි. මේ හා සම්බන්ධයෙන් ගත් කල, ඉතිහාසය දීර්ඝ කාලයක් තිස්සේ දැන සිටි දෙය සිවිල් යුද්ධයේ දෙවසරක කාලයෙන් තහවුරු විය. එය නම්, යුද්ධයක ස්වභාවය සහ එහි සාර්ථකත්වය ප්‍රධාන වශයෙන් රඳා පවත්නේ යුද්ධයට යන රටේ අභ්‍යන්තර රාජ්‍ය පාලනය මත බව හා අදාළ රට යුද්ධයට පෙර ගෙන ගිය අභ්‍යන්තර ප්‍රතිපත්තිය යුද්ධයෙන් පිළිබිඹු වන බවය. යුද්ධය ක්‍රියාත්මක කිරීමේදී මේ සියල්ලම අනිවාර්යය වශයෙන්ම පිළිබිඹු වන්නේය.

යුද්ධය කළ හා දිගටම කරගෙන ගිය පංතිය කුමක්ද? එය ඉතාමත් වැදගත් ප්‍රශ්නයකි. හතර අවුරුද්දක අධිරාජ්‍යවාදී යුද්ධයෙන් වැහැරී ගිය රුසියාව වැනි නොදියුණු රටක සිටින ජනතාවට, නොඇදහිය හැකි සහ අනුපමේය අමාරුකම් සහ දුෂ්කරතාවයන්ගෙන් ගහන දෙවසරක් තිස්සේ එම යුද්ධය කරගෙන යාමට තරම් ආත්ම ශක්තියක් ඇති වූයේ කෙසේද යත්, එම සිවිල් යුද්ධය කරන ලද්දේ ස්වකීය විමුක්තිය දිනා ගත් කම්කරුවන් හා ගොවීන් විසින් වීමද, එය තම රටේ සහ සමස්ත ලෝකයේම ධනපතියන්ගෙන් නිදහස දිනා ගැනීමට වැඩ කරන ජනතාව ගෙන ගිය දේශපාලන අරගලය දිගටම ඉදිරියට ගෙනයාමක් වීමද, නිසාය. ඔවුන් එම ශක්තිය ලද්දේ හුදෙක්ම එම හේතු නිසාම පමණකි.

සිවිල් යුද්ධයේ කොල්චාක් සම්බන්ධ ඉතිහාසයෙන් මෙය ඉතාමත් සිත් කාවදින සේ පෙනී ගියේය. කොල්චාක් ලෝකයේ ඉතාමත් ශක්තිමත්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

බලවතුන් සියලු දෙනාගේම ආධාර ලැබූ සතුරෙක් විය. ලක්ෂ ගණන් විදේශීය හමුදා විසින් ආරක්ෂිත වූ දුම්රිය මාර්ගයක් ඔහුට තිබිණ. අධිරාජ්‍යවාදී යුද්ධය සඳහා පුහුණු කරන ලද නමුත් ප්‍රායෝගික වශයෙන් එයට සම්බන්ධ නොවී සිටීම නිසා සැලකිය යුතු අලාභ හානි නොවින්ද, ජපන් හමුදා වැනි, ලෝක අධිරාජ්‍යවාදයේ විශිෂ්ඨතම සේනා ඒ අතර විය. ඉතා පොහොසත් හා ප්‍රවේණිදාස ක්‍රමය ගැන කිසි කලෙකත් නොදත්, එනිසා අන් සියල්ලටම වඩා කොමියුනිස්ට්වාදයෙන් දුරස්තර වූ, සයිබීරියානු ගොවීන්ගේ සහාය කොල්චාක්ට තිබිණි. කොල්චාක්ගේ හමුදා ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයේ පෙරමුණු බල ඇණිය වූ හෙයින් ඔහු අනභිභවනීය පුද්ගලයෙක් සේ දිස් විය. ජපන් සහ චෙකොස්ලොවැක් සේනාවන්ද, තවත් අධිරාජ්‍යවාදී රටවල් ගණනක සේනාවන්ද, අද දක්වාම සයිබීරියාවේ යුද්ධ කරති. සයිබීරියාව සහ ඇගේ අති මහත් ස්වාභාවික සම්පත් අවුරුද්දකට වැඩි කාලයක් කොල්චාක්ගේ පාලනයට යටත්ව තිබිණි. දෙවැනි ජාත්‍යන්තරයේ සමාජවාදී පක්ෂ, මෙන්ෂෙවික් වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩල කාරක සභා පෙරමුණ[9] පිහිටුවාගෙන මුලින් එම පාලනයට ආධාර කළහ. මෙම තත්වයන් යටතේ, සාමාන්‍ය මිනිසාගේ ස්ථාවරය අනුව බලන කල, ඉතිහාසයේ සාමාන්‍ය ගමන අනුව, එය ශක්තිමත් හා අනභිභවනීය පාලනයක් සේ පෙනිණ. එහෙත් අවුරුද්දකට අධික කොල්චාක් පාලනයෙන් පහත සඳහන් කරුණු හෙළිදරව් විය. කොල්චාක් රුසියාවේ අභ්‍යන්තරය දක්වා ඉදිරියට ගිය තරමට ඔහු වෙහෙසට පත් වූයේය. අවසානයේදී රුසියාව කොල්චාක් පරදවා සම්පූර්ණ ජය අත්කරගත් බව අපි දුටුවෙමු. ධනපති ක්‍රමයේ වියගසෙන් නිදහස් වූ කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ එක්සත් බලවේගයන් ප්‍රාතිහාර්ය පෑමෙහි සමත් වන බව අපට මෙහිදී දක්නට ලැබේ. තමන් සටන් කරන්නේ සූරාකන්නන්ට විරුද්ධවය යන විඥානය වැඩ කරන සහ පීඩිත ජනතාවට ලැබුණ පසු, ඔවුන් සැබැවින්ම විප්ලවවාදී යුද්ධය වෙත ඇදී යන බවටත්, එය ගැන උනන්දුවන බවටත්, ප්‍රායෝගික සාධක මෙහිදී දක්නට ලැබේ. එවැනි විප්ලවවාදී යුද්ධයක් ප්‍රාතිහාර්ය පෑමේ ශක්තිය හා හැකියාව ජනිත කරයි.

රතු හමුදාව ඉටු කර ඇති කාර්යයන්ද, එහි අරගලය සහ එහි ජය ග්‍රහණයේ ඉතිහාසයද, පෙරදිග ජනතාවනට ඉමහත් සහ කාලාන්තර වැදගත් කමක් සහිත වන්නේයයි මම අදහස් කරමි. පෙරදිග ජනතාවන් කොතරම් දුර්වලව සිටියත්, අරගලයේදී විස්ම ජනක කාර්මික ශිල්පය සහ යුද්ධ ශිල්පය උපයෝගි කර ගන්නා යුරෝපීය බලවතුන්ගේ ශක්තිය පරාජය කළ නොහැකිසේ පෙනුනත්, පීඩිත ජනතාවන් කරන විප්ලවවාදී

යුද්ධයක් මගින්, කෝටි සංඛ්‍යාත වැඩ කරන හා සූරා කනු ලබන ජනතාව ඇත්ත වශයෙන්ම අවදි කරනු ලැබුව හොත්, ජාත්‍යන්තර විප්ලවයේ අර්ථානුසාරයෙන් පමණක් නොව, ආසියාවේදී සහ සයිබීරියාවේදී ලද අත් දැකීම්, එනම්, සියලුම බලවත් අධිරාජ්‍යවාදී රටවල ආයුධ සන්නද්ධ ආක්‍රමණයට භාජනය වූ සෝවියට් සමූහාණ්ඩුවේ අත් දැකීම් අනුව බලන කලද, එවැනි විප්ලවවාදී යුද්ධයක ඇති ශක්‍යතාවයන් හා ප්‍රාතිහාර්යතාවය කෙබඳුද යත්, පෙරදිග ජනතාව නිදහස් කර ගැනීම දැන් සම්පූර්ණයෙන්ම ප්‍රායෝගික දෙයක් වී තිබේ.

එපමණක් නොවේ. සිවිල් යුද්ධය නැමති කෝව තුළ, විප්ලවවාදී උද්වේගය සංවර්ධනය වීම සමග සමාගමව, බලවත් අභ්‍යන්තර සංශක්තියක්ද ඇති වන බව අපට හා සියලුම රටවල කොමියුනිස්ට්වරුන්ට රුසියාවේ සිවිල් යුද්ධයේ අත් දැකීම්වලින් පෙනේ. යුද්ධය ජාතියක සියලුම ආර්ථික හා සංවිධානමය බලවේගයන් උරගා බලන්නේය. සාගතයෙන් හා දැඩි ශීතලෙන් පෙළෙන කම්කරුවන්ට හා ගොවි ජනයාට යුද්ධය නිසා අසීමිත අමාරු කම් ඇති වූ නමුත්, අපට පැසුලු බිම් ප්‍රදේශයක් තිබෙන නිසා හා එය ශක්තිමත් නිසාද, සාගතය හා ශීතලය මධ්‍යයේම ගොවිජනයා හා කම්කරුවන් එක්සත්ව සිටිමින් ශක්තිමත් වූ නිසා සහ සෑම බලවත් පහරකටම පිළිතුරු දෙමින් තම බලවේගයන්ගේ වැඩි සංශක්තියක් හා වර්ධිත ආර්ථික බලයක් පෙන්වූ නිසාද, අන්තිමේදී, අප ජය ගනිමින් සිටින බවත්, තව දුරටත් ජය ලබන බවත්, කිව හැකිය. කොල්චාක්, යුදේනිච් සහ ඔවුන්ගේ මිතුරන් වූ ලෝකයේ ශක්තිමත්ම බලවතුන්ද පරදවා ජය ලැබීමට හැකි වූයේ, හුදෙක්ම ඒ නිසාමය. එක් අතකින් විප්ලවවාදී යුද්ධය වර්ධනය කළ හැකි බවත්, අනික් අතින් විප්ලවවාදී මධ්‍යස්ථානය, එනම්, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීමට තරම් එඩිතර වූ කම්කරු හා ගොවිජනතා ආණ්ඩුව විනාශ කිරීම අරමුණු කොට ගත් විදේශ ආක්‍රමණයේ බලවත් ප්‍රහාර මධ්‍යයේම සෝවියට් ක්‍රමය ශක්තියෙන් වර්ධනය වන බවත්, පසුගිය අවුරුදු දෙකෙන් පෙනී ගොස් තිබේ. නමුත් මෙම බලවත් ප්‍රහාරවලින් සිදුවූයේ රුසියාවේ කම්කරුවන් හා ගොවීන් විනාශ වීම නොව, ඔවුන් දැඩි වීමය.

වර්තමාන කාලයෙන් උපුටා ගත හැකි ප්‍රධාන පාඩම සහ එහි ප්‍රධාන සන්ධාරය එසේය. අපේ දේශයෙහි ඉතිරිව සිටින අවසාන සතුරා වන දෙනිකින් පරදවා තීරණාත්මක ජයග්‍රහණයක් ලබන තත්වයට අපි සමීපව සිටිමු. අප ශක්තිමත් බව අපට දැනේ. සමූහාණ්ඩුව අභ්‍යන්තර වශයෙන් තහවුරු වී තිබෙන බවත්, දෙනිකින්ට විරුද්ධව කරන යුද්ධයෙන් අප තවත් ශක්තිමත් වූ ද, සමාජවාදී මන්දිරය ඉදි කිරීමට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වඩාත් හොඳින් සූදානම් වූ ද, තත්වයකින් මතුවනු ඇති බවත් සැබෑවක් හෙයින්, එය දහස් වරක් වුවද කිව හැකිය. සිවිල් යුද්ධය කෙරෙන අතරතුර දී සමාජවාදය ගොඩනැගීමේ කටයුත්ත සඳහා අපට යෙදිය හැකි වූ ශක්තිය හා කාලය ඉතාමත් ස්වල්ප විය. දැන් අප නිදහස් මාර්ගයකට පිවිසෙන නිසා, එයට සම්පූර්ණ වශයෙන් කැප වීමේ හැකියාව අපට ලැබෙනු ඇත.

බටහිර යුරෝපයේ අධිරාජ්‍යවාදය දිරා යනු අපට පෙනේ. අවුරුද්දකට පෙර පැවති තතු වටහා නොගත් සමාජවාදීන් පවා, සමාජවාදීන් අති බහුතරය පවා, සිදුවෙමින් පවතින දෙය දුටුවේ අධිරාජ්‍යවාදී කණ්ඩායම් දෙකක් අතර අරගලයක් ලෙසටය. ඒ අනුව, මුළු ඉතිහාසයම එම අරගලයෙන් සෑදුම් ලබන බවත්, වෙනත් යමක් ඉදිරිපත් කළ හැකි බලවේගයක් නොමැති බවත්, ඔවුන් විශ්වාස කළ බැව් ඔබ දන්නෙහිය. බලගතු ලෝක මංකොල්ලකාරයන්ගේ කණ්ඩායම්වලට එකතු වනු හැර, සමාජවාදීන්ට පවා අනුගමනය කළ හැකි විකල්ප ක්‍රියාමාර්ගයක් නොමැති සේ ඔවුන්ට පෙනී ගියේය. 1918 ඔක්තෝබර් අවසානයේ පෙනෙන්නට තිබුණේ එවැනි තත්වයකි. එහෙත් ඉන් පසුව ගෙවීගිය වර්ෂයේදී අභූත පූර්ව සිදු වීම්, ගැඹුරු සහ දූරගාමී සිදුවීම් ඇති වූ බව ලෝක ඉතිහාසය විසින් දක්නා ලදී. අධිරාජ්‍යවාදී යුද්ධ සමයේ දී දේශප්‍රේමීන් වී සිටි සහ ස්වකීය චාරය සාධාරණ කර පෙන්වීමට තමන්ට සතුරෙකුට මුහුණ දෙන්නට සිදුවූ බව කී සමාජවාදී බොහෝ දෙනෙකුගේ ඇස්, මෙම සිදුවීම් නිසා පැදිනි. ජර්මන් අධිරාජ්‍යවාදීන්ගෙන් ගැලවීම සලසන්නේ බ්‍රිතාන්‍ය සහ ප්‍රන්ස අධිරාජ්‍යවාදීන් යයි කියමින්, ඔවුහු එම අධිරාජ්‍යවාදීන් සමග වූ තමන්ගේ සන්ධාන ගතවීම සාධාරණ කර දක්වූහ. එම යුද්ධය මායා මත කීයක් බිඳ දැම්මේදැයි බලන්න! ජර්මන් අධිරාජ්‍යවාදයේ දිරායාම අපට පෙනෙන්නට තිබේ. එය දිරා යාමෙන්, සමූහාණ්ඩුවාදී විප්ලවයකට පමණක් නොව, සමජවාදී විප්ලවයකට පවා මග පැදිනි. අද ජර්මනියෙහි පංති අරගලය තවත් තියුණු වී ඇති බව ඔබ දන්නෙහිය. එහි සිවිල් යුද්ධය ලං ලංව එන බව ඔබ දන්නෙහිය. එය වූ කලී ජර්මන් නිර්ධන පංතිය ජර්මන් අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව කරන යුද්ධයකි. එම අධිරාජ්‍යවාදීන් සමූහාණ්ඩුවාදී වර්ණ පැළඳගෙන සිටින නමුත්, ඔවුහු දැනුදු අධිරාජ්‍යවාදීන්ම වෙති.

බටහිර යුරෝපයේ සමාජ විප්ලවය ඉතා වේගයෙන් මෝරා එන බව කවුරුත් දනිති. අමෙරිකාවේ සහ බ්‍රිතාන්‍යයෙහිද එයම සිදු වන්නේය. මෙම රටවල් විසින් සංස්කෘතිය සහ ශිෂ්ටාචාරයද, ජර්මන් අධිරාජ්‍යවාදීන් පරදවා ජයගත්තවුන්ද, නියෝජනය කරන බවට වගාඩම්බර දෙඩනු ලැබේ. එසේ වුවද වර්සයිල්ස් ගිවිසුම[10] සකස් කිරීමට වන් විට, එය ජර්මන් හොරුන් විසින් අප පිට පටවන ලද බ්‍රෙස්ට් ගිවිසුමට[11] වඩා සිය ගුණයකින් කොල්ලකාරී ගිවිසුමක් බව සැමටම පෙනී ගියේය. ඒ අභාග්‍ය සම්පන්න ජයග්‍රාහී රටවල ධනපතියන් සහ අධිරාජ්‍යවාදීන් තමන්ටම ගසා ගැනීමෙහි සමත්වූ බරපතලම පහර එයයි. වර්සයිල්ස් ගිවිසුම නිසා ජයග්‍රාහී ජනතාවන්ගේ නෙත් පැදිනි. බ්‍රිතාන්‍යය හා ප්‍රන්සය ප්‍රජාතන්ත්‍ර-වාදී රාජ්‍යයන් වුවද, අප ඉදිරියේ ඇත්තේ සංස්කෘතියේ සහ ශිෂ්ටාචාරයේ නියෝජිත රාජ්‍යයන් නොව, ධනපති කැදරයන් විසින් පාලනය කරනු ලබන රටවල් බව එයින් පෙනී ගියේය. ඔල්වරසන් දෙමින් සිටින අධිරාජ්‍යවාදීන්ට වර්සයිල්ස් ගිවිසුම ජයග්‍රහණයක් වන්නේ පෙනුමෙන් පමණකි. ඇත්ත වශයෙන්ම එයින් සලකුණු කෙරෙන්නේ සමස්ත අධිරාජ්‍යවාදී ලෝකයේම බංකොලොත් භාවයයි. යුද්ධ කාලයේදී දිරාපත් වන අධිරාජ්‍යවාදයේ නියෝජිතයින් සමග මිත්‍ර සම්බන්ධකම් ඇති කර ගත්තාවූ සහ එක්ව යුද වැදුනාවූද, මංකොල්ලකාරී කණ්ඩායම්වලින් එකක් ආරක්ෂා කළාවූද, සමාජවාදීන් වැඩ කරන ජනතාව විසින් ස්ථිර වශයෙන්ම අත්හැර දමන ලද බවයි. මෙම කරුණු දන්නා අපට සතුටු විය හැකි තරම් වේගයෙන්, ඉහත සඳහන් මංකොල්ල කාරයන් අතර අභ්‍යන්තර අරගලය වර්ධනය වන්නේය. වර්සයිල්ස් ගිවිසුම අති කැදර ගිවිසුමක් වීමත්, ප්‍රන්සය හා බ්‍රිතාන්‍යය ජර්මනියට විරුද්ධව සටන් කළේ ඇත්ත වශයෙන්ම යටත් විජිත හා සම්බන්ධයෙන් වූ ඔවුන්ගේ පාලනය ශක්තිමත් කර ගැනීමට හා ඔවුන්ගේ අධිරාජ්‍යවාදී බලය වැඩි කර ගැනීමට බව එයින් පෙනී යාමත්, නිසා වැඩ කරන ජනතාවගේ ඇස් පැදිනි. කල් යත්ම අභ්‍යන්තර අරගලය පුළුල් වෙමින් වර්ධනය වේ.නොවැම්බර් 21 දින ඇතිව ලන්ඩනයෙන් ලැබුණු ගුවන් විදුලි පණිවුඩයක් මම අද දුටිමි.එය එවා ඇති පුවත් පත් කලාවේදීන් විප්ලවවාදීන්ට සහාය දක්වන අය යයි සිතිය නොහැකිය. ඇමෙරිකානුන් වර්සයිල්ස් ගිවිසුම අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා, ප්‍රන්සය තුළ ඇමෙරිකානුන් කෙරෙහි අභූත පූර්ව වෛරයක් පැතිර යනු දක්නට ලැබෙන බව එම පණිවුඩයෙහි කියා ඇත.

බ්‍රිතාන්‍යය සහ ප්‍රන්සය ජයග්‍රාහකයෝ වූහ. නමුත් ඔවුහු ඉහවහ යන තෙක් ඇමෙරිකාවට ණය වී සිටිති. ප්‍රංශය සහ බ්‍රිතාන්‍යය කැමති පරිද්දෙන් ඔවුන් ජයග්‍රාහකයන් සේ සලකා ගැනීමට ඔවුනට ඉඩ දීමටත්, එහෙත් තමන් යොදය බේරා ගැනීමට සහ යුද්ධ කාලයේ දුන් ආධාර සඳහා අධික පොලී ලබා ගැනීමටත්, ඇමෙරිකාව තීරණය කර තිබේ. ඒ පිළිබඳ සහතිකය දැනට ගොඩනගනු ලබන ඇමෙරිකානු නාවුක හමුදාවයි. එය විශාලත්වයෙන් බ්‍රිතාන්‍ය නාවුක හමුදාව අභිභවා යන්නට පටන් ගෙන තිබේ. ඇමෙරිකානු ඒජන්තවරුන් විසින් සුදු වහලුන්, කාන්තාවන් හා දැරියන් මිලට ගනු ලැබ, වෛශ්‍යා වෘත්තිය සංවර්ධනය කරනු සඳහා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඔවුන් නැවගත කරනු ලැබේ. ඇමෙරිකානු අධිරාජ්‍යවාදයේ ගොරහැඩි ස්වභාවය එයින්ම වටහා ගත හැකිය. සංස්කෘතියෙන් දියුණු ඇමරිකාව ගනිකා නිවාස සඳහා සුදු වහලුන් සැපයීමෙහි යෙදීම ගැන සිතන්න! පෝලන්තයේ සහ බෙල්ජියමේ ඇමෙරිකානු ඒජන්තවරුන් සමග සට්ටන ඇතිවන්නේය. මිත්‍ර (Entente) ගිවිසුමෙන් ආධාර ලැබූ සෑම කුඩා රටකම ඉතා විශාල පරිමාණයෙන් සිදුවන දේ පිළිබඳ අංශු මාත්‍ර පින්තූරයකි, එය. නිදර්ශනයක් වශයෙන් පෝලන්තය ගන්න. දැන් තමන් ස්වාධීන බලවතෙක් යයි කියාගන්නා පෝලන්තයට යන ඇමෙරිකානු ඒජන්තවරුන් සහ ලාභ ගරන්නන් විසින් පෝලන්තයේ සම්පත් සියල්ලම මිලට ගනු ලබන බව පෙනේ. ඇමෙරිකානු ඒජන්තවරුන්ගේ මඩිස්සලයට නොවැටුනු පැක්ටරියක් හෝ කර්මාන්ත අංශයක් එහි නොමැති තරම්ය. ඇමෙරිකානුන් කොතරම් ගර්විත වීද යත්, ඔවුහු "මහා සහ විජයග්‍රාහක" ප්‍රන්සය වහලට ගැනීමට පටන් ගෙන සිටිති. ඉහතදී පොලී කාරයන්ගේ රටක් වූ ප්‍රන්සය, අද ඇමෙරිකාවෙන් ගත් ණය තුළ එරී ඇත. එයට හේතු වූ කරුණු මෙසේය. ඇගේ ආර්ථික ශක්තිය ක්ෂය වී ගොසිනි. තමන්ට අවශ්‍ය තරම් ධාන්‍ය හෝ ගල් අඟුරු ඇයට නැත. එනිසා, ඇයට ඇගේ ද්‍රව්‍යමය සම්පත් මහා පරිමාණ ලෙස සංවර්ධනය කර ගත නොහැකිය. ඒ අතර අඩුපාඩුවක් නොමැතිව කප්පම සම්පූර්ණයෙන් ගෙවන ලෙස ඇමෙරිකාව ඇයට බල කරයි. මේ අනුව බලන කල ප්‍රන්සය, බ්‍රිතාන්‍යය සහ අනෙකුත් බලවත් රටවල් ආර්ථික වශයෙන් බංකොලොත් ලබා තිබෙන බව එන්න එන්නම තව තවත් පැහැදිලි වන්නේය. ප්‍රන්ස මැතිවරණවලදී දේවගැතිවාදීන් බලවත් වී ඇත. නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා ජර්මනියට විරුද්ධව තම සම්පූර්ණ ශක්තියම කැප කරන සේ රවටනු ලැබූ ප්‍රන්ස ජනතාවට, දැන් තෑග්ගට ලැබී තිබෙන්නේ කොණක් නොමැති ණයය. අති කෑදර ඇමෙරිකානුන්ගේ අවඥ සහගත සිනහවය. ඒ මදිවාට ඉතාමත් දරුණු ප්‍රතිගාමිත්වයේ නියෝජිතයන්ගෙන් සමන්විත දේවගැතිවාදී බහුතරයක්ද බලයට පත්ව ඇත.

සමස්ත ලෝකය මුළුල්ලේම තත්වය අපරිමාණ ලෙස සංකීර්ණත්වයෙන් වැඩී තිබේ. ජාත්‍යන්තර ප්‍රාග්ධන අධිකාරීන්ගේ අන්තේවාසිකයන් වන කොල්චාක් සහ යුදේනිච් පරදවා අප ලද්දේ විශාල ජයග්‍රහණයකි. නමුත්, අප ජාත්‍යන්තර පරිමාණයෙන් ලබන ජයග්‍රහණය එතරම් දෘශ්‍යමාන නොවුවද, එය ඊට වඩා විශාලය. මෙම ජයග්‍රහණය සමන්විත වන්නේ, අපට විරුද්ධව හමුද එවීමට නොහැකි තත්වයකට පත්ව සිටින අධිරාජ්‍යවාදයේ අභ්‍යන්තරය දිරාපත් වීමෙනි. අපට විරුද්ධව හමුද එවීමට මිත්‍ර (Entente) ගිවිසුම උත්සාහ කළේය. නමුත් එම හමුද භටයින්ට අපගේ හමුද භටයන් හමුවූ කල සහ ස්වකීය භාෂාවට පරිවර්තනය කළ

අපගේ රුසියානු සෝවියට් ව්‍යවස්ථාව ගැන ඔවුන් දැනගත් විට, ඔවුහු දුර්මුඛ වෙති. පිළුණු සමාජවාදයේ නායකයන් කොතරම් බලපෑම් කළත්, අපගේ ව්‍යවස්ථාවට නිතරම වැඩ කරන ජනතාවගේ අනුකූලතාවය ලැබෙනු ඇත. දැන් "සෝවියට්" යන වචනය සෑම දෙනාටම වැටහේ. සෝවියට් ව්‍යවස්ථාව සියලුම භාෂාවලට පරිවර්තනය කර තිබේ. සෑම කම්කරුවෙක්ම ඒ ගැන දන්නේය. එය වැඩ කරන ජනතාවගේ ව්‍යවස්ථාව බවත්, ජාත්‍යන්තර ප්‍රාග්ධනයට විරුද්ධව ජයග්‍රහණය සඳහා හඬ නගන වැඩ කරන ජනතාවගේ දේශපාලන ක්‍රමය බවත්, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය පරදවා අප ලැබූ ජයග්‍රහණයක් බවත්, ඔහු දනී. අධිරාජ්‍යවාදීන් ඔවුන්ගේම හමුදවන් අහිමි කර, අප එම භටයන් අපගේ පැත්තට දිනා ගෙන තිබෙන නිසා, එම හමුද සෝවියට් රුසියාවට විරුද්ධව උපයෝගී කර ගැනීමේ හැකියාව ඔවුනට අහිමි කර තිබෙන නිසා,අපේ මෙම ජයග්‍රහණය සියලුම අධිරාජ්‍යවාදී රටවල් තුළ ආන්දෝලනයක් ඇති කළේය.

වෙනත් රටවල, පින්ලන්තයේ, පෝලන්තයේ සහ ලත්වියාවේ හමුද යොදා ගනිමින් යුද්ධයක් කිරීමට ඔවුන් කළ උත්සාහය ගැන අපි දනිමු. නමුත් එයින් ද සාර්ථකත්වයක් නොලැබිණි. සති කීපයකට පෙර බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලයේදී කථා කළ චර්චිල් ඇමතිවරයා, සෝවියට් රුසියාවට විරුද්ධව රටවල් දහ හතරක ප්‍රහාරයක් සංවිධානය කර තිබෙන බවත්, අළුත් අවුරුද්ද වන විට රුසියාව පරදවා එම ප්‍රහාරය ජයග්‍රාහී වනු ඇති බවත්, දන්වා මුළු ලොවටම කේබල් පණිවුඩ යවා ඇතැයි කියමින් මෑත දෙඩීය. එම ප්‍රහාරයට ජාතීන් රැසක් සහභාගි වූ බව ඇත්තය. පින්ලන්තය, උක්‍රේනියාව, පෝලන්තය, ජෝර්ජියාව, ජපානය, ප්‍රන්සය, බ්‍රිතාන්‍යය සහ ජර්මනියද එයට සහභාගි විය. නමුත් එයින් වූයේ කුමක්දැයි අපි දන්නේමු! එස්තෝනියන්වරු යුදේනිච්ගේ සේනා අතරමං කර දැමූ බව අපි දන්නෙමු. ඔහුට උදව් කිරීමට එස්තෝනියන්වරු අකැමති වන අතර, පින්ලන්තයද, ඇගේ ධනපති පංතියේ බලවත් අපේක්ෂාව නොතකාම, යුදේනිච්ට ආධාර කිරීමෙන් වැලකුණු නිසා, දැන් ධනපති පුවත් පත්වල වේගවත් විවාදයක් සිදුවෙමින් පවතී. ඒ අනුව, අපට පහර දීමට දැරූ දෙවැනි ප්‍රයත්නයද ව්‍යර්ථ විය. ප්‍රථම අදියර වූයේ යුද්ධ නියාමයන් සියල්ලටම අනුකූලව ආයුධ සන්නද්ධ කරන ලද මිත්‍ර (Entente) ගිවිසුමේ හමුදවන්ම එවීමය. එනිසා ඔවුන් සෝවියට් සමූහාණ්ඩුව පරාජය කිරීමෙහි සමත්වන සැටියක් පෙනෙන්නට තිබුණි. ඔවුහු දැනටමත්, කොකේසස්, අර්හංගල්ස්ක් සහ ක්‍රිමියා පෙදෙස් අත් හැර පසු බැස සිටිති. චෙකොස්ලොවැකියානුවන් තවමත් සයිබීරියාවේ රැඳී සිටින ලෙසින්ම, මොවුහුද කවමත් මූර්මන්ස්ක්හි සිටිති. එහෙත් ඒ තනිවූ කණ්ඩායම් වශයෙන් පමණකි. තමන්ගේම හමුද යොදමින් අප පරාජය කිරීමට මිත්‍ර

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

(Entente) ගිවිසුම දරූ ප්‍රයත්නය කෙළවර වූයේ අපට ජය අත් පත් වීමෙනි. දෙවැනි ප්‍රයත්නය සමන්විත වූයේ, මූලයමය වශයෙන් සම්පූර්ණයෙන්ම මිත්‍ර (Entente) ගිවිසුමෙන් යැපෙන අපගේ අසල්වැසි ජාතීන් අපට විරුද්ධව මෙහෙයවමින්, සමාජවාදයේ කැදැල්ලක් සේ සලකා අප විනාශ කිරීමට ගත් උත්සාහයකිනි. නමුත් මෙම ප්‍රයත්නයද අසාර්ථක විය. මේ කුඩා රටවලින් එකකටවත් එවැනි යුද්ධයක් කිරීමේ හැකියාව නොමැති බව පෙනී ගියේය. එපමණක් නොව, සෑම කුඩා රටක් තුළම මිත්‍ර (Entente) ගිවිසුම කෙරෙහි මුල් බැස ගත් වෛරයක් ඇති වී තිබේ. යුදේනිච් ක්‍රාස්නය සිලෝ අල්වාගෙන සිටියදී, පින්ලන්තය පෙත්‍රොග්‍රාදය අල්වා ගැනීමෙන් වැලකුනේ ඇයට සෝවියට් රුසියාව සමග එක්ව සාමයෙන් ජීවත් වීමට පුළුවන් බවත්, මිත්‍ර (Entente) ගිවිසුම සමග සාමයෙන් ජීවත් වීමට නොහැකි බවත්, ඇය දැන තිබීම නිසා ඇතිවුනු පැකිලීම හේතු කොට ගෙනය. සෑම කුඩා ජාතියකටම එය දැනී තිබේ. ජාත්‍යෝන්මාදවාදය පැතිර පවතින, එහෙත් ව්‍යාප්තවන මිත්‍ර (Entente) ගිවිසුමේ සූරාකෑමට බඳුන් වන පින්ලන්තය, ලිතුවේනියාව, එස්තෝනියාව සහ පෝලන්තය තුළ එම ගිවිසුම කෙරෙහි වූ වෛරයක් ඇත්තේය. එනිසා සෝවියට් සමූහාණ්ඩුවට විරුද්ධව කළ යුද්ධයේ ප්‍රථම අදියර පමණක් නොව, දෙවැනි අදියරද, අසාර්ථක වී තිබෙන බව අතිශයෝක්තියෙන් තොරව අපට කිව හැක. අපට තවමත් කිරීමට ඉතිරිව තිබෙන්නේ, දැනටමත් අර්ධ වශයෙන් පරාජයට පත් කර සිටින දෙනිකින් හමුද පරාජය කොට අවසාන කිරීම පමණකි.

දැනට රුසියාවේ හා ජාත්‍යන්තර වශයෙන් පවතින තත්වය එසේය. මා එය ගැන මගේ කථාවෙන් විස්තර කළේ කෙටියෙන් හා සාරාංශ වශයෙනි. අවසාන වශයෙන් පෙරදිග ජාතීන් හා සම්බන්ධයෙන් ඇති වෙමින් පවතින තත්වය ගැන යමක් කීමට මට අවසර දෙන්න. ඔබ විවිධ පෙරදිග ජනතාවන්ගේ කොමියුනිස්ට් සංවිධානවල සහ කොමියුනිස්ට් පක්ෂවල නියෝජිතයන් වන්නෙහිය. රුසියානු බොල්ෂෙවික්වරු, පැරණි අධිරාජ්‍යවාදයේ බල පවුර සාර්ථක ලෙස සිදුරු කළ බවත්, ඔවුන් විප්ලවයේ නව මං ආලෝකමත් කිරීමේ ඉතාමත් දුෂ්කර, එහෙත් ඉතාමත් උත්තුංග කර්තව්‍යය භාරගෙන තිබෙන බවත්, ඒ අතර පෙරදිග ජනතාවන්ගේ නියෝජිතයන් වන ඔබ හමුවේ තිබෙන්නේ ඊටත් වඩා ශ්‍රේෂ්ඨ හා නවතම කර්තව්‍යයක් බවත්, කියනු කැමැත්තෙමි. සමස්ත ලෝකයෙහිම ඇතිවන්නට යන බව පෙනෙන සමාජවාදී විප්ලවය, හුදෙක් ඒ ඒ රටෙහි ධනපති පංතිය පරදවා, එහි නිර්ධන පංතිය ලබන ජයග්‍රහණයක් පමණක් නොවන බව මනාසේ පැහැදිලි වෙමින් පවතී. පහසුවෙන් හා සීඝ්‍ර ආකාරයෙන් විප්ලව ඇති වන්නේ නම්, එය එසේ වන්නට තිබිණ. අධිරාජ්‍යවාදීන් මෙයට ඉඩ නොදෙන බවද, සියලුම රටවල් දේශීය බොල්ෂෙවික්වාදයට විරුද්ධව අවි අමෝරා ගෙන සිටින බවද, දැන් අධිරාජ්‍යවාදීන්ගේ එකම අරමුණ වී තිබෙන්නේ, බොල්ෂෙවික්වාදය එහි දේශය තුළදීම පරාජය කිරීම බවද, අපි දන්නෙමු. සෑම රටකම සිවිල් යුද්ධයට අර අදින්නේත්, එහිදී පරණ සමාජවාදී පාවාදෙන්නන් ධනපති පැත්තට බඳවා ගනු ලබන්නේත්, එනිසාය. ඒ අනුව, සමාජවාදී විප්ලවය, ප්‍රධාන වශයෙන් එක් එක් රටෙහි නිර්ධන පංතිය එහි ධනපති පංතියට විරුද්ධව කරන අරගලයක් නොවනු ඇත. නැත. එය වූ කලී, අධිරාජ්‍යවාදයෙන් පීඩිත යටත් විජිත සහ රටවල්ද, ගැති රටවල්ද, සියල්ලම ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයට විරුද්ධව කරන අරගලයක් වනු ඇත. අප පසුගිය මාර්තුවේ අනුමත කළ පක්ෂ වැඩ පිළිවෙළ මගින්, ලෝක විප්ලවයේ ලභාව ගැන ස්වභාව නිරූපනයක් කළ අපි, දියුණු රටවල් සියල්ලෙහිම අධිරාජ්‍යවාදීන්ට සහ සූරාකන්නන්ට විරුද්ධව එරටවල වැඩ කරන ජනතාවන් කරන සිවිල් යුද්ධය, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයට විරුද්ධව කරන ජාතික යුද්ධ සමග ඒකාබද්ධ වීම ආරම්භ වන්නේ යයි කීවෙමු. විප්ලවයේ ගමන් මාර්ගයෙන් එය සනාථ වී තිබේ. කල් යත්ම, එය තවදුරටත් සනාථ වනු ඇත. පෙරදිග දේශයන්හිදු එයම සිදුවනු ඇත.

පෙරදිග කෝටි ගණන් ජනයා, ගැති සහ වරප්‍රසාද අහිමි ජාතීන්ට අයත් වෙති. එම ජාතීන් මේ දක්වාම අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියට ගොදුරු වී සිටි අතර, ඒවා පැවතුනේ ධනපති සංස්කෘතිය සහ ශිෂ්ටාචාරය පෝෂණය කිරීමට යොදන ලද පොහොර ලෙසින් පමණකි. එනිසා නව ජීවනයකට ස්වාධීනව සහභාගී වන්නන් හා නව ජීවයක් නිර්මාණය කරන්නන් ලෙස පෙරදිග පොදු ජනයා නැගී සිටිනු ඇති බව අපි දන්නෙමු. තවද යටත් විජිත සඳහා භාරකාර බලතල දීම ගැන කථා කරන විට එයින් අදහස් කෙරෙන්නේ උදුරා ගැනීමේ සහ කොල්ලකෑමේ බලතල ගැන බව අපි දන්නෙමු. එයින් අදහස් කෙරෙන්නේ ලෝක ගෝලයේ ජනගහනයෙන් බහුතරය සූරා කෑමේ අයිතිය, ඉන් අල්පමාත්‍ර කොටසකට පැවරීම ගැන බව අපි දන්නෙමු. එම බහුතරය ස්වාධීන විප්ලවවාදී බලවේගයක් සේ සංයුක්ත වීමට අපොහොසත් වූ නිසා, විසිවැනි ශත වර්ෂයේ ආරම්භය තෙක් ඓතිහාසික ක්‍රියාදාමයේ කක්ෂයෙන් සම්පූර්ණයෙන්ම පිටස්තරව පැවති නමුත්, එතැන් පටන්, එය එවැනි අකර්මණ්‍ය කාර්ය කොටසක් ඉටු කිරීමට සීමාවී සිටීම කෙළවර කළ බව අපි දන්නෙමු. එසේම, යුරෝපීය අධිරාජ්‍යවාදීන්ගේ අරගලයට යටත් විජිත රෙජිමේන්තු එහැම පිටින්ම සම්බන්ධ කර ගැනීමට ඔවුනට සිදු වූ හෙයින්, අධිරාජ්‍යවාදී යුද්ධය විප්ලවවාදී ව්‍යාපාරයේ වර්ධනයට ආධාරයක් ද විය. අධිරාජ්‍යවාදී යුද්ධය, පෙරදිගද අවදි කර, එහි ජනතාවන් ජාත්‍යන්තර දේශපා-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ළනයට ඇදගත්තේය. යටත් විජිත ජනතාවන් ආයුධ සන්නද්ධ කළ බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය, යුද්ධ ශිල්පය සහ නවීන යන්ත්‍ර ගැන දැනුමක් ලබා ගැනීමට ඔවුනට ආධාර දුන්හ. ඔවුන් ලබාගත් එම දැනුම, ඔවුන් අධිරාජ්‍යවාදී මහත්වරුන්ට විරුද්ධව පාවිච්චි කරනු ඇත. සම කාලීන විප්ලවයේදී පෙරදිග පිබිදවීමේ කාල සීමාවට අනුගාමීව, ඔවුන් අනුන් ධනවත් කිරීමේ උපකරණ ස්වරූපයෙන් පමණක් පැවතීම කෙළවර කරමින්, සමස්ත ලෝකයේම ඉරණම තීරණය කිරීමට සහභාගි වන කාල සීමාවක් වනු ඇත. පෙරදිග ජනතාවෝ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයෙහි අවශ්‍යතාවය ගැන හා මුළු මිනිස් වර්ගයාගේම ඉරණම හැඩගැස්වීම ගැන, අවබෝධ කර ගනිමින් සිටිති.

ලෝක විප්ලවයේ ආරම්භය ගැන සලකා බලන කල, එය අවුරුදු ගණනාවක් තිස්සේ පවතිනු ඇති බවත්, ඒ සඳහා මහත් පරිශ්‍රමයක් අවශ්‍ය බවත් පෙනේ. ඉහත සඳහන් කරුණු අනුව බලන කල, ලෝක ඉතිහාසයේ සංවර්ධනය පිළිබඳ ඉතිහාසයේදීත්, විප්ලවීය ව්‍යාපාරයේදීත්, ඔබ විශාල කාර්ය කොටසක් ඉටු කරනු ඇතැයිද, අධිරාජ්‍යවාදයට විරුද්ධව අප කරන අරගලය සමග ඔබ සංයෝජනය වනු ඇතැයිද, අපේක්ෂා කරනු ලැබේ. මෙහිදී ජනතාවගෙන් බහුතරය ප්‍රථම වතාවට ස්වාධීන ලෙස කටයුතු කිරීමට පටන් ගන්නා හෙයින් සහ ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය පෙරළා දැමීමේ අරගලයේ ක්‍රියාත්මක සාධකයක් ලෙසින් ඉදිරිපත් වන හෙයින්, ඔබ විප්ලවයට සහභාගි වීමත් සමගම, සංකීර්ණ සහ දුෂ්කර කාර්ය කොටසකට මුහුණ දීමට ඔබට සිදුවේ. එය සාර්ථක ලෙස ඉටු කිරීම අපේ පූර්ණ ජයග්‍රහණයේ පදනම වන්නේය.

පෙරදිග ජනතාවන් අතුරෙන් වැඩි කොටසක් සිටින්නේ යුරෝපයේ නොදියුණුම රට වන රුසියාවටත් වඩා අයහපත් තත්වයකය. නමුත් වැඩ වසම් නෂ්ඨාවශේෂවලට සහ ධනපති ක්‍රමයට විරුද්ධව අප කළ අරගලයේදී රුසියාවේ ගොවි ජනයා හා කම්කරුවන් එක්සත් කිරීමට අපි සමත් වූයෙමු. අපගේ ජයග්‍රහණය එතරම් පහසු වූයේ ධනපති ක්‍රමයට සහ රදළ ක්‍රමයට විරුද්ධව ගොවි ජනයා හා කම්කරුවන් එක්සත් වූ හෙයිනි. පෙරදිග ජනතාවන් අතුරෙන් බහුතරය වැඩ කරන ජනතාවගේ නියෝජිතයන් වන හෙයින්, ධනපති පැක්ටරි නැමති පාසැලේ උගත් කම්කරුවන් නොව, මධ්‍යකාලීන පීඩනයට ගොදුරු වූ වැඩ කරන හා සූරා කනු ලබන ජනතාවගේ නියෝජිතයන් වන හෙයින්, මෙහිදී පෙරදිග ජනතාවන් සමග සම්බන්ධකම් ඉතාමත් වැදගත් වේ. ධනපති ක්‍රමය පරාජය කිරීමෙන් සහ විසිරී සිටින අති විශාල පිරිසක් වන වැඩ කරන ගොවි ජනයා සමග එක්සත් වීමෙන් පසුව, නිර්ධන පංතිකයන් ජයග්‍රාහී ලෙස මධ්‍යකාලීන පීඩනයට විරුද්ධව නැගී සිටියේ කෙසේද යන්න

රුසියානු විප්ලවය පෙන්නුම් කළේය. අප සෝවියට් ජනරජය, දැන් පිබිදී එන පෙරදිග සියලුම ජනතාවන් ඒකරාශී කර ගෙන, ඔවුන් සමග එක්ව, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයට විරුද්ධව අරගලයක් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් ඔබට මුහුණ පාන්නට වී තිබෙන්නේ ලෝකයේ කොමියුනිස්ට්වාදීන් මීට පෙර මුහුණ නුදුන් කර්තව්‍යයකටය. කොමියුනිස්ට්වාදයේ පොදු න්‍යායය හා ව්‍යවහාරය ගැන විශ්වාසය තබමින්, යුරෝපීය රටවල නොපවතින ආකාරයේ විශේෂ තත්වයන්ට ගැලපෙන සේ ඔබ සකස් විය යුත්තෙහිය. පවත්නා තත්වය අනුව, ජනගහනයෙන් විශාලම පිරිස ගොවි ජනතාවය. ඉටු කළ යුතු කර්තව්‍යය වන්නේ, ධනපති ක්‍රමයට විරුද්ධව නොව, මධ්‍ය කාලීන නෂ්ටාවශේෂයන්ට විරුද්ධව අරගලයක් කිරීමයි. මෙම කොන්දේසිවලට ගැලපෙන සේ, ඔබ කොමියුනිස්ට්වාදයේ පොදු න්‍යායය සහ ව්‍යවහාරය ක්‍රියාත්මක කළ යුතුය. මෙය දුෂ්කර සහ නිශ්චිත, එහෙත්, ඉතාමත් ප්‍රසාද ජනක කර්තව්‍යයකි. මෙතෙක් අරගලයට සම්බන්ධ නොවූ ජනතා කොටස් දැන් අරගලයට ඇදී එති. එපමණක් නොව, පෙරදිග කොමියුනිස්ට් ශාඛා ගොඩනැගීම මගින්, තුන්වැනි ජාත්‍යන්තරය සමග සම්බන්ධකම් පවත්වා ගැනීමේ අවස්ථාවද ඔබට ලැබේ. බොහෝ කොටම මධ්‍ය කාලීන තත්වයන් යටතේ ජීවත් වන, පෙරදිග වැඩ කරන සහ සූරාකනු ලබන ජනතාවන් හා සමග ලෝකයේ ප්‍රධාන පෙළේ නිර්ධන පංතිකයින්ගේ මෙම සන්ධානය සඳහා සුදුසු නිශ්චිත ආකෘති සොයා ගැනීම ඔබට භාර කටයුත්තකි. මහා පරිමාණ ලෙස සහ විශාල රටවල ඔබට කිරීමට තිබෙන කර්තව්‍යය අපි අපේ රටෙහි කුඩා පරිමාණයෙන් කර ඇත්තෙමු. ඉහත පසු කී කාර්යය සාර්ථක ලෙස ඉටු කිරීමට ඔබට හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි. ඔබ නියෝජනය කරන කොමියුනිස්ට් සංවිධානවලට ස්තුති වන්නට, ඔබ දියුණු විප්ලවවාදී නිර්ධන පංතිය සමග සම්බන්ධ වී සිටින්නෙහිය. සෑම රටක්ම තුළ ජනතාවට වැටහෙන භාෂාවකින් කොමියුනිස්ට් ප්‍රචාරය තවදුරටත් දිගටම කරගෙන යන බව සහතික කිරීම ඔබට භාර කර්තව්‍යය වේ.

අවසාන ජයග්‍රහණය ලබා ගත හැක්කේ ලෝකයේ දියුණු රටවල් සියල්ලෙහිම නිර්ධන පංතිය විසින්ම යනු, කර්තව්‍යයේ ස්වභාවයෙන්ම පැහැදිලි වන්නේය. රුසියානුන් වන අප පටන් ගන්නා කර්තව්‍යය, බ්‍රිතාන්‍ය, ප්‍රංශ සහ ජර්මන් නිර්ධන පංතිය විසින් තහවුරු කෙරෙනවා ඇත. නමුත්, පීඩිත, යටත් විජිත ජාතීන් සියල්ලෙහිම, ප්‍රථමයෙන්ම සහ ප්‍රධාන වශයෙන්ම, පෙරදිග ජාතීන්ගේ වැඩ කරන ජනතාවන්ගේ සහයෝගය නොමැතිව, ඔවුනට ජය ගත නොහැකි වනු ඇත. කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීම, තනිවම පෙරමුණු බල ඇණියට

https://liberationbase.wordpress.com

පමණක් කළ නොහැක්කක් බව අපි අවබෝධ කර ගත යුත්තෙමු. එනිසා ඉටු කළ යුතු කර්තව්‍යය වී තිබෙන්නේ, වැඩ කරන ජනතාව සපැමිණ ඇති මට්ටම නොතකා, ඔවුන් විප්ලවවාදී ක්‍රියා කාරිත්වයට, ස්වාධීන කාර්ය සාධනයට හා සංවිධාන කටයුතුවලට යොමු වන සේ ඔවුන් පිබිදවීමය; වඩාත් දියුණු රටවල කොමියුනිස්ට්වරුන් සඳහා අරමුණු කරන ලද නියම කොමියුනිස්ට් ධර්මය සියලු ජනතාවගේ භාෂාවට පරිවර්තනය කිරීමය; වහාම ඉටු කළ යුතු ප්‍රායෝගික කර්තව්‍යයන් ඉටු කිරීම සහ පොදු අරගලයක් මගින් අන් රටවල නිර්ධනයන් හා සමග ඒකාබද්ධ වීමය.

ප්‍රශ්න එබඳුය. ඒවාට විසඳුම්, කිසිම කොමියුනිස්ට් පොතකින් සොයා ගැනීම ඔබට නුපුළුවන් වනු ඇත. එම විසඳුම් සොයා ගත හැකි වන්නේ රුසියාව විසින් පටන් ගන්නා ලද පොදු අරගලයෙනි. ඔබට එම ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදුවන්නේ සහ ඒවා විසඳීමට සිදු වන්නේ ඔබේම ස්වාධීන අත් දැකීම මගිනි. එක් අතකින්, වෙනත් රටවල වැඩ කරන ජනතාවගේ පෙරමුණු බල ඇණිය සමග සමීප සන්ධානයක් ඇතිව සිටීමද, අනිත් අතට, ඔබ නියෝජනය කරන පෙරදිග ජනතාව වෙත සමීප වන නිවැරදි ක්‍රමය සොයා ගැනීමේ හැකියාව ඇතිව සිටීමද, ඔබට ආධාරයක් වනු ඇත. ජනතාවන් අතර මතු වෙමින් පවතින සහ මතු විය යුතු, එමෙන්ම, ඓතිහාසික වශයෙන් සාධාරණ වන ධනපති ජාතිවාදය ඔබගේ පදනම වශයෙන් ගැනීමට ඔබට සිදුවනු ඇත. ඒ අතරම, සෑම රටකම වැඩ කරන ජනතාව වෙත යාමට මාර්ගය සොයා ගත යුතු ඔබ, ඔවුන්ගේ එකම බලාපොරොත්තුව රඳා පවත්නේ ජාත්‍යන්තර විප්ලවයේ ජයග්‍රහණය කෙරෙහි බවත්, පෙරදිග වැඩ කරන සූරාකනු ලබන දශ කෝටි සංඛ්‍යාත ජනතාවන්ගේ එකම මිතුරා ජාත්‍යන්තර නිර්ධන පංතිය බවත්, ඔවුනට කියා දිය යුතුය.

ඔබ හමුවේ තිබෙන දැවැන්ත කර්තව්‍යය එයයි. විප්ලව යුගයට සහ විප්ලවීය ව්‍යාපාරයේ වර්ධනයට ස්තූති වන්නට එය නිසැකවම සාර්ථක ලෙස ඉටු කෙරෙනු ඇත. අවසානයේදී ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය පරදවා එම කර්තව්‍යයේ ජයග්‍රාහී නිමාව දැකීමට හැකි වන බව නිසැකය.

රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවේ නිවේදන පත්‍රිකාව ඉස්වෙස්තිය අංක 9, 1919 දෙසැම්බර් 20.

සම්පූර්ණ කෘති, වෙළුම 39, පිටු 318–331

රු. කො. (බො) ප. අටවැනි සමස්ත රුසියා සාකච්ඡා සභාව

1919 දෙසැම්බර් 2–4

විදේශ ප්‍රතිපත්තිය ගැන කෙටුම්පත් යෝජනාව

රුසියානු සමාජවාදී ඒකාබද්ධ සෝවියට් සමූහාණ්ඩුව සියලුම ජාතීන් සමග සාමයෙන් විසීමටත්, සෝවියට් ක්‍රමය පදනම් කරගෙන නිෂ්පාදනයේ ප්‍රවාහණයෙහි සහ ආණ්ඩු කටයුතුවල නිසි පිළිවෙළක් ඇති කිරීමේ අරමුණ ඇතිව අභ්‍යන්තරික සංවර්ධනය සඳහා එහි මුළු ශක්තිය යෙදීමටත්, කැමැත්තේය. නමුත්, මිත්‍ර (Entente) ගිවිසුමේ ආක්‍රමණය සහ සාගතය ඇති කරමින් පැනවූ සම්බාධනය හේතු කොට ගෙන මෙය මේ දක්වා කළ නොහැකි විය.

කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ ආණ්ඩුව, මිත්‍ර (Entente) ගිවිසුමේ බලවතුන් වෙත නැවත නැවතත් සාම යෝජනා ඉදිරිපත් කළේය. විදේශ කටයුතු භාර මහජන කොමිසාර් අංශයෙන් ඇමෙරිකානු නියෝජිත පූල් මහතා වෙත 1918 අගෝස්තු 5 දින පණිවුඩයද, ජනාධිපති විල්සන් වෙත 1918 ඔක්තෝබර් 24 දින පණිවුඩයද, මධ්‍යස්ථ රටවල නියෝජිතයන් මගින් මිත්‍ර (Entente) ගිවිසුමේ සියලුම ආණ්ඩු වෙත 1918 නොවැම්බර් 3 දින පණිවුඩයද, සෝවියට් සභාවල හයවැනි සමස්ත රුසියා සම්මේලනයෙන් 1918 නොවැම්බර් 7 දින පණිවුඩයක්ද, ලිත්වීනව් විසින් ස්ටොක්හෝම්හිදී මිත්‍ර (Entente) ගිවිසුමේ සියලුම නියෝජිතයන් වෙත 1918 දෙසැම්බර් 23 දින පණිවුඩයද, යවන ලදී. ඊළඟට, ජනවාරි 12, ජනවාරි 17 සහ පෙබරවාරි 4 දිනවල යවන ලද පණිවුඩද, බුලිට් සමග එක්ව ඒකාබද්ධ ලෙස 1919 මාර්තු 12 දින කෙටුම්පත් කරන ලද ගිවිසුමද, නාන්සන් මගින් 1919 මැයි 7 දින යවන ලද පණිවුඩයද විය.

මහජන කොමිසාර් මණ්ඩලය සහ විදේශ කටයුතු භාර මහජන කොමිසාර් අංශය විසින් ගන්නා ලද මෙම පියවරයන් සියල්ලම සම්පූර්

https://liberationbase.wordpress.com

ණයෙන්ම අනුමත කරන හත්වැනි සෝවියට් සභා සම්මේලනය නැවත වරක් සාමය සඳහා වූ එහි සදාකාලික අභිලාෂය ප්‍රකාශ කරයි. එමෙන්ම, සාම සාකච්ඡා වහාම ආරම්භ කරන ලෙස, එය බ්‍රිතාන්‍යය, ප්‍රන්සය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය සහ ජපානය යන මිත්‍ර (Entente) ගිවිසුමේ රටවලට වෙන වෙනම සහ පොදු වශයෙන් නැවතත් යෝජනා කරයි. මෙම සාම ප්‍රතිපත්තිය තව දුරටත් දිගටම අනුගමනය කරන ලෙස (නැතහොත්, මෙම සාම ප්‍රතිපත්තියේ සාර්ථකත්වය සහතික කිරීමට අවශ්‍ය නිසි පියවරයන් සියල්ලම ගනිමින් මෙම සාම ප්‍රතිපත්තිය තවදුරටත් දිගටම අනුගමනය කරන ලෙස) සම්මේලනය සමස්ත රුසියා මධ්‍ය විධායක කාරක සභාවටත්, මහජන කොමිසාර් මණ්ඩලයටත්, විදේශ කටයුතු භාර මහජන කොමිසාර් අංශයටත් උපදෙස් දෙයි.

1919 දෙසැම්බර් 2 දින ලියන ලදී
1932 ප්‍රථමයෙන් පළ කරන ලදී

සම්පූර්ණ කෘති, වෙළුම 39,
පිටු 366–369

කෘෂිකාර්මික කොමියුනවල හා කෘෂිකාර්මික ආටලවල ප්‍රථම සම්මේලනයට කළ කථාව[12]
1919 දෙසැම්බර් 4

සහෝදරවරුනි, ඔබගේ කෘෂිකාර්මික කොමියුන සහ කෘෂිකාර්මික ආටලවල ප්‍රථම සම්මේලනයට ආණ්ඩුව වෙනුවෙන් ශුභ පැතුම් ගෙන ඒමට ලැබීම මට ඉමහත් ප්‍රීතියකි. කොමියුන හා ආටල කෙරෙහි මෙන්ම, කුඩා,තනි පුද්ගල ගොවිජන ගොවිතැන සමාජමය, සමූපකාර, නැතහොත්, ආටල ගොවිතැනට පරිවර්තනය කිරීමට ආධාරකාරී වන සංවිධාන සියල්ලම කෙරෙහිද, අප දක්වන්නේ ඉතාමත් බලවත් සැලකිල්ලකි. සෝවියට් ආණ්ඩුවේ සියලු කටයුතුවලින්, ඔබට ඒ ගැන අවබෝධයක් ලැබී ඇත. මේ ආකාරයේ ප්‍රයත්නයන්ට ආධාර කිරීම සඳහා, සෝවියට් ආණ්ඩුව රූබල් සියක් කෝටියක මුදලක්[13], මීට බොහෝ ඉහතදී වෙන් කළ බව ඔබ දන්නෙහිය. සමාජවාදී ඉඩම් සංවර්ධනය පිළිබඳ නීතිය මගින්, විශේෂයෙන්ම කොමියුනවල, ආටලවල හා ඒකාබද්ධ ලෙස ඉඩම් ගොවිතැන් කරන සියලුම ව්‍යාපාරවල වැදගත්කම ගැන අවධාරණය කෙරේ. මෙම නීතිය කඩදාසියට පමණක් සීමා නොවන පරිදි, එයින් බලාපොරොත්තු වන යහපත ඇත්ත වශයෙන්ම ඉටුවන සේ එය ක්‍රියාත්මක කිරීමට සෝවියට් ආණ්ඩුව සැම ධෛර්යයක්ම ගන්නේය.

දරිද්‍රතාවයෙන් පරිපීඩිත පැරණි ගොවිජන ගොවිතැන නොවෙනස්වම පවතින්නේ නම්, ස්ථාවර සමාජවාදී සමාජයක් ගොඩ නැගීම කළ නොහැකි නිසා, මෙම වර්ගයේ ව්‍යවසායයන්ගේ වැදගත් කම අති විශාලය. රාජ්‍ය බලය මෙහෙයවන කම්කරු පංතියේ ප්‍රතිපත්තිය නිවැරදිය යන සැබෑ අවබෝධය ගොවියාට දී, කෝටි සංඛ්‍යාත ගොවි ජනයාගේ සැබෑ සහ කල් පවත්නා අනුගාමිකත්වය දිනා ගැනීමට එයට හැකි වන්නේ, බිම් වගාවෙහිදී පොදු, සමූහ, සමූපකාර හෝ ආටල ගොවිතැන අනුගමනය කිරීමේ වාසිය ප්‍රායෝගික වශයෙන් ගොවියාට ඔප්පු කර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පෙන්වීමට අප සමත් වුවහොත් පමණකි. සමූපකාර හා ආටල ගොවිතැන මගින් ගොවියාට ආධාර කිරීමෙහි අප සමත් වුවහොත් පමණකි. එනිසා, සමූපකාර සහ ආටල ගොවිතැන උනන්දු කිරීම අරමුණු කොටගත් සෑම පියවරකම වැදගත් කම කොතරම් අගේ කළත්, එහි වරදක් නැත. අප රටේ ඇත පිටිසර දිස්ත්‍රික්කවල විහිදී සහ විසිරී තිබෙන දශ ලක්ෂ ගණන් වූ තනි පුද්ගල ගොවිපළවල් ඇත. නියෝගයක් නිකුත් කිරීමෙන් හෝ පිටතින් බල පෑමෙන් හෝ, මෙම ගොවිපළවල් නව හැඩයක් ගැන්වීමට උත්සාහ දැරීම ඒකාන්ත මෝඩ කමකි. ගොවිජනයා ඉතාමත් ප්‍රායෝගික පිරිසකි. හුදෙක් උපදෙස් හා පොත්වල නිර්දේශයන් පමණක් පදනම් කරගෙන කිසියම් බරපතල වෙනසක් කිරීමට කැමති නොවන තරම් දුරට, ඔවුහු පැරණි ගොවිතැන් ක්‍රම කෙරෙහි තදින් එල්බ ගෙන සිටිති. එනිසා දශ ලක්ෂ ගණන් වූ කුඩා ගොවිජන ගොවිපළවල් කෙරෙහි අපට බල පෑ හැක්කේ, ක්‍රම ක්‍රමයෙන්, ප්‍රවේසම් සහිත ලෙස හා ප්‍රායෝගික, සාර්ථක ආදර්ශය අනුව පමණක් බව, අපි හොඳින්ම දන්නෙමු. උපදෙස් හා පොත්වල නිර්දේශයන් පදනම් කර ගෙන ගොවි ජනයා වෙනස් කිරීම කිසිසේත් කළ නොහැක්කකි. එසේ කිරීමට උත්සාහ කිරීම විගඩමක් බවට පත් වේ. මෙම දූවැන්ත ගොවිජන රට, රුසියාව, සමාජවාදී කෘෂිකර්මාන්තය වෙතට යොමු කිරීම සඳහා වැදගත් පියවරක් ගත්තෙමුයි කීමේ අයිතිය අපට ලැබෙන්නේ, සමූපකාර, නැතහොත්, ආටල ආකාරයේ ගොවිතැනට පරිවර්තනය වීම අවශ්‍ය බව හා එය කළ හැකි බව ව්‍යවහාරයෙන් හා ගොවි ජනයාට වැටහෙන අත්දැකීම්වලින් ඔප්පු කළ පසු පමණකි. මේ අනුව, කොමියුනවල, ආටලවල හා සමූපකාර ගොවිපළවල ඇති මහත් වැදගත් කම හේතු කොට ගෙන, ඔබ සියලු දෙනාම වෙත ඉතා විශාල රාජ්‍ය සහ සමාජවාදී වගකීම් පැවරේ. එමෙන්ම, මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන්, විශේෂ අවධානයක් හා ප්‍රවේසම් සහිත බවක් දක්වමින් කටයුතු කිරීම සෝවියට් ආණ්ඩුවේ සහ එහි නියෝජිතයින්ගේ අනිවාර්ය වගකීමක් බවට පත් වේ.

සමූපකාර සහ ආටල කෘෂිකාර්මික ව්‍යවසායයන්, ඒවායේ අසල්වැසි ජනතාවගෙන් කොන් වී සහ වෙන් වී නොසිටිය යුතු බවත්, එම ගොවි ජනයාට ආධාර දීම ඒ සියල්ලෙහිම යුතු කම කොට අප සලකන බවත්, සමාජවාදී කෘෂිකාර්මික පියවරයන් ගැන වූ නීතියෙහි සඳහන් කර තිබේ. මෙය නීතියෙන්ම නියම කර තිබේ. එමෙන්ම, කොමියුනවල, සමූපකාරවල හා ආටලවල ව්‍යවස්ථා මගින්ද එය යළිත් ප්‍රකාශ කර තිබේ. අපගේ කෘෂිකාර්මික කොමිසාර් අංශයෙන් හා සෝවියට් ආණ්ඩුවේ මණ්ඩලවලින් නිකුත් කෙරෙන උපදෙස් හා නියෝග මගින්ද මෙය යළි යළිත් අවධාරණය කරනු ලැබේ. එහෙත් එකම ප්‍රශ්නය වී තිබෙන්නේ

මෙය ක්‍රියාත්මක කිරීමේ සැබෑ ප්‍රායෝගික විධියක් සොයා ගැනීමය. අප මෙම ප්‍රධාන දුෂ්කරතාවය ජය ගෙන ඇතැයි යන්න මට තවමත් ස්ථිර වශයෙන් කිව නොහැකිය. රුසියාවේ සියලුම පෙදෙස්වල සාමූහික ගොවිතැන හා සම්බන්ධ වී සිටින ප්‍රායෝගික කාරක වරුන්ට ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ අවස්ථාව ඔබේ මෙම සම්මේලනයෙන් සැලසේ. එනිසා ආටල, සමූපකාර ගොවිපළවල්, කොමියුන සහ පොදු වශයෙන් සාමූහික සහ සමාජමය ගොවි ව්‍යවසාය ආකෘති හැම එකක්ම, තහවුරු කිරීමේ කර්තව්‍යය ඉටු කිරීමෙහි දක්ෂකම්, අප ව්‍යවහාරික වශයෙන් ලබන බවත්, අප දක්ෂකම් ඇති කර ගැනීමට පටන්ගෙන තිබෙන බවත්, සම්බන්ධයෙන් තිබෙන සියලු සැක දුරු කිරීම ඔබේ සම්මේලනය විසින් කළ යුතු යයි මම අදහස් කරමි. එහෙත් මෙය ඔප්පු කිරීමට ප්‍රායෝගික ප්‍රතිඵල පෙන්විය හැකි විය යුතුය.

කෘෂිකාර්මික කොමියුනවල ව්‍යවස්ථා හෝ මෙම ප්‍රශ්නය ගැන ලියා තිබෙන පොත් හෝ කියවන විට, ප්‍රචාරය සඳහා හා කෘෂිකාර්මික කොමියුන සංවිධාන කිරීම සුදුසු බව න්‍යායික වශයෙන් පෙන්වා දීම සඳහා, ඒවායේ ඉඩ පමණට වැඩියෙන් මිඩංගු කර ඇතැයි සිතෙන්නට පිළිවන. එහෙත් මෙය අවශ්‍යය. ප්‍රචාරය කරන්නේ නැතිව, මෙම අදහස වාර දහස් ගණනක් නැවත නැවතත් කියන්නේ නැතිව, එය ක්‍රියාත්මක කිරීමට හා එය ක්‍රියාත්මක කරන විධි පිළිබඳ ප්‍රායෝගික අත්හද බැලීම් කටයුතු භාර ගැනීමට, පුළුල් ගොවි ජනතාව ඉදිරිපත් වෙතියි අපට බලාපොරොත්තු විය නොහැකිය. ඇත්ත වශයෙන්ම ප්‍රචාරය අවශ්‍යය. නැවත කියන්නක් සේ අපට පෙනෙන දෙය, ලක්ෂ ගණන් ගොවි ජනතාවට නැවත කියන්නක් නොව, ප්‍රථම වතාවට හෙළිදරව් කරන සත්‍යයක් වන්නට ඉඩ තිබේ. අප ප්‍රචාරයට වැඩි අවධානයක් යොදතැයි ඔබ සමහර විට සිතන්නට පුළුවන. එහෙත්, ප්‍රචාරය සඳහා අප යොදන අවධානය සිය ගුණයකින් වැඩි කළ යුතුය. නමුත්, මා මෙහි කියන්නේ, කරුණු සහිතව කරන ප්‍රචාරය ගැනය. ගොවීන් හමුවට ගොස් කෘෂිකාර්මික කොමියුන සංවිධානය කිරීම ගැන සාමාන්‍ය පැහැදිලි කිරීමක යෙදෙන අපට, සමූපකාර හා ආටල ක්‍රමයෙන් අත්වන ප්‍රායෝගික වාසි ගැන ඇත්ත වශයෙන් පෙන්වා දීමට හැකියාව නොමැති නම්, අප කරන ප්‍රචාරය ගැන ගොවියා කිසිම විශ්වාසයක් නොතබනු ඇත.

කොමියුන, ආටල සහ සමූපකාර ගොවිපළවල් අසල් වැසි ගොවි ජනතාවට ආධාර කළ යුතු බව නීතිය කියයි. නමුත් කෘෂිකාර්මික කොමියුනවලට ආධාර කරනු සඳහා, රජය, කම්කරු ආණ්ඩුව, රූබල් සියක් කෝටියක් දෙන්නේය. ඒ ඒ කොමියුන ගොවීනට ආධාර දෙන්නට යන්නේ මෙම අරමුදලෙන් නම්, ඇත්ත වශයෙන්ම ඒවා ගොවීන්ගේ

https://liberationbase.wordpress.com

සමච්චලයට ලක්වනු ඇතැයි මට සිතේ. එසේ වීම සම්පූර්ණයෙන්ම යුක්ති යුක්ත වනු ඇත. එවිට සෑම ගොවියෙක්ම මෙසේ කියනු ඇත. ''ඔබට රූබල් සියක් කෝටියක් ලැබෙන්නේ නම්, ඉන් ටිකක් අපේ පැත්තට වීසි කිරීම ඔබට පහසුවෙන්ම කළ හැකි බව කීමට අවශ්‍ය නැත.'' ගොවියා මෙම කාරණය වෙත සැලකිය යුතු අවධානයක් එල්ල කරන හෙයින්ද, ඔහු ඒ ගැන මහත් අවිශ්වාසයකින් පසුවන හෙයින්ද, ඔහු එය සරදමට ලක් කිරීම හැර වෙනත් යමක් නොකරනු ඇතැයි යන අනුමානය මට ඇත. ශත වර්ෂ ගණනක් තිස්සේ ඔහු පුහුණුව සිටින්නේ, රජයෙන් පීඩාව පමණක් අපේක්ෂා කිරීමටය. එනිසා රජයෙන් එන සෑම දෙයක්ම දෙස සැක සහිතව බැලීම ඔහුගේ පුරුද්ද වී තිබේ. ඒ අනුව බලන කල, නීතියෙහි තිබෙන දෙය පමණක්ම සලකා කෘෂිකාර්මික කොමියුන ගොවි ජනතාවට ආධාර කරයි නම්, එම ආධාරවලින් වැඩක් නොසිදු වෙනවා පමණක් නොව අවැඩක්ද සිදුවන්නේය. කෘෂිකාර්මික කොමියුනය යන නම ශ්‍රෙෂ්ඨය. එය කොමියුනිස්ට් ක්‍රමය පිළිබඳ සංකල්පයට නෑකම් කියන්නකි. කොමියුන ඇත්ත වශයෙන්ම ගොවිජන ගොවිතැනෙහි තත්වය වැඩි දියුණු කිරීමට බරපතල ලෙස කටයුතු කරන බව ව්‍යවහාරයෙන් පෙන්නුම් කරන්නේ නම්, එය හොඳ දෙයකි. එයින් කොමියුනිස්ට්වාදීන්ගේත්, කොමියුනිස්ට් පක්ෂයේත් ගෞරවය ඒකාන්තවම වැඩි වන්නේය. නමුත් බොහෝ තැන්වල සිදු වී තිබෙන්නේ අනිකකි. එම කොමියුන කර තිබෙන්නේ ගොවීන් තුළ නරක ආකල්පයක් ඇති කිරීම පමණක් නොව, සමහර විට ''කොමියුනය'' යන වචනය කොමියුනිස්ට්වාදයට විරුද්ධව සටනට කැඳවීමක් බවට පවා පත්වන තැනට කටයුතු සැලැස්වීමය. මෙය සිදුවන්නේ ගොවීන් බලෙන් කොමියුන තුළට දක්කීමට දරන ලද තකතිරු ප්‍රයත්න නිසා පමණක්ම නොවේ. එසේ කිරීම නොමනා බව ඉතාමත් හොඳින් පැහැදිලි වූ නිසා, මීට බොහෝ ඉහත දී සෝවියට් ආණ්ඩුව එය තහනම් කළේය. එවැනි බල කිරීම් තවමත් තැනින් තැන ඇති වේ නම්, ඒ ඉතාමත් කලාතුරකින්ය යනුත්, මෙම විපරීතතාවයෙහි අන්තිම ඡායාව පවා සෝවියට් සමූහාණ්ඩුවේ භූමියෙන් අතුගා දැමීම පිණිස ඔබ මෙම සම්මේලනයෙන් ප්‍රයෝජන ගනු ඇතැයි යනුත්, කොමියුන සාමාජිකත්වය නම් එක් හෝ තවත් ආකාරයකින් බල කිරීම හා සම්බන්ධ එකකැයි යන පැරණි අදහස ඒත්තු ගැන්වීම පිණිස අසල් වැසි ගොවි ජනතාවට එකම නිදර්ශනයක් වත් පෙන්වීමේ ඉඩක් නො ලැබෙනු ඇතැයි යනුත්, මම බලාපොරොත්තු වෙමි.

එහෙත්, අපි මෙම පැරණි දුර්වලකම කෙළවර කළත්, මෙම විපරීතතාවය සම්පූර්ණයෙන්ම යටපත් කළත්, එයින් ඉටුවන්නේ කාර්යයෙන් සුළු කොටසක් පමණක් වනු ඇත. ඉන් පසුවත්

කොමියුනවලට රජයේ ආධාර දීම අවශ්‍ය වන්නේය. සෑම වර්ගයකම සාමූහික කෘෂිකාර්මික ව්‍යවසායකටම රාජ්‍ය ආධාර දීම අපි නො කරන්නමෝ නම්, අපි කොමියුනිස්ට්වාදීන් හා සමාජවාදය සඳහා සටන් කරන අය නොවෙමු. එය අපගේ අරමුණුවලට ගැලපෙන නිසා අපි එම ආධාර දිය යුත්තෙමු. මෙම සමුපකාර, ආටල සහ සමූහ සංවිධාන නවාංගයන් වන බව අප හොඳින්ම දන්නා නිසාත්, බලයේ සිටින කම්කරු පංතිය ඒවාට ආධාර නොදුනහොත් ඒවා තහවුරු නොවන නිසාත්, අපි ඒවාට ආධාර දිය යුත්තෙමු. එම ව්‍යවසායයන් මුල් ඇද තහවුරු විය යුතුය. රජයෙන් ඒවාට මුදල් සහ වෙනත් සෑම ආකාරයේම ආධාර දෙන නිසා, එම ව්‍යවසායයන් ගොවි ජනතාවගේ සමච්චලයට ලක් නොවන බවට අපි වග බලා ගත යුත්තෙමු. කොමියුනවල, ආටලවල හා සමුපකාරවල සාමාජිකයින් රජයෙන් යැපෙන්නෝ වෙතියිද, ඔවුන් ගොවීන්ට වඩා වෙනස් වන්නේ ඔවුන් ලබන වරප්‍රසාද නිසා පමණක් යයිද, ගොවි ජනයාගෙන් කියවෙන තත්වයක් ඇති නොවන සේ වග බලා ගැනීමට අපි ඉතාමත් සුපරීක්ෂාකාරී විය යුත්තෙමු. අපි ඉඩම්ද, රූබල් සියක් කෝටියේ අරමුදලෙන් ගොඩනැගිලි කටයුතු සඳහා ආධාර මුදල්ද සපයන්නෙමු නම්, ඕනෑම මොට්ටයෙක් සාමාන්‍ය ගොවියාට වඩා සාමාන්‍ය හොඳ තත්වයකින් ජීවත් වනු ඇත. මෙහි තිබෙන කොමියුනිස්ට්වාදය කුමක්ද? වැඩි දියුණු කිරීම සිදුවූයේ කොතැන ද? අප ඔහුට ගෞරව කළ යුත්තේ මොන කාරණයක් නිසාද? යන ප්‍රශ්න ගොවියාට ඇසිය හැක. පුද්ගලයන් ටික දෙනෙක්, නැතහොත්, සිය ගණනක් තෝරා ගෙන ඔවුනට රූබල් සියක් කෝටියක් දුනහොත්, ඇත්තෙන්ම ඔවුන් වැඩ කරනු ඇත.

ගොවි ජනයා එවැනි ආකල්පයකට එළඹීම ගැන අප බිය විය යුතුය. මෙම සම්මේලනයේ සිටින සහෝදරවරුන්ගේ අවධානය මෙම කරුණ වෙත යොමු කරනු කැමැත්තෙමි. ප්‍රශ්නය විසඳිය යුත්තේ ප්‍රායෝගික වශයෙනි. එය විසඳීමේදී, මෙම අන්තරාය මගහැරීම පමණක් නොව, එපරිද්දෙන් කල්පනා කිරීමට ගොවියා යොමු නොවන මාර්ගයන්ද සොයා ගත යුතුය. සෑම කොමියුනයක්ම හා ආටලයක්ම තුළ රජයෙන් ආධාර ලබන යමක් තිබෙන බවත්, පැරණි ගොවිතැන් ක්‍රමවලට වඩා වාසිදායක බව පොත්වලින් හා කථාවලින් (ඒවායේ ප්‍රයෝජන අඩුය) නොව, ව්‍යවහාරයෙන් පෙන්නුම් කරන නව ගොවිතැන් ක්‍රම ඒවායේ තිබෙන බවත්, ගොවියාට පෙනෙන සේ එම ප්‍රශ්නය විසඳිය යුතුය. එම නිසාම මෙම ප්‍රශ්නය විසඳීම අසීරුය. එනිසාම, අප ඉදිරියේ තිබෙන නිරස ඉලක්කම් අනුව, සෑම කොමියුනයක්ම හා සෑම ආටලයක්ම, පැරණි ක්‍රමයේ සෑම ව්‍යාපාරයකටම වඩා ඇත්ත වශයෙන්ම උසස්ද යන්නත්,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කම්කරු ආණ්ඩු මෙහිදී ගොවියාට ආධාර කරන්නේද යන්නත්, නිගමනය කිරීම අමාරු වේ.

මෙම ප්‍රශ්නය ප්‍රායෝගික වශයෙන් විසඳාලිය හැකි වනු පිණිස, අසල්වැසි කොමියුන, ආටල හා සමුපකාර ගණනාවක් ගැන දැනුමක් ඇතිව සිටින ඔබ කළ යුත්තේ, කොමියුන අසල්වැසි ජනතාවට ආධාර කළ යුතුයයි නියම කරන නීතිය ක්‍රියාත්මක වන ආකාරය ගැනත්, සෑම කොමියුනයක්ම, ආටලයක්ම හා සමුපකාර ගොවි පළක්ම සමාජවාදයට පරිවර්තනය වීමේ කාර්යය, ක්‍රියාත්මක කරන ආකාරය හා එහිදී එක් එක් තැන හැඩ ගැසෙන ආකෘති මෙන්ම ඒවා ඇත්ත වශයෙන්ම ව්‍යවහාරයට නගනු ලබන පිළිවෙළ ගැනත්, සමුපකාර හා කොමියුන කීයක් ඇත්ත වශයෙන්ම එය ක්‍රියාත්මක කරන්නේද, කීයක් එය ක්‍රියාත්මක කිරීමට සූදානම් වන්නේද යන්න ගැනත්, කොමියුන ආධාර දුන් අවස්ථා කීයක් දක්නට ලැබේද, දෙන ආධාර කුමණ ස්වභාවයේ ඒවාද, ධනපති ස්වභාවයේද, නැතහොත්, සමාජවාදී ස්වභාවයේද යන්න ගැනත්, පරීක්ෂා කර බැලීම පිණිස යොදගත හැකි යථාර්ථ ප්‍රායෝගික විධි සකස් කරගැනීම යයි මම අදහස් කරමි.

කොමියුනවලට හා ආටලවලට රජයෙන් දෙන ලද ආධාරයෙන් කොටසක් ගොවීන් සඳහා වෙන් කිරීමට ඒවා යොමු වෙත් නම්, එයින් සිදු වන්නේ කිසියම් කාරුණික පිරිසක් තමන්ට ආධාර කරතියි යන්න පමණක් ගොවීන්ට විශ්වාස ගන්වන පසුබිමක් සකස් වීමය. එහෙත් සමාජවාදයට පරිවර්තනය වන බවක් නම්, එයින් කිසිසේත් ඔප්පු නොවේ. එවැනි "කාරුණික මිනිසුන්" දෙස සැක සහිතව බැලීමට ගොවී ජනයා පරම්පරා ගණනක් තිස්සේ පුරුදුව සිටිති.මෙම නව සමාජ ක්‍රමය, කලඑලි බසින ආකාරයත්, තනි පුද්ගල ගොවිජන ගොවි තැනට වඩා සමුපකාර, නැතහොත්, ආටල ක්‍රමය හොඳ බව හා එය හොඳවන්නේ රාජ්‍ය ආධාර නිසා නොවන බව ගොවියාට ඔප්පු කර පෙන්වීමට යොදගන්නා විධි ක්‍රමත්, හරිද වැරදිද බලන්නේ කෙසේදැයි අප දැන සිටිය යුතුය. රජයේ ආධාර නොමැතිව වුවද, මෙම නව සමාජ ක්‍රමය ප්‍රායෝගිකද වශයෙන් උදා කර ගත හැකි බව ගොවීන්ට පෙන්වා දීමේ හැකියාව අපට තිබිය යුතුය.

අවාසනාවකට මෙන් මට ඔබගේ සම්මේලනය අවසාන වන තෙක් නැවතී සිටීමට නොපුළුවන. එනිසා, පාලනය ක්‍රියාත්මක කිරීමේ මෙම විධි සකස් කිරීමට මට සහභාගී වීමට නොලැබේ. එහෙත් අපගේ කෘෂිකාර්මික කොමිසාර් අංශය භාර සහෝදරවරුන්ගේ ආධාරය ඇතිව ඔබට මෙම විධි විධාන සකස් කර ගැනීමට හැකි වෙතියි යනු මට සහතිකය. කෘෂිකර්මාන්තය පිළිබඳ මහජන කොමිසාර් සෙරෙද සහෝදරයාගේ

ලිපියක් මම ඉතා සතුටින් කියෙව්වෙමි. කොමියුන හා සමුපකාර, ඒවා අවට සිටින ගොවි ජනතාවගෙන් කොන් නොවිය යුතු බවත්, ඒවා ඔවුන්ගේ ගොවිපළවල් වැඩි දියුණු කිරීමට උත්සාහ කළයුතු බවත්, ඔහු එහි අවධාරණය කර තිබේ. කොමියුනයක් සංවිධානය කළ යුත්තේ අසල්වැසි ගොවි ජනතාවට එය ආදර්ශයක් වන ලෙසට හා ඔවුන් එය වෙතට ඇදී එන ලෙසටය.භාණ්ඩ හිඟය හා පොදු ආර්ථික වියවුල් තත්වය නිසා පැන නගින දුෂ්කරතා මධ්‍යයේ ස්වකීය ගොවිපළවල් පවත්වාගෙන යන ජනයාට ආධාර දෙන්නේ කෙසේද යන්න පිළිබඳ නිදර්ශනයක් ඔවුන් හමුවේ තැබීමට අප සමත් විය යුතුය. මෙය ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික විධි පැහැදිලි කරනු වස්, ඉතාමත් විස්තර සහිත උපදෙස් සකස් කළ යුතු අතර, අසල් වැසි ගොවියනට දිය හැකි සියලුම ආකාරයේ ආධාර එයින් විස්තර කළ යුතුය. හැම කොමියුනයක්ම ගොවි ජනයාට ආධාර කිරීමට ගත් පියවරයන් ගැන විස්තරයක් සපයන ලෙසටත්, සමාජවාදයට පරිවර්තනය ලෙසටත්, සමාජවාදයට පරිවර්තනය වීමේ ආකෘතියක් වශයෙන් සාමූහික ගොවිතැන ගොවීනට වාසිදායක වන දෙයක් මිස, අවුල් සිතකින් පැන නැගුන ඉබාගාතේ දිවෙන සංකල්පනාවක් නොවන බවට ගොවිජනයා දරන විශ්වාසය ශක්තිමත් කිරීමෙහි සමත් න්‍යෂ්ටියක තත්වයට පත්වීමට පවත්නා කොමියුන දෙදහසෙන් සෑම එකක්ම හා භාර දහසක් පමණ ආටලවලින් සෑම එකක්ම කටයුතු කරන්නේ කෙසේදැයි සඳහන් කරන ලෙසටත්, ඒවාට කරන නියමයක්ද එම උපදෙස්වලට අඩංගු කළ යුතුය.

කොමියුන, ඒවා අවට සිටින ගොවි ජනතාවට ආධාර දිය යුතුය යන්න නීතියෙන් නියම කර ඇතැයි මම කලින් කීවෙමි. නීති භාෂිකයෙන් අපට එය වෙනත් ලෙසකින් ප්‍රකාශ කළ නොහැකි විය. එමෙන්ම, ප්‍රායෝගික උපදෙස් දීමද එයින් කළ නොහැකි විය. අපගේ කටයුත්ත වූයේ පොදු ප්‍රතිපත්ති නියම කිරීමය. සියලු කරුණු සැලකිල්ලට ගනිමින් නීතිය ක්‍රියාත්මක කිරීම, ප්‍රදේශවල සිටින දේශපාලන විඥනයක් ඇති සහෝදරවරුන්ගෙන් බලාපොරොත්තු වූ කාර්යයක් විය. එක් එක් ප්‍රදේශයෙහි පවත්නා යථාභූත ආර්ථික තත්වයන් අනුව එය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමේ මාර්ග දහසකුත් එකක් ඔවුනට සොයාගත හැකි වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. එසේ වුවද, සෑම නීතියකින්ම මඟහැරීමට පුළුවන් කමක් ඇත. එය ක්‍රියාත්මක කරන බවක් පෙන්වමින්ම එයින් මඟ හැරිය හැකිය. එනිසා, ගොවිතැනට ආධාර කිරීම සම්බන්ධයෙන් වූ නීතිය අවස්ථාවෝචිත ලෙස ක්‍රියාත්මක නොකළ-හොත්, එය නිකම්ම ක්‍රීඩාවක් බවට පත්වී, එයින් බලාපොරොත්තු වූවාට වඩා හාත්පසින්ම වෙනස් ප්‍රතිඵල ඇති වන්නට පිළිවන.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොමියුන සංවර්ධනය විය යුත්තේ ඒවා සමග සම්බන්ධකම් ඇති කරගන්නා හා ඒවායින් ආධාර ලබන ගොවිජන ගොවිතැනෙහි තත්වයද වෙනස් වීමට හේතුවන ආකාරයෙනි. එවිට සෑම කොමියුනයකටම, ආටලයකටම හා සමුපකාරයකටම ගොවිජන ගොවිතැනෙහි තත්වය වැඩි දියුණු කිරීමේ කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කිරීම මගින්, එම වෙනස නිසා ගොවීනට අත් වන්නේ වාසියක්ම පමණකැයි යන කරුණ ඔවුනට ඔප්පු කළ හැකි වන්නේය.

ගොවිතැන දියුණු කිරීමට නම්, හතර අවුරුද්දක අධිරාජ්‍යවාදී යුද්ධ සහ අප මත බලෙන් පටවන ලද සිවිල් යුද්ධය නිසා ඇති වී තිබෙන වර්තමාන අවුල් ජාලයට වඩා වෙනස් වූ තත්වයක් අපට අවශ්‍ය යයි අපට කියනු ලැබෙතැයි ඔබ ස්වාභාවික වශයෙන්ම සිතන්නට පුළුවන. අප රටේ දැන් පවතින තත්වයන් මධ්‍යයේ ගොවිතැනෙහි පැතිරී ගිය දියුණුවක් ගැන කෙනෙකුට සිතන්නටවත් නොපුළුවන. සාගතයෙන් නොමැරී කෙසේ හෝ දිවි රැකගැනීමට දෙවියෝ අපට ඉඩ දෙත්වා!

මෙවැනි සැක පහළ කිරීම ස්වාභාවිකය. එවැනි විරුද්ධ මතයකට පිළිතුරු දීමට සිදුවිනි නම්, මම මෙසේ කියන්නෙමි: ආර්ථික ජීවිතය අවුල් වීම නිසා, ආර්ථික වියවුල්, භාණ්ඩ හිඟය, දුර්වල ප්‍රවාහණය හා ගවයන් හා උපකරණ විනාශවීම නිසා ගොවිතැනෙහි විස්තීර්ණ වැඩි දියුණු කිරීමකට ඉඩක් නැතැයි සිතමු. එහෙත් විස්තෘත තත්වයෙන් නොවුවත්, එක් එක් තැන්වල යම් යම් වැඩි දියුණු කිරීම් කළහැකි බවට සැකයක් නැත. එය වුවත් කළ නොහැකියැයි සිතා ගනිමු. එම තත්වය යටතේ වුවත් කොමියුනයට එහි අසල්වැසි ගොවි ජනතාවගේ ජීවිතයෙහි වෙනස්කම් ඇති කළ නොහැකිද? සාමූහික කෘෂිකාර්මික ව්‍යවසායයන් යනු කෘත්‍රිම වශයෙන් උෂ්ණාගාර තුළ වගා කරන ලද පැළෑටියක් නොව, කම්කරු ආණ්ඩුව ගොවි ජනතාවට දෙන ආධාර ක්‍රමයක් බවත්, කුලාකයන්ට විරුද්ධව කරන සටනේදී වැඩ කරන ගොවි ජනතාවට දෙන ආධාරයක් බවත්, ඔවුනට ඔප්පු කළ නොහැකි ද? මේ ආකාරයට ප්‍රශ්න ගැන සලකා බැලුවත්, වර්තමානයේ වියවුල් ආර්ථික තත්වය යටතේ වැඩි දියුණු කිරීම් කළ නොහැකි බව පිළිගත්තත්, කොමියුන සහ ආටල තුළ විඥාන කොමියුනිස්ට්වාදීන් සිටිත් නම්, මහත් කාර්ය කොටසක් ඉටු කළ හැකි බව මම ඒකාන්ත වශයෙන් අදහස් කරමි.

මෙය සනාථ කිරීම පිණිස, අපගේ නගරවල පවතින සුබ්බොත්නික් නැමති ව්‍යාපාරය ගැන සඳහන් කරනු කැමැත්තෙමි. මෙනමින් හැඳින්වෙන්නේ, නාගරික කම්කරුවන් ඔවුන්ගේ සාමාන්‍ය වැඩ දිනය ඉක්මවා, ඊට අමතරව, වේතන රහිතව, ස්වේච්ඡාවෙන්, කිසියම් මහජන අවශ්‍යතාවයක් ඉටු කිරීම සඳහා කැපවී පැය කීපයක් වැඩ කිරීමය.

සුබ්බොත්නික් ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ මොස්කව්හිදී, මොස්කව්-කසාන් දුම්රිය සේවයේ කම්කරුවන් විසිනි. පෙරමුණේ සිටින රතුහමුදා භටයන් පෙර නොවූ විරු පරිත්‍යාගයන් කරමින්, මතුවී තිබෙන සියලුම අමාරුකම්ද විඳගනිමින්ම, අපගේ සතුරා පරදවා අභූත පූර්ව ජයග්‍රහණයන් අත්පත් කරගනිමින් සිටින බව කියන අතරම, පෙරමුණෙහි පමණක් නොව රට අභ්‍යන්තරයේ පසුතලයෙහිද එවැනි වීරත්වයක් හා ආත්ම පරිත්‍යාගයක් පානු දක්නට ලැබේ නම් පමණක්, අපගේ සතුරන් පරදවා ලබන ජයග්‍රහණ ස්ථිර කර ගත හැකි වන බව සෝවියට් ආණ්ඩුව නිකුත් කළ එක් ආයාචනයකින් පෙන්වා දෙන ලදී. මොස්කව් කම්කරුවන් මෙම ආයාචනයට අනුකූලත්වය දක්වූයේ සුබ්බොත්නික් ව්‍යාපාරය සංවිධාන කිරීමෙනි. ගොවිජනයාට වඩා බොහෝ අමාරුකම් හා අග හිඟ කම් විඳ දරා ගැනීමට මොස්කව් කම්කරුවන්ට සිදුවී තිබෙන බවට සැකයක් නැත. ඔබ ඔවුන්ගේ ජීවන තත්වයන් ගැන තොරතුරු සොයා දැනගන්නෙහි නම්, ඔවුන් මුහුණ දෙන ඇදහිය නොහැකි තරම් වන දුෂ්කර තත්වයන් මධ්‍යයේ වුවද සුබ්බොත්නික් ව්‍යාපාරය සංවිධානය කිරීමට ඔවුනට හැකි වූ බව ගැන ඔබ මඳක් මෙනෙහි කරන්නෙහි නම්, එම මොස්කව් කම්කරුවන්ගේ ක්‍රමය යොදා ගනිමින් කළ හැකි දේ නොකිරීමට හේතුවක් වශයෙන්, මොනම තත්වයක් යටතේ වුවද දුෂ්කර තත්වයන් ගැන කථා කිරීම පිළිගත හැක්කක් නොවන බවට ඔබ එකඟ වෙනවා ඇත. මෙම සුබ්බොත්නික් ව්‍යාපාර කලාතුරකින් ඇතිවන සිද්ධීන් වශයෙන් නොපැවැත පැතිරී ගිය ව්‍යාපාරයක් වූ කල, ආණ්ඩු කරන කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයින්ට වගකීම් හා යුතුකම් තිබෙන බව පක්ෂයට බැඳී නැති කම්කරුවන්ට පෙනී ගිය කල, කොමියුනිස්ට්වරු තම පක්ෂයට අළුත් සාමාජිකයන් බඳවා ගන්නේ ආණ්ඩු පක්ෂයේ තත්වයෙන් අත් කරගත හැකි වාසි භුක්ති විඳීමට නොව, සැබෑ කොමියුනිස්ට් ශ්‍රමය පිළිබඳව, එනම්, නොමිළයේ කරන වැඩ පිළිබඳව ආදර්ශයක් දීම පිණිස බව එම කම්කරුවන්ට පෙනී ගිය කල, නගරවලින් කොමියුනිස්ට් පක්ෂයටත්, පක්ෂ සාමාජිකයන් නොවන කම්කරුවන්ගෙන් කොමියුනිස්ට්වරුන්ටත් ලැබෙන ගෞරවය වැඩි යාමට අන් සියල්ලටම වඩා එම ව්‍යාපාරය උපකාරී විය. කොමියුනිස්ට් ක්‍රමය යනු, සමාජවාදයේ උසස්තම සංවර්ධන අවධියයි. එම ක්‍රමය යටතේ, මිනිසුන් වැඩ කරන්නේ පොදු යහපත සඳහා වැඩ කිරීමේ අවශ්‍යතාවය ඔවුනට වැටහෙන හෙයිනි. දැන්ම අපට සමාජවාදී සමාජ ක්‍රමයක් පිහිටුවිය නොහැකි බව අපි දන්නෙමු. අපගේ දරුවන්ගේ කාලයේ, අපගේ මුණුපුරන්ගේ කාලයේ එය ඇති වේවා යයි ප්‍රාර්ථනා කරමු. ආණ්ඩු කරන කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෝ, ධනපති ක්‍රමයට විරුද්ධව කරන

https://liberationbase.wordpress.com

සටනේ වැඩි බරකට කර ගසති. ඉතාමත් හොඳ කොමියුනිස්ට්වාදීන් පෙරමුණට යැවීම සඳහා සංවිධාන කරනු ලැබේ. එවැනි කටයුතුවලට යොදා ගත නොහැකි වන අය සුබ්බොත්නික් ව්‍යාපාරවලට සහභාගි විය යුතුය.

සෑම විශාල නගරයකම පුළුල් ලෙස පැතිර ගොස් තිබෙන මෙම සුබ්බොත්නික් සංවිධාන කිරීමෙන්ද, කොමියුන, ආටල් හා සමූපකාර තුළ මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන්ද, ඉතාමත් අයහපත් තත්වය යටතේ වුව, සෑම කොමියුනයක්ම, ආටලයක්ම හා සමූපකාරයක්ම වැදගත් සමාගමයක් සේ ගොවියා විසින් සලකනු ලබන බව දැකීමට, එයට රජයේ ආධාර මුදල් ලැබෙන නිසා නොව, සමාජවාදය ගැන දේශනා කිරීමෙහි පමණක් නොව එය ක්‍රියාත්මක කිරීමෙහි ද සමත් වන, ඉතාමත් දුෂ්කර තත්වයන් යටතේ පවා තමන්ගේ ගොවිපළවල් කොමියුනිස්ට් ක්‍රමයට පවත්වා ගනිමින්, හැකි සෑම ආකාරයකින්ම අවට ගොවි ජනතාවට ආධාර කිරීමෙහි සමත් වන ඉතාමත් හොඳ කම්කරු පංති ජනයා එය තුළට එක්වී සිටින නිසා, එය වැදගත් සමාගමයක් සේ සලකනු ලබන බව දැකීමට වග බලාගැනීම ඔබට කළ හැකිය. ඔබ එය කළ යුතුය. පක්ෂයේ සෑම සාමාජිකයෙක්ම මෙම සුබ්බොත්නික්වලට සහභාගි විය යුතුයයි පක්ෂය නියම කරයි. එම නියමයන් ඉටු නොකරන්නවුනට දඬුවමක් වශයෙන්, පක්ෂයෙන් නෙරපා දැමීම වුවද කරනු ලැබේ. මෙම කාරණයේදී භාණ්ඩ හිඟය, බීජ නොමැති කම, ගවයන් නැතිවීම සමාවට හේතුවක් වශයෙන් ඉදිරිපත් කළ හැකි නොවේ. මෙය අපට පරීක්ෂණයක් හා සමානය. අපම අප වෙත පවරා ගෙන තිබෙන අසීරු කර්තව්‍යය, ව්‍යවහාරික වශයෙන් කොතරම් දුරට ඉටු කර තිබේද යන්න, කුමණ තත්වය යටතේ වුවද, අපට මෙයින් නිශ්චිත ලෙස දැනගත හැකි වන්නේය.

කොමියුනවල, සමූපකාරවල හා ආටලවල නියෝජිතයින්ගේ මෙම මහා සභාව, මෙම කරුණ සාකච්ඡා කරනු ඇතැයිද, මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම කොමියුන හා සමූපකාර තහවුරු කිරීමේ බලවත් අවියක් ලෙස යොදා ගත හැකි බව අවබෝධ කර ගනු ඇතැයිද, ඒ අනුව කොමියුනවලට, ආටලවලට හා සමූපකාරවලට ගොවිජනයා විරුද්ධත්වය දක්වන අවස්ථා එකක්වත් නැතිව යන ලෙසට ප්‍රායෝගික ප්‍රතිඵල ලබාගනු ඇතැයිද මම ඒකාන්ත ලෙස විශ්වාස කරමි. නමුත් එයද ප්‍රමාණවත් නොවේ. ඒවා කෙරෙහි ගොවි ජනයා හිතවත් ආකල්පයක් දක්වන තත්වයක් ඇතිවීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් සෝවියට් ආණ්ඩුවේ නියෝජිතයන් වශයෙන්, මෙය ඉටු වනු දැකීම සඳහා අපට හැකි සියල්ලක්ම කරන්නෙමු. ඒ අනුව රූබල් සියක් කෝටියේ අරමුදලෙන් හෝ, වෙනත් මාර්ගවලින් හෝ, කොමියුනවලට, නැතහොත්, ආටලවලට ආධාර සැපයීම

කෙරෙන්නේ ඒවා ස්වකීය අසල් වැසි ගොවි ජනයා සමග ඇත්ත වශයෙන්ම සමීප වූ සම්බන්ධකම් ඇති කර ගැනීමෙන් පසුව බවට අපි වග බලාගත යුත්තෙමු. මෙම කොන්දේසි ඉටු නොකළ හොත්, එම ආටලවලට හා සමූපකාරවලට ආධාර දීමෙන් ප්‍රයෝජනයක් නොවන බව පමණක් නොව, එයින් නිසැකවම අවැඩක්ම වන බවද අපි අදහස් කරන්නෙමු. කොමියුනවලින් අසල්වැසි ගොවි ජනයාට දෙන ආධාරය වැඩිපුර තිබෙන දෙයක් සේ නොසැලකෙන බවට වග බලාගත යුතුය. මෙම ආධාරය සමාජවාදී ආධාරයක් විය යුතුය. එම ආධාර නිසා, ගොවි ජනයාගේ තනි පුද්ගල කොන් වූ ගොවිතැන වෙනුවට සමූපකාර ගොවිතැන ආදේශ කර ගැනීමට ඔහුට හැකි විය යුතුය. මෙය කළ හැක්කේ මා මෙහි සඳහන් කළ සුබ්බොත්නික් ක්‍රමය මගින් පමණකි.

ගොවීනට වඩා කියා නිම කළ නොහැකි තරම් අයහපත් තත්වයන් යටතේ ජීවත්ව සිටියදීම සුබ්බොත්නික් ව්‍යාපාරය ආරම්භ කළ නාගරික කම්කරුවන් ගෙන් ඔබ යමක් උගෙන ගන්නෙහි නම්, ඔබගේ පොදු සහ ඒකමතික සහයෝගයද ඇතිව, දැනට පවත්නා දහස් ගණනක් කොමියුන හා ආටල, හැම එකක්ම ගොවි ජනයා අතර කොමියුනිස්ට් අදහස් හා දෘෂ්ටිය රෝපනය කිරීමට උපයෝගි කර ගත හැකි නියම තවානක් බවට පත් කිරීමටද, එය තවමත් කුඩා හා දුර්වල වර්ධයක් වුව, කෘතිම උෂ්ණාගාරයක හදන වර්ධයක් නොව, නවතම සමාජ ක්‍රමයේ නියම වර්ධයක් බව ඔවුනට පෙන්නුම් කරන ප්‍රායෝගික ආදර්ශයක් කර ගැනීමටද, හැකි වේ යයි මම ස්ථිර ලෙසම විශ්වාස කරමි. පැරණි නොදැනුවත් කම දරිද්‍රතාවය හා නැති බැරිකම පරදවා අපට කල් පවත්නා ජයග්‍රහණයක් අත්පත් කර ගත හැක්කේ එවිට පමණකි. අපගේ අනාගත ගමන් මාර්ගයෙහි මතුවන දුෂ්කරතාවයන්ට බිය නොවී ඉදිරියට යා හැක්කේ එවිට පමණකි.

"ප්‍රාව්දා" අංක 273 හා 274, 1919 දෙසැම්බර් 5 හා 6

සම්පූර්ණ කෘති, වෙළුම 5, පිටු 372–382

https://liberationbase.wordpress.com

දෙනිකින් පරදවා ලැබූ ජයග්‍රහණ නිමිත්තෙන් උක්‍රේනියාවේ කම්කරුවන් හා ගොවි ජනයා වෙත යැවූ ලිපිය

සහෝදරවරුනි, කොල්චාක් පරදවා ජය ලැබීම සම්බන්ධයෙන් 1919 අගෝස්තු අග භාගයේදී කම්කරුවන් හා ගොවි ජනතාව අමතා ලිපියක් යැවීමේ අවස්ථාවක් මට මීට සිව් මසකට පෙර ලැබුණි.

දෙනිකින් පරදවා ලත් ජයග්‍රහණ හා සම්බන්ධයෙන් මම දැන් උක්‍රේනියාවේ කම්කරුවන් හා ගොවිජනතාව අමතා යවන මෙම ලිපිය සම්පූර්ණයෙන්ම මුද්‍රණය කරවන්නෙමි.

කීව්, පොල්තාවා සහ හාර්කොව් අල්ලාගත් රතු භටයෝ ජයග්‍රාහී ලෙස රස්තොව් බලා ඉදිරියට යමින් සිටිති. දෙනිකින්ට විරුද්ධව ගසනු ලබන කැරළිවලින් උක්‍රේනියාව ඉතිරී යන්නේය. ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ පාලනය යළි ස්ථාපිත කිරීමට ප්‍රයත්න දරූ දෙනිකින්ගේ හමුදාව අවසාන වශයෙන් පරාජය කිරීම සඳහා සියලුම බලවේගයන් ඒක රාශී කළ යුත්තේය. නව ආක්‍රමණයකට ස්වල්ප හෝ අවකාශයක් නොතබා අපගේ ආරක්ෂාව සලසා ගනු පිණිස, අපි දෙනිකින් විනාශ කළ යුත්තෙමු.

සයිබීරියාව කොල්චාක් විසින් අල්වා ගනු ලැබීමෙන් හා එහි මාස කීපයක් පැවති ඉඩම් හිමියන්ගේ හා ධනපතියන්ගේ අධම පාලනයෙන් පසුව රතු හමුද විසින් එය මුද ගනු ලැබීමෙන්, රුසියානු කම්කරුවන් හා ගොවීන් උගත් පාඩම් ගැන උක්‍රේනියාවේ කම්කරුවන් හා ගොවීන් අවබෝධ කර ගත යුතුය.

උක්‍රේනියාවේ දෙනිකින්ගේ පාලනය ද, සයිබීරියාවේ කොල්චාක්ගේ පාලනය මෙන්ම දරුණු වධක පාලනයක් විය. මෙම දරුණු වධක පාලනය අත් දුටු උක්‍රේනියාවේ කම්කරුවන්ට හා ගොවි ජනයාට සෝවියට් බලයේ කර්තව්‍යයන් ගැන වඩා පැහැදිලි අවබෝධයක් ලැබෙන අතර එය වඩාත් දැඩි ලෙස ආරක්ෂා කිරීමට ඔවුන් යොමු වනු ඇත — උරාල් ප්‍රදේශයේ සහ සයිබීරියාවේ කම්කරුවන් හා ගොවිජනයා සම්බන්ධයෙන් ද එසේම විය.

මහ රුසියාවේ වතුකාර ඉඩම් හිමි ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කර තිබේ. උක්‍රේනියාවේද එයම කළ යුතුය. උක්‍රේනියාවේ කම්කරුවන්ගේ සහ ගොවිජනයාගේ සෝවියට් බලය එහි වතුකාර ඉඩම් හිමි ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කර, උක්‍රේනියානු කම්කරුවන් හා ගොවියන් ඉඩම් හිමියන්ගේ පීඩනයෙන් හා ඉඩම් හිමියන්ගෙන් ද මුද ගත යුතුය.

නමුත්, මෙම කර්තව්‍යයටද, මහ රුසියානු සහ උක්‍රේනියානු වැඩ කරන පොදු ජනතාවට මුහුණ දෙන්නට සිදුවූ හා තවමත් සිදුවී තිබෙන වෙනත් කර්තව්‍යයන් ගණනාවකටද අමතරව, උක්‍රේනියාවේ සෝවියට් බලය ඉටු කළ යුතු, එයට විශේෂ වූ, කර්තව්‍යයන් ද ඇත. මෙම විශේෂ කර්තව්‍යයන් අතුරෙන් එකක් වර්තමාන අවස්ථාවේදී ඉතාමත් වැඩි අවධානයට ලක් වීමට සුදුසු වන්නේය. එය නම් ජාතික ප්‍රශ්නය ය. නැතහොත්, වෙනත් වචනවලින් කියතොත්, උක්‍රේනියාව, රුසියානු සමාජවාදී ඒකාබද්ධ සෝවියට් සමූහාණ්ඩුව සමග (පෙඩරල් ආකාරයෙන්) සන්ධාන ගත වූ, වෙන් වූ සහ ස්වාධීන උක්‍රේනියානු සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවක් විය යුතුද, එසේ නැතහොත්, එකම සෝවියට් සමූහාණ්ඩුවක් සෑදෙන ලෙසට උක්‍රේනියාව රුසියාව සමග එකට සම්බන්ධ විය යුතුද යන ප්‍රශ්නය ය. බොල්ෂෙවික්වරුන් සියලු දෙනාමත්, දේශපාලන විඥනය ඇති කම්කරුවන් හා ගොවීන් සියලු දෙනාමත් මෙම ප්‍රශ්නය ගැන සුපරීක්ෂාකාරී ලෙස කල්පනා කර බැලිය යුතුය.

රු. ස. ඒ. සෝ. ස. (රුසියානු සමාජවාදී ඒකාබද්ධ සෝවියට් සමූහාණ්ඩුවේ) සමස්ත රුසියා විධායක කාරක සභාවත්, රුසියානු බොල්ෂෙවික් කොමියුනිස්ට් පක්ෂයත් යන දෙකම උක්‍රේනියාවේ ස්වාධීනත්වය පිළිගෙන ඇත. එනිසා, උක්‍රේනියාව රුසියාව සමග එකට සම්බන්ධ වන්නේද, නැතහොත්, ඇය වෙනම සහ ස්වාධීනව සමූහාණ්ඩුවක් ලෙසට පවතින්නේද යනුත්, මෙහි පසුව සඳහන් කෙරුණු තත්වය ගනිතොත්, ඇය සහ රුසියාව අතර ඇති කර ගන්නේ කුමණ පෙඩරල් ඒකාබද්ධ සම්බන්ධකම්ද යනුත්, තීරණය කරනු හැක්කේ සහ තීරණය කරනු ඇත්තේ, උක්‍රේනියානු කම්කරුවන් හා ගොවි ජනයා විසින්ම, ඔවුන්ගේ සමස්ත උක්‍රේනියා සෝවියට් සම්මේලනයේදී බව, නිරායාසයෙන් පැහැදිලි වන හා පොදුවේ පිළිගත් කරුණක් වී තිබේ.

වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවයන්ට සහ ප්‍රාග්ධනයේ වියගසින් ශ්‍රමය මුද ගැනීම සඳහා කරන ඔවුන්ගේ සටනට අදාළ වන තාක් දුරට, මෙම ප්‍රශ්නය තීරණය කළ යුත්තේ කෙසේද?

ප්‍රථමයෙන්ම, විවිධ රටවල හා ජාතීන්ගේ වැඩ කරන ජනතාවන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අතර පූර්ණතම විශ්වාසයක් හා සමීපතම සන්ධානයක් තිබීම ශ්‍රමකරුවන්ගේ උවමනාවන් අනුව අවශ්‍ය වන්නේය. කම්කරුවන් දුර්වල කරනු පිණිස සහ ප්‍රාග්ධනයේ බලය ශක්තිමත් කරනු පිණිස කම්කරුවන් අසමගි කිරීමට, ඔවුන් අතර ජාතික අසමගිය සහ සතුරුකම් වැඩි කිරීමට, ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ ආධාර කරුවෝ, ධනපතියෝ උත්සාහ කරති.

ප්‍රාග්ධනය වූකලී ජාත්‍යන්තර බල වේගයකි. එය පරාජය කිරීමට ජාත්‍යන්තර කම්කරු සන්ධානයක්, ජාත්‍යන්තර කම්කරු සහෝදරත්වයක් අවශ්‍ය වන්නේය.

ජාතික සතුරුතාවයට සහ අසමගියටත්, ජාතික සුවිශේෂත්වයටත් අපි විරුද්ධ වෙමු. අපි ජාත්‍යන්තරවාදීන් වෙමු. සියලුම ජාතීන්ගේ කම්කරුවන් හා ගොවි ජනයා එකම ලෝක සෝවියට් සමූහාණ්ඩුවක් තුළ සම්පූර්ණ වශයෙන්ම එකට සම්බන්ධ කිරීමට සහ සමීප ලෙස සමගි කිරීමට අපි පක්ෂ වෙමු.

දෙවැනිව, ධනපති ක්‍රමය විසින් ජාතීන් කුඩා සංඛ්‍යාවක් පීඩක, මහ බලවත් (අධිරාජ්‍යවාදී), ස්වෛරී සහ වරප්‍රසාද ලත් ජාතීන්ද, අති විශාල බහුතර සංඛ්‍යාවක් පීඩිත, යටත් හා අර්ධ යටත්, ස්වෛරී නොවන ජාතීන්ද, යනුවෙන් බෙදන ලද බව වැඩ කරන ජනතාව අමතක නොකළ යුතුය. 1914–1918 අන්ත සාපරාධී සහ අන්ත ප්‍රතිගාමී යුද්ධය මෙම භේදය තව දුරටත් තියුණු කළ අතර, එමගින් ද්වේෂය සහ වෛරය වැඩි කළේය. අධිපති සහ පීඩක ජාතීන් කෙරෙහි ස්වෛරී නොවන සහ යටහත් ජාතීන්ගේ දැඩි වෛරය සහ අවිශ්වාසය ශත වර්ෂ ගණනක් තිස්සේ එකතු වී ඇත. උක්‍රේනියානු වැනි ජාතීන් මහ රුසියානු වැනි ජාතීන් කෙරෙහි දක්වන්නේ එවැනි වෛරයක් හා අවිශ්වාසයක්ය.

අපට අවශ්‍ය වන්නේ ස්වේච්ඡාවෙන් සංගම්ගත වීමකි. එක ජාතියක් විසින් තවත් ජාතියකට බල කිරීමට ඉඩ නොතබන සංගමයකි. සම්පූර්ණ විශ්වාසය මත, සහෝදර සමගිය පිළිගැනීම සහ ඒකාන්ත ස්වේච්ඡා කැමැත්ත මත ඉදි වූ සංගමයකි. එවැනි සංගමයක් එක පහරින් ඇති කළ හැක්කේ නොවේ. එය ඇති කිරීම සඳහා අපට ඉමහත් ඉවසීමෙන් යුතුව හා කල්පනාකාරී ලෙස කටයුතු කිරීමට සිදුවේ. තිබෙන තත්වයන් නරක අතට හැරීමට ඉඩ නොදීමට, අවිශ්වාසය ඇතිවීමට ඉඩ නොදීමට, ඉඩම් හිමි සහ ධනපති පීඩනයේ ශත වර්ෂ ගණන් කාලයකින් ද, පෞද්ගලික දේපළ රජ කල ශත වර්ෂ ගණන් කාලයකින්ද, උරුම කොට ලැබුණු අවිශ්වාසය සහ පෞද්ගලික දේපළ බෙදීම හා යළි බෙදීම නිසා ඇති වූ සතුරු කම් හීන වී යාමේ අවස්ථාව සැලසෙන ලෙසට, අපි ඉවසීමෙන් හා කල්පනාකාරීව කටයුතු කළ යුත්තෙමු.

එනිසා ජාතීන් අතර සමගිය රැකීම සහ ඒවා භේද කිරීමට නැඹුරු වන සියල්ලම නිර්දය ලෙස යටපත් කිරීම සඳහා අපි නිතරම පරිශ්‍රම දැරිය යුත්තෙමු. තවද, එසේ කිරීමේදී, අපි ඉතාමත් ප්‍රවේසම් සහිත ලෙස සහ ඉවසිලිමත් ලෙස කටයුතු කළ යුත්තෙමු — ජාතික අවිශ්වාසයේ නෂ්ටාවශේෂයන් අස්වැසෙන සේ ක්‍රියා කළ යුත්තෙමු. ප්‍රාග්ධනයේ වියගසෙන් නිදහස් වීම සඳහා ශ්‍රමය ගෙනයන සටනේ දී ශ්‍රමයේ අවශ්‍යතාවයන් කෙරෙහි බලපාන සියල්ලක්ම සම්බන්ධයෙන් අපි අචල හා අසම්මුති ආකල්පයක් දැක්විය යුත්තෙමු. දැන් ප්‍රථම වතාවට දේශ සීමා පිළිබඳ ප්‍රශ්නය නොවැදගත් එකක් බවට පත් වී තිබේ. අප උත්සාහ කරන්නේ දේශ සීමා සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමටය. එනිසා දේශ සීමා යනු සුළු ප්‍රශ්නයකි. එය මූලික හෝ වැදගත් හෝ ප්‍රශ්නයක් නොවේ. මෙම කරුණෙහිදී අපට ප්‍රමාද වී සිටිය හැක. එසේම ප්‍රමාදව සිටිය යුත්තෙමු. එයට හේතුව, පුළුල් ගොවිජන සමූහයා සහ සුළු දේපල හිමියන් අතර පවතින ජාතික අවිශ්වාසය දුරලීම ඉතා අමාරු හෙයින්, කඩිනම් වීමෙන් එය උත්සන්න වීමට ඉඩ තිබීමය.. වෙනත් වචනවලින් කියතොත් ඉක්මන් වීම සම්පූර්ණ හා අවසාන සමගියට බාධාවක් විය හැකි වීමය.

පෝලන්ත, ලත්වියන්, එස්තෝනියන් සහ පින්ලන්ත ජාතික ගොවි ජනතාව සහ සුළු දේපල හිමියන් මහ රුසියානුන් කෙරෙහි දරන ජාතික අවිශ්වාසය කලකට උපයෝගි කර ගැනීමෙහි ධනපතියන් සමත් වූ බව, මෙම අවිශ්වාසය පදනම කොට ගනිමින් ඔවුන් සහ අප අතර භේදය වැපිරීමට ධනපතියන් කලකට සමත් වූ බව, රුසියාවේ කම්කරු හා ගොවි විප්ලවයේ, 1917 ඔක්තෝබර්-නොවැම්බර් විප්ලවයේ අත් දැකීමෙන් සහ ජාත්‍යන්තර හා රුසියානු ධනපතියන්ගේ මහා ප්‍රහාරයට විරුද්ධව කළ දැවුරුද්දක ජයග්‍රාහී අරගලයේ අත්දැකීමෙන් සක් සුදක් සේ පැහැදිලි වී තිබේ. මෙම අවිශ්වාසය හීන වී හා අතුරුදහන් වී යන්නේ ඉතා හෙමින් පමණක් බවත්, දීර්ඝ කාලයක් තිස්සේ පීඩක ජාතියක්ව සිටි මහ රුසියානුන් වැඩි වැඩියෙන් ප්‍රවේසම සහ ඉවසීම දැක්වූ තරමට මෙම අවිශ්වාසය පහවී යාම වඩාත් ඒකාන්ත වනු ඇති බවත්, අත් දැකීමෙන් පෙනී ගොස් තිබේ. වඩාත් නොදියුණුව සහ ධනපතියන්ගේ රැවටීමට සහ පෑගීමට වැඩියෙන් භාජනයවී සිටි අසල්වැසි කුඩා රාජ්‍යවල ශ්‍රමකරු ජනතාවන්ගේ විශ්වාසය අපට කෙමෙන් කෙමෙන් සහ එක දිගටම දිනාගත හැකි වූයේ පෝලන්ත, ලත්වියානු, ලිතුවේනියානු, එස්තෝනියානු සහ පින්ලන්ත රජයන්ගේ ස්වාධීනත්වය පිළිගැනීමෙනි. "ඔවුන්ගේ" ජාතික ධනපතියන්ගේ බලපෑමෙන් ඔවුන් ගලවා ගැනීමේ සහ ඔවුන් පූර්ණ විශ්වාසය කරා, අනාගත එක්සත් ජාත්‍යන්තර සෝවියට් සමූහාණ්ඩුව කරා මෙහෙයවීමේ ඉතාමත් විශ්වාසදායක මාර්ගය එයයි.

https://liberationbase.wordpress.com

උක්‍රේනියාව තවමත් දෙනිකින්ගෙන් සම්පූර්ණයෙන්ම මුදාගෙන නොමැති තාක් කල්, සමස්ත උක්‍රේනියා සෝවියට් සභා සම්මේලනය රැස්වන තෙක් රටේ ආණ්ඩුව වන්නේ, සමස්ත උක්‍රේනියානු විප්ලවවාදී කාරක සභාවය.[15] උක්‍රේනියානු බොල්ෂෙවික් කොමියුනිස්ට්වරුන්ට අමතරව, ආණ්ඩුවේ සාමාජිකයන් වශයෙන් මෙම විප්ලවවාදී කාරක සභාවේ කටයුතු කරන උක්‍රේනියානු "බරොත්බා" කොමියුනිස්ට්වරු[16]ද සිටිති. බරොත්බාවාදීන් බොල්ෂෙවික්වරුන්ගෙන් වෙන් කරන එක දෙයක් නම්, ඔවුන් උක්‍රේනියාවේ කොන්දේසි විරහිත ස්වාධීනත්වය ගැන බලකර සිටීමය. බොල්ෂෙවික්වරු මෙය මත භේදයට සහ අසමගියට මාතෘකාවක් කර නොගනිති. එකට හවුල් වී දේශපාලන ප්‍රයත්නයන් දැරීමට බාධාවක් ලෙස ඔවුහු මෙය නො සලකති. ප්‍රාග්ධනයේ වියගසට විරුද්ධව සහ නිර්ධන පංතියේ ආඥාදායකත්වය සඳහා කරන අරගලයේදී සමගිය තිබිය යුතුය. ජාතික දේශ සීමා පිළිබඳ ප්‍රශ්නය, නැතහොත්, රාජ්‍යයන් අතර තිබිය යුත්තේ පෙඩරල්, නැතහොත්, වෙනත් ආකාරයක බැඳීම්ද යන්න පිළිබඳව කොමියුනිස්ට්වරු අතර භේද ඇතිවිය යුතු නොවේ. උක්‍රේනියාවේ සම්පූර්ණ ස්වාධීනත්වයට පක්ෂ අයද, එක්තරා ආකාරයක පෙඩරල් ඒකාබද්ධතාවයට පක්ෂ අයද, උක්‍රේනියාව රුසියාව සමග සම්පූර්ණයෙන්ම එකට සම්බන්ධ වීමට පක්ෂ අයද, බොල්ෂෙවික්වරු අතර වෙති.

මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් මත වෙනස්කම් නොතිබිය යුතුය. එම ප්‍රශ්න සමස්ත උක්‍රේනියා සෝවියට් සභා සම්මේලනයෙන් තීරණය කෙරෙනු ඇත.

උක්‍රේනියාව රුසියාව සමග එකට සම්බන්ධ විය යුතු යයි මහ රුසියානු කොමියුනිස්ට්වරයෙක් බල කරයි නම්, ඔහු පහසුවෙන්ම උක්‍රේනියානුන්ගේ සැකයට භාජනය වීමට ඉඩ තිබේ. ඔහු මෙම ප්‍රතිපත්තිය ඉදිරිපත් කරන්නේ ප්‍රාග්ධනයට විරුද්ධව කරන සටනේදී නිර්ධන පංතිකයන් එක්සත් කිරීමේ අදහසින් නොව, පැරණි මහ රුසියානු ජාතිකවාදයේ, අධිරාජ්‍යවාදයේ දුර්මත හේතු කොට ගෙන යයි ඔවුන් සිතන්නට ඉඩ තිබේ: තවද, එවැනි අවිශ්වාසයක් ඇතිවීම එක්තරා දුරකට ස්වාභාවිකය. ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ විය ගසට බැඳී සිටි මහ රුසියානුන් ශත වර්ෂ ගණනක කාලයක් තිස්සේ මහරුසියානු ජාතොන්මාදවාදයේ ලජ්ජා ගෙන දෙන සහ පිළිකුල් සහගත දුර්මතවල ගැලී සිටි නිසා එවැනි අවිශ්වාසයක් ඇති වීම එක්තරා දුරකට නොවැලැක්විය හැකි සහ සාධාරණ වේ.

උක්‍රේනියාවට කොන්දේසි විරහිත රාජ්‍ය ස්වාධීනත්වය තිබිය යුතු යයි උක්‍රේනියානු කොමියුනිස්ට්වරයෙක් බලකර කියන්නේ නම්, ඔහු

එම ප්‍රතිපත්තියට ආධාර කරන්නේ, ප්‍රාග්ධනයට විරුද්ධව උක්‍රේනියානු කම්කරුවන් සහ ගොවි ජනතාව කරන අරගලයේදී ඔවුන්ගේ තාවකාලික අවශ්‍යතාවයන් නිසා නොව, සුළු දේපල හිමියාගේ සුළු ධනපති ජාතික දුර්මතයන් නිසාය යන සැකය ඇති වීමට ඔහු ඉඩ තබන්නේය. විප්ලවවාදී කම්කරුවන්ට විරුද්ධව, "තමන්ගේ" ජාතික ධනපති පංතිය සමග සම්මුතිගත වීමේ ප්‍රතිපත්තියක් රැවටිලිකාර ලෙස ඉදිරියට ගෙන යාමේ එකම අරමුණ ඉටු කර ගනු පිණිස, විවිධ රටවල සුළු ධනපති "සමාජ වාදීන්" — විවිධ පෝලන්ත, ලත්වියානු සහ ලිතුවේනියානු ව්‍යාජ සමාජවාදීන් සියලු දෙනාද, ජෝර්ජියානු මෙන්ෂෙවික්වරුන්, සමාජවාදී-විප්ලවවාදීන් හා එවැනි අයද නිර්ධන පංතියේ ආධාර කරුවන්ගේ වෙස් ගෙන පෙනී සිටි අවස්ථා සිය ගණනක් පසුගිය අත්දැකීම් වලින් ඉදිරිපත් වී තිබේ. රුසියාවේ 1917 පෙබරවාරි-ඔක්තෝබර් කාලයේ පැවති කෙරෙන්ස්කි පාලනයෙන් අපි මෙය දුටුවෙමු. වෙනත් සියලුම රටවලදීද අපි මෙය දුටුවෙමු. දනුදු දකින්නෙමු.

එනිසා මහ රුසියානු සහ උක්‍රේනියානු කොමියුනිස්ට්වරුන් අතර අන්‍යොන්‍ය අවිශ්වාසය ඉතා පහසුවෙන් ඇති විය හැකිය. මෙම අවිශ්වාසයට විරුද්ධව සටන් කරන්නේ කෙසේද? එය පරාජය කර අන්‍යොන්‍ය විශ්වාසය ඇති කරන්නේ කෙසේද?

මෙය සාර්ථක කර ගැනීමේ හොඳම මාර්ගය නම්, සියලුම රටවල ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට විරුද්ධව සහ ඔවුන්ගේ ආධිපත්‍යය යළි ඇති කිරීමට ඔවුන් දරන ප්‍රයත්නවලට විරුද්ධව කරන සටනේ දී නිර්ධන පංති ආඥාදායකත්වය සහ සෝවියට් බලය ආරක්ෂා කිරීමට එක්ව කටයුතු කිරීමය. රාජ්‍ය ස්වාධීනත්වය, නැතහොත්, දේශසීමා ගැන ගන්නා තීරණය කුමක් වුවත්, මහ රුසියානු සහ උක්‍රේනියානු කම්කරුවන් අතර සමීප යුද්ධමය සහ ආර්ථික සන්ධානයක් තිබිය යුතු බව, මෙම පොදු සටනෙන්, ව්‍යවහාරයේදී ඉතා පැහැදිලි ලෙස පෙනෙනු ඇත. මන්ද යත්, එසේ නොවුවහොත්, "මිත්‍ර" Entente ගිවිසුමේ ධනපතියන් වෙනත් වචන වලින් කියතොත්, බ්‍රිතාන්‍යය, ප්‍රන්සය, ඇමෙරිකාව, ජපානය සහ ඉතාලිය යන ඉතාමත් පොහොසත් ධනපති රටවල ධනපතියන් අප වෙනම ගෙන, අප මිරිකා දමනු හා අපගේ බෙලි අඹරවා දමනු ඇති හෙයිනි. මෙම ධනපතියන් විසින් මුදල් සහ ආයුධ සැපයීමෙන් ආධාර කරනු ලැබූ කොල්චාක්ට හා දෙනිකින්ට විරුද්ධව අප කළ යුද්ධය, මෙම අන්තරාය පැහැදිලි ලෙස ගෙනහැර පාන්නකි.

මහ රුසියානු සහ උක්‍රේනියානු කම්කරුවන් හා ගොවි ජනතාව අතර සමගිය හා සමීපතම සන්ධානය දුර්වල කරන අයෙක් වේ නම්, ඔහු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොල්චාක්ලාට, දෙනීකින්ලාට සහ සියලුම රටවල ධනපතියන්ට ආධාර කරන්නේ වෙයි.

එනිසා, මහ රුසියානු කොමියුනිස්ට්වරුන් වන අපි, අප අතරින් ස්වල්ප වශයෙන් හෝ මතු වන මහ රුසියානු ජාතිකවාදය ඉතාමත් තදින් මර්දනය කළ යුත්තෙමු. එම ජාතිකවාදී හැඟීම් යනු, පොදු වශයෙන් කොමියුනිස්ට්වාදය පාවාදීමක් වන්නේය. ඒවා අපගේ උක්‍රේනියානු සහෝදරවරුන් කෙරෙන් අප වෙන් කිරීමට හේතු වන අතර, එනයින් දෙනීකින්ට හා ඔහුගේ පාලනයට ආධාරයක් වන්නේය.

එනිසා උක්‍රේනියානු බොල්ෂෙවික් කොමියුනිස්ට්වරුන් හා බොරොත්බාවාදීන් සමග වෙනස්කම් ඇති වන කල සහ මෙම වෙනස්කම් උක්‍රේනියාවේ රාජ්‍ය ස්වාධීනත්වය ගැන, ඈ රුසියාව සමග පවත්වන සන්ධානයේ ආකෘති ගැන හා පොදු වශයෙන් ජාතික ප්‍රශ්නය ගැන වන කල, මහ රුසියානු කොමියුනිස්ට්වරුන් වන අපි ඔවුන්ට සහනයන් දිය යුත්තෙමු. නමුත්, මහ රුසියානු කොමියුනිස්ට්වරු, උක්‍රේනියානු කොමියුනිස්ට්වරු සහ වෙනත් ඕනෑම ජාතියක කොමියුනිස්ට්වරු යන අපි සියලු දෙනාම, සියලුම ජාතීන්ට ඒකාකාර වන අත්තිවාරම පිළිබඳ හා මූලික වූ ප්‍රශ්න සම්බන්ධයෙන්, නිර්ධන පංති අරගලය හා නිර්ධන පංති ආඥාදායකත්වය සම්බන්ධයෙන් ප්‍රශ්නවලදී ලිහිලක් නොදක්වන හා බේරුමකට නොඑළඹෙන පිළිවෙතක් අනුගමනය කළ යුත්තෙමු. ධනපති පංතිය සමග සම්මුති ඇති කර ගැනීම හෝ දෙනීකින්ට විරුද්ධව අපට ආරක්ෂාව දෙන බලවේගයන් වෙනත් ආකාරයකින් බෙදීම හෝ අපි නොඉවසිය යුත්තෙමු.

දෙනීකින් පරාජය කර විනාශ කළ යුතුය. ඔහුගේ වැනි ප්‍රහාරයන් නැවත ඇති වීමට ඉඩ නොතැබිය යුතුය. එය මූලික වශයෙන් මහ රුසියානු සහ උක්‍රේනියානු යන ජාතීන් දෙකෙහිම කම්කරුවන්ගේ සහ ගොවි ජනයාගේ යහපතට හේතු වන්නේය. සටන දීර්ඝ හා දුෂ්කර එකක් වනු ඇත. එසේ වන්නේ මුළු ලෝකයේම ධනපතියන් දෙනීකින්ට ආධාර කරන සහ අන් සියලු දෙනීකින්ලාටද ආධාර කරනු ඇති හෙයිනි.

මෙම දීර්ඝ හා දුෂ්කර සටනේදී මහ රුසියානු සහ උක්‍රේනියානු කම්කරුවන් වන අපි ඉතාමත් සමීපතම සන්ධානයක් පවත්වා ගත යුත්තෙමු. මන්ද යත්, වෙන් වෙන් වශයෙන් සිට අපට මෙම කර්තව්‍යය ඉටු කිරීමට නුපුළුවන් වන හෙයිනි. උක්‍රේනියාව හා රුසියාව අතර දේශ සීමාව කුමක් වුවත්, ඒවායේ අන්‍යෝන්‍ය රාජ්‍ය සම්බන්ධකම්වල ආකෘති මොනවා වුවත්, එය එතරම් වැදගත් නොවේ. මෙම කරුණෙහි දී සහනයන් දිය හැකිය. දිය යුතුය. මෙහිදී, එක් දෙයක්, දෙවැනි, නැතහොත්, තුන් වැනි දෙයක් අත් හද බැලීමට පුළුවන. කම්කරුවන්ගේ හා ගොවි ජනතාවගේ ව්‍යාපාරය, ධනපති ක්‍රමය පරාජය කර ලබන ජයග්‍රහණය, එනිසා විනාශ නොවනු ඇත.

නමුත්, සමීපතම සන්ධානයක්, දෙනීකින්ට විරුද්ධව සන්ධානයක්, අපගේ රටවල සහ සියලු රටවල ධනපතියන්ට සහ කුලාකයන්ට විරුද්ධව සන්ධානයක් පවත්වාගැනීමට අප අසමත් වුවහොත්, අප, එනම්, සෝවියට් උක්‍රේනියාව සහ සෝවියට් රුසියාව යන දෙකම සූන් කර දැමීමට හා ඒ දෙකෙහිම බෙල්ල අඹරවා දැමීමට ධනපතියන් සමත් වනු ඇතැයි යන අර්ථයෙන්, අවුරුදු ගණනාවකට හිස එසවිය නොහැකි වන ලෙසට ශ්‍රමයේ සත් ව්‍යාපාරය නිසැකවම විනාශ වනු ඇත.

එනිසා, සියලුම රටවල ධනපතියන් සහ නෝකාකාර සුළු ධනපති පක්ෂ — එනම්, කම්කරුවන්ට විරුද්ධව ධනපතියන් සමග සන්ධානගත වීමට ඉඩ දෙන "සම්මුතිවාදී" පක්ෂ — වැඩියෙන්ම උත්සාහ දරන්නේ විවිධ ජාතීන්ගේ කම්කරුවන් අසමගි කිරීමටය. ඔවුන් අතර අවිශ්වාසය ඇති කිරීමටය. එමෙන්ම, කම්කරුවන්ගේ ජාත්‍යන්තර සන්ධානය හා ජාත්‍යන්තර සහෝදරත්වය කඩාකප්පල් කිරීමටය. මෙය කිරීමෙහි ධනපතියන් සමත් වන සෑම තැනකදීම, කම්කරුවන්ගේ සත් ව්‍යාපාරය විනාශ වී යන්නේය. එනිසා, ඉවසිලිමත්, අනවරථ, දැඩි හා එක්සත් පරිශ්‍රමයක් දරමින්, ධනපතියන්ගේ කූට ප්‍රයෝග ව්‍යර්ථ කිරීමත්, සෑම වර්ගයකම දූර්මතයන් පරාජය කිරීමත්, සෝවියට් බලය සඳහා, ඉඩම් හිමි හා ධනපති වියගස ඉවත ලීම සඳහා සහ ලෝක පෙඩරල් ඒකාබද්ධ සෝවියට් සමූහාණ්ඩුවක් සඳහා කරන සටනේදී විවිධ ජාතීන්ට අයත් කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ සැබැවින්ම ශක්තිමත් සන්ධානයක් පිළිබඳ ආදර්ශයක් ලෝකයේ වැඩ කරන ජනතාව හමුවේ තැබීමත්, රුසියාවේ හා උක්‍රේනියාවේ කොමියුනිස්ට්වරුන්ගේ යුතුකම වන්නේය.

1919 දෙසැම්බර් 28

"ප්‍රාව්දා" අංක 3, 1920 ජනවාරි 4 — එන්. ලෙනින්.

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය වෙළුම 40, පිටු 41-47

https://liberationbase.wordpress.com

යුනිවර්සල් සර්විස් ප්‍රවෘත්ති සේවයේ බර්ලින් වාර්තාකරු කාල් වීගන්ද් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු

1. අපි පෝලන්තයට හා රුමේනියාවට පහරදීමට අදහස් කරන්නෙමුද?

නැත. අපි, මහජන කොමිසාර් මණ්ඩලය සහ සමස්ත රුසියා මධ්‍ය විධායක කාරක සභාව වෙනුවෙන්, අපගේ සාමකාමී අපේක්ෂාවන් ඉතාමත් අවධාරණ සහිතව සහ නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත්තෙමු. අපට පහර දෙනු සඳහා ප්‍රංශ ධනපති ආණ්ඩුව විසින් පෝලන්තය (සහ සිතා ගත හැකි ලෙසට රුමේනියාවද) උසිගන්වනු ලැබීම ඉතාමත් කණගාටුදයකය. ලියොන් නගරයේ, ඇමෙරිකානු ගුවන් විදුලි පණිවුඩ කීපයක් පවා මේ ගැන සඳහන් කර තිබේ.

2. ආසියාවේදී අප අනුගමනය කරන සැලසුම් මොනවාද?

ඒවා යුරෝපයේදී අනුගමනය කරන සැලසුම්වලට සමානය. සියලුම ජනතාවන් සමග සහපැවැත්මය. නව ජීවනයකට, එනම්, සූරා කන්නන් නොමැති, ඉඩම් හිමියන් නොමැති, ධනපතියන් නොමැති, වෙළෙඳුන් නොමැති ජීවනයකට පිබිදී එන කම්කරුවන් හා ගොවි ජනතාව සමග සහපැවැත්මය. 1914–1918 අධිරාජ්‍යවාදී යුද්ධය නිසා, එනම්, ඉංග්‍රිසි-ප්‍රංශ (සහ රුසියන්) කණ්ඩායම ජර්මන්–ඔස්ත්‍රියන් කණ්ඩායමට විරුද්ධව ලෝකය බෙදා ගැනීම සඳහා කළ යුද්ධය නිසා, ආසියාව පිබිදී, අන් සැම තැනකම මෙන්ම, එහිද, නිදහස සඳහාත්, සාමකාමී ශ්‍රමය සඳහාත්, ඇතිවිය හැකි අනාගත යුද්ධවලට විරුද්ධවත්, උද්වේගය බලවත් වී තිබේ.

3. ඇමෙරිකාව සමග සාමයට පදනම වනු ඇත්තේ කුමක්ද?

ඇමෙරිකානු ධනපතියන් අපට නිදහසේ සිටින්නට හැරිය යුතුය. අපි ඔවුනට අතවත් නොතබන්නෙමු. අපගේ ප්‍රවාහණයට හා කර්මාන්තයට ප්‍රයෝජනවත් වන යන්ත්‍ර, උපකරණ ආදිය සඳහා අපි ඔවුන්ට රත්රන්වලින් වුවද ගෙවීමට කැමැත්තෙමු. රත්රන්වලින් පමණක් නොව, අමු ද්‍රව්‍යවලින් වුවද ගෙවීම් කිරීමට අප සූදානම් ය.

4. එවැනි සාමයකට ඇති බාධකයන් මොනවාද?

අපේ පැත්තෙන් කිසිම බාධාවක් නැත. ඇමෙරිකානු (සහ වෙනත් කුමණ හෝ) ධනපතියන්ගේ පැත්තෙන් අධිරාජ්‍යවාදය බාධාවක් වී තිබේ.

5. රුසියානු විප්ලවවාදීන් ඇමරිකාවෙන් නෙරපා හැරීම ගැන අපගේ අදහස් මොනවාද?

අපි ඔවුන් භාරගෙන ඇත්තෙමු. මේ රටේ විප්ලවවාදීන් සිටීම ගැන අපි බිය නොවන්නෙමු. සත්‍ය වශයෙන්ම කියතොත්, අපි කිසිවෙකුට බිය නොවන්නෙමු. එපමණක් නොව, ඇමෙරිකාව තවත් එහි පුරවැසියන් සිය ගණනකට, නැතහොත් දහස් ගණනකට බිය වන්නේ නම්, ඇමෙරිකාව අන්තරාදයකයයි සිතන පුරවැසියන් (අපරාධකරුවන් නම් මීට ඇතුළත් නොකරමු) භාර ගැනීමේ අදහස ඇතිව සාකච්ඡා ආරම්භ කිරීමට අපි සූදානම්ව සිටිමු.

6. රුසියාව සහ ජර්මනිය අතර ආර්ථික සන්ධානයකට ඇති ඉඩකඩ මොනවාද?

අවාසනාවකට මෙන් එම ඉඩකඩ මහත් නොවේ. කිසිම විශේෂයක් නොමැතිව, සියලුම රටවල් සමග සන්ධානයකට අපි පක්ෂ වෙමු.

7. විදේශගත යුද්ධ අපරාධකරුවන් ආපසු භාර දීම සම්බන්ධයෙන් මිත්‍ර රටවල් කරන ඉල්ලීම ගැන අපගේ අදහස් මොනවාද?

යුද්ධ අපරාධවලට වැරදි කරුවන් වීම ගැන අප බරපතල ලෙස කථා කරන්නෙමු නම්, අපරාධ කර තිබෙන්නේ සියලුම රටවල ධනපතියන්ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉඩම් හෙක්ටෙයාර් සියයකට වඩා හිමිකරගෙන සිටින ඔබගේ වතුකාර ඉඩම් හිමියන් සියලු දෙනාම සහ ප්‍රෑන්ක් 1,00,000 ට වැඩි ප්‍රාග්ධනයක් අත් කරගෙන සිටින ධනපතියන් සියලු දෙනාම අපට භාර දෙන්න. අපි ඔවුන්ට ශ්‍රම කටයුතු උගන්වා, ඔවුන් සූරා කන්නන්ගේ සහ යටත් විජිත බෙදගැනීම සඳහා යුද්ධ අවුළුවන්නන්ගේ කාර්ය කොටසෙන් බිඳී ඉවත්වන තැනට යොමු කරන්නෙමු. එවිට, යුද්ධ ඇතිවීමට කිසිම ඉඩක් නැති තත්වයක් ඉක්මණින්ම උදා වනු ඇත.

8. රුසියාව සමග සාමයක් ඇති කර ගැනීමෙන් යුරෝපයේ ආර්ථික තත්වයන් කෙරෙහි ඇතිවිය හැකි බල පෑම කුමක්ද?

ධාන්‍ය, ප්ලැක්ස් හණ සහ වෙනත් අමුද්‍රව්‍ය සඳහා යන්ත්‍ර හුවමාරු කර ගැනීම — මෙය යුරෝපයට අවාසියක් විය හැකිදැයි මම අසන්නෙමි. එය වාසියක් මිස අන් කිසිවක් නොවිය හැකි බව පැහැදිලිය.

9. අනාගතයේදී සෝවියට් සභා ලෝක බලවේගයක් වශයෙන් සංවර්ධනය වීම සම්බන්ධයෙන් අපගේ අදහස කුමක්ද?

සමස්ත ලෝකයේම අනාගතය සෝවියට් ක්‍රමයට අයත් වන්නේය. සත්‍ය කරුණුවලින් එය ඔප්පු වී තිබේ. නිදසුනක් ලෙසට, ඕනෑම රටක් තුළ සෝවියට් සභාවලට පක්ෂ, නැතහොත්, හිතවත් කම් දක්වන පොත් පොඩි, පොත්, පත්‍රිකා සහ පුවත් පත් සංඛ්‍යාව වර්ධනය වන ආකාරය, කාර්තු කාලසීමා අනුව ගණන් බැලීමෙන්ම අයෙකුට ඒ බව පෙනෙනු ඇත. එහිදී වෙනත් දෙයක් සිදු වීමේ ඉඩක් නොමැත. තමන් ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ වියගසින් නිදහස් කරමින් සෝවියට් ක්‍රමය තමන් අතට සියලු බලය පත් කරන බව, නගරවල කම්කරුවන්ද, ගම්වල කම්කරුවන්, ඉඩම් අහිමි ගොවීන් සහ හස්ත කාර්මිකයන් මෙන්ම, සුළු ගොවීන්ද (එනම්, කුලීශ්‍රමය සූරා නොකන අය) යන වැඩ කරන ජනතාවගෙන් මෙම අති බහුතරය වටහාගත් විට, ලෝකය මුළුල්ලේම සෝවියට් ක්‍රමය ජයග්‍රහණය කිරීම නැවැත්විය හැක්කේ කෙසේද? එය වැළැක්වීමේ මාර්ගයක් මම නම් නොදනිමි.

10. පිටතින් එන ප්‍රතිවිප්ලවය ගැන රුසියාව තවදුරටත් බය විය යුතුද?

අවාසනාවකට මෙන් එය ඒ ගැන බිය විය යුතුය. මන්ද යත්, ධනපතියන් අඥාන, කෑදර මිනිසුන් වන හෙයිනි. රුසියාවට විරුද්ධව

මැදිහත් වීමේ එවැනි අඥාන, කෑදර ප්‍රයත්න ගණනාවක්ම ඔවුන් දරා ඇත. සියලුම රටවල කම්කරුවන් හා ගොවි ජනයා, ඔවුන්ගේ ධන පතියන්ට නැවත උගන්වා ශික්ෂණය කරගන්නා තෙක්, එවැනි මැදිහත් වීම් නැවත ඇතිවේය යන බිය කෙනෙක් තුළ ඇති වේ.

11. රුසියාව ඇමෙරිකාව සමග වෙළෙඳ සම්බන්ධකම් ඇති කර ගැනීමට සූදානම්ද?

ඇත්තෙන්ම ඈ එය එසේ කිරීමට සූදානම් ය. අන් රටවල් සමගද එසේ කිරීමට සූදානම්ය. වෙළෙඳ සම්බන්ධකම් ඇති කරගැනීම සඳහා, යම් යම් කොන්දේසි යටතේ කාර්මික පහසුකම් දීමට පවා අප සූදානම් බව එස්තෝනියාව සමග ඇති කර ගත් සාමයෙන් පෙනේ. අපි එයට බොහෝ පහසුකම් දුන්නෙමු.

1920 පෙබරවාරි 18 — වී. උල්‍යානව් (එන්. ලෙනින්)

නිව්යෝක් ඊව්නිං ජෝනල් අංක 12671 හි 1920 පෙබරවාරි 21 දින පළ කරන ලදී

සම්පූර්ණ කෘති, පස් වැනි මුද්‍රණය, වෙළුම 40, පිටු 145–147

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ද වර්ල්ඩ් නැමති ඇමෙරිකානු ප්‍රවෘත්ති පත්‍රයේ වාර්තාකරු ලින්කන් අයර් සමග කළ පුවත් පත් සාකච්ඡාව

මිතුරු බලවත්තු ''වෙස් ක්‍රීඩාවෙහි'' යෙදෙති

සම්බාධනය නතර කිරීමට මිතුරු බලවතුන් විසින් ගන්නා ලදැයි වාර්තා වූ තීරණය ගැන ලෙනින් මෙසේ කීවේය:

''එම යෝජනාව කර ඇත්තේ, පෝලන්තය මගින් අපට විරුද්ධව අළුත් ප්‍රහාරයක් දීමට සූදානමක් කරන අතරම බව පෙනෙන හෙයින්, එවැනි අස්ථිර යෝජනාවක් පිටුපස කොතරම් අවංකභාවය ඇද්දැයි දැන ගැනීම අමාරුය. බැලූ බැල්මට ශ්‍රේෂ්ඨ මණ්ඩලයේ තීරණය — එනම්, රුසියානු සමුපකාර මගින් වාණිජ සම්බන්ධකම් නැවත ආරම්භ කිරීම — තර්කානුකූල සේ පෙනේ. නමුත් සමුපකාර අපගේ සෝවියට බෙදාහැරීමේ ආයතනවලට උරාගන්නා ලද නිසා, දැන් ඒවා පවතින්නේ නැත. එනිසා, මිතුරු බලවතුන් සමුපකාර සමග ගනුදෙනු කිරීම ගැන කථා කරන විට එයින් අදහස් කෙරෙන්නේ කුමක්ද? සැබැවින්ම එය පැහැදිලි නැත.

''එනිසා වඩාත් සමීප ලෙස පරීක්ෂා කර බලන කල, මෙම පැරිස් තීරණය මිතුරු බලවතුන්ගේ වෙස් ක්‍රීඩාවේ එක ඉත්තෙක් ඇදීමක් බව අපට අවබෝධ වන අතර, එහි චේතනාව කුමක්දැයි තවමත් පැහැදිලි නැත.''

ලෙනින් මදක් නැවතී ලොකු සිනාවක් පා මෙසේද එකතු කළේය:

''නිදසුනක් ලෙසට, මාෂල් ෆේපාෂ්ගේ අපේක්ෂිත වොර්සෝ ගමනට වඩා බොහෝ අපැහැදිලිය.''

ඔහු සිතන ලෙසට පෝලන්ත ප්‍රහාරයක් පිළිබඳ බරපතල අනතුරක් තිබේදැයි අසන ලදුව (රුසියාවේ පැතිර තිබුණු කථා අනුව කියවුනේ බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව පෝලන්ත ආක්‍රමණයක් ගැන මිස එහි අනිත් පැත්ත නොවන බව මතක තබා ගත යුතුය) ලෙනින් මෙසේ පිළිතුරු දුන්නේය:

''ඒ ගැන සැකයක් නැත. ක්ලෙමන්සෝ සහ ෆේපාෂ් ඉතාමත් බරපතල ලෙස සිතන මහත්වරුය. මෙයින් එක් අයෙක් මෙම ප්‍රහාරක ව්‍යාපාරයට මුල පිරූ අතර අනිත් අය එය ක්‍රියාත්මක කරන්නට යන්නේය. එය බරපතල තර්ජනයක් බව ඇත්තය. නමුත් අපි මීට වඩා බරපතල තර්ජනවලට මුහුණ දී ඇත්තෙමු. එයින් අප තුළ ඇති වන්නේ බියට වඩා බලාපොරොත්තු සුන්වීමේ හැඟීමකි. එම හැඟීම ඇති වන්නේ, මිතුරු බලවතුන් කළ නොහැකි දෙයක් පසුපස තවමත් එළවන නිසාය. මා එසේ කියන්නේ, කොල්චාක් ගේ සහ දෙනිකින්ගේ ප්‍රහාරවලට වඩා හොඳින් පෝලන්ත ප්‍රහාරයක් මගින් ඔවුන්ට රුසියානු ප්‍රශ්නය විසඳාගත නොහැකි වනු ඇති හෙයිනි. පෝලන්තයට ඇගේම ප්‍රශ්න රැසක් තිබෙන බව මතක තබා ගන්න. එමෙන්ම, රුමේනියාව ඇතුළු ඇගේ අසල් වැසියන් කිසිවෙකුගෙන් ඇයට ලබා ගත හැකි ආධාරයක්ද නැත.''

''නමුත් පෙරට වඩා දැන් සාමය සමීපවී ඇතැ'' යි යන අදහස මම ඉදිරිපත් කෙළෙමි.

''ඔව්, එය ඇත්තය. සාමය අප සමග වෙළෙඳාම් කිරීමට උපප්‍රමේයයක් වන්නේ නම් මිතුරු බලවතුන්ට තවත් වැඩි කලක් එය මග හැරීමට නොහැකි වනු ඇත. ක්ලෙමන්සෝගේ අනුප්‍රාප්තික මිලෙරාන් රුසියානු ජනතාව සමග වාණිජ සම්බන්ධකම් ඇතිකර ගැනීම ගැන සිතා බැලීමට කැමති බව මට අසන්නට ලැබී ඇත. සමහර විට මෙයින් ප්‍රකාශ වන්නේ ප්‍රංශ ධනපතියන් ඔවුන්ගේ පෙරමුණ වෙනස් කරන බව විය හැකිය. නමුත් චර්චිල් තවමත් එංගලන්තයෙහි බලවත්ව සිටී. සමහර විට අප සමග වෙළෙඳාම් කිරීමට කැමති වන ලොයිඩ් ජෝජ්, චර්චිල් ප්‍රතිපත්තියට ආධාර කරන දේශපාලන සහ මූල්‍ය බලවතුන් සමග විවෘත ලෙස භේදවීමේ අවදානමට මුහුණ දීමට බිය වනු ඇත.''

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එක්සත් ජනපදය සමාජවාදීන්ට පීඩා කරයි

''එහෙත් ඇමෙරිකාව?''

''එහි සිදුවන්නේ කුමක්දැයි පැහැදිලිව වටහා ගැනීම අසීරුය. ඔබගේ බැංකු කරුවන් අප කෙරෙහි අභූත විරූ බියක් දක්වන බව පෙනේ. කෙසේ වුවත්, ඔබගේ ආණ්ඩුව සමාජවාදීන්ට පමණක් නොව පොදුවේ කම්කරු පංතියට විරුද්ධව, වෙනත් කිසිම ආණ්ඩුවකට වඩා, ප්‍රතිගාමී ප්‍රංශ ආණ්ඩුවටත් වඩා, ප්‍රචණ්ඩ සේ මර්දනකාරී පියවරයන් ක්‍රියාත්මක කරන්නේය. එය විදේශිකයන්ට තාඩන පීඩන කරන බවද පෙනේ. එය එසේ වුවත්, ඇමෙරිකාවේ විදේශීය කම්කරුවන් නොමැති නම් ඇගේ තත්වය කුමක් වනු ඇද්ද? ඔවුන් ඔබගේ ආර්ථික සංවර්ධනය සඳහා නැතිවම බැරි පිරිසකි.

''එසේ වුවද, රුසියාවේදී මුදල් උපයා ගැනීම රුසියාවට විරුද්ධව යුද්ධ කිරීමට වඩා ඥනවන්ත බව සමහර ඇමෙරිකානු ධනපතියන්ට වැටහෙන සේ පෙනෙන්නට තිබේ. එය හොඳ ලකුණකි. අන් කිසිම රටක භාණ්ඩවලට වඩා අපට ඇමෙරිකාවේ නිමි භාණ්ඩ, එනම් ඇන්ජින් යන්ත්‍ර, මොටර්වාහන ආදිය අවශ්‍ය වන්නේය.''

''ඔබගේ සාම කොන්දේසි?''

''ඒ ගැන තවදුරටත් කථා කිරීමේ අර්ථයක් නැතැ'' යි ලෙනින් අවධාරණයෙන් යුතුව පිළිතුරු දුන්නේය. ''ඉතාමත් අධිරාජ්‍යවාදී ධනපතියන්ට පවා නැතැයි කිව නොහැකි තරම් සාධාරණ කොන්දේසි මත සාමයක් ඇති කර ගැනීමට අප සූදනම් බව මුළු ලෝකයාම දන්නේය. සාමය සඳහා අපේ ඇති අභිලාෂය, සාමය සඳහා අපට ඇති අවශ්‍යතාවය සහ විදේශ ප්‍රාග්ධනයට ඉතාමත් වාසිදයක අනුග්‍රහ හා සහතිකයන් දීමට අපගේ ඇති සූදනම අපි නැවතත් සහ නැවත, නැවතත් පළ කොට ඇත්තෙමු. නමුත් සාමය පතා මැරෙන තෙක් අපගේ බෙල්ල මිරිකව ගැනීමට අපි යෝජනා නොකරමු.''

''අපගේ වැනි සමාජවාදී රාජ්‍යයකට ධනපති රටවල් සමග සීමාවක් නැතිව වෙළෙඳාම් කළ නොහැකි වීමට හේතුව මම දනිමි. ඔවුන්ගේ ඇන්ජින් යන්ත්‍ර සහ කෘෂිකාර්මික යන්ත්‍ර ගැනීමට අපි අකැමැත්තක් නැත්තෙමු. එනිසා අපේ සමාජවාදී තිරිඟු ප්ලැක්ස් හණ සහ ප්ලැටිනම් ගැනීමට ඔවුන් අකැමති විය යුත්තේ මන්ද? සමාජවාදී ධාන්‍යයද, අන් ඕනෑම ධාන්‍යයකට සමාන රස ඇත්තේය. එසේ නොවේද? නමුත්,

ඔවුන්ට වෙළෙඳ සම්බන්ධකම් පවත්වන්නට සිදුවනු ඇත්තේ භයානක බොල්ෂෙවික්වරු, නැතහොත්, සෝවියට් ආණ්ඩුව සමගය. එසේ වුවත්, යුද්ධ කාලීන වෙඩි උණ්ඩ වෙළෙඳාම හා සම්බන්ධයෙන් ඇමෙරිකානු වානේ කර්මාන්ත කරුවන් මිත්‍ර ගිවිසුමේ ආණ්ඩු සමග කළ ගනුදෙනුවලට වඩා සෝවියට් ආණ්ඩුව සමග ගනුදෙනු කිරීම ඔවුන්ට අපහසු වීමට හේතුවක් නොමැත.''

රුසියාවේ ආධාරය යුරෝපයට අවශ්‍යය

''රුසියාව සමග වෙළෙඳාම යළිත් සමුපකාර මගින් විවෘත කිරීම ගැන කථා අවංක නොවන සේ, නැතහොත් යටත්පිරිසෙයින්, නොපැහැදිලි සේ අපට පෙනෙන්නේ, වහාම භාරගෙන ක්‍රියාත්මක කළ හැකි අවංක හා ඍජු යෝජනාවකට වඩා චෙස් ක්‍රීඩාවේ ඉත්තෙක් ඇදීමක් ලෙස පෙනෙන්නේ එහෙයිනි. තවද ශ්‍රෙෂ්ඨ මණ්ඩලය ඇත්ත වශයෙන්ම සම්බාධනය නැවැත්වීමට අදහස් කරන්නේ නම්, එහි අපේක්ෂාවන් ගැන එය අපට නොකියන්නේ මන්ද? අපට පැරිසියෙන් නිල පණිවුඩයක් ලැබී නැත. අප දන්නා ස්වල්පය දනගන්නට ලැබුණේ පුවත් පත් වාර්තාවලින් හා අපගේ ගුවන් විදුලිය විසින් අවුලා ගන්නා ලද තොරතුරුවලිනි.

''රුසියාවේ වර්තමාන ආර්ථික ආපදව, ඉදුරාම ලෝක ආර්ථික ආපදවේම කොටසක් වන බව මිත්‍ර ගිවිසුමේ සහ එක්සත් ජනපදයේ රාෂ්ට්‍ර පාලකයන් වටහාගෙන නොමැති බව පෙනේ. කිසියම් ජාතියක, නැතහොත්, ජාතීන් කණ්ඩායමක ස්ථාවරයෙන් නොව, ලෝක ස්ථාවරයකින් ආර්ථික ප්‍රශ්නයට මුහුණ දෙන තෙක් එයට විසඳීමක් ලබා ගත නොහැකි වනු ඇත. රුසියාව නොමැතිව යුරෝපයට ඇගේ දෙපයින් සිටගත නොහැකි වනු ඇත. එසේ යුරෝපය බිම දිගා වී තිබෙන විට ඇමෙරිකාවේ තත්වය උග්‍රවෙයි. ඇමෙරිකාවේ ධනයෙන් ඇමෙරිකාවට අවශ්‍ය දේ ලබා ගත නොහැකි නම් ඇගේ එම ධනයෙන් ඇති ඵලය කුමක්ද? ඇමෙරිකාව රැස්කරගෙන තිබෙන රත්රන් කෑමටවත්, ඇඳීමටවත් පුළුවන් කමක් ඇයට නැත. ඇයට එම හැකියාව තිබේද? ඇයට දීමට තිබෙන දෙය ගෙන, ඊට හුවමාරුවට ඇයට අවශ්‍ය දේ දීමේ හැකියාව යුරෝපයට ලැබෙන තෙක්, යුරෝපය සමග ලාභ දයක ලෙස, එනම්, ඇයට නියම අගයක් ඇති ලෙසට වෙළෙඳාම් කිරීම ඇයට නොහැකි වනු ඇත. අනිත් අතට යුරෝපය ආර්ථික වශයෙන් දෙපයින් සිටගන්නා තෙක් ඇමෙරිකාවට අවශ්‍ය දේ දීමට පුළුවන් කමක් යුරෝපයට නැත්තේය.''

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලෝකයට රුසියානු භාණ්ඩ අවශ්‍යය

''රුසියාවේ සිටින අපට තිරිඟු, ප්ලැක්ස් හණ, ප්ලැටිනම්, පොටැසියැම් හයිඩ්‍රොක්සයිඩ් සහ මුළු ලෝකයාටම ඉතාමත් උග්‍ර ලෙස අවශ්‍යව තිබෙන බොහෝ ඛනිජ ද්‍රව්‍ය ඇත. බොල්ෂෙවික්වාදය ඇති නැති බව නො සලකා, ඒවා ලබා ගැනීමට අප වෙත ඒමට ලෝකයට සිදුවේ. මෙම සත්‍යය ගැන අවබෝධයක් පිබිදී එන බවට සලකුණු දක්නට ඇත. නමුත් ඒ අතර, රුසියාව පමණක් නොව මුළු යුරෝපයම කඩ කඩ වී යයි. ඒ අතරම ශ්‍රේෂ්ඨ මණ්ඩලය තවමත් ආත්ම පටහැනි වදන් බිනීමෙහි යෙදී සිටී. රුසියාව අන්ත විනාශයෙන් මුදගත හැකිය. යුරෝපයද එයින් මුදගත හැකිය. නමුත් එය අප්‍රමාදව සහ කඩිනම්ව කළ යුත්තේය. එසේ වුවද ශ්‍රේෂ්ඨ මණ්ඩලය එතරම් ප්‍රමාදීය, ඉතාමත් ප්‍රමාදීය. ඇත්ත වශයෙන් එයින් කිසිවක් බේරුම් වී නොමැති අතර, තානාපතිවරුන්ගේ මණ්ඩලයක් තිබීම ඊට වඩා යහපතැයි සලකා, එය දැනටමත් විසුරුවා හැර ඇතැයි මම විශ්වාස කරමි. එහි තැන ගැනීම ඉතිරිව ඇත්තේ, නොපවත්නා, මැරී[17] උපන්, ජාතීන්ගේ සංගමයක් පමණකි. ජාතීන්ගේ සංගමයට කොඳු ඇටයක් දීම සඳහා එක්සත් ජනපදය සම්බන්ධ නොවී ජාතීන්ගේ සංගමයකට ජීවය ලැබෙන්නේ කෙසේද?''

යුද්ධමය තත්වය ගැන සෝවියට් ආණ්ඩුව සෑහීමට පත්ව සිටින්නේ දැයි මම විමසුවෙමි.

''බොහෝ දුරට එසේය'' යනුවෙන් ලෙනින් එක් වරම පිළිතුරු දුන්නේය. ''තව දුරටත් අපට විරුද්ධව ආක්‍රමණයක් සිදුවීමේ සලකුණු වශයෙන් දක්නට ඇත්තේ මා පෝලන්තය සම්බන්ධයෙන් සඳහන් කළ දේ පමණකි. පෝලන්තය එවැනි අවදානම් පියවරක් ගැනීමට ඉදිරිපත් වේ නම්, දෙපැත්තෙහිම විඳින දුක් වේදනා තවත් වැඩි වනු ඇත. අනවශ්‍ය ලෙස තවත් ජීවිත බිල්ලට දෙනු ඇත. නමුත්, පෝලන්ත ජාතිකයින්ට ජයග්‍රහණයක් ලබා දීම ෆේපාච්ට වුවද කළ නොහැකි දෙයකි. චර්චිල් පවා ඔවුන්ට එකතු වී සටන් කළත්, අපේ රතු හමුදාව පරාජය කිරීමේ හැකියාවක් ඔවුන්ට නැත.''

මෙහිදී ලෙනින් හිස ඔසවා ප්‍රතාපවත් ලෙස සිනාසුනේය. නැවත ඔහු වඩාත් දැඩි ස්වරයක් පාමින් තවදුරටත් මෙසේ කීවේය.

''මහ බලවත් මිතුරු බලවතුන් අතුරෙන් එක් රටක් තමන්ගේම හමුදා අපට විරුද්ධව එවුව හොත් අප පොඩිපට්ටම් කර දැමිය හැකි බව ඇත්තකි. නමුත් එසේ කිරීමට තරම් ඔවුහු එඩිතර නොවෙති. මිත්‍ර බලවතුන්ගේ අසීමිත සම්පත් හා සමග සසඳන කළ රුසියාව බොහෝ දුර්වලව සිටියත්, බ්‍රිතාන්‍ය, ඇමෙරිකානු සහ ප්‍රංශ හමුදා ඇතුළුව ඔවුන් ඇයට විරුද්ධව එවීමෙහි සමත් වුනු සෑම ආයුධ සන්නද්ධ හමුදාවක්ම සුන් කර දැමීමට පමණක් නොව ''සනීපාරක්ෂක වලල්ලේ'' රටවල් අභිභවා රාජ්‍යතාන්ත්‍රික සහ සදාචාරම ජයග්‍රහණයන්ද අත් කර ගැනීමට රුසියාවට හැකි වී තිබීම අසාමාන්‍ය උභතෝකෝටිකතාවයක් වී තිබේ. පින්ලන්තය අපට විරුද්ධව සටන් කිරීම ප්‍රතික්ෂේප කළේය. අපි එස්තෝනියාව සමග සාමය ඇති කර ගෙන සිටින්නෙමු. සර්බියාව* සහ ලිතුවේනියාව සමග සාමය[18] ඇති කර ගැනීමට ආසන්නව පවතී. මිත්‍ර ගිවිසුම මෙම කුඩා රටවලට දීමට ඉදිරිපත් වූ ද්‍රව්‍යමය පෙළඹීම්ද, ඒවා වෙත එල්ල කරන ලද ද්වේෂ සහගත තර්ජනද, නොසලකා ඒවා අප සමග සමාදාන සම්බන්ධ කම් ඇති කර ගැනීමට වැඩි කැමැත්තක් දැක්වූහ.''

අභ්‍යන්තර තත්වය බලාපොරොත්තු සහගතය

''අප දරන සදාචාරමය බලය මෙයින් ස්ථිර වශයෙන් ප්‍රදර්ශනය වන්නේය. අපගේ සමීපතම අසල්වැසියන් වන බෝල්ටික් රාජ්‍යයන්ගේ නිදහසට සහ යහජීවනයට විරුද්ධ අරමුණු නැත්තේ අපට පමණක් බව එම රාජ්‍යයෝ වටහා ගෙන සිටිති.''

නමුත්, රුසියාවේ අභ්‍යන්තර තත්වය?

''එය උග්‍ර නමුත් බලාපොරොත්තු සහිතය. වසන්තය පැමිණි විට යටත් පිරිසෙයින් නගර දුර්භික්ෂයෙන් මුදා ගත හැකි වන තරමට වත් ආහාර හිඟය මඟ හරවා ගත හැකි වනු ඇත. එවිට ප්‍රමාණවත් තරම් ඉන්ධන ද තිබෙනු ඇත. රතු හමුදාවේ යෝධ ව්‍යායාමයන්ට ස්තුති වන්නට නැවත ගොඩනැගීමේ කාලය ආරම්භ වී තිබේ. දැන් එම හමුදාවේ කොටස් ශ්‍රම හමුදා බවට පරිවර්තනය වී තිබේ. මෙය උසස් පරමාදර්ශයක් සඳහා අරගල කරන රටක පමණක් ඇති විය හැකි අසාමාන්‍ය ප්‍රපංචයකි. ධනපති

*මෙය ප්‍රවෘත්ති පත්‍රයේ ප්‍රමාද දෝෂයකි. සර්බියාව සෝවියට් රුසියාවට විරුද්ධව යුද්ධයට ඉදිරිපත් වූයේ නැත. මෙය ලත්වියාව සම්බන්ධයෙන් කරන සඳහනක් බව පැහැදිලිය — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රටවල නම් එය නොකළ හැකි බවට සැකයක් නැත. අපගේ ආයුධ සන්නද්ධ සතුරන් පිටුදැක ජය ගනු සඳහා අතීතයේදී අපි සියල්ලක්ම කැප කෙළෙමු. දැන් ආර්ථික පුනරුත්ථාපනය සඳහා අපි අපගේ මුළු ශක්තියම යොදන්නෙමු. ඒ සඳහා අවුරුදු ගණනාවක් ගත වනු ඇත. නමුත් අවසානයේදී අපි දිනන්නෙමු.''

''ඔබ සිතන ලෙසට රුසියාවේ කොමියුනිස්ට් ක්‍රමය සම්පූර්ණ වනු ඇත්තේ කවදද?'' මෙය අමාරු ප්‍රශ්නයකැයි මා සිතූ නමුත් ලෙනින් එක් වරම පිළිතුරු දුන්නේය.

''උරාලයේ හා වෙනත් ප්‍රදේශවල විදුලි බල ස්ථාන මාර්ගයෙන් අපගේ මුළු කාර්මික ක්‍රමයම විද්‍යුතනය කිරීම අපගේ අපේක්ෂාවයි. ඒ සඳහා අවුරුදු දහයක් ගත වනු ඇතැයි අපගේ ඉන්ජිනේරුවරු කියති. විද්‍යුතනය කිරීම සම්පූර්ණ කළ විට එය මහජන ආර්ථික ජීවිතය කොමියුනිස්ට් ක්‍රමය අනුව පරිපාලනය කිරීමට යන මාර්ගයේ ප්‍රථම වැදගත් අවධිය වනු ඇත. අපගේ කර්මාන්ත සියල්ලටම අවශ්‍ය ධාවක බලය ප්‍රමාණවත් කරමින් සැපයීමෙහි සමත් එකම මූලාශ්‍රයකින් එය සැපයෙනු ඇත. ඉන්ධන සොයා යන නිෂ්පාදක ව්‍යවසායයන් අතර කෙරෙන නාස්තිකාර තරඟය මෙයින් අහෝසි වන්නේය. එනිසා එම ව්‍යවසායයන්ට ශක්තිමත් ආර්ථික පදනමක් ඇති වන්නේය. එය නොමැතිව, අත්‍යාවශ්‍ය නිෂ්පාදිතයන් සම්පූර්ණයෙන්ම කොමියුනිස්ට් ප්‍රතිපත්ති අනුව හුවමාරු කර ගැනීම සාර්ථක කර ගැනීමේ බලාපොරොත්තුවක් අපට ඇති කර ගත නොහැක.

''අවුරුදු තුනකින් රුසියාවේ තාප දීප්ත විදුලි පහන් 5,00,00,000 ක් දල්වෙනු ඇති බව අමතර වශයෙන් සඳහන් කරමි. මා කල්පනා කරන හැටියට එක්සත් ජනපදයේ එම පහන් 7,00,000,000 ක් ඇත. නමුත්, විදුලි බලය ළදරු වියේ පවතින රටක එම සංඛ්‍යාවෙන් තුනෙන් දෙකොටසකට වැඩි ගණනක් තිබීමෙන් නියෝජනය වන්නේ උසස් ජයග්‍රහණයකි. මා කල්පනා කරන හැටියට අප හමුවේ තිබෙන ශ්‍රේෂ්ඨ කාර්යයන් අතුරෙන් මෙය ඉතාමත් ප්‍රභාමත් කර්තව්‍යය වන්නේ.''

සමාජවාදී නායකයන් ගැන කරන ලද දැඩි විවේචනය

අපගේ සාකච්ඡාවෙන් පසුව ලෙනින්, පළ නොකිරීම සඳහා මුත්, යුරෝපයේ සහ ඇමෙරිකාවේ ඇතැම් සමාජවාදී නායකයන් ගැන තියුණු විවේචන සමහරක් කළේය. ලෝක විප්ලවය සාර්ථක ලෙස ඉදිරියට ගෙන යාමේ හැකියාවක්, නැතහොත්,

අභිලාෂයක් පවා ඔවුන්ට තිබීම ගැන ලෙනින්ට විශ්වාසයක් නොමැති බව එම විවේචනවලින් හෙළිදරව් විය. සමාජවාදයේ මෙම නිල ''අධිපතියන්'' නිසා නොව, ඊට වඩා ඔවුන්ගේ බාධා නොතකා බොල්ෂෙවික්වාදය සාර්ථක වනු ඇතැයි ඔහු අදහස් කරන බව පෙනේ.

පත්‍රයේ අංක 21368 කලාපයේ 1920 පෙබරවාරි 21 දින ඉංග්‍රිසියෙන් පළ කරන ලදී.

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 40. පිටු 150–156

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රු. කො. (බො) ප. නවවැනි සම්මේලනය

1920 මාර්තු 29 — අප්‍රේල් 5

මධ්‍යම කාරක සභාවේ වාර්තාව
මාර්තු 29

සහෝදරවරුනි, පසුගිය සම්මේලනයට ඉදිරිපත කළ වාර්තාව මෙන්ම, මා ඉදිරි පත් කරන මෙම වාර්තාවද දෙකකට බෙදූ ඇති බව, දේශපාලන සහ සංවිධාන යනුවෙන් බෙදූ ඇති බව, ප්‍රථමයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. මෙම බෙදීම නිසා, මධ්‍යම කාරක සභාවේ කටයුතු එහි බාහිර අංශයෙන් හා සංවිධාන අංශයෙන් සංවර්ධනය වී තිබෙන ආකාරය ගැන කල්පනා කිරීමට අයෙක් ප්‍රථමයෙන්ම යොමු වන්නේය. වයි. එම්. ස්වෙර්ද්ලොව් නැති වීමෙන් පසුව පක්ෂය දැන් එක අවුරුද්දක් ගෙවා ඇත. ඔහු නැති වීමෙන් අපට වූ පාඩුව මධ්‍යම කාරක සභාවේ මුළු සංවිධානයම කෙරෙහි බලපෑම නොවැලැක්විය හැකිය. ස්වෙර්ද්ලොව් සහෝදරයා තරම් සාර්ථක ලෙස සංවිධාන හා දේශපාලන කටයුතු එකම පුද්ගලයෙකු තුළ ඒකාබද්ධ කිරීමේ හැකියාව අන් කිසිවෙකුට නොවීය. එනිසා ඔහු කළ වැඩ කටයුතු වෙනුවට මණ්ඩලයක් කරන වැඩ කටයුතු ආදේශ කිරීමේ ප්‍රයත්නයක යෙදීමට අපට සිදුවිය.

සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළදී මධ්‍යම කාරක සභාවේ දෛනික ප්‍රවර්තන කටයුතු ඉටු කරන ලද්දේ මධ්‍යම කාරක සභාවේ පූර්ණ රැස්වීමේදී තෝරා පත් කරන ලද මණ්ඩල දෙකක් විසිනි. ඒවා නම් මධ්‍යම කාරක සභාවේ සංවිධාන කාරක සභාව සහ මධ්‍යම කාරක සභාවේ දේශපාලන කාරක සභාව[19] ය. මෙම මණ්ඩල දෙකෙහිම තීරණවල සම්බන්ධතාවයක් සහ සසංගතතාවයක් ඇති වීම දකිනු පිණිස, ලේකම් ඒ දෙකෙහිම සාමාජිකයෙක් විය. ව්‍යවහාරික වශයෙන් සංවිධාන කාරක සභාවේ ප්‍රධාන හා නිසි කාර්යය වූයේ පක්ෂයේ බලවේගයන් බෙදා හැරීමය. දේශපාලන කාරක සභාවේ කාර්යය වූයේ දේශපාලන ප්‍රශ්න ගැන කටයුතු කිරීමය. මෙම බෙදීම එක්තරා දුරකට කෘතිම බව නොකීවත් පැහැදිලිය. පත්කිරීම් හා මාරුකිරීම් මගින් ප්‍රකාශිත නොවන පරිද්දෙන් ව්‍යවහාරයේදී කිසිම ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ නොහැකි

බව නොරහසකි. ඒ අනුවම, සෑම සංවිධාන ප්‍රශ්නයක්ම දේශපාලනමය වැදගත් කමකින් යුක්තය. එමෙන්ම, ඕනෑම ප්‍රශ්නයක් මොනයම් හේතුවක් නිසා හෝ දේශපාලන ප්‍රශ්නයක් ලෙසට පරීක්ෂා කර බැලීමට පිළිගැනීම සඳහා මධ්‍යම කාරක සභාවේ එක සහෝදරයෙකුගේ ඉල්ලීම ප්‍රමාණවත් සේ සැලකීම ව්‍යවහාරයෙන් තහවුරු වී තිබේ. මධ්‍යම කාරක සභාවේ කාර්යයන් වෙනත් ආකාරයකින් බෙදීමට ප්‍රයත්න දැරීම අවස්ථාවෝචිත නොවන්නට තිබුණි. එවැනි ප්‍රයත්නයකින් අපේක්ෂිත අරමුණ ව්‍යවහාරික වශයෙන් ඉටු නොවන්නටද තිබුණි.

මේ ආකාරයෙන් කටයුතු කරගෙන යාමෙන් ඉතා හොඳ ප්‍රතිඵල ලැබී තිබේ. කිසිම අවස්ථාවක කාරක සභා දෙක අතර දුෂ්කරතාවයන් මතු වී නැත. සමස්තයක් වශයෙන් ගත් කල, මෙම මණ්ඩලවල කටයුතු සාර්ථක වශයෙන් සිදු වී තිබේ. ලේකම් ඒවා තුළ සිටීම නිසා තීරණ ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමද පහසු විය. එපමණක් නොව, ලේකම් කටයුතු කළේ තනිකරම මධ්‍යම කාරක සභාවේ කැමැත්ත අනුවම පමණකි. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ලේකම් ක්‍රියාත්මක කළේ සංවිධායක කාරක සභාව, නැතහොත්, දේශපාලන කාරක සභාව, එසේත් නැතහොත්, මධ්‍යම කාරක සභාවේ පූර්ණ රැස්වීම විසින් පිළිගන්නා ලද, මධ්‍යම කාරක සභාවේ සාමූහික තීරණ පමණක් බව, එම තීරණ පමණක්ම බව, වැරදි අවබෝධයක් ඇති වීම වලක්වනු පිණිස ආරම්භයේ දීම අවධාරණය කළ යුතුය. එසේ නොවී නම් මධ්‍යම කාරක සභාවේ කටයුතු නිසි ලෙස ඉටු වීමට පුළුවන් කමක් නැත.

මධ්‍යම කාරක සභාව තුළ වැඩ කටයුතු පිළියෙළ කර ගැනීම සම්බන්ධයෙන් වූ මෙම කෙටි අදහස් පළ කිරීමෙන් අනතුරුව, මට පැවරී ඇති කාර්යය වන, මධ්‍යම කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීමට යොමු වන්නෙමි. මධ්‍යම කාරක සභාවේ දේශපාලන කටයුතු ගැන වාර්තා කිරීම යන්න පදගතාර්ථයෙන් වටහා ගතහොත්, එය ඉතා දුෂ්කර කටයුත්තකි. මෙම වර්ෂයේ දී දේශපාලන කාරක සභාවේ කටයුතුවලින් ඉතා වැඩි කොටසක් සමන්විත වූයේ, මතුවී තිබෙන ප්‍රතිපත්තිමය ප්‍රශ්න ගැන, සෝවියට් සහ පක්ෂ ආයතන සියල්ලෙහි හා, මුළු මහත් සෝවියට් සමූහාණ්ඩුවේම වැඩ කටයුතු ඒකාබද්ධ කිරීම සහ මෙහෙයවීම සඳහා ක්‍රියා කරන කම්කරු පංතියේ සංවිධාන සියල්ලෙහි කටයුතු ඒකාබද්ධ කිරීමත්, පිළිබඳ ප්‍රශ්න ගැන ප්‍රවර්තන තීරණ ගැනීමෙනි. දේශපාලන කාරක සභාව විදේශ හා දේශීය ප්‍රතිපත්තිය පිළිබඳ සියලු ප්‍රශ්න ගැන තීරණ අනුමත කළේය. මෙම තීරණ දළ වශයෙන් වුවද එකින් එක ගෙනහැර දැක්වීම නොකළ හැක්කකි. එය ස්වාභාවිකය. මෙම සම්මේලනය සඳහා මධ්‍යම කාරක සභාව විසින් පිළියෙළ කර තිබෙන මුද්‍රිත

https://liberationbase.wordpress.com

විස්තරවලින් ඒ පිළිබඳ සාමාන්‍ය සම්පිණ්ඩනයකට අවශ්‍ය තොරතුරු[20] ඔබට ලබා ගත හැක. මෙම සම්පිණ්ඩනය යළිත් මගේ වාර්තාවෙන් ඉදිරිපත් කිරීම මගේ හැකියාව ඉක්මවන්නකි. මට එය කළ හැකි වුවත්, එය නියෝජිත වරුන්ට අවශ්‍ය නොවන්නටද පිළිවන. පක්ෂ, නැතහොත්, සෝවියට් සංවිධානයේ වැඩ කරන අප හැම දෙනාම, විදේශීය සහ දේශීය යන දෙ ආකාරයේම දේශපාලන ප්‍රශ්න එකින් එක පැන නගින අසාමාන්‍ය ආකාරය ගැන දිනපතාම පරීක්ෂාකාරීව සිටින්නෙමු. එක් එක් සිද්ධි ඇති වන සෑම අවස්ථාවකදීම මෙම ප්‍රශ්න ගැන තීරණය කර තිබෙන ආකාරය සෝවියට් ආණ්ඩුවේ ආඥාවලින් සහ පක්ෂ සංවිධානයේ වැඩ කටයුතුවලින් ප්‍රකාශිත වන අතර, එයම පක්ෂයේ මධ්‍යම කාරක සභාව පිළිබඳ ඇගැයීමක් වන්නේය. ප්‍රශ්න සංඛ්‍යාව කොතරම් විශාල වීද යත්, බොහෝ විට ඉතාමත් ඉක්මන් කාරී තත්වයන්, යටතේ ඒවා ගැන තීරණය කළ යුතු විය. එනිසා කුමණ ආකාරයකින් හෝ මෙම වැඩ කිරීමට පුළුවන් වූයේ, අදාළ මණ්ඩලයේ සාමාජිකයන් ඔවුනොවුන් ගැන මනාව අවබෝධ කරගෙන සිටි නිසා, සෑම අදහස් මාත්‍රයක්ම ගැන දන සිටි නිසා සහ අන්‍යොන්‍ය විශ්වාසය ඇතිව සිටි නිසාය. නොඑසේ වී නම්, එය මෙන් තුන් ගුණයක් විශාල මණ්ඩලයකට පවා එම කටයුතු සියල්ල කිරීමට නුපුළුවන් වන්නට තිබිණි. සංකීර්ණ ප්‍රශ්න තීරණය කිරීමේදී රැස්වීම් වෙනුවට දුරකථන සාකච්ඡා ආදේශ කිරීමට සිදුවූ අවස්ථා බොහෝ විය. මෙය කරන ලද්දේ සංකීර්ණ බව පැහැදිලිව පෙනෙන හා විවාදයට භාජනය වූ ප්‍රශ්න නොසලකා නොහරිනු ඇතැයි යන සම්පූර්ණ විශ්වාසය ඇතිවය. දැන් සාමාන්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස මට නියම කර තිබෙන නිසා, මා අදහස් කරන්නේ විෂයයන් ගැන කාල පිළිවෙළ අනුව සමාලෝචනයක් කිරීමට හා ඒවා කොටස් කර දක්වීමට නොවේ. ප්‍රධාන හා ඉතාමත් වැදගත් කරුණු ගැන විස්තර කිරීමට, එපමණක් නොව, අපට දැන් මුහුණ පාන්නට සිදුවී තිබෙන කර්තව්‍යයන් පසුගිය කාලයේ අත් දැකීම් සමග, වඩාත් නිවැරදි ලෙස කිවහොත් ගතවූ වර්ෂයේ අත් දැකීම් සමග, සම්බන්ධ කරන ආකාරයෙන් ඒවා ගැන විස්තර කිරීමට මම බලාපොරොත්තු වෙමි.

සෝවියට් ආණ්ඩුවේ ඉතිහාසය ලිවීමට කාලය පැමිණ නැත. එයට කාලය සුදුසු වුවත්, ඉතිහාසඥයන් වීමේ අපේක්ෂාවක් අප තුළ නොමැති බව මා වෙනුවෙන් — මා හිතන හැටියට මධ්‍යම කාරක සභාව වෙනුවෙන්ද — කියනු කැමැත්තෙමි. අපගේ උනන්දුව යොමු වී තිබෙන්නේ වර්තමානය හා අනාගතය වෙතය. සමාලෝචනයට භාජනය වන පසුගිය අවුරුද්ද ගැන අප සලකන්නේ තොරතුරු සපයන්නක්, පාඩමක්, නැතහොත්, පියගැටක් වශයෙනි. එතැන සිට අපි ඉදිරියට

යා යුත්තෙමු. මෙම දෘෂ්ටි කෝනයෙන් බලන කල මධ්‍යම කාරක සභාවේ කටයුතු විශාල කොටස් දෙකකට වෙන් කළ හැකිය. ඒ මෙසේය: යුද්ධ ප්‍රශ්න හා සමූහාණ්ඩුවේ ජාත්‍යන්තර තත්වය නිශ්චය කරන ප්‍රශ්න සම්බන්ධව කරන කටයුතු සහ අභ්‍යන්තර සාම කාලීන සංවර්ධනය පිළිබඳ කටයුතු යනුවෙනි. මෙයින් අභ්‍යන්තර සංවර්ධනය පිළිබඳ කටයුතු ප්‍රමුඛ ස්ථානයට පැමිණීම ආරම්භ වූයේ සමහර විට පසුගිය වර්ෂය අවසානයේදීය. නැතහොත්, මෙම වර්ෂය ආරම්භයේ දීය. එම කටයුතු මුල් තැනට පැමිණීමට පටන් ගත්තේ, සිවිල් යුද්ධයේ තීරණාත්මක පෙරමුණුවලදී අපි තීරණාත්මක ලෙස ජයග්‍රහණය ලබා ඇති බව හොඳින් පැහැදිලි වූ පසු ය. පසුගිය වසන්තයේ දී අපගේ යුද්ධ තත්වය ඉතාමත් දුෂ්කර එකක් විය. ඔබට මතක ඇති පරිදි ඉන් පසුවත් අපට පරාජය ගණනාවක්ම විඳගැනීමටත්, ප්‍රතිවිප්ලවයෙන් හා මිත්‍ර (Entente) ගිවිසුමෙන් එල්ල වූ අළුත් අති විශාල හා අනපේක්ෂිත ප්‍රහාරයන්ට මුහුණ දෙන්නටත් සිදු විය. අපි ඒ කිසිවක් බලාපොරොත්තු නොවූයෙමු. එනිසා, මෙම කාල පරිච්ඡේදයෙන් වැඩි කොටස යුද්ධ ප්‍රශ්නයට, සිවිල් යුද්ධයේ ප්‍රශ්නයට කැප වීම ස්වාභාවිකය. දුර්වල සිත් ඇතියවුන්ට එම ප්‍රශ්නය නොවිසඳිය හැකිසේ පෙනින. මෙන්ෂෙවික්වරුන් ගේ සහ සමාජවාදී-විප්ලවවාදීන්ගේ පක්ෂත්, අන්‍ය සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ පක්ෂත්, මධ්‍යස්ථ කොටස් සියල්ලත් එම ගණයට අයත් විය. මේ නිසා, ප්‍රශ්නය විසඳීමට පුළුවන් කමක් නැතැයිද, රුසියාව නොදියුණුව හා දුර්වලව පවතින නිසා එයට මුළු ලෝකයේම ධනපති ක්‍රමය පරාජය කළ නොහැකියයි ද, ඉතා පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීමට බටහිර රටවල විප්ලවය ප්‍රමාද වන බව දුටු ඔවුහු පෙළඹුනහ. එනිසා අපගේ ස්ථාවරය රකිමින්, අප ජයගන්නා බව තරයේ සහ විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කිරීමට අපට සිදුවිය. "සියල්ලම ජයග්‍රහණය සඳහා" සහ "සියල්ලම යුද්ධය සඳහා" යන සටන් පාඨය ක්‍රියාත්මක කිරීමට අපට සිදුවිය.

යුද්ධය සඳහා සියලුම බලවේග සංකේන්ද්‍රණය කළ යුතු යයිද, මිත්‍ර (Entente) ගිවිසුම අප මත පැටවූ යුද්ධයෙන් අප ජය ගතයුතු යයිද යන අවබෝධයෙන් මෙම සටන් පාඨ ක්‍රියාත්මක කරනු සඳහා, ඉතාමත් අවශ්‍ය උවමනාවන් සමහරක් සිතාමතාම හා විවෘත ලෙස ඉටු නොකර හැරීමටත්, බොහෝ දෙනාට අවශ්‍ය ආධාර දීමෙන් නැවත නැවතත් වැලකී සිටීමටත් අපට සිදුවිය. සිදු වූ ප්‍රාතිහාර්යය සැබැවක් වූයේ පක්ෂයේ සුපරීක්ෂාකාරීත්වය හා දැඩි විනය නිසාය. පක්ෂයේ අධිකාරය විසින් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා ආයතන සියල්ලම එක්සත් කරන ලද නිසාය. මධ්‍යම කාරක සභාව නිකුත් කළ සටන් පාඨ, දුසිම් ගණන්, සිය ගණන්, දහස් ගණන් හා අවසානයේදී දශලක්ෂ ගණන් ජනයා විසින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එකාවන්ව පිළිගන්නා ලද නිසාය. පුදුමාකාර පරිත්‍යාගයන් කරන ලද නිසාය. ඒ ප්‍රාතිහාර්යය ඇති වූයේ මේ කරුණු සියල්ල නිසා පමණකි. මිත්‍ර (Entente) ගිවිසුමේ සහ මුළු ලෝකයේම අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රහාරයන් දෙවැනි වරටත්, හා හතරවැනි වරටත් අප වෙත නැවත නැවතත් එල්ල කෙරුණ නමුත්, අපට ජය අත්පත් කර ගත හැකි වූයේ මේ සියල්ල නිසාම පමණකි. අපි නම් මෙම කරුණ අවධාරණය කිරීමෙන් නොනවතින්නෙමු. විනය හා මධ්‍යගත භාවය නොමැතිව, අපට කිසි කලෙකත් මෙම කර්තව්‍යය ඉටු කිරීමට පුළුවන් කමක් නොතිබුණැයි යන පාඩමද මෙයින් අපට ලැබෙන බවද අපි සිත්හි දරා ගත යුත්තෙමු. රට ප්‍රතිවිප්ලවයෙන් මුදා ගැනීම සඳහා සහ දෙනීකින්, යූදෙනිච් හා කොල්චාක් පරදවා රුසියානු විප්ලවය ජයගනු සහතික කිරීම සඳහා අප කළ මවිත කර තරම් පරිත්‍යාගයන් ලෝක සමාජ විප්ලවයේ ජයග්‍රහණය පිළිබඳ සහතිකයක් වේ. මෙය සාර්ථක කරගනු සඳහා අපට පක්ෂ විනයත්, තදබල මධ්‍යගත භාවයත් තිබීම අවශ්‍ය විය. එසේම, මෙම කර්තව්‍යයන් සියල්ලම ඉටු කිරීම සඳහා දස දහස් ගණන් හා ලක්ෂ ගණන් ජනතාවන්ගේ පරිත්‍යාගවලින් ආධාර ලැබෙනු ඇති බවටත්, එය ඇත්ත වශයෙන්ම කළ හැක්කක් බවටත්, එය ඉටු කළ හැකි බවටත්, ඒකාන්ත විශ්වාසයක් තිබිය යුතු විය. මෙය උදෙසා, අපගේ පක්ෂය සහ ආඥාදායකත්වය ක්‍රියාත්මක කරන පංතිය වන කම්කරු පංතිය, රුසියාවේ සහ සමස්ත ලෝකයේම කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනයා එක්සත් කරන මූලිකාංගයන් ලෙසට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය විය.

මෙම ඓතිහාසික ප්‍රාතිහාර්යයට හේතු වූයේ කුමක් දැයි, දුබල, විඩාපත් සහ නොදියුණු රටක් ලෝකයේ ඉතාමත් බලවත් රටවල් පරාජය කිරීමට සමත් වූයේ කෙසේ දැයි, අපි මඳක් කල්පනා කර බලන්නෙමු නම්, එයට උපස්තම්භක වූයේ මධ්‍යගතකරණය, විනය හා අනුපමේය ආත්ම පරිත්‍යාගය බව අපට පෙනෙනු ඇත. ඒ කුමණ පදනමක් මතද? කිසි සේත් උගත් යයි කිව නොහැකි වූ රටක දශ ලක්ෂ ගණන් වැඩ කරන ජනයාට මෙම සංවිධානය, විනය හා මධ්‍යගත කරණය ඇති කර ගත හැකි වූයේ කම්කරුවන් ධනපති ක්‍රමයේ පාසලට ගොස් සිටි හා ධනපති ක්‍රමය විසින් එක්සත් කරනු ලැබ සිටි හෙයිනි. සියලුම දියුණු රටවල නිර්ධන පංතිය එක්සත් වී සිටින හෙයිනි. රට වඩාත් දියුණු වූ තරමට ඔවුන් වඩාත් එක්සත්ව සිටින හෙයිනි. එමෙන්ම, අනිත් අතට දේපල, ධනපති දේපල, වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය යටතේ සුළු දේපල, අසමගි වන හෙයිනි. දේපල අසමගි වන අතර, අපි ලෝකය මුළුල්ලේම කෝටි ගණන් වැඩ කරන ජනතාව එක්සත් කරන්නෙමු. ඔවුන් වැඩි වැඩියෙන් එක්සත් කරන්නෙමු. දැන්, අන්ධයන්ට පවා,

නැතහොත්, යටත්පිරිසෙයින් මෙම කරුණ දැකීම ප්‍රතික්ෂේප කරන අයට පවා එය පැහැදිලි වී ඇත. කාලය ගෙවී යත්ම අපගේ සතුරෝ වඩ වඩාත් අසමගි වී ගියහ. ඔවුහු, කුසගින්නේ පෙළෙන කම්කරුවන් අමාරුවේ හෙළමින් අතිරික්ත ධාන්‍ය අධිකතර වැඩි මිළට විකිණීමෙන් තමන් පොහොසත් වන සුළු දේපල හිමියන් වුවත්, නැතහොත්, විවිධ රටවල ධනපතියන් වුවත්, ඔවුන්ට යුද්ධ ශක්තිය තිබුණත්, එමෙන්ම, ජාතීන්ගේ සංගමයක්, ලෝකයේ ප්‍රමුඛතම ජාතීන්ගේ "මහා සංගමයක්" ඇති කරමින් සිටියත්, ඔවුහු ධනපති දේපල නිසා, වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය යටතේ වන සුළු දේපල නිසා භේදවී සිටියහ. ඔවුන් ඇති කරන මෙම වර්ගයේ සමගිය හුදු මිථ්‍යාවක් පමණකි. එය එකම වංචාවකි. ඉඳුරාම බොරුවකි. අප දුටු ලෙසට රටවල් ආණ්ඩු කිරීම සඳහා, ලෝකය බෙදු ගැනීම සඳහා අධිකාර බලතල බෙදදීමට ප්‍රයත්න දැරූ මෙම අපකීර්තිමත් ජාතීන්ගේ සංගමය — එය කදිම නිදර්ශනයක් විය — එක් වරම පුපුරා ගිය සබන් පෙන බුබුලක් හා සමාන විය. එය ධනපති දේපල මත පදනම් කරන ලද සන්ධානයක් විය. අති විශාල ඓතිහාසික ක්ෂේත්‍රයක මෙය සිදුවනු අපි දැක ඇත්තෙමු. අපගේ ව්‍යාපාරය සාධාරණ බවත්, ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණය ඒකාන්ත බවත්, දුෂ්කරතා සහ බාධක කොතරම් තිබුණත් අප ආරම්භ කරමින් සිටි ව්‍යාපාරයට සියලුම රටවල කෝටි ගණන් වැඩ කරන ජනයා එක් රොක් වනු ඇති බවත්, අප කී ඒ මූලික සත්‍යය මෙයින් සනාථ වන්නේය. අපට මිතුරන් සිටින බව අපි දැන සිටියෙමු. ඉතිහාසය විසින් මෙම ගෞරවනීය හා ඉතාමත් දුෂ්කර කර්තව්‍යය පවරන ලද රට, ආත්ම පරිත්‍යාගයේ ජීවගුණය ගෙන හැර පෑ පමණින්, මෙම පුදුමාකාර පරිත්‍යාගයන්ට සරිලන ප්‍රතිදාන සියගුණයෙන් ලැබෙන බව අපි දැන සිටියෙමු. අප අපගේ රටේ ජයග්‍රහණය රැකගන්නා සෑම මාසයක් පාසාම ලෝකයේ සියලුම රටවලින් අපට කෝටි ගණන් මිතුරන් දිනාගත හැකි වනු ඇත.

අපට ජය ගත හැකි වීමට හේතුව, අපගේ ජයග්‍රහණය නොවැලැක්විය හැකි වීමට හේතුව, ගැන අපි සැබැවින්ම මඳක් සිතා බලන්නෙමු නම්, එසේ වූයේ — ලෝකයේ ඉතාමත් බලවත් ආණ්ඩුවලට හා ධනපතියන්ට විවිධාකාර බැමි මගින් විධිමත් ලෙස බැඳී සිටි — අපගේ සතුරන් නාමික වශයෙන් එක්සත් වී සිටියත්, ඔවුන් ඇත්ත වශයෙන්ම අසමගිව සිටි නිසා පමණක් බව අපට දැක්ක හැකිය. ඔවුන්ගේ අභ්‍යන්තර බැම්ම ඇත්ත වශයෙන්ම ඔවුන් අසමගි කළේය. එය ඔවුන් එකිනෙකාට විරුද්ධව ඔට්ටු කළේය. ධනපති දේපල විසින් ඔවුන් අසමගි කරන ලදී. එය විසින් ඔවුන් මිතුරන්ගේ තත්වයේ සිට රෞද්‍ර වනසතුන්ගේ තත්වයට පරිවර්තනය කරන ලදී. එනිසා, අර්හාංගල්ස්ක් හි ගොඩබස්වන ලද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බ්‍රිතාන්‍ය සොල්දදුවන් අතරද, සෙවස්තෝපල්හි ප්‍රංශ සොල්දදුවන් අතරද, සියලුම රටවල, සමාජ-සම්මුතිවාදීන් ප්‍රාග්ධනයේ පැත්ත ගත් සියලුම දියුණු රටවල කම්කරුවන් අතරද, රුසියාව, ඇගේ අනුගාමිකයන් සංඛ්‍යාව වැඩි කර ගනිමින් සිටි බව අපගේ සතුරෝ නොදුටහ. අවසාන වශයෙන් විග්‍රහ කර බලන විට අපගේ ජයග්‍රහණය ඒකාන්ත දෙයක් වූයේ මෙම මූලික, මෙම පදනම් හේතුව නිසාය. තවමත් අපගේ ශක්තියෙහි ප්‍රධාන අනභිභවනීය සහ නොසිඳෙන ප්‍රභව මූලය වන්නේද එයමය. තවද, අප රටේ නිර්ධන පංති ආඥාදායකත්වය අංග සම්පූර්ණ ලෙස ඇති කළ විට හා නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණිය මගින්, එහි දියුණු කොටස මගින්, එහි බලවේගයන් උපරිම ලෙස සමගි කරගත් විට අපට ලෝක විප්ලවය අපේක්ෂා කළ හැකි යයි කීමට ඉඩ ලැබෙන්නේය. මෙය ඇත්ත වශයෙන්ම ආත්ම ශක්තිය ප්‍රකාශ කිරීමක්ද, සටන් කිරීම සඳහා නිර්ධන පංතියේ අධිෂ්ඨානය ප්‍රකාශ කිරීමක්ද, සියලුම රටවල සිටින කෝටි ගණන් කම්කරුවන් අතර සන්ධානයක් ඇති කර ගැනීම සඳහා වූ නිර්ධන පංති අධිෂ්ඨානය ප්‍රකාශ කිරීමක්ද, වන්නේය.

ධනපතියන් සහ ව්‍යාජ සමාජවාදී මහත්වරු මෙය ප්‍රචාරයට කියන කථාවක් ලෙසට විස්තර කර තිබේ. නමුත් එය එසේ නොවේ. එය වූකලී, රුසියාවේ සිවිල් යුද්ධයේ ලේ තැවරුණු සහ වේදනා සහිත අත් දැකීමෙන් ඔප්පු වුනු ඓතිහාසික යථාර්ථය යි. මෙම සිවිල් යුද්ධය ලෝක ප්‍රාග්ධනයට විරුද්ධව කරන ලද්දක් හෙයින් අපි එසේ කියමු. ලෝක ප්‍රාග්ධනය කල කෝලාහල වෙමින් තමන්ම දුර්වල කරගත්තේය. තමන්ම කාගත්තේය. නමුත්, සාගතයෙන් සහ තයිපස් උණෙන් පෙළෙමින් නිර්ධන පංතිය නැසී යමින් සිටි රටක වූ අපි, අන් කවර දකටවත් වඩා දැඩි වී හා ශක්තිමත් වී ඉස්මතු වූයෙමු. මෙම රටේ අපි එන්න එන්නම වැඩි සංඛ්‍යාවක් වැඩ කරන ජනයාගේ සහයෝගය දිනා ගත්තෙමු. සම්මුති ගත වන්නන් විසින් ඉහතදී ප්‍රචාරක කථාවක් සේ සලකන ලද සහ ධනපතියන් විසින් පුරුද්දක් ලෙස අවඥවට ලක් කරන ලද දෙය, විප්ලවයේ මෙම අවුරුදුවලදී, විශේෂයෙන්ම සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂයේදී, ඒකාන්ත හා අවිවාදී ඓතිහාසික සත්‍යයක් බවට පරිවර්තනය වී තිබේ. එනිසා අපට ලෝක ව්‍යාප්ත පදනමක් තිබෙන බවත්, ඉහත කිසිම විප්ලවයක නො තිබුණු තරම් එම පදනම ඉතාමත් පුළුල් බවත්, අප මෙය සාර්ථක කර තිබීමෙන් ඔප්පු වෙතැයි කීමේ හැකියාව අපට ලැබෙන්නේය. අපට ජාත්‍යන්තර සන්ධානයක් ඇත. එය කොතැනකවත් ලියා පදිංචි කර නැත. එය විධිමත් ලෙස කිසි කලෙකත් ආකෘති ගත කර නැත. ''ව්‍යවස්ථා පිළිබඳ නීතිය'' අනුව එහි ඇති අර්ථයක් නැත. නමුත්, කැඩී බිඳී යන ධනපති ලෝකයේ ඇත්ත වශයෙන්ම එහි

තුළ සෑම අර්ථයක්ම ඇත. අප අළුත් තත්වයන් දිනා ගත්, නැතහොත්, කිව නොහැකි තරම් බලවත් සතුරෙකුට විරුද්ධව සටන් කරමින් අපගේ තත්වය රැක ගැනීම පමණක් පවා කළ සෑම මාසයක්ම පාසා, අප නිවැරදි බව මුළු ලෝකයාටම ඔප්පු වීමෙන් දශලක්ෂ ගණන් නව ආධාර කරුවන් දිනාගැනීමට අපට හැකි විය.

මෙය දුෂ්කර ක්‍රියා මාලාවක් විය. එය සමගම ඉතා විශාල පරාජය වීම්ද ඇති විය. මෙම අවුරුද්දෙහිදීම පින්ලන්තයේ සුදු භීෂණයත්[21], ඉන් අනතුරුව, හංගේරියාවේ විප්ලවය පරාජය වීමත්[22] සිදුවිය. ස්වකීය පාර්ලිමේන්තු රැවටූ සහ රුමේනියාව සමග රහස් ගිවිසුම් ඇති කර ගත් මිත්‍ර (Entente) ගිවිසුමේ රටවල ආණ්ඩු, එම විප්ලවය යටපත් කර දැමූහ.

එය, එනම්, හංගේරියානු විප්ලවය සුදු භීෂණය මගින් සුන් කර දැමීමට ජාත්‍යන්තර මිත්‍ර (Entente) ගිවිසුම කළ කුමන්ත්‍රණය, ඉතාමත් දුෂ්ඨ ප්‍රයෝගයක් විය. එපමණක්ද නොවේ. ඔවුහු ජර්මන් විප්ලවයේ බෙල්ල අඹරවා දැමීම සඳහා ජර්මන් සම්මුති ගත වන්නන් සමග ඕනෑම එකඟත්වයකට එළඹීමට සූදානම් වූහ. එමෙන්ම ලීබ්ක්නෙහ්ට් අවංක ජර්මන් පුරුෂයෙක් බව ඉහතදී ප්‍රකාශ කර තිබුණු මොවුන්, ජර්මන් අධිරාජ්‍යවාදීන් සමග එක්ව, ඒ අවංක ජර්මන් පුරුෂයා මතට කඩා පැන්නේ පිස්සු බල්ලන් මෙනි. ඔවුහු සිතන්නට හැකි සෑම සීමාවක්ම ඉක්මවූහ. නමුත් ඔවුන් ගත් එවැනි සෑම මර්දන කාරී පියවරක්ම නිසා සිදු වූයේ අප ශක්තිමත් වීම හා තහවුරු වීම පමණකි. ඒ අතර ඔවුන් දුර්වල විය.

මෙහිදී, අන්සියල්ලටම පෙර මෙම අත් දැකීමෙන් අප පාඩමක් ගත යුතු බව මගේ අදහස වන්නේය. අපට ජය ගත හැකි වූයේත්, සිවිල් යුද්ධයේදී කරන ලද පරිත්‍යාගයන් වෙනුවෙන් සිය ගුණයෙන් ප්‍රතිදන ලද්දේත්, මන්ද යන්නද, තවත් යුද්ධයක දී, ලේ නොවැගිරෙන පෙරමුණක කරන යුද්ධයකදී, ආකෘතියෙන් පමණක් වෙනස් වූ, එහෙත්, පැරණි ධනපති ලෝකයේ ඒ නියෝජිතයන්ම, ඒ බැලයන්ම, ඒ නායකයන්ම විසින් අපට විරුද්ධව වඩාත් වේගවත් ලෙස, වඩාත් වියරු ලෙස හා වඩාත් උත්සුක්ත ලෙස, ඊට වඩා අමුත්තක් නොමැතිව, කරනු ලබන යුද්ධයකදී ජය ගැනීම සඳහා මෙම අත් දැකීම් පදනම් කර ගෙන අප කටයුතු කළ යුත්තේ කෙසේද යන්නද, ගැන කරන විස්තරයක් මත, නැතහොත්, විග්‍රහයක් මත අපගේ උද්ඝෝෂණය හා ප්‍රචාරය පිහිටුවීම අවශ්‍ය බව, මෙහිදී විශේෂයෙන් වැදගත් කරුණක් සේ සඳහන් කළ යුත්තෙමු. විප්ලවයක ශක්තිය, එහි ප්‍රහාරයේ බලවත් කම, එහි ධෛර්යය හා අධිෂ්ඨානය නිසා, එහි, සාර්ථකත්වය හා විජයග්‍රහණනය නිසා,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපතියන්ගේ ප්‍රතිරෝධය උත්සන්න වන්නේය යන නීතිය අන් කිසිම විප්ලවයකට වඩා හොඳින් අපගේ විප්ලවයෙන් ඔප්පු විය. අප වැඩි වැඩියෙන් ජයග්‍රාහී වන තරමට ධනපති සූරාකන්නෝ එක්සත් වීමට උගෙන ගනිති. ඔවුන්ගේ ප්‍රහාරය වඩාත් බලවත් කරති. ඔක්තෝබර් විප්ලවය ආරම්භයේදී බොල්ෂෙවික්වාදය විකෘතියක් සේ සලකන ලද බව ඔබට පැහැදිලිවම මතක ඇත. කාලාතික්‍රමණය අනුව බලන කළ එය සිදු වූයේ බොහෝ කලකට පෙර නොවුවත්, සිදුවීම්වල ගමනය අනුව බලන කල නම් ඒ බොහෝ කලකට පෙරය. බොල්ෂෙවික්වාදය ගැන වූ එම අදහස නිර්ධන පංති විප්ලවයේ හීන සංවර්ධනයේ සහ දුබල කමේ පිළිබිඹුවක් විය. වැඩි කලක් යන්නට පෙර රුසියාවේ මෙම අදහස අත් හැරීමට සිදුවිය. දැන් යුරෝපයේද එය අත්හැර දමා තිබේ. බොල්ෂෙවික්වාදය ලෝක ව්‍යාප්ත ප්‍රපංචයක් බවට පත්ව තිබේ. කම්කරු විප්ලවය එහි හිස ඔසවා ඇත. අපගේම අත්දැකීම් ජනිත කරමින් ඔක්තෝබරයේදී සෝවියට් ක්‍රමය නිර්මාණය කිරීමේදී, අපි 1905 සම්ප්‍රදායයන් අනුගමනය කෙළෙමු. මෙම සෝවියට් ක්‍රමය ලෝක ඓතිහාසික වැදගත් කමක් ඇති ප්‍රපංචයක් බවට පත් වී තිබේ.

ලෝකය මුළුල්ලේම දැන් කඳවුරු දෙකක් ඉතා පැහැදිලි ලෙස එකිනෙකට මුහුණ ලා සිටියි. කිසිම අතිශයෝක්තියකින් තොරව දැන් මේ බව කිව හැකිය. එම කඳවුරු දෙක තීරණාත්මක සහ අවසාන අරගලයට පැටලුනේ මේ වර්ෂයේදී බව සටහන් කර ගත යුතුය. දැන්, මෙම සම්මේලනය පැවැත්වෙන අවස්ථාවේදී අප පසු කරමින් සිටින්නේ, යුද්ධයේ සිට සාමයට පරිවර්තනය වීමේ, සමහරවිට ශ්‍රේෂ්ඨතම යයි කිව හැකි, ඉතාමත් තියුණු, එහෙත්, තවමත් සම්පූර්ණ වී නැති කාල පරිච්ඡේදයන් අතුරෙන් එකක් තුළිනි.

"අපි ඒ අයුතු ලෙස බලය අල්ලාගත්තවුන්ට විරුද්ධව, ඒ පල්හොරුන්ට, බලය උදුරාගත්තවුන්ට, ඒ ප්‍රජාතන්ත්‍රවාදයේ සතුරන්ට, ඒ බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව සටන කිසි කලෙකත් නොනවත්වන්නෙමු" යයි මුළු ලොවටම හඬගා කී මිත්‍ර ගිවිසුමේ අධිරාජ්‍යවාදී බලවතුන්ගේ නායකයන්ට සිදු වූයේ කුමක්දැයි ඔබ දන්නෙහිය. ප්‍රථමයෙන්ම ඔවුන් පැනවූ සම්බාධනය ඉවත් කළ බවත්, කුඩා ජාතීන් එක්සත් කිරීමට ඔවුන් දැරූ ප්‍රයත්නය අසාර්ථක වූ බවත් ඔබ දන්නෙහිය. එසේ වූයේ සියලුම රටවල කම්කරුවන් පමණක් නොව, කුඩා රටවල ධනපතියන්ද දිනා ගැනීමෙහි අප සමත් වූ හෙයිනි. අධිරාජ්‍යවාදීන් තමන්ගේ රටවල කම්කරුවන් පමණක් නොව, කුඩා රටවල ධනපතියන්ද පීඩනයට පත් කරන නිසා අපට එය කළ හැකි විය. දියුණු රටවල වැනෙන සුලු ධනපතියන් ද අප විසින් දිනා ගන්නා ලද බව ඔබ දන්නෙහිය. දැන්

තිබෙන තත්වය මෙයයි. මිත්‍ර ගිවිසුම එහි පැරණි පොරොන්දු සහ සහතික පැහැර හරිමින් සිටී. එය, එහි ගිවිසුම් උල්ලංඝනය කරමින් සිටී. ඒවා විවිධ රුසියානු සුදු හමුදා සමග වාර දුසිම් ගණනකදී අත්සන් කරන ලද ගිවිසුම් බව මෙහිලා සඳහන් කරමු. දැන්, මෙම ගිවිසුම් අනුව බලන කල පාඩු සිදු වී ඇත්තේ මිත්‍ර ගිවිසුමටය. එම ගිවිසුම් වෙනුවෙන් එය දශ කෝටි ගණන් මුදල් වැය කළත් කාර්යය සම්පූර්ණ කිරීමෙහි අපොහොසත් විය.

පනවා තිබූ බාධක ඉවත් කළ එය, සෝවියට් සමූහාණ්ඩුව සමග සාකච්ඡා කරන තත්වයකට පත්ව ඇත. නමුත් එය මෙම සාකච්ඡා සම්පූර්ණ කරන්නේ නැත. එනිසා එම ගිවිසුමේ ශක්තිය ගැන කුඩා රාජ්‍යයන් තුළ තිබුණු විශ්වාසය බිඳී ගොස් තිබේ. මේ අනුව බලන කල මිත්‍ර ගිවිසුමේ තත්වය, විදේශ කටයුතුවලදී එය ගන්නා තත්වය සුපුරුදු නීතිමය සංකල්පයන් අනුව විස්තර කළ නොහැකි බව පෙනේ. මිත්‍ර ගිවිසුමේ රාජ්‍යයන් බොල්ෂෙවික්වරුන් සමග සාමය පවත්වන්නේ හෝ යුද්ධ කරන්නේ හෝ නැත. ඔවුන් අප පිළිගෙන ඇත. එමෙන්ම, ඔවුන් අප පිළිගෙන නැත. තමන් කිසියම් දෙයක් නියෝජනය කරතැයි යන විශ්වාසය ඇතිව සිටි, අපගේ ප්‍රතිපාක්ෂිකයන්ගේ මෙම අන්ත ව්‍යාකූලත්වය නිසා ඔප්පු වන්නේ, ඔවුන් තම තමන් අතර ඇන කොටා ගන්නා සහ අපට කිසිම හානියක් කිරීමට සම්පූර්ණයෙන්ම අසමත් ධනපති මෘගයන් රංචුවක් වන බවය.

අද පවතින තත්වය මෙයයි. ලත්වියාව නිල වශයෙන් අප වෙත සාම යෝජනා ඉදිරිපත් කර ඇත. පින්ලන්තය අප වෙත විදුලි පුවතක් එවා ඇති අතර, එහි නිල වශයෙන් මායිම් රේඛාවක් ගැන සඳහන් වෙතත්, එයින් ඇත්ත වශයෙන් අදහස් වන්නේ සාමයේ ප්‍රතිපත්තිය[23] වෙතට නැඹුරු වීමකි. අවසාන වශයෙන් පෝලන්තය — පෝලන්තයේ නියෝජිතයෝ එතරම් ජවසම්පන්න ලෙස කඩු වනමින් සිටියහ. තවමත් ඔවුහු එසේ කරති. එයට තවමත් දුම්රිය ගණන් පුරවා තුවක්කු ලැබෙන්නේය. එපමණක් නොව, එය රුසියාව සමග නොනවත්වාම යුද්ධ කරන්නේ නම් සෑම දෙයකදීම උදව් දෙන බවට පොරොන්දු දෙනු ලැබ්. එම පෝලන්තය පවා, එහි ආණ්ඩුවේ අස්ථාවර තත්වය නිසා ඕනෑම යුද්ධමය දූ කෙළියකට කැමති නොවී සිටිය නොහැකි පෝලන්තය පවා, සාම සාකච්ඡා ආරම්භ කිරීමට අපට ආරාධනා කර තිබේ. අපි ඉතාමත් ප්‍රවේසම් සහිත විය යුත්තෙමු. අපගේ ප්‍රතිපත්තිය අනුව ඉතාමත් සුපරීක්ෂාකාරී ලෙස කල්පනා කර බැලීම අවශ්‍ය වේ. මෙහිදී නිවැරදි ප්‍රතිපත්තිය සොයා ගැනීම අන් සියල්ලටම වඩා අමාරුය. එසේ වන්නේ, දුම්රිය තිබෙන්නේ කුමණ පීල්ලේද යනු තවමත් කිසිවෙක් නොදන්නා හෙයිනි. සතුරා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඊළඟට කරන්නට යන්නේ කුමක්දැයි ඔහුම නොදනියි. ප්‍රංශ ප්‍රතිපත්තිය නියෝජනය කරන සහ පෝලන්තය උසිගැන්වීමෙහි වඩාත්ම උත්සුක්ත වන මහත්වරුද, ඉඩම් හිමි සහ ධනපති පෝලන්තයේ නායකයෝද, ඊළඟට සිදුවන දෙය ගැන නොදනිති. ඔවුන්ට උවමනා කරන්නේ කුමක්දැයි ඔවුන්ම නොදනිති. ඔවුහු අද මෙසේ කියති: "මහත්වරුනි, දුම්රිය කීපයක් පුරවා තුවක්කුද, දස කෝටි කීපයක් මුදල්ද අපට දෙන්න. එවිට බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව සටන් කිරීමට අපි සූදනම්ව සිටින්නෙමු." ඔවුහු පෝලන්තයේ පැතිරෙමින් තිබෙන වැඩ වර්ජන ගැන තොරතුරු වසං කරති. සත්‍යය සැඟවීම සඳහා, ඔවුහු පුවත්පත් පාලනය තද කරති. නමුත් පෝලන්තයේ විප්ලවීය ව්‍යාපාරය වර්ධනය වෙමින් පවතී. ජර්මන්, කර්නිලව් වර්ගයේ කැරළි කුමන්ත්‍රණයෙන්[25] පසුව, දැන් ජර්මනියේ විප්ලවය පැතිරී යාමෙන්, එහි නව අදියරෙන්, එහි නව අවධියෙන්, කම්කරුවන් විසින් රතු හමුදා නිර්මාණය කරනු ලැබීමෙන්, (මැතදී ජර්මනියෙන් ලැබුණු පණිවුඩ අනුව) පැහැදිලිව පෙනෙන්නේ කම්කරුවන්ගේ උද්වේගය තව තවත් වැඩි වන බවයි. පමාවුනා වැඩිදැයි, යුද්ධය සඳහා, නැතහොත්, සාමය සඳහා ආණ්ඩුව ක්‍රියාකාරී වීමට පෙර පෝලන්තයේ සෝවියට් සමූහාණ්ඩුවක් ඇතිවිය නොහැකිදැයි යනුවෙන් පෝලන්ත ධනපතියන්ම හා ඉඩම්හිමියන්ම කල්පනා කිරීමට පටන් ගෙන ඇත. කළ යුත්තේ කුමක්ද යනු ඔවුහු නොදනිති. හෙට සිදුවනු ඇත්තේ කුමක්දැයි ඔවුහු නොදනිති.

සෑම මාසයක් පාසාම අපගේ බලවේගයන් වර්ධනය වන බව අපි දන්නෙමු. අනාගතයේදී ඒවා තව තවත් වර්ධනය වනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපගේ ජාත්‍යන්තර තත්වය අන් කවර දකටත් වඩා හොඳින් ස්ථාවර වී තිබේ. නමුත් අපි, ඉතා ප්‍රවේසම් සහිතව ජාත්‍යන්තර අර්බුදය ගැන සෙවිල්ලෙන් හා මතුවන ඕනෑම තත්වයක් සඳහා සූදනම්ව සිටිය යුත්තෙමු. පෝලන්තයෙන් අපට සාමය සඳහා විධිමත් යෝජනාවක් ලැබී තිබේ. මෙම මහත්වරු අවදනම් තත්වයන්ට මුහුණ පා සිටිති. ඔවුන්ගේ අවදනම කොතරම් බරපතලද යත්, ඔවුන්ගේ මිතුරන් වන, එමෙන්ම, වඩා හොඳ පුහුණුවක් හා වැඩි දේශපාලන අත් දැකීමක් හා දැනුමක්ද ඇති ජර්මන් රාජාණ්ඩුවාදීහු අවිශ්වාසදයක සූදුවක, කර්නිලව් වර්ගයේ කැරළි කුමන්ත්‍රණයක යෙදුනහ. ගනු ලබන ඕනෑම අවිශ්වාසදයක පියවරක් පෝලන්ත කර්නිලව් වර්ගයේ සිද්ධියක් විය හැකි බව පෝලන්ත ධනපතියන්ට වැටහී ඇති නිසා ඔවුහු සාම යෝජනා ඉදිරියට දමති. අපගේ සතුරා අවදනමට පත්ව ඇති බවත්, ඔහුට කරන්නට උවමනාවී තිබෙන්නේ, නැතහොත්, ඔහු හෙට කරන්නට යන්නේ කුමක්ද යනුත්, ඔහු නොදැන සිටින බව දන්නා අපි අපටම ඉතා නිශ්චිත

ලෙස කියා ගත යුත්තේ සාම යෝජනා තිබුණත් යුද්ධය ඇති වීමට ඉඩ තිබෙන බවය. ඔවුන්ගේ අනාගත හැසිරීම කෙබඳු වනු ඇද්දැයි කිසිසේත් කිව නොහැකිය. අපි මීට ඉහතදී මෙම මිනිසුන් දැක ඇත්තෙමු. අපි මෙම කෙරෙන්ස්කිලා ගැන, මෙම මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීන් ගැන දන්නෙමු. ඔවුන් පසු ගිය දෙවසර තුළදී එක දිනක් කොල්චාක් දෙසටද ඊළඟ දිනයේ බොල්ෂෙවික්වරුන් දෙසට යයි කිව හැකි තත්වයකටද, නැවත දෙනිකින් දෙසටද ඇදී ගිය සැටි හා ඒ සියල්ලම නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කථාවෙන් සරසා තැබූ සැටිද, අපි දැක ඇත්තෙමු. අපි මෙම මහත්වරුන් ගැන දන්නෙමු. එනිසා, කුඩා ජාතීන් සමඟ සාමය ඇති කර ගැනීමෙන් යුද්ධයට වඩා අපගේ යහපතට බොහෝ සේ හේතු වනු ඇතැයි යන විශ්වාසය ඇතිව, අපි සාම යෝජනාව දැතින්ම අල්ලා ගැනීමටත්, වැඩිම සහනයන් දීමටත් සූදනම්ව සිටිමු. අප එසේ කරන්නේ, අධිරාජ්‍යවාදීන් පොදු ජනතාව රැවටීම සඳහා යුද්ධය යොදා ගත් හෙයිනි. සෝවියට් රුසියාව ගැන සත්‍යය වසං කිරීමට ඔවුන් විසින් යුද්ධය යොදා ගන්නා ලද හෙයිනි. එබැවින් ඇතිවන ඕනෑම සාමයක් නිසා අපගේ බලපෑම වැඩි වීමේ මාර්ග සියගුණයෙන් පුළුල් වනු ඇත. මෙම පසුගිය වර්ෂ කීපය තුළදී එම මාර්ග දැනටමත් බෙහෙවින් පුළුල් වී තිබේ. තුන්වැනි (කොමියුනිස්ට්) ජාත්‍යන්තරය ලබා ඇති ජයග්‍රහණයන් අසම සමය. නමුත්, ඕනෑම දිනක යුද්ධය අප මත පටවනු ලැබිය හැකි බව අපි දන්නෙමු. මේ හා සම්බන්ධයෙන් අපගේ සතුරන්ට කළ හැකි වන දේ ගැන ඔවුහුම පවා තවමත් නො දනිති.

යුද්ධය සඳහා කටයුතු සූදනම් කරනු ලැබේ. ඒ ගැන කිසිම සැකයක් නැත. රුසියාවේ දේශ සීමාවේ තිබෙන මේ රටවල් සමහරවිට රුසියාවේ දේශසීමාවෙන් ඔබ්බෙහි තිබෙන රටවල් පවා — ආයුධ සන්නද්ධ වෙමින් සිටිති. අපගේ ජාත්‍යන්තර ප්‍රතිපත්තියෙහිදී අප එතරම් නම්‍යශීලී ලෙස ක්‍රියා කළ යුත්තේ සහ අප ගෙන තිබෙන මාර්ගයෙහි එතරම් දැඩි ලෙස එල්බ සිටිය යුත්තේ එහෙයිනි. ඕනෑම දෙයකට අප සූදනම්ව සිටිය යුත්තේ එහෙයිනි. අපි සාමය දිනා ගැනීම සඳහා අතිශයින් බලවත් ලෙස යුද්ධ කෙළෙමු. මෙම යුද්ධයෙන් විශිෂ්ට ප්‍රතිඵල ලැබෙමින් තිබේ. අරගලයේ මෙම ක්ෂේත්‍රයෙහිදී අපි ඉතා හොඳින් සමත්කම් පා ඇත්තෙමු. ඒවා, ලේ වැගිරීම සිදුවන පෙරමුණේ රතු හමුදා දක්වන දස්කම්වලට නොදෙවැනි වන්නේය. නමුත් කුඩා රාජ්‍යයන්ගේ කැමැත්ත තිබුණත්, අප සමඟ සාමය ඇති කර ගැනීම රඳා පවතින්නේ එම රාජ්‍යයන් මත නොවේ. ඒවා, මිත්‍ර ගිවිසුමේ රාජ්‍යයන්ගෙන් ගත් ණයවලට සම්පූර්ණයෙන්ම යටවී ඇත. ඒ අතර එම ගිවිසුමේ රටවල්ම ඔවුනොවුන් අතරම දරුණු ලෙස පොර වැදෙමින් හා තරඟ කරමින් සිටිති. එනිසා ලෝක තත්වය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අනුව්, සිවිල් යුද්ධයෙන් සහ මිත්‍ර ගිවිසුමට විරුද්ධව කරන ලද යුද්ධයෙන් ඇති වී තිබෙන ඓතිහාසික තත්වය අනුව නම් සාමය ඇති වීමට ඉඩ තිබෙන බව අපි මතක තබා ගත යුත්තෙමු.

නමුත්, අප සාමය සඳහා ගන්නා පියවරයන් සමගම ආරක්ෂාව සඳහා සූදානමද දියුණු තියුණු කළ යුතුය. එනිසා මොනම තත්වයක් හෝ යටතේ අපගේ යුද්ධ හමුදාව නිරායුධ කළ යුතු නොවේ. අධිරාජ්‍යවාදී බලවතුන් අපට විරුද්ධව අල්ප මාත්‍ර හෝ ප්‍රයත්නයක් නොදරන, නැතහොත්, පහරක් නොදෙන බවට අපට නියම සහතිකය ලැබෙන්නේ අපගේ යුද්ධ හමුදාවෙනි. මන්ද යත්, ප්‍රථමයෙන් ඔවුන්ට කිසියම් ජයග්‍රහණයක් බලාපොරොත්තු විය හැකි වුවත්, සෝවියට් රුසියාව අතින් පරාජය ලැබීමෙන් බේරීමට ඔවුන් කිසිවෙකුටත් නොපුළුවන් හෙයිනි. වර්ධනය වන විඩාපත් තත්වය නිසා එක ක්‍රියාමාර්ගයක් සමග අනික සම්බන්ධ කිරීමට අපට බල කරන ප්‍රශ්නය විසඳීම පිණිස, අපි එම කරුණ අවබෝධ කර ගත යුත්තෙමු. එය අපගේ උද්ඝෝෂණයෙහි හා ප්‍රචාරයෙහි පදනම කොට ගත යුත්තෙමු. ඒ සඳහා සූදානම් විය යුත්තෙමු.

යම් යම් මූලික හා වැදගත් ප්‍රශ්න සමහරක් විසඳා ගනු පිණිස යුද්ධ හමුදාව උපයෝගි කර ගැනීමේ ක්‍රියාමාර්ගය ඔස්සේ වැඩ කරන පොදු ජනතාව එතරම් අධිෂ්ඨාන සහගත ලෙස මෙහෙයවීමට අප උනන්දු කළ ප්‍රතිපත්ති පිළිබඳ ඒ වැදගත් ප්‍රශ්න ගැන සලකා බැලීම කෙරෙහි මම දැන් යොමු වන්නෙමි. ඉහත දී විනය ඇති කළ මූලාශ්‍රය වන ප්‍රාග්ධනය දුර්වල වී තිබේ. සමගිය ඇති කළ පැරණි මූලාශ්‍රය අතුරුදහන් වී තිබේ. අපි වෙනත් වර්ගයක විනයක්, විනය ඇති කරන වෙනත් මූලාශ්‍රයක් හා සමගියක් නිර්මාණය කළ යුත්තෙමු. බල කිරීම විසින් ධනපතියන් ප්‍රජාතන්ත්‍රවාදීන් කෙරෙන් කෝපයත්, උඩු බිරුමත්, ගෝරනාඩුවත්, තප්පු ලැමත් පැන නංවනු ලැබේ. ඔවුහු ''නිදහස'' සහ ''සමානත්වය'' යන වචනවලින් මහත් විජ්ජා පෙන්වති. නමුත් ප්‍රාග්ධනයට නිදහස යනු වැඩ කරන ජනතාවට විරුද්ධව කරන අපරාධයක් බව, පොහොසතා හා අසරණයා අතර සමානත්වය යනු වැඩ කරන ජනතාවට කරන අපරාධයක් බව, ඔවුන්ට වැටහෙන්නේ නැත. බොරුවට විරුද්ධව කරන සටනේදී අපි බල කිරීම උපයෝගි කර ගැනීමට පැකිලෙන්නේ නැතිව, අනිවාර්ය ශ්‍රම සේවයට බඳවා ගැනීම ආරම්භ කර වැඩ කරන ජනතාව එක්සත් කිරීමට පියවර ගත්තෙමු. අප එසේ කළේ බල කිරීම නොමැතිව කිසිම විප්ලවයක් ඇති නොවූ හෙයිනි. එමෙන්ම, මොන ආකාරයෙන් හෝ තමන්ගේ ශක්තිය රැක ගැනීම සඳහා බලකිරීම ක්‍රියාත්මක කිරීමේ අයිතිය නිර්ධන පංතියට තිබෙන හෙයිනි. ධනපතියන් සම්මුතිගත වන්නන්, ජර්මානු ස්වාධීනයන් ඔීස්ත්‍රියානු ස්වාධීනයන්[26] සහ ප්‍රංශ ලොංගේ වාදීන්[27] වන ඒ මහත්වරු ඓතිහාසික සාධකය ගැන තර්ක කරන විට, ඔවුහු නිර්ධන පංතියේ විප්ලවවාදී අධිෂ්ඨාන සහගත භාවය, දැඩි බව හා නොපසුබට ස්වභාවය පිළිබඳ සාධකය ගැන නිතරම අමතක කළහ. ඔවුන් හරියටම අමතක කළේ, අප අපගේ දේශභූමිය පාවා දෙනවාට වඩා, අපගේ මූල ධර්ම, එනම්, විනය හා ප්‍රතිපත්තිය පිළිබඳ මූලධර්ම පාවා දෙනවාට වඩා, අන්තිම පුද්ගලයා දක්වා මිය යාමට සූදානම් බව ප්‍රකාශ කරන හා ක්‍රියාවෙන් ඔප්පු කර තිබෙන එම සාධකයමය. දේශභූමිය හා මූලධර්ම රැක ගැනීමට අන් සියල්ලම පරිත්‍යාග කළ යුත්තේය. ධනපති රටවල් සහ ධනපති පංතිය කඩා කප්පල් වී යන අවස්ථාවේ, අර්බුදය හා විපිළිසරය බල පවත්වන අවස්ථාවේ, එකම තීරණාත්මක සාධකය වන්නේ මෙම දේශපාලන සාධකය ය. පසුගිය ඓතිහාසික කාල පරිච්ඡේදයේ වීරයන් අල්පතරය හා බහුතරයත්, ප්‍රජාතන්ත්‍රවාදය සහ නිදහසත්, කොතරම් ආවේශ කළත්, ඒවා ගැන කරන කථාවලින් කිසිම දෙයක් තීරණය වූයේ නැත. මෙහිදී වැදගත් වන්නේ කම්කරු පංතියේ පංති විඥනය හා දැඩි බවය. කම්කරු පංතිය පරිත්‍යාගයන් කිරීමට සූදානම් නම්, මුළු ධෛර්යයම යෙදීමට සූදානම් බව එය පෙන්වන්නේ නම්, ප්‍රශ්නය විසඳෙනු ඇත. සියල්ලම ඉලක්ක කළ යුත්තේ මෙම ප්‍රශ්නය විසඳීම වෙතය. කම්කරු පංතියේ අධිෂ්ඨානය, නැතහොත් ''යටත් වෙනවාට වඩා මිය යාම යෙහෙකි'' යි යන සංඥ පාඨය කෙරෙහි, එය තදින් එල්බගෙන සිටීම යනු, හුදෙක් ඓතිහාසික සාධකයක් පමණක් නොව, ජයග්‍රහණය ගෙන දෙන සාධකයක්ද වන්නේය.

දැන් අපි මෙම ජයග්‍රහණයේ සහ අවබෝධයේ සිට සාමකාමී ආර්ථික සංවර්ධනයේ ප්‍රශ්න වෙත යන්නෙමු. අපගේ සම්මේලනයේ ප්‍රධාන කාර්යය වන්නේ එම ප්‍රශ්න විසඳීමය. මේ හා සම්බන්ධයෙන් වූ කල, මධ්‍යම කාරක සභාවේ දේශපාලන කාරක සභාවේ වාර්තාවක් ගැන, නැතහොත්, මධ්‍යම කාරක සභාවේ දේශපාලන වාර්තාවක් ගැන අපට කථා කළ නොහැකිය යනු මගේ අදහසයි. සහෝදරවරුනි. ශ්‍රේෂ්ඨතම පක්ෂ මණ්ඩලය වන ඔබ, ඔබගේ මුළු අධිකාරයම යොදා මෙම ප්‍රශ්නය තීරණය කළ යුතු බව මම අවංකවම හා නොසඟවාම කියමි. අපි ඉතාමත් පැහැදිලි ලෙස මෙම ප්‍රශ්නය ඔබ හමුවේ තබා ඇත්තෙමු. මේ සම්බන්ධයෙන් අපි නිශ්චිත ස්ථාවරයක් ගෙන ඇත්තෙමු. අපගේ තීරණය අනුමත කිරීම නිවැරදි කිරීම, නැතහොත්, සංශෝධනය කිරීම ඔබගේ යුතුකම වන්නේය. නමුත්, මෙම මූලික සහ ඉතා හදිසි ප්‍රශ්නයේදී මධ්‍යම කාරක සභාව නිශ්චිත ස්ථාවරයක් ගෙන තිබෙන බව එය එහි වාර්තාවෙහි සඳහන් කළ යුතුය. එසේය. දැන් කළ යුතුව තිබෙන්නේ, නිර්ධන පංතිය සම්පූර්ණයෙන්ම සමගිවන සේ එය එකට පැස්සීමෙහි පොහොසත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සියල්ලම ආර්ථික සංවර්ධනයේ සාමකාමී වැඩ සඳහා, අපගේ විනාශ වී ගිය කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීම සඳහා යොදා ගැනීමය. මෙහිදී, අයෝමය විනයත්, අයෝමය ක්‍රමයත් අපට අවශ්‍ය වන්නේය. එය නොමැති වී නම්, අපට අවුරුදු දෙකක් තබා මාස දෙකක් වත් අපගේ බලය රැක ගැනීමට නොහැකි වන්නට තිබිණි. අපගේ ජයග්‍රහණයෙන් ප්‍රයෝජන ගැනීමට අපි සමත් විය යුත්තෙමු. අනිත් අතට මෙම පරිවර්තනය ඉටු කර ගැනීම සඳහා බොහෝ පරිත්‍යාගයන් අවශ්‍ය වන බව අපි වටහා ගත යුත්තෙමු. අප රට දැනටමත් පරිත්‍යාග මහත් රැසක් කර ඇත.

මේ හා සම්බන්ධ ප්‍රතිපත්තිය ගැන මධ්‍යම කාරක සභාවේ අදහස් පැහැදිලි විය. අපගේ කටයුතු සම්පූර්ණයෙන්ම මෙම ප්‍රතිපත්තියෙන් පාලනය වූ අතර, ඒවා කරන ලද්දේ එම ප්‍රතිපත්තියේ ජීවගුණයෙන් යුක්තවය. නිදසුනක් ලෙසට, සාමූහික කළමනාකරණයත්, ඊට ප්‍රතිවිරුද්ධ තනි පුද්ගල කළමනාකරණයත්, පිළිබඳ ප්‍රශ්නය ගනිමු. ඔබට ඒ ප්‍රශ්නය විසඳීමට සිදුවනු ඇත. එය ද්විතීය ප්‍රශ්නයක් ලෙසට පෙනී යා හැකි හා එහි පසුබිමෙන් ඉවත් කොට ගත හොත් මූලික ප්‍රතිපත්ති සම්බන්ධ ප්‍රශ්නයක් වන බවට අයිතිවාසි කම් කීමට ඉඩක් නොමැති එකකි. මෙම ප්‍රශ්නය පරීක්ෂණයට භාජනය කළ යුත්තේ අපගේ මූලික දැනුම, අත් දැකීම් සහ විප්ලවවාදී ව්‍යවහාරය, පමණක් උපයෝගී කර ගනිමිනි. නිදසුනක් ලෙසට, "සාමූහික කළමනාකරණය යනු පොදු ජනතාව පරිපාලනයට සහභාගී වීමේ ආකෘති අතුරෙන් එකක්" බව අපට කියනු ලැබේ. නමුත් මධ්‍යම කාරක සභාවේ අපි මෙම ප්‍රශ්නය සාකච්ඡා කර අපගේ තීරණය ගත්තෙමු. අපි ඒ ගැන ඔබට වාර්තා කළ යුත්තෙමු. එවැනි න්‍යායික අවුලකට ඉඩ තැබිය නොහැකිය. අපගේ යුද්ධ කටයුතු පිළිබඳ, අපගේ සිවිල් යුද්ධය පිළිබඳ මූලික ප්‍රශ්නයේදී, මෙම න්‍යායික අවුලෙන් දහයෙන් පංගුවකටවත් අපි අවකාශ දුන්නෙමු නම් අප පරාජය වන්නට තිබුණි. එපමණක් නොව එසේ වීනම් අප පරාජය ලැබීමට සුදුස්සන් වන්නටද තිබුණි.

සහෝදරවරුනි, මධ්‍යම කාරක සභාවේ වාර්තාව සම්බන්ධයෙන්ද, නව පංතිය පරිපාලන කටයුතුවලට සහභාගී විය යුත්තේ සාමූහික පදනමකින්ද, නැතහොත්, තනි පුද්ගල පදනමකින්ද යන්න සම්බන්ධයෙන්ද, න්‍යායය මඳක් පැහැදිලි කිරීමට, එනම්, පංතියක් ආණ්ඩු කරන්නේ කෙසේද යනුත්, පංති ආධිපත්‍යය යනු ඇත්ත වශයෙන්ම කුමක්ද යනුත් පෙන්නුම් කිරීමට මට ඉඩ දෙන්න. අපි මෙම කාරණයෙහිදී ආධුනිකයෝ නොවෙමු. අපගේ විප්ලවය, ඊට ඉහත ඇති වූ විප්ලවවලින් වෙනස් වන්නේ එහි මනෝරාජික කිසිවක් නොමැති හෙයිනි. නව පංතිය පැරණි පංතිවල තැන ගැනීමෙන් පසුව, එයට පවතින්නට හැකි වන්නේ අන් පංතිවලට

විරුද්ධව දරුණු අරගලයක් කරමිනි. එමෙන්ම එය අවසානයේදී ජයග්‍රහණයට පත්වනු ඇත්තේ, පොදු වශයෙන් පංති නැති කිරීමට එය පොහොසත් වන්නේ නම් පමණකි. පංති අරගලයේ දැවැන්ත හා සංකීර්ණ ක්‍රියාදාමයෙන් අපේක්ෂා කරනු ලබන්නේ එය ය. එසේ නොවේ නම් ඔබ අවුල් සහගත භාවයේ වගුරක ගිලී යනු ඇත. පංති ආධිපත්‍යය යනු කුමක්ද? ධනපතියන් වැඩ වසම් අධිපතියන් යටපත් කර ඔවුන්ගේ ආධිපත්‍යය පැවැත්වූයේ කුමණ ආකාරයෙන්ද? නිදහස සහ සමානත්වය ගැන ව්‍යවස්ථාවෙහි සඳහන් විය. එය බොරුවක් විය. වැඩ කරන මිනිසුන් සිටිනතාක් කල් දේපල හිමියන්ට ලාභ ගරා ගැනීමට හැකි තත්වයක් ලැබෙන්නේය. එවිට ඇත්ත වශයෙන්ම ලාභ ගැරීමෙහි යෙදෙන සේ දේපලහිමියන්ට බල කෙරෙන්නේය. එහි සමානත්වයක් නොමැති බව අපි ප්‍රකාශ කරන්නෙමු. බඩ පුරවා ගත් මිනිසා සයින් පෙළෙන මිනිසාගේ සමානයා නොවන බවත්, ලාභ ගරන්නා වැඩ කරන මිනිසාගේ සමානයා නොවන බවත් අපි ප්‍රකාශ කරන්නෙමු.

අද පංති ආධිපත්‍යය ප්‍රකාශිත වන්නේ කෙසේද? නිර්ධන පංතියේ ආධිපත්‍යය සංයුක්ත වන්නේ ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට ඔවුන්ගේ දේපල අහිමි කර තිබීමෙනි. ඉහත වූ සියලුම ව්‍යවස්ථාවල, ඉතාමත් සමූහාණ්ඩුවාදී සහ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවේ ව්‍යවස්ථාවෙහි පවා, ජීව ගුණය සහ මූලික අර්ථය එකක්ම විය — දේපල විය. අපගේ ව්‍යවස්ථාව මගින් දේපල අවලංගු කිරීම හුදෙක් කඩදාසියේ කරන ප්‍රකාශනයකට සීමා කර නොමැති නිසා, එයට ඉතිහාසයේ තැනක් හිමි වේ. එනිසා එය ඉතිහාසයේ තැනක් සඳහා හිමිකම දිනාගෙන ඇත. ජයග්‍රාහී පංතිය දේපල නැති කර තිබේ. එය සම්පූර්ණයෙන්ම අවලංගු කර තිබේ. පංතියක් වශයෙන් ආධිපත්‍යය පැවැත්වීම ඇත්තේ එහිය. මුල් කරුණ දේපල පිළිබඳ ප්‍රශ්නය ය. දේපල පිළිබඳ ප්‍රශ්නය ප්‍රායෝගික වශයෙන් විසඳන ලද පසු පංතියේ ආධිපත්‍යය ඒකාන්ත දෙයක් විය. ඊට පසුව, ඇත්ත වශයෙන් ක්‍රියාත්මක කර ඇති දෙය, එනම්, ධනපති හා ඉඩම් හිමි දේපල අවලංගු කළ බව හා ව්‍යවස්ථාව යටතේ ගොවි ජනතාවට වඩා කම්කරු පංතියට අයිතිවාසිකම් තිබෙන බවත්, සූරා කන්නන්ට අයිතිවාසිකම් කිසිවක් නොමැති බවත්, ව්‍යවස්ථාව මගින් කඩදාසියෙහි සටහන් කළ කල්හි, එයින් පිළිබිඹු වූයේ වැඩ කරන ජනතාවගේ සියලුම කොටස් හා සියලුම කුඩා කණ්ඩායම් අප වෙත බැඳෙන ආකාරයෙන් අපගේ පංතියේ ආධිපත්‍යය ඇති කරන ලද බව ලේඛණ ගත කිරීමකි.

සුළු ධනපති දේපල හිමියෝ අසමගිව සිටිති. වැඩියෙන් දේපල හිමි අය අඩුවෙන් දේපල හිමි අයගේ සතුරෝ වෙති. එමෙන්ම, නිර්ධන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පංතිකයන් දේපල අවලංගු කිරීමෙන් සුළු ධනපති දේපල හිමියන්ට විරුද්ධව විවෘත යුද්ධයක් ප්‍රකාශයට පත් කර ඇත. වෙළෙඳම සඳහා ඕනෑම වර්ගයක නිදහසට එක හෙළාම පක්ෂ වන නූගත් හා කරුණු නොදත් බොහෝ ජනයා තවමත් සිටිති. නමුත් සූරාකන්නන්ට විරුද්ධව ජයග්‍රහණය අත්පත් කර ගැනීමේදී දක්වන ලද විනය හා ආත්ම පරිත්‍යාගය දකින ඔවුහු සටන් කිරීමට ශක්තිය නැති තත්වයට පත්වෙති. ඔවුහු අපට පක්ෂ නොවෙතත්, අපට විරුද්ධව ඉදිරිපත් වීමට බලයක් නොමැතිව සිටිති. දේපල සම්බන්ධකම් හා උඩින් සිටිය යුත්තේ කුමණ පංතියද යන්න තීරණය කෙරෙන්නේ පංතියක ආධිපත්‍යයෙන් පමණකි. අපට නිතර දක්නට ලැබෙන ලෙසට, පංති ආධිපත්‍යයේ ස්වභාවය පිළිබඳ ප්‍රශ්නය ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගත භාවය පිළිබඳ ප්‍රශ්නය සමග සම්බන්ධ කරන අය ඇති කරන අවුල කොතරම් විශාලද යත්, මෙම පදනම මත කිසිම වැඩක් සාර්ථක ලෙස කළ නොහැකි වන්නේය. ප්‍රචාරයෙහි සහ උද්ඝෝෂණයෙහි පැහැදිලිතාවයක් තිබීම අවශ්‍ය මූලික කොන්දේසියකි. උද්ඝෝෂණය හා ප්‍රචාරය විකාශ කිරීමේදී අප ප්‍රාතිහාර්යයන් පෑ බව අපගේ සතුරන් කියන විට සහ පිළිගන්නා විට, එය වටහා ගත යුත්තේ, අපට උද්ඝෝෂකයන් විශාල සංඛ්‍යාවක් සිටි බවත් හා අප බෙහෙවින් කඩදාසි වැය කළ බවත් කියන අර්ථයෙන් නොව, එම ප්‍රචාරයෙහි අඩංගු සත්‍යය සියල්ලන්ගේම සිත් තුළට කාවැදුනු බව කියන අර්ථයෙනි. සත්‍යයෙන් ගැළවී යා නොහැක.

පංති ඉවත් කර ඒ වෙනුවට වෙනත් පංති බලයට පත්වූ විට, ඒවා දේපල සම්බන්ධකම් වෙනස් කළේය. ධනපති පංතිය වැඩවසම් අධිපතියන් යටපත් කර බලයට පත්වූ විට එය දේපල සම්බන්ධකම් වෙනස් කළේය. ධනපති ව්‍යවස්ථාවෙන් මෙසේ කියවේ: ''දේපල හිමි මිනිසා හිඟන්නාට සමානය.'' එය ධනපති නිදහස විය. මේ වර්ගයේ ''සමානත්වය'' මගින් රාජ්‍යය තුළ ධනපති පංතියේ ආධිපත්‍යය සහතික විය. නමුත් වැඩවසම් ධනපතියන් අභිභවා ධනපතියන් බලයට පත් වූ විට ඔවුන් රාජ්‍යයත්, පරිපාලනයත්, එකට පටලවා ගත්තේයයි ඔබ සිතන්නෙහිද? නැත, ඔවුහු එවැනි මෝඩයෝ නොවූහ. පරිපාලනයේ කටයුතු සඳහා පරිපාලනය කරන්නේ කෙසේදැයි දන්නා අය අවශ්‍ය බවත්, එම කටයුත්ත ඉටු කර ගැනීම සඳහා වැඩවසම් පාලකයන් සුදුසු ලෙසට යොදා ගන්නා බවත්, ඔවුහු ප්‍රකාශ කළහ. ඔවුන් කළේද එයයි. එය වරදක් විද? නැත සහෝදරවරුනි. පරිපාලන කලාව දෙව්ලොවින් පහළ වන්නේ නැත. එය ශුද්ධ ආත්මයෙන් ලැබෙන මායමක් නොවේ. කිසි යම් පංතියක් නායක පංතිය වීම නිසාම, එයට එක් වරම පරිපාලන හැකියාව ලැබෙන්නේ නැත. අපි මේ පිළිබඳ නිදර්ශනයක් දැක ඇත්තෙමු.

ධනපතියන් ඔවුන්ගේ ජයග්‍රහණය තහවුරු කර ගනිමින් සිටියදී, පරිපාලනයේ කටයුතු සඳහා ඔවුන් වෙනත් පංතියක සාමාජිකයන්, එනම් වැඩ වසම් පංතියේ සාමාජිකයන් යොදා ගත් බව අපි දක්කෙමු. පරිපාලකයන් ගත හැකි වෙනත් තැනක් ධනපතියන්ට තිබුණේ නැත. අපි නුවණැති ලෙසින් සත්‍ය කරුණුවලට මුහුණ දිය යුත්තේමු. ධනපතියෝ පැරණි පංතිය උපයෝගි කර ගත්හ. අපද දැන් මුහුණ පා සිටින්නේ පැරණි පංතිය අපගේ අවශ්‍යතාවයන්ට යටත් කරමින්, එම පංතියෙන් දැනුම හා පුහුණුව ලැබීමේ හා ඒ සියල්ලම අපගේ පංතියේ සාර්ථකත්වය සඳහා උපයෝගි කර ගැනීමේ කර්තව්‍යයටය. එනිසා, ජයග්‍රාහී පංතිය මුහුකුරා ගිය ස්වභාවයක් සහිත විය යුතු යයි අපි කියමු. අනිත් අතට, මුහුකුරා ගිය බව සහතික වන්නේ ලියවිල්ලකින් නොව, අත්දැකීමෙන් හා ව්‍යවහාරයෙන් වේ.

ධනපති පංතිය ජය ගන්නා විට පාලනය කරන්නේ කෙසේද යන්න ඔවුහු නොදැන සිටියහ. නව ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීමෙන්ද, තමන්ගේම පංතියෙන් පරිපාලකයන් බඳවා ගනිමින්, යොදවා ගනිමින් හා ඔවුන් පුහුණු කරමින්ද, ඒ සඳහා පැරණි පංතියේ පරිපාලකයන් උපයෝගි කර ගනිමින්ද ඔවුහු ඔවුන්ගේ ජයග්‍රහණය ස්ථිර කර ගත්හ. ඔවුහු ඔවුන්ගේම පාලකයන් පුහුණු කිරීමට පටන් ගත්හ. මුළු රාජ්‍ය යන්ත්‍රයම ආධාර කොට ගනිමින් ඔවුන් වැඩ කටයුතු වලට පත් කරන ලදී. වැඩවසම් ආයතන තහංචියට යටත් කළ ඔවුහු, පොහොසතුන් පමණක් පාසල්වලට වැද්ද ගත්හ. මේ ආකාරයෙන් කටයුතු කරමින් අවුරුදු හා දශක ගණනක කාලය තුළදී, ඔවුහු තමන්ගේම පංතියෙන් පාලකයන් පුහුණු කර ගත්හ. අද, අධිපති පංතියේ රටාව හා පිළිබිඹුව අනුව ඉදි කෙරුණු රාජ්‍යයක සිටින අපි, අන් සෑම රාජ්‍යයක් කළ පරිද්දෙන්ම ක්‍රියා කළ යුත්තෙමු. අන්ත මනෝරාජික භාවය හා අර්ථ විරහිත වදන් හරඹය පිළිබඳ වරදට නොවැටීමට නම්, අපි අතීතයේ අත්දැකීම් සැලකිල්ලට ගන්නා බව කිව යුත්තෙමු. විප්ලවයෙන් දිනාගත් ව්‍යවස්ථාව ආරක්ෂා කර ගත යුතු නමුත්, පරිපාලන කටයුතු සඳහා රාජ්‍ය සංවිධානය කරනු සඳහා, රාජ්‍ය හා ව්‍යාපාර පිළිබඳ පළපුරුද්ද ඇති හා පරිපාලන කලාවෙහි හුරුබුහුටිකම් ඇති පුද්ගලයන් අපට අවශ්‍ය බවත්, එවැනි පුද්ගලයන් සොයා ගැනීම සඳහා පැරණි පංතිය වෙතට හැර වෙනත් තැනක් අපට නොමැති බවත් කිව යුත්තෙමු.

සාමූහික කළමනාකරණය පිළිබඳ අදහස් බොහෝවිටම හුදු නොදැනුවත් කම පිළිබඳ ජීවගුණයත්, විශේෂඥයන්ට විරුද්ධ කම පිළිබඳ ජීවගුණයත් සමග සමීප ලෙස බැඳුනේ වෙයි. සාර්ථකත්වය ලැබීම සඳහා අපි පැරණි ධනපති ලෝකයේ ඉතිහාසය ගැන ඉතා ගැඹුරු අවබෝධයක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලබා ගත යුත්තෙමු. එමෙන්ම කොමියුනිස්ට් ක්‍රමය ගොඩනැගීම සඳහා අපි කාර්මික ශිල්පීය සහ විද්‍යා දැනුම ලබාගෙන එය වඩාත් පුළුල් පිරිස්වලට ලැබෙන්නට සැලැස්විය යුත්තෙමු. නමුත් අපට එම දැනුම ලබා ගත හැක්කේ ධනපතියන්ගෙන් පමණකි. එය ලබාගත හැකි වෙනත් තැනක් නැත. මෙම මූලික ප්‍රශ්නයට ප්‍රමුඛ තැනක් දිය යුතුය. ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන ප්‍රශ්න අතුරෙන් එකක් ලෙසට මෙය ගැන සැලකිලිමත් විය යුතුය. අපට පරිපාලනය කිරීමට සිදු වී තිබෙන්නේ අප විසින් බලයෙන් පහ කරන ලද පංතියට අයත් පුද්ගලයන් ආධාර කොට ගනිමිනි. ඔවුහු ඔවුන්ගේ පංතියට ආවේණික දූර්මතයන්හි ගැලී සිටිති. එනිසා අපි ඔවුන්ට නැවත උගන්වා ගත යුත්තෙමු. ඒ අතරම අපි අපගේ පංතියෙන් අපගේම පාලකයන් බඳවා ගත යුත්තෙමු. පාසල්, වැඩිහිටි අධ්‍යාපනය සහ සියලු ප්‍රායෝගික පුහුණුව කොමියුනිස්ට්වරුන්ගේ මෙහෙයවීම යටතේ නිර්ධන පංතිකයන්ගේ, පැක්ටරි කම්කරුවන්ගේ සහ ශ්‍රමකරු ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා යෙදීමට අපි මුළු මහත් රාජ්‍ය යන්ත්‍රයම උපයෝගි කර ගත යුත්තෙමු.

වැඩ කටයුතු ඉටු කර ගැනීමේ එකම මාර්ගය එයයි. අපගේ අවුරුදු දෙකක අත් දැකීම්වලින් පසුව, අප සමාජවාදය ගොඩනැගීම ආරම්භ කිරීමට මේ දැන් යොමු වෙමින් සිටින කලෙක මෙන් තර්ක කිරීමට අපට නුපුළුවන. ස්මොල්නි[28] කාලයේදී හා ඊට තදනන්තරව අපි සෑහෙන තරම් නුනුවණ කම් කර ඇත්තෙමු. ඒ ගැන ලජ්ජා වීමට දෙයක් නැත. අපට කෙසේනම් දැනුම ඇතිව සිටිය හැකි වීද? අප භාර ගනිමින් සිටියේ සම්පූර්ණයෙන්ම අළුත් කටයුත්තකි. අපි ප්‍රථමයෙන් එක මාර්ගයක් අත්හද බැලුවෙමු. ඉන් පසුව තවත් මාර්ගයක් අත්හද බැලුවෙමු. අපට හරි දෙයත්, වැරදි දෙයත් වෙන්කර තෝරාගත නොහැකි වූ නිසා අපි රළ පහර හරහට පිහිනුවෙමු. ඒ සඳහා කාලය අවශ්‍ය වන්නේය. දැන් ඒ සියල්ලම මෑත අතීතයට අයත්ය. අපි ඒ සියල්ලම පසු කර ඇත්තෙමු. අවුල් වියවුල් හා උද්වේගය බලපැවැත්වූ ඒ අතීතය දැන් ගෙවී ගොස්ය. එම අතීතයට අයත් ලියවිලි අතුරෙන් එකකි, බ්‍රෙස්ට් සාම ගිවිසුම. එය ඓතිහාසික ලියවිල්ලකි. එපමණක් නොව, එය ඓතිහාසික කාල පරිච්ඡේදයක්ද විය. අප සෑම අතින්ම අසරණව සිටි නිසා, බ්‍රෙස්ට් ගිවිසුම අප මත බලෙන් පටවන ලදී. එය කෙබඳු කාල පරිච්ඡේදයක් වීද? එය බෙලහීන කමේ කාල පරිච්ඡේදයක් විය. අපි එයින් ජයග්‍රාහී ලෙස ඉස්මතු වූයෙමු. එම කාල පරිච්ඡේදයේ දී සාමූහික කළමනාකරණය සෑම තැනෙකම ක්‍රියාත්මක කෙරින. සාමූහික කළමනාකරණය උගන්වන පාසැලකියි කීමෙන් ඔබට මෙම සත්‍යයෙන් ගැලවීමට නොපුළුවන. ඔබට සද කල්හිම පාසලක ප්‍රාථමික පංතියේ සිටිය නොහැකිය!

(අත්පොළසන්.) එය හරියන්නේ නැත. අපි දැන් වැඩි වියට පත්ව සිටින්නෙමු. නමුත් අපි පාසල් ළමුන් ලෙස හැසිරෙන්නෙමු නම්, අප පරාජය වනු ඇත — නැවත නැවතත් පරාජය වනු ඇත. අපි ඉදිරියට යා යුත්තෙමු. ධෛර්යයෙන් සහ ඒකමතික අධිෂ්ඨානයෙන් යුතුව අපි ඉහළට නැගෙනු යුත්තෙමු. අති විශාල දුෂ්කරතාවයන් වෘත්තීය සමිති හමුවේ ඇත. චිරප්‍රසිද්ධ ප්‍රජාතන්ත්‍රවාදයේ නෂ්ටාවශේෂයන්ට විරුද්ධව කරන සටනේ ජීවගුණයෙන් යුතුව මෙම කර්තව්‍යය ගැන සැලකිල්ලට ගන්නා ලෙස අපි වෘත්තීය සමිති යොමු කළ යුත්තෙමු. පත්වීම් ලබන අයට විරුද්ධව කරන මේ ඝෝෂාවන් සියල්ලම, විවිධ යෝජනා සහ සාකච්ඡා තුළට වැද්දගනු ලබන මෙම පැරණි සහ අනතුරුදායක කුණු කන්දල් සියල්ලම, එක හෙළාම බැහැර කළ යුතුය. නො එසේ නම් අපට සාර්ථකත්වය අත්පත් කර ගත හැකි නොවේ. මෙම අවුරුදු දෙක තුළදී අපට මෙය උගෙන ගත නොහැකි වී නම්, අපි පසුබා සිටින්නෙමු. එමෙන්ම එමෙන්ම, පසුබාන අය පරාජය ලැබීමට සුදුස්සෝද වෙති.

මෙය ඉතා දුෂ්කර කර්තව්‍යයකි. අපගේ වෘත්තීය, සමිති නිර්ධන පංති රාජ්‍යය ගොඩ නැගීමේදී ඊට අතිශයින් ආධාර කාරී විය. ඒවා පක්ෂයත්, දශලක්ෂ සංඛ්‍යාත නූගත් ජනයාත් එකට සම්බන්ධ කරන පුරුක වශයෙන් ක්‍රියාත්මක විය. ආහාර හා සම්බන්ධ කටයුතුවලදී රාජ්‍යයට ආධාර අවශ්‍ය වූ කල, අපගේ අමාරුකම් සියල්ලටම විරුද්ධව සටන් කිරීමේදී අරගලයේ ප්‍රධාන කොටසට කර දුන්නේ වෘත්තීය සමිති බව අපි අමතක නොකළ යුත්තෙමු. එය අති දැවැන්ත කර්තව්‍යයක් නොවීද? මධ්‍යම සංඛ්‍යාලේඛන මණ්ඩලය මෑතදී පළකළ එහි නිවේදන පත්‍රිකාවේ කලාපයෙහි සංඛ්‍යා විද්‍යාඥයින් විසින් සකස් කරන ලද සාරාංශ සටහන් ඇතුළත් විය. එම සංඛ්‍යා විද්‍යාඥයන් බොල්ෂෙවික්වරුන්යයි සිතීමට පුළුවන් කමක් නැත. එම සටහන්වල වැදගත් සංඛ්‍යාවන් දෙකක් සඳහන් විය. 1918 හා 1919 වර්ෂවලදී පාරිභෝගික ගුබර්නියා ප්‍රදේශවල කම්කරුවන්ට අවුරුද්දකට එක් අයෙකුට ධාන්‍ය පූද් හත බැගින් ලැබුණු අතර, නිෂ්පාදනය කරන ගුබර්නියා ප්‍රදේශවල ගොවිජනයාට අවුරුද්දකට එක් අයෙකුට පූද් දහහත බැගින් ලැබිණ. යුද්ධයට පෙර ඔවුන් පූද් දහසයක් බැගින් පමණ ප්‍රයෝජනයට ගත්හ. ආහාර සඳහා කරන අරගලයේදී පංති අතර සම්බන්ධය පිළිබිඹු කරන සංඛ්‍යා දෙක එසේය. නිර්ධන පංතිය දිගටම පරිත්‍යාග කිරීමෙහි යෙදුනේය. සමහරු බල කිරීම ගැන ඝෝෂා කරති! නමුත් නිර්ධන පංතිය බලකිරීම යුක්ති සහගත සහ සාධාරණ දෙයක් බවට පත් කළේය. එය බල කිරීම යුක්ති සහගත බවට පත් කළේ ඉමහත් පරිත්‍යාගයන් කිරීමෙනි. සාගින්නෙන් පෙළෙන සහ දරිද්‍රතාවයට පත් අපගේ රුසියාවේ ජනගහනයෙන් බහුතරය,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිෂ්පාදනය කරන ගුබර්නියා ප්‍රදේශවල ගොවි ජනයා, සාර්වාදී සහ ධනපති රුසියාවේදී ශත වර්ෂ ගණන් තිස්සේ ගත්තාට වඩා, ප්‍රථම වතාවට ආහාර ගත්හ. රතු හමුදාව ජයග්‍රාහී වන තෙක්ම ජනතාව සාගින්නෙන් පෙළෙනු ඇති බව අපි කියන්නෙමු. කම්කරු පංතියේ පෙරමුණු බල ඇණියට මෙම පරිත්‍යාගය කිරීමට සිදුවිය. මෙම අරගලය පාසලකි. නමුත් අපි මෙම පාසැලෙන් නික්ම යනවිට අපි ඉදිරියට යා යුත්තෙමු. දැන් මොන අමාරුකමක් හෝ විඳ මෙම පියවර ගත යුතුව ඇත. සියලුම වෘත්තීය සමිතිවලට මෙන්ම, පැරණි වෘත්තීය සමිතිවලටද ඉතිහාසයක් හා අතීතයක් ඇත. අතීතයේදී ඒවා ශ්‍රම කරුවන් පීඩනයට පත් කළ අයට, නැතහොත්, ධනපති ක්‍රමයට, ප්‍රතිරෝධය දක්වන සංවිධාන විය. නමුත් දැන්, ඒවායේ පංතිය ආණ්ඩු කරන පංතිය බවට පත්ව ඇති නිසා සහ මහා පරිත්‍යාගයන් කරන ලෙසට, කුසගින්නේ සිටින ලෙසට, විනාශයට මුහුණ දෙන ලෙසට එයට කියනු ලබන නිසා, තත්වය වෙනස් වී ඇත.

මෙම වෙනස වැටහෙන්නේ සැම දෙනාටම නොවේ. එහි වැදගත්කම වටහා ගන්නේ සැම දෙනාම නොවේ. තවද, තනි පුද්ගල කළමනාකරණය වෙනුවට සාමූහික කළමනාකරණය ආදේශ කළ යුතු යයි ඉල්ලන සමහර මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් මෙම කරුණෙහිදී අපට ආධාරකාරී වී ඇත. නැත සහෝදරවරුනි, එය හරියන්නේ නැත. අපි ඉන් ඔබ්බට යා යුත්තෙමු. අපට දැන් මුහුණ දීමට සිදුවී තිබෙන්නේ ඉතා දුෂ්කර කර්තව්‍යයකටය. ලේ වැගිරෙන පෙරමුණෙහි දී ජය අත්පත් කරගෙන සිටින අපි දැන් ලේ වැගිරීමෙන් තොර පෙරමුණෙහිදී ජය අත්කර ගත යුත්තෙමු. මෙය වඩාත් දුෂ්කර යුද්ධයකි. මෙම පෙරමුණ ඉතාමත් අමාරු පෙරමුණය. අපි අවංකවම, පංති විඥානය ඇති සියලුම කම්කරුවන්ට මේ ගැන කියන්නෙමු. පෙරමුණෙහිදී අප ඔරොත්තු දී සිටි යුද්ධයෙන් අනතුරුව, ලේ වැගිරීමෙන් තොර යුද්ධයක් කළ යුතුව ඇත. සත්‍ය කරුණ මෙයයි. අප වඩ වඩාත් ජයග්‍රාහී වූ තරමට සයිබීරියාව, උක්‍රේනියාව සහ කුබානය වැනි ප්‍රදේශ වැඩි වැඩියෙන් අප අතට පත් විය. මේ ප්‍රදේශවල පොහොසත් ගොවීහු සිටිති. එහි නිර්ධන පංතිකයන් නැත. එහි සිටින නිර්ධන පංතිකයන් වෙතොත් ඔවුන්ද සුළු ධනපති පංති පුරුදු නිසා දූෂිත වී ඇත. එම පළාත්වල ඉඩම් කැබැල්ලක් තිබෙන සැම කෙනෙක්ම මෙසේ කියන බව අපි දනිමු: "ආණ්ඩුවට කිසිවක් නොදෙමි. සාගින්න ප්‍රයෝජනයට ගෙන මම හැකි තරම් පොහොසත් වන්නෙමි. මම ආණ්ඩුව ගැන තුට්ටුවකටවත් නොසලකමි." දෙනිකින්ගේ දරුණුකම්වලට මුහුණ පෑ කල අප වෙත නැඹුරු වෙමින් සිටි ගොවි ලාභ ගරන්නාට දැන් මිත්‍ර (Entente) ගිවිසුමේ ආධාර ලැබෙනු ඇත. යුද්ධය නිසා පෙරමුණත්,

එහි ආකෘතීන් වෙනස් වී ඇත. එය දැන් වෙළෙඳාමේ සහ ආහාර වලින් ලාභ ගැරීමේ ආකෘතිය ගන්නේය. එය දැන් ජාත්‍යන්තර ආකෘතියක් වී තිබේ. රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවේ නිවේදන පත්‍රිකාවෙහි[29] පළ වූ කාමෙනෙව් සහෝදරයාගේ ප්‍රවාදවල මූලික ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම සඳහන් කර තිබේ. ආහාර වලින් ලාභ ගැරීම ජාත්‍යන්තර තත්වයට පත් කිරීමට ඔවුන්ට උවමනා කර තිබේ. සාමකාමී ආර්ථික සංවර්ධනය සාමකාමී ලෙස සෝවියට් බලය කඩා විසුරුවා හැරීමක් බවට හරවා ගැනීමට ඔවුන්ට උවමනා වී තිබේ. නැත, අධිරාජ්‍යවාදී මහත්වරුනි, ඔබට එය කරන්නට ලැබෙන්නේ නැත! අපි අපගේ ආරක්ෂාව ගැන සැලකිල්ලෙන් සිටින්නෙමු. අපි මෙසේ ප්‍රකාශ කරමු: අපි සටන් කර ජයගෙන සිටින්නෙමු. එනිසා, අපි අපගේ ජයග්‍රහණයට උපස්තම්භක වූ ඒ සටන් පාඨය, අපගේ මූලික සටන් පාඨය ලෙසට තබා ගන්නෙමු. එම සටන් පාඨය මුළුමනින්ම රැක ගන්නා අපි, එය ශ්‍රම ක්ෂේත්‍රයෙහි ක්‍රියාත්මක කරන්නෙමු. මෙම සටන් පාඨය නම්, නිර්ධන පංතියේ අධිෂ්ඨානයේ දැඩි බව හා සමගියයි. තවමත් පවතින පැරණි දුර්මත, පැරණි පුරුදු ඉවත ලිය යුතුය.

අවසාන වශයෙන් ගුසෙව් සහෝදරයාගේ කුඩා පොත ගැන සඳහන් කිරීමට කැමැත්තෙමි. කරුණු දෙකක් හේතු කොට ගෙන ඒ වෙත අවධානය යොමු විය යුතු යයි මම අදහස් කරමි. එය හොඳ පොතකි. එසේ කියන්නේ එහි ඇති විධිමත්කම නිසාම නොවේ. එය අපගේ සම්මේලනය සඳහා ලියන ලද නිසාම නොවේ. කෙසේ හෝ වේවා, අපි සියලු දෙනාම මේ දක්වා යෝජනා ලිවීමට පුරුදුව සිටියෙමු. නිරස සාහිත්‍යය හැර අන් සියලුම සාහිත්‍යය හොඳ යයි කියනු ලැබේ. යෝජනා නිරස සාහිත්‍ය ගණයෙහි ලා සැලකිය යුතු යයි මම අදහස් කරමි. ගුසෙව් සහෝදරයාගේ ආදර්ශය අනුගමනය කරමින් අඩුවෙන් යෝජනා ලිවීමද, ඔහුගේ පොත මෙන් වැරදිවලින් ගහනව හෝ වැඩියෙන් පොත් පොඩි ලිවීමද, වඩා හොඳය. රට මුළුල්ලේම කර්මාන්තය සහ නිෂ්පාදනය පුනරුත්ථාපනය කිරීම සඳහා වූ මූලික ආර්ථික සැලැස්මක් කෙරෙහි එහි අවධානය ඉලක්ක වී ඇති හෙයින් හා එය සියල්ලක්ම මෙම මූලික සැලැස්මට යටත් කරන හෙයින්, එහි වැරදි ඇතත්, එම පොත හොඳය. මධ්‍යම කාරක සභාව ගුසෙව් සහෝදරයාගේ පොතෙන් සම්පූර්ණ වගන්තියක්ම ගෙන එය අද බෙදා හරින ලද ප්‍රවාදවලට ඇතුළත් කර තිබේ. විශේෂඥයන්ගේ ආධාරය ඇතිව, මෙම මූලික ආර්ථික සැලැස්ම වඩාත් සවිස්තර ලෙස සකස් කර ගත හැකිය. සැලැස්ම ඉදිරි වර්ෂ ගණනාවක්ම සඳහා අරමුණු කරන ලද්දක් බව අපි මතක තබා ගත යුත්තෙමු. රට එක් වරම සාගින්නෙන් මුදාගන්නා බවට අපි පොරොන්දු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නොදෙමු. ඒ සඳහා කරන අරගලය යුද පෙරමුණේ අරගලයට වඩා බොහෝ දුෂ්කර එකක් බව අපි කියන්නෙමු. නමුත්, එය වූකලී අප තවත් වැඩි උනන්දුවකින් කරන අරගලයකි. එම අරගලය මගින් අපි අපගේ හදිසි සහ ප්‍රධාන කර්තව්‍යයන් වෙත තව දුරටත් සමීප වන්නෙමු. ඒ සඳහා උපරිම පරිශ්‍රමයත්, අප ඉහත දී ගෙන හැර පෑ සහ දනුදු ගෙන හැර පෑ යුතු අධිෂ්ඨානයේ එක්සත් කමත්, අවශ්‍ය වන්නේය. අපි මෙය ඉටු කරන්නෙමු නම්, සිවිල් යුද්ධ පෙරමුණෙහිදී ලද ජයග්‍රහණයට වඩා නොදෙවැනි ජයග්‍රහණයක් ලේ වැගිරීමෙන් තොර පෙරමුණෙහිදීද අත් කර ගන්නෙමු. (අත්පොළසන්.)

ප්‍රාව්ද අංක 69 හා 70.
1920 මාර්තු 30 හා 31

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 40, පිටු 237–257

පැරණි සමාජ ක්‍රමය වැනසීමේ සිට නව සමාජ ක්‍රමය නිර්මානය කිරීම දක්වා

අපගේ පුවත් පත[30] කැප වී තිබෙන්නේ කොමියුනිස්ට් ශ්‍රමය පිළිබඳ ප්‍රශ්න වෙනුවෙනි.

සමාජවාදය ගොඩනැගීමේදී ඉතාමත් වැදගත් වන ප්‍රශ්නය මෙයයි. ප්‍රායෝගික ආකාරයකින් මෙම ප්‍රශ්නය මතු කළ හැකි වූයේ නිර්ධන පංතිය දේශපාලන බලය අල්වා ගත් පසු පමණක් බවත්, ඉඩම් හිමියන් හා ධනපතියන් අසන්තක කරන ලද පසු පමණක් බවත්, නිර්ධන පංතිය රාජ්‍ය බලය අල්වා ගැනීමෙන් පසුව දරුණු ප්‍රතිරෝධයක් පෑ සහ ප්‍රතිවිප්ලවවාදී කැරලි හා සිවිල් යුද්ධය සංවිධානය කළ සූරාකන්නන් පරදවා නිර්ධන පංතිය තීරණාත්මක ජයග්‍රහණය ලැබීමෙන් පසු පමණක් බවත්, අපි ප්‍රථමයෙන්ම ඉතා පැහැදිලි ලෙස වටහා ගත යුත්තෙමු.

1918 වර්ෂයේ මුල් අවදියේදී නිසි කල් එළඹ ඇති බවක් පෙනී ගියේය. ඇත්ත වශයෙන් රුසියාවට විරුද්ධව ජර්මන් අධිරාජ්‍යවාදය එල්ල කළ (1918) පෙබරවාරි යුද්ධ ප්‍රහාරවලින් පසුව සුදුසු කාලය එළඹ තිබිණි. නමුත් එම අවස්ථාවේදී ලැබුණු කාලය ඉතා කෙටි විය. එකල නව සහ වඩාත් බලවත් ප්‍රතිවිප්ලවවාදී කැරලි සහ ආක්‍රමණ නැමති රැළි මාලා කොතරම් නම් ඉක්මණින් අපට උඩින් ගලා ගියේද යත්, සාමකාමී සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න කෙරෙහි සමීප ලෙස හා අනවරථ ලෙස යොමු වීමේ කිසිම ඉඩක් සෝවියට් ආණ්ඩුවට නො ලැබුණි.

අභූත පූර්ව සහ මවිත කර තරම් දුෂ්කරතාවයන්ගෙන් පිරි දෙවර්ෂයක්, සාගතය, අගහිඟකම හා ආපදාව උතුරා ගිය දෙවර්ෂයක්, ඒ සමගම ජාත්‍යන්තර ධනපති ප්‍රතිගාමීත්වයේ මහා හමුද පරදවා රතු හමුදාව ලත් අනුපමේය ජයග්‍රහණයන් ගෙන ආ දෙවර්ෂයක්, දැන් අපි ගත කර ඇත්තෙමු.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අපට වඩාත් ස්ථිර සහ කල් පවත්නා සාමයක් ලැබෙතැයි (අපට විරුද්ධ යුද්ධ කරන සේ ප්‍රංශ ධනපතියන් විසින් පෝලන්තය පොළඹවනු නොලැබුව හොත්) බලාපොරොත්තු ඇති කර ගැනීමට තරම් බරපතල හේතු අද ඇත.

මෙම අවුරුදු දෙක අතරතුරදී, සමාජවාදයේ පදනම සංවිධානය කිරීමෙහි යම් තරමක පළපුරුද්දක් ලබා ගැනීමට අපට හැකි විය. අප එක එල්ලේම කොමියුනිස්ට් ශ්‍රමය පිළිබඳ ප්‍රශ්නයට අත ගැසීමෙහි සමත් වන්නේ හා අප එසේ කළ යුත්තේ එහෙයිනි. මෙහිදී කොමියුනිස්ට් ශ්‍රමය යයි කියනවාට වඩා සමාජවාදී ශ්‍රමය යන්න යෙදීම වඩාත් නිවැරදි වනු ඇත. මන්ද යත්, අප සලකා බලමින් සිටින්නේ ධනපති ක්‍රමයෙන් වැඩී එන නව සමාජ ක්‍රමයේ ඉහළ අවධිය ගැන නොව, එහි පහළ, ප්‍රාථමික අවධිය ගැන වන හෙයිනි.

වචනයේ පටු සහ ඒකාන්ත අර්ථය අනුව කොමියුනිස්ට් ශ්‍රමය යනු, නිශ්චිත කාර්ය නියමයක් ඉටු කිරීමක් වන ශ්‍රමය නොව, යම් නිෂ්පාදිතයන් ලබා ගැනීම සඳහා නොව, කලින් ස්ථාපිත වූ සහ නීතිමය වශයෙන් නියම කළ වැඩ සලාකයන් අනුව නොව, සමාජයේ යහපත සඳහා, වැඩ සලාකයන් ගැන නොසිතා ඉටු කරන ස්වේච්ඡා ශ්‍රමයයි. එය වූකලී, ප්‍රතිලාභ අපේක්ෂාවෙන් තොරව, කොන්දේසියක් ලෙසට ප්‍රතිලාභ නොලබා ඉටු කරන, පොදු යහපත සඳහා වැඩ කිරීම පුරුද්දක් වී තිබීම අනුව හා පොදු යහපත සඳහා වැඩ කිරීමේ අවශ්‍යතාවය පිළිගැනීමේ පිළිබඳ, පුරුද්දක් වී තිබූ අවබෝධයෙන් ඉටු කරන ශ්‍රමයයි. සෞඛ්‍ය සම්පන්න ජීවේන්ද්‍රියකට අවශ්‍ය වන්නාවූ ශ්‍රමයයි.

මෙම ශ්‍රම ආකෘතිය, පුළුල්, සැබැවින්ම පොදුජන පරිමාණයකින් ක්‍රියාත්මක කිරීමට අප, එනම්, අපගේ සමාජ ක්‍රමය තවත් බොහෝ දුරක් යායුතු බව සෑම කෙනෙකුටම පැහැදිලි විය යුතුය.

නමුත්, මෙම ප්‍රශ්නය මතුකර තිබීම ම, මුළු දියුණු නිර්ධන පංතියම (කොමියුනිස්ට් පක්ෂය සහ වෘත්තීය සමිති) සහ රාජ්‍ය ආයතන යන දෙකම විසින්ම මතු කර තිබීමම, මෙම දිසාවම බලා තබන ලද පියවරකි.

මහා ජයග්‍රහණ ලැබීම සඳහා අපි කුඩා දේවලින් පටන් ගත යුත්තෙමු.

අනික් අතට, ධනපති අයිතිය පෙරළා දමූ සහ නිර්ධන පංතිය බලයට පත් කළ පසු "මහා ජයග්‍රහණ", එනම්, නව පදනමක් මත ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කිරීම ආරම්භ කළ හැක්කේ කුඩා දේවලින් පමණකි.

සුබොත්නික් ව්‍යාපාර, ශ්‍රම හමුදා, අනිවාර්ය ශ්‍රම සේවයට බඳවා ගැනීම යන මේවා, විවිධ ආකෘති අනුව සමාජවාදී සහ කොමියුනිස්ට් ශ්‍රමය ප්‍රායෝගික වශයෙන් යොදවා ගැනීමකි.

මෙම ප්‍රායෝගික යොදවා ගැනීම තවමත් දුර්වල කම් රැසකට යටත්ව පවතී. අපි ධනපති ක්‍රමයේ වීරයන් අත් හරින්නෙමු නම්, එම ආකෘති දැක අවඥාවෙන් සිනා සීමට (නැතහොත් කෝප වීමට) සමත් වනු ඇත්තේ කල්පනා කිරීමේ ශක්තිය සම්පූර්ණයෙන්ම අහිමි අය පමණකි.

එබඳු අළුත්, දුෂ්කර සහ ශ්‍රේෂ්ඨ කටයුත්තකදී අඩුපාඩු කම්, දුර්වලකම්, වැරදීම් සිදුවීම වැලැක්විය හැකි නොවේ. සමාජවාදය ගොඩනැගීමේ දුෂ්කරතාවයන්ට බිය වන අය, ඒවායින් තමන් බිය වැදීමට ඉඩ තබන අය, බලාපොරොත්තු සුන් කර ගන්නා සහ බියගුළු ලෙස විමති වන අය, සමාජවාදීහු නොවෙති.

නව ශ්‍රම විනයක්, ජනතාව අතර සමාජ සම්බන්ධකම් පිළිබඳ නව ආකෘති සහ ජනතාව ශ්‍රමයට අද්දා ගැනීමේ නව ආකෘති හා විධික්‍රම නිමවා ගැනීම සඳහා අවුරුදු ගණනාවක් ගත වනු ඇත.

එම වැඩ කටයුතු ඉතාමත් තෘප්තිදයකය. උතුම්ය.

ධනපති පංතිය බලයෙන් පහ කර දැමීමෙන් සහ එහි ප්‍රතිරෝධය මර්දනය කිරීමෙන්, මෙම වැඩ කටයුතු කිරීමට ඉඩ කඩ ඇති තත්වයක් දිනා ගැනීමට හැකි වීමේ වාසනාව අපට ලැබී තිබේ.

අපි අපගේ මුළු ශක්තියෙන් මෙම කටයුත්තෙහි යෙදෙන්නෙමු. කාරණා ගැන සිය වරක් අත්හද බැලීමට, ඒවා සිය වරක් නිවැරදි කිරීමට, එහෙත් මොනවා වුවත්, අරමුණ ඉටු කර ගැනීමට ඇති දැඩි උත්සාහය, නොපසුබට ස්වභාවය, කැමැත්ත, අධිෂ්ඨානය හා හැකියාව — ඔක්තෝබර් විප්ලවයට පෙර අවුරුදු දහය, පහළොව, නැතහොත්, විස්ස තුළ සහ විප්ලවයෙන් පසුව ගත කළ අභූත පූර්ව අගහිඟකම, සාගින්න, විනාශය හා අසරණ කම සහිත දෙඅවුරුද්ද තුළ නිර්ධන පංතිය ඇති කරගත් ගතිගුණ එසේය. නිර්ධන පංතියේ මෙම ගතිගුණ වූ කලී එය ජයගන්නා බව කියන ඒකාන්ත සහතිකය වන්නේය.

1920 අප්‍රේල් 8

"කොමියුනිස්ට්වෙස්කි සුබොත්නික්", 1920 අප්‍රේල් 11

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 40, පිටු 314–316

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

‘‘වාමාංශික’’ කොමියුනිස්ට්වාදය ළදරු වලිප්පුවකි

I

රුසියානු විප්ලවයේ ජාත්‍යන්තර වැදගත්කම ගැන අපට කථා කළ හැක්කේ කුමණ අර්ථයක් අනුවද?

නොදියුණු රුසියාව හා බටහිර යුරෝපයේ දියුණු රටවල් අතර පවතින අති විශාල වෙනස හේතුකොට ගෙන, එම පසු කී රටවල නිර්ධන පංති විප්ලවය අපගේ විප්ලවයට සමාන වනු ඇත්තේ ඉතාමත් ස්වල්ප වශයෙන් යයි, රුසියාවේ නිර්ධන පංතිය බලය අත්පත් කර ගැනීමෙන් (1917 ඔක්තෝබර් 25 [නොවැම්බර් 7]) පසු ප්‍රථම මාසවලදී පෙනී යා හැකිව තිබුණි. අපි දැනටමත් බොහෝ ජාත්‍යන්තර අත්දැකීම් ලබා ඇත්තෙමු. අපගේ විප්ලවයේ ඇතැම් මූලික අංග ලක්ෂණ රටට පමණක් සීමා නොවූ, ජාතික විශේෂතාවයක් නොවූ, හුදෙක් රුසියානු පමණක් නොවූ, ජාත්‍යන්තර වැදගත් කමක් දරන බව මෙම අත් දැකීම් අනුව ඒකාන්ත ලෙස පැහැදිලි වන්නේය. මා මෙහි දී ජාත්‍යන්තර වැදගත් කම ගැන සඳහන් කරන්නේ එහි පුළුල් අර්ථයෙන් නොවේ; අපගේ විප්ලවයේ මූලික අංග ලක්ෂණ බොහෝ ගණනක් නොව සියල්ලමත්, එහි ද්විතීය අංගලක්ෂණ බොහොමයකුත්, සියළුම රටවල් කෙරෙහි බලපාන නිසා, ඒවා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන්නේය යන අර්ථයෙන් නොවේ. ජාත්‍යන්තර වැදගත්කම යන්නෙන් අප රටේ සිදු වූ දෙයෙහි ජාත්‍යන්තර වටිනාකම, නැතහොත්, එය ජාත්‍යන්තර පරිමාණයෙන් නැවත සිදුවීම ඓතිහාසික වශයෙන් නොවැලැක්විය හැකි බව පළ වෙතැයි සලකා මා එය ගැන සඳහන් කරන්නේ, වචනයේ පටුම අර්ථයෙනි. අපගේ විප්ලවයේ ඇතැම් මූලික අංග ලක්ෂණ එසේ වැදගත් වන බව පිළිගත යුතු වනනේය.

නමුත්, මෙම සත්‍යය අතිශයෝක්තියෙන් දැක්වීම හා එය අපගේ විප්ලවයේ සමහර අංග ලක්ෂණවලින් ඔබ්බට විහිදවීම බරපතල වරදක් වනු ඇත. දියුණු රටවල් අතුරෙන් යටත් පිරිසෙයින් එකක හෝ නිර්ධන පංති විප්ලවය ජයග්‍රහණය කිරීමෙන් පසු, අප්‍රමාදවම තියුණු වෙනසක් සිදුවීමට ඉඩ තිබෙන බව අමතක කිරීමද, වරදක් වනු ඇත. එවිට, රුසියාව ආදර්ශමත් රට වීමේ තත්වය කෙළවර වී, එය නැවතත් (‘‘සෝවියට්’’ සහ සමාජවාදී අර්ථයෙන්) නොදියුණු රටක තත්වය ගනු ඇත.

එසේ වුවද, මෙම අවස්ථාවේදී, සියළුම රටවලට ඒවායේ නුදුරු සහ නොවැලැක්විය හැකි අනාගතය ගැන යමක් උගන්වන්නේ, එසේම, ඉතාමත් වැදගත් යමක් උගන්වන්නේ, රුසියානු ආදර්ශය යි. සියළුම රටවල දියුණු කම්කරුවෝ බොහෝ කලක සිටම මෙය වටහා ගෙන සිටිති. බොහෝ අවස්ථාවල ඔවුහු මෙය අවබෝධයෙන් වටහා ගන්නවාට වඩා, ස්වකීය විප්ලවවාදී පංති සහජාසයෙන් මෙය ග්‍රහණය කරගෙන සිටිති. සෝවියට් බලයෙහි සහ බොල්ෂෙවික් න්‍යායයෙහි හා උපක්‍රමවල ‘‘වැදගත්කම (වචනයේ පටු අර්ථයෙන්) රැඳී ඇත්තේ මෙහිය. ජර්මනියේ කෞට්ස්කි සහ ඔටෝ බවර්ද, ඔස්ත්‍රියාවේ ප්‍රෙඩ්රික් අඩ්ලර්ද වැනි දෙවැනි ජාත්‍යන්තරයේ ‘‘විප්ලවවාදී’’ නායකයෝ මෙය වටහා ගැනීමට අසමත් වූහ. ඔවුන් ප්‍රතිගාමීන් සහ අන්තතම අවස්ථාවාදයේ හා සමාජ ද්‍රෝහිත්වයේ පක්ෂවාදීන් බවට පත්වූයේ එනිසා ය. 1919 දී වියානා නුවරදී Sozialistische Bücherei, Heft II; Ignaz Brand පළ කෙරුණු ‘‘ලෝක විප්ලවය’’ Weltrevolution[32] නැමති පොත් පිංචෙන් ඔවුන්ගේ සම්පූර්ණ චින්තනය සහ අදහස් මාලාවම, නැතහොත් ඔවුන්ගේ මෝඩ, අතිපණ්ඩිත කමේ සහ නීච කමේ මුළු බරපතල කමද, ඔවුන් කම්කරු පංතියේ උවමනාවන්ට ද්‍රෝහී වූ තරමද, හෙළිදරව් වන බව මෙහිලා සඳහන් කරමු. තවද, ඔවුන් එසේ ක්‍රියා කරන්නේද,‘‘ලෝක විප්ලවය’’ පිළිබඳ අදහස ‘‘ආරක්ෂා කිරීමේ’’ මුවාවෙනි.

එසේ වුවද, මෙම පොත් පිංච ගැන වඩාත් විස්තර සහිතව කරුණු සඳහන් කිරීම වෙනත් අවස්ථාවකදී කරන්නෙමු. මෙහිදී අපි තවත් එක කරුණක් ගැන පමණක් සඳහන් කරමු. ඉහතදී, කෞට්ස්කි ද්‍රෝහියෙකු නොව තවමත් මාක්ස්වාදියෙකුව සිටියදී, ඉතිහාසඥයෙකු ලෙස ප්‍රශ්නය විමසිල්ලට ලක් කළ ඔහු, රුසියානු නිර්ධන පංතියේ විප්ලවවාදී ජීව ගුණය බටහිර යුරෝපයට ආදර්ශයක් දෙන තත්වයක් ඇති විය හැකි බව කල් තබා දුටුවේය. ඒ 1902 දී විය. එම වර්ෂයේ විප්ලවවාදී ‘‘ඉස්ක්‍රා’’[33] පත්‍රයට ‘‘ස්ලාව් ජාතිකයින් සහ විප්ලවය’’ යන මැයෙන් ලිපියක් සැපයූ ඔහු, එහි මෙසේ සඳහන් කළේය:

> ‘‘ස්ලාව් ජාතිකයන් විප්ලවවාදී ජාතීන් අතරට පත්ව සිටින බව පමණක් නොව, විප්ලවවාදී චින්තනයේ සහ විප්ලවවාදී ක්‍රියාකාරිත්වයේ කේන්ද්‍රස්ථානය වඩ වඩාත් ස්ලාව් ජාතිකයන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙතට යොමුවෙමින් පවතින බවද (1848 වර්ෂයට විසංසන්දනය වන පරිද්දෙන්), වර්තමාන කාලයේ දී පෙනී යන්නේය. විප්ලවවාදී කේන්ද්‍රස්ථානය බටහිර සිට නැගෙනහිරට සංක්‍රමණය වෙමින් පවතී. දහනව වැනි ශත වර්ෂයේ මුල් භාගයේදී එය ප්‍රංශයේ සහ ඇතැම් විට, එංගලන්තයේ රැඳී තිබුණි. 1848 දී ජර්මනියද විප්ලවවාදී ජාතීන්ට එකතු විය... . නව ශත වර්ෂය ආරම්භ වූයේ විප්ලවවාදී කේන්ද්‍රස්ථානය තව දුරටත්, එනම්, රුසියාවට, මාරුවන අවස්ථාවකට අප ළඟා වෙමින් සිටින බව හඟවන සිදුවීම් සමගය. ... බටහිරෙන් මේ තරම් විප්ලවවාදී ක්‍රියාරම්භකත්වය ලබා ගත් රුසියාව, දැන් සමහරවිට විප්ලවවාදී ශක්තිය දෙන මූලාශ්‍රයක් ලෙසට බටහිරට සේවා කිරීමට තමන්ම සූදානම්ව සිටිනවා විය හැක. දැන් අප අතර පැතිර යාමට පටන් ගෙන තිබෙන ඕතෑනි අමනවාදය සහ හැඟීමෙන් තොර කුම්මැහි දේශපාලනය පිළිබඳ ජීව ගුණය දමනය කරන ඉතාමත් බලවත් බලවේගය වනුයේ, සමහරවිට දැන් ඇවිලී යමින් පවතින රුසියානු විප්ලවවාදී ව්‍යාපාරය විය හැකිය. සටන් කාමීත්වයත්, ශ්‍රෙෂ්ඨ පරමාදර්ශයන් කෙරෙහිවූ අපගේ කැපවීමත්, නැවත ඇවිල යාමට එය සමහරවිට හේතු විය හැකිය. රුසියාව ප්‍රතිගාමිත්වයේ සහ පරම අධිපතිවාදයේ බල පවුරක් ලෙසට බටහිර යුරෝපයට පෙනුනු කාලය ගෙවී ගොස් බොහෝ කල්ය. අද සත්‍යය එහි අනිත් පැත්ත යයි මම සිතමි. බටහිර යුරෝපය රුසියාවේ ප්‍රතිගාමිත්වයේ සහ පරම අධිපතිවාදයේ බලපවුර බවට පත් වෙමින් තිබේ. ... සාර්ට විරුද්ධව සටන් කරන අතරම, ඔහුගේ මිතුරා වන යුරෝපීය ප්‍රාග්ධනයටද විරුද්ධව එකවර සටන් කිරීමට රුසියානු විප්ලවවාදීන්ට සිදු නොවිනි, නම්, මීට බොහෝ කලකට පෙර ඔවුන්ට සාර් මෙල්ල කර ගත හැකිව තිබුණි. මෙවර ඔවුන්ට සතුරන් දෙදෙනාම මෙල්ල කළ හැකි වේවා යයිද, නව ''ශුද්ධ සන්ධානය'' එහි පූර්වගාමී සන්ධානයන්ට වඩා සීඝ්‍රයෙන් බිඳවැටේවි යයි අපි බලාපොරොත්තු වෙමු. රුසියාවේ වර්තමාන අරගලය කුමණ ආකාරයෙන් කෙළවර වුවත්, එම අරගලයේ වීරයන් වගුරන ලේ ධාරාවන් හා විඳින දුක් වේදනා නිරර්ථක නොවනු ඇත. අවාසනාවකට මෙන් මෙම අරගලයේදී එසේ වීරත්වයට පත් කෙරෙන සංඛ්‍යාව අති විශාල වන අතර ඔවුන් නිසා සමස්ත ශිෂ්ටාචාර ලෝකයේම සමාජ විප්ලවයේ අංකුර පෝෂණය වී ඒවා වඩාත් සාරවත් ලෙස හා සීඝ්‍ර ලෙස වැඩෙනු ඇත. ස්ලාව් ජාතිකයෝ 1848 වර්ෂයේ ජනතා වසන්තයේ මල් කුරෝලු කර දැමූ මාරක හිම පතනයක් සේ ක්‍රියාත්මක වූහ. දැන් සමහරවිට, ඔවුන්, ප්‍රතිගාමිත්වය ප්‍රථමයෙන් බිඳ දමන හා ජාතීන් සඳහා නව සහ වාසනාවන්ත වසන්තයක් ගෙන එන කුණාටුව වීමට ඉරණම්ව සිටිනවා විය හැක'' (කාල් කෞට්ස්කි, ''ස්ලාව් ජාතිකයින් සහ විප්ලවය'', ''ඉස්ක්‍රා'' රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවවාදී ප්‍රවෘත්ති පත්‍රය, අංක 18, 1902 මාර්තු 10).

අවුරුදු දහ අටකට පෙර කාල් කෞට්ස්කි ලියූ සැටි අගනේය!

II

බොල්ෂෙවික්වරුන්ගේ ජයග්‍රහණයට හේතුවූ වැදගත් කොන්දේසියක්

අප පක්ෂයේ තදබල සහ සැබැවින්ම අයෝමය විනයක් නොතිබෙන්නට, එසේ නැතහොත්, මුළු වැඩකරන ජනතා සමූහයාගේම, එනම්, එහි වන සියළුම සිතන, අවංක, කැප වූ හා බලපෑමක් සහිත වූ ද, නොදියුණු ස්ථරයන්ට නායකත්වය දීමෙහි හෝ එම ස්ථරයන් තමන් සමග ඉදිරියට ගෙන යාමෙහි හෝ සමත් වූ ද, කොටස්වල සම්පූර්ණ සහ කොන්දේසි විරහිත සහයෝගය පක්ෂයට නොලැබෙන්නට, බොල්ෂෙවික් වරුන්ට අවුරුදු දෙක හමාරක් තබා මාස දෙක හමාරක්වත් බලය රැක ගැනීමට නොහැකි වන්නට තිබුණු බව දැන් සියළු දෙනාටම පාහේ වැටහී ඇතැයි යනු මම සිතමි.

නිර්ධන පංති ආඥාදායකත්වය යනු නව පංතිය විසින් තමන්ට වඩා බලවත් සතුරෙක් වන ධනපති පංතියට විරුද්ධව කරන ඉතාමත් අධිෂ්ඨාන සහගත සහ නිර්දය යුද්ධයකි. ධනපති පංතිය (එක රටක් තුළ පමණක් වුව) බලයෙන් පහ කර දමනු ලැබීම නිසා එහි ප්‍රතිරෝධය දස ගුණයකින් වැඩි වී තිබේ. එහි බලය රඳා පවතින්නේ ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ ශක්තිය තුළ, ඔවුන්ගේ ජාත්‍යන්තර සම්බන්ධතාවයන්ගේ ශක්තිය හා කල්පවත්නා ස්වභාවය තුළ පමණක් නොවේ. පුරුද්දෙහි දැඩි බව තුළත්, කුඩා පරිමාණ නිෂ්පාදනයේ ශක්තිය තුළත් එම සතුරාගේ බලය රැඳී ඇත. අවාසනාවකට මෙන් කුඩා පරිමාණ නිෂ්පාදනය තවමත් ලොව පුරා පැතිර පවතී. එමෙන්ම කුඩා පරිමාණ නිෂ්පාදනය නොකඩවාම, දිනපතාම, පැයක් පැයක් පාසාම, සාංසිද්ධික ලෙස සහ බහුජන පරිමාණයෙන් ධනපති ක්‍රමය සහ ධනපති පංතිය උත්පාද කරයි. මේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සියළු කරුණු නිසා නිර්ධන පංති ආඥාදායකත්වය අවශ්‍ය වන්නේය. ධෛර්යයක්, විනයක්, ඒකීය සහ අනම්‍ය අධිෂ්ඨානයකුත් අවශ්‍ය වන දීර්ඝ, නොපසුබට සහ දිවි නොතකන දරුණු අරගලයකින් තොරව ධනපති පංතිය පරදවා ජයගත හැකි නොවේ.

මම නැවතත් මෙසේ කියමි: ධනපති පංතිය පරදවා ජයග්‍රහණය ලැබීම සඳහා නිර්ධන පංතියේ පරිසමාප්ත මධ්‍යගත කරණය හා දැඩි විනය අත්‍යවශ්‍ය වන බව, සිතීමට නොහැකි අයට පවා, නැතහොත්, එම කරුණ ගැන සිතා බැලීමට අවස්ථාවක් නොලද අයට පවා, රුසියාවේ ජයග්‍රාහී නිර්ධන පංති ආඥාදායකත්වයේ අත් දැකීමෙන් පැහැදිලි ලෙස පෙන්නුම් කර තිබේ.

මේ ගැන බොහෝ විට කථා කරනු ලැබේ. එසේ වුවද, එහි අරුත හා එය ක්‍රියාත්මක විය හැක්කේ කුමණ කොන්දේසි යටතේද යන්න ගැන ප්‍රමාණවත් තරම් සිතා බලනු නොලැබේ. සෝවියට් සභා සහ බොල්ෂෙවික්වරුන් අමතා ගෞරවාචාර දක්වන විට, විප්ලවවාදී නිර්ධන පංතියට අවශ්‍ය විනය ගොඩනැගීමට බොල්ෂෙවික්වරුන් පොහොසත් වූයේ මන්ද යන කරුණ ගැන සාර ගර්භ විශ්ලේෂණයක්ද වඩාත් නිරන්තර ලෙස ඇතුලත් කරන ලද්දේ නම් හොඳ නොවේ ද?

දේශපාලන චින්තන ධාරාවක් වශයෙන්ද, දේශපාලන පක්ෂයක් වශයෙන්ද බොල්ෂෙවික්වාදය 1903 වර්ෂය පටන් පැවතියේය. නිර්ධන පංතියේ ජයග්‍රහණය සඳහා අවශ්‍ය වූ අයෝමය විනය ඉතාමත් දුෂ්කර තත්වයන් යටතේ ගොඩ නැගීමට සහ පවත්වා ගැනීමට බොල්ෂෙවික්වාදයට හැකි වූයේ මන්ද යන්න සතුටුදායක ලෙස පැහැදිලි කළ හැක්කේ බොල්ෂෙවික්වාදයේ පැවැත්මේ මුළු කාල පරිච්ඡේදය පුරා විහිදුණු එහි ඉතිහාසය මගින් පමණකි.

එහිදී මුලින්ම මතුවන ප්‍රශ්න මෙසේය: නිර්ධන පංතියේ විප්ලවවාදී පක්ෂයේ විනය පවත්වා ගනු ලබන්නේ කෙසේද? එය පරීක්ෂාවට භාජනය කරන්නේ කෙසේද? එය ශක්තිමත් කරන්නේ කෙසේද? ප්‍රථමයෙන්ම එය සිදු කෙරෙන්නේ නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණියෙහි පංති විඥානයෙන් හා විප්ලවය කෙරෙහි වූ එහි කැප වීමෙන්ද, එහි නො පසුබස්නා වීර්යයෙන්, ආත්ම පරිත්‍යාගයෙන් සහ වීරත්වයෙන්ද වේ. දෙවැනිව, එය සිදු කෙරෙන්නේ වැඩ කරන ජනතාවගේ පුළුල්තම කොටස් සමග, මූලික වශයෙන්ම නිර්ධන පංතියත්, එමෙන්ම, වැඩකරන ජනතාවගේ නිර්ධන පංතික නොවන පොදු ජනතාවත් සමග ගැලපීමට, සමීපතම සම්බන්ධකම් පැවැත්වීමට සහ එක්තරා දුරකට — ඔබ එසේ කීමට කැමති නම් — සංයෝග වීමට එහි ඇති හැකියාව තුළිනි. තුන්වැනිව එය සිදු කෙරෙන්නේ, මෙම පෙරමුණු බල ඇණිය දෙන

දේශපාලන නායකත්වයේ නිරවද්‍යතාවයත්, එහි දේශපාලන පොදු ක්‍රියාමාර්ගයෙහි සහ උපක්‍රමවල නිරවද්‍යතාවයත්, ඒවා නිවැරදි බව ජනතාව ඔවුන්ගේම අත්දැකීම් තුළින් දැක තිබීමත් අනුවය. මෙම කොන්දේසි ඉටු වීමෙන් තොරව, කිසිසේත් සාර්ථක කර ගත නොහැකි දෙයකි, දියුණු පංතියේ පක්ෂය වීමෙහි සැබැවින්ම සමත් හා ධනපති පංතිය බලයෙන් නෙරපා දැමීම සහ මුළු සමාජයම පරිවර්තනයකට භාජනය කිරීම ස්වකීය පරමාර්ථය කොට ගත්,විප්ලවවාදී පක්ෂයක විනය ඇති කිරීම. මෙම කොන්දේසි ඉටු කිරීමෙන් තොරව විනය ඇති කිරීමට දරන සියළුම ප්‍රයත්නයන් ව්‍යර්ථ වීමත්, ඒවා වදන් හරඹයෙන් සහ උසුළු විසුළුවලින් කෙළවර වීමත් නොවැලැක්විය හැකිය. අනිත් අතට මෙම කොන්දේසි එක්වරම උද්ගත වන්නේද නොවේ. ඒවා නිර්මාණය කරනු ලබන්නේ දීර්ඝ පරිශ්‍රමයන් සහ වෙහෙස විඳ ලබන අත් දැකීම් මගිනි. නිවැරදි විප්ලවවාදී න්‍යායයක් තිබීම එම කොන්දේසි නිර්මාණය වීමට පහසුවක් වන නමුත් න්‍යායය ඇදහිල්ලක් නොවන්නේය. න්‍යායය එහි අවසාන හැඩහුරුව ලබන්නේ සැබැවින්ම පොදුජන සහ සැබැවින්ම විප්ලවවාදී ව්‍යාපාරයක ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය හා සමග සමීප සම්බන්ධයක් ඇතිව පමණකි.

1917–1920 කාලයේදී, පෙර නොවූ විරූ තරම් දුෂ්කර තත්වයන් යටතේ දැඩිතම මධ්‍යගතකරණයක් සහ අයෝමය විනයක් ගොඩ නගා එය පවත්වා ගැනීමට බොල්ෂෙවික්වාදයට හැකිවූයේ, හුදෙක්ම රුසියාවට ආවේනිකවූ ඓතිහාසික විශේෂතාවයන් ගණනාවක් හේතුකොට ගෙන ය.

එක් අතකින් 1903 දී බොල්ෂෙවික්වාදය ඉස්මතු වූයේ මාක්ස්වාදී න්‍යායය පිළිබඳ ඉතා ශක්තිමත් පදනමක් මත ය. මෙම විප්ලවවාදී න්‍යායය නිවැරදි බව, එය පමණක් නිවැරදි බව, දහනමවැනි ශත වර්ෂය මුළුල්ලේම ලෝකයා ලැබූ අත් දැකීම්වලින් පමණක් නොව, රුසියාවේ විප්ලවවාදී චින්තනයේ සෙවුම් බැලුම් හා චපලකම්වලින්ද, වැරදීම් සහ සුන්වූ බලාපොරොත්තුවලින්ද, ඔප්පු වී තිබේ. අර්ධ ශත වර්ෂයක් පමණ කාලයක් තිස්සේ, දළ වශයෙන් පසුගිය ශත වර්ෂයේ හතළිස් ගණන්වල පටන් අනූගණන් දක්වා, ඉතාමත් දරුණු හා ප්‍රතිගාමී සාර්වාදයෙන් පීඩිතවූ රුසියාවේ ප්‍රගතිශීලී චින්තනය, මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධයෙන් වූ යුරෝපයේ හා ඇමෙරිකාවේ සෑම නිශ්චයාර්ථයක්ම ගැන අති මහත් උද්යෝගයෙන් හා අංග සම්පූර්ණත්වයෙන් යුතුව විමසා බැලුවේය. අසමසම වධ හිංසා විඳීමේ සහ කැප කිරීම් දැරීමේද, අපරිමිත වීරත්වයේ, නො ඇදහිය හැකි ධෛර්යයේ සහ භක්තිමත් විමර්ශනයේ, අධ්‍යයනයේ, ප්‍රයෝගික පරීක්ෂණයේ, බලාපොරොත්තු සුන් වීමේ, හරිවැරදි බැලීමේ හා යුරෝපීය අත්දැකීම් සමග සන්සන්දනය කිරීමේද, අඩ සිය වසරක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තිස්සේ විඳිනා ලද පෙර නොවූ විරූ තරම් දරුණු වේදනා තුළින් රුසියාව, මාක්ස්වාදය, නැතහොත්, ඒ එකම නිවැරදි විප්ලවවාදී න්‍යායය දිනා ගත්තේය. සාර්වාදය විසින් ඇති කරන ලද දේශපාලන විගමනයට ස්තුති වන්නට, විප්ලවකාරී රුසියාව අන් කිසිම රටක් සතු නොවූ තරම් වන ජාත්‍යන්තර සම්බන්ධකම් සහ ලෝක විප්ලවීය ව්‍යාපාරයේ ආකෘති සහ න්‍යාය ගැන වූ අගනා තොරතුරු සම්භාරයක් රැස්කර ගත්තාය.

අනිත් අතට, මෙම ශෛලමය පදනම මත ඉස්මතුව තිබුණු බොල්ෂෙවික්වාදය ලෝකයේ වෙන කිසිම තැනෙකදී නොලද විරූ අත් දැකීම් සම්භාරයක් සහිත පසළොස් වසරක (1903–1917) ඉතිහාසයක් ගෙවිවේය. එම විප්ලවවාදී අත්දැකීමට තරමක් හෝ සමාන වූ කිසිවක් පවා, එම පසළොස් වසර තුළ වෙනත් කිසිම රටක සිදුනොවිය. එය වූකලී ව්‍යාපාරයේ නොයෙක් ආකෘති, එනම්, නීති සහගත හා නීතිවිරෝධී, සාමකාමී සහ කුණාටු සහිත, රහසිගත හා විවෘත, ප්‍රාදේශීය කව හා පොදුජන ව්‍යාපාර සහ පාර්ලිමේන්තුවාදය හා ත්‍රස්තය යන ආකෘති එකකින් අනිකට සීඝ්‍රලෙස හා විවිධාකාර ලෙස මාරුවීමේ අත්දැකීමකි. නූතන සමාජයේ සියලුම පංති විසින් කරනු ලබන අරගලයේ, එනම්, රටේ නොදියුණු කමත්, සාර්වාදී වියගසෙහි දරුණු කමත්, නිසා අති සීඝ්‍රතාවයකින් මෝරාගිය, එසේම, ඇමෙරිකානු සහ යුරෝපීය දේශපාලන අත්දැකීම්වල අදාළ නිශ්චයාර්ථයන් අති මහත් උනන්දුවෙන් හා සාර්ථක ලෙස උකහාගත් අරගලයක, ඒසා විශාල සංඛ්‍යාවක් ආකෘති, මතිමාත්‍ර සහ විධික්‍රම, ඒසා කෙටි කාලයක් තුළදී සංකේන්ද්‍රණය වීම දුටු වෙනත් රටක් නොවිය.

III

බොල්ෂෙවික්වාදයේ ඉතිහාසයේ ප්‍රධාන අවධි

විප්ලවය සඳහා වර්ෂ ගණන් කාලයක (1903–1905) සූදානමක් විය. මහා කුණාටුව සමීප වන බව සැම තැනකම දක්නට තිබිණ. පංති සියල්ලම උතුරා හැළෙන සහ සූදානම් වන තත්වයක පැවැත්තේය. විදේශයෙහි දේශපාලන පිටුවහලුන්ගේ පුවත් පත්, විප්ලවයේ මූලික ප්‍රශ්න සියල්ලෙහිම න්‍යායික පැති ගැන සාකච්ඡා කළහ. ලිබරල්-ධනපති, ("සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී" සහ "සමාජ-විප්ලවවාදී" සටන්පාඨ පිටුපස සැඟවී සිටින[34]) සුළුධනපති-ප්‍රජාතන්ත්‍රවාදී සහ නිර්ධන පංති විප්ලවවාදී යන ප්‍රධාන පංති තුනෙහිම, ප්‍රධාන දේශපාලන උපනති තුනෙහිම නියෝජිතයෝ, වැඩපිළිවෙළ හා උපක්‍රම පිළිබඳ ප්‍රශ්න ගැන ඉතාමත් තියුණු අරගලයක යෙදෙමින්, ළඟ එන විවෘත පංති අරගලය බලාපොරොත්තු-

වී. අයි. ලෙනින් ලියූ "වාමාංශික කොමියුනිස්ට් වාදය—ළදරු වලිප්පු-වක්" නැමති කෘතියෙහි පිට කවරය.1920. කුඩා කළ ආකාරයෙනි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙන් හා ඒ සඳහා සූදනම් වෙමින් සිටියහ. 1905–1907 සහ 1917–1920 අවුරුදු වලදී පොදු ජනතාව ගෙන ගිය ආයුධ සන්නද්ධ අරගලයේ සියලුම ප්‍රශ්න, ඒවායේ කලල ස්වරූපයෙන් ගෙන, අදාළ වකවානුවේ පුවත් පත්වලින් අධ්‍යයනය කළ හැකි (හා යුතු) වේ. මෙම ප්‍රධාන උපනති තුන අතර තුර අන්තර්, පරිවර්තනීය හා දෙගිඩියා ආකෘති රැසක්ද තිබුණු බව සැබවි. නියත වශයෙන්ම පංතිමය ස්වරූපයක් දරූ දේශපාලන සහ දෘෂ්ටිමය උපනති, නිල පුවත් පත්, පක්ෂ, කාණ්ඩ සහ කණ්ඩායම් අතර කෙරුණු අරගලයේදී සවි වූ බව කීම වඩාත් නිවැරදි වනු ඇත. පංති, ළඟ එන සංග්‍රාමයන් සඳහා අවශ්‍ය දේශපාලන සහ දෘෂ්ටිමය ආයුධ තනමින් සිටියහ.

විප්ලවයේ අවුරුදු (1905–1907) උදා විය. පංති සියල්ලම එළිමහනට වන්හ. වැඩ පිළිවෙලවල් හා උපක්‍රම පිළිබඳ සියලු අදහස් පොදු ජනතා සටන මගින් පරීක්ෂණයට භාජනය කරන ලදී. වැඩ වර්ජනය, එහි පතල ස්වභාවය හා තියුණු කම අතින් අසම සම තත්වයක් ගත්තේය. ආර්ථික වැඩ වර්ජනය දේශපාලන වැඩ වර්ජනයක් දක්වාද, දේශපාලන වැඩ වර්ජනය කැරලි ගසා නැගී සිටීමක් දක්වාද, සංවර්ධනය විය. නායකයා ලෙසට නිර්ධන පංතියත්, අනුගාමිකයා ලෙසට චපල සහ අස්ථිර ගොවි ජනතාවත් අතර සම්බන්ධ කම් ව්‍යවහාරයට නගා පරීක්ෂා කරන ලදී. අරගලයේ සාංසිද්ධික සංවර්ධනයේදී සෝවියට් සංවිධාන ආකෘතිය උත්පාද විය. සෝවියට් සභාවල වැදගත්කම ගැන එදා කෙරුණු වාද විවාද 1917–1920 මහා අරගලය බලාපොරොත්තුවෙන් කෙරුණේ විය. පාර්ලිමේන්තු හා පාර්ලිමේන්තු නොවන අරගල ක්‍රම ද, පාර්ලිමේන්තුව වර්ජනය කිරීමේ උපාය සහ එයට සහභාගි වීමේ උපායද, නීති සහගත සහ නීති විරෝධී අරගල ආකෘතිද එකක සිට අනිකට මාරු කිරීම මෙන්ම ඒවායේ අන්තර් සම්බන්ධ කම් හා ඒකාබද්ධතාවයන්ද, යන මේ සියල්ලෙන්ම සලකුණු වූයේ අසාමාන්‍ය තරම් සාරවත් සන්ධාරයකි. දේශපාලන විද්‍යාවේ මූලධර්මයන් ගැන උගැන්වීම හා සම්බන්ධයෙන් වූ කල, පොදු ජනතාවට හා නායකයන්ටද, පංතිවලට හා පක්ෂවලටද යන මේ සියල්ලන්ටම එකසේම, මෙම කාල පරිච්ඡේදයේ එක මාසයක්, ''සාමකාමී'' සහ ''ව්‍යවස්ථානුකූල'' සංවර්ධනයේ මුළු අවුරුද්දකටම සමාන වූයේය. 1905 වර්ෂයේ මෙම ''පූරුදු වීම'' නොමැති වී නම් 1917 ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණය කිසිසේත් නොලැබෙන්නට තිබිණි.

ඊළඟට ප්‍රතිගාමිත්වයේ අවුරුදු (1907–1910) පැමිණියේය. සාර්වාදය ජයග්‍රහණය ලැබුවේය. විප්ලවවාදී සහ විරුද්ධ පක්ෂ සියල්ලම විනාශ කරන ලදී. දේශපාලනය වෙනුවට උදාසීනත්වය, දුර්මුඛවීම, භේද, අසමගි කම්, ව්‍යාපාරය හැර යාම සහ අනුරාගය ආදේශ විය. වඩ වඩාත් විශාල

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වශයෙන් දර්ශනික විඥනවාදය දෙසට ගසා ගෙනයාම දක්නා ලදී. ගුප්තවාදය ප්‍රතිවිප්ලවවාදී සිතුම් පැතුම්වල වස්ත්‍රයක් බවට පත්විය. එසේ වුවද, ඒ අතරම, විප්ලවවාදී පක්ෂවලට හා විප්ලවවාදී පංතියට නියම හා ඉතා ප්‍රයෝජනවත් පාඩමක්, ඉතිහාසයේ දයලෙක්තික ක්‍රමය ගැන පාඩමක්, දේශපාලන අරගලය වටහා ගැනීම සහ අරගලය කිරීමේ කලාව හා විද්‍යාව ගැන පාඩමක්, උගන්වන ලද්දේ මෙම ශ්‍රේෂ්ඨ පරාජය විසිනි. අයෙක් තම මිතුරන් කවුරුන්ද යනු දැනගන්නේ අපහසුකම්වලට මුහුණ දෙන අවස්ථාවේදීය. පරාජයට පත් හමුද පාඩම් උගෙන ගනිති.

රුසියාවේ පැවති පූර්ව ධනපති පීතෘ මූලික ජීවන ක්‍රමයේ නෂ්ටාවශේෂයන් විනාශ කර දැමීම ඉක්මන් කිරීම ජයග්‍රාහී සාර්වාදයට නොකර බැරි දෙයක් විය. ධනපති මාර්ගය ඔස්සේ රටේ සංවර්ධනය සීඝ්‍රයෙන් සිදු විය. පංති භේදයෙන් පිටස්තරව හා ඊට ඉහළින් සිටි මායාමත, නැතහොත්, ධනපති ක්‍රමය මග හැර යාමේ හැකියාව පිළිබඳ මායා මත, සුළඟේ විසිර යයි. පංති අරගලය නවතම සහ වඩාත් පැහැදිලි ආකාරයකින් ප්‍රකට වෙයි.

විප්ලවවාදී පක්ෂවලට ඒවායේ අධ්‍යාපනය සම්පූර්ණ කර ගැනීමට සිදුවිය. ඔවුහු පහර දෙන ආකාරය ගැන උගෙන ගනිමින් සිටියහ. එවැනි දැනුමට අමතරව, ක්‍රමානුකූල ලෙස පසු බසින්නේ කෙසේද යන්න ගැනද දැන් දැනුම ලබා ගත යුතු බව අවබෝධ කර ගැනීමට ඔවුන්ට සිදුවිය. නිසි ලෙස පහර දීමටත්, පසුබැසීමටත් යමෙක් උගෙන ගෙන නොමැති නම්, ජය ගැනුමක් කිසිසේත් නොවන බව වටහා ගැනීමට ඔවුන්ට සිදුවිය. විප්ලවවාදී පංතිය මෙම කරුණ වටහා ගැනීමට උගෙන ගන්නේ අම්හිරි අත්දැකීම් තුළිනි. පරාජයට පත් විරුද්ධ පාර්ශවීය සහ විප්ලවවාදී පක්ෂ අතුරෙන්, තමන්ගේ "හමුදවට" අඩුවෙන්ම හානි සිදුකර ගනිමින්, තමන්ගේ අරටු කොටස වඩාත් හොඳින් රැක ගනිමින්, භේද භින්න වීමට (ගැඹුරු සහ දුස්සාධ්‍ය භේදවීම් අර්ථයෙන්) අඩුවෙන්ම ඉඩ තබමින්, දූර්මුඛවීම අඩුම තත්වයක පවත්වා ගනිමින් හා ඉතාමත් පුළුල් පරිමාණයෙන්ද, ඉතාමත් නිවැරදි සහ ධෛර්යමත් ආකාරයෙන්ද යළි වැඩ ඇරඹීමට වඩාත්ම හොඳ තත්වයන් තබා ගනිමින් පසු බැස්සේ බොල්ෂෙවික් වරුන්ය. බොල්ෂෙවික්වරුන්ට මෙය සාර්ථක ලෙස කර ගත හැකිවූයේ, ඔවුන් විප්ලවවාදී වදන් හරඹ කරුවන් නිර්දය ලෙස හෙළිදරව් කර නෙරපා දැමූ හෙයිනි. අයෙකුට පසු බැසීමට සිදුවන බවත්, පසු බැස්ස යුත්තේ කෙසේද යන්න අයෙක් දැන සිටිය යුතු බවත්, ඉතාමත් ප්‍රතිගාමී පාර්ලිමේන්තු තුළ, ඉතාමත් ප්‍රතිගාමී වෘත්තීය සමිති, සමූපකාර සහ රක්ෂණ සමිති හා එවැනි සංවිධාන තුළ නිත්‍යානුකූල ලෙස වැඩ කළ යුත්තේ කෙසේ දැයි අයෙක් උගෙන ගැනීම පරම අවශ්‍යතාවයක් බවත්

වටහා ගැනීමට කැමැත්තක් නොදක්වූ වදන් හරඹ කරුවන් බොල්ෂෙවික්වරුන් විසින් එසේ හෙළිදරව් කර නෙරපා දමන ලදී.

අනතුරුව පුනරුත්ථානයේ වර්ෂ (1910–1914) එළඹියේය. ප්‍රථමයෙන් ප්‍රගතිය සිදුවූයේ විශ්වාස නොකළහැකි තරම් සෙමින්ය. නමුත් 1912 ලේනා සිදුවීම්වලින්[35] පසුව එය තරමක් සීඝ්‍ර විය. අභූත පූර්ව දුෂ්කරතාවයන් ජය ගනිමින් බොල්ෂෙවික්වරු මෙන්ෂෙවික් වරුන් පස්සට කල්ලු කර දැමූහ. කම්කරු පංතිය තුළ සිටි ධනපති පංතියේ ඒජන්ත වරුන් ලෙසට මෙන්ෂෙවික්වරුන් ඉටු කළ කාර්ය කොටස 1905 න් පසුව මුළු මහත් ධනපති පංතියටම අවබෝධ වූ හෙයින්, ධනපතියෝ බොල්ෂෙවික් වරුන්ට විරුද්ධව ඔවුන්ට දහසකුත් එකක් මාර්ගවලින් ආධාර කළහ. බොල්ෂෙවික්වරු ඔවුන්ගේ නීතිවිරෝධී වැඩ කටයුතුත්, "නීති සහගත ඉඩ කඩ" උපයෝගී කරගැනීමත් යන දෙක ඒකාබද්ධ කිරීමට විශේෂ උනන්දුවක් ගත් අතර, ඔවුහු එම නිවැරදි උපක්‍රමය අනුගමනය නොකළෝ නම්, ඔවුන්ට මෙම කාර්යය සාර්ථක ලෙස ඉටු කිරීමට නුපුළුවන් වන්නට තිබිණි. අන්ත ප්‍රතිගාමී දූමා සභාවට[36] තෝරා පත් කිරීමේ මැතිවරණයේදී බොල්ෂෙවික්වරුන්ට කම්කරු කියුරියා මණ්ඩලයේ සම්පූර්ණ ආධාරය ලැබුණේය.

ඉක්බිතිව ප්‍රථම අධිරාජ්‍යවාදී ලෝක යුද්ධය (1914–1917) විය. අන්ත ප්‍රතිගාමී "පාර්ලිමේන්තුවක්" සහිත නීති සහගත පාර්ලිමේන්තුවාදය, විප්ලවවාදී පක්ෂය වන බොල්ෂෙවික් වරුන්ට ඉතාමත් ප්‍රයෝජනවත් සේවයක් කළේය. බොල්ෂෙවික් මන්ත්‍රීවරු සයිබීරියාවට පිටුවහල් කරන ලදී.[37] විදේශගත රුසියානුන්ගේ පුවත් පත් මගින් සමාජ-අධිරාජ්‍යවාදයේ, සමාජ-ජාත්‍යොන්මාදවාදයේ, සමාජ-දේශප්‍රේමීත්වයේ, සසංගත හා දුස්සංගත ජාත්‍යන්තරවාදයේ සහ සමාදනවාදී මයා මතවලට එරෙහි විප්ලවවාදී ප්‍රතික්ෂේපයේ ද මති මාත්‍ර සියල්ල ප්‍රකාශයට පත්විය. රුසියානු සමාජවාදී ව්‍යාපාරයේ "කාණ්ඩ" බහුලත්වය සහ එම කාණ්ඩ ඔවුනොවුන් අතර කරගෙන ගිය උග්‍ර අරගලය දැක උඩඟු ලෙස හා පිළිකුලෙන් මුහුණු ඉවත හරවා ගත් දෙවැනි ජාත්‍යන්තරයේ උගත් මෝඩයන් සහ නාකි අම්මණ්ඩිලා විසින් හුවා දක්වන ලද "නීත්‍යානුකූල භාවය", ඔවුන්ට සෑම රටකදීම යුද්ධයේ හේතුවෙන් අහිමිව ගිය අවස්ථාවේදී, ස්විට්සර්ලන්තය තුළ සහ වෙනත් රටවල් කීපයක්ම තුළ රුසියානු බොල්ෂෙවික් වරුන් සංවිධාන කළ වැනි නිදහස් (නීති විරෝධී) අදහස් හුවමාරුවට සහ නිවැරදි අදහස් නිදහස් ලෙස (නීති විරෝධී ලෙස) පරිණාම කර ගැනීමට යම්තමින් හෝ සමාන වන යමක් කිරීමට, දෙවැනි ජාත්‍යන්තරයේ ඔවුහු අසමත් වූහ. රටවල් සියල්ලෙහිම වූ තමන් සමාජ-දේශප්‍රේමීන් බව දිවුරා කියන්නවුන් හා කෞට්ස්කිවාදීන් නිර්ධන පංතියේ අන්තම

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ද්‍රෝහීන් බවට පත් වූයේ එනිසාය. 1917–1920 කාලයේදී බොල්ෂෙවික්-වාදයට ජයග්‍රහණය අත්පත් කර ගැනීමේ හැකියාව ලැබීමට එක හේතුවක් වූයේ, 1914 අවසානයේ පටන්ම එය සමාජ-ජාත්‍යොන්මාදවාදයේ සහ කෞට්ස්කිවාදයේ නින්දිතභාවයත්, සටකපට භාවයත් නිර්දය ලෙස හෙළිදරව් කිරීමෙහි යෙදී තිබීමය (ප්‍රංශයේ ලොංගේ වාදයද, බ්‍රිතාන්‍යයේ ෆේබියන්වරුන්ගේ[38], ස්වාධීන කම්කරු පක්ෂයේ[39] හා ඉතාලියේ තුරාටිගේ යනාදීන්ගේ අදහස්ද ජාත්‍යොන්මාදවාදයට හා කෞට්ස්කිවාදයට සමාන ය). බොල්ෂෙවික්වරුන්ගේ අදහස් නිවැරදි බව පොදු ජනතාව පසුව තමන්ගේම අත්දැකීම අනුව වඩ වඩාත් හොඳින් අවබෝධ කර ගත්හ.

රුසියාවේ දෙවැනි විප්ලවය (1917 පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා) සිදුවිය. සාර්වාදයේ වයෝවෘධ භාවය සහ යල්පැනගිය ස්වභාවය නිසා (ඉතාමත් වේදනාකාරී යුද්ධයක පහරවල සහ දුෂ්කරතාවයන්ගේ ආධාරය ලැබීම නිසාද), එයට විරුද්ධව එල්ලවුනු විශ්වාස කළ නොහැකි තරම් විනාශකාරී වූ බලවේගයක් නිර්මාණය විය. දින කීපයක් ඇතුලත රුසියාව යුද්ධ තත්වය යටතේ ලෝකයේ අන් සෑම රටකටම වඩා නිදහස් ධනපති ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් බවට පරිවර්තනය විය. විරුද්ධ පාර්ශවීය සහ විප්ලවවාදී පක්ෂවල නායකයෝ ආණ්ඩුවක් පිහිටුවීමට පටන් ගත්හ. එය කරන ලද්දේ ඉතාමත්ම ''දැඩි පාර්ලිමේන්තුවාදී'' සමූහාණ්ඩුවල කෙරෙන ආකාරයෙන්මය. යමෙක් පාර්ලිමේන්තුවේ, ඉතාමත් ප්‍රතිගාමී පාර්ලිමේන්තුවේ වුව, විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස කටයුතු කර තිබීම, පසුව විප්ලවයේදී ඔහු ඉටු කරන කාර්ය කොටස සාර්ථක කිරීමට ආධාරකයක් විය.

සති කීපයක් ඇතුලත මෙන්ෂෙවික්වරු හා සමාජවාදී-විප්ලවවාදීහු දෙවැනි ජාත්‍යන්තරයේ යුරෝපීය වීරයන්ගේත්, ආණ්ඩු පාක්ෂිකවාදීන්ගේ[40] සහ වෙනත් අවස්ථාවාදී කෙලතොල්ලන්ගේත් විධික්‍රම හා ගති සිරිත්ද, තර්ක හා විතණ්ඩවාදී කියමන්ද, තමන් කෙරෙහි ආරූඪ කරගත්හ. ෂයිඩමාන්ලා සහ නොස්කෙ ලා ගැනද, කෞට්ස්කි සහ හිල්පර්දිං ගැනද, රෙන්නර් සහ අවුස්ටර්ලිට්ස් ගැනද, ඔටෝ බවර් සහ ෆ්‍රිට්ස් අඩ්ලර් ගැනද, තුරාටි සහ ලොංගේ ගැනද, ෆේබියන්වරු සහ බ්‍රිතාන්‍යයේ ස්වාධීන කම්කරු පක්ෂයේ නායකයන් ගැනද, යන මේ සියල්ලන් ගැන අප දැන් කියවන සියල්ලක්ම, පරණ සුපුරුදු තාලය කර්ණ කටුක ලෙස නැවත වාදනය කිරීමක් ලෙසට, පුණරුක්තියක් ලෙසට පෙනේ. (ඇත්තෙන්ම එසේ වන්නේය). මෙන්ෂෙවික්වරුන් හා සම්බන්ධයෙන් මේ සියල්ලක්ම අපි දැනටමත් දැක ඇත්තෙමු. නොදියුණු රටක අවස්ථාවාදීහු, දියුණු රටවල් ගණනාවක අවස්ථාවාදීන්ගේ

පුරෝගාමීන් බවට පත්වූහ. ඉතිහාසය කටයුතු යොදා ඇත්තේ එසේය.

දෙවැනි ජාත්‍යන්තරයේ වීරයන් සියළු දෙනාම සෝවියට් සභාවල කාර්ය කොටසෙහි හා සෝවියට් ආණ්ඩු පාලනයෙහි වැදගත්කම පිළිබඳ ප්‍රශ්නය මත බංකොලොත් ලබා සහ තමන්ටම අවමාන කරගෙන සිටිත් නම්, ඉතා වැදගත් පක්ෂ තුනක (එනම්, ජර්මන් ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ, ප්‍රංශ ලොංගේ වරුන්ගේ සහ බ්‍රිතාන්‍ය ස්වාධීන කම්කරු පක්ෂයේ) නායකයන් ආත්ම අවමානයෙහි යෙදෙමින් ඉතාමත් ''ප්‍රබල'' ආකාරයෙන් මෙම ප්‍රශ්නයට පැටලී සිටිත් නම්, ඔවුන් සියලු දෙනාම (1848 දී තමන් ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්'' යයි කියාගත් සුළු ධනපතියන්ගේ ජීවගුණයට සම්පූර්ණයෙන් අනුකූල වන සේ) සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ පූර්ව මතවල වහලුන් වී සිටින බව පෙන්වා ඇත්නම්, එවිට අප කියන්නේ, අප මේ සියල්ලම දැනටමත් මෙන්ෂෙවික්වරුන් කෙරෙන් දැක ඇති බව පමණකි.

ඉතිහාසය විසින් කටයුතු යොදන ලද පරිදි සෝවියට් සභා රුසියාව තුළ, 1905 දී උත්පාද විය. 1917 පෙබරවාරියේ පටන් ඔක්තෝබරය දක්වා සෝවියට් සභා මෙන්ෂවික්වරුන් විසින් වැරදි ලෙස උපයෝජනය කරගන්නා ලදී. සෝවියට් සභාවල වැදගත් කම වටහා ගැනීමට අපොහොසත් වීම නිසා ඔවුහු බංකොලොත් ලැබූහ. අද සෝවියට් බලය පිළිබඳ අදහස ලෝකය මුළුල්ලේම ඉස්මතු වී තිබේ. එය සියලුම රටවල නිර්ධන පංතිය අතර මවිතකර තරම් සීඝ්‍රතාවයකින් පැතිරී යන්නේය. අපගේ මෙන්ෂෙවිකයන් මෙන්ම, දෙවැනි ජාත්‍යන්තරයේ වෘධ නායකයෝද සෑම තැනෙකම බංකොළොත් ලබමින් සිටිති. ඔවුන් එම තත්වයට පත්ව සිටින්නේ සෝවියට් සභාවල කාර්ය කොටස සහ වැදගත් කම වටහා ගැනීමට ඔවුන් අපොහොසත් හෙයිනි. නිර්ධන පංති විප්ලවයේ ඇතැම් ප්‍රශ්න හා සම්බන්ධයෙන් රුසියාව කර තිබෙන දෙයම කිරීමට සියලුම රටවලට අනිවාරණීය වශයෙන්ම සිදුවනු ඇති බව අත්දැකීමෙන් ඔප්පු වී තිබේ.

මෙකල යුරෝපයේ දී හා ඇමෙරිකාවේ දී නිතර හමුවන මති මතාන්තර කෙබඳු වුවත්, බොල්ෂෙවික්වරු ඔවුන්ගේ ජයග්‍රාහී අරගලය ආරම්භ කළේ පාර්ලිමේන්තු සහ (ඇත්ත වශයෙන්ම) ධනපති සමූහාණ්ඩුවටත්, මෙන්ෂෙවික්වරුන්ටත් විරුද්ධව ඉතාමත් ප්‍රවේසම් සහිත ආකාරයෙනි. ඒ සඳහා සූදනම් වීමට ඔවුන් කළ කටයුතු කිසිසේත් සරල නොවිය. සඳහන් කරන ලද කාලය ආරම්භයේදී ආණ්ඩුව පෙරළා දැමීම සඳහා අප හඬ නැගුවේ නැත. නමුත් අප කළේ සෝවියට් සභාවල සංයුතිය සහ පන්නරය ප්‍රථමයෙන් වෙනස් නොකර එය කිසිසේත් පෙරළා දැමිය නොහැකි බව පැහැදිලි කිරීමය. අපි ධනපති පාර්ලිමේන්තුව, එනම්,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය වර්ජනය කිරීමක් ප්‍රකාශයට පත් නොනොකෙළෙමු. නමුත් ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයක් සහිත ධනපති සමූහාණ්ඩුවක් එය නොමැති ධනපති සමූහාණ්ඩුවකට වඩා හොඳ බවත්, එහෙත්, ''ගොවියන්ගේ සහ කම්කරුවන්ගේ'' සමූහාණ්ඩුවක්, සෝවියට් සමූහාණ්ඩුවක් ඕනෑම ධනපති ප්‍රජාතන්ත්‍රවාදී, පාර්ලිමේන්තු සමූහාණ්ඩුවකට වඩා හොඳ බවත්, අපි කීවෙමු. අප්‍රේල් (1917) සම්මේලනයෙන් අනතුරුව, අප පක්ෂය නිල වශයෙන් එසේ ප්‍රකාශ කරන්නට පටන් ගත්තේය. එසේ තරයේ සහ අංග සම්පූර්ණ ලෙස සූදනම් වීමේ කටයුතු නොකරන ලද නම්, අපට 1917 ඔක්තෝබරයේදී ජයග්‍රහණය ලැබීමට හෝ එම ජයග්‍රහණය තහවුරු කර ගැනීමට හෝ නොහැකි වන්නට තිබිණි.

IV

බොල්ෂෙවික්වාදය වර්ධනය වී, ශක්තිමත් වී, පන්නරය ලැබීමට උපකාරී වූයේ කම්කරු පංති ව්‍යාපාරය තුළ සිටින කුමණ සතුරන්ට විරුද්ධව අරගල කිරීමද?

ප්‍රථම කොට හා ප්‍රධාන කොටම අවස්ථාවාදයට විරුද්ධව කරන ලද අරගලය ඊට උපකාරී විය. 1914 වන විට අවස්ථාවාදය නිශ්චිත වශයෙන්ම සමාජ-ජාත්‍යොන්මාදවාදය ලෙසට සංවර්ධනය වී තිබුණු අතර, එය නිර්ධන පංතියට විරුද්ධව නිශ්චිත වශයෙන්ම ධනපති පංතියේ පැත්ත ගෙන තිබුණේය. එනිසා, ස්වාභාවික වශයෙන්ම මෙම අවස්ථාවාදය කම්කරු පංති ව්‍යාපාරය තුළ බොල්ෂෙවික්වාදයට එදිරි ප්‍රධාන සතුරා විය. එය තවමත් ජාත්‍යන්තර වශයෙන් ප්‍රධාන සතුරා වන්නේය. බොල්ෂෙවික්වරුන්ගේ ඉමහත් අවධානය මෙම සතුරා කෙරෙහි යොමු වී තිබිණි. බොල්ෂෙවික්වරුන්ගේ කටයුතුවල මෙම අංශය ගැන දැන් විදේශවල පවා තරමක් ප්‍රසිද්ධ වී තිබේ.

නමුත්, කම්කරු පංති ව්‍යාපාරය තුළ බොල්ෂෙවික්වාදයට එදිරිව සිටින අනිත් සතුරා ගැන කිව යුත්තේ වෙනත් දෙයකි. බොල්ෂෙවික්වාදය සුළු ධනපති විප්ලවවාදයට විරුද්ධව අවුරුදු ගණන් තිස්සේ කළ දීර්ඝ අරගලය තුළින් හැඩ ගැසුනු, සංවර්ධන වුනු හා පන්නරය ලැබූ බව වෙනත් රටවල ප්‍රකට වී නැත. එම සුළු ධනපති විප්ලවවාදය අරාජිකවාදයේ හැඩහුරු කම් සහිතය. නැතහොත් සෑම වැදගත් කරුණකදීම අරාජිකවාදයෙන් යමක් උපුටා ගන්නේය. තවද, සසංගත නිර්ධන පංති අරගලයක් කිරීමට අදාළ කොන්දේසි හා අවශ්‍යතාවයන් එයට ඇත්තේද නොවේ. ධනපති ක්‍රමය යටතේ නිතරම පීඩා විඳිමින් සිටින්නා වූද, බොහෝ විට ස්වකීය ජීවන තත්වයන් ඉතාමත් තියුණු ලෙස හා සීඝ්‍ර ලෙස පිරිහී යාමට හා විනාශ වී යාමට පවා ගොදුරු වන්නා වූද, සුළු දේපල හිමියා, (බොහෝ යුරෝපීය රටවල ඉතා බහුල සමාජ කොට්ඨාශයක් වන) සුළු සේව්‍යයා, ඉතාමත් පහසුවෙන් විප්ලවවාදී අන්තයන්ට ඇදී යන නමුත්, ඔහුට නොපසුබට උත්සාහයක්, සංවිධානාත්මක බවක්, විනයක් හා දැඩිතර බවක් නැත්තේය. මේ බව මාක්ස්වාදී න්‍යායයෙන් තහවුරු කර ඇති අතර, යුරෝපයේ සියළුම විප්ලවවල හා විප්ලවවාදී ව්‍යාපාරවල අත්දැකීම්වලින් ද නොඅඩුව සනාථ වී තිබේ. ධනපති ක්‍රමයේ මහා භීෂණතාවයන් දැක වියරු කෝපයට පත් සුළු ධනපති පංතියක් දක්නට ලැබීම, සියලුම රටවල පවතින අරාජිකවාදය වැනි ස්වභාව ලක්ෂණයකි. එවැනි විප්ලවවාදිත්වයක ඇති අස්ථිරත්වය හා නිස්සාර භාවයද, යටත් වීම, උදාසීනත්වය, මායා මතවලට රැවටීම හා එක් හෝ තවත් ධනපති විකාරයක් කෙරෙහි උමතුවකින් මෙන් ඇදී යාම කරා සීඝ්‍ර ලෙස යොමු වීම පිළිබඳ ප්‍රවණතාවය ද යන මේ සියල්ල ගැන කවුරුත් දනිති. එසේ වුවත්, මෙම සත්‍යයන් හුදෙක් න්‍යායික හෝ වියුක්ත වශයෙන් පිළිගත් පමණින් විප්ලවවාදී පක්ෂවල පැරණි වැරදි ඉවත් නොවන්නේය. එම වැරදි, නිතර නිතර, බලාපොරොත්තු නොවන අවස්ථාවල, එක්තරා දුරකට අළුත් ආකෘති අනුව, අමුතු පෙනුමක් ඇතිව හෝ අමුතු වටපිටාවක් තුළ, අසාමාන්‍ය, නැතහොත්, අසාමාන්‍ය යයි කිව හැකි ආකාරයේ තත්වයක් යටතේ ඉස්මතු වන්නේය.

බොහෝ විට අරාජිකවාදය මතු වූයේ කම්කරු පංති ව්‍යාපාරයේ අවස්ථාවාදය නිසා එක්තරා ආකාරයකින් කරන දඬුවමක් ලෙසටය. මෙම භයානක උවදුරු ද්වය අන්‍යොන්‍ය වශයෙන් ඌන පූරණ කරගන්නා ආකාරයක විය. වෙනත් යුරෝපීය රටවල් හා සමග සසඳන කල රුසියාවේ ජනගහනය වැඩියෙන් සුළු ධනපති ස්වභාවයක් දරන නමුත් විප්ලව දෙකෙහිදීම (1905 සහ 1917) සහ ඒවා සඳහා සූදනම් වීමෙහිදී අරාජිකවාදයේ බලපෑම ස්වල්ප වූයේ නම් ඒ සඳහා දැක්විය යුතු ගෞරවයෙන් කොටසක් බොල්ෂෙවික්වාදයට අයත් විය යුතුය. එය නිරතුරුවම අවස්ථාවාදයට විරුද්ධව නිර්දය හා බුරුලක් නොදෙන අරගලයක් ගෙන ගියේය. රුසියාව තුළ අරාජිකවාදයේ බලපෑම හීන වී යාමට ඊටත් වඩා හේතු වූයේ ඉහත දී (දහනව වැනි ශතවර්ෂයේ හැත්තෑ ගණන්වලදී) එය අසාමාන්‍ය ලෙස සංවර්ධනය වීමත්, ඒ අනුව එහි අන්තසාවද්‍යභාවය සහ විප්ලවවාදී පංතියට මග පෙන්වන න්‍යායයක් ලෙස

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සේවා කිරීමට එහි ඇති අයෝග්‍යතාවය හෙළිදරව් වීමත් ය. මා ඉහත සඳහන් "කොටසක්" යන වචනය යෙදුවේ එහෙයිනි.

බොල්ෂෙවික්වාදය 1903 දී උත්පාද වීම හා සමගම, එය සුළු ධනපති, අර්ධ අරාජිකවාදී (නැතහොත් කෝඩුකාර-අරාජිකවාදී) විප්ලවවාදිත්වයට විරුද්ධව කරන නිර්දය අරගලයේ සම්ප්‍රදය තමන් වෙත පවරා ගත්තේය. එය විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ කවදත් පැවති සම්ප්‍රදයක් විය. විප්ලවවාදී නිර්ධන පංතියේ බහුජන පක්ෂයක් ගොඩ නැගීම සඳහා රුසියාව තුළ අත්තිවාරම් දැමීම සිදු වෙමින් තිබුණු 1900–1903 වර්ෂවලදී එය අප රට තුළ විශේෂයෙන් බලවත් වී පැවැත්තේය. කර්තව්‍යය පවරා ගත් බොල්ෂෙවික් පක්ෂය, අන් කවර පක්ෂයකටත් වඩා සුළු ධනපති විප්ලවවාදිත්වයේ ප්‍රවණතාවයන් පෙන්වූ පක්ෂයකට, එනම්, "සමාජවාදී-විප්ලවවාදී" පක්ෂයට විරුද්ධව අරගල කරමින්, ප්‍රධාන ප්‍රශ්න තුන මුල් කරගෙන එම අරගලය ගෙන ගියේය. පළමුව, මාක්ස්වාදය බැහැර කළ එම පක්ෂය, කිසියම් දේශපාලන කටයුත්තක යෙදීමට ප්‍රථමයෙන් පංති බලවේගයන් හා ඒවායේ පෙළගැසීම පිළිබඳව වාස්තවික තක්සේරුවක් කිරීමේ අවශ්‍ය කම වටහා ගැනීමට සම්පූර්ණයෙන්ම අකැමති විය (අසමත් විය, යනුවෙන් කීම වඩාත් නිවැරදි විය හැකිය). දෙවැනිව, මාක්ස්වාදීන් වන අප බලවත් ලෙස ප්‍රතික්ෂේප කළ දෙයක්වූ තනි පුද්ගල ත්‍රස්තය, තනි පුද්ගල ඝාතනය, එය විසින් පිළිගන්නා ලද නිසා, එම පක්ෂය තමන් විශේෂයෙන්ම "විප්ලවවාදී" නැතහොත් "වාමාංශික" යයි සිතුවේය. අප තනි පුද්ගල ත්‍රස්තය බැහැර කළේ, එයින් කාර්ය සාධනයක් නොවන නිසාය. එහෙත්, 1900–1903 කාලයේ දී, ප්ලෙහානව් මාක්ස්වාදියෙක් හා විප්ලවවාදියෙක්ව සිටියදී, ප්‍රංශ ශ්‍රේෂ්ඨ විප්ලවයේ ත්‍රස්තය "ප්‍රතිපත්තියක් වශයෙන්" හෙළා දැකීමෙහි සමත් වුවත්, නැතහොත්, මුළුලෝකයේම ධනපතියන්ගේ වැටලීමට හසුව සිටින ජයග්‍රාහී විප්ලවවාදී පක්ෂය ක්‍රියාත්මක කරන ත්‍රස්තය පොදුවේ හෙළා දකිනවුන් ඔහු විසින් සමච්චලයට හා පිළිකුල පෙන්වන හාස්‍යයට ලක් කරන ලදී. තුන්වැනිව, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සංසන්දනීය වශයෙන් නොවැදගත් අවස්ථාවාදී දුර්වල කම් නිගාවට ලක් කිරීම බෙහෙවින් "වාමාංශික" දෙයක් ලෙසට සැලකූ "සමාජවාදී-විප්ලවවාදීහු" නිදසුනක් ලෙසට, ගොවි ජන ප්‍රශ්නය, නැතහොත්, නිර්ධන පංති ආඥාදායකත්වය වැනි ප්‍රශ්නවලදී තමන්ම එම පක්ෂයේ අන්ත අවස්ථාවාදීන් අනුකරණය කළහ.

අප නිරතුරුවම පළ කළ අදහස, එනම්, ජර්මන් විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ප්‍රවාදී පක්ෂය විප්ලවවාදී නිර්ධන පංතියේ ජයග්‍රහණය සඳහා එම පංතියට අවශ්‍ය පක්ෂය බවට පත්වීමට ඉතාමත් ආසන්න තත්වයට

පැමිණියේය යනු, ඉතිහාසය විසින් දුන් පුළුල් හා ලෝක ව්‍යාප්ත පරිමාණයෙන් සනාථ කර තිබෙන බව මෙහිලා සඳහන් කළ යුතුය. (1900–1903 තරම් ඈත කාලයක බර්න්ස්ටයින් පක්ෂයෙන් නෙරපා හැරිය යුතු යයි ප්ලෙහානව් කී බවද, මෙම සම්ප්‍රදය ඉදිරියට ගෙනයමින් 1913 දී බොල්ෂෙවික්වරු ලේගින්ගේ[41] නීච, සට කපට හා ද්‍රෝහී ක්‍රියා හෙළිදරව් කළ බවද සටහන් කර ගන්න). සියලුම බටහිර පක්ෂ අතුරෙන් විශිෂ්ඨතම නායකයන් ඉදිරිපත් කළේත්, අන් පක්ෂවලට වඩා සීඝ්‍ර ලෙස දුර්වල කම් මකාගෙන නව ශක්තියක් උද කරගත්තේත් ජර්මන් විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් බව, යුද්ධ කාලයේ හා ඉන් ඉක්බිති මුල් අවුරුදුවල ලත් සියලු අපකීර්තිමත් පරාජයන්ගෙන් හා ඇති වූ අර්බුදවලින් පසුව, අද, 1920 දී පැහැදිලිව දැක්ක හැකිය. කෞට්ස්කිලාගේ, හිල්පර්ඩිංලාගේ, ලෙදෙබූර්ලාගේ සහ ක්‍රිස්පින්ලාගේ අවස්ථාවාදයට සහ චපලත්වයට විරුද්ධව අනවරථ අරගලයක් කරන ජර්මනියේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වාම, නිර්ධන පංතික අංශය සහ ස්පාර්ටකස්වාදීන් කෙරෙන් මෙය පෙනෙන්නේය. අපි දැන් සම්පූර්ණ ඓතිහාසික කාලපරිච්ඡේදයක් දෙස, පැරිස් කොමියුනයේ සිට ප්‍රථම සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව දක්වා කාලය දෙස අවධානය යොමු කරන්නෙමු නම්, අරාජිකවාදය කෙරෙහි මාක්ස්වාදය පොදු වශයෙන් දක්වන ආකල්පය ඉතාමත් පැහැදිලි හා නිරවුල් ලෙස අපට පෙනෙනු ඇත. අවසාන විග්‍රහයේදී මාක්ස්වාදය නිවැරදි බව ඔප්පු විය. සමාජවාදී පක්ෂ බොහොමයක් තුළ බල පැවති අවස්ථාවාදී අදහස් අරාජිකවාදය විසින් පෙන්නුම් කෙරුනු නමුත්, මෙම අවස්ථාවාදය, රාජ්‍යය පිළිබඳ මාක්ස්ගේ අදහස් විකෘති කිරීම හා උවමනාවෙන්ම යටපත් කිරීම සම්බන්ධ වූවක් බව ප්‍රථමයෙන් කිව යුතුය (එංගල්ස්ගේ ලිපියක්[42] බේබෙල් විසින් 1875 පට 1911 දක්වා අවුරුදු තිස් හයක් තිස්සේ යටපත් කර තබන ලද බව මම මගේ "රාජ්‍යය සහ විප්ලවය" යන පොතෙහි පෙන්වා දී ඇත්තෙමි. රාජ්‍යය පිළිබඳව දැනට පවතින සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී අදහස්වල අවස්ථාවාදිත්වය ඉතා පැහැදිලි ලෙස, විචිත්‍ර ලෙස, එක එල්ලේම සහ ඒකාන්ත වශයෙන්ම එයින් හෙළිදරව් විය). මෙම අවස්ථාවාදී අදහස් නිවැරදි කිරීම ද, සෝවියට් බලය හා ධනපති පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවා-දයට වඩා එහි ඇති උසස් බව පිළිගැනීමද, යුරෝපයේ සහ ඇමෙරිකාවේ සමාජවාදී පක්ෂ තුළ වූ වඩාත්ම මාක්ස්වාදී උපනති අතර ඉතාමත් සීඝ්‍ර ලෙස සහ පුළුල් ලෙස සිදු වූ බව දෙවැනිව සඳහන් කළ යුතුය.

බොල්ෂෙවික්වාදය තමන්ගේම පක්ෂය තුළ වූ "වාමාංශික" පිළිපැනීම්වලට විරුද්ධව කළ අරගලය අවස්ථාවන් දෙකකදීම විශාල පරිමාණයක් ගත්තේය, ඒවා නම්, වරක් 1908 දී ඉතාමත් ප්‍රතිගාමී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පාර්ලිමේන්තුවකට සහ ඉතාමත් ප්‍රතිගාමී නීතිවලින් බැඳ තබනලද නීති සහගත කම්කරු සමිතිවලට සහභාගි විය යුතු ද, නැද්ද යන ප්‍රශ්නය වටාද, නැවත 1918 දී (බ්‍රෙස්ට් ලිතොව්ස්ක් ගිවිසුම සම්බන්ධයෙන්) එක් නැතහොත් වෙනත් "සම්මුතියක්" ඇතිකර ගැනීම සුදුසුද යන ප්‍රශ්නය වටාද, අරගලය සිදු වූ අවස්ථා විය.

1908 දී, ඉතාමත් ප්‍රතිගාමී "පාර්ලිමේන්තුවට" සහභාගි වීමේ අවශ්‍යතාවය[43] වටහා ගැනීම දැඩි ලෙස ප්‍රතික්ෂේප කිරීම නිසා "වාම" බොල්ෂෙවික් වාදීහු අපගේ පක්ෂයෙන් නෙරපා දමන ලදහ. "වාම" වාදීන් ඔවුන්ගේ මතයෙහි පිහිටියේ 1905 වර්ෂයේ සාර්ථක වර්ජනයේ අත් දැකීම පදනම් කර ගෙන ය. පසු කලෙක කොමියුනිස්ට් පක්ෂයේ අගනා සාමාජිකයන් වූ (හා තවමත් වන) විශිෂ්ට විප්ලවවාදීන් බොහෝ දෙනෙක්ද ඔවුන් අතර වූ බව මෙහිලා සඳහන් කළ යුතුය. 1905 අගෝස්තුවේදී සාර් උපදේශක පාර්ලිමේන්තුවක් කැඳවීමට ආඥා නිකුත් කළ අවස්ථාවේ දී, එය වර්ජනය කරන ලෙස බොල්ෂෙවික්වරු සියළුම විරුද්ධ පක්ෂවල සහ මෙන්ෂෙවික්වරුන්ගේ විරුද්ධත්වය මැද්දේ හඬ නැගූහ.[44] එසේම 1905 ඔක්තෝබරයේ ඇතිවුනු විප්ලවයෙන්[45] "පාර්ලිමේන්තුව" ඇත්ත වශයෙන්ම අතු ගෑවී ගියේය. එම අවස්ථාවේදී වර්ජනය නිවැරදි විය. එසේ වූයේ ප්‍රතිගාමී පාර්ලිමේන්තුවලට සහභාගි නොවීම පොදු වශයෙන් නිවැරදි නිසා නොව, — අප නිවැරදි ලෙස වාස්තවික තත්වය තක්සේරු කළ නිසාය. එය පොදු ජන වැඩ වර්ජන, ප්‍රථමයෙන් දේශපාලන වැඩ වර්ජනයක් දක්වාද, ඊළඟට විප්ලවවාදී වැඩ වර්ජනයක් දක්වාද, අවසානයේ නැගී සිටීමක් දක්වාද සීඝ්‍ර ලෙස වර්ධනය වීමට කටයුතු යෙදී තිබුණු තත්වයක් විය. එපමණක්ද නොව, එකල අරගලය සිදුවූයේ, ප්‍රථම නියෝජිත සභාව කැඳවීම සාර්ට භාර කර තබනවාද නැතහොත් එය කැඳවීමේ කටයුත්ත පරණ පාලනයෙන් උදුරා ගැනීමේ ප්‍රයත්නයක් දරනවාද යන ප්‍රශ්නය මුල් කරගෙන ය. පවත්නා වාස්තවික තත්වය එවැනි එකක් බව ස්ථිරව දැනගන්නට නැති කල, එවැනි උපනතියක් සහ ඒ ආකාරම සංවර්ධන වේගයක් ඇතිබව ස්ථිරව දැනගත නොහැකි කල, වර්ජනය තවදුරටත් නිවැරදි නොවිය.

බොල්ෂෙක්වරු 1905 දී ගෙන ගිය "පාර්ලිමේන්තු" වර්ජනය නිසා විප්ලවවාදී නිර්ධන පංතිය ඉතා වැදගත් දේශපාලන අත්දැකීමක් ලැබුවේය. තවද, නීත්‍යානුකූල සහ නීතිවිරෝධී, පාර්ලිමේන්තු සහ පාර්ලිමේන්තු නොවන අරගල ආකෘති ඒකාබද්ධ කිරීමේදී පාර්ලිමේන්තු ක්‍රම ප්‍රතික්ෂේප කිරීම සමහර විට ප්‍රයෝජනවත් සහ සමහරවිට අවශ්‍යද වන බවත් එයින් පෙනිනි. එසේ වුවත්, මෙම අත්දැකීම අන්ධ ලෙස, අනුකරණයක් ලෙස හා විමසිල්ලෙන් තොරව වෙනත් කොන්දේසිවලට හා වෙනත් තත්වයන්ට ගැලපීම ඉතාමත්ම වැරදි වනු ඇත. බොල්ෂෙවික්වරු 1906 දී ක්‍රියාත්මක කළ දූමා සභා වර්ජනය වරදක් විය. එහෙත් එය පහසුවෙන් නිවැරදි කළ හැකිද විය.* 1907 දී, 1908 දී සහ ඉන් පසු වසර වල දූමා සභාව වර්ජනය කිරීම ඉතාමත් බරපතල වරදක් විය. එය නිවරද කිරීම දුෂ්කර විය. මන්දයත්, එකල එක් අතකින් විප්ලවවාදී වඩදියෙහි ඉතා සීඝ්‍ර නැග්මක් හා එය නැගී සිටීමකට පරිවර්තනය වීමක් බලාපොරොත්තු විය නොහැකි වූ හෙයින්ද, අනිත් අතින්, ධනපති රාජාණ්ඩුව අළුත් වැඩියා වීම හා සම්බන්ධ මුළු ඓතිහාසික තත්වයම අනුව නීත්‍යානුකූල සහ නීති විරෝධී කටයුතු ඒකාබද්ධ කිරීම අවශ්‍ය වූ හෙයින් ද වේ. නොඅඩුව සම්පූර්ණ වී තිබෙන මෙම ඓතිහාසික කාල පරිච්ඡේදය, ඉන් ඉක්බිති කාල සීමා සමග සම්බන්ධ වූ ආකාරය දැන් පැහැදිලි වී තිබෙන අතර, බොල්ෂෙවික්වරු ඉතාමත් දැඩි අරගලයක් කරමින්, නීත්‍යානුකූල සහ නීති විරෝධී අරගල ආකෘති ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවය හා ඉතාමත් ප්‍රතිගාමී පාර්මේන්තුවටත්, ප්‍රතිගාමී නීතිවලින් හිරකර තබන ලද වෙනත් ආයතන (ගිලාන යහ සාධන සමිති ආදිය) ගණනාවකටත් වුවද සහභාගි වීමේ අවශ්‍යතාවය පිළිබඳ අදහස ආරක්ෂා නොකළෝ නම්, 1908–1914 වකවානුවේදී නිර්ධන පංතියේ විප්ලවවාදී පක්ෂයේ අරටු කොටස (ශක්තිමත් කර සංවර්ධනය කරනු තබා) ආක්ෂා කර ගැනීමට ඔවුනට නුපුළුවන් වන්නට තිබුණු බව අද එම කාලය දෙස ආපසු හැරී බලන විට අපට පෙනේ.

1918 දී භේදයක් වන තරම් දුරට කටයුතු යෙදුනේ නැත. ඒ කාලයේදී සිදුවූයේ "වාම" කොමියුනිස්ට්වාදීන් අප පක්ෂය තුළ වෙනම කණ්ඩායමක් නැතහොත් "කාණ්ඩයක්" සෑදීම පමණක් වූ අතර එයද දිගු කලක් පැවතියේ නොවේ. එම වර්ෂයේ දීම, 1918 දීම, "වාම කොමියුනිස්ට්වාදයේ" ඉතාමත් ප්‍රකට නියෝජිතයෝ, නිදසුනක් ලෙසට රාදෙක් සහ බුහාරින් යන සහෝදරවරු, තම වරද විවෘතවම පිළිගත්හ. බ්‍රෙස්ට් සාම ගිවිසුම ප්‍රතිපත්තියක් වශයෙන් සමාව නොදිය හැකි ලෙසට හා විප්ලවවාදී නිර්ධන පංතියේ පක්ෂයට හානිදයක වන පරිදි අධිරාජ්‍යවාදීන් සමග ඇති කර ගන්නා ලද සම්මුතියක් සේ ඔවුනට පෙනී ගොස් තිබිණි. එය ඇත්තෙන්ම අධිරාජ්‍යවාදීන් සමග ඇති කර ගත් සම්මුතියක් වූයේය. නමුත් එය, එම තත්වය යටතේ ඇතිකරගත යුතු වූ සම්මුතියක් විය.

* පුද්ගලයන්ට ගැලපෙන දේ අවශ්‍ය වෙනස් කම් සහිතව දේශපාලනයට හා පක්ෂවලටද ගැලපෙන්නේය. බුද්ධිමත් වන්නේ වැරදි නොකරන තැනැත්තා නොවේ. එවැනි පුද්ගලයන් නැත. ඇති විය හැකිද නොවේ. යමෙක් කරන වැරදි බරපතල නොවන්නේද, ඔහුට ඔහුගේ වැරදි පහසුවෙන් හා ඉක්මණින් නිවැරදි කරගත හැකිද, හේ බුද්ධිමතෙකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කිරීමේ දී අප අනුගමනය කළ උපක්‍රමවලට අද, නිදසුනක් ලෙසට, සමාජවාදී-විප්ලවවාදීන් පහර දෙනු මට ඇසෙන විට, නැතහොත්, ලාන්ස්බරි සහෝදරයා වරක් මා සමග කථා කරමින් සිටියදී "බොල්ෂෙවික්වරුන්ට සම්මුති ඇති කර ගැනීම සුදුසු වී නම්, අපගේ බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති නායකයින්ටද සම්මුති ඇති කර ගැනීම සුදුසු වන්නේයයි ඔවුන් කියන" බව ඔහු දෙඩනු මට ඇසෙන විට, මා සාමාන්‍ය වශයෙන් ප්‍රථමයෙන්ම පිළිතුරු දෙන්නේ සරල හා "ජනප්‍රිය" නිදර්ශනයක් ඉදිරිපත් කිරීමෙනි.

ආයුධ සන්නද්ධ මං පහරන්නන් විසින් ඔබේ මෝටර් රථය නතර කරන ලදැයි සිතමු. ඔබ ඔබගේ මුදල්, ගමන් බල පත්‍රය, රිවෝල්වරයත්, කාරයත් ඔවුන්ට දෙන්නේය. එය සලකා පල් හොරුන්ගේ ප්‍රසන්න සමාගමය ඔබෙන් දුරුවීමට ඉඩ සැලසෙන්නේය. මෙය සම්මුතියක් බවට ප්‍රශ්නයක් නොමැත. "Do ut des" (මගේ හම සම්පූර්ණයෙන් ආරක්ෂා කරගෙන ගැලවී යාමට අවස්ථාව "ඔබ මට දෙනු සඳහා" මම ඔබට මුදල්, තුවක්කු සහ කාරය "දෙන්නෙමි".) නමුත්, එවැනි සම්මුතියක් "ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත නොහැකි" යයි කියන, නැතහොත්, සම්මුතියට එළඹෙන්නා මං පහරන්නන්ගේ හවුල් කරුවෙකැයි කියන සිහි කල්පනාවෙන් යුත් අයෙක් සොයා ගැනීම දුෂ්කර වනු ඇත. (තව තවත් මංකොල්ල කෑම සඳහා සොරුන් විසින් කාරයත් තුවක්කුත් උපයෝගි කර ගැනීමට ඉඩ තිබෙන මුත්, එසේ කිව නොහැකිය.) ජර්මන් අධිරාජ්‍යවාදයේ පල් හොරුන් සමග අප ඇති කර ගත් සම්මුතියත් එවැන්නක්ම විය.

නමුත්, 1914–1918 කාලයේදී සහ ඊළඟට 1918–1920 කාලයේදී, රුසියාවේ මෙන්ෂෙවිකයන් සහ සමාජවාදී-විප්ලවවාදීන්ද, ජර්මනියේ ෂයිඩමාන්වාදීන් (හා බොහෝ දුරට කෞට්ස්කිවාදීන්) ද, ඔස්ත්‍රියාවේ ඔටෝ බෞවර් සහ ෆ්‍රෙඩ්රික් අඩ්ලර්ද (රෙන්නර්ලා සහ සමාගම ගැන කුමණ කථා ද?), ප්‍රංශයේ රෙනොදෙල්ලා හා ලොංගේලා සහ සමාගමද, බ්‍රිතාන්‍යයේ ෆේබියන්වරු, ස්වාධීනයන් සහ කම්කරු පාක්ෂිකයන්[46] ද, තමන්ගේ ධනපති පංතියේ සහ සමහර විට "මිත්‍ර" ධනපති පංතියේ මංකොල්ලකරුවන් සමග සහ තමන්ගේ රටවල විප්ලවවාදී නිර්ධන පංතියට විරුද්ධව සම්මුති ඇති කරගත් අවස්ථාවේදී, මේ මහත්වරු සියළු දෙනාම ඇත්ත වශයෙන්ම මං කොල්ල කෑමේ හවුල් කරුවන් වශයෙන් කටයුතු කළහ.

එළඹ ගත යුතු නිගමනය පැහැදිලිය: "ප්‍රතිපත්තියක් වශයෙන්" සම්මුති බැහැර කිරීම, කුමණ වර්ගයක වුවද සම්මුති ඇති කර ගැනීමට ඉඩක් නැතැයි කියා එය පොදුවේ ප්‍රතික්ෂේප කිරීම ළාමකය. එසේ

ප්‍රතික්ෂේප කිරීමක් ගැන බරපතල ලෙස සිතා බැලීම පවා දුෂ්කරය. විප්ලවවාදී නිර්ධන පංතියට ප්‍රයෝජනවත් සේවයක් කිරීමට අපේක්ෂා කරන දේශපාලන නායකයෙක් වෙතොත්, සමාව දිය නොහැකි වන හා අවස්ථාවාදය සහි ද්‍රෝහිත්වය පිළිබිඹු කරන සම්මුති පිළිබඳ නියත අවස්ථා තෝරා බේරා ගැනීමට ඔහු සමත් විය යුතුය. ඔහු මෙම නියත සම්මුතිවලට විරුද්ධව විවේචනයේ මුළු බලයත්, නිර්දය ලෙස හෙළිදරව් කිරීමේ සහ බුරුලක් නොදෙන සටනේ සම්පූර්ණ දහක ශක්තියත් මෙහෙය විය යුතුය. "ප්‍රායෝගික" සමාජවාදයේ අන්තුවන් සහ පාර්ලිමේන්තුවාදී දේශකයන් ඇදබාන "පොදු වශයෙන් සම්මුති" ගැන වූ දේශනා මගින් ඔවුන්ගේ වගකීම් මගහැර පැන යාමට ඔවුන්ට ඉඩ නොතැබීමට ඔහු වග බලා ගත යුතුය. බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති නායකයන්, ෆේබියන් සමාජය සහ "ස්වාධීන" බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂය, ඔවුන්ගේ ද්‍රෝහි කම් සම්බන්ධයෙන්, ඔවුන් ඇති කරගත් ඇත්ත වශයෙන්ම අන්ත අවස්ථාවාදයක්, ද්‍රෝහිත්වයක් හා පාවාදීමක් වූ සම්මුතියක් සම්බන්ධයෙන් වගනොකියා මගහැර යාමට යොදා ගන්නේ මෙම ක්‍රමය ය.

නා නා ප්‍රකාර සම්මුති ඇත්තේය. එක එක සම්මුතියට, නැතහොත්, එක එක සම්මුති වර්ගයකට අදාළ තත්වය හා යථාභූත කොන්දේසි විග්‍රහකර බැලීමට අයෙක් සමත් විය යුතුය. මං පහරන්නන් කරන හානිය අඩු කිරීමට හා ඔවුන් අල්වා නසා දැමීම පහසු කිරීමට, ඔවුන්ට තමන්ගේ මුදල් හා ආයුධ දෙන මිනිසාත්, කොල්ලකාගත් වස්තුවෙන් කොටසක් ලබා ගැනීම පිණිස ඔවුන්ට තමන්ගේ මුදල් හා ආයුධ භාර දෙන මිනිසාත්, අතර වෙනස තේරුම් ගැනීමට අයෙක් උගත යුතුය. මෙම ළාමක යයි කිව හැකිසේ සරල උදාහරණය මෙන් දේශපාලනයෙහි දී මෙය කිසි සේත් සරල නොවේ. එසේ වුවද, සෑම අවස්ථාවකටම හරියන, කපා, කොටා, සද නිම කළ විසඳීම් ඇතුළත් කළ යම් ප්‍රකාර වට්ටෝරු විශේෂයක් සිතින් නිමවා කම්කරුවන්ට දීමට, නැතහොත්, විප්ලවවාදී නිර්ධන පංතියේ ප්‍රතිපත්තියට කිසි විටෙකත් දුෂ්කර හෝ සංකීර්ණ තත්වයන්ට මුහුණ දීමට සිදු නොවෙතැයි පොරොන්දු දීමට ඉදිරිපත් වන ඕනෑම කෙනෙක් බොරු පණ්ඩිතයෙකි.

වැරදි අර්ථ නිරූපනයන්ට ඉඩ නොතබනු වස්, කෙටියෙන් වුවද, නියත සම්මුති විග්‍රහ කිරීම සඳහා අදාළ වන මූලික නීති කීපයක් විස්තර කිරීමට උත්සාහ කරන්නෙමි.

බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කිරීමෙන් ජර්මන් අධිරාජ්‍යවාදීන් සමග සම්මුතියකට ඇතුලත් වූ පක්ෂය, 1914 අවසානයේ පටන්ම භාවිතයෙන් එහි ජාත්‍යන්තරවාදය පරිණාම කර ගනිමින් සිටියේය. සාර්වාදී රාජාණ්ඩුව පෙරළා දමන ලෙස හඬ නැගීමට සහ අධිරාජ්‍යවාදී කොල්ල කරුවන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දෙදෙනෙක් අතර කෙරෙන යුද්ධයේදී ''පිතෘ භූමිය ආරක්ෂා කිරීම'' හෙළා දැකීමට එය බිය වූයේ නැත. මෙම පක්ෂයේ පාර්ලිමේන්තු නියෝජිතයෝ ධනපති ආණ්ඩුවක ඇමති තනතුරු වෙත ලඟාවන මාර්ගය ඔස්සේ යනවාට වඩා, සයිබීරියාවට පිටුවහල් වීමට කැමති වූහ. සාර්වාදය පෙරළා දැමූ සහ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ස්ථාපිත කළ විප්ලවය විසින්, මෙම පක්ෂය නව සහ මහා දුෂ්කර පරීක්ෂණයකට භාජනය කරන ලදී. එය ''තමන්ගේ'' අධිරාජ්‍යවාදීන් සමග කිසිම එකඟත්වයකට නොඑළඹුනු අතර ඔවුන් බලයෙන් නෙරපා දැමීමට කටයුතු සූදානම් කර එම කාර්යය සාර්ථක කළේය. මෙම පක්ෂය දේශපාලන බලය අත්පත් කරගත් පසු, වතුකාර හෝ එසේ නැතහොත් ධනපති හිමිකමේ සේයාවක්වත් ඉතිරි නොකළේය. අධිරාජ්‍යවාදී රහස් ගිවිසුම් ප්‍රසිද්ධ කර ඒවා අත් හැර දැමූ මෙම පක්ෂය, සියලුම ජාතීන් වෙත සාමය යෝජනා කළේය. එය බ්‍රෙස්ට් මංකොල්ල කරුවන්ගේ බලහත් කාරයට ඉඩ දුන්නේ, සාමයක් ඇතිකර ගැනීම ඉංග්‍රිසි-ප්‍රංශ අධිරාජ්‍යවාදීන් විසින් කඩා කප්පල් කරන ලද පසු හා ජර්මනියේ සහ අනිකුත් රටවල විප්ලවය ඉක්මන් කිරීමට මිනිස් පරිශ්‍රමය තුළින් බොල්ෂෙවික්වරුන්ට හැකි සියල්ලක්ම කිරීමෙන් පසුව පමණකි. එවැනි පක්ෂයක්, එවැනි තත්වයක් යටතේ ඇති කර ගන්නා ලද මෙම සම්මුතියේ නිරවද්‍යතාවය දිනක් දිනක් පාසාම වඩාත් පැහැදිලි හා තව තවත් නිරනුමාන වෙමින් පවතී.

මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදීන් (1914–1920 කාලයේ දෙවැනි ජාත්‍යන්තරයේ නායකයින් ලෝකය මුළුල්ලේම කළ පරිද්දෙන්) ''රට ආරක්ෂා කිරීම'', එනම්, තමන්ගේ කොල්ලකාරී ධනපති පංතිය ආරක්ෂා කිරීම කෙළින්ම හෝ අනියමින් සාධාරණ කර දක්වමින් ආරම්භයේදීම කළේ ද්‍රෝහි කමකි. තමන්ගේ ධනපති පංතිය සමග සභාගයට ඇතුළු වීමෙන්ද, තමන්ගේ රටේ විප්ලවවාදී නිර්ධන පංතියට විරුද්ධව, තමන්ගේ ධනපති පංතිය සමග එක්ව සටන් කිරීමෙන්ද, ඔවුහු ඔවුන්ගේ ද්‍රෝහි කම් දිගටම කරගෙන ගියහ. රුසියාවේ ඔවුන්, ප්‍රථමව කෙරෙන්ස්කි සහ කැඩෙට්වරු[47] සමගද, ඊළඟට කොල්චාක් සහ දෙනිකින් සමගද ඇතිකර ගත් පෙරමුණ, ඔවුන්ගේ විදේශ සාකච්ඡා කරුවන් ඒ ඒ රටවල ඔවුන්ගේ ධනපති පංතිය සමග ඇති කර ගත් පෙරමුණ මෙන්ම, නිර්ධන පංතියට විරුද්ධ වී ධනපති පංතියේ පැත්තට පැන යාමක් විය. ආරම්භයේ පටන් අවසානය දක්වාම, අධිරාජ්‍යවාදයේ මංකොල්ල කරුවන් සමග ඔවුන් ඇති කරගත් සම්මුතියෙන් අදහස් වූයේ ඔවුන් අධිරාජ්‍යවදයේ මං පැහැරීමට හවුල් කරුවන් වූ බවය.

V

ජර්මනියේ ''වාමාංශික'' කොමියුනිස්ට්වාදය. නායකයෝ, පක්ෂය, පංතිය, පොදු ජනතාව

මෙහිදී අප සඳහන් කළ යුතු වන ජර්මන් කොමියුනිස්ට්වාදීන්, තමන් හඳුන්වා ගන්නේ ''වාමාංශිකයන්'' යනුවෙන් නොවේ. මාදන්නා හැටියට ඔවුන් තමන් හඳුන්වා ගන්නේ ''ප්‍රතිපත්තිය රකින විරුද්ධ පාර්ශවය''[48] යනුවෙනි. නමුත්, ''වාමාංශික ළදරු වලිප්පුවේ'' සියලුම රෝග ලක්ෂණ ඔවුන් කෙරෙහි දක්නට ලැබෙන බව, පහත සඳහන් කරුණු වලින් ඒත්තු යනු ඇත.

''ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ (ස්පාර්ටකස් සංගමයේ) භේදය'' යන මාතෘකාව යටතේ ''මයින් නදීබද ෆ්‍රැංක්පුර්ට් ප්‍රාදේශීය කණ්ඩායම'' විසින් පළ කරන ලද පොත් පිංචෙන්, මෙම විරුද්ධ පාර්ශවයේ අදහස මැනැවින් පිළිබිඹු කෙරේ. විරුද්ධ පාර්ශවයේ අදහස්වල හරය ඉතාමත් සිත් කාවදින ලෙස, ඉතාමත් පැහැදිලි ලෙස හා කෙටියෙන් එම පොතෙන් ඉදිරිපත් කර ඇත. එම අදහස්වල හරය පාඨකයාට වටහා ගත හැකි වනු පිණිස එම පොතෙන් කොටස් කීපයක් උපුටා දැක්වීම ප්‍රමාණවත් වනු ඇත:

> ''කොමියුනිස්ට් පක්ෂය වූ කලී දැඩිතම අධිෂ්ඨානයෙන් යුත් පංති අරගලයේ පක්ෂයයි...''
>
> ''දේශපාලන වශයෙන් සලකන කල (ධනපති ක්‍රමය හා සමාජවාදය අතර) පරිවර්තනීය කාල පරිච්ඡේදය නිර්ධන පංති ආඥාදායකත්වයේ කාලයකි...''
>
> ''මෙම ප්‍රශ්නය පැන නඟින්නේය: මෙම ආඥාදායකත්වය ක්‍රියාත්මක කරවන්නේ කවුද? කොමියුනිස්ට් පක්ෂයද? නැතහොත් නිර්ධන පංතියද?.. මූලික වශයෙන් ගත් කල අප පරිශ්‍රම දැරිය යුත්තේ කොමියුනිස්ට් පක්ෂයේ ආඥාදායකත්වයක් සඳහාද? නැතහොත්, නිර්ධන පංතියේ ආඥාදායකත්වයක් සඳහාද?..''

සෑම තැනකම අවධාරණය මුල් පොතේ එන පරිදිය.)

එතැනින් නොනවතින පොතේ කතු වරයා, ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සමග සභාගයක් ඇති කර ගැනීමේ මං සෙවීම ගැන සහ ස්වාධීනයන් සමග සභාගයක් ඇති කර ගැනීමේ නියම හා ප්‍රධාන ප්‍රයත්න වසං කිරීමේ එකම අරමුණින් පාර්ලිමේන්තු ක්‍රමය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇතුළුව අරගලයේ ''සියළුම දේශපාලන මාධ්‍යයන් පිළිගැනීමේ ප්‍රශ්නය'' මතු කිරීම ගැන, ජර්මනියේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට චෝදනා කරයි.

එම පොතෙහි තවදුරටත් මෙසේ කියා තිබේ:

''විරුද්ධ පාර්ශවය වෙනත් මාර්ගයක් තෝරා ගෙන තිබේ. කොමියුනිස්ට් පක්ෂයේ පාලනය හා පක්ෂයේ ආඥාදායකත්වය පිළිබඳ ප්‍රශ්නය හුදෙක්ම උපක්‍රම පිළිබඳ ප්‍රශ්නයක් බව ඔවුහු අදහස් කරති. කෙසේ වුවත්, ඕනෑම පක්ෂ පාලනයක අවසාන ආකෘතිය වන්නේ කොමියුනිස්ට් පක්ෂය මගින් කෙරෙන පාලනය ය. මූලික වශයෙන්, අප වැඩ කළ යුත්තේ නිර්ධන පංතියේ ආඥාදායකත්වය ඇති කිරීම සඳහාය. පක්ෂය ගන්නා සෑම පියවරක්ම, එහි සංවිධාන, අරගල ක්‍රම, පොදු ක්‍රියා මාර්ගය සහ උපක්‍රම යොමු කළ යුත්තේ එම අරමුණ වෙතය. එනිසා, වෙනත් පක්ෂ සමග ඇති කරගන්නා සියලු සම්මුතිද, ඓතිහාසික හා දේශපාලන වශයෙන් යල්පැන ගිය පාර්ලිමේන්තුවාදී අරගල ක්‍රම වෙත ආපසු යාමේ සියලු ක්‍රියාවන්ද, උපායික ලෙස මග හැරීමේ හා සම්මුති ගත වීමේ සෑම ප්‍රතිපත්තියක් ම ද අවධාරණ සහිතව ප්‍රතික්ෂේප කළ යුතු වේ.'' ''විශේෂිත වශයෙන්ම, විප්ලවීය අරගලයේ නිර්ධන පංති ක්‍රම කෙරෙහි බලවත් අවධාරණයක් යෙදිය යුතුය. කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ විප්ලවීය අරගලයට සහභාගි වනු සඳහා ඉතාමත් පුළුල් නිර්ධන පංතික කොටස් හා ස්ථරයන් එක් රැස් කර ගනු පිණිස, හැකි තරම් පුළුල් පදනමකින් හා හැකි තරම් පුළුල් පරිමාණයකින් යුතු නව සංවිධාන ආකෘති නිර්මාණය කළ යුතුය. විප්ලවවාදී කොටස් ඒකරාශී කරන ලක්ෂය විය යුත්තේ පැක්ටරි සංවිධාන පදනම්කර ගත් කම්කරුවන්ගේ සංගමයක් විය යුතුය. ''වෘත්තීය සමිතිවලින් ඉවත් වෙයව්!'' යන සටන් පාඨය යටතේ සියලුම කම්කරුවන් මේ අනුව එක්සත් වනු ඇත. සටන්කාමී නිර්ධන පංතිය සටන සඳහා එහි පිරිස් අමෝරා ගන්නේ මෙහිදීය. පක්ෂයට බඳවා ගැනීම සඳහා පංති අරගලයත්, සෝවියට් ක්‍රමයත්, ආඥාදායකත්වයත් පිළිගැනීම ප්‍රමාණවත් විය යුතුය. පසුව සටන් කරන පොදු ජනතාවට දේශපාලන අධ්‍යාපනය දීම සහ අරගලයේ දී ඔවුන්ට දේශපාලන හැඩගැස්මක් දීම යන සියලු කටයුතු කම්කරු සංගමයෙන් පිටස්තරව සිටින පක්ෂයේ කර්තව්‍යය වන්නේය...

''...එහි ප්‍රතිඵලයක් ලෙසට කොමියුනිස්ට් පක්ෂ දෙකක් එකිනෙකට විරුද්ධව පෙළ ගැසී සිටි...

''එක් පක්ෂයක් නායකයන්ගේ පක්ෂයකි; විප්ලවීය අරගලය සංවිධානය කිරීමටත්, ආඥාදායකත්වයක් ක්‍රියාත්මක කරන සභාග ආණ්ඩුවකට සහභාගි වීමට එයට හැකියාව ලබා දෙන ලෙසට සම්මුතිය හා පාර්ලිමේන්තුවාදය පිළිගනිමින් ඉහළ සිට එම අරගලය මෙහෙයවීමටත්, එය එක පෙළාම ඉදිරිපත් වන්නේය.

අනිත් පක්ෂය බහුජන පක්ෂයකි. එය විප්ලවවාදී අරගලයේ පහළින් ඇතිවෙන උත්සන්නියක් අපේක්ෂා කරන්නේය. මෙම අරගලයේ දී එය හඳුනන්නේ හා ක්‍රියාත්මක කරන්නේ එක අරගල ක්‍රමයක් පමණකි. එය පැහැදිලිවම අරමුණ කරා පාර පෙන්වන අරගල ක්‍රමයකි; පාර්ලිමේන්තු සහ අවස්ථාවාදී ක්‍රම සියල්ලම ප්‍රතික්ෂේප කරන්නකි. එම එකම ක්‍රමය නම්, කොන්දේසි විරහිත ලෙස ධනපති පංතිය බලයෙන් නෙරපීම ය. එය සාර්ථක කළ විට සමාජවාදය පිහිටුවීම සඳහා නිර්ධන පංතියේ පංති ආඥාදායකත්වය පිහිටුවිය හැකි වේ...

''එහි ඇත්තේ නායකයන්ගේ ආඥාදායකත්වයය; මෙහි ඇත්තේ පොදු ජනතාවගේ ආඥාදායකත්වය ය! අපගේ සටන් පාඨය එයයි.''

ජර්මන් කොමියුනිස්ට් පක්ෂය තුළ ඇති විරුද්ධ පාර්ශවයේ හැඩරුව පෙන්වන ප්‍රධාන අංග ලක්ෂණ එබඳුය.

1903 වර්ෂයේ පටන් බොල්ෂෙවික්වාදයේ සංවර්ධනයට අවංක ලෙස සහභාගි වූ හෝ, එම සංවර්ධනය සමීප ලෙස නිරීක්ෂණය කළ හෝ ඕනෑම බොල්ෂෙවික්වරයෙක් මෙම තර්ක කියවා බැලීමෙන් පසුව එක් වරම මෙසේ කියනු ඇත: ''කුමණ නම් පැරණි සහ සුපුරුදු බොරුද! මොන තරම් 'වාමාංශික' ළදරු ස්වභාවයක්ද!''

නමුත් අපි මෙම තර්ක වඩාත් සමීප ලෙස පරීක්ෂා කර බලමු.

''පක්ෂයේ ආඥාදායකත්වය, නැතහොත්, පංතියේ ආඥාදායකත්වය: නායකයන්ගේ ආඥාදායකත්වය, (පක්ෂය) නැතහොත්, පොදුජනතාවගේ ආඥාදායකත්වය (පක්ෂය)?'' යනුවෙන් හුදෙක් ප්‍රශ්නය ඉදිරිපත් කළ පමණින්ම ඔප්පු වන්නේ, එසේ කරන තැනැත්තේ විශ්වාස කළ නොහැකි තරමට හා සුව කළ නොහැකි තරමට මොළය අවුල් කරගෙන තිබෙන බවය. සම්පූර්ණයෙන්ම අසාමාන්‍ය යමක් නිර්මාණය කිරීමට මෙම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පුද්ගලයන්ට උවමනා වී තිබේ. තමන් දක්ෂයන් බව පෙන්වීමට ඔවුන් දරන උත්සාහය නිසා, ඔවුහු විහිළු තත්වයට පත්වෙති. පොදු ජනතාව පංතිවලට බෙදී සිටින බව කවුරුත් දනිති. පොදු ජනතාව පංති සමග විසංසන්දනය කළ හැක්කේ, සමාජමය නිෂ්පාදන ක්‍රමය තුළ දරන තත්වයන් ගැන නොතකා පොදු වශයෙන් ගත් අති බහුතර ජනකායද, සමාජමය නිෂ්පාදන ක්‍රමය තුළ නිශ්චිත තත්වයක් දරන පිරිස්ද විසංස-න්දනය කිරීමෙන් පමණක් බවත්, සාමාන්‍ය වශයෙන් සහ බොහෝ තන්හි, යටත්පිරිසෙයින්, වර්තමාන ශිෂ්ටාචාර රටවල හෝ, පංතිවලට නායකත්වය දෙනු ලබන්නේ දේශපාලන පක්ෂ විසින් බවත්, සාමාන්‍ය නීතියක් වශයෙන්ම දේශපාලන පක්ෂ මෙහෙයවනු ලබන්නේ වැඩිම අධිකාරයක්, බලපෑමක් සහ අත්දැකීමක් ඇති, ඉතාමත් වගකිව යුතු තනතුරුවලට තෝරා පත් කෙරුණු සහ නායකයන් යනුවෙන් හැඳින්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත තරමක් දුරට ස්ථාවර කණ්ඩායම් විසින් බවත් කවුරුත් දනිති. මේ සියල්ලම ඉතා සරලය. මේ සියල්ලම පැහැදිලි සහ නිරවුල්ය. මේ සඳහා කිසියම් වැල්වටාරමක්, නැතහොත් අළුත් අපභ්‍රංශයක් යොදන්නේ කුමටද? පක්ෂය නීත්‍යානුකූල තත්වයේ සිට හිටි අඩියේම නීති විරෝධී තත්වයට පත්වීම හේතුකොට ගෙන නායකයන්, පක්ෂ හා පංති අතර වූ සුපුරුදු, සාමාන්‍ය හා සරල සම්බන්ධකම් වෙනස් වී යාමෙන් අමාරු තත්වයකට පත්වීම නිසා, මෙම පුද්ගලයන් තමන්ගේ මොළය අවුල් කර ගත් බව එක් අතකින් පෙනේ. වෙනත් යුරෝපීය රටවල මෙන් ජර්මනියේ ද ජනයා නීත්‍යානුකූල ස්වභාවයටද, ක්‍රමවත් ලෙස පවත්වන පක්ෂ සම්මේලනවලදී නිදහස් හා නිසිලෙස ''නායකයන්'' තෝරාපත් කිරීමටද, පාර්ලිමේන්තු මැතිවරණ, පොදු ජන රැස්වීම්, පුවත්පත්, වෘත්තීය සමිති සහ වෙනත් සංගම් ආදියෙන් ප්‍රකාශ කෙරෙන හැඟීම් මගින් පක්ෂවල පංති සංයුතිය පරික්සා බැලීමේ පහසු ක්‍රමයට ද ඇබ්බැහි වී සිටියහ. විප්ලවයේ කලබල සහිත සංවර්ධනය හා සිවිල් යුද්ධය ඇති වීම නිසා, මෙම සුපුරුදු ක්‍රියා පරිපාටිය අත්හැර, නීත්‍යානුකූල භාවයේ සිට සීඝ්‍රයෙන් නීති විරෝධී භාවය වෙත යාමටත්, ඒ දෙක ඒකාබද්ධ කිරීමටත්, ''නායක කණ්ඩායම්'' තෝරාගැනීමේදී, පිහිටුවීමේදී හෝ රැක තබා ගැනීමේදී ''අපහසු'' සහ ''ප්‍රජාතන්ත්‍රවාදී නොවන'' ක්‍රම අනුගමනය කිරීමටත් සිදු වූ විට, විකල් වූ එම ජනයා, තනිකරම විකාරයන් වන යම් යම් දේ ගැන සිතන්නට පටන් ගත්හ. ඉමහත් වරප්‍රසාද සහිත සහ අතිශය ස්ථාවරත්වයක් ඇති නීත්‍යානුකූල භාවයේ සම්ප්‍රදයයන් හා කොන්දේසි බලපවත්වන කුඩා රටක ජන්ම ලාභීන් වීමට තරම් අවාසනාවක් වූ සහ නීත්‍යානුකූල භාවයේ සිට නීති විරෝධී භාවය දක්වා පරිවර්තනය වීමක් කිසි කලෙකත් දැක නැති,

ඕලන්ද කොමියුනිස්ට් පක්ෂයේ සමහර සාමාජිකයෝ සමහර විට ව්‍යාකූලත්වයට පත්ව, මොළය අවුල් කරගෙන, මෙම විකාර සොයාගැනීම් නිර්මාණය කිරීමට ආධාර කළහ.

අනිත් අතට කෙනෙකුට දක්නට තිබෙන්නේ ''පොදු ජනතාව'' සහ ''නායකයන්'' යන, දැන් ''මොස්තරකාර'' වී ඇති වදන්, හුදෙක්ම සිහි බුද්ධියෙන් තොරව සහ අනුසන්ධානයක් නැතිව යොදනු ලබන බවයි. නායකයන් ''පොදු ජනතාව'' සමග විසංසන්දනය කරමින් ''නායකයන්ට'' පහර දෙන කථා රැසක් අසා ඇති මෙම පුද්ගලයෝ ඒවා කටපාඩම් කරගෙන සිටිති. නමුත්, ඒ සියල්ලෙන්ම කියන්නේ කුමක් ගැනද යන්න ගැන සිතා බලා පැහැදිලි වැටහීමක් ලබා ගැනීමට ඔවුහු අපොහොසත් වූහ.

අධිරාජ්‍යවාදී යුද්ධය අවසානයේ දී හා ඉන් අනතුරුව සියලුම රටවල ''පොදුජනතාව'' සහ ''නායකයන්'' අතර අපසාරිතාවය ඉතාමත් පැහැදිලි ලෙස හා තියුණු ලෙස හෙළිදරව් විය. බ්‍රිතාන්‍යය උදහරණයක් ලෙසට ගනිමින්, මාක්ස් හා එංගල්ස් 1852 හා 1892 අතර වර්ෂවලදී බොහෝ වරක්ම මෙයට හේතුව විස්තර කළහ. තනිකරම එරටට විශේෂ වූ තත්වය හේතුකොට ගෙන, එහි ''පොදු ජනතාව'' අතරින් අර්ධ සුලු ධනපති, අවස්ථාවාදී ''ශ්‍රම කරු රදළ පන්තියක්'' ඉස්මතු විය. මෙම ශ්‍රමකරු රදළ පන්තියේ නායකයෝ නිතරම ධනපති පංතිය පැත්තට ගමන් කරමින් සිටියහ. එසේම ඔවුහු කෙළින්ම නැතහොත් වක්‍ර ලෙස ධනපතියන්ගේ මුදලට යටවූ පිරිසක් වූහ. මෙම අපකීර්තිමත් පුද්ගලයන්ට ද්‍රෝහීන් යන හංවඩුව විවෘතයේම තැබූ මාක්ස්, එනිසා ඔවුන්ගේ වෛරයට පාත්‍ර වීමේ ගෞරවය ලද්දේය. අද (විසිවැනි ශත වර්ෂයේ) අධිරාජ්‍යවාදය දියුණු රටවල් කීපයකට ඉමහත් වරප්‍රසාද සහිත තත්වයක් ලබා දී තිබේ. එනිසා දෙවැනි ජාත්‍යන්තරය සැම තන්හිම ද්‍රෝහී, අවස්ථාවාදී සහ සමාජ-ජාත්‍යොන්මාදවාදී නායකයන් වර්ගයක් ඇති වී තිබේ. එම නායකයෝ තමන්ගේම කර්මාන්තයේ, ශ්‍රම කරු රදළ පන්තියේ තමන්ගේම කොටසේ අවශ්‍යතාවයන් සඳහා කටයුතු කරති. අවස්ථාවාදී පක්ෂ ''පොදු ජනතාවගෙන්'', එනම්, වැඩ කරන ජනතාවගේ පුළුල්තම ස්ථරයන්ගෙන්, ඔවුන් බහුතරයෙන්, අඩුම වේතන ලබන කම්කරු-වන්ගෙන් ඈත් වී ඇත. මෙම උවදුර පිටු නොදැක, අවස්ථාවාදී, සමාජ-ද්‍රෝහී නායකයන් හෙළිදරව් කර, අවමානයට පත්කර එළවා නොදමා, විප්ලවවාදී නිර්ධන පංතියට ජයග්‍රහණයක් ලබා ගත නොහැකිය. තුන්වැනි ජාත්‍යන්තරය මුල පුරා ඇත්තේ මෙම ප්‍රතිපත්තියටය.

මේ හා සම්බන්ධයෙන් වූ කල, පොදු ජනතාවගේ ආඥාදායකත්වයත්, නායකයන්ගේ ආඥාදායකත්වයත්, පොදු වශයෙන් විසංසන්දනය කිරීම තරම් දුරට යාම අන්ත විකාරයක් හා තකතිරු කමක් වේ. මෙහිදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විශේෂයෙන්ම හාස්‍ය ජනක දෙය නම්, සරල කරුණු හා සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් පිළිගත් අදහස් දරන පරණ නායකයන් වෙනුවට ("නායකයන් හංගවේවා!" යන සටන් පාඨය කඩතුරාවක් කොට ගනිමින්) වල්පල් සහ විකාර දොඩන අළුත් නායකයන් ඉදිරිපත් කරනු ලැබීම ය. ජර්මනියේ ලෞපන්බෙර්ග්, වොල්ෆ්හයිම්, හෝර්නර්, කාල් ශ්‍රෙඩර්, ෆ්‍රෙඩ්රික් වෙන්ඩල්, කාල් එර්ලර්* එවැන්නෝ වෙති. ප්‍රශ්නය වඩාත් "අරුත්සරු" කිරීමටත්, දේශපාලන පක්ෂ පොදු වශයෙන් අනවශ්‍ය සහ "ධනපති" වන්නේ යයි ප්‍රකාශ කිරීමටත්, එර්ලර් දරන ප්‍රයත්නයන් කොතරම් අන්ත විගඩමක්ද යත් කෙනෙකුට ඒ ගැන කළ හැක්කේ පුදුමය පළ කිරීම පමණකි. සුළු වරදක් අත් නොහැරම කරගෙන ගියහොත්, එය සාධාරණ බව පෙන්වීමට ගාම්භීර හේතු සාධක සෙවීමෙහි යෙදෙතොත්, එය එහි තර්කානුකූල අවසානය දක්වාම ගෙන ගියහොත්, එය දැවැන්ත වරදක තත්වයට පත්වීමේ හැම ඉඩක්ම ඇතැයි යන සත්‍යය මේ සියල්ලෙන් සනාථ වේ.

විරුද්ධ පාර්ශවය එළඹී ඇත්තේ පක්ෂ ප්‍රතිපත්ති සහ පක්ෂ විනය බැහැර කරන තැනටය. මෙය නම්, ධනපති පංතියේ යහපත පිණිස නිර්ධන පංතිය සම්පූර්ණයෙන්ම නිරායුධ කිරීමට සමාන ක්‍රියාවකි. මෙයින් පෙනී යන්නේ සුළු ධනපති විසාරිතාවය හා අස්ථායීතාවයක්, නොපසුබටව උත්සාහය, සමගිය හා සංවිධිත ක්‍රියාකාරිත්වය අතින් පොහොසත්කම්

---

* කාල් එර්ලර්, "පක්ෂය විසුරුවා හැරීම" Kommunistische Arbeiter-Zeitung[49], හැම්බර්ග්, 1920 පෙබරවාරි 7, අංක 32: "ධනපති ප්‍රජාතන්ත්‍රවාදය විනාශ නොකර, ධනපති රාජ්‍යය විනාශ කිරීමේ හැකියාවක් කම්කරු පංතියට නොමැත. එසේ පක්ෂ විනාශ නොකර ධනපති ප්‍රජාතන්ත්‍රය විනාශ කිරීමද, එයට කළ නොහැකිය."

තමන් මාක්ස්වාදීන් ලෙසට සලකා ගන්නා බව පෙනෙන හරබර ජර්මන්වරු ඉතාමත් අනුවණ ප්‍රකාශයන් කිරීමට තරම් දුර යනු දැකීම, ලතින් රටවල සිටින සම්මේලවාදීන් සහ අරාජිකවාදින් අතුරෙන් වැඩියෙන්ම ව්‍යාකූල කල්පනා ඇතියවුන්ට "සතුටක්" වන්නට පිළිවන. (කේ. එර්ලර් සහ කේ. හෝර්නර් තමන් හොඳ මාක්ස්වාදීන් ලෙසට සලකාගන්නා බව ඉහත සඳහන් පත්‍රයෙහි ඔවුන් ලියා ඇති ලිපිවලින් ඉතාමත් පැහැදිලි ලෙස පෙනෙන නමුත්, එයින් ඔවුන් කර ඇත්තේ කොහේත්ම විශ්වාස ගැනීමට පවා බැරි තරම් බහුබූත කථා විකට ආකාරයෙන් දොඩමින් තමන්ට මාක්ස්වාදයේ අයන්න වත් නොවැටහෙන බව හෙළිදරව් කිරීමය.) යම්කිසිවෙක් මාක්ස්වාදය පිළිගත් පමණින්ම ඔහු වැරදිවලින් නිදහස් වන්නේ නැත. බොහෝ අවස්ථාවලදී මාක්ස්වාදය අප රටේ "මෝස්තරයක්" ලෙස පැවත ඇති නිසා රුසියානුන් වන අපි මෙය හොඳින් දන්නෙමු.

නොමැති කමක් ය. එම දුර්වල කම දිරිගැන්වුනහොත් ඕනෑම නිර්ධන පංති විප්ලවවාදී ව්‍යාපාරයක් අනිවාරණීය වශයෙන්ම විනාශ වනු ඇත. කොමියුනිස්ට්වාදයේ ස්ථාවරය අනුව පක්ෂ ප්‍රතිපත්තිය බැහැර කිරීම යනුවෙන් අදහස් වන්නේ (ජර්මනියේ) ධනපති ක්‍රමය බිඳවැටීමේ පූර්වාසන්නයේ සිට, කොමියුනිස්ට් ක්‍රමයේ පහළ නැතහොත් අන්තර් අදියර වෙත නොව එහි ඉහළ අදියර වෙත පැනීමට උත්සාහ දැරීමය. නිර්ධන පංතිය බලය දිනාගැනීමෙන් පසුව පංති පවතිනු ඇත — ඉන් පසුව අවුරුදු ගණන් යන තෙක් සෑම තන්හිම පංති පවතිනු ඇත. ගොවිජනතාවක් නොමැති (නමුත් සුළු දේපල හිමියන් සිටින) බ්‍රිතාන්‍යයේ සමහරවිට මෙම කාලය කෙටි වන්නට පිළිවන. පංති අහෝසි කිරීම යන්නෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ධනපතියන් සහ ඉඩම් හිමියන් පලවා හැරීම පමණක් නොවේ. ඔවුන් පලවා හැරීම අපි සංසන්දනීය වශයෙන් පහසුවෙන් සාර්ථක කෙළෙමු. පංති අහෝසි කිරීම යන්නෙන් සුළු වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයන් නැති කිරීමද අදහස් වේ. ඔවුන් පලවා හැරීම හෝ මර්දනය කිරීම නොකළ හැකි ය. ඔවුන් සමග ජීවත් වීමට අපි උගත යුත්තෙමු. ඔවුන් නැවත හැඩගස්වා සහ නැවත උගන්වා ගත හැක්කේ (සහ යුත්තේ) දීර්ඝ වශයෙන් හෙමින් හා සීරුවෙන් කරන වැඩ මගින් පමණකි. ඔවුහු සුළු ධනපති වාතාවරණයකින් නිර්ධන පංතිය සෑම පැතතෙන්ම වටලාගෙන සිටිති. මෙම සුළු ධනපති පංති වාතාවරණය නිර්ධන පංතිය තුළට කාන්දු වී එය දූෂණය කරමින්, එහි පිරිස් අතර සුළු ධනපති කොන්ද පණ නැති ගතිය, අසමගිය, පුද්ගලවාදය සහ මාරුවෙන් මාරුවට ප්‍රමෝදයට සහ කනස්සල්ලට පත්වීමේ ස්වභාවයද නිතර නිතර ඇති කරයි. මෙයින් වන හානිය නැති කිරීමටත්, නිර්ධන පංතියේ සංවිධානාත්මක කාර්ය කොටස (එය එහි ප්‍රධාන කාර්ය කොටස වේ) නිවැරදි ලෙස, සාර්ථක ලෙස සහ ජයග්‍රාහී ලෙස ඉටු කිරීමටත්, නිර්ධන පංතියේ පක්ෂය තුළ දැඩිතම මධ්‍යගතකරණය හා විනය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන්නේය. නිර්ධන පංති ආඥාදායකත්වය වූ කලී පැරණි සමාජයේ බලවේග සහ සම්ප්‍රදායයන්ට විරුද්ධව නොකඩවා කරන ලේ වගුරන හා ලේ නොවගුරන, ප්‍රචණ්ඩ සහ සාමකාමී, යුද්ධමය හා ආර්ථිකමය, අධ්‍යාපනික හා පරිපාලනමය අරගලයකි. දශලක්ෂ ගණන් හා කෝටි ගණන් ජනතාවන්ගේ පුරුද්දෙහි ශක්තිය අති මහත් බලවේගයක් වන්නේය. අරගලයෙන් පන්නරය ලත් අයෝමය පක්ෂයකින් තොරව, අදාළ පංතියේ සියලු අවංක ජනතාවන්ගේ විශ්වාසය දිනාගත් පක්ෂයකින් තොරව, පොදුජනතාවගේ අන්දම් ගැන පරීක්ෂාවෙන් සිටීමේ හා ඒවා කෙරෙහි බල පෑමේ පොහොසත් කම් ඇති පක්ෂයකින් තොරව, එවැනි අරගලයක් සාර්ථක ලෙස කළ හැකි නොවේ. කෝටි සංඛ්‍යාත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සුළු දේපල හිමියන් "ජයගන්නවාට" වඩා මධ්‍යගත ලොකු ධනපති පංතිය ජයගැනීම දහස්වරක් පහසුය. එසේ නමුත්, සුළු දේපල හිමියන්ගේ සාමාන්‍ය, එදිනෙද, අදෘශ්‍යමාන, හසු නොවන හා දුර්මුඛකාරී ක්‍රියාවන් මගින් ඔවුන් ඇති කරන්නේ ධනපති පංතියට අවශ්‍ය සහ ධනපති පංතිය යළි නගා සිටුවීමට තුඩු දෙන ප්‍රතිඵලම ය. නිර්ධන පංති පක්ෂයේ විනය (විශේෂයෙන්ම එහි ආඥාදායකත්වයේ සමයේදී) අල්පමාත්‍ර වශයෙන් හෝ දුර්වල කරන යමෙක් වෙතොත්, ඔහු ඇත්ත වශයෙන් නිර්ධන පංතියට විරුද්ධව ධනපති පංතියට ආධාර කරන්නේ වෙයි.

නායකයන්, පක්ෂය, පංතිය හා පොදු ජනතාව පිළිබඳ ප්‍රශ්නය හා සමාන්තරව සිටින සේ, අපි, ප්‍රතිගාමී වෘත්තීය සමිති පිළිබඳ ප්‍රශ්නයද ඉදිරිපත් කළ යුත්තෙමු. නමුත්, අපගේ පක්ෂයේ අත්දැකීම් පදනම් කරගෙන සමාප්තික අදහස් ස්වල්පයක් දැක්වීමේ අවසරය මම මෙහි දී ගන්නෙමි. අපගේ පක්ෂය තුළ "නායකයන්ගේ ආඥාදායකත්වයට" විරුද්ධව ප්‍රහාරය එල්ල කෙරුණු අවස්ථා නිතර දක්නා ලදී. මට මතක හැටියට මට එවැනි ප්‍රහාරයක් ශ්‍රවනය කිරීමට ලැබුණු ප්‍රථම අවස්ථාව 1895 දී විය. එවකට නිල වශයෙන් පක්ෂයක් නොපැවති අතර, දිස්ත්‍රික්ක කණ්ඩායම්වල නායකත්වය ගැනීම සඳහා සාන්ත පීටර්ස්බර්ග් නගරය තුළ මධ්‍යම කණ්ඩායමක් හැඩ ගැසෙමින් තිබිණි.[50] "නායකයන්ගේ ආඥාදායකත්වයට" විරුද්ධව, "කතිපයාධිපතිත්වයට" විරුද්ධව යනාදී වශයෙන් කථා කළ කුඩා විරුද්ධ පාර්ශවයක් අප පක්ෂයේ (අප්‍රේල් 1920 නව වැනි සම්මේලනයෙහි ද විය.[51] එනිසා ජර්මන්වරුන් අතර දක්නට ලැබෙන "වාමාංශික කොමියුනිස්ට්වාදය" නැමති "ළදරු වලිප්පුව" පුදුම එලවන, අළුත් හෝ භයංකර හෝ දෙයක් නොවේ. මෙම රෝගය භයානක නොවන අතර එය සුව වූ පසු ජීවියා වඩාත් ආරෝග්‍ය සම්පන්න වන්නේය. අනිත් අතට, අප හා සම්බන්ධයෙන් වූ කල, ප්‍රධාන මණ්ඩලය, එනම්, නායකයන්, ආවරණය කර සහ අතිශය රහස්‍යභාවයෙන් වසං කර තැබීමේ අවශ්‍යතාවය ඇති කරන පරිදි, නීත්‍යානුකූල සහ නීති විරෝධී වැඩ කටයුතු සීඝ්‍රයෙන් මාරු කෙරෙන තත්වයෙන් සමහර විට ඉතාමත් අන්තරායකාරී ප්‍රතිඵල ඇතිවන්නේය. එයින් ඉතාමත් නරකම ප්‍රතිඵලය වූයේ 1912 දී මලිනොව්ස්කි නැමති ප්‍රකෝපකාර චරපුරුෂයා බොල්ෂෙවික් මධ්‍යම කාරක සභාවට ඇතුළු වීමය. ඔහු දුසිම් පිට දුසිම් ගණනින්, ඉතාමත් හොඳ සහ ඉතාමත් පක්ෂපාත සහෝදරවරුන් පාවා දී ඔවුන් බරපතල වැඩ සහිතව බන්ධනාගාර ගත වන තැනට හා ඔවුන් බොහෝ දෙනෙකුගේ මරණය ඉක්මන් වන තැනට කටයුතු යෙදුවේය. ඊට වැඩි හානියක් කිරීමට ඔහුට නුපුළුවන් වූයේ නීත්‍යානුකූල සහ නීති

විරෝධී වැඩ අතර හරි ආකාර තුලනයක් පැවති හෙයිනි. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙක් සහ දූමා සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙසට ක්‍රියා කළ මලිනොව්ස්කිට, අපගේ විශ්වාසය දිනා ගැනීම සඳහා, නීත්‍යානුකූල දිනපතා පුවත්පත් ඇති කිරීම පිණිස අපට ආධාර නොකර බැරිවිය. සාර්වාදය යටතේ වුවද, මෙන්ෂෙවික් අවස්ථාවාදයට විරුද්ධව අරගලයක් කිරීමටත්, නිසි ලෙස වෙස් ගැන්වූ ආකාරයකින් බොල්-ෂෙවික්වාදයේ මූලධර්ම පැතිරවීමටත්, එම පත්‍රවලට හැකි විය. මලිනොව්ස්කි එක් අතකින් දුසිම් ගණන් කදිමතම බොල්ෂෙවික්වාදීන් බරපතල වැඩ සහිත සිරගෙයටත්, මරණයටත් යැවූ අතර, එමෙන් වාර දහස් ගණනක් විශාල සංඛ්‍යාවක් නව බොල්ෂෙවික්වරුන්ට නීත්‍යානුකූල පුවත් පත් මගින් අධ්‍යාපනය දීමේ කාර්යයට අනිත් අතින් ආධාර කිරීමට ඔහුට සිදුවිය. ප්‍රතිගාමී වෘත්තීය සමිති තුළ විප්ලවවාදී වැඩ කරන්නේ කෙසේද යන්න උගෙන ගැනීමට සිදුවී සිටින ඒ ජර්මන් සහෝදරවරු (සහ බ්‍රිතාන්‍ය, ඇමෙරිකානු, ප්‍රංශ සහ ඉතාලියානු සහෝදරවරුද) මෙම කරුණ ගැන බරපතල ලෙස සිතා බැලීම වටනේය.*

ඉතාමත් දියුණු රටවල් ඇතුළුව, රටවල් බොහොමයක ධනපතියෝ ඒකාන්ත වශයෙන්ම කොමියුනිස්ට් පක්ෂ තුළට ප්‍රකෝපකාර චරපුරුෂයින් ඇතුළු කරති. ඔවුන් ඉදිරියටත් දිගටම එසේ කරනු ඇත. මෙම අන්තරාය පිටු දැකීමට තිබෙන එක මාර්ගයක් නම් නීති විරෝධී සහ නීත්‍යානුකූල, වැඩ දක්ෂ ලෙසින් ඒකාබද්ධ කිරීමය.

---

* මලිනොව්ස්කි ජර්මනියේ යුද්ධ සිරකරුවෙක් විය. බොල්ෂෙවික්වරුන් බලයෙහි සිටින විට ඔහු රුසියාවට ආපසු පැමිණි වහාම, ඔහුට විරුද්ධව නඩු විභාග කළ අපගේ කම්කරුවන් විසින් ඔහුට වෙඩි තබන ලදී. අපගේ වරද සම්බන්ධයෙන්, ප්‍රකෝපකාර චර පුරුෂයෙක් අප පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙක් වීම සම්බන්ධයෙන් මෙන්ෂෙවික්වරු අපට තදින් පහර දුන්හ. නමුත්, දූමා සභාවේ සභාපති රොද්ස්යන්කෝ, මලිනොව්ස්කි ප්‍රකෝපකාර චර පුරුෂයෙක් බව දැන සිටි අතර, ඒ බව දූමා සභාවේ තෘදවික් වරුන්ට[62] හා කම්කරුවන්ට නොදැන්වීම සම්බන්ධයෙන් ඔහු අත් අඩංගුවට ගෙන ඔහුට විරුද්ධව නඩු විමසන ලෙස බොල්ෂෙවික්වරුන් විසින් කරන ලද බලවත් ඉල්ලීමට කෙරෙන්ස්කි ආණ්ඩුවේ සිටි මෙන්ෂෙවික්වරු වත්, සමාජවාදී-විප්ලවවාදීහු වත් ආධාර නොදුන්හ. ඒ අනුව නිදහසේ සිටි රොද්ස්යන්කෝ කිසි බාධාවක් නොමැතිව ගොස් දෙනිකින්ට එකතුවිය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

VI

විප්ලවවාදීන් ප්‍රතිගාමී වෘත්තීය සමිති තුළ වැඩ කළ යුතුද?

ජර්මන් ''වාමවාදීන්'' හා සම්බන්ධයෙන් වූ කල, මෙම ප්‍රශ්නයට පිළිතුර විය යුත්තේ කොන්දේසි විරහිත නැත යන්න යයි ඔවුහු අදහස් කරති. ඔවුන්ගේ මතයේ හැටියට, ජාත්‍යෝන්මාදවාදී, සමාජ-ජාත්‍යෝන්මාදවාදී, සම්මුති ගතවන සහ ප්‍රති විප්ලවවාදී වූ ලේගින් වර්ගයේ වෘත්තීය සමිති තුළ විප්ලවවාදීන් සහ කොමියුනිස්ට්වාදීන් වැඩ කිරීම අනවශ්‍යයයි ද, සමාව දිය නොහැකි වරදක් පවා වන්නේයයිද, ''ඔප්පු කිරීමට'' සාක්ෂි වශයෙන් ''ප්‍රතිගාමී'' සහ ''ප්‍රතිවිප්ලවවාදී'' වෘත්තීය සමිති වලට විරුද්ධව කරන වතුර වාග් ප්‍රහාර සහ (කේ. හෝර්නර් ඉතාමත් ''හරබර'' සහ ඉතාමත් තකතිරු ආකාරයෙන් කරන වැනි) කෝපාවිෂ්ට බෙරිහන්දීම් ප්‍රමාණවත් වන්නේය.

එවැනි උපක්‍රමවල විප්ලවවාදිත්වය ගැන ජර්මන් ''වාමවාදීන්'' කොතරම් තදින් අවබෝධ කරගෙන සිටියත්, ඒවා ඇත්ත වශයෙන් සහමුලින්ම වැරදිය. ඒවා තුළ හිස් වදන් හැර වෙනත් කිසිවක් අන්තර්ගතව නැත.

මෙය පැහැදිලි කිරීම පිණිස මම අපගේම අත්දැකීමෙන් පටන් ගන්නෙමි. බොල්ෂෙවික්වාදයේ ඉතිහාසයෙහි හා වර්තමාන උපක්‍රමවල ඇති විශ්වීය වශයෙන් ව්‍යවහාරයට නැගිය හැකි, වැදගත් හා අදාළ වන කරුණු බටහිර යුරෝපයට ගැලපීම අරමුණු කොටගත් මෙම පොතෙහි පොදු සැලැස්මට එය අනුකූල වන්නේය.

අද රුසියාවේ නායකයන්, පක්ෂය, පංතිය හා පොදු ජනතාව අතර පවතින සම්බන්ධයත්, නිර්ධන පංතියේ සහ එහි පක්ෂයේ ආඥාදායකත්වය වෘත්තීය සමිති කෙරෙහි දක්වන ආකල්පයත් තත්වාකාරයෙන් මෙසේය: සෝවියට් සභා තුළ සංවිධානය වී සිටින නිර්ධන පංතිය විසින් ආඥාදායකත්වය ක්‍රියාත්මක කරනු ලැබේ. නිර්ධන පංතියට නායකත්වය දෙනු ලබන්නේ බොල්ෂෙවික්වරුන්ගේ කොමියුනිස්ට් පක්ෂය විසිනි. එම පක්ෂයේ පසුගිය (1920 අප්‍රේල්) සම්මේලනයේ සංඛ්‍යා ලේඛන අනුව එහි සාමාජිකත්වය 6, 11, 000 කි. ඔක්තෝබර් විප්ලවයට පෙර මෙන්ම පසුවද එහි සාමාජිකත්වය බෙහෙවින් වෙනස් වූ අතර 1918 දී හා 1919 දී පවා එය සංඛ්‍යාවෙන් ඊට වඩා බොහෝ කුඩා විය.[53] පක්ෂය පමණ ඉක්මවා වර්ධනය වීම ගැන අපි විමසිලි මත් වෙමු. මන්දයත්, වෙඩි තබා දැමීමට පමණක් සුදුසුවන වංචාකාරයින් හා තක්කඩියන් පාලක පක්ෂයේ සාමාජිකත්වය තුළට රිංගා ගැනීම සඳහා තමන්ට හැකි සියල්ලක්ම කරන හෙයිනි. අන්තිම වරට අප පක්ෂයේ දොර පුළුල් ලෙසට විවෘත කරන ලද්දේ (1919 ශීත ඍතුවේදී) යුදේනිච් පෙත්‍රොග්‍රාදයෙන් සැතපුම් කීපයක් ඔබ්බෙන්ද, දෙනිකින් ඔරිඔල්හිද (මොස්කව් සිට සැතපුම් 350 ක් පමණ) සිටියදීය. ඒද කම්කරුවන් සහ ගොවිජනයා සඳහා පමණක් විය. එය සෝවියට් සමූහාණ්ඩුව මාරක අන්තරාවකට මුහුණ පා සිටි අවස්ථාවක් නිසා, කොමියුනිස්ට්වාදීන් සමග එකතුවීමෙන් වාසි සොයන්නන්ට, වංචාකාරයින්ට, තක්කඩියන්ට හා පොදු වශයෙන් විශ්වාස නොකටයුතු පුද්ගලයන්ට බලාපොරොත්තු විය හැකි ආත්මාර්ථ සිද්ධියක් නොවූ (හා එල්ලුම් ගසට හා වධ වේදනාවන්ට කැප වීම වැඩියෙන් අපේක්ෂා කළ හැකි) කාලයක් විය.[54] වාර්ෂික සම්මේලන පක්ෂය මෙහෙයවනු ලබන්නේ සම්මේලනයේදී තෝරා පත් කරන දහනම දෙනෙකුගෙන් යුත් මධ්‍යම කාරක සභාව විසිනි (පසුගිය සම්මේලනය සඳහා නියෝජිතයන් පත් කරන ලද්දේ සාමාජිකයන් 1000 ට එක නියෝජිතයා බැගිනි). මොස්කව්හි, පක්ෂයේ නිති පතා කටයුතු කරනු ලබන්නේ, සංවිධාන කාරක සභාව සහ දේශපාලන කාරක සභාව යන, මධ්‍යම කාරක සභාවටත් වඩා කුඩා සහ මධ්‍යම කාරක සභාවේ පූර්ණ රැස්වීම්වලදී තෝරා පත් කරන ලද මණ්ඩල විසිනි. ඒ එක කාරක සභාවකට මධ්‍යම කාරක සභිකයන් පස් දෙනෙකු බැගින් පත් කරනු ලැබේ. මෙය අංග සම්පූර්ණ ''කතිපයාධිපතිත්වයක්'' ලෙසට පෙනෙන්න ට පිළිවන. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ මග පෙන්වීම නොමැතිව අපගේ සමූහාණ්ඩුවේ කිසිම රාජ්‍ය ආයතනයක් විසින්, කිසිම වැදගත් දේශපාලන හෝ සංවිධාන ප්‍රශ්නයක් තීරණය කරනු නොලැබේ.

පක්ෂය එහි වැඩ කටයුතුවලදී වෘත්තීය සමිති කෙරෙහි එක එල්ලේම විශ්වාසය තබයි. පසු ගිය (1920 අප්‍රේල්) සම්මේලනයේ සංඛ්‍යා ලේඛන අනුව, දැන් මෙම වෘත්තීය සමිතිවල ලක්ෂ හතළිහ ඉක්මවූ සාමාජිකත්වයක් ඇත. එම සාමාජිකත්වය අපාක්ෂික වන්නේ නමින් පමණකි. ඇත්ත වශයෙන් සංගම් අති බහුතරයක නායක මණ්ඩල සහ නිශ්චය වශයෙන්ම, සමස්ත රුසියා මහා වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නැතහොත් කාරක සභාවේ (සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයේ) ප්‍රධාන ආයතන කොමියුනිස්ට්වරුන් ගෙන් සැදී ඇති අතර, ඒවා පක්ෂ නියමයන් සියල්ල ක්‍රියාත්මක කරති. මේ අනුව සමස්තයක් වශයෙන් බලන කල, අපට නාමික වශයෙන් පමණක් කොමියුනිස්ට් පාක්ෂික නොවන, නම්‍යශීලී සහ සාපේක්ෂ වශයෙන් පුළුල් හා ඉතා බලවත් නිර්ධන පංති යන්ත්‍රයක් ඇත. එය මගින් පක්ෂය පංතිය හා පොදුජනතාව සමග සමීප ලෙස එකට සම්බන්ධවී සිටී. එය මගින්, පක්ෂයේ නායකත්වය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යටතේ, පංති ආඥාදායකත්වය ක්‍රියාත්මක කරනු ලැබේ. වෘත්තීය සමිති සමග කිට්ටු සම්බන්ධකම් නොමැතිව, ආර්ථික කටයුතුවලදී පමණක් නොව යුද්ධමය කටයුතුවලදීද ඒවායේ ධෛර්යමත් සහයෝගය නොමැතිව අවුරුදු දෙක හමාරක් තිස්සේ තබා මාස දෙක හමාරක්වත් අපට රට ආණ්ඩු කිරීමට හා ආඥාදායකත්වය පවත්වා ගැනීමට නොහැකි වන්නට තිබුණ බව සත්‍යයකි. ව්‍යවහාරික වශයෙන් මෙබඳු කිට්ටු සම්බන්ධකම් පැවැත්වීමේදී, නායක වෘත්තීය සමිති කාරකවරුන් පමණක් නොව, පොදුවශයෙන් බලපෑමක් ඇති වෘත්තීය සමිති ක්‍රියාකාරීන් සමග ප්‍රචාරක, උද්ඝෝෂණික සහ කලට වේලාවට හා නිතිපතා කරන සාකච්ඡා පැවැත්වීම ස්වභාවයේ වූ ඉතාමත් සංකීර්ණ සහ විවිධාකාර කාර්යයන් ඉටු කිරීම, ස්වාභාවික ලෙසටම අවශ්‍ය වන්නේය. එසේම, මෙම සම්බන්ධකම් පැවැත්වීමේදී අවශ්‍ය වන දෙයකි, තවමත්, කුඩා වුවත්, යම්කිසි අනුගාමික පිරිසක් ඇතිව සිටින, දෘෂ්ටිමය වශයෙන් (ධනපති) ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාකිරීමේ සහ වෘත්තීය සමිති ස්වාධීන විය යුතු යයි (නිර්ධන පංති බලයෙන් ස්වාධීන විය යුතු යයි!) දේශනා කිරීමේ පටන්, නිර්ධන පංති විනය කඩා කප්පල් කිරීම යනාදිය දක්වා විහිදුනු විවිධාකාර ප්‍රතිවිප්ලවවාදී කූටෝපායයන් සියල්ලක්ම එම අනුගාමිකයන්ට උගන්වන මෙන්ෂෙවිකයන්ට විරුද්ධව අධිෂ්ඨාන සහගත අරගලයක් කිරීම.

වෘත්තීය සමිති මගින් ''පොදු ජනතාව'' සමග සම්බන්ධතා පැවැත්වීම ප්‍රමාණවත් නොවන්නේයයි අපි අදහස් කරමු. අපගේ විප්ලවය සිදුවන අතර තුර කෙරුණු ප්‍රායෝගික කටයුතුවල ප්‍රතිඵලයක් ලෙසට අපාක්ෂික කම්කරු සහ ගොවි සාකච්ඡා සභා වැනි ආයතන උද්ගත වී තිබේ. පොදුජනතාවගේ මනෝ ගතිය වටහා ගැනීම, ඔවුන් වෙතට වඩාත් සමීප වීම, ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම, ඔවුනතුරින් හොඳම අය රාජ්‍ය තනතුරුවලට උසස් කිරීම යනාදිය සඳහා මෙම ආයතනයට ආධාර දී එය සංවර්ධනය හා ව්‍යාප්ත කිරීමට අපි හැම ආකාරයකින්ම උත්සාහ දරන්නෙමු. රාජ්‍ය පාලන කටයුතු පිළිබඳ කොමිසාර් අංශය කම්කරු සහ ගොවි පරීක්ෂණය බවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් මෑතදී නිකුත් කරන ලද ආඥාව යටතේ, විවිධ ආකාරයේ පරීක්ෂණ පැවැත්වීමට රාජ්‍ය පාලනයේ සාමාජිකයන් තේරීම ආදිය සඳහා මෙම වර්ගයේ අපාක්ෂික සාකච්ඡා සභාවලට බලය පවරා තිබේ.

එපමණක් නොව, පක්ෂයේ වැඩ කටයුතු සියල්ලම ක්‍රියාත්මක කරනු ලබන්නේද රැකියා විශේෂත්වයක් නොතකා වැඩ කරන පොදු ජනතාව සම්බන්ධ කොටගත් සෝවියට් සභා මගිනි. සෝවියට් සභාවල දිස්ත්‍රික් සම්මේලන ප්‍රජාතන්ත්‍රවාදී ආයතන වෙති. ධනපති ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩු අතරින් හොඳම ඒවා වුවද එවැනි ආයතන කිසිවක් දක නැත. මෙම සම්මේලන (ඒවායේ කටයුතු ඉතාමත් සමීප ලෙස නිරීක්ෂණය කිරීමට පක්ෂය ප්‍රයත්න දරයි) මගින් සහ ගම්බද දිස්ත්‍රික්කවල විවිධ තනතුරුවලට පංති විඥානය ඇති කම්කරුවන් නිරතුරුවම පත් කිරීමෙන්, නිර්ධන පංතිය, ගොවිජනතාවගේ නායකයා ලෙසට එයට පැවරී තිබෙන කාර්ය කොටසද, නාගරික නිර්ධන පංතියේ ආඥාදායකත්වය ක්‍රියාත්මක කිරීමද, ධනවතුන්, ධනපතියන්, සූරාකන සහ ලාභ ගරන ගොවීන් ආදීන්ට විරුද්ධව ක්‍රමානුකූල ලෙස අරගල කිරීමද, ඉටු කරන්නේය.

''ඉහළින්'' බලන කල, ආඥාදායකත්වය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමේ ස්ථාවරයෙන් බලන කල, නිර්ධන පංති රාජ්‍ය බලයේ පොදු යන්ත්‍රය පෙනෙන්නේ ඒ ආකාරයට ය. මෙම යන්ත්‍රය ගැන විසි පස් වසරක් තිස්සේ දැන සිටි සහ එය කුඩා, නීති විරෝධී හා රහස්‍ය කවවලින් පටන්ගෙන සංවර්ධනය වී එනු දුටු රුසියානු බොල්ෂෙවිකයාට, ''ඉහළින්'' නැතහොත් ''පහළින්'' ක්‍රියාත්මක වීම ගැන ද, නායකයන්ගේ ආඥාදායකත්වය නැතහොත්, පොදුජනතාවගේ ආඥාදායකත්වය ගැනද, ආදී වශයෙන් කරන මෙම කථා සියල්ලම, මිනිසෙකුට වඩාත් ප්‍රයෝජනවත් වන්නේ ඔහුගේ වම් කකුලද, නැතහොත්, දකුණු අතද යන්න ගැන සාකච්ඡා කිරීම හා සමාන තේරුමක් නැති, ළාමක විකාරයක් ලෙසට පෙනී යන්නේ මන්දැයි පාඨකයාට වැටහෙනු ඇතැයි අපි විශ්වාස කරමු.

කොමියුනිස්ට් වාදීන්ට ප්‍රතිගාමී වෘත්තීය සමිති තුළ වැඩ කළ නොහැකි යයිද, ඔවුන් ඒවා තුළ වැඩ නොකළ යුතු යයිද, එවැනි වැඩ කටයුතු ප්‍රතික්ෂේප කිරීමට ඉඩ දිය හැකි යයිද, වෘත්තීය සමිතිවලින් ඉවත් වීම සහ ඉතා ප්‍රසන්න (සහ සමහර විට වැඩි වශයෙන්ම යෞවන) කොමියුනිස්ට්වරුන් විසින් නිර්මාණය කරනු ලබන ඉතාමත්ම අළුත් හා අති පිරිසිදු ''කම්කරු සංගමයක්'' ඇතිකිරීම අවශ්‍ය යයිද, කියන ජර්මන් වාමවාදීන්ගේ පුරාජේරුකාර, මහ උගත් හා බියජනක තරම් විප්ලවවාදී දේශනා, ඒ සමානම තේරුමක් නැති ළාමක විකාරයන් ලෙස නොසලකා සිටීමට අපට පුළුවන් කමක් නැත.

ධනපති ක්‍රමය අනිවාරණීය වශයෙන් සමාජවාදයට ඉතිරිකර යන උරුමයක් ඇත. එයනම්, එක් අතකින්, කම්කරුවන් අතර පවතින හා ශතවර්ෂ ගණන් කාලයක් තිස්සේ පරිණාම වී ඇති වෘත්තීයමය සහ ශිල්පීයමය ප්‍රභේදයන් ද, අනිත් අතින් වෘත්තීය සමිතිද, වේ. මෙම වෘත්තීය සමිතිවල ශිල්පීය සංගම් ස්වභාවය හීන වී ගොස් ඒවා (ශිල්පීය අංශ, වෘත්තීන් හා රැකියා කොට්ඨාශ පමණක් නොව මුළු මහත් කර්මාන්තයන්ම වැළඳගත්) පුළුල්තර කාර්මික සංගම් බවට පත්වනු

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ඇත්තේ ඉතා හෙමින් අවුරුදු ගණනාවක් තිස්සේ සංවර්ධනය වීමෙන් පසුව පමණකි. ජනතාව අතරින් ශ්‍රම විභජනය තුරන් කිරීමට, ජනතාවට අධ්‍යාපනය හා ශික්ෂණය ලබා දීමට, ජනතාවට සෑම දෙයක්ම කිරීමේ හැකියාව ලැබෙන සේ ඔවුන්ට සර්ව පාර්ශවීය සංවර්ධනය හා සර්වපාර්ශවීය පුහුණුව ලබා දීමට මෙම කාර්මික සංගම් මගින් ඉදිරියට යා හැක්කේ ඉන් පසුව ය. කොමියුනිස්ට්වාදය ඉදිරියට යන්නේ හා ඉදිරියට යා යුත්තේ මෙම අරමුණ ඉටු කිරීමටය. එය එම අරමුණ වෙත ළඟාවනු නිසැකය. නමුත් ඒ අවුරුදු බොහෝ ගණනකින් පසුව පමණකි. සම්පූර්ණයෙන් සංවර්ධනය වූ, සම්පූර්ණයෙන් තහවුරු වූ හා සංයුක්ත වූ, නො අඩුව අංග සම්පූර්ණ වූ සහ මෝරා ගිය කොමියුනිස්ට් ක්‍රමයක ඇතිවන මෙම අනාගත ප්‍රතිඵලය අද ව්‍යවහාරික කටයුතුවලදී විස්තර කරන්නට ප්‍රයත්න දැරීම යනු අවුරුදු හතරක අත දරුවෙකුට උසස් ගණිතය උගැන්වීමට උත්සාහ කිරීමක් බඳුය.

අපට සමාජවාදය ගොඩ නැගිය හැක්කේ (හා අප එය ගොඩනැගිය යුත්තේ) වියුක්ත මිනිස් ද්‍රව්‍යයෙන්, නැතහොත්, අප විසින් විශේෂයෙන් සකස් කරගන්නා ලද මිනිස් ද්‍රව්‍යයෙන් නොව, ධනපති ක්‍රමය අපට උරුම කොට දුන් මිනිස් ද්‍රව්‍යයෙනි. මෙය පහසු කටයුත්තක් නොවන බව ඇත්තය. නමුත් මෙම කර්තව්‍යය ඉටු කර ගැනීම සඳහා ඉදිරිපත් කරන වෙනත් ඕනෑම ප්‍රවේශ මාර්ගයක්, ඒ ගැන සාකච්ඡා කිරීමට තරම්වත් වැදගත් නොවේ.

ධනපති ක්‍රමයේ සංවර්ධනයේ මුල් කාලයේදී වෘත්තීය සමිතිවලින් නියෝජනය වූයේ, කම්කරුවන්ගේ අසමගියේ සහ අසරණභාවයේ සිට පංති සංවිධානයේ බිංජාංකුර දක්වා පරිවර්තනයවීමක් හෙයින්, එය කම්කරු පංතිය තැබූ දැවැන්ත ඉදිරි පියවරක් විය. නිර්ධන පංතියේ පංති සංවිධානයේ උසස්තම ආකෘතිය වන නිර්ධන පංතියේ විප්ලවවාදී පක්ෂය (නායකයන් මුළු මහත් පංතියම හා පොදු ජනතාවම සමග නොබිඳිය හැකි සමස්තයක් සේ එකට පෑස්සීමට උගෙන ගන්නා තෙක් පක්ෂය එම නම ලැබීමට සුදුසු නොවේ) හැඩ ගැසී ඒමට පටන්ගත් පසු, වෘත්තීය සමිති යම් යම් ප්‍රතිගාමී අංග ලක්ෂණ, එනම්, කිසියම් ශිල්පීය පටු ආකල්පයක්, දේශපාලනයෙන් බැහැරව සිටීමේ කිසියම් ප්‍රවණතාවයක්, එක්තරා අකර්මණ්‍ය ස්වභාවයක්, යනාදිය පෙන්නුම් කරන්නට පටන් ගත්තේය. එසේ වුවද, වෘත්තීය සමිති මගින් හැර, වෘත්තීය සමිති හා කම්කරු පංතියේ පක්ෂය අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයෙන් තොරව, ලෝකයේ කිසිම තැනෙක නිර්ධන පංතිය සංවර්ධනය නොවී ය — විය හැක්කේද නොවේ. නිර්ධන පංතිය විසින් දේශපාලන බලය දිනාගනු ලැබීම, එය පංතියක් වශයෙන් තැබූ යෝධ ඉදිරි පියවරකි. ඒ අනුව පක්ෂය

අන් කවර දකටත් වඩා, පරණ විධියට පමණක් නොව, නව ක්‍රමයකට වෘත්තීය සමිතිවලට උගැන්වීම හා මග පෙන්වීම කළ යුතුය. ඒ අතරම, වෘත්තීය සමිති ''කොමියුනිස්ට්වාදයේ පාසලක්'' ලෙසට මෙකල මෙන්ම අනාගතයේ දී ද අත්‍යාවශ්‍යවනු ඇති බවත්, ඒවා නිර්ධන පංතිකයන්ට ඔවුන්ගේ ආඥාදායකත්වය ක්‍රියාත්මක කිරීමේ පුහුණුව දෙන අභ්‍යාස විද්‍යාලය වන බවත්, රටේ ආර්ථික ජීවිතයේ කළමණාකාර කටයුතු ක්‍රමානුකූල ලෙස ප්‍රථමයෙන් කම්කරු පංතියට (එක් එක් කර්මාන්තවලට නොවේ) සහ පසුව සියලු වැඩ කරන ජනතාවට පවරා දීම සඳහා කම්කරු-වන්ට නැතිවම බැරි සංවිධානයක් බවත්, මතක තබා ගත යුතුය.

නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ ඉහත සඳහන් කරන ලද අර්ථයෙන් වන එක්තරා ආකාර ''ප්‍රතිගාමිත්වයක්'' වෘත්තීය සමිති තුළ දක්නට ලැබීම නොවැලැක්විය හැකිය. මෙය තේරුම් නොගන්නේ නම්, එයින් අදහස් වන්නේ ධනපති ක්‍රමයේ සිට සමාජවාදී ක්‍රමයට පරිවර්තනය වීමට අදාළ වන මූලික කොන්දේසි වටහා ගැනීමට අපොහොසත් වන බවකි. මෙම ''ප්‍රතිගාමිත්වයට'' බිය වීම, නැතහොත්, එය මග හැර යාමට හෝ එයට උඩින් පැන යාමට හෝ යත්න දැරීම අන්ත මෝඩ කමකි. එසේ කිරීම යනු, නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණි කාර්ය කොටස කෙරෙහි, නැතහොත්, කම්කරු පංතියේ සහ ගොවි ජනතාවගේ ඉතාමත් නොදියුණු ස්ථරයන්ට හා ගොවි ජනතාවට පුහුණුව, අධ්‍යාපනය හා අවබෝධය දී ඔවුන් නව ජීවනයට අද්ද ගැනීමේ කර්තව්‍ය කෙරෙහි, බියක් දක්වීමකි. අනික් අතට ශිල්ප අනුබද්ධ හැඟීම් හරිත පටු ආකල්පයක් හෝ ශිල්ප, නැතහොත්, ශිල්පීය සංගම් ආශ්‍රිත පූර්ව මතයන් හෝ දරන එකද කම්කරුවෙක්වත් නැති තත්වයක් උදවන තෙක්, නිර්ධන පංති ආඥාදායකත්වය ඇති කිරීම කල් තැබීම ඊටත් වඩා බරපතල වරදක් වනු ඇත. දේශපාලන කලාව (හා කොමියුනිස්ට්වාදියා ඔහුගේ කර්තව්‍යයන් නිසි ලෙස වටහා ගැනීම) සංයුක්ත වන්නේ, නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණියට සාර්ථක ලෙස බලය ගත හැක්කේ කුමණ කොන්දේසි යටතේ ද හා කුමණ අවස්ථාවකද යනුත්, බලය අල්ලා ගන්නා අතරතුර හා ඉන් පසුව කම්කරු පංතියේ සහ නිර්ධන පංතික නොවන වැඩ කරන ජනතාවගේ ප්‍රමාණවත් තරම් පුළුල් ස්ථරයන් කෙරෙන් සෑහෙන තරම් සහයෝගයක් ලබා ගැනීමට එයට හැකිවන්නේ කුමණ විටෙකද යනුත්, ඉන් අනතුරුව, තව තවත් පුළුල් වැඩ කරන ජනතා කොටස්වලට උගන්වා, පුහුණුව දී ඔවුන් තමන් වෙතට ඇදගැනීම මගින් එයට එහි පාලනය පවත්වාගෙන යාමට, තහවුරු කර ගැනීමට හා ව්‍යාප්ත කිරීමට හැකිවන්නේ කවර කලෙකද යනුත් නිවැරදි ලෙස මැන බැලීමේ හැකියාවෙනි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එපමණක් නොවේ. රුසියාවට වඩා දියුණු රටවල වෘත්තීය සමිති තුළ අප රටටත් වඩා ඉතා අධික මට්ටමකින් කිසියම් ප්‍රතිගාමී ස්වභාවයක් තිබෙනු දක්නා ලදී. එය නොවැලැක්විය හැකි දෙයක් විය. වෘත්තීය සමිති තුළ පවතින ශිල්ප අනුබද්ධ පටු ආකල්පය නිසා, ශිල්ප ආශ්‍රිත ආත්මාර්ථකාමය සහ අවස්ථාවාදය හේතු කොට ගෙන, අපගේ මෙන්ෂෙවිකයන්ට වෘත්තීය සමිති තුළ සහයෝගයක් තිබිණ. (සමහර කුඩා වෘත්තීය සමිති ගණනාවක් තුළ ඔවුන්ට තවමත් එක්තරා ප්‍රමාණයක සහයෝගයක් ඇත.) බටහිර රටවල මෙන්ෂෙවිකයෝ ඊට වඩා බොහෝ ශක්තිමත් පදනමක් ඇති කරගත්හ. එහි ශිල්පීය සාංගමික, පටු ආකල්ප ඇති, ආත්මාර්ථකාමී, කට්ට ඝන වූ, කෑදර සහ සුළු ධනපති "ශ්‍රමකරු රදළ", අධිරාජ්‍යවාදී අදහස් දරන සහ අධිරාජ්‍යවාදයෙන් දූෂිත වූ කොටස් අප රටේ මෙන් නොව ඊට වඩා බොහෝ ශක්තිමත් පිරිසක් ලෙසට සංවර්ධනය වී සිටිති. ඒ ගැන අභියෝගයක් නැත. සම්පූර්ණයෙන්ම සමජාතීය සමාජ හා දේශපාලන ප්‍රවර්ගයක් වන අපගේ මෙන්ෂෙවිකයන්ට විරුද්ධව කරන අරගලයට වඩා බටහිර යුරෝපයේ ගොම්පර්ස්ලාට විරුද්ධව සහ ජූඕ ලා, හෙන්ඩර්සන්ලා, මේර්හයිම්ලා, ලේගින්ලා සහ සමාගමට විරුද්ධව කරන අරගලය අතිශයින් දුෂ්කරය. මෙම අරගලය නිර්දය ලෙස කරගෙන යායුතුය. එමෙන්ම අප කළ සේම අවස්ථාවාදයේ සහ සමාජ-ජාතෝන්මාදවාදයේ සියලුම දුර්දාන්ත නායකයන් සම්පූර්ණයෙන්ම පාරාජිකා කර වෘත්තීය සමිති වලින් පන්නා දමන තැනට එනතෙක් නොවරදවාම එම අරගලය ගෙන යා යුතුය. අරගලය කිසියම් අවධියකට පත්වන තෙක් දේශපාලන බලය අල්වා ගත නොහැකිය (එතෙක් ඒ සඳහා ප්‍රයත්න නොදැරිය යුතුය). මෙම "කිසියම් අවධිය" විවිධ රටවල් අනුව හා විවිධ තත්වයන් අනුව වෙනස් වන්නේය. එය නිවැරදි ලෙස මැන බැලීම කිරීමෙහි සමත් වන්නේ ඒ ඒ විශේෂ රටෙහි නිර්ධන පංතියේ කල්පනාකාරී, පළපුරුදුකම් ඇති සහ දැනුම ඇති දේශපාලන නායකයන් පමණකි. (1917 ඔක්තෝබර් 25 දින ඇති වූ ඔක්තෝබර් විප්ලවයෙන් දින කීපයකට පසුව, 1917 නොවැම්බරයේදී රුසියාවේ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය තේරීම සඳහා පැවැත්වුනු මැතිවරණය මෙම අරගලයේ සාර්ථකත්වය පෙන්නුම් කරන මිනුම් දණ්ඩකි. මෙම මැතිවරණවලදී මෙන්ෂෙවිකයෝ අන්ත පරාජයට පත්වූහ. බොල්ෂෙවික්වරුන්ට එහිදී ලැබුණු ඡන්ද 90,00,000 හා සමග සසඳන කල, ඔවුන්ට ලැබුණේ ඡන්ද 7,00,000 ක් පමණකි. එයට ට්‍රාන්ස් කොකේසියාවේ ඡන්දත් එකතු කළත් ඔවුන්ට ලැබුණු ඡන්ද සංඛ්‍යාව 14,00,000 කි. "ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩල මැතිවරණය සහ නිර්ධන පංති ආඥාදායකත්වය" යන මැයෙන් "කොමියුනිස්ට් ජාත්‍යන්තරය[55] අංක 7–8 හි පළ වූ මගේ ලිපිය බලන්න.

කම්කරු පොදු ජනතාව අප පැත්තට දිනා ගැනීම සඳහා අපි ඔවුන් අතර "ශ්‍රමකරු රදළයන්ට" විරුද්ධව අරගලයක් ගෙන යමින් සිටිමු. කම්කරු පංතිය අප පැත්තට දිනා ගැනීම සඳහා අපි අවස්ථාවාදී සහ සමාජ-ජාතෝන්මාදවාදී නායකයන්ට විරුද්ධව අරගලය කරගෙන යන්නෙමු. මෙම ඉතාමත් සරල සහ ඉතාමත් පැහැදිලිව පෙනෙන සත්‍යය අමතක කිරීම අන්ත මෝඩ කමක් වනු ඇත. නමුත් වෘත්තීය සමිතිවල ඉහළ නායකත්වයේ ප්‍රතිගාමී සහ ප්‍රතිවිප්ලවවාදී ස්වරූපය නිසා, අපි වෘත්තීය සමිතිවලින් ඉවත් විය යුත්තෙමුය, ඒවා තුළ වැඩ කිරීම ප්‍රතික්ෂේප කළ යුත්තෙමුය සහ නව කෘත්‍රිම ආකාරයේ කම්කරු සංවිධාන ඇති කළ යුත්තෙමුය යන නිගමනයට ඉක්මන්කාරී ලෙස බැසගන්නා විට ජර්මනියේ "වාම" කොමියුනිස්ට්වාදීන් කරන්නේ මෙම අන්ත මෝඩ කමමය! මෙය කොතරම් නම් සමාව නොදිය හැකි වරදක්ද කිව හොත්, එය කොමියුනිස්ට්වාදීන්ගෙන් ධනපති පංතියට දිය හැකි ලොකුම උපකාරයට සමාන ය. අවස්ථාවාදී, සමාජ-ජාතෝන්මාදවාදී සහ කෞට්ස්කිවාදී වෘත්තීය සමිති නායකයන් සියලු දෙනාම මෙන්ම, අපගේ මෙන්ෂෙවිකයෝද. "කම්කරු පංතිය තුළ සිටින ධනපති පංතියේ ඒජන්තවරුන්" මිස අන් කිසිවෙක් නොවෙති (මෙන්ෂෙවික්වරුන් එසේ වන බව අපි නිතර කියා ඇත්තෙමු). නැතහොත්, ඇමෙරිකාවේ ඩැනියෙල් ඩී ලියොන්ගේ අනුගාමිකයන්ගේ කදිම සහ ඉතාමත් සත්‍ය යෙදුමක් අනුව කියතොත්, ඔවුහු "ධනපති පංතියේ කම්කරු ලුතිනන්ලා වෙති". ප්‍රතිගාමී වෘත්තීය සමිති තුළ වැඩ කිරීමට ප්‍රතික්ෂේප කිරීම යනු, ප්‍රමාණවත් තරම් සංවර්ධනය නොවූ සහ නොදියුණු කම්කරු ජනතා කොටස් ප්‍රතිගාමී නායකයන්ගේ, ධනපති පංතියේ ඒජන්තවරුන්ගේ, ශ්‍රමකරු රදළයන්ගේ, නැතහොත්, "සම්පූර්ණයෙන්ම ධනපති වූ කම්කරුවන්ගේ" (බ්‍රිතාන්‍ය කම්කරුවන් ගැන එංගල්ස් 1858 දී මාක්ස්ට ලියූ ලිපිය[56] බලන්න) බලපෑම යටතේ සිටින්නට හැරීම වන්නේය.

පොදු ජනතාවට බලපෑම පිළිබඳ ප්‍රශ්නය කෙරෙහි "වාම" කොමියුනිස්ට්වාදීන් දක්වන සෙල්ලම් ආකල්පය හා "පොදු ජනතාව" සම්බන්ධයෙන් වන ඝෝෂණය ඔවුන් විසින් අයුතු භාවිතයෙහි යෙදෙන අන්දම, කොමියුනිස්ට්වාදීන් ප්‍රතිගාමී වෘත්තීය සමිති තුළ වැඩ නොකළ යුතුය යන මෙම විකාර "න්‍යායයෙන්" මනාසේ හෙළිදරව් වේ. "පොදු ජනතාවට" ආධාර කිරීමේ සහ "පොදුජනතාවගේ" පක්ෂපාතිත්වය හා සහයෝගය දිනාගැනීමේ උවමනාවක් ඔබට ඇත්නම්, ඔබ දුෂ්කරතාවයන්ට නැතහොත් කටු කොහොල්වලට, "නායකයන්ගේ" රැවටිලි, අවමාන හා හිංසා පීඩා වලට බිය නොවිය යුතුය. (අවස්ථාවාදීන් සහ සමාජ-ජාතෝන්මාදවාදීන් වන ඔවුන්, බොහෝ අවස්ථාවල කෙළින්ම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හෝ අනියම් ලෙස ධනපතියන් හා පොලිසිය සමග සම්බන්ධ ය.) නමුත්, ඔබට එම උවමනාව ඇත්නම් ඔබ කළ යුත්තේ පොදු ජනතාව සිටින තන්හි වැඩ කිරීමය. නිර්ධන පංතික හා අර්ධ නිර්ධන පංතික පොදු ජනතාව සිටින ඒ ආයතන, සමාගම් හා සංගම් තුළ, ඉතාමත් ප්‍රතිගාමී ඒවා තුළ පවා, ක්‍රමාණුකූල ලෙස, නොපසුබට ලෙස, අනවරථ ලෙස හා ඉවසිලිමත් ලෙස උද්ඝෝෂණය හා ප්‍රචාරය කරගෙන යනු පිණිස, ඕනෑම පරිත්‍යාගයක් කිරීමට, මහත්ම බාධක ජයගැනීමට ඔබ සමත් විය යුතුය. තවද පොදු ජනතාව සිටින සංවිධාන නම් වෘත්තීය සමිතිම හා සමූපකාර සමිතිම වන්නේය (මින් පසුකී සමිතිවලද සමහර විට හෝ පොදුජනයා සිටිති). ස්වීඩනයේ Folkets Dayblad Politiken[57] පත්‍රයේ 1920 මාර්තු 10 කලාපයේ සඳහන් කර ඇති පරිදි, මහා බ්‍රිතාන්‍යයේ වෘත්තීය සමිති සාමාජිකත්වය 1917 අවසානයේදී 55,00,000 ක් වූ අතර, 1918 අවසානය වන විට එය 66,00,000 දක්වා වැඩි විය. මෙය සියයට 19 ක වැඩි වීමකි. 1919 අවසාන භාගය වන විට එම සාමාජිකත්වය 75,00,000 ක් යයි ගණන් බලන ලදී. ප්‍රංශය හා ජර්මනිය සම්බන්ධයෙන් අදාළ සංඛ්‍යා ලේඛන මට පහසුවෙන් ලබා ගැනීමට නැත. නමුත් මෙම රටවලද, වෘත්තීය සමිති සාමාජිකත්වය සීඝ්‍ර ලෙස වර්ධනය වූ බව සම්පූර්ණයෙන්ම අවිවාදී හා කවුරුත් දන්නා කරුණුවලින් ඔප්පු වේ.

මෙම කරුණු සක්සුදක් සේ පැහැදිලිය. වෙනත් ලක්ෂණ දහස් ගණනකින් ද එම කරුණු සනාථ වී ඇත. නිදසුනක් ලෙසට නිර්ධන පංති පොදුජනතාව අතර, සාමාන්‍ය පිරිස් අතර, නොදියුණු කොටස් අතර පංති විඥානය සහ සංවිධානය වීමේ ආශාව වර්ධනය වෙමින් පවතී. මහා බ්‍රිතාන්‍යයේ, ප්‍රංශයේ හා ජර්මනියේ දශලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ සම්පූර්ණයෙන්ම සංවිධානයෙන් තොර තත්වයේ සිට සරලම, පහළම, පහසුම සහ (තවමත් ධනපති ප්‍රජාතන්ත්‍රවාදී පූර්ව මතවල ගිලී සිටිනවුනට) පහසුවෙන්ම වටහා ගත හැකි සංවිධාන ආකෘතිය වන වෘත්තීය සමිති දක්වා ප්‍රථම වතාවට සංක්‍රමණය වෙමින් සිටිති. එසේ වන කල, විප්ලවවාදී එහෙත් අනුවණ වාම කොමියුනිස්ට්වාදීහු "පොදු ජනතාව", "පොදු ජනතාව!" කියමින් කෑගසමින් බලා සිටින නමුත්, වෘත්තීය සමිති "ප්‍රතිගාමී යයි" කියා ඒවා තුළ වැඩ කිරීම ප්‍රතික්ෂේප කරති. එසේ කරන ඔවුහු, ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී පූර්වමත දුරීමේ වරද කර නැති, ශිල්ප ආ ත, නැතහොත්, ශිල්පීය සංගමයේ පටු ආකල්ප පිළිබඳ වරදෙහි නොබැඳුනු හා පුළුල් සංවිධානයක් වනු ඇතැයි(!) ඔවුන් කියන, ඉතාමත් අළුත්, අති පිරිසිදු කුඩා "කම්කරු සංගමයක්" නිර්මාණය කරති. එහි සාමාජිකත්වය ලැබීමට තිබිය යුතු එකම(!) සුදුසු කම "සෝවියට්

ක්‍රමයත්, ආඥාදායකත්වයත් පිළිගැනීම" වේ (ඉහත උපුටා දක්වූ කොටස බලන්න).

"වාම" විප්ලවවාදීන්ගේ ක්‍රියාවන්ට වඩා ඔලමොට්ටල කමක් හෝ විප්ලවයට කළ හැකි හානියක් හෝ ගැන සිතන්නට වත් බැරිය! මන්ද යත්, රුසියාවේ ධනපති පංතිය සහ මිත්‍ර ගිවිසුම (Entente) පරදවා ලබන ලද අභූත පූර්ව ජයග්‍රහණවලින් වසර දෙක හමාරකට පසුව, අද, රුසියාවේ අපි, "ආඥාදායකත්වය පිළිගැනීම" වෘත්තීය සමිති සාමාජිකත්වය සඳහා අවශ්‍ය සුදුසු කමක් කරන්නෙමු නම්, එය ජනතාව අතර පවතින අපගේ බලපෑමට හානියක් සහ මෙන්ෂෙවික් වරුන්ට කරන ආධාරයක් වන හෙයිනි. අප එසේ කළහොත් එය අන්ත මෝඩ කමකි. කොමියුනිස්ට්වරුන්ට පැවරෙන කාර්යය වන්නේ නොදියුණු කොටස්වලට කරුණු ඒත්තු ගැන්වීමය. ඔවුන් අතර වැඩ කිරීමය; ඔවුන් තමන්ගෙන් වෙන් වනසේ කෘත්‍රිම සහ ළාමක "වාම" සටන් පාඨවලින් වැටක් බැඳීම නොවේ.

"ප්‍රතිපත්ති රකින" ජර්මන් විරුද්ධ පාර්ශවය, නැතහොත් ඇමෙරිකානු ලෝක කාර්මික කම්කරුවෝ[58] නැමති සංවිධානයේ සමහරු මෙන්, ප්‍රතිගාමී වෘත්තීය සමිතිවලින් ඉවත් වීමට සහ ඒවා තුළ වැඩ කිරීම ප්‍රතික්ෂේප කිරීමට පක්ෂවාදී වන, ඒ "වාම" විප්ලවවාදීන්ට ගොම්පර්ස්ලාගේ, හෙන්ඩර්සන්ලාගේ, ජූඕ ලාගේ හා ලේගීන්ලාගේ කෘතඥතාවය හිමිවන බවට සැකයක් නැත.කොමියුනිස්ට්වරු වෘත්තීය සමිතිවලින් පිටමං කරතැබීමට, වෘත්තීය සමිති වැඩ ඔවුන්ට හැකි තරම් දුරට තිත්ත කිරීමට, ඔවුන්ට නින්ද කිරීමට, උගුල් ඇටවීමට හා වධ දීමට අවස්ථාවාදයේ නායකයන් වන මේ පුද්ගලයන් ධනපති රාජ්‍ය තන්ත්‍රයේ සෑම උපාමාරුවක්ම යොද ගන්නා බවට සහ ධනපති ආණ්ඩුවලට, පැවිදි පක්ෂයට, පොලිසියට හා උසාවියට ආධාර දෙන බවට කිසිම සැකයක් නැත. මේ සියල්ලටම මුහුණ දී නැගී සිටීමට අපට හැකි විය යුතුය. අප වෘත්තීය සමිති තුළට ඇතුළු වන තාක් කල්, කුමණ අමාරුවක් හෝ විඳිමින් ඒවා තුළ රැඳී සිටිමින් කොමියුනිස්ට් වැඩ කටයුතු කරන තාක් කල්, ඕනෑම පරිත්‍යාගයක් කිරීමට එකඟ වීමටත්, අවශ්‍ය වුවහොත්, විවිධ කූට කම්, නොමග යැවීම් සහ නීතිවිරෝධී ක්‍රම පවා යොද ගැනීමටත්, මගහැරීම සහ සූක්ෂම උපා යොද ගැනීමටත් අපට හැකි විය යුතුය. සාර්වාදය යටතේ 1905 වනතෙක් අපට "නීති සහගත ඉඩ කඩ" කිසිවක් නොතිබිණි. එසේ වුවද, විප්ලවවාදීන් කොටුකර ගැනීම සඳහා සහ ඔවුන් පිටු දැකීම සඳහා, රහස් පොලිස් ඒජන්ත සුබාතව කළ සියය කම්කරු රැස්වීම සහ වැඩ කරන ජනතා සමිති සංවිධාන කළ විට, අපි අපගේ පක්ෂයේ සාමාජිකයන් මෙම රැස්වීම්වලට සහ සමිතිවලට යැවෙවමු. (එයින් එක්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

අයෙකුට,එනම්, සාන්ත පීටර්ස්බුර්ග් පැක්ටරි කම්කරුවන්ගේ නායකයෙක් වූ හා සාර්ගේ සෙන්පතියෙකුගේ නියමය අනුව 1906 දී වෙඩි තැබූ බාබුෂ්කින් සහෝදරයා මම පුද්ගලිකව අඳුනා සිටියෙමි. ඔවුහු පොදු ජනතාව සමග සම්බන්ධකම් ඇති කර ගත්හ. ඔවුහු ඔවුන්ගේ උද්ඝෝෂණ කරගෙන යාමට සමත් වූහ. ඒ අනුව ඔවුහු සුබාතව් ඒජන්තවරුන්ගෙන් කම්කරුවන් උදුරා ගැනීම සාර්ථක ලෙස ඉටු කළහ* එහෙත්, ඉතාමත් ගැඹුරට විහිදුනු නීත්‍යානුකූලවාදී, ව්‍යවස්ථානුකූලවාදී සහ ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී පූර්වමත ගහනව පවතින බටහිර යුරෝපයේ මෙය සාර්ථක කර ගැනීම ඊට වඩා දුෂ්කර වන්නට පිළිවන. කෙසේ හෝ වේවා එය කළ හැකිය. කළ යුතුය. එපමණක් නොව, එය ක්‍රමානුකූලව කළ යුතුය.

ප්‍රතිගාමී වෘත්තීය සමිතිවල වැඩ කිරීම ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිපත්තිය පොදු වශයෙන්ද (එසේ ප්‍රතික්ෂේප කිරීම අනුවණ කමක් වන්නේ මන්දැයි යනුත්, නිර්ධන පංති විප්ලවයේ සත් ව්‍යාපාරයට එයින් සිදුවන අති විශාල හානියත් සවිස්තර ලෙස පැහැදිලි කරමින්), මෙම වැරදි ප්‍රතිපත්තියට කෙළින්ම නැතහොත් අනියම් ලෙස, විවෘත ලෙස නැතහොත් ආවෘත ලෙස, යන කුමණ ආකාරයෙන් වුවත් ආධාර කළ ඕලන්ද කොමියුනිස්ට් පක්ෂයේ සමහර සහෝදරවරුන්ගේ ක්‍රියා කලාපය විශේෂ වශයෙන්ද, හෙළා දැකීම සහ ඒවා හෙළා දකින ලෙස කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ මීළඟ සම්මේලනයෙන් ඉල්ලා සිටීම, තුන්වැනි ජාත්‍යන්තරයේ විධායක කාරක සභාවේ යුතු කම යයි මම අදහස් කරමි. තුන්වැනි ජාත්‍යන්තරය දෙවැනි ජාත්‍යන්තරයේ උපක්‍රම අත්හැර දැමිය යුතුය. විවාදයට හේතුවන ප්‍රශ්න මග හැරීම එය නොකටයුතුය. ඒවා ඍජු ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය. මුළු සත්‍යයම ''ස්වාධීනයන්'' (ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය) හමුවේ එක එල්ලේම තබා ඇත. එසේම, මුළු සත්‍යයම ''වාම'' කොමියුනිස්ට්වාදීන් හමුවේ එක එල්ලේම තැබිය යුත්තෙමු.

VII

ධනපති පාර්ලිමේන්තුවට අප සහභාගි විය යුතුද ?

ජර්මන් ''වාම'' කොමියුනිස්ට්වාදීන් මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ අන්ත පිළිකුලක් හා අන්ත ලිහිලක් දක්වමින් නැත යනුවෙනි. එහිදී ඔවුන්

* ගොම්පර්ස්ලා, හෙන්ඩර්සන්ලා, ජුඕලා සහ ලේගින්ලා යනු සුබාතව්ලාම මිස අන් කිසිවෙක් නොවති. ඔවුන් අපගේ සුබාතව්ගෙන් වෙනස්වන්නේ ඔවුන්ගේ යුරෝපීය ඇඳුමෙන් සහ සමර්ථ ගතියෙන්ද, ඔවුන්ගේ නින්දිත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ශීලාචාර, සියුම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ආචාර ශීලී ස්වභාවයෙන්ද පමණකි.

ඉදිරිපත් කරන තර්ක මොනවාද? ඉහත උපුටා දැක්වූ කොටසෙහි මෙසේ සඳහන්ව ඇත:

> ''...ඓතිහාසික හා දේශපාලන වශයෙන් යල් පැන ගිය පාර්ලිමේන්තුවාදී අරගල ක්‍රම වෙත ආපසු යාමේ සියලු ක්‍රියාවන්... අවධාරණ සහිතව ප්‍රතික්ෂේප කළ යුතුවේ.''

විකාර උඩඟුකමක් සහිතව කරන මෙම ප්‍රකාශය සාවද්‍ය බව ඉතා පැහැදිලිය. හැබැවටම, පාර්ලිමේන්තුවාදය වෙත ආපසු යාම! එසේනම්, සමහරවිට දැනටමත් ජර්මනියේ තිබෙන්නේ සෝවියට් සමූහාණ්ඩුවක්ද? පෙනෙන හැටියට එය එසේ නොවේද? නැත්නම් යමෙක් ''ආපසු යාම'' ගැන කථා කරන්නේ කෙසේද? මෙය හිස් වදනක් නොවේද?

පාර්ලිමේන්තුවාදය ''ඓතිහාසික වශයෙන් යල් පැන ගොස්'' ඇත. ප්‍රචාරක අර්ථයකින් එය සත්‍ය ය. එසේ වුවද, ව්‍යවහාරයේදී එය පරාජය කිරීමට තවත් බොහෝ දුර යායුතු බව සැම කෙනෙක්ම දන්නේය. ධනපති ක්‍රමය ''ඓතිහාසික වශයෙන් යල්පැන ගොස්'' ඇති බව දශක ගණනකට කලින්ම සම්පූර්ණ හේතු සහිතව කිව හැකිව තිබිණි. නමුත් ධනපති ක්‍රමය පදනම් කරගෙන ඉතා දීර්ඝ සහ ඉතාමත් අනවරථ අරගලයක් කිරීමේ අවශ්‍යතාවය මඟ හැරී යන්නේ නැත. ලෝක ඉතිහාසයේ ස්ථාවරය අනුව බලන කල පාර්ලිමේන්තුවාදය ''ඓතිහාසික වශයෙන් යල් පැන ගොසිනි''. ඒ අනුව, ධනපති පාර්ලිමේන්තුවාදයේ යුගය අවසන් වී, නිර්ධන පංති ආඥාදායකත්වයේ යුගය ආරම්භ වී ඇත. එය අවිවාදව පිළිගත යුතුය. නමුත් ලෝක ඉතිහාසය ගණන් ගන්නේ දශකවලිනි. ලෝක ඉතිහාසයේ මිණුම් දණ්ඩෙන් මනින කල අවුරුදු දහයක් හෝ විස්සක් ඉස්සරහට හෝ පස්සට වීමෙන් වෙනසක් සිදු නොවේ. ලෝක ඉතිහාසයේ ස්ථාවරය අනුව එය දළවශයෙන් වුවද සැලකිල්ලට ගත නොහැකි තරම් සුළු කාලයකි. නමුත්, එම හේතුව නිසාම, ප්‍රායෝගික දේශපාලනයට ලෝක ඉතිහාසයේ මිණුම්දණ්ඩ ගැලපීම කැපී පෙනෙන න්‍යායික දෝෂයක් වන්නේය.

පාර්ලිමේන්තුවාදය ''දේශපාලන වශයෙන් යල්පැන ගොස්'' තිබේ? එය සම්පූර්ණයෙන්ම වෙනත් ප්‍රශ්නයකි. එය එසේ නම්, ''වාම'' වාදීන්ගේ ස්ථාවරය ශක්තිමත් එකකි. නමුත් එය එසේ බව ඉතාමත් විමසුම්කාරී විග්‍රහයකින් ඔප්පු කළ යුතුව තිබේ. මෙම ප්‍රශ්නයට සමීප වන්නේ කෙසේද යන්නවත් ''වාම'' වාදීහු නොදනිති. ඈම්ස්ටර්ඩෑම්හි කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ තාවකාලික කාරක සභාවේ නිවේදන සංග්‍රහයේ 1920 පෙබරවාරි අංක 1 කලාපයෙහි පළ කෙරුණු සහ ඕලන්ද-වාම, නැතහොත්, වාම-ඕලන්ද පරිශ්‍රමයන් පිළිබඳ ප්‍රකාශනයක් බව පැහැදිලිව

https://liberationbase.wordpress.com

පෙනෙන, ''පාර්ලිමේන්තුවාදය ගැන ප්‍රවාද'' මගින් කෙරෙන විග්‍රහය ඉතාමත් දුර්වල එකක් බව අපට පෙනේ.

පළමුවැන්න, රෝසා ලුක්සම්බුර්ග් සහ කාල් ලිබ්ක්නෙහ්ට[59] වැනි විශිෂ්ඨ දේශපාලන නායකයන්ගේ මතවලටද පටහැනි වන පරිද්දෙන්, ජර්මන් ''වාම'' වාදීන් විසින් 1919 ජනවාරියේදී පවා පාර්ලිමේන්තුවාදය ''දේශපාලන වශයෙන් යල් පැනගිය'' සේ සලකන ලද බව අපි දන්නෙමු. ''වාම'' වාදීන්ට සිදුවූයේ වැරදීමක් බව අපි දනිමු. පාර්ලිමේන්තුවාදය ''දේශපාලන වශයෙන් යල් පැන ගොස්'' ඇතැයි යන ප්‍රස්තුතය මෙම කරුණෙන් එක පහරින්ම විනාශ වන්නේය. එකල ''වාම'' වාදීන් අතින් සිදුවූ නැතැයි කිව නොහැකි වැරදීම, අද වරදක් නොවන්නේ මන්ද යන්න ඔප්පු කිරීම ඔවුන්ගේ යුතු කම ය. ඔවුන් එය ඔප්පු කරන්නේ නැත. එය ඔප්පු කිරීමට අල්ප මාත්‍ර සාධකයක් වුව ඉදිරිපත් කිරීමටද හැකියාවක් ඔවුන්ට නොමැත. දේශපාලන පක්ෂයක් කොතරම් උවමනාවකින් කටයුතු තරන්නේද යනු සහ ස්වකීය පංතිය සහ වැඩ කරන ජනතාව කෙරෙහි යුතුකම් ඉටු කරන්නේද යනු නිශ්චය කිරීමේ ඉතාමත් වැදගත් හා ඉතාමත් නොවරදින මාධ්‍යයකි, එය තමන්ගේම වැරදි කෙරෙහි දක්වන ආකල්පය. බරපතල ලෙස කටයුතු කරන පක්ෂයක ඒකාන්ත ලක්ෂණය වන්නේ, වරදක් අවංකව පිළිගැනීම, එයට හේතු වූ කරුණු සොයා දැන ගැනීම, එම වරද සිදුවන තැනට කටයුතු යෙදුනු තත්වයන් විග්‍රහ කිරීම සහ එය නිවරද කිරීමේ මාර්ග තීරණය කර ගැනීම යන ක්‍රියාමාර්ගය ය. එය තමන්ගේ යුතුකම් ඉටු කළ යුත්තේ, තමන්ගේ පංතියට සහ ඊළඟට පොදු ජනතාවට උගැන්විය යුත්තේ එලෙසිනි. ජර්මනියේ (හා ඕලන්දයේ) ''වාම'' වාදීහු මෙම යුතු කම ඉටු කිරීමට සහ ඔවුන්ගේ ඉතා පැහැදිලිව පෙනෙන වරද ගැන අධ්‍යයනය කරනු පිණිස ඒ ගැන අතිශය අවධානයක් හා සැලකිල්ලක් දැක්වීමට අපොහොසත් වී සිටිති. එයින් ඔප්පු වන්නේ, ඔවුන් පංතියක පක්ෂයක් නොව, උවමනාවන් වටා එක්වුනු පිරිසක් වන බවත්, පොදු ජනතාවගේ පක්ෂයක් නොව, බුද්ධිමතුන් කණ්ඩායමක් සහ බුද්ධිමතුන්ගේ නරකම අංග ලක්ෂණ අනුකරණය කරන කම්කරුවන් ටික දෙනෙක් වන බවත්ය.

දෙවැන්න, මා විස්තර සහිතව ඉහත කොටසක් උපුටා දැක්වූ ප්‍රැන්ක්පුර්ට් ''වාම'' වාදී කණ්ඩායමේ එම පොත් පිංචෙහිම මෙසේ සඳහන් වේ:

> ''...මැද පිරිසේ (කතෝලික ''මධ්‍ය'' පක්ෂයේ) ප්‍රතිපත්තිය තවමත් අනුගමනය කරන දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ ප්‍රතිවිප්ලවවාදී වෙති. ගම්බද නිර්ධන පංතිකයෝ ප්‍රතිවිප්ලවවාදී හමුදුවලට බල සේනා සපයති.'' (පොතෙහි 3 වැනි පිටුව).

සැම කරුණකින්ම පෙනෙන්නේ මෙය බොහෝ සේ පමණ ඉක්මවූ සාමාන්‍ය කාරණයක් බවයි. නමුත් මෙයින් ඉදිරිපත් කර තිබෙන මූලික කරුණ බොරු කළ නොහැක්කකි. තවද, ''වාම'' වාදීන් විසින් එය පිළිගනු ලැබීම ඔවුන්ගේ වරද පෙන්වන පැහැදිලි සාක්ෂියකි. නිර්ධන පංතිකයන් අතුරෙන් ''දශලක්ෂ'' ගණන් පිරිස් හා ''බල සේනා'' තවමත් පාර්ලිමේන්තුවාදයට පක්ෂව පමණක් නොව අමු ''ප්‍රතිවිප්ලවවාදීන්ව'' සිටියදී (!) ''පාර්ලිමේන්තුවාදය දේශපාලන වශයෙන් යල් පැන ගොස්'' ඇතැයි කෙනෙක් කියන්නේ කෙසේද? ජර්මනියේ පාර්ලිමේන්තුවාදය තවමත් යල් පැන ගොස් නොමැති බව පැහැදිලිය. ජර්මනියේ ''වාම'' වාදීන්, ඔවුන්ගේ ආශාව, ඔවුන්ගේ දේශපාලන-දෘෂ්ටිමය ආකල්පය, වාස්තවික යථාර්ථය ලෙසට වරදවා වටහා ගෙන තිබෙන බවද පැහැදිලිය. එය විප්ලවවාදීන් නොකළ යුතු ඉතාමත් අනතුරුදායක වරදකි. ම්ලේච්ඡ සහ කෲර සාර්වාදයේ වියගස විසින් ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සහ ඉතාමත් විවිධ ආකාරයෙන්, නෝකාකාර ස්වරූපයේ විප්ලවවාදීන්, පුදුමාකාර කැපවීමක්, උද්‍යෝගයක්, වීරත්වයක් හා ආත්ම ශක්තියක් ප්‍රදර්ශනය කළ විප්ලවවාදීන් ජනිත කරන ලද රුසියාවේ අපි විප්ලවවාදීන්ගේ මෙම වරද ඉතාමත් ආසන්නමානයේ සිට දැක ඇත්තෙමු — අපි එය ඉතාමත් සාවධානව අධ්‍යයනය කර ඇත්තෙමු. අපට ඒ ගැන අත්දුටු දැනුමක් ඇත්තේය. අන්‍යයන් කෙරෙහි ඇති එම වරද ඉතා පැහැදිලි ලෙස අපට පෙනෙන්නේද එනිසාය. ජර්මනියේ කොමියුනිස්ට්වාදීන්ට නම්, පාර්ලිමේන්තුවාදය ''දේශපාලන වශයෙන් යල්පැන ගොසිනි''. නමුත් එය අපට නොසුදුසු යල් පැන ගිය දෙයක් ලෙසට, පංතියට, පොදු ජනතාවට නොසුදුසු යල්පැන ගිය දෙයක් ලෙසට අපි නො සැලකිය යුත්තෙමු — ප්‍රධාන කරුණ එයයි. ''වාම'' වාදීන් තර්ක කිරීමට නොදන්නා බව සහ පංතියේ පක්ෂය ලෙසට, පොදු ජනතාවගේ පක්ෂය ලෙසට ක්‍රියා කරන හැටි නොදන්නා බවත් අපට මෙහිදී නැවතත් පෙනේ. ඔබ පොදු ජනතාවගේ මට්ටමට, පංතියේ නොදියුණු ස්ථරයන්ගේ මට්ටමට පහළ නොයා යුතුය. එය අවිවාදයෙන් පිළිගත යුත්තකි. තිත්ත සත්‍යය ඔවුන්ට කීම ඔබගේ යුතුකම ය. ඔවුන්ගේ ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී දුර්මතයන් තත් ලෙසින්, දුර්මතයන් ලෙසින්, හැඳින්වීම ඔබගේ පැහැර හැරිය නොහැකි යුතු කමය. නමුත් ඒ අතරම, මුළුමහත් පංතියේම (කොමියුනිස්ට් පෙරමුණු බල ඇණියේ පමණක් නොවේ) සහ වැඩ කරන සකල ජනතාවගේම (ඔවුන්ගේ දියුණු කොටස්වල පමණක් නොවේ) පංති විඥානයේ සහ සූදනම් කමේ නියම තත්වය ගැන කල්පනා කාරී ලෙස විමසිලිමත් වීමද, ඔබගේ යුතුකම වන්නේය.

''දශලක්ෂ ගණනින්'' හා ''බලසේනා'' පිටින්ම නොවුවත්, කාර්මික

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කම්කරුවන් අතුරෙන් විශාල අල්පතරයක් හෝ වුවත්, කතෝලික පල්ලියේ නායකත්වය අනුගමනය කරන්නේ නම්, තවද, එවැනිම ග්‍රාමීය කම්කරු අල්පතරයක් ඉඩම් හිමියන් හා කුලාකයන් (Grossbauern) අනුගමනය කරන්නේ නම්, එයින් සලකුණු කෙරෙන්නේ ජර්මනියේ පාර්ලිමේන්තුවාදයේ දේශපාලන ආයුෂ තවමත් ගෙවී නිමවී නැති බව ය. එයින් සලකුණු කෙරෙන්නේ තමන්ගේම පංතියේ නොදියුණු ස්ථරයන්ට උගැන්වීමේ ඒකාන්ත කාර්යය ඉටු කර ගැනීම සඳහා සහ ඌනසංවර්ධිත, පැගුනු හා නූගත් ගැමි පොදුජනතාවන් අවදි කර, අවබෝධමත් කර ගැනීම සඳහා, පාර්ලිමේන්තු මැතිවරණවලට සහ පාර්ලිමේන්තු වේදිකාවේ කෙරෙන අරගලයට සහභාගී වීම විප්ලවවාදී නිර්ධන පංතියේ පැහැර හැරිය නො හැකි කටයුත්තක් වන බවය. ධනපති පාර්ලිමේන්තු සහ වෙනත් සෑම වර්ගයකම ප්‍රතිගාමී ආයතන. බැහැර කර ලීමේ ශක්තිය ඔබ සතුව නැති තාක් කල් ඔබ ඒවා තුළ වැඩ කළ යුතුය. පූජකයන් විසින් නොමග යවන ලද සහ ගම්බද ජීවන කොන්දේසි විසින් කේඩෑරි කරන ලද කම්කරුවන් තවමත් සිටින බව ඔබට පෙනී යනු ඇති නිසා ඔබ එසේ කළ යුතුය. එසේ නොකළහොත් ඔබ නත් දෙඩන්නන් වීමේ අන්තරායට ලක්වන්නේය.

තුන්වැන්න, බොල්ෂෙවික්වරු වන අප ගැන "වාම" කොමියුනිස්ට්වාදීන් කියන ප්‍රශංසාත්මක දේ බොහෝය. අපට ප්‍රශංසා කිරීම අඩු කර බොල්ෂෙවික්වරුන්ගේ උපක්‍රම ගැන වඩා හොඳ දැනුමක් ලබාගන්නැයි ඔවුනට කීමට සිතෙන අවස්ථා ඇත. රුසියානු ධනපති පාර්ලිමේන්තුව වන ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයට තෝරා පත් කිරීම් සඳහා 1917 සැප්තැම්බර්-නොවැම්බර් කාලයේ පැවති මැතිවරණවලට අපි සහභාගි වුනෙමු. අපගේ උපක්‍රම නිවැරදි වීද? නැද්ද? ඒවා නිවැරදි නොවී නම්, ඒ බව පැහැදිලි ලෙස කිවයුතුය. ඔප්පු කළ යුතුය. මන්ද යත්, එසේ කිරීම ජාත්‍යන්තර කොමියුනිස්ට්වාදයේ නිවැරදි උපක්‍රම සකස් කර ගැනීම පිණිස අවශ්‍ය වන හෙයිනි. එම උපක්‍රම නිවැරදි වී නම්, එයින් යම් යම් නිගමනවලට බැස ගත යුතුය. නමුත් රුසියාවේ තත්වයන් බටහිර යුරෝපයේ තත්වයන් සමග එක මට්ටමක තැබීමට පුළුවන් කමක් නැත. එසේද වුවත්, "පාර්ලිමේන්තුවාදය දේශපාලන වශයෙන් යල් පැන ගොස්" ඇතැයි යන සංකල්පයේ අර්ථය පිළිබඳවූ විශේෂ ප්‍රශ්නයේදී අපගේ අත් දැකීම නිසිසේ සැලකිල්ලට ගත යුතුය. යථාභූත අත්දැකීම් ගැන සැලකිල්ලක් නොදක්වුවහොත්, එවැනි සංකල්පයන් පහසුවෙන්ම පුහුවදන් බවට පත්වන්නට ඉඩ තිබේ. කුමණ හෝ බටහිර රටක කොමියුනිස්ට්වාදීන්ට වඩා, රුසියාවේ පාර්ලිමේන්තුවාදය 1917 සැප්තැම්බර්-නොවැම්බර් කාලයේදී යල් පැන ගොස් තිබුණේයයි

සැලකීමේ අයිතියක්, රුසියානු බොල්ෂෙවික්වරුන් වන අපට නොතිබුණේද? සැලකිල්ලට ගත යුත්තේ ධනපති පාර්ලිමේන්තු දීර්ඝ කාලයක්, නැතහොත්, කෙටි කාලයක් පැවතියේද යන කරුණ නොව, වැඩ කරන පොදු ජනතාව සෝවියට් ක්‍රමයක් (ආර්ථිමය, දේශපාලන හා ප්‍රායෝගික වශයෙන්) භාර ගැනීමට හා ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට (නැතහොත් එය විසුරුවා හැරීමට ඉඩ දීමට) කොතරම් දුරට සූදානම්ද යන්න වන හෙයින් ඇත්තෙන්ම අපට එවැනි අයිතියක් තිබිණි. විශේෂ කොන්දේසි ගණනාවක් නිසා, 1917 සැප්තැම්බර්-නොවැම්බර් කාලයේදී රුසියාවේ නාගරික කම්කරු පංතිය, සොල්දාදුවන් සහ ගොවි ජනතාව සෝවියට් ක්‍රමය භාර ගැනීමටත්, ධනපති පාර්ලිමේන්තු අතුරෙන් ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුව විසිරුවා හැරීමටත්, ඉතාමත් විශිෂ්ඨ ලෙස සූදානම්ව සිටි බව, කිසිම විවාදයක් නැතිව පිළිගත යුතුව තිබෙන හා සම්පූර්ණයෙන් තහවුරු වී තිබෙන සත්‍යයකි. එය එසේ වී නමුත්, බොල්ෂෙවික්වරු පාර්ලිමේන්තුව වර්ජනය නොකළහ. නිර්ධන පන්තිය බලය ගැනීමට පෙර මෙන්ම ඉන් පසුවද ඔවුහු මැතිවරණයට සහභාගී වූහ. මෙම මැතිවරණයෙන් ඉතාමත් අගනා (සහ නිර්ධන පංතියට අතිශයින් ප්‍රයෝජනවත්) දේශපාලන ප්‍රතිඵල ලැබුණු බව, රුසියාවේ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයට තෝරා පත් කිරීම් සඳහා පැවැත්වුනු මැතිවරණයේ ප්‍රතිඵල විස්තර සහිතව විග්‍රහ කරමින් මා ලියූ ඉහත සඳහන් ලිපියෙන් ඔප්පු කර ඇතැයි කීමට තරම් එඩිතර වෙමි.

මෙයින් බැස ගත හැකි නිගමනය කිසිසේත් ප්‍රතික්ෂේප කළ හැක්කක් නොවේ. සෝවියට් සමූහාණ්ඩුවක ජයග්‍රහණයට සති කීපයකට පෙර වුවද, එසේම, එවැනි ජයග්‍රහණයකින් පසුව පවා, ධනපති ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුවකට සහභාගී වීම, එවැනි පාර්ලිමේන්තු ඉවත් කර දැමිය යුත්තේ මන්ද යන්න නොදියුණු පොදු ජනතාවට ඔප්පු කර පෙන්වීම පිණිස නිර්ධන පංතියට ඇත්ත වශයෙන්ම උදව්වක් වන්නේය. එසේ කිරීම, එම පාර්ලිමේන්තු විසුරුවා හැරීම පහසු කරන්නක් හා ධනපති පාර්ලිමේන්තුවාදය "දේශපාලන වශයෙන් යල් පැන ගිය" තත්වයට පත් කිරීමට රුකුල් දෙන්නක් වේ. ස්වකීය උපක්‍රම ජාත්‍යන්තර වශයෙන් (පටු නැතහොත් තනිකරම ජාතික උපක්‍රම ලෙසට නොව, ජාත්‍යන්තර උපක්‍රම ලෙසට) සකස් කර ගත යුතුව තිබෙන කොමියුනිස්ට් ජාත්‍යන්තරයට තමන් ඒකාබද්ධයයි කියන අතරම, මෙම අත් දැකීම නොසලකා හැරීම යනු බරපතල වරදක් කිරීමක් හා ජාත්‍යන්තරවාදය වචනයෙන් පිළිගනිමින් එය ඇත්ත වශයෙන් ක්‍රියාවෙන් ප්‍රතික්ෂේප කිරීමක් වන්නේය.

පාර්ලිමේන්තුවලට සහභාගි නොවීමට පක්ෂව ඉදිරිපත් කර ඇති "ඕලන්ද-වාම" තර්ක දැන් පරීක්ෂා කර බලමු. ඉහත සඳහන් "ඕලන්ද" ප්‍රවාද අතුරෙන් වඩාත්ම වැදගත් අංක 4 දරන ප්‍රවාදය මෙසේය:

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

"ධනපති නිෂ්පාදන ක්‍රමය බිඳවැටී තිබෙන විට හා සමාජය විප්ලවීය තත්වයක පවතින විට, ජනතාවගේම ක්‍රියාකාරිත්වය මෙන් නොව පාර්ලිමේන්තු කටයුතුවල වැදගත් කම ක්‍රමානුකූල ලෙස හීන වී යන්නේය. මෙම තත්වයන් යටතේ, පාර්ලිමේන්තුව ප්‍රති විප්ලවයේ මධ්‍යස්ථානය හා අවයවය බවට පත්වන විට සහ අනිත් අතට වැඩ කරන පංතිය සෝවියට් සභා තුළ එහි බලයේ උපකරණ ගොඩනගන විට, පාර්ලිමේන්තු කටයුතුවලට සහභාගී වීමෙන් සම්පූර්ණයෙන්ම හා සෑම ආකාරයකින්ම වැලකී සිටීම පවා අවශ්‍ය වන්නට පුළුවන."

මෙහි මුල් වාක්‍යය වැරදි බව බැලූ බැල්මටම පෙනේ. එසේ කියන්නේ පොදු ජන ක්‍රියාකාරිත්වය, නිදසුනක් ලෙසට ලොකු වැඩ වර්ජනයක්, පාර්ලිමේන්තු කටයුතුවලට වඩා සැමවිටම වැදගත් බැවිනි. එය වැඩියෙන් වැදගත් වන්නේ විප්ලවයක්, නැතහොත් විප්ලවීය තත්වයක් පවතින විට පමණක් නොවේ. අයෝග්‍ය වූ ද, ඓතිහාසික සහ දේශපාලන වශයෙන් වැරදි වූ ද තර්කයක් බව නිසැකසේ පෙනෙන මෙය ඉදිරිපත් කිරීමෙන් ඉතා පැහැදිලිව හෙළිදරව් වන්නේ නීත්‍යානුකූල සහ නීති විරෝධී වැඩ ඒකාබද්ධ කිරීමේ වැදගත්කම පෙන්වන පොදු යුරෝපීය අත්දැකීම් (1848 හා 1870 ට පෙර ප්‍රංශයේ අත් දැකීම්; 1878–1890 ට පෙර ජර්මනියේ අත්දැකීම්, ආදිය) සහ රුසියානු අත්දැකීම් (ඉහත සඳහන් ය) යන දෙකම කතුවරුන් විසින් සම්පූර්ණයෙන්ම නොසලකා හරිනු ලබන බව පමණකි. මෙය අතිශයින් වැදගත් ප්‍රශ්නයකි. එය පොදු සහ විශේෂ යන දෙ ආකාරයෙන්ම වැදගත්ය. එයට හේතුව සියලුම ශීලාචාර සහ දියුණු රටවල විප්ලවවාදී නිර්ධන පංතියේ පක්ෂවල නීත්‍යානුකූල සහ නිතිවිරෝධී කටයුතුවල එබඳු සම්බන්ධ තාවයක් නැතිවම බැරි තත්වයක්, වඩ වඩාත් ආසන්න වෙමින් පවතින හා දැනටමත් අර්ධවශයෙන් එම තත්වය මතුවී තිබෙන හෙයිනි. නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර සිවිල් යුද්ධය මෝරා එමින් හා නුදුරුව පවතින නිසාද, සමූහාණ්ඩු පාලකයන් හා පොදුවේ ධනපති ආණ්ඩු විසින් කොමියුනිස්ට් වාදීන්ට දරුණු හිංසා පීඩා පමණුවනු ලබන හෙයින්ද, එම ආණ්ඩු ඕනෑම නීත්‍යානුකූල භාවයක් උල්ලංඝනය කරන හෙයින්ද (ඇමෙරිකාවේ නිදර්ශනය ප්‍රමාණවත් සාධකයකි) යනාදිය නිසා එම තත්වය ඇති වී තිබේ. ඕලන්දක්කාරයින් හා පොදුවශයෙන් වාම වාදීන් මෙම ඉතා වැදගත් ප්‍රශ්නය තේරුම් ගැනීමට සම්පූර්ණයෙන්ම අපොහොසත් වී ඇත.

දෙවැනි වාක්‍යය ගැන ප්‍රථමයෙන්ම කිව යුත්තේ එය ඓතිහාසික

වශයෙන් වැරදි බවය. බොල්ෂෙවික් වරුන් වන අපි ඉතාමත් ප්‍රතිවිප්ලවවාදී පාර්ලිමේන්තුවලට සහභාගී වීමු. රුසියාවේ ප්‍රථම (1905) ධනපති විප්ලවයෙන් පසුව දෙවැනි (1917 පෙබරවාරි) ධනපති විප්ලවය දක්වාද, ඊට පසුව සමාජවාදී (1917 ඔක්තෝබර්) විප්ලවය දක්වාද මාවත සකස් කිරීම පිණිස මෙම සහභාගිත්වය විප්ලවවාදී නිර්ධන පංතියේ පක්ෂයට ප්‍රයෝජනවත් පමණක් නොව, අනිවාර්ය ද වූ බව, පළ පුරුද්ද අනුව පෙනී ගොස් තිබේ. දෙවැනිව ඒ ගැන කිවයුත්තේ, මෙම වාක්‍යය පුදුම වලවන තරම් අතාර්කික බවය. කම්කරුවන් සෝවියට් සභා ස්වරූපයෙන් ඔවුන්ගේ බලයෙහි උපකරණ ගොඩනගමින් සිටිය දී, පාර්ලිමේන්තුව ප්‍රතිවිප්ලවයේ අවයවයක් සහ "මධ්‍යස්ථානයක්" වන්නේ නම් (ඇත්ත වශයෙන් නම්, එය කිසි කලෙකත් එසේ වන්නේවත් නැත — නමුත් එය අමතර කරුණකි) එයින් නිගමනය වන්නේ පාර්ලිමේන්තුවට විරුද්ධව සෝවියට් සභා කරන අරගලය සඳහා, සෝවියට් සභා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු දැකීම සඳහා, කම්කරුවන් දෘෂ්ටිමය වශයෙන්, දේශපාලන වශයෙන් හා තාක්ෂණික වශයෙන් සූදනම් විය යුතු බවය. නමුත් ප්‍රතිවිප්ලවවාදී පාර්ලිමේන්තුව තුළ සෝවියට් විරුද්ධ පාර්ශ්වයක් තිබීමෙන් මෙම විසුරුවා හැරීමට බාධාවක් සිදුවන බව හෝ, පහසුවක් නොවන බව හෝ එයින් කිසිසේත් නිගමනය නොවේ. කොල්චාක්ට හා දෙනිකින්ට විරුද්ධව අප කළ ජයග්‍රාහී අරගලයේ කාලයේදී, ඔවුන්ගේ කඳවුර තුළ සෝවියට් සහ නිර්ධන පංති විරුද්ධ පාර්ශ්වයක් තිබීම අපගේ ජයග්‍රහණ සඳහා නොවැදගත් වන දෙයක් ලෙසට අපට කිසි කලෙකත් පෙනී ගියේ නැත. විසුරුවා හැරීමට ආසන්නව තිබුණු ප්‍රතිවිප්ලවවාදී ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය තුළ සසංගත බොල්ෂෙවික් කණ්ඩායමකින් සහ ඊට අමතරව දුස්සංගත වාම සමාජවාදී-විප්ලවවාදී[60] කණ්ඩායමකින් සමන්විත සෝවියට් විරුද්ධ පාර්ශ්වයක් සිටීම, 1918 ජනවාරි 5 දින ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසුරුවා හැරීමට බාධාවක් නොව, ඇත්ත වශයෙන්ම පහසුවක් වූ බව අපි හොඳින්ම දන්නෙමු. මෙම ප්‍රවාදවල කතුවරු කරුණු පටලවා ගෙන කල්පනාවෙහි යෙදී සිටිති. විප්ලවයක් අවස්ථාවේදී ප්‍රතිගාමී පාර්ලිමේන්තුවකට පිටතින් කෙරෙන පොදු ජන සටන, එය තුළ සිටින විප්ලවයට අනුකූලතාවය (නැතහොත්, ඊට වඩා අගනා ලෙසට කෙළින්ම සහයෝගය) දක්වන විරුද්ධ පාර්ශ්වයක් සමග ඒකාබද්ධ කිරීමේ විශාල ප්‍රයෝජනය ගෙන හැර පාන විප්ලව සියල්ලෙහිම නොවේ නම් ඉන් බොහොමයකම අත්දැකීම් ඔවුන්ට අමතක වී තිබේ. මේ හා සම්බන්ධයෙන් වූ කල ලන්දේසිවරුන් සහ "වාම" වාදීන් පොදු වශයෙන් තර්ක කරන්නේ, කිසි කලෙකත් නියම විප්ලවයකට සහභාගී වී නැති, විප්ලවවල ඉතිහාසය ගැන කිසි කලෙකත් සිතා බලා

https://liberationbase.wordpress.com

නැති, එසේ නැතහොත්, ආයතනයක් මනෝමූල වශයෙන් ප්‍රතික්ෂේප කිරීම වාස්තවික සාධක ගණනාවක ඒකාබද්ධ ක්‍රියාකාරිත්වය නිසා එය සැබැවින්ම විනාශ වී යාමක් සේ බොළඳ ලෙසට වරදවා වටහා ගන්නා පොතේ ගුරුන් ලෙසට ය. අළුත් දේශපාලන (දේශපාලන පමණක්ම නොවේ) අදහසක් පරිහාසයට ලක්කිරීමේ හා එයට හානි පැමිණවීමේ ඉතාමත් සාර්ථක ක්‍රමය, එය ආරක්ෂා කිරීමේ මුවාවෙන් එය විකාරයක තත්වයට පහත හෙළීම ය. මන්ද යත්, ඕනෑම සත්‍යයක්, (ඩීට්ස්ගන් පීතෘකී ලෙසට) ''පමණ ඉක්මවා නද කළහොත්'', අතිශයෝක්තියෙන් වර්ණනා කළහොත්, නැතහෙත්, එය ඇත්ත වශයෙන් ගැලපෙන සීමාවෙන් ඔබ්බට එය ගෙනගියහොත් එය විකාරයක් බවට පත්විය හැකි බැවිනි. මෙම තත්වයන් යටතේ එය විකාරයක් වීම වැලැක්විය නොහැකිවීමට පවා ඉඩ තිබේ. සෝවියට් ආණ්ඩු ආකෘතිය ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු වලට වඩා උසස්ය යන නැවුම් සත්‍යයට ඕලන්ද සහ ජර්මානු ''වාම'' වාදීන් කරන හානියද එයම ය. පැරණි අදහස ඉදිරිපත් කරන, නැතහොත්, ධනපති පාර්ලිමේන්තුවලට සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීමට සෑම හා කිසිම තත්වයක් යටතේ එකඟ විය නොහැකි යයි පොදුවේ සලකන ඕනෑම කෙනෙක් වැරදි වනු ඇති බව සැබෑය. පාර්ලිමේන්තුව වර්ජනය කිරීම කුමණ කොන්දේසි යටතේ ප්‍රයෝජනවත් වන්නේද යනු විස්තර කිරීමට මට මෙහිදී පුළුවන් කමක් නැත. මෙම පොත ලිවීමෙහි අරමුණ ඊට වඩා බෙහෙවින් සීමිතය. මෙයින් බලාපොරොත්තුවන්නේ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ උපක්‍රම පිළිබඳ කාලීන ප්‍රශ්න සමහරකට අදාළ වන සේ රුසියානු අත් දැකීම අධ්‍යයනය කිරීමයි. බොල්ෂෙවිවරුන් විසින් වර්ජනය සාර්ථක ලෙස සහ නිවැරදි ලෙස උපයෝගී කරගන්නා ලද (1905) එක් අවස්ථාවක්ද, එය වැරදි ලෙස යොදගන්නා ලද වෙනත් (1906) අවස්ථාවක්ද, ගැන නිදසුන් රුසියානු අත්දැකීමෙන් සැපයෙන්නේය. පාර්ලිමේන්තුවෙන් බාහිර විප්ලවවාදී පොදුජන සටන (විශේෂයෙන්ම වැඩ වර්ජන) මහත් වේගයෙන් වර්ධනය වෙමින් තිබුණු අවස්ථාවක, නිර්ධන පංතියේ සහ ගොවිජනතාවගේ කිසිම කොටසකට ප්‍රතිගාමී ආණ්ඩුවට ආධාර දීමේ හැකියාවක් නොතිබුණ විටෙක, එසේම වැඩවර්ජන අරගලය සහ ගොවිජන ව්‍යාපාරය මගින් විප්ලවවාදී නිර්ධන පංතිය නොදියුණු පොදු ජනතාව කෙරෙහි තම බලපෑම වැඩි කරගනිමින් සිටි කලෙක, ප්‍රතිගාමී ආණ්ඩුවකට ප්‍රතිගාමී පාර්ලිමේන්තුවක් ඇති කිරීමට ඉඩ නොදී වැලැක්වීමට බොල්-ෂෙවික්වරුන් සමත් වූ බව මින් ප්‍රථම නිදසුන විග්‍රහ කළ විට අපට පෙනේ. මෙම අත්දැකීම වර්තමාන යුරෝපීය කොන්දේසිවලට ගැලපිය නොහැකි බව ඉතා පැහැදිලිය. ලන්දේසි සහ අනෙකුත් ''වාම'' වාදීන් සඳහන්

කරන සීමාවන් යටතේ වුවද, පාර්ලිමේන්තුවලට සහභාගී වීමට ප්‍රතික්ෂේප කිරීම මූලික වශයෙන් වැරදි සහ විප්ලවවාදී නිර්ධන පංතියේ සත් ව්‍යාපාරයට අවැඩදයක බවද එසේම පැහැදිලිය. ඉහත සඳහන් කෙරුණු තර්ක වලින් එම නිගමනය සනාථ වේ.

බටහිර යුරෝපයේ සහ ඇමෙරිකාවේ පාර්ලිමේන්තුව කම්කරු පංතියේ විප්ලවවාදී පෙරමුණු බල ඇණියේ ඉමහත් පිළිකුලට ලක්වී තිබේ. මෙය නැතැයි කිව නොහැකි දෙයකි. එය පහසුවෙන්ම වටහා ගත හැකිය. එවැනි තත්වයක් ඇතිවූයේ, යුද්ධ කාලයේදී හා ඉන් පසුව, සමාජවාදී සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් අති බහුතරය පෑ හැසිරීමට වඩා අපකීර්තිමත්, දූෂ්‍ය හා ද්‍රෝහී වෙනත් කිසිවක් ගැන සිතීමට පවා දුෂ්කර හෙයිනි. එසේ වුවද, පොදුවේ හඳුනාගත් මෙම උවදුරට විරුද්ධව සටන් කරන්නේ කෙසේද යන්න තීරණය කිරීමේදී, මෙම මනෝභාවයට යටවීම අවිචාරවත් ක්‍රියාවක් පමණක් නොව, ඇත්ත වශයෙන්ම අපරාධයක්ද වන්නේය. බටහිර රටවල් බොහොමයක පවතින විප්ලවවාදී මනෝභාවය දැන් සැලකෙන්නේ, බොහෝ කාලයක් තිස්සේ අසාර්ථක ලෙස හා නොඉවසිලිමත් ලෙස ප්‍රාර්ථනා කරන ලද ''අළුත් දෙයක්'' නැතහොත් ''දුර්ලභ දෙයක්'' ලෙසටය. සමහරවිට අයෙක් එතරම් පහසුවෙන් එම මනෝභාවයට යටවීමට හේතුව එය විය හැකිය. ජනතාව අතර විප්ලවීය මනෝභාවයක් නොමැතිව, මෙම මනෝ-භාවය වර්ධනය වීමට උපස්තම්භක වන කොන්දේසි නොමැතිව, විප්ලවීය උපක්‍රම කිසිකලෙකත් ක්‍රියාවට නොපෙරළෙන බව නිසැකය. එසේ වුවද රුසියාවේ අප ලත් දීර්ඝ, වේදනා සහිත සහ ලෙයින් තෙත්වුනු අත් දැකීමෙන් අප උගෙන ගෙන තිබෙන්නේ, විප්ලවවාදී මනෝභාවය පමණක් පදනම් කරගෙන විප්ලවවාදී උපක්‍රම ගොඩනැගිය නොහැකි බවය. උපක්‍රම පදනම් කළ යුත්තේ කිසියම් රාජ්‍යයක (සහ ඒ වටා ඇති රාජ්‍යයන්ගේත්, ලොකයේ සියලුම රාජ්‍යයන්ගේත්) පංති බලවේගයන් සියල්ලම මෙන්ම, විප්ලවවාදී ව්‍යාපාරවල අත්දැකීම්ද ගැන කරන ඥානාන්විත සහ තරයේ වාස්තවික වූ අගය කිරීමක් මතය. පාර්ලිමේන්තු අවස්ථාවාදය වෙත ගැරහුම් එල්ල කිරීමෙන්, එසේ නැතහොත්, හුදෙක් පාර්ලිමේන්තුවලට සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීමෙන් යමෙකුට ඉතා පහසුවෙන් තමන්ගේ ''විප්ලවවාදී'' වේගය පෙන්වීමට පුළුවන. එහෙත්, මෙම මහත් පහසුව, දුෂ්කර ප්‍රශ්නයකට, ඉතාමත් දුෂ්කර ප්‍රශ්නයකට විසඳීමක් බවට හැරෙන්නේ නැත. යුරෝපීය පාර්ලිමේන්තුවක නියම විප්ලවවාදී පාර්ලිමේන්තු කණ්ඩායමක් ඇති කිරීම රුසියාවේ එය කළාට වඩා බෙහෙවින් දුෂ්කරය.එය තර්කානුකූල ලෙස වටහා ගත හැකි කරුණකි. නමුත්, ඒ වූකලී, රුසියාවට විශේෂවූ සහ 1917 දී පැවති, පෙර කිසි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කලෙකත් උද නොවූ තත්වය නිසා, සමාජවාදී විප්ලවය ආරම්භ කිරීමට එයට හැකිවීය යන සත්‍යය ප්‍රකාශ කිරීමේ එක් ආකාරයක් පමණකි· රුසියාව විප්ලවය ආරම්භ කර ඇතත්, එය දිගටම ඉදිරියට ගෙනයාම සහ එය අවසාන ජයග්‍රහණයට පැමිණවීම යුරෝපීය රටවලට වඩා එයට දුෂ්කර වනු ඇත. 1918 වර්ෂය ආරම්භයේදීම මම මෙය පෙන්වා දුන්නෙමි. මෙම අදහස නිවැරදි බව පසුගිය වසර දෙක හමාරක අපගේ අත් දැකීමෙන් සම්පූර්ණයෙන්ම සනාථ වී තිබේ. රුසියාවට විශේෂ වූ ලෙසට සඳහන් කරන ලද තත්වයන් සමහරක් මෙසේය: 1) කම්කරුවන් හා ගොවිජනතාව සිතන්නට පවා බැරි තරම් දුරට විඩාපත් තත්වයට ඇද දමා තිබුණු අධිරාජ්‍යවාදී යුද්ධය විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙසට කෙළවර කිරීම සමග සෝවියට් විප්ලවය සම්බන්ධ කිරීමට තිබුණු හැකියාව; 2) ස්වකීය සෝවියට් සතුරාට විරුද්ධව එක්සත් වීමට නොහැකි වන සේ, ලෝකයේ ඉතාමත් බලගතු අධිරාජ්‍යවාදී මංකොල්ලකරු කණ්ඩායම් ද්වය අතර වූ මාරක සටන තාවකාලික වාසියකට හරවා ගත හැකි වීය; 3) රටේ මහත් විශාලත්වය සහ පණිවුඩ හුවමාරු මාර්ගයන්ගේ දුර්වලතාවය නිසා සංසන්දනීය වශයෙන් දීර්ඝ සිවිල් යුද්ධයක් දරා සිටීමේ හැකියාවක් තිබීම; 4) ගොවිජන පක්ෂයේ (සමාජවාදී-විප්ලවවාදී පක්ෂය — එහි සාමාජිකයින්ගෙන් බහුතරය බොල්ෂෙවික්වරුන්ට බලවත් සේ විරුද්ධ වූහ) විප්ලවවාදී ඉල්ලීම් නිර්ධන පංතියේ පක්ෂයට පිළිගත හැකි වන තරමට මේරූ ධනපති ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක් ගොවිජනතාව අතර පැවතීම සහ නිර්ධන පංතිය බලයට පත් වූ වහාම එම ඉල්ලීම් ක්‍රියාත්මක කළ හැකි වීම. මේ තත්වයන් සියල්ලම දැන් බටහිර යුරෝපයේ පවතින්නේ නැත. එමෙන්ම, එවැනි, නැතහොත්, ඊට සරිලන තත්වයන් පහසුවෙන් ඇති වන්නේ ද නොවේ. වෙනත් හේතු ගණනකට අමතරව, මේ නිසා සමාජවාදී විප්ලවයක් ආරම්භ කිරීම අපට වඩා බටහිර යුරෝපයට දුෂ්කර වන බව මෙහිලා සඳහන් කරමු. විප්ලවකාරී අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රතිගාමී පාර්ලිමේන්තු උපයෝගි කර ගැනීමේ මෙම අමාරු කාර්යයට ''උඩින් පැන'' යාමෙන් එය ''මගහැරීමට'' යත්න දැරීම ඉතාමත් ළාමකය. ඔබට නව සමාජයක් ගොඩ නැගීමට උවමනා වී තිබේ. එහෙත්, අවබෝධය ඇති, කැපවූ සහ වීරෝදාර කොමියුනිස්ට්වරුන්ගෙන් සමන්විත හොඳ පාර්ලිමේන්තු කණ්ඩායමක් පිහිටුවීමේදී මුහුණ පාන්නට වන දුෂ්කරතාවයන් දැක, ඔබ බිය වන්නෙහිය! එය ළාමක කමක් නොවේද? පහළින් ලැබෙන පොදු ජන සහයෝගයක් නොමැතිව පවා, සැබැවින්ම විප්ලවවාදී ලෙස ප්‍රතිගාමී පාර්ලිමේන්තු උපයෝගි කරගැනීම පිළිබඳ ආදර්ශයන් දීමට ජර්මනියේ කාල් ලිබ්ක්නෙහ්ට් සහ ස්වීඩනයේ සෙඩ්, හෙග්ලුන්ඩ් සමත් වූවෝ නම්, පොදුජනතාව අතර පවතින

පශ්චාත් යුද්ධ අපේක්ෂා භංගත්වය හා අප්‍රසන්නතාවය මධ්‍යයේ සීඝ්‍රයෙන් වර්ධනය වන විප්ලවවාදී පොදු ජන පක්ෂයක්, නරකම පාර්ලිමේන්තුවක හෝ කොමියුනිස්ට් කණ්ඩායමක් ඇතිකිරීමට අපොහොසත් වන්නේ මන්ද? එසේ වන්නේ බටහිර යුරෝපයේ වැඩකරන නොදියුණු පොදු ජනතාව හා ඊටත් වැඩියෙන් සුළු ගොවි ජනතාව, රුසියාවේ එම ජනකොටස් ඉක්මවා ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු පිළිබඳ දුර්මත කෙරෙහි ඇලී ගැලී සිටින හෙයිනි. එනිසාම, මෙම දුර්මතයන් හෙළිදරව් කිරීම, දුරු කිරීම හා පරාජය කිරීම කොමියුනිස්ට් වරුන්ට කළ හැකිවන්නේ, දුෂ්කරතාවයන් දැක බිය නොවී ධනපති පාර්ලිමේන්තු වැනි ආයතන තුළින්ම පමණක් කරන දීර්ඝ සහ අනවරථ අරගලයකිනි (ඔවුන් ඒ සඳහා ක්‍රියා කළ යුත්තේ එමගින්ම ය).

ජර්මන් ''වාම'' වාදීහු ඔවුන්ගේ පක්ෂයේ සිටින නරක ''නායකයන්'' ගැන මැසිවිලි කියති. බලාපොරොත්තු සුන් වූ තත්වයට පත්වෙති. එපමණක් නොව, ''නායකයන්'' ''ප්‍රතිෂේධ'' කිරීමේ තත්වයට පවා වැටෙති. නමුත් ''නායකයන්'' බොහෝවිට රහසිගත ලෙස සඟවා තැබීමට සිදුවන තත්වයන් යටතේ හොඳ, විශ්වාසදායක, උරගා බලන ලද හා අධිකාරයක් ඇති ''නායකයන්'' හැදීම ඉතා දුෂ්කර කාර්යයකි. නීත්‍යානුකූල සහ නීති විරෝධී වැඩ ඒකාබද්ධ කිරීමක් නොමැතිව, වෙනත් මාර්ග තුළින් මෙන්ම පාර්ලිමේන්තු තුළින්ද ''නායකයන්'' පරීක්ෂාවට භාජනය කිරීමෙන් තොරව, මෙම දුෂ්කරතාවයන් සාර්ථක ලෙසින් ජයගත හැකි නොවේ. විවේචනය, එනම්, ඉතාමත් තියුණු, නිර්දය හා අසමථකාරී විවේචනය ඉලක්ක කළ යුත්තේ පාර්ලිමේන්තුවාදයට, නැතහොත්, පාර්ලිමේන්තු කටයුතුවලට විරුද්ධව නොවේ. එම විවේචන එල්ල කළ යුත්තේ පාර්ලිමේන්තු මැතිවරණ වලින් හා පාර්ලිමේන්තු වේදිකාවෙන් විප්ලවවාදී හා කොමියුනිස්ට්වාදී ලෙසට ප්‍රයෝජන ගැනීමේ හැකියාව නැති හා ඊටත් වඩා එයට කැමැත්තක් නැති, ඒ නායකයන්ට විරුද්ධවය. කම්කරු පංතියට සහ සියලු වැඩ කරන ජනතාවට සුදුසු වන නායකත්වයක් පුහුණු කිරීමත්, දේශපාලන තත්වය සහ එම තත්වයෙන් පැනනගින, බොහෝ විට ඉතාමත් සංකීර්ණ වූ හා ගැටළු සහිත, කර්තව්‍යයන් නිසි ලෙස වටහා ගැනීමට ජනතාව පුහුණු කිරීමත්, එක්වරම ඉටු කෙරෙන ආකාරයේ ප්‍රයෝජනවත් හා ඵලදායක විප්ලවවාදී වැඩ කටයුතු සංයුක්ත වන්නේ, එවැනි විවේචන කිරීමෙන් හා ඒ සමගම අසමර්ථ නායකයන් ඉවත් කර ඒවෙනුවට සමර්ථ නායකයන් පත් කිරීමෙන් ද වේ.*

*ඉතාලියේ වාමාංශික කොමියුනිස්ට්වාදය ගැන කරුණු දැන ගැනීමට මට ලැබුණේ ඉතා අල්ප අවස්ථාවකි. බොර්දිග සහෝදරයා සහ ඔහුගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

VIII

සම්මුති එපා ?

"වාම" වාදීන් කොතරම් අවධාරණ සහිතව මෙම සටන් පාඨය ඉදිරිපත් කර තිබේද යන්න ප්‍රැන්ක්පුර්ට් පොත් පිංචෙන් උපුටා දැක්වූ කොටසින් අපි දුටුවෙමු. නිසැක ලෙසින්ම තමන් මාක්ස්වාදීන් වශයෙන් සලකාගන්නා සහ මාක්ස්වාදීන් වීමට කැමතිවන අය, මාක්ස්වාදයේ මූල ධර්මයන් අමතක කරනු දක්නට ලැබීම කණගාටුවට කරුණකි. තමන් කළ සෑම මූලික කෘතියකම එන සෑම වාක්‍යයක්ම තුළ පුදුමාකාර තරම් අර්ථවත් සන්ධාරයක් ගැබ් කිරීම අතින් මාක්ස් මෙන්ම දුර්ලභ ගණයේ ගත් කතු වරුන්ගෙන් කෙනෙක්වූ එංගල්ස්, බ්ලංකීවාදී කොමියුනාර්වරු[64] තිස්තුන් දෙනාගේ ප්‍රකාශනයට රූහැණි වෙමින් 1874 දී මෙසේ ලීවේය:

"ජයග්‍රහණය ලබන දිනය කල් දැමීමට සහ වහල් භාවයේ කාලය දීර්ඝ කිරීමට පමණක් හේතු වන, අතර මග නැවතුම්පලවල සිටීමෙන් තොරව, සම්මුති කිසිවක් නොමැතිව අපගේ අරමුණ ඉටු කර ගැනීමේ උවමනාව අපට ඇති නිසා අපි කොමියුනිස්ට්වාදීහු වෙමු' යයි බ්ලංකීවාදී කොමියුනාර්වරු ඔවුන්ගේ ප්‍රකාශනයෙහි ලිවූහ.

"ජර්මන් කොමියුනිස්ට්වාදීන්, ඔවුන් විසින් නොව, ඓතිහාසික සංවර්ධන මාර්ගය විසින් නිර්මාණය කරන ලද අතර මග නැවතුම් පලවල් සියල්ල හා සම්මුති සියල්ල තුළින් අවසාන අරමුණ, එනම් පංති අහෝසි කිරීම සහ ඉඩම් හෝ නිෂ්පාදන මාධ්‍යයන් හෝ පිළිබඳ පෞද්ගලික අයිතිය තවදුරටත් නොපවතින සමාජයක් ඇති කිරීම පැහැදිලිව දකින හෙයින් හා අනවරථයෙන් එම අරමුණ සාර්ථක කර ගැනීමට කටයුතු කරන හෙයින්, ඔවුහු කොමියුනිස්ට්වාදීහු වෙති. බ්ලංකීවාදීන් තිස්තුන් දෙනා කොමියුනිස්ට්වාදීන් වන්නේ, අතර මග නැවතුම් පලවල් හා සම්මුති මග හැරීමේ උවමනාව ඔවුන්ට තිබෙන පමණින් ප්‍රශ්නය නිරාකරණය වී ඇතැයි ඔවුන් කල්පනා කරන හෙයිනි; ඊළඟ දින කීපය තුළ 'එය ආරම්භ' වෙයි නම් — එය ඒකාන්තව සිදුවෙතැයි ඔවුහු විශ්වාස කරති, — එසේම ඔවුන් බලය අත්පත් කරගතහොත්, ඊළඟ දිනයේදී 'කොමියුනිස්ට් ක්‍රමය ආරම්භ කරනු ලැබේ' යයි ඔවුන් සිතන හෙයිනි. එය වහාම කළ නොහැකි නම් ඔවුහු කොමියුනිස්ට් වාදීහු නොවෙති.

"තමන්ගේම නොඉවසිලිමත් කම න්‍යායික වශයෙන් කරුණු ඒත්තු ගන්වන තර්කයක් ලෙසට ඉදිරිපත් කිරීම මොන තරම් ළාමක කමක්ද!" (ප්‍රෙඩ්රික් එංගල්ස්, "බ්ලංකීවාදී කොමියුනාර් වරුන්ගේ වැඩ පිළිවෙළ". එය ජර්මන් සමාජවාදී පුවත්පතක් වූ "Volksstaat"[65] අංක 73, 1874 පත්‍රයෙන් ගෙන "1871–1875 ලිපි" යන රුසියානු පරිවර්තනයෙහි 1919 පෙත්‍රොග්‍රාද්හිදී පළ කෙරින — පිටු 52–53.)

එම ලිපියෙන්ම වලාන් ගැන උසස් සේ අගය කරන එංගල්ස්, අවිවාදයෙන් පිළිගත යුතු ඔහුගේ යහ ගුණ ගැන කියයි. (ගේද් මෙන්ම ඔහුද 1914 අගෝස්තු දක්වා ජාත්‍යන්තර සමාජවාදයේ ඉතාමත් ප්‍රමුඛ නායකයෙක් විය. 1914 අගෝස්තුවේදී ඔවුහු සමාජවාදයට ද්‍රෝහී වූහ.) නමුත් පැහැදිලිව පෙනෙන වරදක් ගැන සවිස්තර විග්‍රහයක් කිරීමට එංගල්ස් අමතක කරන්නේ නැත. ඉතා තරුණ සහ පළපුරුදු කම් නැති විප්ලවවාදීන්ටද, එමෙන්ම, ගරු කටයුතු වයසට පවා පත්ව සිටින සුළු ධනපති විප්ලවවාදීන්ටද, පෙනෙන හැටියට "සම්මුතිවලට ඉඩදීම" බොහෝ "අන්තරාදයක", වටහා ගැනීමට අපහසු හා වැරදි බව සැබැවි.

"වර්ජක කොමියුනිස්ට් කණ්ඩායම" (communista abstensionista) පාර්ලිමේන්තුවට සහභාගි නොවීමට පක්ෂවාදීව කටයුතු කිරීම ඇත්තෙන්ම වරදකි. "Il Soviet"[61] නැමති ඔහුගේ පත්‍රයේ (1920 ජනවාරි 18 සහ පෙබරවාරි 1, අංක 3 හා 4) කලාප දෙකෙන්ද, සෙරාති සහෝදරයාගේ "Comunismo"[62] නැමති අනගි වාර පත්‍රයේ (1919 ඔක්තෝබර් 1 සිට නොවැම්බර් 30 දක්වා වූ, 1–4) කලාප හතරෙන්ද, මා දැක ඇති ඉතාලි පුවත් පත්වල එක් එක් කලාපද අනුව වටහා ගත හැකි තාක් දුරට මට පෙනෙන්නේ එක් කරුණක් හා සම්බන්ධයෙන් බෝර්දිග සහෝදරයා නිවැරදි බවය. සෝවියට් බලය සහ නිර්ධන පංති ආඥාදායකත්වය පිළිගත් පක්ෂයක සිටින නමුත් ඒ අතරම පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් වශයෙන් ඔවුන් පැරණි විනාශකාරී සහ අවස්ථාවාදී ප්‍රතිපත්තියම අනුගමනය කිරීම සම්බන්ධයෙන් තුරාටි සහ ඔහුගේ පාක්ෂිකයන්ට පහර දීමේදී බෝර්දිග සහෝදරයා සහ ඔහුගේ කණ්ඩායම නිවැරදි විය. මෙය ඉවසා සිටීමෙන් සෙරාති සහෝදරයා සහ මුළු ඉතාලි සමාජවාදී පක්ෂයම[63] කරන්නේ වරදක් බව නිසැකය. එම වරද නිසා මහත් හානි සිදුවීමේ සහ හංගේරියේ මතුවූ අන්තරායම ඇතිවීමේ තර්ජනය ඉදිරිපත් වන්නේය. මෙහි හංගේරියේ මතුවූ අන්තරාය ලෙසට සඳහන් කරන්නේ එහි තුරාටිලා විසින් පක්ෂයත්, සෝවියට් ආණ්ඩුවත් යන .දෙකම අභ්‍යන්තරයෙන් විනාශ කර දමනු ලැබීම ය. අවස්ථාවාදී පාර්ලිමේන්තුවාදය කෙරෙහි දක්වන එබඳු දුස්සංගත නැතහොත් අස්ථිර ප්‍රතිපත්යක් නිසා එක් අතකින් "වාමාංශික" කොමියුනිස්ට්වාදය ඇතිවීමට හේතුවන අතර අනික් අතින් එහි පැවැත්ම එක්තරා දුරකට සාධාරණ කර දක්වන්නේය. තුරාටි සහ සමාගම වැනි පාර්ලිමේන්තුවාදීන් ඉවසීම නිසා අසංගත වන්නේ ඉතාලි සමාජවාදී පක්ෂයම වන හෙයින්, තුරාටි මන්ත්‍රීවරයා "දුස්සංගත" ලෙස කටයුතු කරන්නේයයි (Comunismo අංක 3) චෝදනා කිරීමෙන් සෙරාති සහෝදරයා කරන්නේ වරදක් බව පෙනේ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බොහෝ විතණ්ඩවාදීන් (අසාමාන්‍ය, නැතහොත්, පමණ ඉක්මවා "අත්දැකීම් ලත්" අය වන හෙයින්) තර්ක කරන්නේ, හරියටම ලාන්ස්බරි සහෝදරයා සඳහන් කරන බ්‍රිතාන්‍ය අවස්ථාවාදීන් තර්ක කරන ආකාරයටමය. ඒ මෙසේ ය: "යම් සම්මුතියක් ඇති කර ගැනීමට බොල්ෂෙවික්වරුන්ට ඉඩ දෙන්නේ නම්, කිසිම අසම්මුතියක් ඇති කර ගැනීමට අපට ඉඩ නොදෙන්නේ මන්ද?" එසේ වුවද, බොහෝ වැඩ වර්ජනවලින් (පංති අරගලයේ මෙම ස්වරූපය පමණක් ගනිතොත්) ශික්ෂණය ලත් නිර්ධන පංතිකයෝ එංගල්ස් විසින් ගෙන හැර දක්වන ලද (දර්ශනික, ඓතිහාසික, දේශපාලන සහ මනෝ විද්‍යාත්මක) ඉතා ගැඹුරු සත්‍යය නිතරම පාහේ ප්‍රසංශා කටයුතු ආකාරයෙන් අවබෝධ කර ගනිති. සෑම නිර්ධන පංතිකයෙක්ම වැඩවර්ජන අත්දැක ඇත. කිසිවක් දිනා නොගෙන, නැතහොත්, තමන්ගේ ඉල්ලීම්වලින් කොටසක් පමණක් ලබාගැනීමට එකඟව කම්කරුවන්ට ආපසු වැඩට යාමට සිදු වූ අවස්ථාවල, තමන්ගේ වෛරයට පාත්‍ර වූ පීඩකයන් සහ සූරාකන්නන් සමග ඇති කරගත් "සම්මුති" පිළිබඳ අත් දැකීම ඔහුට තිබේ. වාස්තවික කොන්දේසිවල (වැඩ වර්ජන අරමුදල් නොමැතිකම, බාහිර අධාර නොලැබීම, කුසගින්න හා විඩාව වැනි) බලපෑම නිසා බලෙන්ම ඇති කර ගැනීමට සිදුවන සම්මුතියක්, එනම්, එවැනි සම්මුතියක්, ඇති කර ගැනීමට එකඟ වූ කම්කරුවන්ගේ විප්ලවවාදී කැපවීම සහ අරගලය කරගෙන යාමේ සූදානම කිසි කලෙකත් හීන නොකරන සම්මුතියක් ද, අනිත් අතට, තමන්ගේ ආත්ම ලාභය (හොරිකඩයෝද "සම්මුතිවලට" එළඹෙති!), බියගුළු කම, ධනපතියනට ගැති කම් කිරීමේ ආශාව සහ ධනපතියන්ගේ තර්ජනවලට, වරෙක චාටුකථාවලට, වරෙක සුළු වාසිවලට සහ තවත් වරෙක බොරු වර්ණනාවලට යටවීමට ඇති කැමැත්ත, වාස්තවික හේතු වශයෙන් පෙන්වීමට උත්සාහ කරන ද්‍රෝහීන් ඇති කරගන්නා සම්මුතියක්ද අතර වෙනස තේරුම් ගැනීමේ හැකියාව සෑම නිර්ධන පංතිකයෙකුටම ඇත. ඔහුට එම හැකියාව ලැබී තිබෙන්නේ ඔහු ජීවත්වන වටපිටාවෙහි බලපවත්වන පංති අරගලයේ සහ පංති සතුරුතාවයන් තදින් උග්‍රවීමේ කොන්දේසිවල ප්‍රතිඵලයක් වශයෙනි. (බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති නායකයන් ඉහත සඳහන් වැනි ද්‍රෝහී සම්මුති ඇති කරගත් අවස්ථා පිළිබඳ නිදර්ශන රැසක් බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති ව්‍යාපාරයේ ඉතිහාසයෙන් දක්ක හැකිය. නමුත්, සියලුම රටවල කම්කරුවන් සියලු දෙනාම පාහේ, එකම ආකාරයේ දෙය එක් හෝ තවත් විධියකින් සිදුවනු දැක ඇත).

විශේෂ දුෂ්කරතාවයන් ඇති වන එක් එක් අවස්ථා ඇත. එය ස්වාභාවිකය. එවැනි අවස්ථාවලදී එක් හෝ වෙනත් "සම්මුතියක" නියම ස්වභාවය නිසි ලෙස තක්සේරු කිරීම පිණිස ඉමහත් පරිශ්‍රමයක් දැරීම

අවශ්‍ය වන්නේය. යම්සේද යත්, මිනී මැරීමක් සම්පූර්ණයෙන් සාධාරණ වීද, නැතහොත් (නිදසුනක් ලෙසට යුක්ති සහගත ආත්මාරක්ෂාව සඳහා) අවශ්‍ය දෙයක් වී ද, එසේත් නැතහොත්, එය සමාව දිය නොහැකි නොසැලකිල්ල නිසා හෝ කූට ලෙස ක්‍රියාත්මක කරන ලද දුෂ්ට සැලැස්මක් අනුව හෝ සිදුවීද යන්න ඔප්පු කිරීම කිසිසේත් පහසු නොවන ආකාරයේ මිනීමැරීම් සිදුවන අවස්ථා ඇතිවන ලෙසිනි. නමුත් දේශපාලනයේදී සමහරවිට මුහුණ පාන්නට සිදුවන්නේ — ජාතික සහ ජාත්‍යන්තර — පංති හා පක්ෂ අතර ඉතාමත් සංකීර්ණ සම්බන්ධකම් පිළිබඳ ප්‍රශ්නවලට වන නිසා, වැඩ වර්ජනයක දී ඇති කරගන්නා සාධාරණ "සම්මුතියත්", නැතහොත් හොරිකඩයෙක්, ද්‍රෝහී නායකයෙක් ආදී වූ අයෙක් ඇති කරගන්නා ද්‍රෝහී සම්මුතියක් පිළිබඳ ප්‍රශ්නයකට වඩා තෝරා බේරාගැනීමට බොහෝ දුෂ්කර වන අවස්ථා එහිදී උද්ගත වන්නේය. සියලුම අවස්ථාවලට හරියන වට්ටෝරුවක් හෝ පොදු නීතියක් ("සම්මුති එපා!") සකස් කිරීම ලොකු මෝඩ කමක් වනු ඇත. තමන්ගේ මොළය පාවිච්චි කර තමන් සිටින්නේ කුමණ තත්වයකද යන්න වටහා ගැනීමට අයෙකුට පුළුවන් විය යුතුය. කිසියම් නිශ්චිත පංතියක සිතන බලන නියෝජිතයන්* සියලු දෙනාගේම දීර්ඝ, නොපසුබස්නා, නේකාකාර සහ විස්තරාත්මක පරිශ්‍රමයන්ගේ මාර්ගයෙන්, සංකීර්ණ දේශපාලන ප්‍රශ්න අප්‍රමාද සහ නිවැරදි ලෙස විසඳීමට අවශ්‍ය වන දැනුම, පළ පුරුද්ද සහ, ඊට අමතරව, දේශපාලන නිපුණත්වය ලබා ගැනීම, ඇත්ත වශයෙන්ම නියම පක්ෂ සංවිධානයක හා පක්ෂ නායකයන්ගේ කාර්යයන්ගෙන් එකක් වන්නේය.

අපි අවස්ථාවාදයට විරුද්ධව අත් නොහරින අරගලයක් කරමින් සිටින්නෙමු. අපි එම අරගලය කළ යුත්තෙමු. එහෙත් එම අවස්ථාවාදයත්, විප්ලවවාදී මාක්ස්වාදය, නැතහොත්, කොමියුනිස්ට්වාදයත් අතර වෙනස නැති කිරීමට, පොදු වශයෙන් සම්මුති ඇතිකර ගැනීමට අවසර තිබීම ප්‍රමාණවත් වන්නේ යයි, බොළඳ සහ කිසිම පළපුරුද්දක් නොමැති අය සිතති. නමුත්, ස්වභාවධර්මයේ සහ සමාජයේ සියලුම වෙනස්කම් සරල

* ඉතාමත් දියුණු රටවල පවා, සෑම පංතියක් තුළම, ඉතාමත් දියුණු පංතිය තුළ පවා, අවස්ථාවේ වාතාවරණය විසින් එහි අධ්‍යාත්මික බලවේගයන් සියල්ලම අසාමාන්‍ය මට්ටමක් දක්වා ප්‍රබෝධමත් කර තිබෙන විට වුව, සිතා නොබලන, තමන් වෙනුවෙන් සිතා බැලීමට හැකියාවක් නොමැති, එම පංතියේ නියෝජිතයෝ සිටිති. පංති පවතිනතාක් කල්, පංති රහිත සමාජය සම්පූර්ණයෙන් තහවුරු වී නැති තාක් කල් සහ පංති රහිත සමාජය තමන්ගේම අත්තිවාරම් සකස් කරගෙන නොමැති තාක් කල්, අනිවාර්යණීය ලෙසටම, එම තත්වය පවතිනු ඇත. එවැනි තත්වයක් නොවී නම්, ධනපති ක්‍රමයට දැන් මෙන් පොදු ජනයා පීඩාවට පත් කිරීමේ හැකියාව නොලැබෙන්නට තිබිණි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ස්වභාවයක් ගන්නා බවත්, ඒවා එක්තරා දුරකට ව්‍යවහාරයෙන් පිළිගත් සම්මතයන් බවත්, මේ මිනිසුන් තවමත් නොදන්නේ නම්, දීර්ඝ පුහුණුව, අධ්‍යාපනය, කරුණු පැහැදිලි කිරීම සහ දේශපාලන හා දෛනික අත්දැකීම් ලැබීම හැර වෙනත් කිසිවක් ඔවුන්ට ආධාරකාරී නොවනු ඇත. ඕනෑම විශේෂ නැතහොත් ඓතිහාසික අවස්ථාවක, දේශපාලනයේදී උද්ගත වන ප්‍රායෝගික ප්‍රශ්නවලදී, විප්ලවවාදී පංතියට මාරක වන අවස්ථාවාදය අන්තර්ගත වන වැනි, ප්‍රධාන වශයෙන් නොඉවසිය හැකි හා ද්‍රෝහී වර්ගයේ සම්මුති මොනවාදැයි තෝරාගෙන, ඒවා ගැන කරුණු පැහැදිලි කිරීමට හා ඒවාට විරුද්ධව සටන් කිරීමට, සෑම ධෛර්යයක්ම යෙදීම වැදගත් අවශ්‍යතාවයකි. එක හා සමානවම කොල්ලකාරී වූ රටවල් කණ්ඩායම් දෙකක් අතර ඇති වූ 1914–1918 අධිරාජ්‍යවාදී යුද්ධය සමයේදී, අවස්ථාවාදයේ ප්‍රධාන සහ මූලික වර්ගය වූයේ සමාජ-ජාතෝන්මාදවාදය ය. එනම්, එවැනි යුද්ධයකදී ''තමන්ගේ'' ධනපති පංතියේ කොල්ලකාරී උවමනාවන් ආරක්ෂා කිරීමකට ඇත්ත වශයෙන්ම සමාන වන ''රට ආරක්ෂා කිරීමට'' ආධාර කිරීමය. යුද්ධයෙන් පසුව, ඒ නො ඉවසිය හැකි සහ ද්‍රෝහී සම්මුතිවල ප්‍රධාන ස්වරූපය වූයේ කොල්ලකාරී ජාතීන්ගේ සංගමය ආරක්ෂා කිරීම, විප්ලවවාදී නිර්ධන පංතියට සහ ''සෝවියට්'' ව්‍යාපාරයට විරුද්ධව තමන්ගේ රටේ ධනපති පංතිය සමග ඇති කරගන්නා සන්ධානයන් කෙළින්ම හෝ අනියම් ආකාරයෙන් ආරක්ෂා කිරීම සහ ''සෝවියට් බලයට'' විරුද්ධව ධනපති ප්‍රජාතන්ත්‍රවාදය සහ ධනපති පාර්ලිමේන්තුවාදය ආරක්ෂා කිරීම ය. එම ක්‍රියාවල එකතු සමස්තය, විප්ලවවාදී නිර්ධන පංතියට හා එහි ව්‍යාපාරයට මාරක අනතුරක් වූ අවස්ථාවාදයක් විය.

> ''...වෙනත් පක්ෂ සමග ඇති කර ගන්නා සියලු සම්මුතිද,... උපායික ලෙස මග හැරීමේ හා සම්මුතිගත වීමේ සෑම ප්‍රතිපත්තියක්මද, අවධාරණ සහිතව ප්‍රතික්ෂේප කළ යුතු වේ.''

ජර්මන් වාමවාදීහු ඔවුන්ගේ ප්‍රැන්ක්පූර්ට් පොත් පිංචෙහි එසේ ලිවූහ.

මෙම වාමවාදීන් මෙවැනි අදහස් දරන කල ඔවුන් බොල්ෂෙවික්වාදය හෙළා නොදැකීම විමතියට කරුණකි! කෙසේ හෝ වේවා, ඔක්තෝබර් විප්ලවයට පෙර හා පසු යන කාල පරිච්ඡේද දෙකෙහිදීම බොල්ෂෙවික්-වාදයේ මුළු ඉතිහාසයම, පිළිවෙත වෙනස් කිරීමේ, සමාදානවාදී උපක්‍රම අනුගමනය කිරීමේ සහ ධනපති පක්ෂ ඇතුළුව වෙනත් පක්ෂ සමග සම්මුතිගත වීමේ අවස්ථාවලින් පිරී තිබෙන බව, ජර්මන් වාමවාදීන් නොදැන සිටිනවා විය නොහැකිය!

රාජ්‍යයන් අතර කෙරෙන සාමාන්‍ය යුද්ධ අතුරෙන් ඉතාමත් දැඩිතර යුද්ධයට වඩා සියවරක් දුෂ්කර, දිගට ඇදෙන සහ සංකීර්ණ යුද්ධයක් වන ජාත්‍යන්තර ධනපති පංතිය පෙරළා දැමීමේ යුද්ධය කරන අතර, කල් තබාම, සෑම ආකාරයකම පිළිවෙත වෙනස් කිරීමක්ම හෝ තමන්ගේ සතුරන්ගේ උවමනාවන් සම්බන්ධයෙන් ඔවුන් අතර වන ගැටුමකින් (තාවකාලික වශයෙන්වත්) ප්‍රයෝජන ගැනීම හෝ, එසේ නැතහොත්, විය හැකි මිතුරන් සමග (ඔවුන් තාවකාලික, අස්ථාවර, වැනෙනසුලු හෝ කොන්දේසි සහිතව මිතුරුකම් දක්වන මිතුරන් වුවත්) මොනම ආකාරයේ හෝ සමාදානයක් හෝ සම්මුතියක් හෝ ඇති කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම අන්ත මෝඩ කමක් නොවේද? එය හරියටම, මෙතෙක් මග සොයා ගෙන නැති, මෙතෙක් නැංග නොහැකි වූ කන්දක් නැගීමට සූදනම් වෙද්දී කල් තබාම, ඇද කුද සහිත මගක් ගැනීමත්, ගිය මග නැවත යාමත්, තෝරාගත් මග වෙනස් කිරීමත් හෝ වෙනත් කිසිම මගක් අත්හදා බැලීමත්, කිසිසේත් නොකරමුයි ප්‍රතික්ෂේප කිරීමෙන් කඳු නැගීම දුෂ්කර කිරීමක් හා සමාන නොවේද? එය එසේ වුවත්, එතරම් නොමේරූ සහ නොපුරුදු අයට (ඔවුන්ගේ වරද තරුණ කම පමණක් වීනම් එය එතරම් නරක නොවේ. කලක් යන තෙක් තරුණ ජනයා එවැනි අර්ථ විරහිත කථා කීම දේව නියමයකි) ඍජු හෝ අනියම් ලෙස, විවෘත හෝ ආවෘත ලෙස, සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් යන කුමන ආකාරයෙන් වුව, ඕලන්දයේ කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයින් සමහර දෙනෙකුගේ ආධාරය ලැබී තිබේ.

කිසියම් රටක නිර්ධන පංතියේ ප්‍රථම සමාජවාදී විප්ලවයෙන් සහ එරටේ ධනපති පංතිය බලයෙන් නෙරපා දැමීමෙන් පසුව, එරටේ නිර්ධන පංතිය දීර්ඝ කාලයක් යන තෙක් ධනපති පංතියට වඩා දුර්වල තත්වයක පවතින්නේය. එයට එකම හේතුව ධනපති පංතියට පුළුල් ජාත්‍යන්තර සම්බන්ධ කම් තිබීම සහ ධනපති පංතිය පෙරළා දැමූ රටෙහි සුළු වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයන් විසින් සාංසිද්ධික වශයෙන් හා නොකඩවාම ධනපති ක්‍රමය ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබීම වේ. වඩාත් බලවත් සතුරා පරාජය කළ හැකි වන්නේ උපරිමතම හා අතිමහත් පරිශ්‍රමයෙන් පමණකි. එම සතුරා පරාජය කළ හැකි වන්නේ, සතුරන් අතර පවතින ඕනෑම හා ඉතාමත් සුළු වූ හෝ භේදයකින්, විවිධ රටවල ධනපතියන් අතර සහ විවිධ රටවල ධනපතියන්ගේ විවිධ කණ්ඩායම් හෝ අතර පවතින ඕනෑම ගැටුමකින්, ඉතාමත් තරයේ, සුපරීක්ෂාකාරී ලෙස, අවධාන සහිතව, දක්ෂ හා නොවරදවාම ප්‍රයෝජන ගැනීමෙන්ද, පොදුජන මිතුරෙක් දිනාගැනීමට ස්වල්පතම හෝ අවස්ථාවක් ඇති කල, ඔවුන් තාවකාලික වැනෙනසුලු, අස්ථාවර, අවිශ්වාසදායක සහ කොන්දෙසි සහිතව මිතුරුකම්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දක්වන පිරිසක් වුවත්, ඒ ඕනෑම අවස්ථාවකින් ප්‍රයෝජන ගැනීමෙන්ද වේ. මෙම කරුණ අවබෝධ කරගැනීමට අපොහොසත් වීමෙන් පෙනෙන්නේ මාක්ස්වාදයේ හා පොදු වශයෙන් නවීන විද්‍යාත්මක සමාජවාදයේ අංශු මාත්‍රයක්වත් වටහා ගැනීමට ඇති නොහැකියාවයි. තමන්ට මෙම සත්‍යය ව්‍යවහාරයේදී ක්‍රියාවට නැංවිය හැකි බව සැලකිය යුතු තරම් දීර්ඝ කාලයක් තිස්සේ සහ තරමක් විවිධ දේශපාලන තත්වයන් යටතේ ව්‍යවහාරික වශයෙන් ඔප්පු කරනැති අය, වෙහෙසී වැඩ කරන මුළු මිනිස් වර්ගයාම සූරා කන්නන්ගෙන් මුද ගැනීමට විප්ලවවාදී පංතිය කරන අරගලයේදී එයට ආධාර කිරීමට තවමත් උගෙන ගෙන නැත. තවද, මෙම නිගමනය, නිර්ධන පංතිය දේශපාලන බලය දිනාගැනීමට පෙර හා පසු යන කාල ද්වයටම අදළ වන්නේය.

අපගේ න්‍යාය ඇදහිල්ලක් නොව, ක්‍රියාකාරීත්වය සඳහා මග පෙපෙන්වීමකියි මාක්ස් සහ එංගල්ස් කීහ.[66] කාල් කෞට්ස්කි සහ ඔටෝ බවර් වැනි "එහෙම පිටින්ම" මාක්ස්වාදීන් කළ විශාලම වරද, විශාලම අපරාධය, මෙය වටහා නොගැනීම සහ නිර්ධන පංති විප්ලවයේ තීරණාත්මක අවස්ථාවලදී එය ක්‍රියාත්මක කිරීමට අසමත් වීමය. 'දේශපාලන ක්‍රියාකාරීත්වය යනු නෙව්ස්කි වීදියේ පදික වේදිකාව, වැන්නක් නොවේ," යයි මාක්ස් පූර්ව කාලයේ සිටි ඒ ශ්‍රේෂ්ඨ රුසියානු සමාජවාදියා වන එන්. ජී. චෙර්නිෂෙව්ස්කි[67] කීවේය. (එයින් සඳහන් කෙරුනේ සාන්ත පීටර්ස්බර්ග් නුවර ඉතාම සෘජු ප්‍රධාන මාවතේ මනාව නඩත්තු කරන ලද, පුළුල් සහ මට්ටම් වේදිකාව ගැනය). චෙර්නිෂෙව්ස්කිගේ කාලයෙන් පසුව මෙම සත්‍යය නොසලකා හැරීම, නැතහොත්, අමතක කිරීම නිසා රුසියානු විප්ලවවාදීන්ට බොහෝ අලාභ හානි සිදුවිය. මෙම සත්‍යය උගෙන ගැනීම සඳහා නොදියුණු රුසියානුන් ගෙවූ තරම් අධික මිළක් ගෙවීමෙන් වාම කොමියුනිස්ට්වාදීන් සහ කම්කරු පංතිය වෙනුවෙන් කැපවූ බටහිර යුරෝපීය සහ ඇමෙරිකානු විප්ලවවාදීන් වළක්වනු පිණිස, අපි සෑම ප්‍රයත්නයක්ම දැරිය යුත්තෙමු.

සාර්වාදයේ ඇදවැටීමට පෙර, රුසියානු විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු නැවත නැවතත් ධනපති ලිබරල්වාදීන්ගෙන් ප්‍රයෝජන ගත්හ. ඔවුහු ඔවුන් සමග බොහෝ ප්‍රායෝගික සම්මුති ඇති කර ගත්හ. බොල්ශෙවික්වාදය උදා වීමටත් පෙර, 1901–1902 කාලයේදී (ප්ලෙහානව්, අක්සල්රොද්, සසුලිච්, මාර්තව්, පොත්‍රෙසව් හා මා යන අයගෙන් සමන්විත) පැරිස් "ඉස්ක්‍රා" කර්තෘ මණ්ඩලය, ධනපති ලිබරල්වාදයට සහ කම්කරු පංති ව්‍යාපාරය තුළට එන එහි ස්වල්පතම හෝ බලපෑමට පවා විරුද්ධව ලිහිලක් නොදෙන සහ ඉතාමත් නිරනුකම්පක දෘෂ්ටිමය හා දේශපාලනමය අරගලයක් කිරීමේ ඉඩ කඩ තබා ගනිමින්ම, ධනපති ලිබරල්වාදයේ දේශපාලන නායකයා වූ ස්ත්‍රුවේ සමග විධිමත් දේශපාලන සන්ධානයක් (දීර්ඝ කලක් සඳහා නොවූ බව සැබෑය) ඇතිකර ගත්තේය. බොල්ශෙවික්වරු නිතරම මෙම ප්‍රතිපත්තිය අනුගමනය කළහ. 1905 පටන්, ඔවුහු, ලිබරල් ධනපති පංතියට සහ සාර්වාදයට විරුද්ධව කම්කරු පංතිය සහ ගොවිජනතාව අතර සන්ධානයක් ඇතිකරගැනීම සඳහා ක්‍රමාණුකූල ලෙස කටයුතු කර ඇත්තාහ. නමුත්, ඒ අතරම සාර්වාදයට විරුද්ධව ධනපති පංතියට ආධාරදීම (නිදසුන් ලෙසට දෙවැනි වටයේ මැතිවරණවලදී, නැතහොත්, දෙවැනි ඡන්දයේදී) කිසි කලෙකත් ප්‍රතික්ෂේප නොකිරීමටද, සුළු ධනපති විප්ලවවාදී ගොවිජන පක්ෂය වූ සමාජවාදී-විප්ලවවාදීන්ට විරුද්ධව බුරුලක් නොදී කළ දෘෂ්ටිමය හා දේශපාලන අරගලය කිසිසේත් නොනැවැත්විමටද, ඔවුහු වගබලා ගත්හ. 1907 දූමා සභා මැතිවරණවලදී බොල්ශෙවික්වරු සමාජවාදී-විප්ලවවාදීන් සමග කෙටිකාලීන විධිමත් දේශපාලන පෙරමුණක් ඇති කරගත්හ. 1902 සහ 1912 අතර කාලයේදී මෙන්ශෙවික්වරුන් සමග අප එකම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් තුළ විධිමත් ලෙස එක්සත්ව සිටි අවුරුදු කීපයක කාලසීමා විය. නමුත්, ඔවුන් අවස්ථාවාදීන් හා නිර්ධන පංතිය තුළට ධනපති බලපෑම ගෙන එන වාහන සේ සලකා, ඔවුන්ට විරුද්ධව අපි කළ දෘෂ්ටිමය හා දේශපාලන අරගලය කිසිකලෙකත් නොනැවැත්වූයෙමු. යුද්ධය කාලයේදී අපි, කෞට්ස්කිවාදීන්ද, වාම මෙන්ශෙවික්වරුන්ද (මාර්තව්), සමාජවාදී-විප්ලවවාදීන් ගෙන් කොටසක්ද (චෙර්නොව් සහ නතන්සොන්) සමග යම් යම් සම්මුති ඇතිකර ගත්තෙමු. ට්සිමර්වාල්ඩ්හිදී සහ කීන්තාල්හිදී[68] අපි ඔවුන් සමග එක්ව සිටියෙමු. ඒකාබද්ධ ප්‍රකාශන නිකුත් කෙළෙමු. එසේ වුවද කෞට්ස්කිවාදීන්ට, මාර්තව්ට සහ චෙර්නොව්ට විරුද්ධව අප කළ දෘෂ්ටිමය සහ දේශපාලන අරගලය අපි කිසිකලෙකත් නොනැවැත්වූයෙමු.කිසිකලෙකත් අඩු නොකෙළෙමු. (1919 දී නතන්සොන් මිය යන විට, "විප්ලවවාදී කොමියුනිස්ට්" නරොද්නික්වරයෙක්[69] වූ ඔහු අපට බොහෝ කිට්ටුව හා අප හා සමග එකඟත්වයෙන් මෙන් සිටියේය). ඔක්තෝබර් විප්ලවයේ අවස්ථාවේදීම, එකද වෙනස් කිරීමක්වත් නොකර, සමාජවාදී-විප්ලවවාදී ගොවි වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම පිළිගැනීමෙන්, අපි සුළු ධනපති ගොවිජනයා සමග, අනියම් එහෙත් ඉතා වැදගත් (හා ඉතා සාර්ථක) දේශපාලන පෙරමුණක් ඇති කර ගත්තෙමු. අප එයින් කළේ, ගොවිජනතාව "යට කර දැමීම" අපගේ අපේක්ෂාව නොවන බවත්, ඔවුන් සමග එකඟත්වයක් ඇති කර ගැනීමට අපට උවමනා වූ බවත්, ඔවුන්ට ඔප්පු කිරීම පිණිස ඒකාන්ත ලෙස සම්මුතියකට එළඹීම ය. ඒ අතරම ආණ්ඩුවට සම්බන්ධවීමත් ඇතුලත්ව විධිමත් දේශපාලන පෙරමුණක් සඳහා අපි වාම සමාජවාදී-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විප්ලවවාදීන් වෙත යෝජනා ඉදිරිපත් කෙළෙමු (එසේම කල් නොයවාම එම පෙරමුණ පිහිටෙව්වෙමු). බ්‍රෙස්ට්-ලිටොව්ස්ක් ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව මෙම පෙරමුණ බිඳ දැමූ වාම සමාජවාදී-විප්ලවවාදීහු 1918 ජූලි මාසයේදී ආයුධ සන්නද්ධ කැරැල්ලක් ගසන තරම්ද, පසුව අපට විරුද්ධව ආයුධ සන්නද්ධ අරගලයෙහි යෙදීම තරම්ද දුර ගියහ.

ස්වාධීනයන් (ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්වාදී පක්ෂය — කෞට්ස්කිවාදීන්) සමග පෙරමුණක් ඇති කර ගැනීමේ අදහස දැරීම සම්බන්ධයෙන් ජර්මන් වාම වාදීන් ජර්මනියේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව වෙත එල්ල කරන පහරවල් සම්පූර්ණයෙන්ම උමතුවකැයි යන අපගේ මතය මේ අනුව වටහා ගත හැකි වනු ඇත. එමෙන්ම "වාම" වාදීන් කරන්නේ වරදක් බවද මෙම කරුණුවලින් පැහැදිලි වේ. රුසියාවේද, ජර්මන් ෂෙයිඩමාන්ලාට සමාන දක්ෂිණ මෙන්ෂෙවික්වරුනුත් (කෙරෙන්ස්කි ආණ්ඩුවට සම්බන්ධ වූවන්), ජර්මන් කෞට්ස්කිවාදීන්ට සමාන සහ දක්ෂිණ මෙන්ෂෙවික්වරුන්ට විරුද්ධ වී සිටි වාම මෙන්ෂෙවික්වරුනුත් (මාර්තව්) සිටියහ. වැඩ කරන පොදු ජනතාව මෙන්ෂෙවිකයන් අත්හැර ක්‍රම ක්‍රමයෙන් බොල්ෂෙවික්වරුන් පැත්තට එණ බව 1917 දී පැහැදිලිවම දක්නට තිබිණ. 1917 ජූනි මාසයේදී පැවැත්වුනු ප්‍රථම සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලයේදී අපට තිබුණේ ඡන්ද සියයට 13 ක් පමණකි. සමාජවාදී-විප්ලවවාදීන්ට සහ මෙන්ෂෙවික්වරුන්ට එහි බහුතරයක් සිටියහ. දෙවැනි සෝවියට් සභා සම්මේලනයේදී (පැරණි දින දර්ශනය අනුව 1917 ඔක්තෝබර් 25) අපට ඡන්ද සියයට 51 ක් තිබිණ. ජර්මනියේ කම්කරුවන් දකුණ අත් හැර එසේම, සම්පූර්ණයෙන්ම ඒ ආකාරයෙන්ම වම පැත්තට ගිය නමුත්, එයින් එක් වරම කොමියුනිස්ට්වරුන් ශක්තිමත් නොවී, ප්‍රථමයෙන් අතර මැද වූ ස්වාධීන පක්ෂය ශක්තිමත් වූයේ මන්ද? එම ස්වාධීන පක්ෂයට කිසි කලෙකත් ස්වාධීන අදහස් හෝ ස්වාධීන ප්‍රතිපත්තියක් හෝ නොතිබුන නමුත්, ඔවුන් ෂෙයිඩමාන්ලා සහ කොමියුනිස්ට්වරුන් අතර හුදෙක්ම එහා මෙහා වැනෙමින් සිටි නමුත්, ප්‍රථමයෙන් ඔවුන් ශක්තිමත් වූයේ මන්ද?

ඊට හේතු වූ, පැහැදිලිව පෙනෙන එක කරුණක් නම්, ජර්මන් කොමියුනිස්ට්වරුන්ගේ උපක්‍රම වැරදි වීමය. ඔවුන් නිර්භයව හා අවංකව එම වරද පිළිගෙන, එය නිවැරදි කිරීමට උගත යුතුය. මෙම වරද සිදු වූයේ ප්‍රතිගාමී ධනපති පාර්ලිමේන්තුවලට සහ ප්‍රතිගාමී වෘත්තීය සමිතිවලට සහභාගි වීමේ අවශ්‍යතාවය ඔවුන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙනි. එම වරද සිදු වූයේ "වාමාංශික" ළදරු වලිප්පුව නොයෙක් ආකාරයෙන් ඉස්මතු වීමෙනි. එම රෝගය දැන් මතුපිටට පැමිණ තිබෙන නිසා, වඩාත්

අංග සම්පූර්ණ ලෙස, වඩාත් සීඝ්‍ර ලෙස හා ජීවෙන්ද්‍රියයට වැඩි යහපතක් සිදුවන ආකාරයෙන් එය සුව කෙරෙනු ඇත.

ජර්මන් ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සමජාතීය සංවිධානයක් නොවන බව පැහැදිලි කරුණකි. සෝවියට් බලයේ සහ නිර්ධන පංති ආඥාදායකත්වයේ වැදගත් කම වටහා ගැනීමට තමන්ගේ අසමත් කම හා නිර්ධන පංතියේ විප්ලවවාදී අරගලයට නායකත්වය දීමට තමන්ගේ නොහැකියාව හෙළිදරව් කර තිබෙන මෙම පක්ෂයේ පැරණි (කෞට්ස්කි, හිල්පර්දිං සහ පෙනෙන ලෙසට එක්තරා දුරකට ක්‍රිස්පීන්, ලෙදෙබූර් සහ වෙනත් අය) අවස්ථාවාදී නායකත්වය සමග එක පෙළට සිටින සේ, එය තුළ වාම සහ නිර්ධන පංතික අංශයක් ඉස්මතුවී, එම අංශය ඉතා සීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පවතී. මෙම පක්ෂයේ සාමාජිකයන් (ලක්ෂ හත හමාරක් පමණ වෙතියි සිතමි) ලක්ෂ ගණනක් නිර්ධන පංතිකයන් වන අතර, ඔවුහු ෂෙයිඩමාන්ලා අතහැර, කොමියුනිස්ට්වාදය වෙතට හැරෙමින් සිටිති. කොන්දේසි විරහිතව තුන්වැනි ජාත්‍යන්තරයට වහාම සම්බන්ධ විය යුතු යයි මෙම නිර්ධන පංති අංශය දැනටමත් ස්වාධීනයන්ගේ (1919) ලයිප්සිග් සම්මේලනයේදී යෝජනා කර ඇත. එම පක්ෂයේ මේ අංශය සමග "සම්මුතියක්" ඇතිකර ගැනීමට බියවීම යනු, ඇත්තෙන්ම විකාරයකි. ඊට ප්‍රතිකූල වශයෙන් ඔවුන් සමග සම්මුතියක් ඇති කර ගැනීම සඳහා සුදුසු ආකෘතියක් සෙවීම හා සොයා ගැනීම කොමියුනිස්ට්වරුන්ගේ යුතුකම වන්නේය. එවැනි සම්මුතියක් නිසා, එක් අතකින් මෙම අංශය සමග සම්පූර්ණයෙන්ම එකට පැහීමේ අවශ්‍යතාවය ඉටු කිරීම පහසු සහ ඉක්මන් කෙරෙනු ඇත. අනිත් අතට, ස්වාධීනයන්ගේ අවස්ථාවාදී දක්ෂිණාංශයට විරුද්ධව කොමියුනිස්ට්වරුන් ගෙනයන ඔවුන්ගේ දෘෂ්ටිමය හා දේශපාලන අරගලයට එයින් කිසිම බාධාවක් නොවනු ඇත. සම්මුතියක් සඳහා සුදුසු ආකෘතියක් සකස් කර ගැනීම සමහර විට පහසු දෙයක් නොවන්නට ඉඩ තිබේ. නමුත් "පහසු" ජයග්‍රහණ මාවතක් ගැන ජර්මන් කොමියුනිස්ට්වාදීන්ට පොරොන්දු දිය හැක්කේ බොරු කාරයෙකුට පමණකි.

නිර්ධන පංතිකයා හා අර්ධ නිර්ධනයා (ස්වකීය ශ්‍රම ශක්තිය විකිණීමෙන් තමන්ගේ ජීවනෝපායයෙන් කොටසක් උපයාගන්නා අය) අතරද, අර්ධ නිර්ධනයා හා කුඩා ගොවියා (සුළු ශිල්පියා, හස්ත කාර්මික කම්කරුවා සහ පොදුවශයෙන් සුළුසේවා යෝජකයා) අතරද, කුඩා ගොවියා සහ මධ්‍යම ගොවියා අතරද, යනාදී වශයෙන් තත්වයන් ගෙන සිටින අතිශයින්ම මිශ්‍රිත වර්ගවලට අයත් අන්තර් ජන කොටස්වලින් "පිරිසිදු" නිර්ධන පංතිය වටවී නොතිබෙන්නට, එමෙන්ම, නිර්ධන පංතියම වැඩියෙන් හා අඩුවෙන් දියුණු වූ ස්ථරවලට බෙදී නොතිබෙන්නට, එය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මුල් ප්‍රදේශය, කර්මාන්තය, සමහරවිට ආගම, යනාදිය අනුව බෙදී නොතිබෙන්නට, ධනපති ක්‍රමය නියම ධනපති ක්‍රමය නොවන්නේය. කොමියුනිස්ට් පක්ෂයට, නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණියට, එහි පංති විඥනය ඇති කොටසට, පිළිවෙත වෙනස් කිරීමටත්, නිර්ධන පංතිකයන්ගේ විවිධ කණ්ඩායම් සමග, කම්කරුවන්ගේ හා සුළු සේවා යෝජකයන්ගේ පක්ෂ සමග සමාදන හා සම්මුති ඇති කර ගැනීමටත්, අවශ්‍යයෙන්ම සිදුවනු බව මේ සියල්ලෙන්ම නිගමනය වන්නේය. එය වූකලී, හුදෙක්ම නිර්ධන පංතියේ පොදු විඥන මට්ටම, විප්ලවවාදී ජීව ගුණය සහ සටන් කර ජය ගැනීමේ ශක්තිය අඩු කිරීම නොව වැඩි කිරීම සඳහා, මෙම උපක්‍රම යොදා ගන්නේ කෙසේ ද යන්න දැන ගැනීම පිළිබඳ ප්‍රශ්නයකි. මෙන්ෂෙවික්වරුන් පරදවා ජය අත්පත් කරගනු සඳහා බොල්ෂෙවික්වරුනට පිළිවෙත වෙනස් කිරීමේ, සමාදන සහ සම්මුති ඇති කරගැනීමේ උපක්‍රම අනුගමනය කිරීමට සිදුවූ බව මෙහි ලා සටහන් කරගත යුතු වේ. 1917 ඔක්තෝබර් විප්ලවයට පෙර පමණක් නොව ඉන් පසුවද එසේ කිරීම අවශ්‍ය විය. නමුත්, පිළිවෙත වෙනස්කිරීමේ, සමාදන සහ සම්මුති ඇති කරගැනීමේ එම පියවරයන් මෙන්ෂෙවික්වරුන්ට අවාසි සිදුවන සහ බොල්ෂෙවික්වරුන්ට ආධාරකාරීවන, ඔවුන්ගේ තත්වය ශක්තිමත් හා තහවුරු කරන ඒවා විය. සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීහු (මෙන්ෂෙවික් වරුන්ද ඇතුළුව) ධනපති පංතිය සහ නිර්ධන පංතිය අතරද, ධනපති ප්‍රජාතන්ත්‍රවාදය සහ සෝවියට් ක්‍රමය අතරද, ප්‍රතිසංස්කරණ වාදය සහ විප්ලවවාදීත්වය අතරද, කම්කරුවන්ට ලැදිකම සහ නිර්ධන පංති ආඥාදයකත්වයට බියවීම අතරද ආදීවශයෙන්, එහා මෙහා වැනෙමින් සිටිති. කොමියුනිස්ට්වාදියාගේ නියම උපක්‍රම වියයුත්තේ මෙම වැනෙනසුලු ගතිවලින් ප්‍රයෝජන ගැනීම මිස ඒවා නොසලකා හැරීම නොවේ. එයින් ප්‍රයෝජන ගැනීම පිණිස, නිර්ධන පංතිය දෙසට හැරෙන කොටස්වලට, ඔවුන් එසේ හැරෙන විට හා හැරෙන තාක් දුරට සහන සැලසීම සහ ඊට අමතරව ධනපති පංතිය දෙසට හැරෙන අයට විරුද්ධව සටන් කිරීම අවශ්‍ය වේ. අප නිවැරදි උපක්‍රම ක්‍රියාත්මක කළ නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙන්ෂෙවික්වාදය බිඳී විසිරී යාමට පටන් ගත්තේය. එය අප රට තුළ වඩ වඩාත් පිරිහී යමින් පැවතියේය. දැඩි ලෙසම අවස්ථාවාදී වන නායකයන් කොන් කෙරෙන අතර, සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් අතර සිටින හොඳම කම්කරුවන් සහ හොඳම කොටස් අපගේ කඳවුර වෙත ගෙන එනු ලැබේ. මෙය දීර්ඝ ක්‍රියාදමයකි. එනිසා “සම්මුති එපා”, “උපායික මගහැරීම් එපා” යන ඉක්මන් තීරණයෙන් සිදුවිය හැක්කේ විප්ලවවාදී නිර්ධන පංතියේ බලපෑම ශක්තිමත් වීමට හා එහි බලවේගයන් පුළුල් වීමට බාධාවක් පමණකි.

ජර්මන් “වාම” වාදීන්ගේ නිසැක වැරදිවලින් එකක් නම්, වර්සයිල්ස් ගිවිසුම පිළිගැනීම ඔවුන් විසින් එකහෙළාම ප්‍රතික්ෂේප කරනු ලැබීම ය. මෙම මතය වඩාත් “හරබර ලෙස” හා “පුරාජේරු සහිතව”, වඩාත් “අවධාරණයෙන්” සහ බලකාරී ලෙස ඉදිරිපත් කළ තරමට (නිදසුනක් ලෙසට කේ. හෝර්නර් එසේ කරයි), එයින් පළවන අර්ථය අඩුවන්නේය. මිත්‍ර ගිවිසුමට (Entente) විරුද්ධව යුද්ධයක් කිරීම සඳහා ජර්මන් ධනපති පංතිය සමග පෙරමුණක් ඇති කිරීමට යෝජනා කරන තරම් දුර ගොස් සිටින (ලවපන්බෙර්ග් සහ වෙනත් අයගේ), “ජාතික බොල්ෂෙවික්වාදයේ” විපරීත බහුබූතයන් හුදෙක් අත්හැර දැමීම පමණක් ජාත්‍යන්තර නිර්ධන පංති විප්ලවයේ වර්තමාන තත්වයන් යටතේ ප්‍රමාණවත් නොවේ. කලක් යන තෙක් වර්සයිල්ස් ගිවිසුම පිළිගැනීමට සහ එයට අනුකූලත්වය දක්වා කටයුතු කිරීමට සෝවියට් ජර්මනියකට (ජර්මන් සෝවියට් ජනරජයක් ඉක්මණින් ඇති වුවහොත්) සිදුවනු ඇති බව නො පිළිගෙන ප්‍රතික්ෂේප කිරීම අන්ත ව්‍යාජ උපක්‍රමයක් බව කෙනෙකුට වැටහී යා යුතුය. නමුත්, ෂයිඩමාන්ලා ආණ්ඩුවේ සිටි සමයක, හංගේරියාවේ සෝවියට් ආණ්ඩුව පෙරළා දැමීම තවමත් සිදු නොවී තිබුණු සමයක, වියනාවේ කෙරෙන සෝවියට් විප්ලවයකින් සෝවියට් හංගේරියාවට තවමත් ආධාර කළ හැකිව තිබුණු සමයක, එවැනි තත්වයන් යටතේ, වර්සයිල්ස් ගිවිසුම අත්සන් කරන සේ ස්වාධීනයන් කළ ඉල්ලීම නිවැරදි දෙයකැයි යන්න පිළිගැනීමක් මෙයින් කිසිසේත් අදහස් නොකෙරේ. එම අවස්ථාවේදී ස්වාධීනයන් ගෙන ගිය ක්‍රියාමාර්ගය හා අනුගමනය කළ මග හැරීමේ උපායයන් අනුචිත විය. එසේ කියන්නේ ඔවුන් ෂයිඩමාන් ද්‍රෝහීන්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් වගකීම භාර ගන්නා තත්වයට ආසන්න වූ හෙයින්ද, ෂයිඩමාන්ලාට විරුද්ධව නිර්දය (සහ ඉතාමත් සන්සුන් ලෙස කරන) පංති යුද්ධයකට පක්ෂවාදී වීමෙන් ආපස්සට තල්ලු වී “පංති රහිත” නැතහොත් “පංති ඉක්මවූ” ස්ථාවරයකට පක්ෂ වීමේ තත්වයට ආසන්න වූ හෙයින් ද වේ.

කෙසේ හෝ වේවා, කොමියුනිස්ට්වාදය ජයග්‍රහණය කළහොත් වර්සයිල්ස් ගිවිසුම අත් හැර දමන බවට ඒකාන්ත හා නිශ්චිත පොරොන්දුවක් දීමෙන්, ජර්මන් කොමියුනිස්ට්වරු, වර්තමාන තත්වය යටතේ ඔවුන්ගේ ක්‍රියාකාරී වීමේ නිදහස නැති නොකරගත යුතුය යන්න පැහැදිලි කරුණකි. එසේ කිරීම තකතිරු කමක් වනු ඇත. ඔවුන් කිව යුත්තේ මෙසේය: සෝවියට් රුසියාව සහ සෝවියට් හංගේරිය සමග සන්ධානයක් ඇති කර ගැනීමට තිබුණු අවස්ථා අවුරමින් (සහ අර්ධ වශයෙන් විනාශ කරමින්) ෂයිඩමාන්ලා හා කෞට්ස්කිවාදීන් ද්‍රෝහී ක්‍රියා ගණනාවක් කර ඇත. කොමියුනිස්ට්වාදීන් වන අපි එවැනි සන්ධානයක් ඇති වීම පහසු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීමට හා ඒ සඳහා මග සකස් කිරීමට අපට හැකි සියල්ලක්ම කරන්නෙමු. නමුත්, මොනවා සිදු වුවත්, වර්සයිල්ස් ගිවිසුම අත්හැර දැමීමට, නැතහොත්, එක් වරම එය අත්හැර දැමීමට අපි කිසිසේත් බැඳී නොසිටිමු. එය සාර්ථක ලෙස අත්හැර දැමීමේ හැකියාව රැඳී පවතින්නේ ජර්මන් සෝවියට් ව්‍යාපාරයේ පමණක් නොව ජාත්‍යන්තර සෝවියට් ව්‍යාපාරයේද ජයග්‍රහණය මතය. ෂයිඩමාන්ලා සහ කෞට්ස්කිවාදීහු ව්‍යාපාරයට අකුල් හෙළූහ. අපි එයට ආධාර කරන්නෙමු. කාරණයේ සරල සම්පිණ්ඩනය එයයි. මූලික වෙනස තිබෙන්නේ එතැනය. අනිත් අතට, ජර්මන් සහ ජාත්‍යන්තර යන සෝවියට් ව්‍යාපාර ද්වයම ශක්තිමත් කිරීමේ අවස්ථා, අපගේ පංති සතුරන්ට, සූරා කන්නන්ට සහ ඔවුන්ගේ ෂයිඩමාන් සහ කෞට්ස්කිවාදී අන්තේවාසිකයන්ට වැරදී ගියේ නම්, එහි වරද පැවරෙන්නේ ඔවුන්ටමය. ජර්මනියේ සිදුවන සෝවියට් විප්ලවයෙන් ජාත්‍යන්තර සෝවියට් විප්ලවය ශක්තිමත් වන්නේය. වර්සයිල්ස් ගිවිසුමට විරුද්ධව සහ පොදු වශයෙන් ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයට විරුද්ධව තිබෙන බලවත්ම පවුර (සහ එකම විශ්වාසදායක, අනභිභවනීය සහ ලෝක ව්‍යාප්ත පවුර) ජාත්‍යන්තර සෝවියට් විප්ලවයයි. වර්සයිල්ස් ගිවිසුමෙන් නිදහස ලැබීම ඉදුරාම, නිශ්චිත වශයෙන්ම සහ වහාම කළ යුතු ප්‍රධාන කටයුත්ත ලෙස සැලකීම ද, අධිරාජ්‍ය වාදයෙන් පීඩිත වෙනත් රටවල් අධිරාජ්‍යවාදයේ වියගසින් මුදා ගැනීමේ ප්‍රශ්නයට වඩා වර්සයිල්ස් ගිවිසුමෙන් නිදහස් වීම ප්‍රධානත්වයෙහි ලා සැලකීමද, විප්ලවවාදී ජාත්‍යන්තරවාදය නොව හිල්පර්දිංලා, ඔටෝ බෞවර්ලා සහ සමාගමට සුදුසුවන) අමන ජාතිවාදය වේ. ජර්මනිය ඇතුළුව විශාල යුරෝපීය රටවල් අතුරෙන් එකක ධනපති පංතිය බලයෙන් නෙරපා දැමීම අතිශයින්ම වැදගත් හෙයින්, ඒ උදෙසා වර්සයිල්ස් ගිවිසුම තවත් දීර්ඝ ලෙස පැවතීම වුවද අවශ්‍ය වේ නම්, එය ඉවසා සිටීමට අයෙක් සමත් විය යුතුය, එසේම, කැමති විය යුතුය. රුසියාව තනිවම නැගී සිටිමින් විප්ලවයේ යහපත පිණිස මාස ගණනක් යන තෙක් බ්‍රෙස්ට් සාම ගිවිසුම දරා සිටීමෙහි සමත් වූයේ නම්, සෝවියට් රුසියාව සමග සන්ධාන ගතවූ සෝවියට් ජර්මනියට විප්ලවයේ යහපත පිණිස ඊට වඩා දීර්ඝ කාලයක් යන තෙක් වර්සේල්ස් ගිවිසුම තිබීම දරා ගත නොහැකි වීමට කිසිම හේතුවක් නැත.

ජර්මන් කොමියුනිස්ට් වරු ප්‍රකෝප කර, ඔවුන් උගුලට හසු කර ගැනීමට යත්න දරමින් ප්‍රංශ, බ්‍රිතාන්‍ය යනාදී අධිරාජ්‍යවාදීහු මෙසේ කියති: "නුඹලා වර්සයිල්ස් ගිවිසුම අත්සන් කරන්නේ නැතැයි කියාපල්ලා". ඔවුහු එසේ පොළඹවති. කූට සහ දූනට වැඩි ශක්තියක් ඇති සතුරා දක්ෂ ලෙස උපායෙන් මග හරිනවා වෙනුවට, "දැන් අපි වර්සයිල්ස් ගිවිසුම අත්සන් කරන්නෙමු" යයි ඔහුට කියනවා වෙනුවට, ජර්මන් වාම කොමියුනිස්ට්වාදීහු ළදරුවන් මෙන් ගොස්, තමන් ඇල්ලීමට අටවා තිබෙන උගුලෙහි හසුවෙති. කල් මත්තෙන්ම අපගේ ක්‍රියාකාරිත්වය සඳහා ඇති කිසියම් නිදහසක් ඉවත දැමීම, දැනට අපට වඩා හොඳින් ආයුධ සන්නද්ධව සිටින සතුරාට විරුද්ධව අප සටන් කරන්නේද හා ඒ කවදාද යනු ඔහුට දැනුම් දීම, විප්ලවවාදිත්වය නොව තකතිරු කමකි. අපට නොව සතුරාට පැහැදිලි වාසිය තිබෙන විටෙක සටන පිළිගැනීම යනු අපරාධයකි. අවාසිය හොඳින් පෙනෙන සංග්‍රාමයකදී මගහැරයාමේ පියවර ගැනීම පිණිස, "පිළිවෙත මාරු කිරීමට නැතහොත් සමාදානය හා සම්මුතිය යෝජනා කිරීමට" අපොහොසත් වන විප්ලවවාදී පංතියේ දේශපාලන නායකයෝ කිසිම වැඩකට නැති අය වෙති.

IX

මහා බ්‍රිතාන්‍යයේ "වාමාංශික කොමියුනිස්ට්වාදය"

මහා බ්‍රිතාන්‍යය තුළ තවමත් කොමියුනිස්ට් පක්ෂයක් නොමැත. නමුත් අපගේ උසස්තම බලාපොරොත්තු තැබීමට තරම් වන අළුත්, පුළුල්, බලවත් හා සීඝ්‍රයෙන් වැඩෙන කොමියුනිස්ට් ව්‍යාපාරයක් එහි කම්කරුවන් අතර ඇත. කොමියුනිස්ට් පක්ෂයක් පිහිටුවීමට කැමති සහ එම අරමුණ ඇතිව ඔවුනොවුන් අතර සාකච්ඡා කරමින් සිටින දේශපාලන පක්ෂ හා සංවිධාන ගණනාවක් (බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය[70], සමාජවාදී කම්කරු පක්ෂය, දකුණු වේල්සයේ සමාජවාදී සමිතිය, කම්කරු සමාජවාදී සම්මේලනය[71] වෙති. මෙහි අවසානයට සඳහන් සංවිධානයේ නිල සතිපතා පත්‍රය වන, "Worker's dreadnought"[72], වෙළුම VI, අංක 48 දරන 1920 පෙබරවාරි 21 දින කලාපයෙහි එම පත්‍රයේ කතෘ සිල්වියා පැංක්හර්ස්ට් සහෝදරියගේ ලිපියක් "කොමියුනිස්ට් පක්ෂයක් කරා" යන සිරස්තලය යටතේ පළ වී තිබිණි. තුන්වැනි ජාත්‍යන්තරයට සම්බන්ධවීම, පාර්ලිමේන්තුවාදය වෙනුවට සෝවියට් ක්‍රමය පිළිගැනීම සහ නිර්ධන පංති ආඥාදායකත්වය පිළිගැනීම පදනම් කරගෙන, එක්සත් කොමියුනිස්ට් පක්ෂයක් පිහිටුවීම සඳහා ඉහත සඳහන් සංවිධාන අතර පැවැත්වුනු සාකච්ඡාවල ප්‍රගතිය ගැන එම ලිපියෙන් විස්තර කර තිබිණි. වහාම එක්සත් කොමියුනිස්ට් පක්ෂයක් පිහිටුවීමට ඇති විශාලම බාධක අතුරෙන් එකක් වන්නේ, පාර්ලිමේන්තුවට සහභාගී වීම හා සම්බන්ධ ප්‍රශ්නත්, අළුත් කොමියුනිස්ට් පක්ෂය, පැරණි, වෘත්තීය සමිතිවාදී, අවස්ථාවදී සහ ජාතෝන්මාදවාදීවූ ද, වැඩි කොටම වෘත්තීය සමිතිවලින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සැඳුනා වූද, කම්කරු පක්ෂයට ඒකාබද්ධ විය යුතුද යන ප්‍රශ්නයත් බව පෙනේ. කම්කරු සමාජවාදී සම්මේලනය සහ සමාජවාදී කම්කරු පක්ෂය* පාර්ලිමේන්තු මැතිවරණවලට සහ පාර්ලිමේන්තුවට සහභාගි වීමටත්, කම්කරු පක්ෂයට ඒකාබද්ධ වීමටත් විරුද්ධ වෙති. මෙහිදී බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ සාමාජිකයින් සියළු දෙනාම, නැතහොත්, වැඩි දෙනෙක් සමග ඔවුහු එකඟ නොවෙති. ඔවුහු එම පක්ෂය මහා බ්‍රිතාන්‍යයේ ''කොමියුනිස්ට් පක්ෂවල දක්ෂිණාංශය'' ලෙස සලකති. (සිල්වියා පැංක්හර්ස්ට් ගේ ලිපිය, 5 වැනි පිටුව).

මේ අනුව බලන කල ප්‍රධාන බෙදීම ජර්මනියේ බෙදීමට සමාන වන්නේය. අසමථකම් ඉස්මතුවන ආකාරයන් (ජර්මනියේ එම ආකාරයන්, බ්‍රිතාන්‍යයේ ආකාරයන්ට වඩා බෙහෙවින් රුසියාවේ මෙනි) සහ වෙනත් කරුණු ගණනක් අතින් අතිශය වෙනස් කම් ඇතත්, බෙදීම එකසේ සමාන වේ. දැන් ''වාම'' වාදීන්ගේ තර්ක ගැන විමසා බලමු.

පාර්ලිමේන්තුවට සහභාගිවීම පිළිබඳ ප්‍රශ්නය ගැන ග්ලස්ගොව්හි ස්කොට්ලන්ත කම්කරු මණ්ඩලයේ නමින් විලියම් ගැලකර් සහෝදරයා එම පත්‍රයේම ලියා ඇති ලිපියක් ගැන සිල්වියා පැංක්හර්ස්ට් ඇගේ ඉහත සඳහන් ලිපියෙහිම සඳහන් කරන්නීය.

ඔහු මෙසේ ලියා ඇත:

> ''ඉහත සඳහන් මණ්ඩලය නිශ්චිත වශයෙන් පාර්ලිමේන්තුවාදයට විරුද්ධය. එහිදී විවිධ දේශපාලන සංවිධානවල වාමාංශයන්ගේ සහයෝගය එයට ලැබන්නේය. අපි ස්කොට්ලන්තයේ විප්ලවවාදී ව්‍යාපාරය නියෝජනය කරන්නෙමු. අපි කර්මාන්ත තුළ (කර්මාන්තයේ විවිධ අංශ තුළ) විප්ලවවාදී සංවිධානයක් සහ රට මුළුල්ලේම පවතින සමාජ කාරක සභා පදනම් කරගත් කොමියුනිස්ට් පක්ෂයක් පිහිටුවීමට උත්සාහ කරමින් සිටින්නෙමු. දැනට සෑහෙන කාලයක් තිස්සේ අපි නිල පාර්ලිමේන්තුවාදීන් සමග පොර අල්ලමින් සිටියෙමු. ඔවුන්ට විරුද්ධව විවෘත යුද්ධයක් ප්‍රකාශ කිරීම අවශ්‍යයයි අපි නොසිතුවෙමු. එසේම අපට විරුද්ධව ප්‍රහාරයක් ඇරඹීමට ද ඔවුහු බිය වෙති.
>
> ''නමුත් මෙම තත්වය දීර්ඝ කාලයක් තිස්සේ පැවතිය නොහැකිය. අපි පෙරමුණ මුළුල්ලේම ජයග්‍රහණය කරමින් සිටින්නෙමු.
>
> ''ස්කොට්ලන්තයේ ස්වාධීන කම්කරු පක්ෂ සාමාජිකත්වයට පාර්ලිමේන්තුව පිළිබඳ අදහස එන්න එන්නම එපාවන තත්වයක් ඇත. එහි සෑම ප්‍රාදේශීය ශාඛාවකම පාහේ සහයෝගය සෝවියට් සභා (රුසියානු වචනය ඉංග්‍රිසි බසට ඇතුලත් කර යොද තිබේ) නැතහොත් කම්කරු මණ්ඩලවලට ලැබෙන්නේය. දේශපාලනය වෘත්තියක් කොටගත් අයට නම් මෙය බරපතල ප්‍රශ්නයකි. එනිසා ආපසු පාර්ලිමේන්තුවාදී කොටුවට එන ලෙස ස්වකීය සාමාජිකයන් පෙළඹවීම සඳහා, ඔවුහු ඕනෑම සහ සෑම මාධ්‍යයක්ම යොද ගනිති. විප්ලවවාදී සහෝදරවරු මෙම කල්ලියට කිසිම සහයෝගයක් නොදැක්විය යුතුය. (සෑම තැනෙකම අවධාරණය කතුවරයාගේය.) මෙහි දී අපට දුෂ්කර සටනක් කරන්නට සිදුවන්නේය. එහි ඉතාමත් අශෝභන අංගලක්ෂණවලින් එකක් වනු ඇත්තේ, විප්ලවයට දක්වන සැලකිල්ලට වඩා ආත්මාර්ථකාමී පෞද්ගලික අභිලාෂයට මුල්තැන දෙන අයගේ ද්‍රෝහිකම්ය. පාර්ලිමේන්තුවාදයට දෙන ඕනෑම ආධාරයක්, ඉඳුරාම අපගේ බ්‍රිතාන්‍ය ෂයිඩමාන්ලා සහ නොස්කෙ ලා බලයට පත් කිරීමට කරන ආධාරයක් වන්නේය. හෙන්ඩර්සන්, ක්ලයින්ස් සහ සමාගම සම්පූර්ණයෙන්ම ප්‍රතිගාමීය. නිල ස්වාධීන කම්කරු පක්ෂය එන්න එන්නම මධ්‍යම පංතික ලිබරල්වරුන්ගේ, එනම්, මැක්ඩොනල්ඩ්, ස්නෝඩන් සහ සමාගමේ කඳවුර ස්වකීය ''අධ්‍යාත්මික නිවහන'' කරගත් ලිබරල්වාදීන්ගේ පාලනය යටතට පත්වෙමින් තිබේ. නිල ස්වා. ක. ප. තුන්වැනි ජාත්‍යන්තරයට තදින්ම විරුද්ධය. නමුත් එහි සාමාජිකත්වය එම ජාත්‍යන්තරයට පක්ෂ වෙති. පාර්ලිමේන්තුවාදී අවස්ථාවාදීන්ට දෙන ඕනෑම සහයෝගයක් හුදෙක්ම නිල ස්වා. ක. පක්ෂයේ උගුලට හසු වීමක් වන්නේය. බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය මෙහි දී කිසිසේත් වැදගත් වන්නේ නැත... මෙහි අවශ්‍යව සුබෙන්නේ ශක්තිමත් විප්ලවවාදී කාර්මික සංවිධානයක් සහ පැහැදිලි, මනාව නිර්ණය කළ හා විද්‍යාත්මක ක්‍රියාමාර්ගයක් අනුව කටයුතු කරන කොමියුනිස්ට් පක්ෂයකි. මේවා ගොඩනැගීම සඳහා අපට ආධාර දීමට අපගේ සහෝදරවරුන්ට හැකි නම් අපි සතුටින් එම ආධාරය පිළිගනිමු. ඔවුන්ට එසේ කළ නොහැකිනම්, ප්‍රතිගාමීන්ට ඔවුන්ගේ සහයෝගය දැක්වීමෙන් විප්ලවයට ද්‍රෝහිකම් නොකර පැත්තකට

* මා කල්පනා කරන හැටියට මෙම පක්ෂය විරුද්ධවූයේ කම්කරු පක්ෂයට ඒකාබද්ධ වීම ගැනය. නමුත් එහි සාමාජිකයන් සියළු දෙනාම පාර්ලිමේන්තුවට සහභාගි වීම ගැන විරුද්ධ නොවූයේ යයි සිතමි.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

> වී සිටින ලෙස දෙවියන්ගේ නාමයෙන් ඔවුන්ට කියමු. ප්‍රතිගාමීහු පාර්ලිමේන්තු 'නම්බුනාම' (?) (ප්‍රශ්න ලකුණ කතුවරයාගේ ය) ලබා ගැනීමට පොර කමින් සිටිති. "ලොක්කන්ගේ" පංතියේ දේශපාලනඥයන්ට මෙන්ම, තමන්ටද සාර්ථක ලෙස පාලනය කළ හැකි බව පෙන්වීම ඔවුන්ගේ ආශාව වී තිබේ."

තරුණ කොමියුනිස්ට් වාදීන්ගේ සහ කොමියුනිස්ට්වාදය පිළිගැනීමට දූන් දූන් යොමු වන සාමාන්‍ය කම්කරුවන්ගේ උද්‍යෝගය සහ අදහස, කතෘ වෙත ලියන ලද මෙම ලිපියෙන් මනාව ප්‍රකාශ වන්නේය යනු මගේ අදහසයි. මෙම උද්‍යෝගය ඉතාමත් ප්‍රසාද ජනකය. අගනේය. එය අගේ කිරීමට සහ එයට අනුබල දීමට අපි උගත යුත්තෙමු. එය නොමැතිව බ්‍රිතාන්‍යයේ, ඒ තබා වෙනත් මොනම හෝ රටක, නිර්ධන පංති විප්ලවයේ ජයග්‍රහණය අපේක්ෂා කිරීම නිෂ්ඵල වේ. පොදු ජනතාවගේ මෙම උද්‍යෝගය (එය බොහෝ විට අකර්මණ්‍යව, අවිඥතව සහ සැඟවී පවතී) එළි දැක්වීමට සමත් සහ ජනතාව අතර එවැනි උද්‍යෝගයක් පණ ගැන්වීමට සමත් අය ගැන අගේ කළ යුතු අතර ඔවුන්ට සෑම ආධාරයක්ම දිය යුතුය. නමුත්, මානසික තත්වයක්, තනිකර එය පමණක් ගත් විට, මහා විප්ලවීය අරගලයකදී පොදු ජනතාවන්ට නායකත්වය දීම සඳහා එය ප්‍රමාණවත් නොවන බවත්, විප්ලවයේ සද්ව්‍යාපාරයට සම්පූර්ණයෙන්ම කැපවී සිටින සමහර අය කිරීමට යන, නැතහොත්, කරමින් සිටින සමහර වැරදි නිසා විප්ලවයට හානි සිදුවීමට හොඳටම ඉඩ තිබෙන බවත්, අපි කරුණු නොසඟවාම ඔවුන්ට කිව යුත්තෙමු. ජර්මන් "වාම" කොමියුනිස්ට්වාදීන් කරන සහ 1908 දී හා 1918 දී රුසියානු "වාම" බොල්ෂෙවික්වාදීන් කළ වැරදි සියල්ලෙහිම බීජාංකුර ගැලකර් සහෝදරයාගේ ලිපියෙහි දක්නට ලැබෙන බවට සැකයක් නැත.

ලේඛකයා ධනපති "පංති දේශපාලනඥයන්" කෙරෙහි දක්වන උත්තම සහ කම්කරු පංති වෛරයෙන් පිරී සිටී. (එසේ වුවද, නිර්ධන පංතිකයෝ පමණක් නොව, ජර්මන් යෙදුමක් ගනිතොත් Kleinen Leuten* ද මෙම වෛරය වටහා ගනිති. එයට කොටස් කරුවෝ වෙති). පීඩිත සහ සූරාකනු ලබන පොදු ජනතාවගේ නියෝජිතයෙකු තුළ වන මෙම වෛරය "සියලු නුවණට මූලය". ඕනෑම සමාජවාදී සහ කොමියුනිස්ට් වාදී ව්‍යාපාරයකත්, එහි සාර්ථකත්වයෙහිත්, පදනම වන්නේ මෙම වෛරයයි. එසේ වුවද, දේශපාලනය යනු අහසින් නොවැටෙන නැතහොත් පිණට නොලැබෙන විද්‍යාවක් බවත්, ධනපති පංතිය පරාජය කර ජය ගැනීමට නිර්ධන පංතියට උවමනාවක් තිබේ නම්, එය ධනපති දේශපාලනඥයන්ට වඩා කිසිසේත් දුර්වල නොවන තමන්ගේම නිර්ධන "පංති දේශපාලනඥයන්" පුහුණු කරගත යුතු බවත්, ලේඛකයාට අමතක වී තිබේ.

නිර්ධන පංතියට එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා උපකරණය වශයෙන් ප්‍රයෝජනවත් විය හැක්කේ පාර්ලිමේන්තුව නොව කම්කරුවන්ගේ සෝවියට් සභා පමණක් බව ලිපියෙහි කතුවරයාට මනාව පැහැදිලි වී තිබේ. මෙය වටහා ගෙන නැති අය නම් මුළුමනින්ම ප්‍රතිගාමීන් වෙති. ඔවුන්, ඉතාමත් උසස් අධ්‍යාපනයක් ලැබූ අය වුවත්, විශාල පළපුරුද්දක් ඇති දේශපාලනඥයන් වුවත්, ඉතාමත් විශාරද මාක්ස්වාදීන් වුවත්, එසේම ඉතාමත් අවංක පුරවැසියන් සහ පවුල්වල පීතෘවරුන් වුවත්, එහි වෙනසක් නොවේ. නමුත්, සෝවියට් පාක්ෂික දේශපාලනඥයන් පාර්ලිමේන්තුවට ඇතුල් කරන්නේ නැතිව, පාර්ලිමේන්තුව අභ්‍යන්තරයෙන් එය දුර්වල කරන්නේ නැතිව, අනාගතයේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ සෝවියට් කර්තව්‍යය සාර්ථක කිරීමට පාර්ලිමේන්තුව තුළින් කටයුතු නොකර, පාර්ලිමේන්තුව පරදවා සෝවියට් සභාවල ජයග්‍රහණයක් උද කළහැකිද යන ප්‍රශ්නය ඇසීමටවත් ලිපියේ කතුවරයා යොමු නොවේ. එම ප්‍රශ්නය ඇසිය යුතුයයි ඔහුට මතක්වන්නේ නැත. කෙසේ හෝ වේවා, මහා බ්‍රිතාන්‍යයේ කොමියුනිස්ට් පක්ෂය විද්‍යාත්මක ප්‍රතිපත්ති අනුව වැඩ කළ යුතුය යන සම්පූර්ණයෙන්ම නිවැරදි මතය, එම කතුවරයා විසින් ප්‍රකාශ කරනු ලැබේ. විද්‍යානුකූල වීම සඳහා ප්‍රථමයෙන්ම වෙනත් රටවල අත් දැකීම සැලකිල්ලට ගත යුතුවේ. මෙම වෙනත් රටවල්ද, ධනපති රටවල් වන අතර, මුලින් සඳහන් රටට බොහෝ දුරට සමාන අත් දැකීම් ලබමින් සිටී නම්, නැතහොත්, මෑතදී එවැනි අත් දැකීම් ලබා සිටීනම්, විශේෂයෙන් එම අත් දැකීම් සැලකිල්ලට ගත යුතුවේ. විද්‍යානුකූල වීම සඳහා, දෙවැනිව, කිසියම් රටක ක්‍රියාත්මක වන බලවේග, කණ්ඩායම්, පංති සහ පොදුජන කොටස් සියල්ලම ගැන සැලකිල්ලට ගැනීමත්, එක කණ්ඩායමක, නැතහොත්, පක්ෂයක පමණක් කැමැත්ත හා අදහස්ද, පංති විඥන මට්ටම හා සටන් කාමිත්වයද, පදනම් කරගෙන ප්‍රතිපත්තිය තීරණය නොකිරීමත්, අවශ්‍යවේ.

හෙන්ඩර්සන්ලා, ක්ලයින්ස්ලා, මැක්ඩොනල්ඩ්ලා සහ ස්නෝඩන්ලා සම්පූර්ණයෙන්ම ප්‍රතිගාමී බව සැබවි. ඔවුන්ට බලය අත්පත් කර ගැනීමට උවමනා වී තිබෙන බවත් (එහෙත් ධනපති පංතිය සමග සභාගයකට ඔවුන් වැඩියෙන් කැමතිය), පරණ ධනපති ක්‍රියාමාර්ගය අනුවම "පාලනය" කිරීමට ඔවුන්ට උවමනා වී තිබෙන බවත්, ඔවුන් බලයට පත්වූ කල ඔවුන් නිසැක වශයෙන්ම හැසිරෙනු ඇත්තේ ෂයිඩමාන්ලා සහ නොස්කෙ ලා මෙන්ම බවත්, එසේම සැබවි. ඒ සියල්ලම සත්‍යය. නමුත්,

* "අවශේෂ ජනයා, පොඩි මිනිස්සු" (ජර්මන්) — සංස්කාරක

https://liberationbase.wordpress.com

ඔවුන්ට ආධාර කිරීම විප්ලවයට ද්‍රෝහී වීමක් බව එයින් කිසිසේත් නිගමනය නොවන්නේය. නමුත්, එයින් නිගමනය වන්නේ, විප්ලවයේ යහපත පිණිස, කම්කරු පංති විප්ලවවාදීන් මෙම මහත්වරුන්ට එක්තරා ප්‍රමාණයක පාර්ලිමේන්තු සහයෝගයක් දක්විය යුතු බවය. මෙම අදහස විස්තර කිරීමට සමකාලීන බ්‍රිතාන්‍ය දේශපාලන ලියවිලි දෙකක් උපයෝගී කර ගනු කැමැත්තෙමි: (1) අගමැති ලොයිඩ් ජෝජ් විසින් 1920 මාර්තු 18 දින කරන ලද කථාව (1920 මාර්තු 19 දින මැන්චෙස්ටර් ගාඩියන්[73] පත්‍රයේ පළවූ පරිදි) හා (2) ඉහත සඳහන් ලිපියෙන්, "වාම" කොමියුනිස්ට්වාදියෙක් වන සිල්වියා පැංක්හර්ස්ට් ඉදිරිපත් කර තිබෙන තර්ක.

ලොයිඩ් ජෝජ් ඔහුගේ කථාවේදී ඇස්ක්විත් (එම රැස්වීමට සහභාගි වන ලෙස විශේෂ ආරාධනයක් කරන ලද නමුත් ඔහු එයට පැමිණීම ප්‍රතික්ෂේප කළේය) එරෙහිව හා කොන්සර්වටිව් පාක්ෂිකයන් සමග සහාගයක් නොව කම්කරු පක්ෂය සමග වඩා කිට්ටු සම්බන්ධකම් ඇති කර ගැනීමට අපේක්ෂා කරන ලිබරල්වාදීන් එරෙහිව විවාදයකට එළඹියේය. (ලිබරල්වාදීන් ස්වාධීන කම්කරු පක්ෂයට සම්බන්ධ වන බව ගැලකර් සහෝදරයාද ඉහත සඳහන් ලිපියෙන් පෙන්වා දෙයි.) ලිබරල්වරුන් සහ කොන්සර්වටිව් පාක්ෂිකයන් අතර සහාගයක් පමණක් නොව සමීප සභාගයක් අවශ්‍ය යයි ලොයිඩ් ජෝජ් තර්ක කළේය. නො එසේ නම්, "සමාජවාදී" යනුවෙන් විස්තර කිරීමට ලොයිඩ් ජෝජ් රුචි වන සහ නිෂ්පාදන මාධ්‍යයන්ගේ "පොදු අයිතිය" සඳහා කටයුතු කරන කම්කරු පක්ෂය බලයට පැමිණෙනු ඇතැයි ඔහු ප්‍රකාශ කළේය. "ප්‍රංශයේ එය... කොමියුනිස්ට්වාදය යනුවෙන් හැඳින්වෙන්නේ" යයි බ්‍රිතාන්‍ය ධනපතියන්ගේ නායකයා කීයේය. ඔහු එය ඔහුගේ රැස්වීමේ සිටි ලිබරල් මන්ත්‍රීවරුන්ට වැටහෙන බසින් කීවේ එපරිද්දෙනි. එම ලිබරල් මන්ත්‍රීවරු සමහර විට ඊට පෙර එම කරුණ නොදැන සිටින්නට ඇත. ජර්මනියේ එයට සමාජවාදය යයි කියන බවත්, රුසියාවේ එයට බොල්ෂෙවික්වාදය යයි කියන බවත් ඔහු තවදුරටත් කීවේය. ලිබරල්වාදීන් පෞද්ගලික දේපළට පක්ෂ ප්‍රතිපත්තියක් මත පිහිටා සිටින නිසා, ඔවුන්ට මෙය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත නොහැකි යයි ලොයිඩ් ජෝජ් පැහැදිලි කළේය. "ශිෂ්ටාචාරය අන්තරායට ලක්ව තිබේ". එනිසා ලිබරල්වාදීන් සහ කොන්සර්වටිව් පාක්ෂිකයන් එක්සත් විය යුතු යයි කථිකයා ප්‍රකාශ කළේය...

"...ඔබ කෘෂිකාර්මික පෙදෙස්වලට ගියහොත්, එහි පැරණි පක්ෂ භේද ඉතාමත් ශක්තිමත්ව පවතින බව ඔබට පෙනෙනු ඇතැයි මම පිළිගනිමි. ඔවුහු අන්තරායෙන් ඈත්ව සිටිති. අන්තරාය ඔවුන්ගේ පෙදෙස්වලට පැතිර ගොස් නැත. නමුත් ඔවුන්ට එය පෙනෙන විට ඔවුන්ද, දැන් මෙම කාර්මික කොට්ඨාශ සමහරක් මෙන්ම බලවත් ලෙස ඊට විරුද්ධ වනු ඇත. මේ රටෙන් පහෙන් හතර පංගුවක්ම කාර්මික හා වාණිජ පෙදෙස්ය. කෘෂිකාර්මික ප්‍රදේශ පහෙන් එකටත් අඩු තරම්ය. මෙහි ඇතිවන අනාගත අනතුරු ගැන කල්පනා කරන විට මා නිතරම සිත්හි දරාගන්නා කරුණුවලින් එකක් එයයි. ප්‍රංශයේ ජනගහනය කෘෂිකාර්මිකය. එනිසා එහි ඇත්තේ සීඝ්‍ර චලනතාවයකින් තොර හා විප්ලවවාදී ව්‍යාපාරවලින් පහසුවෙන් නොකැළඹෙන, දැඩි ගතියකින් යුත් ජනමතයයි. මෙහි තත්වය එය නොවේ. ලෝකයේ වෙනත් කිසිම රටකට වඩා මුදුන බර වූ තත්වයක් මෙරටෙහි ඇත. එනිසා මෙහි සෙලවීමක් ඇති වුවහොත්, ඒ හේතුව කරණකොට ගෙන ඇදවැටීම අන් කිසිම දේශයකට වඩා බරපතල වනු ඇත" යයි ලොයිඩ් ජෝජ් කීවේය.

ලොයිඩ් ජෝජ් ඉතාමත් බුද්ධිමත් පුද්ගලයෙක් පමණක් නොව, මාක්ස්වාදීන් ගෙන් බොහෝ දේ උගත ගත් අයෙක්ද වන බව පාඨකයාට මෙයින් පෙනෙනු ඇත. අපද, ලොයිඩ් ජෝජ්ගෙන් උගෙන ගත යුතු දෙයක් තිබේ.

ලොයිඩ් ජෝජ්ගේ කථාවෙන් පසුව ඇතිවූ සාකච්ඡාවේදී ප්‍රකාශ වුනු පහත සඳහන් අදහස් ගැන සැලකිල්ලට ගැනීම නිශ්චිත වශයෙන්ම වැදගත්ය:

"පාර්ලිමේන්තු මන්ත්‍රී, වොලස් මහතා: බොහෝ දෙනෙක් දැනට ලිබරල්වාදීන් වන සහ අපට බෙහෙවින් ආධාර දෙන කාර්මික කම්කරුවන් කෙරෙහි, කාර්මික ඡන්ද කොට්ඨාශ තුළ ඇතිවිය හැකි බලපෑම කුමක්ද යන්න ගැන අගමැතිතුමාගේ අදහස දැන ගනු කැමැත්තෙමි. දැනට අපගේ හිතවත් ආධාරකරුවන් වන මිනිසුන්ගෙන් කම්කරු පක්ෂයට ඇති විශාල සහයෝගයක් ලැබීමෙන් එම පක්ෂය එක් වරම ශක්තිමත්වීම එක් ප්‍රතිඵලයක් විය නොහැකිද?

"අගමැති: මා දරන්නේ ඊට ඉඳුරාම වෙනස් අදහසකි. ලිබරල්වාදීන් ඔවුනොවුන් අතර රණ්ඩු කර ගැනීම නිසා සුන්වූ බලාපොරොත්තු ඇති ලිබරල්වාදීන් විශාල සංඛ්‍යාවක් කම්කරු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පක්ෂය වෙත යති. එම පක්ෂය තුළ ලිබරල්වාදීන් සෑහෙන පිරිසක් ඇත. ඔවුහු ඉතා දක්ෂ පුද්ගලයෝ වෙති. ඔවුන්ගේ ප්‍රධාන කාර්යය වී තිබෙන්නේ ආණ්ඩුව කෙරෙහි අප්‍රසාදයක් ඇති කිරීමය. මෙහි ප්‍රතිඵලය වන්නේ කම්කරු පක්ෂයට හිතවත් මහජන හැඟීමක් විශාල වශයෙන් ඇති වීමය. එම මහජන හැඟීම පිටත සිටින ලිබරල්වාදීන් වෙත නොව කම්කරු පක්ෂය වෙත නැඹුරු වූවකි. අතුරු මැතිවරණවලින් ඒ බව පෙනේ.''

ධනපති පංතියේ ඉතාමත් බුද්ධිමත් සාමාජිකයෝ පවා කොතරම් අවුල් කල්පනා සහිතව සහ මකාලිය නොහැකි මෝඩකම් කිරීමෙන් වැළකීමට අපොහොසත්ව සිටිත්ද යනු, මෙම තර්කයෙන් පෙනෙන බව මෙහිලා අමතර වශයෙන් සඳහන් කරමු. ඇත්ත වශයෙන් ධනපති පංතිය ඇද වැටීමට එය හේතුවනු ඇත. අපේ මිනිස්සු අතින්ද මෝඩකම් සිදුවීමට ඉඩ තිබේ. නමුත් ඒවා ඉතා බරපතල නොවේ නම් හා කල්වේලා ඇතිව නිවරද කළහොත්) කල් යාමේදී ඔවුන් දිනනු ඇත.

දෙවැනි දේශපාලන ලියවිල්ල ''වාම'' කොමියුනිස්ට්වාදියෙක් වන සිල්වියා පැංක්හර්ස්ට් සහෝදරිය ඉදිරිපත් කළ පහත සඳහන් තර්කය යි:

''...ඉන්ක්පින් සහෝදරයා (බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම්) කම්කරු පක්ෂය ගැන සඳහන් කරන්නේ, එය 'කම්කරු පංති ව්‍යාපාරයේ ප්‍රධාන කොටස' ලෙස ගනිමිනි. තුන්වැනි ජාත්‍යන්තරයේ සම්මේලනයේදී බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ තවත් සාමාජිකයෙක් එම පක්ෂයේ ප්‍රතිෂ්ඨාව වඩාත් බලවත් ලෙස විස්තර කළේය. 'අපි කම්කරු පක්ෂය සංවිධානය වූ කම්කරු පංතිය ලෙස සලකන්නෙමු' යයි ඔහු කීවේය.

''කම්කරු පක්ෂය ගැන අප දරන්නේ මෙම අදහස නොවේ. කම්කරු පක්ෂයේ සමාජිකත්වය අක්‍රියාශීලී හා උදාසීන නමුත්, ස්වකීය වැඩ කණ්ඩායම්වල සගයන් වෘත්තීය සමිතිවාදීන් වන නිසා සහ මිත්‍රශීලී යහ සාධකයන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් එයට බැඳුනු ස්ත්‍රී පුරුෂයන්ගෙන් සමන්විත වූවක් නමුත්, එය සංඛ්‍යාවෙන් ඉතා විශාල පක්ෂයකි.

''නමුත් කම්කරු පක්ෂයේ විශාලත්වයට හේතු වී තිබෙන්නේ එය බ්‍රිතාන්‍ය කම්කරු පංතියට ඉක්ම යාගත නොහැකිව සිටින ගුරුකුලයක නිර්මානයක් වීමය. එහෙත්, ජනතාවගේ සිත්

සතන් තුළ විශාල වෙනස් කම් සිදුවෙමින් පවතින අතර, එනිසා පවත්නා තත්වය කල් නොයවාම වෙනස් වනු ඇත...

''බ්‍රිතාන්‍ය කම්කරු පංතිය ද, වෙනත් රටවල සමාජ-දේශප්‍රේමී සංවිධාන මෙන්, සමාජයේ ස්වාභාවික සංවර්ධනයේදී අනිවාරණීය වශයෙන්ම බලයට පත්වනු ඇත. සමාජ-දේශප්‍රේමීන් බලයෙන් පහ කර දමන බලවේග ගොඩනැගීම කොමියුනිස්ට් වාදීන්ට භාර කටයුත්තකි. එනිසා මේ රටේ අපි, එම කටයුත්ත ඉටු කිරීමේ දී අප්‍රමාදව සහ නොපැකිළී ක්‍රියා කළ යුත්තෙමු.

''කම්කරු පක්ෂයේ බලය වැඩි කිරීමෙන් අපි අපගේ ශක්තිය ක්ෂය නොකළ යුත්තෙමු. එය අනිවාරණීය වශයෙන්ම බලයට එනු ඇත. අප කළ යුත්තේ එය පරාජය කරන කොමියුනිස්ට් ව්‍යාපාරය සෑදීමට උනන්දු වීමය. කල් නොයවාම කම්කරු පක්ෂය ආණ්ඩුවක් පිහිටුවනු ඇත. විප්ලවවාදී විරුද්ධ පාර්ශවය එයට පහර දීමට සූදනම් විය යුතුය...''

ශතවර්ෂ ගණනක අත්දැකීමෙන් සම්භාවනීයත්වයට පත් සහ සූරා කන්නන්ට ඉතාමත් වාසි දයක වූ (සූරාකන්නන්ගේ) ඓතිහාසික ''ද්විපාක්ෂික'' ක්‍රමය අත්හැර දමන ලිබරල් ධනපතියෝ, කම්කරු පක්ෂයට විරුද්ධව මෙම පක්ෂ දෙක එක්සත් විය යුතු යයි සලකති. ගිලෙන නැවකින් ඉවතට පනින මීයන් මෙන්, ලිබරල්වාදීහු බොහෝ දෙනෙක් කම්කරු පක්ෂය අත්හැර යති. කම්කරු පක්ෂයට බලය අත් පත් වීම නොවැලැක්විය හැකි දෙයකැයි වාම කොමියුනිස්ට්වාදීහු සිතති. එසේම දැන් එයට කම්කරුවන්ගෙන් වැඩි පිරිසක සහයෝගය ලැබෙන බවද ඔවුහු පිළිගනිති. මෙම පසුබිම් කරුණු අනුව ඔවුන් බැසගන්නේ සිල්වියා පැංක්හර්ස්ට් සහෝදරිය පහත සඳහන් පරිදි යෙදූම්, ගත කරන පුදුම නිගමනයටය:

''කොමියුනිස්ට් පක්ෂය සම්මුතිවලට ඇතුලත් නොවිය යුතුය... කොමියුනිස්ට් පක්ෂය එහි ධර්මය පිරිසිදුව තබා ගත යුතුය. එය ප්‍රතිසංස්කරණවාදයෙන් කෙලෙසීමට පත්නොවී ඉන් නිදහස් බව රැකගත යුතුය. එයට පැවරී තිබෙන මෙහෙය වූ කලී, නවතින්නේ හෝ හැරෙන්නේ හෝ නැතිව කොමියුනිස්ට් විප්ලවය කරා යන ඍජු මාවත ඔස්සේ නායකත්වය දෙමින් ඉදිරියට යාමය.''

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බ්‍රිතාන්‍ය කම්කරුවන් තවමත් බ්‍රිතාන්‍ය කෙරෙන්ස්කිලාගේ, නැතහොත්, ෂයිඩමාන්ලාගේ නායකත්වය අනුගමනය කිරීම ද, ඔවුන් තවමත් මෙම පුද්ගලයන්ගෙන් සැදුනු ආණ්ඩුවක් අත්දැක නොතිබීමද, කම්කරුවන් කොමියුනිස්ට්වාදය දක්වා ඒමට සලස්වනු පිණිස රුසියාවේදී හා ජර්මනියේදී එම අත්දැකීම අවශ්‍ය දෙයක් වීමද අනුව, ඉහත සඳහන් නිගමනයට ප්‍රතිකූල වශයෙන්, ඒකාන්තවම පෙනී යන්නේ, බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් වාදීන් පාර්ලිමේන්තු සටනට සහභාගි විය යුතු බවත්, හෙන්ඩර්සන්ලාගේ සහ ස්නෝඩන්ලාගේ ආණ්ඩුවක් ව්‍යවහාරයෙන් ක්‍රියාත්මක වනු දැක ගැනීමට ඔවුන් කම්කරු පොදු ජනතාවන්ට ආධාර කළ යුතු බවත්, ලොයිඩ් ජෝජ්ගේ සහ චර්චිල්ගේ එක්සත් බලවේග පරාජය කිරීමට ඔවුන් හෙන්ඩර්සන්ලාට සහ ස්නෝඩන්ලාට ආධාර කළ යුතු බවත්ය. වෙනත් ආකාරයකට කටයුතු කිරීම යනු විප්ලවයේ යහපතට හරස් වීමකි. කම්කරු පංතියේ බහුතරයෙහි අදහස් වෙනස් වීමකින් තොරව විප්ලවය කිසිසේත් සිදුවිය නො හැකි නිසා ද, එම පොදු ජනතාවගේ දේශපාලන අත්දැකීමෙන් මිස තනිකරම ප්‍රචාරය මගින් කිසි කලෙකත් ඇති නො කළ හැකි නිසාද, එසේ වන්නේය. ''සම්මුති නැතිව, හැරෙන්නේ නැතිව, නායකත්වය දෙමින් ඉදිරියට යාම'' — මෙම සටන් පාඨය ඉදිරිපත් කරන්නේ, ලොයිඩ් ජෝජ් සහ චර්චිල් පරදවා හෙන්ඩර්සන් සහ ස්නෝඩන් ජයග්‍රහණය ලැබුවහොත්, බහුතරය ස්වකීය නායකයන් ගැන ඉක්මණින්ම කලකිරී කොමියුනිස්-ට්වරුන්ට ආධාර කිරීමට (නැතහොත්, කෙසේ හෝ කොමියුනිස්ට්වාදීන් කෙරෙහි මධ්‍යස්ථ ආකල්පයක් සහ ප්‍රධාන වශයෙන් අනුකූලතා පූර්වක මධ්‍යස්ථ ආකල්පයක් දැක්වීමට) පටන් ගනු ඇතැයි දන්නා (නැතහොත්, යටත්පිරිසෙයින් දැනගත යුතු), නිසැකසේ පෙනෙන බෙලහීනකම් ඇති කම්කරුවන් අල්පතරයක් නම්, එය වැරදි බව එක එල්ලේම පෙනේ. මෙම සටන්පාඨය වූ කලී 50,000 ක සතුරු හමුදවකට මුහුණු දෙන සොල්දදුවන් 10,000 ක හමුදවක්, තමන්ගේ ආධාරයට එමින් සිටින, එහෙත් වහාම සංග්‍රාමාවතීර්ණ විය නොහැකිව සිටින, 1,00,000 ක අතිරේක සේනා එන තෙක් ''නැවතීම'', ''මගහැරීමේ පියවර ගැනීම'' හා ''සම්මුති ඇතිකර ගැනීම'' පවා සුදුසු විටෙක, සටනට ඉදිරියට පැනීම හා සමාන වන්නකි. එය බුද්ධිවාදයේ ළදරු ක්‍රියාවක් මිස විප්ලවවාදී පංතියක් අනුගමනය කරන බරපතල උපක්‍රමයක් නොවේ.

සියළුම විප්ලවවලින් සහ විශේෂයෙන්ම විසිවැනි ශත වර්ෂයේ සිදු වූ රුසියානු විප්ලව තුනෙන්ම තහවුරු කරන ලද විප්ලවය පිළිබඳ මූලික නීතිය මෙසේය: සූරාකනු ලබන සහ පීඩිත ජනතාව තමන්ට පැරණි ක්‍රමයට ජීවත්විය නොහැකි බව අවබෝධ කර ගැනීම සහ වෙනස් කිරීම

ඉල්ලීම විප්ලවයක් සිදුවීම සඳහා ප්‍රමාණවත් නොවේ. විප්ලවයක් සිදුවීම සඳහා සූරාකන්නන්ට පැරණි ක්‍රමයෙන් ජීවත් වීමට සහ පාලනය කිරීමට නොහැකි තත්වයක් ඇතිවීම අත්‍යාවශ්‍යය. විප්ලවය විජයග්‍රහණයට පත්විය හැක්කේ ''පහළ පංතිවලට'' පැරණි ක්‍රමයෙන් ජීවත් වීම එපා වූ විට සහ ''ඉහළ පංතිවලට'' පැරණි ක්‍රමයෙන් කටයුතු කරගෙන යාමට බැරිව ගිය විට ය. මෙම සත්‍යය මෙම වචනවලින් ඉදිරිපත් කළ හැකිය: දේශ ව්‍යාප්ත (පීඩිත සහ පීඩක යන දෙකොටසටම බලපාන) අර්බුදයක් නොමැතිව විප්ලවය ඇති විය නොහැකිය. ඒ අනුව බලන කල විප්ලවයක් සිදුවීම සඳහා ප්‍රථමයෙන්ම, විප්ලවය අවශ්‍ය බවත්, ඒ සඳහා ජීවිතය දීමට තමන් සූදානම්ව සිටිය යුතු බවත්, කම්කරුවන්ගෙන් බහුතරයකට (නැතහොත් යටත් පිරිසෙයින් පංති විඥනය ඇති, කල්පනා කරන සහ දේශපාලන වශයෙන් ක්‍රියාශීලී කම්කරුවන්ගෙන් බහුතරයටවත්) මනාසේ අවබෝධ වී තිබිය යුතුය. දෙවැනිව, ඉතාමත් නොදියුණු පොදු ජනතා කොටස් පවා දේශපාලනයට අද්දන (මෙතෙක් උදාසීනව සිටි හා දේශපාලන අරගලයෙහි යෙදීමේ හැකියාව ඇති, වැඩ කරන සහ පීඩිත පොදු ජනයා සීඝ්‍රයෙන්, දස ගුණයෙන් හා සිය ගුණයෙන් පවා වැඩි වී යාම ඕනෑම සැබෑ විප්ලවයක ලක්ෂණයකි), ආණ්ඩුව දුර්වල කරන හා එය සීඝ්‍ර ලෙස පෙරළා දැමීමේ ඉඩ විප්ලවවාදීන්ට සලසන ආණ්ඩු අර්බුදයක පාලක පංති හසුවී සිටිය යුතුය.

තවද, ලොයිඩ් ජෝජගේ කථාවෙන් පෙනී යන පරිදි, සාර්ථක නිර්ධන පංති විප්ලවයක් සඳහා අවශ්‍ය කොන්දේසි දෙකම මහා බ්‍රිතාන්‍යය තුළ පැහැදිලි ලෙසම මෝරමින් පවතී. වාම කොමියුනිස්ට් වාදීන්ගේ වැරදි විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අනතුරුදායක වන්නේය. එසේ වන්නේ සමහර විප්ලවවාදීන් මෙම කොන්දේසි එක එක කෙරෙහි ප්‍රමාණවත් තරම් අවධාන සහිත, ප්‍රමාණවත් තරම් නැණවත් හා ප්‍රමාණවත් තරම් ශූර ආකල්පයක් නොදක්වන හෙයිනි. අපි විප්ලවවාදී පංතියේ පක්ෂය වෙමු නම්, හුදෙක් විප්ලවවාදී කණ්ඩායමක් පමණක් නොවෙමු නම්, අපි ජනතාවගේ අනුගාමිකත්වය අපේක්ෂා කරන්නෙමු නම් (අපි එය ලබා නො ගතහොත් පුහු කථා කාරයන් බවට පත් වීමේ අවදනමට ලක් වෙමු) අපි ප්‍රථමයෙන්ම ලොයිඩ් ජෝජ් සහ චර්චිල් පරාජය කිරීමට හෙන්ඩර්සන්ට හා ස්නෝඩන්ට ආධාර කළ යුත්තෙමු (නැතහොත්, පසුකී අය ස්වකීය ජයග්‍රහණය ගැන බිය වන නිසා (!) මුලින් කී අය පරාජය කරන සේ ඔවුන්ට බල කිරීමට ඔවුන්ට ආධාර දිය යුත්තෙමු). දෙවැනිව, අප කියන දේ නිවැරදි බව,නැතහොත්,හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩන්ලා කිසිම වැදගැම්මකට නැති, ස්වභාවයෙන් සුළු ධනපති හා ද්‍රෝහී පිරිසක් බව සහ ඔවුන් බංකොලොත් ලැබීම වැලැක්විය නොහැකි බව, කම්කරු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පංතියේ බහුතරයට ඔවුන්ගේම අත් දැකීමෙන් අවබෝධ කර ගත හැකි වනු පිණිස, අපි එම කම්කරුවන්ට ආධාර කළ යුත්තෙමු. තුන්වැනිව, හෙන්ඩර්සන්ලා කෙරෙහි වූ කම්කරුවන් බහුතරයෙහි කලකිරීම පදනම් කරගෙන, සාර්ථකත්වය ලැබීමේ බරපතල අපේක්ෂා ඇතිව හෙන්ඩර්සන්ලාගේ ආණ්ඩුව එක්වරම පෙරළා දැමීමට හැකිවන මොහොත ලඟා කිරීමට අපි කටයුතු කළ යුත්තෙමු. එසේ කියන්නේ, සුළු ධනපති පංතිය නොව, ලොකු ධනපති පංතිය නියෝජනය කරන ඒ බලවත් ලොයිඩ් ජෝර්ජ් අද චර්චිල් සමග සහ හෙට ඇස්ක්විත් සමග "ගැටීමෙන්" ඔහු බියෙනැලලී ගිය ස්වභාවයක් පෙන්වයි නම් හා තමා (සහ සමස්තයක් වශයෙන් ධනපති පංතිය) දුර්මුඛ වූ තත්වයක් පෙන්නුම් කරයි නම්, හෙන්ඩර්සන් ආණ්ඩුවකින් ඇතිවන භ්‍රාන්තය ඉමහත් බැවිනි!

එය වඩාත් නියත ලෙසින් මෙසේ කියමු. බ්‍රිතාන්‍ය කොමියුනිස්ට්වරුන්ගේ පක්ෂ හා කණ්ඩායම් හතර (ඒවා සියල්ලම දුර්වලය; සමහරක් ඉතාමත් දුර්වලය) එක්සත් වී, තුන්වැනි ජාත්‍යන්තරයේ ප්‍රතිපත්ති සහ පාර්ලිමේන්තුවට අවශ්‍යයෙන්ම සහභාගී වීම පදනම් කර ගත් එක කොමියුනිස්ට් පක්ෂයක් පිහිටුවිය යුතුය. කොමියුනිස්ට් පක්ෂය පහත සඳහන් පරිදි "සම්මුති" මැතිවරණ ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩ්න්ලා වෙත යෝජනා ඉදිරිපත් කළ යුතුය: ලොයිඩ් ජෝර්ජ් සහ කොන්සර්වටිව්වරු ඇතුළත් සන්ධානයට විරුද්ධව අපි ඒකාබද්ධව සටන් කරමු. කම්කරු පක්ෂයට සහ කොමියුනිස්ට් පක්ෂයට (මැතිවරණයේදී නොව විශේෂ ඡන්දයකින්) ලැබෙන කම්කරු ඡන්ද සංඛ්‍යාවල අනුපාතය අනුව ආසන බෙදගනිමු. එසේම, උද්ඝෝෂණය, ප්‍රචාරය හා දේශපාලන කටයුතු සඳහා සම්පූර්ණ නිදහස තබා ගනිමු. මෙම අවසානයට සඳහන් කොන්දේසිය නොමැතිව නම් පෙරමුණක් ඇති කිරීමට අපට එකඟ විය නොහැකිය. එය නොමැතිව පෙරමුණක් සෑදීම ද්‍රෝහී කමක් වනු ඇත. රුසියානු හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩ්න්ලා, එනම්, මෙන්ෂෙවික්වරුන් ගැන හෙළිදරව් කිරීමේ නිදහස (1903–1917, පසළොස් අවුරුද්දක් තිස්සේ) ඉල්ලා ලබාගත් රුසියානු බොල්ෂෙවික්වරු මෙන්, බ්‍රිතාන්‍ය කොමියුනිස්ට්වරුද, හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩ්න්ලා ගැන හෙළිදරව් කිරීමේ සම්පූර්ණ නිදහස ඉල්ලා ලබා ගත යුතුය.

මෙම කොන්දේසි අනුව පෙරමුණකට ඒමට හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩ්න්ලා එකඟ වුවහොත් එය අපේ වාසියට හේතු වනු ඇත. එසේ වන්නේ පාර්ලිමේන්තු ආසන ගණන අපට වැදගත් නිසා නොවේ. අපි ආසන ගිජු කමෙන් නොපෙළෙන්නෙමු. මෙම කරුණෙහි දී අවාසි ගැනීමට අපි එකඟ වෙමු. (ඒ අතර, හෙන්ඩර්සන්ලා සහ විශේෂයෙන්ම, ස්වාධීන කම්කරු පක්ෂයට බැඳී සිටින ලිබරල්වාදීන් වන ඔවුන්ගේ නව මිතුරෝ, නැතහොත්, නව ස්වාමිවරු ආසන ලබා ගැනීමට බොහෝ ගිජු වෙති). අපට වාසි ගත හැකි වනු ඇත්තේ ලොයිඩ් ජෝර්ජ්ම පොදු ජනතාව "කුපිත" කර තිබෙන අවස්ථාවක අප ඔවුන් අතර උද්ඝෝෂණය කරගෙන යන හෙයිනි. එසේ කිරීමෙන්, අපි කම්කරු පක්ෂයට එහි ආණ්ඩුව වඩාත් ඉක්මණින් පිහිටුවා ගැනීමට පමණක් නොව, අප කිසිම අඩුවක් හෝ අතපසු කිරීමක් නොමැතිව හෙන්ඩර්සන්ලාට විරුද්ධව ගෙන යන කොමියුනිස්ට් ප්‍රචාරය වඩාත් ඉක්මණින් වටහා ගැනීමට පොදු ජනතාවටද ආධාර කරන හෙයිනි.

මෙම කොන්දේසි අනුව අප සමග පෙරමුණක් ඇති කර ගැනීම හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩ්න්ලා ප්‍රතික්ෂේප කරති නම්, එය ඊටත් වඩා අපේ වාසියට හේතු වනු ඇත. එසේ වන්නේ, කම්කරුවන් සමග සමගියට වඩා, හෙන්ඩර්සන්ලා ධනපතියන් සමග පවත්වන ඔවුන්ගේ සමීප සම්බන්ධකම් අගය කරන බව අප විසින් පොදු ජනතාවට පෙන්වා දෙන ලද තත්වයක් එයින් ඇතිවන බැවිනි (තනිකරම මෙන්ෂෙවික් පක්ෂයක් සහ සම්පූර්ණයෙන්ම අවස්ථාවාදී වූ ස්වාධීන කම්කරු පක්ෂයේ පවා සාමාන්‍ය සාමාජිකත්වය සෝවියට් සභාවලට පක්ෂ බව සටහන් කරගන්න). විශේෂයෙන්ම ලොයිඩ් ජෝර්ජ්ගේ විචක්ෂණ, ඉතාමත් නිවැරදි හා (කොමියුනිස්ට්වරුන්ට) ඉතාමත් ප්‍රයෝජනවත් පැහැදිලි කිරීමෙන් පසුව, ලොයිඩ් ජොජ් — කොන්සර්වටිව් සන්ධානයට විරුද්ධව සියලුම කම්කරුවන් එක්සත් කිරීමේ අදහසට පොදුජනයා අනුකූලතාවයක් දක්වනු ඇති හෙයින් ඔවුන් අතර අපගේ තත්වය ක්ෂණික වශයෙන් වාසිදයක අතට හැරෙන්නේය. හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩ්න්ලා නම්, ලොයිඩ් ජෝජ් පරාජය කිරීමට බිය වන බවද, ඔවුන් තනිවම බලයට පත්වීමට බිය වන බවද, කම්කරු පක්ෂයට විරුද්ධව, විවෘත ලෙසම, කොන්සර්වටිව්වරුන් වෙත හස්තයක් දිගු කරන ලොයිඩ් ජෝජ්ගේ රහස් සහයෝගය ලබා ගැනීමට ඔවුන් ප්‍රයත්න දරන බවද, අප විසින් පොදු ජනතාවට පෙන්වා දුන් තත්වයක් එවිට ඇති වන හෙයින්, එයින් අප්‍රමාදවම අපට වාසි සැලසෙනු ඇත. රුසියාවේ 1917 පෙබරවාරි 27 දින (පරණ දින දර්ශනය අනුව) විප්ලවයෙන් පසුව මෙන්ෂෙවික්වරුන්ට සහ සමාජවාදී-විප්ලවවාදීන්ට (එනම්, රුසියානු හෙන්ඩර්සන්ලාට සහ ස්නෝඩ්න්ලාට) විරුද්ධ බොල්ෂෙවික්වරුන් ගෙන ගිය ප්‍රචාරයෙන් ප්‍රයෝජන ලබා ගත්තේ ඉදුරාම මෙවැනි තත්වයක් යටතේය. අපි මෙන්ෂෙවික්වරුන්ට සහ සමාජවාදී-විප්ලවවාදීන්ට මෙසේ කීවෙමු: නුඹලාට සෝවියට් සභාවල බහුතරයක් තිබෙන නිසා (1917 ජූනි මස පැවැත්වුනු ප්‍රථම සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයේදී

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

බොල්ෂෙවික්වරුන්ට තිබුණේ ඡන්ද වලින් සියයට 13 ක් පමණකි) සම්පූර්ණ බලය ගනිල්ලා. නමුත් රුසියානු හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩන්ලා ධනපති පංතිය නොමැතිව බලය ගැනීමට බිය වූහ. ඒ අතර ධනපතියෝ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයට තෝරා පත් කිරීම් සඳහා මැතිවරණ පැවැත්වීම ප්‍රමාද කළහ. ධනපතියන් එම මැතිවරණ ප්‍රමාද කළේ, (සමීප ලෙස දේශපාලන පෙරමුණකින් එක්ව සිටි හා ඇත්ත වශයෙන්ම සුළු ධනපති ප්‍රජාතන්ත්‍රයම නියෝජනය කළ) සමාජවාදී -විප්ලවවාදීන්ට හා මෙන්ෂෙවික්වරුන්ට එයින් බහුතරයක් ලැබෙනු ඇති බව* ඔවුහු හොඳින් දැන සිටි හෙයිනි. මෙම ප්‍රමාදයන්ට විරුද්ධව බලවත් ලෙස හා සසංගත ලෙස ක්‍රියාත්මක වීමට සමාජවාදී-විප්ලවවාදීහු සහ මෙන්ෂෙවික්වරු අපොහොසත් වූහ.

හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩන්ලා කොමියුනිස්ට්වරුන් සමග පෙරමුණක් ඇති කර ගැනීම ප්‍රතික්ෂේප කළ හොත්, කොමියුනිස්ට්වරු ජනතාවගේ අනුකූලතාවය දිනා ගැනීමෙන් හා හෙන්ඩර්සන්ලා සහ ස්නෝඩන්ලා අප්‍රසාදයට පත් කිරීමෙන් අප්‍රමාදව වාසියක් අත් කර ගනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපට පාර්ලිමේන්තු ආසන කීපයක් නැතිව ගියත්, එය අපට වැදගත් කරුණක් නොවේ. අපි අපේක්ෂකයන් ඉතා ස්වල්ප ගණනක් ඉදිරිපත් කරන්නෙමු. ඒ සඳහා අපි සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කොට්ඨාශ, එනම්, කම්කරු පක්ෂ අපේක්ෂකයින් පරදවා ලිබරල් අපේක්ෂකයනට ජයග්‍රහණය අත්පත් වීමක් සිදු නොවන කොට්ඨාශ තෝරා ගන්නෙමු. අපි මැතිවරණ ව්‍යාපාරයට සහභාගි වන්නෙමු. කොමියුනිස්ට්වාදයට පක්ෂව උද්ඝෝෂණය කරමින් පත්‍රිකා බෙදා හරින්නෙමු. තවද අපගේ අපේක්ෂකයන් නොමැති කොට්ඨාශවල ධනපති අපේක්ෂකයන්ට විරුද්ධව කම්කරු පක්ෂ අපේක්ෂකයන්ට ඡන්දය දෙන ලෙස ඡන්දදායකයන්ට ආයාචනා කරන්නෙමු. මෙසේ කිරීම කොමියුනිස්ට්වාදයට ද්‍රෝහි වීමක්ය, නැතහොත්, සමාජ-ද්‍රෝහීන්ට විරුද්ධව කරන අරගලය අත් හැරීමක්ය යනුවෙන් සිල්වියා පැංක්හර්ස්ට් සහෝදරිය සහ ගැලකර් සහෝදරයා දරන අදහස වැරදිය. ඊට ප්‍රතිකූල

* රුසියාවේ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය සඳහා 1917 නොවැම්බරයේදී පැවැත්වුනු මැතිවරණයේදී ලැබුණු ඡන්ද 3,60,00,000 කට අදාළ වාර්තා අනුව ප්‍රතිඵල මෙසේ විය. බොල්ෂෙවික්වරු ඡන්ද සියයට 25 ක් ලබා ගත්හ. ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ විවිධ පක්ෂ ඡන්ද සියයට 13 ක් ලබාගත්හ. සුළු ධනපති පක්ෂ, එනම්, සමාජවාදී-විප්ලවවාදීහු, මෙන්ෂෙවික් වරු හා වෙනත් කුඩා කණ්ඩායම් කීපයක් එකතුව ඡන්ද සියයට 62 ක් ලබා ගත්හ.

වශයෙන් කොමියුනිස්ට් විප්ලවයේ සද්ව්‍යාපාරයට එයින් වාසියක් සැලසෙනු ඇත.

දැනට පොදු ජනතාව වෙත සමීප වීම පවා, තමන් කියන දෙයක් වෙත ඔවුන්ගේ සවන් යොමු කරවා ගැනීම පවා, කොමියුනිස්ට්වරුන්ට දුෂ්කර දෙයක් වී තිබේ. නමුත් මා කොමියුනිස්ට්වාදියෙකු ලෙසට ඉදිරිපත්ව, ලොයිඩ් ජෝජ්ට විරුද්ධව, හෙන්ඩර්සන්ට ඡන්දය දෙන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියහොත්, ඔවුන් නිසැක වශයෙන්ම මට කන් දෙනු ඇත. එවිට, පාර්ලිමේන්තුවට වඩා සෝවියට් සභා හොඳ මන්ද යනුත්, (ධනපති ''ප්‍රජාතන්ත්‍රවාදය'' නැමති සංඥා පුවරුවෙන් වෙස් මාරුවක් දී තිබෙන) චර්චිල්ගේ ආඥාදායකත්වයට වඩා නිර්ධන පංති ආඥාදායකත්වය හොඳ මන්ද යනුත් පමණක් නොව, මා මගේ ඡන්දයෙන් හෙන්ඩර්සන්ට ආධාර කිරීමට අපේක්ෂා කරන්නේ, එල්ලෙන මිනිසාට කඹය ආධාර වන ආකාරයෙන් බවත්, ළඟදී ඇතිවන හෙන්ඩර්සන්ලාගේ ආණ්ඩුවෙන් මා නිවැරදි බව ඔප්පු වනු ඇති බවත්, ඒ අනුව ජනතාව මගේ පැත්ත ගනු ඇති බව හා එයින් හෙන්ඩර්සන්ලාගේ සහ ස්නෝ-ඩන්ලාගේ දේශපාලන මරණය ඉක්මන් වනු ඇති බවත්, රුසියාවේ හා ජර්මනියේ සිටි ඔවුන්ගේ ඥාති භූතයන්ට මෙන්ම ඔවුන්ටද එම ඉරණම අත්වනු ඇති බවත්, ජනතාවට වැටහෙන ආකාරයෙන් විස්තර කර දීමට මට හැකි වනු ඇත.

මෙම උපක්‍රම ජනතාවට වටහා ගත නොහැකි වන තරම් සියුම් යයිද, නැතහොත්, සංකීර්ණ යයිද, මෙම උපක්‍රම නිසා අපගේ බලවේග භේදවී විසිරී යනු ඇතැයිද, ඒවා සෝවියට් විප්ලවය සඳහා සංකේන්ද්‍රණය කිරීම එනිසා වැළකෙනු ඇතැයිද යනාදිය කියමින් ''වාම'' වාදීන් විරෝධය දක්වතොත්, මම මෙසේ ඔවුන්ට පිළිතුරු දෙන්නෙමි: ඔබගේ දෘෂ්ටි නිවේශක වාදය ජනතාවගේ වරදක් ලෙස පෙන්වන්න එපා! රුසියාවේ පොදු ජනතාව බ්‍රිතාන්‍යයේ පොදු ජනතාවට වඩා උගත් පිරිසක් නොවන බවට සැකයක් නැත. මේ ගැන කිවහැකි යමක් ඇතොත්, ඒ ඉන් අඩු උගත්කමක් ඇත්තේ රුසියාවේ පොදු ජනතාවට බවය. එසේ වී නමුත්, පොදු ජනතාව බොල්ෂෙවික් වරුන් ගැන වටහා ගත්හ. 1917 සැප්තැම්-බරයේදී, සෝවියට් විප්ලවයේ පූර්වාසන්නයේදී බොල්ෂෙවික්වරු ධනපති පාර්ලිමේන්තුවකට (ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයට) ඔවුන්ගේ අපේක්ෂකයන් ඉදිරිපත් කළහ. 1917 නොවැම්බරයේදී, විප්ලවයෙන් ඉක්බිති දිනක, ඔවුහු ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩල මැතිවරණයට සහභාගි වූහ. ඔවුහු 1918 ජනවාරි 5 දින එම මණ්ඩලය තුරන් කර දැමූහ. මෙසේ ක්‍රියා කිරීමෙන් බොල්ෂෙවික්වරුනට බාධාවක් සිදු වූයේ නැත. ඊට ප්‍රතිකූල වශයෙන් එයින් ඔවුන්ට සිදුවූයේ වාසියකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බ්‍රිතාන්‍ය කොමියුනිස්ට්වාදීන් අතර අසමථයට අදාළ දෙවැනි කරුණ ගැන, කම්කරු පක්ෂයට ඒකාබද්ධ වීම හෝ නොවීම පිළිබඳ ප්‍රශ්නය ගැන, මට මෙහිදී කරුණු විස්තර කළ නොහැකිය. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් මා සතුව ඇත්තේ කරුණු ඉතා ස්වල්පයකි. ඒ අතර, යුරෝපා මහා දේශයේ සාමාන්‍යයෙන් දක්නට ලැබෙන දේශපාලන පක්ෂවලට වඩා ව්‍යුහය අතින් පවා වෙනස්වන බ්‍රිතාන්‍ය කම්කරු පක්පක්ෂයේ ඉතාමත් අමුතු ස්වභාවය නිසා එම ප්‍රශ්නය ඉතාමත් සංකීර්ණ එකක් වී තිබේ. නමුත්, ප්‍රථමයෙන්ම, මෙම ප්‍රශ්නයේදී වුවද, "කොමියුනිස්ට් පක්ෂය එහි ධර්මය පිරිසිදුව තබා ගත යුතුය. ප්‍රතිසංස්කරණවාදෙයන් නිදහස් වූ එහි තත්වය නොකෙලෙසා රැක ගත යුතුය. එයට පැවරී තිබෙන මෙහෙය වූකලී, නවතින්නේ හෝ හැරෙන්නේ හෝ නැතිව, කොමියුනිස්ට් විප්ලවය කරා යන සෘජු මාවත ඔස්සේ නායකත්වය දෙමින් ඉදිරියට යාමය" යන වැනි ප්‍රතිපත්ති අනුව විප්ලවවාදී නිර්ධන පංතියේ උපක්‍රම නිශ්චය කර ගැනීමට උත්සාහ කරන අය, නොවැලැක්විය හැකි ලෙසම තම කටයුතු වරද්ද ගනු ඇත. එවැනි ප්‍රතිපත්ති පිළිගැනීම යනු 1874 දී සියලුම සම්මුති සහ සියලුම අන්තර් අවධි "බැහැර කළ" බ්ලන්කිවාදී කොමියුනාඩ්වරු කළ වරදම නැවතත් කිරීමක් පමණකි. දෙවැනිව, වෙනත් සෑම අවස්ථාවකදී මෙන්ම මෙම ප්‍රශ්නයේදී ද, ඉටු කළ යුතු කර්තව්‍යය වන්නේ පංති අතර පවතින විශේෂ සම්බන්ධතාවයන් සමග සහ කොමියුනිස්ට් වාදය කරා යොමු වූ වාස්තවික සංවර්ධනයට අදාළ, රටින් රටට වෙනස් වන විශේෂ අංගලක්ෂණ සමග ගලපමින්, කොමියුනිස්ට්වාදයේ පොදු හා මූලික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට උගෙන ගැනීම බවට සැකයක් නොමැත. මෙම විශේෂ අංග ලක්ෂණ සොයා දැන ගැනීමට, අධ්‍යයනය කිරීමට හා කල්තබා හඳුන්වා දීමට අප සමත් විය යුතුය.

X

නිගමන කීපයක්

1905 වර්ෂයේ රුසියානු ධනපති විප්ලවය, ලෝක ඉතිහාසයේ පෙර කිසි කලෙකත් නොදක්නා ලද නව නැම්මක් පෙන්නුම් කළේය: ඉතාමත් නො දියුණු ධනපති රටක වැඩ වර්ජන ව්‍යාපාරය ලෝකයේ කිසිම තැනෙක පෙර නොවූ විරූ තරම් ව්‍යාප්ත විය, බලවත් විය. 1905 වර්ෂයේ මුල් මාසයේ පමණක් වැඩ වර්ජකයන්ගේ සංඛ්‍යාව ඊට පෙර (1895–1904) දශ වර්ෂයේ වැඩ වර්ජකයන්ගේ සාමාන්‍ය වාර්ෂික සංඛ්‍යාව මෙන් දස ගුණයකටත් අධික විය. 1905 ජනවාරි පටන් ඔක්තෝබරය දක්වා නොකඩවාම වර්ධනය වූ වැඩ වර්ජන අති දැවැන්ත පරිමාණයක් ගත්තේය.

විප්ලව කාලයේදී පීඩිත පොදු ජනතාවගේ ස්වාධීන ක්‍රියාකාරීත්වය මවිත කර තරම් වේගයකින් වර්ධනය වීම (මෙය විප්ලව සියල්ලෙහි දීම සිදුවී තිබුණි) පමණක් නොව, නිර්ධන පංතියේ වැදගත්කම මුළු ජනගහනයෙන් එය පිළිබිඹු කරන සංඛ්‍යාත්මක අනුපාතයට වඩා අත්‍යන්තයෙන් අධික බවද, ලෝකයාට පෙන්වූ ප්‍රථම රට වූයේ, අපූර්වතම ඓතිහාසික කොන්දේසි ගණනාවක බල පෑමට හසු වූ නොදියුණු රුසියාවය. ආර්ථික වැඩ වර්ජනයේ සහ දේශපාලන වැඩවර්ජනයේ ඒකාබද්ධ වීමක්ද, දේශපාලන වැඩ වර්ජනය ආයුධ සන්නද්ධ නැගී සිටීමක් දක්වා වැඩීයාමක් ද, ධනපති ක්‍රමයෙන් පීඩිත වූ පංතිවල පොදුජන අරගලයේ සහ පොදු ජන සංවිධානයේ නව ආකෘතියක් වූ සෝවියට් සභාවල උපතද, එය විසින් ගෙන හැර දක්වන ලදී.

1917 පෙබරවාරි සහ ඔක්තෝබර් විප්ලව කරණකොට ගෙන සෝවියට් සභා දේශ ව්‍යාප්ත පරිමාණයකින් සර්ව පාර්ශවීය ලෙස සංවර්ධනය වීමටත්, නිර්ධන පංති සමාජවාදී විප්ලවයේදී ඒවාට ජයග්‍රහණය අත්පත් වීමටත් මග පෑදුනේය. අවුරුදු දෙකක් ගෙවී යන්නට මත්තෙන්, සෝවියට් සභාවල ජාත්‍යන්තර ස්වභාවයත්, මෙම අරගල සහ සංවිධාන ආකෘතිය ලෝක කම්කරු පංති ව්‍යාපාරය තුළ පැතිර ගිය ආකාරයත්, ධනපති පාර්ලිමේන්තුවාදයේ සහ පොදු වශයෙන් ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ මිනීවල කපන්නා, උරුමක්කාරයා හා අනුප්‍රාප්තිකයා ලෙසට සෝවියට් සභාවලට පැවරෙන ඓතිහාසික මෙහෙයත් යන සියල්ල පැහැදිලි වූයේය.

එපමණක් ද නොවේ. සෑම රටකදීම එය ගමන් කිරීමට ආසන්නව (දැනටමත් ගමන් කරමින්) සිටින්නේ, නැගී එන, ශක්තියෙන් වැඩෙන හා ජයග්‍රහණය කරා ඉදිරියට යන කොමියුනිස්ට්වාදය විසින් මූලික වශයෙන් මෙන්ෂෙවික්වාදයට විරුද්ධව, එනම්, අවස්ථාවාදය වන, (එක් එක් රටෙහි දේශීය වර්ගයේ) ජාත්‍යොන්මාද වාදය වන සහ වාමාංශික කොමියුනිස්ට්වාදයේ අනුපූරක ස්වභාවෂියක් දරන මෙන්ෂෙවික්වාදයට විරුද්ධව කරනු ලබන අරගලයක් තුළින් බව කම්කරු පංති ව්‍යාපාරයේ ඉතිහාසය දැන් පෙන්නුම් කරයි. මෙයින් අවස්ථාවාදයට සහ ජාත්‍යොන්මාදවාදයට විරුද්ධ අරගලය විශේෂයක් නොමැතිව සෑම රටකම පාහේ ඇති වූයේ දෙවැනි ජාත්‍යන්තරය (එය දැන් මිය ගොස් ඇතිසේය) සහ තුන්වැනි ජාත්‍යන්තරය අතර පොරයක ස්වභාවයෙන් බව පෙනේ. වාමාංශික කොමියුනිස්ට්වාදයට අනුපූරක ස්වභාවයේ වන මෙන්ෂෙවික්වාදයට විරුද්ධ අරගලය ජර්මනියේ, මහා බ්‍රිතාන්‍යයේ, ඉතාලියේ, ඇමෙරිකාවේ (කොහොම නමුත් ලෝක කාර්මික කම්කරුවෝ සංවිධානයේ සහ අරාජික-සම්මේලවාදී උපනතිවල එක් කොටසක් සෝවියට්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහා එහෙම පිටින්ම හා කොන්දේසි විරහිතවම පිළිගන්නා අතරම, වාමාංශික කොමියුනිස්ට්වාදයේ වැරදි ආරක්ෂා කරයි) සහ ප්‍රංශයේ (කලින් සම්මේලවාදීන් වූවන්ගෙන් කොටසක් ද සෝවියට් ක්‍රමය පිළිගන්නා අතරම දේශපාලන පක්ෂය හා පාර්ලිමේන්තුවාදීන් කෙරෙහි දක්වන ආකල්පය) සිදුවනු දක්නා ලැබේ. වෙනත් වචනවලින් කියතොත් එම අරගලය ජාත්‍යන්තර පරිමාණයෙන් පමණක් නොව, ලෝක ව්‍යාප්ත පරිමාණයෙන්ද කරගෙන යනු ලැබේ.

කම්කරු පංති ව්‍යාපාරය ධනපති පංතිය පරාජය කර ජයග්‍රහණය ලැබීම සඳහා, සෑම තැනෙකම, ඇත්ත වශයෙන් එකම වර්ගයක 'අභ්‍යාස විද්‍යාලවල' පුහුණුව ලබමින් සිටින නමුත්, එක් එක් රටෙහි එම ව්‍යාපාරය සංවර්ධනයට පත් වන්නේ එයටම විශේෂ වූ ආකාරයකිනි. ලොකු හා දියුණු ධනපති රටවල් බොල්ෂෙවික්වාදයට වඩා බොහෝ සීඝ්‍ර ලෙස මෙම මාර්ගය ගෙවා ගමන් කරති. සංවිධානය වූ දේශපාලන උපනතියක් ලෙසට ජයග්‍රහණය සඳහා සූදනම් වීම පිණිස බොල්ෂෙවික්වාදයට ඉතිහාසයෙන් අවුරුදු පහළොවක කාලයක් ලැබුණි. එක් අවුරුද්දක් වන කෙටි කාලය තුළදී තුන්වැනි ජාත්‍යන්තරය දැනටමත් තීරණාත්මක ජයග්‍රහණයක් ලබාගෙන ඇත. එය සමාජ-ජාත්‍යාන්මාදවාදී දෙවැනි ජාත්‍යන්තරය පරාජය කර දැම්මේය. වැඩි කලක් නොව, මාස කීපයකට පෙර, දෙවැනි ජාත්‍යන්තරය තුන්වැනි ජාත්‍යන්තරයට වඩා අති බලවත් සේ ද, ස්ථාවර සහ ශක්තිමත් සේද, පෙනුනු නමුත්, එයට සෘජු සහ අනියම්, ද්‍රව්‍යමය (කැබිනට් තනතුරු, ගමන් බලපත්, පුවත්පත්) සහ දෘෂ්ටිමය යන සෑම වර්ගයකම ආධාර ලෝක ධනපති පංතියෙන් ලැබුණ නමුත්, එය පරාජය වී තිබේ.

සෑම රටකම කොමියුනිස්ට්වාදීහු අවස්ථාවාදයට සහ වාම දෘෂ්ටිනිවේශකවාදයට විරුද්ධව කරනු ලබන අරගලයේ මූලික අරමුණුත්, එක් එක් රටෙහි ආර්ථිකයෙහි, දේශපාලනයෙහි, සංස්කෘතියෙහි, ජාතික සංයුතියෙහි (අයර්ලන්තය, ආදී), එහි යටත් විජිතවල, ආගමික නිකායවල හා එවැනි වෙනත් සාධකවල විශේෂ ස්වභාවය අනුව, ඒ ඒ රටෙහි මෙම අරගලය ආරූඪ කරගන්නා හා ආරූඪ කර ගත යුතු නියත අංගලක්ෂණත් යන දෙකම දැන් විඥත ලෙස අවශ්‍යයෙන්ම සැලකිල්ලට ගත යුත්තාහ. දෙවැනි ජාත්‍යන්තරය කෙරෙහි අප්‍රසාදය සෑම තැනෙකම දැනී යන්නේය, පැතිරෙන්නේය, වර්ධනය වන්නේය. මෙයට හේතු වූයේ, එහි අවස්ථාවාදයත්, ලෝක සෝවියට් සමූහාණ්ඩුවක් සඳහා විප්ලවවාදී නිර්ධන පංතිය කරන අරගලයේ ජාත්‍යන්තර උපක්‍රම මෙහෙයවීමෙහි සමත්, සැබැවින්ම මධ්‍යගත වූ සහ සැබැවින්ම නායකත්වය දෙන මධ්‍යස්ථානයක් ඇති කිරීමෙහිලා එහි ඇති නොහැකියාව, නැතහොත්, අපොහොසත්කම යන දෙකමය. අරගලය පිළිබඳ ඒකාකාර වූ, යාන්ත්‍රික වශයෙන් සම කරන ලද හා සර්ව සම උපක්‍රමීය නියාමයන් පදනම් කරගෙන එවැනි නායක මධ්‍යස්ථානයක් කිසි කලෙකත් ගොඩනැගිය නොහැකි බව අවබෝධ කර ගත යුතුය. ජනතාවන් සහ රටවල් අතර තිබෙන ජාතික සහ රාජ්‍ය වෙනස් කම් පවතින තාක් කල් — එම වෙනස්කම් ඉතා දීර්ඝ කලක් යන තෙක්, නිර්ධන පංති ආඥාදායකත්වය ලෝක ව්‍යාප්ත පරිමාණයෙන් ස්ථාපිත කිරීමෙන් පසුවද, පවතිනු ඇත — — සියලුම රටවල කොමියුනිස්ට් කම්කරු පංති ව්‍යාපාරයේ ජාත්‍යන්තර උපක්‍රම එක්සත් කිරීම පිණිස, විවිධත්වය තුරන් කිරීම, නැතහොත්, ජාතික වෙනස් කම් යටපත් කිරීම (දැනට එය හුදෙක්ම සිහිනයකි) පමණක් නොව, මෙම නියාමයන් යම් යම් කරුණු අතින් නිවැරදි ලෙස වෙනස් කර සකසන, ජාතික හා ජාතික-රාජ්‍ය වෙනස්කම්වලට අදාළ වන සේ නිවැරදි ලෙසට ගලපන හා ව්‍යවහාරයට නගන, කොමියුනිස්ට්වාදයේ මූලික ප්‍රතිපත්ති (සෝවියට් බලය හා නිර්ධන පංති ආඥාදායකත්වය) ක්‍රියාත්මක කිරීමද අවශ්‍ය වේ. සියළුම රටවල් (ඒවා පමණක්ම නොවේ) දැනට පසු කරමින් සිටින ඓතිහාසික කාල පරිච්ඡේදයේදී ඉටුකළ යුතු මූලික කර්තව්‍යය වූ කලී, එක් එක් රටක් කිසියම් එක ජාත්‍යන්තර කර්තව්‍යයක්, නිදසුන් ලෙසට, කම්කරු පංති ව්‍යාපාරය තුළ පවතින අවස්ථාවාදය සහ වාම දෘෂ්ටි නිවේශකවාදය පරාජය කර ජය ගැනීම, ධනපති පංතිය බලයෙන් නෙරපා දැමීම, සෝවියට් සමූහාණ්ඩුවක් සහ නිර්ධන පංති ආඥාදායකත්වයක් පිහිටුවීම, යන එක් එක් කර්තව්‍යයක් ඉටු කළ යුතු නියත ආකාරයෙහි දක්නට ලැබෙන ජාතික වශයෙන් විශේෂ වූ සහ ජාතික වශයෙන් අමුතු වූ කරුණු සොයා දැන ගැනීම, විමසීම, කල්තබා හැදින්වීම සහ වටහා ගැනීම වන්නේය. ප්‍රධාන කාර්යය දැනටමත් ඉටු කර තිබේ. නමුත් අපි සියළු කටයුතු සම්පූර්ණ වූ තත්වය අසලකටවත් පැමිණ නැත්තෙමු. කම්කරු පංතියේ පෙරමුණු බල ඇණිය අප පැත්තට දිනා ගැනීමේ ප්‍රධාන කාර්යය ඉටු කර තිබේ. එම පෙරමුණු බල ඇණිය, පාර්ලිමේන්තුවාදයට විරුද්ධව සහ ධනපති ප්‍රජාතන්ත්‍රයට විරුද්ධව සෝවියට් ආණ්ඩුවේ පැත්ත ගෙන පෙළ ගැසී සිටී. දැන් සියලු පරිශ්‍රමයන් සහ සියලු අවධානය ඊළඟ පියවර වෙත ඉලක්ක කළ යුතුය. එය එතරම් මූලික ප්‍රශ්නයක් නොවන සේ පෙනෙන්නට පුළුවන. එක්තරා දෘෂ්ටි කෝනයකින් බලන කල, ඇත්ත වශයෙන්ම එය මූලිකතම ප්‍රශ්නයක් නොවේ. අනිත් අතට එය අදාළ කර්තව්‍යය ප්‍රායෝගික ලෙස ඉටු කිරීමකට බොහෝ දුරට ආසන්න දෙයකි. මෙම පියවර නම්, නිර්ධන පංති විප්ලවය කරා පරිවර්තනය වීමේ, නැතහොත්, ළඟා වීමේ ආකෘති සෙවීමය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණිය දෘෂ්ටිමය වශයෙන් අප පැත්තට දිනා ගෙන තිබේ. ප්‍රධාන කටයුත්ත එයයි. මෙය ඉටු නොකර ජයග්‍රහණය දෙසට ප්‍රථම පියවරවත් තැබිය හැකි නොවේ. නමුත් ජයග්‍රහණය කරා තව යායුතු දුර බොහෝය. පෙරමුණු බල ඇණියක් පමණක් ඇතිව දිනුම ලැබිය නොහැකිය. මුළු පංතිය, පුළුල් ජනතාව, එක්කෝ එක එල්ලේම පෙරමුණු බල ඇණියට ආධාර කරන, නැතහොත්, යටත්පිරිසෙයින් එය කෙරෙහි අනුකූලතා පූර්වක මධ්‍යස්ථභාවයක්වත් දක්වන සහ සතුරාට ආධාර නොදෙන ස්ථාවරයක් ගන්නා තැනට ඒමට පෙර, පෙරමුණු බල ඇණිය පමණක් තීරණාත්මක සංග්‍රාමයට ඇද දැමීම හුදෙක් මෝඩකමක් පමණක් නොව, අපරාධයක්ද වන්නේය. මුළු පංතියම, වැඩ කරන පුළුල් ජනතාව, ප්‍රාග්ධනයෙන් පීඩනයට පත් පිරිස්, එවැනි ස්ථාවරයක් ගන්නා තැනට ගෙන එනු පිණිස, ප්‍රචාරය සහ උද්ඝෝෂණය පමණක් ප්‍රමාණවත් වන්නේ නැත. එය සිදු වීම සඳහා පොදු ජනතාවට ඔවුන්ගේම දේශපාලන අත්දැකීම් තිබිය යුතුය. මහා විප්ලවවල මූලික නීතිය එයයි. රුසියාවෙහි දී පමණක් නොව ජර්මනියෙහි දී ද, මෙය ඉතා බලවත් ලෙස හා විචිත්‍රාකාර ලෙස තහවුරු විය. කොමියුනිස්ට්වාදය දෙසට තීරණාත්මක ලෙස හැරීමක් සිදුවීම සඳහා, නොදැනුවත් සහ බොහෝ විට නූගත් රුසියාවේ පොදු ජනතාවට පමණක් නොව, දැනුවත් සහ හොඳ උගත් කමක් ඇති ජර්මනියේ පොදු ජනතාවටද, දෙවැනි ජාත්‍යන්තරයේ වීරයන්ගේ අන්ත බෙලහීන භාවය හා චපලත්වය, අන්ත අසරණ කම හා ධනපති පංතියට ගැති බව ගැන, තමන්ගේම අමිහිරි අත්දැකීම් තුළින් අවබෝධ වීම අවශ්‍ය විය. එසේම, නිර්ධන පංති ආඥාදායකත්වය හැරුණු විට තිබෙන එකම විකල්පය අන්ත ප්‍රතිගාමීන්ගේ (රුසියාවේ කර්නිලව්, ජර්මනියේ කාප් සහ සමාගම) ආඥාදායකත්වය බවද, ඔවුන් අවබෝධ කර ගත යුතු විය.

ජාත්‍යන්තර කම්කරු පංති ව්‍යාපාරයේ පංති විඥානය ඇති පෙරමුණු බල ඇණියෙහි, නැතහොත්, කොමියුනිස්ට් පක්ෂවල, කණ්ඩායම්වල හා උපනතිවල හදිසි අරමුණ විය යුත්තේ, පුළුල් පොදු ජනතාව ඔවුන්ගේ නව ස්ථාවරයට පමුණුවනු පිණිස (තවමත් ඔවුහු බොහෝ කොටම උදාසීන, අක්‍රිය, නිදිගත සහ සිරිතට බැඳුනු පිරිසක් වෙති) ඔවුන්ට නායකත්වය දීමේ හැකියාව ලැබීමය. නැතහොත්, වෙනත් ආකාරයකින් කියතොත්, නව ස්ථාවරය කරා ඉදිරියට යාමේදී හා පරිවර්තනය වීමේදී තමන්ගේම පක්ෂයට පමණක් නොව, මෙම පොදු ජනතාවන්ටද නායකත්වය දීමේ හැකියාව ලැබීමය. අවස්ථාවාදය සහ සමාජ-ජාතෝන්මාදවාදය පරදවා සම්පූර්ණ දෘෂ්ටිමය හා දේශපාලන ජයග්‍රහණයක් ලැබීමෙන් තොරව, ප්‍රථම ඓතිහාසික අරමුණ (නිර්ධන පංතියේ පංති විඥානය ඇති පෙරමුණු බල ඇණිය සෝවියට් බලය සහ කම්කරු පංතියේ ආඥාදායකත්වය පැත්තට

දිනා ගැනීම) ඉටු කරගැනීමට ඉඩක් නොතිබුණු අතර, වාම දෘෂ්ටි නිවේශකවාදය තුරන් නොකර, එහි වැරදි සම්පූර්ණයෙන් තුරන් නොකර, විප්ලවයේදී පෙරමුණු බල ඇණියේ ජයග්‍රහණය සහතික කරන පරිදි පොදු ජනතාව නව ස්ථාවරයකට පමුණුවන සේ ඔවුන්ට නායකත්වය දීමේ හැකියාව ලබා ගැනීමෙන් සමන්විත වන දෙවැනි හා හදිසි අරමුණ ඉටු කරගත හැකි නොවේ.

ඉටු කළ යුතු කර්තව්‍යය, නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණිය කොමියුනිස්ට්වාදය පැත්තට දිනා ගැනීම වූ තාක් කල් (හා වන තාක් කල්), පූර්වතාවය දුන්නේ හා තවමත් දෙන්නේ ප්‍රචාරක වැඩ කටයුතුවලට ය. ප්‍රචාරක කවවල තිබෙන ප්‍රදේශාවනත දුර්වලකම් සියල්ලම සහිතව වුවද, ඒවා පවා, මෙම තත්වයන් යටතේ ප්‍රයෝජනවත් වන සේම හොඳ ප්‍රතිඵලද ලබති. නමුත් මතුවී තිබෙන්නේ, ජනතාවගේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය, නැතහොත්, අයෙකුට කිවහැකි ලෙසට, අවසාන තීරණාත්මක සටන සඳහා අති විශාල හමුදා පෙරමුණුවල රැඳවීම පිළිබඳ, යම්කිසි සමාජයක සියලුම පංති බලවේගයන් පෙළගැස්වීම පිළිබඳ ප්‍රශ්නයක් වන කල්හි, ප්‍රචාරක ක්‍රම පමණක්, ''පිරිසිදු'' කොමියුනිස්ට්වාදයේ සත්‍යයන් හුදෙක් නැවත ප්‍රකාශ කිරීම පමණක්, ඵලදායක නොවේ. මෙම තත්වයන් යටතේ, පොදු ජනතාවට තවමත් නායකත්වය දී නැති කුඩා කණ්ඩායමකට අයත් ප්‍රචාරකයෙකු ලෙසට, කෙනෙකු දහස් ගණනින් ගණන් නොකළ යුතුය. මෙම තත්වයන් යටතේ අයෙක් ගණන් ගැනීම කළ යුත්තේ දශලක්ෂ ගණනින්ය, කෝටි ගණනින්ය. මෙම තත්වයන් යටතේ අප අපෙන් ප්‍රශ්න කර ගත යුත්තේ විප්ලවවාදී පංතියේ පෙරමුණු බල ඇණියට අවබෝධය ලබා දී තිබේ ද යනුවෙන් පමණක් නොවේ. තීරණාත්මක සටන ලඟදීම සිදුවිය හැකි ආකාරයට, සියලුම පංතිවලට අයත්, නැතහොත්, කිසියම් සමාජයක් තුළ, විශේෂයක් නොමැතිව, ඒකාන්ත වශයෙන්ම, සියලුම පංතිවලට අයත්, ඓතිහාසික වශයෙන් ක්‍රියාත්මක බලවේගයන් පෙළගැසී තිබේද යනුත්, එනම්, (1) අපට සතුරු වන සියලුම බලවේගයන් ප්‍රමාණවත් තරම් පැටලී තිබේද, ඔවුහු එකිනෙකා සමග සැහෙන තරම් ගැටෙන තත්වයට පත්ව සිටිත්ද, ඔවුන්ගේ ශක්තිය ඉක්මවා යන අරගලයකින් ඔවුහු ප්‍රමාණවත් තරම් දුබල වී සිටිත්ද, (2) චපල සහ අස්ථාවර කොටස්, නැතහොත්, ධනපතියන්ට වඩා වෙනස් සුළු ධනපති සහ සුළුධනපති-ප්‍රජාතන්ත්‍රවාදී කොටස් සියල්ලම ප්‍රමාණවත් තරම් දුරට ජනතාව හමුවේ හෙළිදරව් වී තිබේද, ඔවුන්ගේ දේශපාලන බංකොලොත්භාවය නිසා ඔවුහු ප්‍රමාණවත් තරම් අවමානයට ලක්ව සිටිත්ද, (3) ධනපති පංතියට විරුද්ධව ඉතාමත් අධිෂ්ඨාන සහගත, එඩිතර සහ කැපවූ විප්ලවවාදී සටනක් කිරීමට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පක්ෂ වන පොදු ජන හැඟීමක් නිර්ධන පංතිය අතර ඉස්මතු වී, එය වේගයෙන් වර්ධනය වන්නට පටන් ගෙන තිබේ ද යනුත්, අපෙන් ප්‍රශ්න කර ගත යුතුය. ඒ එසේ නම් ඇත්ත වශයෙන්ම විප්ලවය සඳහා කාලය එළඹ තිබේ. එවිට, ඉහත සඳහන් හා සාරාංශ කොට දක්වූ සියළුම කොන්දේසි ඉටු වී ඇති බව අප හරි ආකාර ලෙස පිරික්සා බලා දැනගෙන තිබේ නම්, අපි ඇත්තෙන්ම නිවැරදි මොහොත තෝරා ගත්තෝ වෙමු. එවිට අපගේ ජයග්‍රහණය සහතිකය.

පිරිසිදු (එනම්, වියුක්ත) කොමියුනිස්ට්වාදයේ, නැතහොත්, පොදු ජනතාවගේ ප්‍රායෝගික දේශපාලන සටන් වේදිකාව දක්වා යන තරමට තවම මෝරා නැති කොමියුනිස්ට්වාදයේ ස්ථාවරය අනුව බලන කල, එක් අතකින් චර්චිල් සහ ලොයිඩ් ජෝර්ජ් අතර මතභේදත් — නොවැදගත් ජාතික විශේෂතාවයන් සහිත වූ මෙවැනි දේශපාලන පිරිස් සෑම රටකම ඇත — අනිත් අතින් හෙන්ඩර්සන්ලා සහ ලොයිඩ් ජෝර්ජ්ලා අතර මත භේදත්, ඉතා සුළු හා නොවැදගත් වන්නේය. එසේ වී නමුත් පොදු ජනතාවගේ මෙම ප්‍රායෝගික සටනේ ස්ථාවරයෙන් බලන කල මෙම මත භේද ඉතාමත් වැදගත්ය. මෙම මතභේද ගැන නිසි ලෙස සැලකිල්ලට ගැනීම සහ, මෙම "මිතුරන්" අතර නොවැළැක්විය හැකි ලෙසට ඇතිවන හා සමස්තයක් වශයෙන් "මිතුරන්" සියළු දෙනාම අබල දුබල කරන සට්ටන ඇවිළී යන මොහොත නිශ්චය කිරීම වැදගත්ය. හුදෙක් විඥනයෙන් සහ අවබෝධයෙන් යුතුව අදහස් ප්‍රචාරය කරන්නෙකු පමණක් ලෙසට නොසිට, විප්ලවයේ දී පොදු ජනතාවට ප්‍රායෝගික වශයෙන් නායකත්වය දෙන්නෙකු වීමට අපේක්ෂා කරන කොමියුනිස්ට්වාදියාගේ කටයුත්ත විය යුත්තේ එයයි. හෙන්ඩර්සන්ලාට (තමන් සමාජවාදීන් ලෙසට හඳුන්වා ගන්නා, සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ එක් එක් නියෝජිතයන්ගේ නම් සඳහන් නොකර කියමු නම්, දෙවැනි ජාත්‍යන්තරයේ වීරයන්ට) බලය හිමි වීම හා අහිමි වීම ඉක්මන් කරනු පිණිසද, අපගේ අදහස්වල ජීවගුණය ග්‍රහණය කරමින් කොමියුනිස්ට්වාදයට නැඹුරු වන සේ පොදු ජනතාවට අවබෝධයක් ගෙන දෙන පරිදි ඔවුන්ගේ (හෙන්ඩර්සන්ලාගේ) අනිවාර්‍යය බංකොලොත් ලැබුම ඉක්මන් කරනු පිණිසද, හෙන්ඩර්සන්ලා, ලොයිඩ් ජෝර්ජ්ලා සහ චර්චිල්ලා (මෙන්ෂෙවික් වරුන්, සමාජවාදී-විප්ලවවාදීන්, ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදීන්, රාජාණ්ඩුවාදීන්, ෂයිඩමාන්ලා සහ කාප් වාදීන්, ආදීන්) අතර නොවැළැක්විය හැකි ලෙසට ඇතිවන නොමනාපකම්, ඝණ්ඩු-දබර, සට්ටන සහ භේද-භින්න වීම් වේගවත් කරනු පිණිසද, "ශුද්ධ පෞද්ගලික දේපලෙහි මෙම බල කනු" අතර අසමගිය ප්‍රයෝජනයට ගනිමින් දෙන තීරණාත්මක ප්‍රහාරයක් මගින් ඔවුන් සියළු දෙනාම පරාජය කර දමා

නිර්ධන පංතියට දේශපාලන බලය අල්ලා ගත හැකි වන සේ ඔවුන් අතර පවතින අසමගියේ උග්‍රතම වූ නිසි අවස්ථාව තෝරා ගනු පිණිසද, කොමියුනිස්ට්වාදයට සම්පූර්ණයෙන්ම කැප වීමත්, අවශ්‍ය ප්‍රායෝගික සම්මුති ඇති කර ගැනීම, පිළිවෙත් වෙනස් කිරීම්, සමාදාන වීමේ උපක්‍රම, ඇද කුද ස්වභාවයේ මගක් ගැනීම, පසුබැසීම් යනාදිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවත් එකට සම්බන්ධ කරගත යුතු වේ.

සමස්තයක් වශයෙන් ඉතිහාසය, විශේෂයෙන්ම විප්ලවවල ඉතිහාසය, ඉතාමත් හොඳ පක්ෂ පවා සිතනවාට වඩා, ඉතාමත් දියුණු පංතිවල උසස්ම පංති විඥනයක් ඇති පෙරමුණු බල ඇණි සිතනවාට වඩා සන්ධාරයෙන් පොහොසත්ය, ඉතාමත් විවිධාකාරය, අනේකවිධය, ඉතාමත් ප්‍රාණවත්ය, එසේම තීක්ෂණය. මෙය පහසුවෙන් වටහා ගත හැකි දෙයකි. එයට හේතුව මෙයයි. ඉතාමත් විශිෂ්ට පෙරමුණු බල ඇණිවලින් පවා ප්‍රකාශ වන්නේ දස දහස් ගණන් පිරිස්වල පංති විඥනය, අභිමතය, අභිලාෂය හා පරිකල්පනය වන අතර මහා උත්සන්නි ඇතිවන හා සියළු මිනිස් ශක්තීන් කුළු ගැන්වෙන අවස්ථා වන විප්ලව සිදු කෙරෙන්නේ, පංතීන්ගේ ඉතාමත් තියුණු අරගලය විසින් ඔද වැඩුනු කෝටි සංඛ්‍යාත ජනතාවන්ගේ පංති විඥනය, අභිමතය, අභිලාෂය හා පරිකල්පනය අනුවය. මේ අනුව බැසගත යුතු ඉතා වැදගත් ප්‍රායෝගික නිගමන දෙකකි: පළමුවැන්න, මෙම කර්තව්‍යය ඉටු කරනු හැකි වීම සඳහා, විශේෂයෙන් තොරව සමාජ ක්‍රියාකාරිත්වයේ සෑම ආකෘතියක්ම නැතහොත් අංශයක්ම සම්බන්ධ සමත් කම් ලබා ගැනීමේ හැකියාව විප්ලවවාදී පංතියට තිබිය යුතුය (එය දේශපාලන බලය අත්පත් කර ගැනීමට පෙර සම්පූර්ණ නොකළ දේ, එම බලය අත්පත් කර ගැනීමෙන් පසුව, සමහරවිට මහත් අවදානමට හා අන්තරායට මුහුණ දෙමින්, සම්පූර්ණ කළ යුතු වේ). දෙවැන්න, ඉතාමත් සීඝ්‍ර හා සැඩ ස්වරූපයෙන් එක ආකෘතියක් වෙනුවට තවත් එකක් ආදේශ කිරීමට විප්ලවවාදී පංතිය සූදානම්ව සිටිය යුතුය.

සතුරා සතුව තිබෙන නැතහොත් සතුරා සතු විය හැකි සියලුම ආයුධ, සියලුම සංග්‍රාම මාධ්‍යයන් සහ විධි පාවිච්චි කිරීමට පුහුණු නොවන එසේ හැසිරීම අපරාධයක් යයි පවා කිව හැකිය. මෙම නිගමනය යුද්ධයටත් වඩා දේශපාලනයට අදළ වන්නේය. යම් යම් අනාගත කොන්දේසි යටතේ අදළ වන්නේ සහ අපගේ වාසියට හේතු වන්නේ කුමණ අරගල ක්‍රමද යන්න තීරණය කිරීම දේශපාලනයේදී වඩාත් දුෂ්කරය. සියලුම අරගල විධි උපයෝගී කරගැනීමට අප උගෙන නොගන්නේ නම්, අපගේ පාලනයෙන් බාහිරව, වෙනත් පංතිවල තත්වයන් වෙනස් වීමෙන්, විශේෂයෙන්ම, අපට සමත්කම් අඩු අරගල ආකෘතියක් ඉදිරිපත් වූ කලෙක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමහර විට බරපතල හා තීරණාත්මක පවා වන පරාජයක් ලැබීමට අපට සිදුවනු ඇත. නමුත් අපි සියලුම අරගල විධි ප්‍රයෝජන ගැනීමට උගෙන ගන්නෙමු නම්, ජයග්‍රහණය සහතික වන්නේය. එයට හේතුව, සතුරාට ඉතාමත් අනතුරුදායක වන ආයුධ, ඉතාමත් සීඝ්‍ර ලෙස මාරක ප්‍රහාරයන් දෙන ආයුධ පාවිච්චි කිරීමේ අවස්ථාව අපට වට පිටාව අනුව නොලැබී යතත්, නියම වශයෙන්ම පෙරමුණ ගෙන සිටින හා නියම වශයෙන්ම විප්ලවවාදී වන පංතියේ උවමනාවන් අප විසින් නියෝජනය කරනු ලැබීමය. නීත්‍යානුකූල අරගල ක්‍රම පිළිබඳ ක්ෂේත්‍රයේදී ධනපති පංතිය බොහෝ විට (විශේෂයෙන්ම ''සාමකාමී'' සහ විප්ලවකාරී නොවන වකවානුවලදී) කම්කරුවන් රවටා සහ ඔවුන්ට වංචා කර තිබෙන නිසා, එම අරගල ක්‍රම අවස්ථාවාදී යයිද, නීති විරෝධී අරගල ක්‍රම විප්ලවවාදී යයිද, පළපුරුද්ද අඩු විප්ලවවාදීහු සිතති. නමුත්, එසේ සිතීම වැරදිය. සත්‍යය මෙයයි. නිදසුනක් ලෙසට, ඉතාමත් නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී රටවල ධනපති පංතිය ඉතාමත් සාහසික ලෙස හා තිරශ්චීන ලෙස කම්කරුවන් මුළා කළ සහ යුද්ධයේ කොල්ලකාරී ස්වභාවය ගැන සත්‍යය යටපත් කර දැමූ 1914–1918 අධිරාජ්‍යවාදී යුද්ධ සමයේ බල පැවැත් වූ වැනි කොන්දේසි යටතේ නීති විරෝධී අරගල ක්‍රම යොදා ගැනීම අසමත්, නැතහොත්, අකැමති (''මට නොහැකිය'' නො කියන්න, ''මම නොකැමැත්තෙමි'' කියන්න) පක්ෂ හා නායකයෝ අවස්ථාවාදීන් හා කම්කරු පංතියට ද්‍රෝහීන් වෙති. නමුත් නීති විරෝධී අරගල ක්‍රම සමග සෑම ආකාරයකම නීත්‍යානුකූල අරගල ක්‍රම ඒකාබද්ධ කර ගැනීමට අසමත් වන විප්ලවවාදීහු ඇත්ත වශයෙන්ම දුර්වල විප්ලවවාදීන් වෙති. විප්ලවය ආරම්භ වී එය පිටාර ගලන විට, එහි ප්‍රවාහයට හසු වීම නිසා, එය මොස්තරය වී තිබෙන නිසා සහ සමහර විට ආත්මාර්ථකාමී වාසි අපේක්ෂාවෙන් ජනයා සියලු දෙනාම විප්ලවයට සම්බන්ධ වන විට, විප්ලවවාදියෙකු වීම දුෂ්කර දෙයක් නොවේ. නිර්ධන පංතිය ජයග්‍රහණය අත්පත් කර ගැනීමෙන් පසුව, එවැනි බොරු විප්ලවවාදීන්ගෙන් ''නිදහස්'' වීම සඳහා ඉතාමත් දැඩි සහ වේදනාකාරී පවා විය හැකි ප්‍රයත්න දැරීම අවශ්‍ය වේ. ඍජු, විවෘත, සැබැවින්ම පොදු ජන සහ සැබැවින්ම විප්ලවවාදී අරගල කිරීම සඳහා සුදුසු කොන්දේසි තවමත් උද්ගතව නොතිබිය දී විප්ලවවාදී නොවන ආයතන තුළ, විප්ලවවාදී නොවන තත්වයක් යටතේ, විප්ලවවාදී සටන් ක්‍රමවල අගය එක්වරම වටහා ගැනීමෙහි අපොහොසත් පොදු ජනතාවන් අතර විප්ලවයේ යහපත පිණිස (ප්‍රචාරය, උද්ඝෝෂණය සහ සංවිධානය මගින්) කටයුතු කරගෙන යාම ඊට වඩා බොහෝ දුෂ්කරය. ඊට වඩා බොහෝ අගනේය. බටහිර යුරෝපයේ සහ ඇමෙරිකාවේ කොමියුනිස්ට්වාදයේ වර්තමාන ප්‍රධාන අරමුණ

වන්නේ පොදු ජනතාව නියම, තීරණාත්මක සහ අවසාන විප්ලවීය අරගලය කරා මෙහෙයවන නිශ්චිත මාවත, නැතහොත්, විශේෂ සිදුවීම් යොමුව සොයා බැලීමේ, දැනගැනීමේ සහ නිවැරදි ලෙස නිර්ණය කිරීමේ හැකියාව ලබාගැනීමය.

බ්‍රිතාන්‍යය මේ සම්බන්ධයෙන් උදාහරණයකි. එහි නියම නිර්ධන පංතික විප්ලවයක් කොතරම් ඉක්මණින් ඇවිලී යයිද, තවමත් අක්‍රියාශීලීව සිටින ඉතා පුළුල් පොදු ජනතාවන් අරගලය සඳහා කුළු ගැන්වීමට, උනන්දු කිරීමට සහ යොමු කිරීමට වැඩියෙන්ම ප්‍රයෝජනවත් වනු ඇත්තේ කුමණ ක්ෂණික හේතුවද යන්න අපට හෝ වෙනත් කෙනෙකුට හෝ කල්තබා කිව නොහැකිය. එනිසා (ප්ලෙහානව් මාක්ස්වාදියෙකු සහ විප්ලවවාදියෙකුව සිටියදී, ඔහු නිතර කී පරිදි) ''කකුල් හතරටම හොඳින් ලාඩම් ගැසූ'' තත්වයෙන් මෙන් සිටිනසේ අපගේ සූදනම් කාරී වැඩ කටයුතු සියල්ලම කර ගෙන යාම අපගේ යුතුකමය. පාර්ලිමේන්තු අර්බුදයකින්, නැතහොත්, වඩ වඩාත් වේදනාකාරී සහ තියුණු වෙමින් පවතින සහ නිරවුල් කර ගත නොහැකි සේ පැටලී තිබෙන යටත් විජිත සහ අධිරාජ්‍යවාදී ප්‍රතිවිරෝධතාවයන්ගෙන් පැන නගින අර්බුදයකින්, එසේත් නැතහොත්, සමහරවිට වෙනත් තුන්වැනි හේතුවකින් එහි පවුර දෙදරා යාමට, සටන ආරම්භ වීමට ඉඩ තිබේ. මහා බ්‍රිතාන්‍යයේ නිර්ධන පංති විප්ලවයේ ඉරණම තීරණය වනු ඇත්තේ කුමණ ආකාරයේ අරගලයකින්ද යන්න ගැන අපි සාකච්ඡා නොකරමු (ඒ ගැන කිසිම කොමියුනිස්ට්වාදියෙකුට සැකයක් නැත. අපි සියළු දෙනාම මෙය කල් තබා නිශ්චය වූවක් සේ සලකමු). අප සාකච්ඡා කරන්නේ, දැනට අක්‍රියාශීලීව සිටින නිර්ධන පංති පොදු ජනතාව චලිත කර ඔවුන් විප්ලවය දක්වාම මෙහෙයවනු ලැබෙනු ඇත්තේ කුමණ ක්ෂණික හේතුව විසින්ද යන්න ගැනය. නිදසුනක් ලෙසට ප්‍රංස ධනපති සමූහාණ්ඩුවේ ප්‍රතිගාමී යුද්ධ නිලධාරීන් අතර සිදු වූ දහස් සංඛ්‍යාත වංචනික ක්‍රියාවලින් ඉතාමත් ''අනපේක්ෂිත'' සහ ''සුළු'' එකක් (ද්‍රයිෆුස් නඩුව[74]) ජනතාව සිවිල් යුද්ධයට ආසන්න තත්වයක පත්කිරීමට ප්‍රමාණවත් විය! එවැනි තත්වයක් ඇති වූයේ ජාත්‍යන්තර හා ජාතික යන ස්ථාවරයන් දෙකම අනුව බලන කල අදට වඩා සියගුණයකින් අඩු විප්ලවවාදීත්වයක් පැවති අවස්ථාවකය.

මහා බ්‍රිතාන්‍යයේ කොමියුනිස්ට්වරු පාර්ලිමේන්තු මැතිවරණද, බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ අයර්ලන්ත, යටත් විජිත සහ ලෝක අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිවලින් උද්ගත වන සියලු තත්වයන්ද, ජන ජීවිතයේ වෙනත් සියලුම ක්ෂේත්‍රයන් හා අංශද, නිරන්තර ලෙස, ලිහිලක් නොපා සහ ස්ථිරසාර ලෙස උපයෝගී කරගනිමින්, එම ක්ෂේත්‍ර සියල්ලෙහිම අළුත් ක්‍රමයකට, කොමියුනිස්ට් ක්‍රමයට, දෙවැනි ජාත්‍යන්තරයේ ජීව ගුණයෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නොව තුන්වැනි ජාත්‍යන්තරයේ ජීවගුණයෙන් වැඩ කළ යුත්තාහ. පාර්ලිමේන්තු මැතිවරණවලට සහ පාර්ලිමේන්තු අරගලයට සහභාගි වීමේ "රුසියානු" "බොල්ෂෙවික්" ක්‍රමය ගැන මෙහි විස්තර කිරීමට තරම් මට කාලයත්, ඉඩත් නොමැත. එසේ නමුත්, එම ක්‍රම සාමාන්‍ය බටහිර යුරෝපීය පාර්ලිමේන්තු ව්‍යාපාරවලට වඩා බෙහෙවින් වෙනස් වූ බව මට ස්ථිර වශයෙන්ම කිව හැක. මෙයින් බැස ගනු ලබන නිගමනය මෙසේය: "නමුත් එසේ වූයේ රුසියාවේ ය. අපේ රටේ පාර්ලිමේන්තුවාදය ඊට වඩා වෙනස්ය". මෙය අසත්‍ය නිගමනයකි. සියලුම රටවල කොමියුනිස්ට්වරුන්, තුන්වැනි ජාත්‍යන්තරයේ අනුගාමිකයින් සිටින්නේ, පැරණි සමාජවාදී, වෘත්තීය සමිතිවාදී, සම්මේලවාදී සහ පාර්ලිමේන්තුවාදී යන වර්ගයේ වැඩ කිරීම, නව වර්ගයක වැඩ කිරීමක් දක්වා සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම සඳහාය. රුසියාවේද අවස්ථාවාදයත්, තනිකරම ධනපති වංචාවනුත්, ධනපතියන්ගේ මැතිවරණ වංචාවනුත් නිතරම බහුල ලෙස පැවතුනි. නව, සිරිතට වෙනස්, අවස්ථාවාදී නොවන, පුද්ගලික වාසි නොතකන පාර්ලිමේන්තුවාදයක් ඇති කිරීමට බටහිර යුරෝපයේ සහ ඇමෙරිකාවේ කොමියුනිස්ට්වරු උගත යුතුය. කොමියුනිස්ට් පක්ෂ ඒවායේ සටන් පාඨ නිකුත් කළ යුතුය. නියම නිර්ධන පංතිකයන්, සංවිධාන නොවූ සහ පැගෙන දුප්පතුන්ගේ සහායද ලබා ගනිමින් පත්‍රිකා බෙදහැරිය යුතුය. ගම්බද නිර්ධනයන්ගේ දුර බැහැර ගම්වල ගොවිජනයාගේ නිවෙස් සහ පැල්පත්වලට ගොස් කරුණු විස්තර කර දිය යුතුය (වාසනාවකට මෙන් යුරෝපයේ තිබෙන දුර බැහැර ගම් රුසියාවට වඩා කීප ගුණයකින් අඩුය. එංගලන්තයේ එම සංඛ්‍යාව ඉතාමත්ම අඩුය). ඔවුන් පොදුජන ස්ථානවලට, සංගම් තුළට පොදු ජනතා සමිති හා අහම්බෙන් සෙනඟ එකතුවන තැන්වලට ගොස්, උගත් හා ශිෂ්ටයෙන් (නැතහොත් පාර්ලිමේන්තු භාෂාවෙන්) තොරව, ජනතාවට කථා කළ යුතුය. ඔවුන් පාර්ලිමේන්තුවේ "ආසන ලබා ගැනීමට" කිසිසේත් උත්සාහ නොකළ යුතුය. ඔවුන් උත්සාහ කළ යුත්තේ ජනතාවට සිතන්නට සැලැස්වීමය. පොදු ජනතාව අරගලයට අද්ද ගැනීමටය. ධනපතියන් කියන දේ එසේ ගනිමින්, ඔවුන් පිහිටුවා තිබෙන යන්ත්‍රයෙන්ද නිල කරන මැතිවරණවලින්ද, ඔවුන් ජනතාවට කරන ආයාචනාවලින්ද, ප්‍රයෝජන ගැනීමටය. මැතිවරණ කාලවලදී හැර (ධනපති පාලනය යටතේ) වෙනත් කිසිම කලෙක නොකළ හැකිවූ පරිද්දෙන් නිර්ධන පංතිකයෝ ජනතාවට බොල්ෂෙවික්වාදය යනු කුමක්දැයි විස්තර කර දිය යුත්තාහ (එසේ වුවද රුසියාවේ පැතිරීගිය පොදුජන උද්ඝෝෂණය සඳහා වූ එවැනි යන්ත්‍රයක් වැඩ වර්ජන කාලවලදී මැතිවරණ කාලවලටත් වඩා උත්සන්න ලෙස ක්‍රියාත්මක විය). බටහිර යුරෝපයේ මෙය කිරීම

දුෂ්කරය. ඇමෙරිකාවේ එය කිරීම ඉතාමත් දුෂ්කරය. නමුත් එය කළ හැකිය, කළ යුතුය. මහත් පරිශ්‍රමයක් නොදරා කොමියුනිස්ට්වාදයේ අරමුණු ඉටු කර ගත හැකි නොවේ. අප වැඩ කළ යුත්තේ වඩ වඩාත් විවිධාකාර සහ සමාජ ජීවිතයේ සියලුම අංශ සමග වඩ වඩාත් සමීප ලෙස සම්බන්ධ වූ ප්‍රායෝගික කර්තව්‍යයන් ඉටු කිරීමට සහ එමගින් සමාජ ජීවිතයේ අංශයෙන් අංශය, ක්ෂේත්‍රයෙන් ක්ෂේත්‍රය ධනපති පංතියෙන් දිනා ගැනීමට ය.

තව දුරටත්, මහා බ්‍රිතාන්‍යයේ යුද්ධ හමුද තුළ සහ "තමන්ගේම" රාජ්‍යයේ සිටින පීඩිත සහ අයිතිවාසිකම් අහිමි ජාතීන් (අයර්ලන්තය සහ යටත් විජිත) අතර ප්‍රචාරය, උද්ඝෝෂණය සහ සංවිධානය කිරීමේ වැඩ ද නව (සමාජවාදී නොවන, එහෙත් කොමියුනිස්ට් වන, ප්‍රතිසංස්කරණවාදී නොවන, එහෙත් විප්ලවවාදී වන) හැඩයකින් කළ යුතු වේ. අප එසේ කළ යුත්තේ පොදු වශයෙන් අධිරාජ්‍යවාදයේ යුගයේදී සහ ජනතාවට දරුණු වධයක් වූ හා ඉක්මනින්ම ඔවුන්ට සත්‍යය (එනම්, වැඩිම රටවල් ගණනක් කොල්ල කෑ යුත්තේ බ්‍රිතාන්‍ය නැතහොත් ජර්මන් මංකොල්ල කරුවන්ද යන්න තීරණය කරනු සඳහාම පමණක්, කෝටි ගණන් ජනයා මරුමුවට හා අබ්බාගාතභාවයට පත්කරන ලද බව) පෙනෙන සේ ඔවුන්ගේ නෙත් පෑදූ යුද්ධයෙන් ඉක්බිති මේ කාලයේ දී සමාජ ජීවිතයේ මෙම සියලු අංශයන්ම ගිනි ගන්නා ද්‍රව්‍යවලින් පිරී පවතින බැවිනි. එම අංශ සියල්ලක්ම සට්ටන, අර්බුද සහ පංති අරගලයේ උත්සන්න වීමක් ඇති වීමට හේතු නිර්මාණය කරන බැවිනි. ලෝක ආර්ථික සහ දේශපාලන අර්බුදයේ ප්‍රතිඵලයක් වශයෙන් සියලුම රටවල විසිරී යමින් පවතින නිමක් නැති ගිනි පුපුරු අතුරෙන් කුමන ගිනි පුපුරෙන්, ජනතාව නගා සිටුවීමේ අර්ථයෙන්, ගිනිජාලය දල්වෙයිද යනු අපි නොදන්නෙමු. අපට එය දැනගත නොහැකිය. එනිසා සෑම සියලු කොටසක්ම, පැරණිතම, අන්තයටම පුස් බැඳුණු හා පෙනුමෙන් වැඩකට පවා නැති ක්ෂේත්‍රයන් වුවද අවදි කරවීමට අපි අපගේ නව කොමියුනිස්ට් ප්‍රතිපත්ති අනුව වැඩ ආරම්භ කළ යුත්තෙමු. එසේ නොකළහොත්, අපට අපගේ කර්තව්‍යයන් ජය ගත නො හැකි වන්නේය. අප අංග සම්පූර්ණ සූදානමෙන් නොසිටියා වන්නේය. ආයුධ සියල්ල අත්පත් කර නොගත්තා වන්නේය. ධනපති පංතිය (සමාජ ජීවිතයේ අංශ සියල්ලම සකස් කළ හා දැන් ඒවා අවුල් කර තිබෙන ධනපති පංතිය) පරදවා ජයග්‍රහණය අත් පත් කර ගැනීමට හෝ, එම ජයග්‍රහණයෙන් අනතුරුව සමාජයේ සෑම ක්ෂේත්‍රයකම කොමියුනිස්ට් ප්‍රතිසංවිධානයක් කිරීමට හෝ සූදානම් නොවෙනවා වන්නේය.

ධනපති පංතියවත්, අමනයින්වත්, අපේක්ෂා නොකළ පරිද්දෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රුසියාවේ නිර්ධන පංති විප්ලවය ඇති වීමෙන් හා එය ජාත්‍යන්තර පරිමාණයෙන් ලත් ජයග්‍රහණවලින් පසුව, මුළු ලෝකයම වෙනස් වී ඇත. ඒ අනුව සෑම තන්හිම ධනපති පංතියද වෙනස් වී ඇත. එය ''බොල්ෂෙවික්වාදයට'' බියෙන් සන්ත්‍රාස වී සහ උමතුවන තරමට එයින් කුපිත වී ඇත. ඒ හේතුව නිසාම එය එක් අතකින් සිදුවීම්වල ගමන ඉක්මන් කරයි. අනිත් අතින් එය බලහත්කාරයන් බොල්ෂෙවික්වාදය යටපත් කිරීම සඳහා ප්‍රයත්න සංකේන්ද්‍රණය කරයි. එසේ කිරීමෙන් ධනපති පංතිය ක්ෂේත්‍ර ගණනාවක්හිම ස්වකීය තත්වය දුර්වල කර ගනියි. සියලුම දියුණු රටවල කොමියුනිස්ට්වරු ඔවුන්ගේ උපක්‍රම තීරණය කිරීමේදී මෙම කරුණු දෙකම සැලකිල්ලට ගත යුතුය.

රුසියානු කැඩෙට්වරු සහ කෙරෙන්ස්කි ලා දරුණු ලෙස බොල්ෂෙවික්වරුන් දඩයම් කිරීම පටන් ගත් විට විශේෂයෙන්ම 1917 අප්‍රේල් මාසයේ සිට සහ ඊටත් වඩා 1917 ජූනි සහ ජූලි මාසවලදී, පමණ ඉක්මවා මර්දනයෙහි යෙදුනහ. ධනපති පුවත්පත් පිටපත් කෝටි ගණන් මගින් බොල්ෂෙවික් වරුන්ට විරුද්ධව නොයෙක් තාලවලින් කළ ඝෝෂණය, බොල්ෂෙවික්වරු ගැන කරුණු දැන ගැනීමට පොදුජනතාවට ආධාරයක් විය. ධනපති පංතියේ ''උත්සුක්තභාවයේ'' ප්‍රතිඵලයක් වශයෙන්, පුවත්පත්වලට අමතරව, ජන ජීවිතය මුළුමණින්ම බොල්ෂෙවික්වාදය ගැන කෙරෙන සාකච්ඡාවලින් පිරී ගියේය. අද සියළුම රටවල කෝටිපතියෝ අපගේ ස්තුතිය ලැබීම සුදුසු වන පරිද්දෙන් ජාත්‍යන්තර පරිමාණයෙන් ක්‍රියාකරති. කෙරෙන්ස්කි සහ සමාගම තරම්ම උත්සුක්ත ලෙසින් ඔවුහු බොල්ෂෙවික්වාදය දඩයම් කිරීමෙහි යෙදෙති. කෙරෙන්ස්කි කළ මෙන්ම ඔවුහුද පමණ ඉක්මවා මර්දනය කිරීමෙහි යෙදෙති. ප්‍රංස ධනපති පංතිය බොල්ෂෙවික්වාදය මැතිවරණයේ ප්‍රධාන ප්‍රශ්නය කර ගනිමින්, සංසන්දනීය වශයෙන් මැදහත්, නැතහොත්, වැනෙන සුළු සමාජවාදීන්ට බොල්ෂෙවික්වාදීන්යයි කියා චෝදනා කරන විට, සම්පූර්ණයෙන්ම උන්මත්තක ස්වභාවයක් ගත් ඇමෙරිකානු ධනපති පංතිය, දහස් ගණන් ජනයා බොල්ෂෙවික්වරුන් යයි සැක කොට අත් අඩංගුවට ගනිමින් භීතියේ වාතාවරණයක් නිර්මාණය කරන විට හා බොල්ෂෙවික් කුමන්ත්‍රණ ගැන කථා ගුවන්විදුලියෙන් ප්‍රචාරය කරනවිට, ලෝකයේම වඩාත් ''ශක්තිමත්'' ධනපති පංතිය වන බ්‍රිතාන්‍ය ධනපති පංතිය කොතරම් නැණවත් හා පළපුරුදු කම් සහිත වුවත්, අදහාගන්නට පවා බැරි තරම් අන්ත මෝඩකම් කරමින් අතිවිශාල මුදල් සම්භාරයන් ලබන ''බොල්ෂෙවික් විරෝධී සමාජ'' පිහිටුවන විට සහ බොල්ෂෙවික්වාදයට විරුද්ධව සටන් කිරීම සඳහා විද්‍යාඥයන්, උද්ඝෝෂකයන් සහ පූජකවරුන් අතිරේක සංඛ්‍යාවක් බඳවා ගන්නා විට, අපි ධනපතියන්ට

ආචාර කර ඔවුන්ට ස්තුති කළ යුත්තෙමු. ඔවුන් වැඩ කරන්නේ අපට වාසිවන ආකාරයෙනි. බොල්ෂෙවික්වාදයේ හරය සහ වැදගත්කම ගැන පොදු ජනතා උනන්දුවක් ඇති කිරීමට ඔවුහු අපට ආධාර වෙති. බොල්ෂෙවික්වාදය නොතකා හැරීමට සහ එය මැඩලීමට ඔවුන් දැනටමත් අපොහොසත් වී සිටින නිසා අපට ආධාර වන ලෙසින් කටයුතු නොකර බැරි තත්වයට ඔවුහු පත්වී සිටිති.

නමුත්, බොල්ෂෙවික්වාදයේ එක පැත්තක් පමණක්, නැතහොත්, කැරළි ගසා නැගී සිටීම, ප්‍රචණ්ඩ භාවය හා ත්‍රස්තය පමණක් දකින ස්වභාවයක් ධනපති පංතියට ඇත. එනිසා මූලික වශයෙන් මෙම ක්ෂේත්‍රයෙහිදී ප්‍රතිරෝධය සහ විරුද්ධත්වය දැක්වීම සඳහා එය සූදනම් වන්නේය. සමහර අවස්ථාවලදී, සමහර රටවලදී හා යම් යම් කෙටි කාලසීමාවලදී, එය මෙම කාර්යයෙන් සාර්ථකත්වය ලබන්නට පිළිවන. එවැනි අවස්ථා ඇති විය හැකි බව අපි සැලකිල්ලට ගත යුත්තෙමු. නමුත් එය එසේ සිදු වුවත් අපට බිය වීමට කිසිම හේතු වක් නැත. කොමියුනිස්ට්වාදය ඒකාන්ත වශයෙන්ම සමාජ ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකින්ම ඉස්මතුවන්නේය. එහි ආරම්භය සෑම පැත්තකින්ම පාහේ දක්ක හැකිය. මෙම ''වසංගතය'' (ධනපති පංතිය සහ ධනපති පොලීසිය නිතරම පාවිච්චි කරන සහ ඔවුන්ට ප්‍රිය වචනය එයයි) ජීවේන්ද්‍රිය තුළට සම්පූර්ණයෙන්ම කාවැදී, එය පුරාම පැතිරී ඇත. මෙම ''වසංගතය'' පැතිරී යන මාර්ග අතුරෙන් එකක් හිර කිරීමට විශේෂ ප්‍රයත්න දරතොත්, එය, සමහරවිට ඉතාමත් අනපේක්ෂිත ලෙස වෙනත් මාර්ගයක් සොයා ගනු ඇත. ජීවිතය එහි බලය පා ක්‍රියාත්මක වනු ඇත. ධනපති පංතිය කෝපාවේශව දෙඩෙව්වාවේ. වියරුවෙන් දැහලුවාවේ. අන්තයට ගියාවේ. මෝඩකම් කළාවේ. බොල්ෂෙවික්වරුන්ගෙන් කල් තබා පළිගනිමින් (ඉන්දියාවේ, හංගේරියාවේ, ජර්මනියේ ආදියෙහි මෙන්) ඊයේ සහ හෙට දින කොමියුනිස්ට්වාදීන් තවත් සිය ගණනින්, දහස් ගණනින් සහ ලක්ෂ ගණනින් නසා දමන්නට උත්සාහ කළාවේ. එසේ ක්‍රියා කිරීමෙන් ධනපති පංතිය කරන්නේ ඓතිහාසික වශයෙන් විනාශයට ඉරණම්වූ සෑම පංතියක්ම කළ දේමය. මොනවා වුවත්, අනාගතය තමන් සතු බව කොමියුනිස්ට්වරු දත යුතුය. එනිසා අප කළ යුත්තේ, ධනපති පංතියේ උමතු දෙඩවිලි ගැන කරන ඉතාමත් සන්සුන් සහ ඥානවන්ත ඇගැයීම, මහා විප්ලවවීය අරගලයේ දී දක්වන ඉතාමත් උත්සන්න අනුරාගය හා සමග ඒකාබද්ධ කිරීම වේ. 1905 දී රුසියානු විප්ලවය කෲරතර ලෙස පරාජය කරන ලදී. 1917 ජූලි මාසයේදී රුසියානු බොල්ෂෙවික්වරු පරාජය කරනු ලැබූහ. ධනපති සහ රාජාණ්ඩුවාදී සේනාපතියන් සමග අතිනත් ගෙන ක්‍රියා කළ ෂයිඩමාන්ගේ සහ නොස්කේගේ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ජඩ ප්‍රකෝප කිරීම් සහ කූට උපායයන් නිසා, 15,000 ක් ජර්මන් කොමියුනිස්ට්වරු මරා දමන ලදහ. පින්ලන්තයේ සහ හංගේරියාවේ ධවල ත්‍රස්තය රජයන්නේය. නමුත් සියලුම තැන්වල සහ සියලුම රටවල කොමියුනිස්ට්වාදය දෘඩතර වෙමින් වර්ධනය වන්නේය. එහි මුල් බොහෝ ගැඹුරට විහිදී ඇත. එනිසා මර්දනයෙන් එය දුර්වල වන්නේ හෝ අබලන් වන්නේ හෝ නැත. එයින් සිදුවන්නේ, එය ශක්තිමත් වීම පමණකි. වැඩි විශ්වාසයක් සහ ස්ථිරත්වයක් ඇතිව ඉදිරියට ගමන් කළ හැකි වනු පිණිස අපට අඩුව ඇත්තේ එක් දෙයක් පමණකි. එනම්, සියලුම රටවල සියලුම කොමියුනිස්ට්වරු ඔවුන් අනුගමනය කරන උපක්‍රම අතිශයින් නම්‍ය ශීලී වීමේ අවශ්‍යතාවය පිළිබඳව විශ්වීය හා අංග සම්පූර්ණ අවබෝධයක් ඔවුන්ට නොතිබීමේ අඩුවය. විශේෂයෙන්ම දියුණු රටවල ඉතාමත් විශිෂ්ට අන්දමින් සංවර්ධනය වෙමින් පවතින කොමියුනිස්ට් ව්‍යාපාරයට මෙම අවබෝධය හා එය ව්‍යවහාරික ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාව අඩුය.

කෞට්ස්කි ඔටො බෞවර් සහ වෙනත් අය වැනි දෙවැනි ජාත්‍යන්තරයේ නායකයින්ට සිදු වූ දෙය, සමාජවාදයට කැපවූ මහා උගත් මාක්ස්වාදීන්ට සිදුවූ දෙය ප්‍රයෝජනවත් පාඩමක් විය හැකිය (විය යුතුය). නම්‍යශීලී උපක්‍රම අවශ්‍ය බව ඔවුහු සම්පූර්ණයෙන්ම වටහා ගෙන සිටියහ. ඔවුහු තමන්ම මාක්ස්වාදී දයලෙක්තික ක්‍රමය උගෙන ගෙන, එය වෙනත් අයට ද උගැන්වූහ (මෙම ක්ෂේත්‍රයෙහි දී ඔවුන් කළ බොහෝ ලියවිලි මාක්ස්වාදී සාහිත්‍යයට එකතු කළ වටිනා කෘති ලෙසට පවතිනු ඇත). එසේ වී නමුත්, මෙම දයලෙක්තිකය ක්‍රියාවට පෙරළීමේදී ඔවුහු ඉතා බරපතල වරදක් කළහ. නැතහොත් ව්‍යවහාරයේදී දයලෙක්තික ක්‍රමයෙන් තොර බවට පත්වූහ. ආකෘති සීඝ්‍රයෙන් වෙනස් වන බව හා පැරණි ආකෘති නව සන්ධාරයන් අත් කරගන්නා බව සැලකිල්ලට ගැනීමට ඔවුහු අපොහොසත් වූහ. එනිසාද ඔවුන් වැටුනේ හයින්ඩ්මන්, ගේද් සහ ප්ලෙහානව් යන අයට වඩා ප්‍රශංසනීය තත්වයකට නොවේ. ඔවුන් එසේ බංකොලොත් වීමට ප්‍රධාන හේතුව වූයේ, කම්කරු පංති ව්‍යාපාරයේ සහ සමාජවාදයේ වර්ධනයෙහි එක නිශ්චිත ආකෘතියකින් මෝහනයට පත්වීමය. එම ආකෘතියේ ඒකාංශ ස්වභාවය සම්පූර්ණයෙන්ම අමතක කර දැමීමය. වාස්තවික කොන්දේසි විසින් අනිවාර්යත්වයට පත් කරන ලද බිඳී යාම දැකීමට බියෙන්, කටපාඩම් කරගත් ඉතා සරල සහ "තුන දෙකට වඩා අධිකය" යන වැනි බැලූ බැල්මට අවිවාදී සේ පෙනෙන ප්‍රත්‍යක්ෂයන් දිගටම පුනරුච්චාරනය කිරීමෙහි යෙදීමය. නමුත් දේශපාලනය අංක ගණිතයට වඩා වීජ ගණිතය මෙනි. එමතු ද නොව, මූලික ගණිතයට වඩා උසස් ගණිතය මෙනි. ඇත්ත වශයෙන්ම සමාජ-

වාදයේ පැරණි ආකෘති සියල්ලම නව සන්ධාරයක් ඇතුළත් කොට ගෙන ඇත්තේය. එසේම, සියලුම සංඛ්‍යා ඉදිරියෙන් නව ලකුණක්, එනම් "ඍණ" ලකුණ භාවිතයට පැමිණ ඇත්තේය. එසේ නමුත්, "ඍණ දෙකට" වඩා "ඍණ තුන" අධිකයයි තමන්ට ඒත්තු ගැන්වීමෙහි ලා අපේ පණ්ඩිතයෝ දිගටම නිරත වූහ (එසේම දැනුදු නිරත වෙති).

කොමියුනිස්ට්වරු, නොපිට පෙරළූ අර්ථයෙන් වන මෙවැනි වැරදි නොකරන බවට අපි වග බලා ගත යුත්තෙමු. එසේ නැතහොත්, "වාම" කොමියුනිස්ට්වාදීන් විසින් නොපිට පෙරළූ අර්ථයෙන් කරනු ලබන එවැනි වරදක් හැකි තරම් ඉක්මණින් නිවරද කරනු දැකීමටත්, හැකි තරම් සීඝ්‍ර ලෙස හා වේදනා රහිත ලෙස බැහැර කරනු දැකීමටත්, අපි වග බලා ගත යුත්තෙමු. වැරදි වන්නේ දක්ෂිණාංශික දෘෂ්ඨි නිවේශකවාදය පමණක් නොවේ. වාමාංශික දෘෂ්ටි නිවේශකවාදය ද, වැරදිය. නමුත් වර්තමානයේ කොමියුනිස්ට්වාදය තුළ කෙරෙන වාමාංශික දෘෂ්ටි නිවේශකවාදයේ වරද දක්ෂිණාංශික දෘෂ්ටි නිවේශකවාදයේ (එනම්, සමාජ-ජාත්‍යොන්මාද වාදයේ සහ කෞට්ස්කිවාදයේ) වරදට වඩා අන්තරාය හා වැදගත්කම අතින් දහස් වරක් සුළුය. එසේ වුවත්, ඊට හේතු වන්නේ වාම කොමියුනිස්ට්වාදය ඉතාමත් ළාබාල උපනතියක් වීමය. එය තවමත් බිහිවෙමින් පවතින උපනතියක් වීමය. සමහර තත්වයන් යටතේ මෙම රෝගය පහසුවෙන් වදකර දැමිය හැකිව තිබෙන්නේ, එම හේතුව නිසාම පමණකි. එසේම එය වඳ කර දැමීම සඳහා අපි ඉමහත් ධෛර්යයෙන් කාර්යාරම්භ කළ යුත්තෙමු.

පැරණි ආකෘතිවල නව සන්ධාරය වන නිර්ධන පංති විරෝධී සහ ප්‍රතිගාමී ස්වභාවය, පමණ ඉක්මවා සංවර්ධනය වී ඇති හෙයින් එම පැරණි ආකෘති පුපුරා දෙපළු වී යන්නේය. ජාත්‍යන්තර කොමියුනිස්ට්වාදයේ සංවර්ධනයේ ස්ථාවරයෙන් බලන කල අප අද කරන වැඩ කටයුතුවල අන්තර්ගත සන්ධාරය (සෝවියට් බලය හා නිර්ධන පංතියේ ආඥාදායකත්වය) කොතරම් චිරස්ථායීද හා කොතරම් බලවත්ද යත්, අළුත් හා පරණ යන දෙවර්ගයේම ඕනෑම ආකෘතියක් තුළ එය විද්‍යමාන විය හැකිය හා විද්‍යමාන විය යුතුය. පැරණි ආකෘති සමග පෑහීම සඳහා නොව, අළුත් සහ පැරණි යන සෑම සියලු ආකෘතියක්ම කොමියුනිස්ට්වාදයේ සම්පූර්ණ සහ නොමැකිය හැකි ජයග්‍රහණය ලැබීම පිණිස උපයෝගි කර ගන්නා අවියක් ලෙසට යොදා ගනු වස්, අළුත් පමණක් නොව පැරණි වූ ද ආකෘති සියල්ලම ප්‍රතිජනනය කරවීමට, ජය ගැනීමට හා යටත් කිරීමට, එම සන්ධාරයට හැකිය. එය එසේ කළ යුතුය.

ලෝක පරිමාණයෙන් සෝවියට් බලය සහ නිර්ධන පංති ආඥාදායකත්වය ජයග්‍රහණය කිරීම කරා යන ඍජුතම සහ කෙටිම මාර්ගය ඔස්සේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කම්කරු පංති ව්‍යාපාරය සහ පොදු වශයෙන් සමාජ සංවර්ධනය මෙහෙයවීම පිණිස කොමියුනිස්ට්වරු සෑම පරිශ්‍රමයක්ම යෙදිය යුතුය. එය අවිවාදයෙන් පිළිගත යුතු සත්‍යයකි. නමුත් එතැන් සිට තවත් එක පියවරක් ඔබ්බට තැබූ පමණින් — එය එම පැත්තටම තබන පියවරක් සේ පෙනුනත් — එම සත්‍යය වරදක් බවට හැරේ. ජර්මන් සහ බ්‍රිතාන්‍ය වාම කොමියුනිස්ට්වාදීන් කියන ලෙසට, අපි එකම මගක් පමණක්, කෙළින් මාර්ගය පමණක් පිළිගන්නෙමු යයි ද, පිළිවෙත වෙනස් කිරීමට, සමහන්කාරී උපායයන් යෙදීමට නැතහොත් සම්මුති ඇති කර ගැනීමට අපි ඉඩ නොදෙන්නෙමු යයි ද කී පමණින්, අපි වරදට වැටෙන්නෙමු. එම වරද නිසා කොමියුනිස්ට්වාදයට බරපතල හානි සිදු විය හැකිය. දැනටමත් එයින් බරපතල හානි සිදුවී ඇත. එසේම එයින් තවමත් හානි සිදුවන්නේය. දක්ෂිණාංශික දෘෂ්ටි නිවේශකවාදය පැරණි ආකෘති පමණක් පිළිගැනීමෙහි එල්බගෙන සිටි හෙයින්, එය නව ආකෘති නොදුටු අතර එනිසා බංකොලොත් වූයේය. නව සන්ධාරය සෑම සියලු ආකෘතියක්ම තුළට කාවදින බව නොදක්නා, එසේම සියලුම ආකෘති සම්බන්ධයෙන් සාමාර්ථයක් ලැබීමත්, එක ආකෘතියකට අතිරේකව තවත් එකක් උපරිම සීඝ්‍රතාවයකින් යොදා ගැනීමට, එකක් වෙනුවට තවත් එකක් එසේම ආදේශ කිරීමට සහ අපගේ පංතියෙන්, නැතහොත්, අපගේ ප්‍රයත්නවලින් පිටස්තරව පැන නගින ඕනෑම වෙනසකට සරිලන සේ අපගේ උපක්‍රම සකසා ගැනීමට උගෙන ගැනීමත්, කොමියුනිස්ට්වරුන් වශයෙන් අපගේ යුතුකම වන බව නොදක්නා වාම දෘෂ්ටි නිවේශකවාදීහු, යම් යම් පැරණි ආකෘති කොන්දේසි විරහිතව අත්හැර දැමීමේ අදහසෙහි එල්බ ගනිති.

ලෝක අධිරාජ්‍යවාදී යුද්ධයේ බිහිසුණු කම්, නීචකම් හා දුෂ්ටකම්-වලින්ද, එම යුද්ධයෙන් උද්‍ වී තිබෙන අන්ත දුෂ්කර තත්වයෙන්ද, ලෝක විප්ලවයට ලැබෙන බලවත් දිරිගැන්වීම හා වේගීතාවය ගැන සලකා බලන කල, මෙම විප්ලවය මහත් පරිමාණයෙන්, ගැඹුරෙන් හා විශිෂ්ට සීඝ්‍රතාවයකින් යුතුවද, වෙනස් වෙමින් පවතින එතරම් මවිතකර තරම් විශාල ආකෘති සංඛ්‍යාවක් සහිතවද, දෘෂ්ටි නිවේශකවාද සියල්ලක්ම ඉතාමත් උපදේශාත්මක ලෙස හා ප්‍රායෝගික ලෙස නිෂ්ප්‍රභා කරමින්ද, සංවර්ධනය වන ආකාරය ගැන සලකා බලන කල, ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයට වැළඳී තිබෙන ''වාමාංශික'' ළදරු වලිප්පු රෝගය ඉක්මණින්ම සුව වනු ඇතැයි යන බලාපොරොත්තුව ඇති කර ගැනීමට සෑම හේතුවක්ම තිබේ.

1920 අප්‍රේල් 27.

අතිරේකය

නිර්ධන පංති විප්ලවය කිරීම ගැන පළිගැනීමක් වශයෙන් මුළු ලෝකයේම අධිරාජ්‍යවාදීන් විසින් කොල්ලකන ලද හා ඔවුන් ඔවුන්ගේ කම්කරුවන්ට දුන් පොරොන්දු සියල්ලම නොතකා තවමත් කොල්ලකනු ලබන හා අවහිර කිරීම්වලට භාජනය කරනු ලබන අප රටේ ප්‍රකාශක ආයතනවලට මගේ පොත මුද්‍රණය කර නිකුත් කරන්නට හැකි වීමට මත්තෙන්, විදේශයෙන් අතිරේක තොරතුරු ලැබුණේය. මගේ පොතෙන් ඉදිරිපත් කෙරෙන්නේ දේශපාලන විචාරකයෙකුගේ කඩිනම් සටහන් කීපයකට වැඩි යමක් නොවන බව කියන අතරම, කරුණු ස්වල්පයක් ගැන කෙටියෙන් විස්තර කරමි.

I

ජර්මන් කොමියුනිස්ට්වරුන් අතර භේදය

ජර්මන් කොමියුනිස්ට්වරුන් අතර භේදය දැන් සිදුවී හමාර වූ දෙයකි. ''වාම'' වාදීහු නැතහොත් ''ප්‍රතිපත්තිය රකින විරුද්ධ පාර්ශවය'' කොමියුනිස්ට් පක්ෂයෙන් වෙන් වූ කොමියුනිස්ට් කම්කරු පක්ෂයක් වෙනම පිහිටුවා ගෙන සිටිති. ඉතාලියේද භේදයක් සිදුවීමට ඉතා ආසන්න සේ පෙනේ. මා ''පෙනේ'' යන වචනය යොදන්නේ, මට ලැබී තිබෙන්නේ වාම පුවත්පත වන ''Il Soviet'' පත්‍රයෙන් අතිරේක කලාප (අංක 7 හා 8) දෙකක් පමණක් හෙයිනි. භේදයක් වීමේ හැකියාව සහ අවශ්‍යතාවය ගැන එම කලාපවල විවෘත ලෙස සාකච්ඡා කෙරේ. තවමත් ඉතාලි සමාජවාදී පක්ෂයේ කණ්ඩායමක් වන ''වර්ජක'' කණ්ඩායමේ (නැතහොත්, වර්ජනය කරන්නන් ගේ, එනම්, පාර්ලිමේන්තුවට සහභාගි වීමට විරුද්ධ අයගේ) සම්මේලනයක් ගැන පවා එහි සඳහන් වේ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

"වාම" වාදීන් සමග, පාර්ලිමේන්තු විරෝධීන් සමග (අර්ධ වශයෙන් ඔවුහු සෑම දේශපාලන පක්ෂයකටත්, වෘත්තීය සමිති සමග වැඩ කිරීමටත් විරුද්ධ වන දේශපාලන විරෝධීන්ද වෙති) භේද වීමද, 'මධ්‍යස්ථ" වාදීන් (එනම්, කෞට්ස්කිවාදීන්, ලොංගේවාදීන්, ස්වාධීනයන් යනාදීන්) සමග වූ භේදය මෙන් ජාත්‍යන්තර ප්‍රපංචයක් බවට පත් වනු ඇතැයි යන බිය ඇති කර ගැනීමට හේතු තිබේ. එය එසේ වේවා. පක්ෂයේ දෘෂ්ටිමය, න්‍යායික සහ විප්ලවවාදී වර්ධනයට සහ මේරීමට මෙන්ම නිර්ධන පංති ආඥාදායකත්වය වෙත ලඟා වීමට එය කරන සංගත සහ සැබැවින්ම සංවිධානාත්මකවූ ප්‍රායෝගික වැඩ කටයුතුවලටද බාධක වන වියවුල් සහිත තත්වයට වඩා භේදය කොහොමටත් හොඳය.

ජාතික හා ජාත්‍යන්තර පරිමාණයෙන් කමන්ම ප්‍රායෝගික වශයෙන් පරීක්ෂණයකට භාජනය වීමේ අවස්ථාව "වාම" වාදීන්ට දෙමු. අයෝමය විනයකින් සමන්විත, තදබල සේ මධ්‍යගත වූ පක්ෂයක් නොමැතිව, දේශපාලන හා සංස්කෘතික වැඩ පිළිබඳ සෑම ක්ෂේත්‍රයක්ම, සෑම අංශයක්ම, සෑම වර්ගයක්ම සම්බන්ධයෙන් සාමාර්ථය ලැබීමේ හැකියාව නොමැතිව නිර්ධන පංති ආඥාදායකත්වය සඳහා සූදානම් වීමට (සහ අනතුරුව එය ක්‍රියාත්මක කිරීමට) ඔවුන් ප්‍රයත්න දරුවාවේ. කල් මත්තෙන්ම ප්‍රායෝගික අත් දැකීමෙන් ඔවුන් පාඩම් උගෙන ගනු ඇත.

එහෙත්, අවශ්‍යයෙන්ම හා අනිවාර්යණීය වශයෙන්ම කළ යුතු පරිදි, සෝවියට් ආණ්ඩුවට සහ නිර්ධන පංති ආඥාදායකත්වයට අවංකව හා ඉත සිතින් පක්ෂ වන කම්කරු පංති ව්‍යාපාරයේ කොටස් කරුවන් සියළු දෙනාම, නුදුරු අනාගතයේදී එකම පක්ෂයක් තුළට එකතු කිරීමේ කටයුත්තට "වාම" වාදීන් සමග භේද වීමෙන් පාඩුවක් වීම වැලැක්වීමට, නැතහොත්, සිදුවන පාඩු හැකි තරම් අඩු කිරීමට, සෑම පරිශ්‍රමයක්ම දැරිය යුතුය. රුසියාවේ පොදු ජනතාව නිර්ධන පංති ආඥාදායකත්වය සඳහා එක එල්ලේම සටන් ආරම්භ කරන්නට බොහෝ කලකට පෙර, මෙන්ෂෙවික්වරුන්ට (එනම්, අවස්ථාවාදීන්ට සහ "මධ්‍යස්ථවාදීන්ට") සහ "වාම" වාදීන්ට යන දෙකොටසටම විරුද්ධව පසළොස් අවුරුද්දක ක්‍රමානුකූල සහ පරිපූර්ණ අරගලයක් කරන්නට ලැබීම රුසියාවේ බොල්ෂෙවික් වරුන්ගේ භාග්‍යයක් විය. යුරෝපයේ සහ ඇමෙරිකාවේ එම කටයුතු දැන් කිරීමට සිදුවී තිබෙන්නේ බලවත් පරිශ්‍රමයෙනි. සමහර, විශේෂයෙන්ම අසාර්ථක ලෙස නායකත්වය පැතුවන් අතර සිටින පුද්ගලයන් (ඔවුන් නිර්ධන පංති විනයෙන් හීන නම් හා ආත්ම වංචනයෙහි යෙදෙන අයනම්) ඔවුන්ගේ වැරදි දීර්ඝ කලක් යන තෙක් අත් නොහැරීමට ඉඩ තිබේ. එසේ වුවද, සුදුසු කාලය පැමිණි විට, සෝවියට් ක්‍රමයක් හා නිර්ධන පංති ආඥාදායකත්වයක් පිහිටුවීමෙහි සමත් එකම

කොමියුනිස්ට් පක්ෂයක් පිහිටුවන පරිද්දෙන්, කම්කරු පොදු ජනතාවන් විසින්ම සියලුම අවංක කොමියුනිස්ට්වාදීන් පහසුවෙන්ම හා අවංක ලෙස එක්සත් කරනු ලැබෙනු ඇත.*

II

ජර්මනියේ කොමියුනිස්ට්වරුන් සහ ස්වාධීනයන්

කොමියුනිස්ට්වරුන් සහ ස්වාධීනයන්ගේ වාමාංශය අතර සම්මුතියක් අවශ්‍ය යයිද, එය කොමියුනිස්ට්වාදයට ප්‍රයෝජනවත් වනු ඇතැයි ද, යන අදහස මම මෙම පොතෙන් පළ කෙළෙමි. නමුත් එම සම්මුතිය ඇති කිරීම පහසු දෙයක් නොවන බවත් එහි සඳහන් කෙළෙමි. මා වෙත පසුව ලැබුණු පුවත් පත් වලින් මෙම අදහස, එහි අඩංගු කරුණු දෙකම, සනාථ වන්නේය. ජර්මනියේ කොමියුනිස්ට් පක්ෂයේ නිල පත්‍රය වන

LIBERATIONBASE

* අනාගතයේදී සාමාන්‍ය කොමියුනිස්ට් වරුන් සමග "වාම" කොමියුනිස්ට්වරුන් සහ පාර්ලිමේන්තු විරෝධීන් ඒකාබද්ධ කිරීමේ ප්‍රශ්නය ගැන පහත දක්වෙන අතිරේක අදහස් එකතු කරනු කැමැත්තෙමි. ජර්මනියේ "වාම" කොමියුනිස්ට්වාදීන් ගේ සහ සාමාන්‍ය කොමියුනිස්ට්වාදීන්ගේ පුවත් පත්, වලින් මට තොරතුරු දැනගත හැකි වූ තාක් දුරට මට පෙනෙන්නේ, මෙහි පසුකී අයට, වඩා එරටේ පොදු ජනතාව අතර උද්ඝෝෂණය ගෙන යාමේ හැකියාව මෙහි මුලින් කී අයට තිබෙන බවය. මෙවැනිම දෙයක් මම බොල්ෂෙවික් පක්ෂයේ ඉතිහාසයේදී ද, නැවත නැවතත් අත් දැක ඇත්තෙමි. නමුත් එය දක්නට ලැබුණේ ජාතික පරිමාණයෙන් නොව, වඩාත් කුඩා තනි ප්‍රාදේශීය පරිමාණයෙනි. නිදසුනක් ලෙසට, 1907–1908 කාලයේදී "වාම" බොල්ෂෙවික්වාදීහු අපට වඩා සාර්ථක ලෙස සමහර අවස්ථාවල හා සමහර තැන්වලදී පොදු ජනතාව අතර උද්ඝෝෂණය ගෙන ගියහ. මෙයට අර්ධ වශයෙන් හේතු වූයේ,විප්ලවවාදී අවස්ථාවක, විප්ලවීය මතකයන් තවමත් නැවුම්ව පවතින අවස්ථාවක, හුදු ප්‍රතිෂේධාත්මක උපක්‍රම සහිතව ජනතාවට සමීප වීමේ වැඩි පහසුව විය හැකිය. නමුත් මෙය එවැනි උපක්‍රම නිවැරදි බව ඔප්පු කිරීමට තර්කයක් නොවේ. විප්ලවවාදී පංතියේ, නිර්ධන පංතියේ නියම පෙරමුණු බල ඇණිය වීමට, ප්‍රමුඛ සේනාංකය වීමට කැමති, එසේම ඊට අමතරව නිර්ධන පංතික පමණක් නොව, වැඩ කරන හා සූරා කනු ලබන ජනතාවගේ නිර්ධන පංතික නොවන පොදු ජනතාවටද නායකත්වය දීම උගෙන ගැනීමට කැමති කොමියුනිස්ට් පක්ෂය, නාගරික පැක්ටරි සහ ගම්බද යන දෙකොටසටම අයත් පොදු ජනතාවට වැටහෙන සේ ඉතාමත් සරල ලෙස, පැහැදිලි ලෙස සහ සිත් කාවදින ලෙස ප්‍රචාරය කිරීමට, සංවිධානය කිරීමට සහ උද්ඝෝෂණය කිරීමට දැන සිටිය යුතු බව, මොන තත්වයක් යටතේ වුවද අවිවාදයෙන් පිළිගත යුතු කරුණකි.

https://liberationbase.wordpress.com

''රතු කොඩිය''[75] අංක 32 කලාපයෙහි (''Die Rote Fahne'', Zentral-organ der Kommunistischen Partei Deutschlands, Spartakus Bund, 1920 මාර්තු 26) කාප්-ලුට්විට්ස් යුදහමුද කැරැල්ල සම්බන්ධයෙන් හා ''සමාජවාදී ආණ්ඩුව'' ගැන මෙම මධ්‍යම කාරක සභාවේ ''ප්‍රකාශනයක්'' පළ කර ඇත. මෙම ප්‍රකාශනය, එහි ප්‍රධාන තර්කමූලයන් හා එහි ප්‍රායෝගික නිගමන යන දෙකෙන්ම නිවැරදිය එහි ප්‍රධාන තර්ක මූලය වී තිබෙන්නේ ''නාගරික කම්කරුවන් බහුතරය'' ස්වාධීනයන්ට ආධාර කරන නිසා නිර්ධන පංති ආඥාදායකත්වයකට ''වාස්තවික පදනමක්'' නැතැයි යන්නය. එහි නිගමනය වී තිබෙන්නේ ''ධනපති පංතික පක්ෂ අත්හැර පිහිටුවන සමාජවාදී ආණ්ඩුවකට'' හිතවත් විරුද්ධ පක්ෂයක්'' ලෙස කටයුතු කරන බවට (එනම් ''බලෙන් පෙරළා දැමීම'' සඳහා සූදනම් වීම අත් හැර දැමීමට) දෙන පොරොන්දුවකි.

මෙය බොහෝ දුරට නිවැරදි උපක්‍රමයක් බවට සැකයක් නැත. එහෙත් මෙම යෙදුමෙහි සුළු අඩුපාඩු කම් ගැන නොසලකා හැරියත්, සමාජ-ද්‍රෝහීන්ගෙන් සමන්විත ආණ්ඩුවක් ''සමාජවාදී'' යනුවෙන් (කොමියුනිස්ට් පක්ෂයේ නිල ප්‍රකාශනයක) විස්තර කෙරෙන විට ඒ ගැන ද, ෂයිඩමාන් ලාගේ සහ කෞට්ස්කි ලාගේ හා ක්‍රිස්පින් ලාගේ යන දෙපිරිසගේම පක්ෂ සුළු ධනපති පක්ෂ වන කල, යමෙක් ''ධනපති පංතික පක්ෂ'' අත් හැරීම ගැන කථා නොකළ යුතුය යන්න ගැන ද, ප්‍රකාශනයේ 4 වැනි ඡේදයේ සඳහන් දේ කිසි කලෙකත් නොලිවිය යුතුය යන්න ගැන ද, නිහඬව සිටිය නොහැක.

එහි 4 වැනි ඡේදයේ මෙසේ සඳහන්ය:

> ''...නිර්ධන පංති ආඥාදායකත්වය ඇති කිරීමේ දෘෂ්ටි කෝණයෙන් බලන කල, සීමා රහිතව දේශපාලන නිදහස භුක්ති විඳීමට හැකි සහ ප්‍රාග්ධනයේ ඒකාධිපතිත්වය ලෙසට ක්‍රියාත්මක වීමෙහි ධනපති ප්‍රජාතන්ත්‍රවාදය අපොහොසත්වන තත්වයක් පැවතීම, නිර්ධන පංති පොදු ජනයා තවදුරටත් කොමියුනිස්ට්වාදය පැත්තට දිනා ගැනීම උදෙසා අතිශයින්ම වැදගත් වන්නේය...''

එවැනි තත්වයක් කිසි කලෙකත් ඇති විය නොහැකිය. සුළු ධනපති නායකයෝ, ජර්මන් හෙන්ඩර්සන්ලා (ෂයිඩමාන්ලා) සහ ස්නෝඩන්ලා (ක්‍රිස්පින්ලා) ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ සීමාවන් ඉක්මවා නොයති. එම සීමා ඉක්මවා යාමේ හැකියාවක්ද, ඔවුන්ට නැත. අනිත් අතට ධනපති ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රාග්ධනයේ ආඥාදායකත්වයක්ම මිස අන් කිසිවක් විය නොහැකිය. කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඉතාමත් නිවැරදි අපේක්ෂාවෙන් යුතුව අත් කර ගැනීමට වෙහෙසෙමින් සිටි ප්‍රායෝගික ප්‍රතිඵල ලබා කර ගැනීම සඳහා එවැනි, ප්‍රතිපත්තිමය වශයෙන් වැරදි සහ දේශපාලන වශයෙන් හානි කර දේ ලිවීමෙහි අවශ්‍යතාවයක් නැත. (පාර්ලිමේන්තු පිළිවෙත් නොබිඳීමේ අවශ්‍යතාවයක් යමෙකුට වී නම්) මෙසේ කීම ප්‍රමාණවත් වන්නට තිබිණ: ''නාගරික කම්කරුවන් බහුතරය ස්වාධීනයන් අනුගමනය කරන තාක් කල්, එම කම්කරුවන් 'තමන්ගේම' පාර්ලිමේන්තුවක් පවත්වා ගැනීමේ අත් දැකීම තුළින් ඔවුන්ගේ අවසාන අමන-ප්‍රජාතන්ත්‍රවාදී (එනම් 'ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී') මායා මතයෙන්ද නිදහස් වීම වැලැක්වීමට, කොමියුනිස්ට්වාදීන් වන අපි කිසිවක් නොකළ යුත්තෙමු''. ඇත්ත වශයෙන්ම ඇති කර ගත යුතු, එමෙන්ම, නාගරික කම්කරුවන් බහුතරයක විශ්වාසය දිනාගත් ආණ්ඩුවක් බලෙන් පෙරළා දැමීමට දරන සියළු ප්‍රයත්නයන් කිසියම් කාලයකට අත් හැර දැමීම ඇතුළත් වන, සම්මුතියක් සඳහා එය ප්‍රමාණවත් පදනමකි. නමුත්, අයෙක් පාර්ලිමේන්තු පිළිවෙත්වලට බැඳීමෙන් තොරව කරන දෛනික පොදු ජන උද්ඝෝෂණය හා සම්බන්ධයෙන් අතිරේක වශයෙන් මෙසේ එකතු කිරීම සුදුසුය: ''ෂයිඩමාන් වැනි ජඩයින් ද, කෞට්ස්කි හා ක්‍රිස්පින් වැනි අමනයන් ද, තමන්ම රවටා ගන්නා සහ කම්කරුවන්ද රවටන ආකාරය ඔවුන්ගේ ක්‍රියාවන් මගින් හෙළිදරව් කරනු ඇත. සමාජවාදයේ, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සහ සමාජ ද්‍රෝහිත්වයේ වෙනත් ආකෘතිවල මහා කසළ ගොඩවල් ''ශුද්ධ කිරීම'' සම්බන්ධයෙන් 'පිරිසිදුතම' කාර්යය ඔවුන්ගේ ම 'පිරිසිදු' ආණ්ඩුව මගින් ඉටු කෙරෙනු ඇත.''

ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වර්තමාන නායකයන්ගේ (බලපෑම සම්පූර්ණයෙන්ම අහිමිව ගොස් ඇතැයි වැරදි ලෙස කියන ලද නමුත්, තමන් කොමියුනිස්ට්වාදීන් ලෙස නම් කර ගනිමින් නිර්ධන පංති ආඥාදායකත්වයට ''ආධාර'' දීමට ද පොරොන්දු වූ හංගේරියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ටත් වඩා, ඇත්ත වශයෙන්ම නිර්ධන පංතියට අන්තරායකාරී නායකයන්ගේ) නියම ස්වභාවය කුමක්ද යනු, කර්නිලව් කැරැල්ලේ ජර්මන් සම සිද්ධිය වූ කාප්-ලුට්විට්ස් කැරැල්ලේදී නැවතත් හෙළිදරව් විය.* කුඩා වුවත්, සිත් කාවදින කෙටි ලිපි

* ඕස්ත්‍රියානු කොමියුනිස්ට් පක්ෂයේ විශිෂ්ඨ නිල පුවත් පත වන ''රතු කොඩිය'', 1920 මාර්තු 28 හා 30 දිනවල කලාපවල, මේ ගැන ඉතාමත් පැහැදිලි, සංක්ෂිප්ත, ඒකාන්ත සහ මාක්ස්වාදී ආකාරයෙන් විස්තර කර තිබෙන බව අමතර වශයෙන් සඳහන් කරමු. (Die Rote Fahne[77], Wien 1920, NN 266 u. 267;L.L.: ''Ein neuer Abschnitt der deutschen Revolution'') [''ජර්මන් විප්ලවයේ නව අවධියක්'' — සංස්කාරක]).

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිදෙකන් එය පිළිබිඹුවේ. ඉන් එකක් කාල් කෞට්ස්කි විසින් "තීරණාත්මක පැය කීපය" යන සිරස් තලය සහිතව ස්වාධීනයන්ගේ නිල පත්‍රය වන Freiheit[76] (නිදහස) 1920 මාර්තු 30 දින කලාපයෙහි ලියන ලද ලිපිය ය. අනික, ආතර් ක්‍රිස්පින් විසින් "දේශපාලන තත්වය ගැන" යන සිරස් තලය යටතේ (එම පත්‍රයේම 1920 අප්‍රෙල් 14 දින කලාපයෙහි) ලියන ලද ලිපියය. විප්ලවවාදීන් ලෙස සිතීමේ හෝ තර්ක කිරීමේ කිසිම හැකියාවක් මෙම මහත්වරුන්ට නොමැත. මෙම මහත්වරු, තමන් "අවංකවම" නිර්ධන පංතියට උදව් කරන බව විශ්වාස කරන (!) අතරම, දුෂ්කර සහ අන්තරාදයක අවස්ථාවක් මතුවන සෑම විටෙකම නිසැකව ද්‍රෝහිකම් කිරීමෙහි ඇත්ත වශයෙන්ම යෙදෙන නිසා, ඔවුන් සෝවියට් ආණ්ඩුවේ සහ නිර්ධන පංති ආඥාදයකත්වයේ ආධාරකරුවන් බව කියා ගන්නා කල, ඔවුහු නිර්ධන පංතියට දහස්වරකින් අධික අන්තරායක් ගෙන එන අද්‍යෝනා කාරයෝ වෙති. තමන්ගේ නම කොමියුනිස්ට්වාදීන් යන්නට වෙනස් කර ගත් හංගේරියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්, ඔවුන්ගේ බියගුළු කම හා චපලකම පෙන්වමින් හංගේරියාවේ සෝවියට් බලය ඉතාමත් දුෂ්කර තත්වයට පත්ව ඇතැයි සිතමින් මිත්‍ර ගිවිසුමේ (Entente) ධනපතියන් හා අළුගෝසුවන්ගේ ඒජන්ත වරුන් වෙත අද්‍යෝනා නගමින් ගිය අවස්ථාවේදී ඔවුන්ද අපේක්ෂා කළේ නිර්ධන පංතියට "ආධාර" දීමට නොවේද?

III

ඉතාලියේ තුරාටි සහ පිරිස

ඉතාලි සමාජවාදී පක්ෂය තුළ එවැනි සාමාජිකයින්ට හා එවැනි පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමට ඉඩදීමෙන් එම පක්ෂය කළ වරද සම් සම්බන්ධයෙන් මෙම පොතෙහි මා පළ කොට ඇති කරුණු, ඉහත සඳහන් "ඉල් සෝවියට්" කලාපවලින් මනාව ස්ඵුට වේ. එපමණක් නොව බ්‍රිතාන්‍ය ලිබරල් ධනපති පංතියේ නිල පත්‍රය වන "මැන්චෙස්ටර් ගාඩියන්" පත්‍රයේ රෝම වාර්තාකරු වැනි පිටස්තර නිරීක්ෂකයෙක් ලියන දෙයින්ද, ඒවා සනාථ වේ. ඔහු තුරාටි සමග පැවැත්වූ සාකච්ඡාව ගැන විස්තර 1920 මාර්තු 12 දින එම පත්‍රයේ පළ විය. එම වාර්තාකරු මෙසේ ලියයි:

"ඉතාලියේ විප්ලව උපද්‍රවය අනවශ්‍ය තැවුලක් ඇතිකර ගැනීමට තරම් දෙයක් නොවන බව තුරාටි මහතාගේ අදහසයි. මැක්සිමලිස්ට්වරුන්* සෝවියට් න්‍යායයන් පිළිබඳ ගින්න අවුලුවන්නේ පොදු ජනතාව අවදියෙන් හා කැලඹිල්ලෙන් තබනු පිණිස පමණකි. එසේ වුවද, මෙම න්‍යායයන් හුදෙක්ම ප්‍රායෝගික භාවිතයට නැගිය නොහැකි මතිමතාන්තර, නැතහොත්, නොමේරුවැඩි පිළිවෙළ වල් වන්නේය. එයින් සිදුවිය හැක්කේ කම්කරු පංතිය අපේක්ෂා සහගත තත්වයකින් රඳවා තැබීම පමණකි. නිර්ධන පංතික නෙත් නිලංකාර කිරීම පිණිස මෙම න්‍යායයන් උපයෝගි කර ගන්නා ඒ මිනිස්සුන්ම වැටී සිටින්නේ, කම්කරු පංතිය ඔවුන් බැතියෙන් සලකන මිථ්‍යාවන් කෙරෙහිවූ ඔවුන්ගේ රැවටිල්ල හා විශ්වාසය හැර දමන මොහොත ප්‍රමාද කිරීම සඳහා, බොහෝ විට ඉතාමත් අල්ප ස්වල්ප වූ යම් යම් ආර්ථික වාසි උදුරා ගැනීමට දිනක් දිනක් පාසාම සටනක් කළ යුතු තත්වයට ය. සෑම ප්‍රමාණයකම වන සහ සෑම ආකාරයකම හේතූන් මුවාවෙන් කරනු ලබන, එසේම, තැපැල් හා දුම්රිය සේවාවන්හි වූ ඉතාමත් අළුත් වැඩ වර්ජන ද ඇතුළු වූ, දීර්ඝ වැඩ වර්ජන මාලාවක් ඇති වූයේ එහෙයිනි. දැනටමත් දුෂ්කර තත්වයක පවතින රටේ තත්වය, මෙම වැඩ වර්ජන නිසා තවත් නරක් වන්නේය. අද්‍රියාටික් ප්‍රශ්නය හා සම්බන්ධ කරදර නිසා රට අමනාපයෙන් පසුවෙයි. එය විදේශ ණය බරින් හා අගය හීන වූ මුදල් නෝට්ටු සංසරණයෙන් පීඩිතව සිටියි. එසේ වුවද, සන්සුන් කම හා සෞභාග්‍යය ගෙන ඒමෙහි සමත් එකම මග වන, ශ්‍රම විනය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ගැන අවබෝධයේ අසලකටවත් එය පැමිණ නැත..."

මෙම බ්‍රිතාන්‍ය ප්‍රවෘත්ති ලේඛකයා දෙසා තිබෙන්නේ සත්‍යයක් බව දහවල් එළිය මෙන් පැහැදිලිය. සමහර විට තුරාටි විසින්මත්, ඉතාලියේ සිටින ඔහුගේ ධනපති ආරක්ෂකයන්, ගෝලබාලයන් හා දිරි දෙන්නන් විසිනුත් මෙම සත්‍යය වසං කරනු හා නොසලකා හරිනු ලැබෙනවා විය හැකිය. සත්‍යය මෙයයි. තුරාටි, ත්‍රෙවෙස්, මොදිලියානි, දුගෝනි සහ සමාගමේ දේශපාලන අදහස් හා ක්‍රියාවන් ඇත්ත වශයෙන්ම හා හරියටම

---

* Maximalist— සම්මුතිවලට එකඟ නැතිව උපරිමයම ඉල්ලන අය. — <u>අනුවාදක</u>

https://liberationbase.wordpress.com

බ්‍රිතාන්‍ය වාර්තාකරු විස්තර කළ වර්ගයට අයත් වන්නේය. එය ඒකාන්ත සමාජ-ද්‍රෝහිත්වයයි. ධනපතියන් ධනවත් කිරීමට වෙහෙසෙන චේතන වහලුන් වන කම්කරුවන් අතර සන්සුන් කම හා විනය ඇති කිරීමට කරන කථාව දෙස බලත්වා! මෙම මෙන්ෂෙවික් කථා සියල්ලම රුසියානු අපට හොඳින් හුරු පුරුදුය! පොදු ජනතාව සෝවියට් ආණ්ඩුවට පක්ෂ වන බව පිළිගෙන තිබීම ඉතා අගනේය! සාංසිද්ධික ලෙස පැතිරී යමින් පවතින වැඩ වර්ජනවලින් ඉටු කෙරෙන විප්ලවීය කාර්ය කොටස වටහා ගැනීමට අපොහොසත් වීම මෝඩ සහ පහත් ධනපති ලක්ෂණයකි! ඇත්තෙන්ම, බ්‍රිතාන්‍ය ධනපති-ලිබරල් ප්‍රවෘත්ති පත්‍රයේ වාර්තාකරු තුරාටි සහ සමාගමට කර ඇත්තේ අයහපතකි. ඔහු කර තිබෙන්නේ, ඉතාලි සමාජවාදී පක්ෂයට ඇත්ත වශයෙන්ම තුන්වැනි ජාත්‍යන්තරයට පක්ෂ වීමට උවමනා නම්, එය එහි සාමාජිකත්වය කෙරෙන් තුරාටි සහ සමාගම තප්පු ගසා එළවා දමා නමින් සහ ක්‍රියාවෙන් යන දෙකෙන්ම කොමියුනිස්ට් පක්ෂයක් විය යුතුය යනුවෙන් ඉල් සෝවියට් පත්‍රයේ බොර්දිග සහෝදරයා සහ ඔහුගේ මිතුරන් කරන ඉල්ලීමේ නිරවද්‍යතාවය අනගි ලෙසින් සනාථ කිරීමය.

IV

නිවැරදි තර්ක මූලයන්ගෙන් බැස ගන්නා වැරදි නිගමන

කෙසේ හෝ වේවා, තුරාටි සහ සමාගම ගැන බොර්දිග සහෝදරයා සහ ඔහුගේ "වාම" මිතුරන් කරන නිවැරදි විවේචනයෙන් ඔවුන් බැස ගන්නේ කුමණ ආකාරයෙන් හෝ පාර්ලිමේන්තුවට සහභාගි වීම ප්‍රතිපත්තියක් වශයෙන් හානිකරය යන නිගමනයට ය. මෙම මතය සාධාරණ බව පෙන්වීමට බරපතල තර්කයක ඡායා මාත්‍රයක්වත් ඉදිරිපත් කිරීමට ඉතාලි "වාම" වාදීහු අපොහොසත් වෙති. ධනපති පාර්ලිමේන්තුව සැබැවින්ම විප්ලවවාදී හා කොමියුනිස්ට් ආකාරයෙන් උපයෝගී, කර ගැනීම පිළිබඳ ජාත්‍යන්තර නිදසුන් ගැන ඔවුහු කොහෙත්ම නො දනිති (නැතහොත් සම්පූර්ණයෙන්ම අමතක කිරීමට උත්සාහ කරති). එසේ පාර්ලිමේන්තුව උපයෝගි කර ගැනීම නිර්ධන පංති විප්ලවය සඳහා කටයුතු සූදානම් කිරීමේ දී අවිවාදයෙන්ම වැදගත් විය. එම උපයෝගිතාවයේ "නව" ක්‍රම සොයාගැනීමට අපොහොසත් වන ඔවුහු "පරණ" බොල්ෂෙවික් නොවන ක්‍රමය ගැන නැවත නැවතත් කෙළවරක් නැතිව කෑගසති.

ඔවුන්ගේ මූලික වරද ඇත්තේ මෙහිය. පාර්ලිමේන්තු ක්ෂේත්‍රයෙහිදී පමණක් නොව, ක්‍රියාකාරිත්වයේ සෑම ක්ෂේත්‍රයක දීම, කොමියුනිස්ට්වාදය, දෙවැනි ජාත්‍යන්තරයේ (එහි හොඳ දේ රැක ගන්නා හා සංවර්ධනය කර ගන්නා අතරම) සම්ප්‍රදායයන්ගෙන් සහමුලින්ම බිඳී වෙන්වීමක් පිළිබිඹු කරන, ප්‍රතිපත්තිමය වශයෙන් අළුත් කිසියම් දෙයක් ආරම්භ කළ යුතුය (නමුත් දීර්ඝ හා නොපසුබට උත්සාහයන්ගෙන් තොරව ආරම්භ කිරීම නොකළ හැකි වනු ඇත).

නිදසුනක් ලෙසට අපි පුවත් පත් කලාවේදී වැඩ ගනිමු. ප්‍රචාරයේදී, උද්ඝෝෂණයේ දී සහ සංවිධානයේදී පුවත් පත්, පොත් පොඩි සහ පත්‍රිකා විසින් ඉටු කෙරෙන කාර්ය කොටස නැතිවම බැරි දෙයකි. යම් තරමක් හෝ ශිෂ්ටාචාර සම්පන්න ඕනෑම රටක කිසිම පොදු ජන ව්‍යාපාරයකට පුවත් පත් කලාවේදී යන්ත්‍රයක් නොමැතිව පැවතිය නොහැකිය. "නායකයන්ට" විරුද්ධව කොතරම් ඝෝෂා කළත්, නැතහොත්, නායකයන්ගේ බලපෑමෙන් ජනතාව කෙලෙසිය නොදී තබාගැනීමට භක්තිමත් ලෙස දිවුරුම් දුන්නත්, මෙම වැඩ කිරීම සඳහා ධනපති බුද්ධිමතුන්ගේ වට පිටාවකින් එන පුද්ගලයන් උපයෝගි කර ගැනීමේ අවශ්‍යතාවයෙන් අපට සහනයක් සැලසෙන්නේවත්, නො එසේනම්, ධනපති ක්‍රමය යටතේ මෙම කටයුතු කරගෙන යන ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී පෞද්ගලික දේපල" පිළිබඳ වටපිටාවෙන්, නොහොත් වාතාවරණයෙන් අප නිදහස් වන්නේ වත් නැත. ධනපති පංතිය බලයෙන් පහ කර දැමීමෙන් පසුව, නිර්ධන පංතිය බලය අත්පත් කර ගැනීමෙන් පසුව, දෙවර්ෂයක් ගත වූ තැන පවා, අප වටා තවමත් තිබෙන්නේ මෙම වටපිටාවය, පොදු ජන (ගොවිජන, ශිල්පීය) ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී පෞද්ගලික දේපල සම්බන්ධකම් පිළිබඳ වාතාවරණය ය.

පාර්ලිමේන්තුවාදී කටයුතු එක් ක්‍රියාකාරිත්ව ආකෘතියකි. පුවත් පත් කලාව තවත් එකකි. මෙම ක්ෂේත්‍රයන් දෙකෙහිම කටයුතු කරන අය නියම කොමියුනිස්ට්වාදීන් නම්, නියම වශයෙන්ම නිර්ධන පංති පොදු ජන පක්ෂයක සාමාජිකයන් නම්, ඒ දෙ ආකාර කටයුත්තෙහිම සන්ධාරය කොමියුනිස්ට්වාදී විය යුතුය. නමුත්, ධනපති ක්‍රමය පවතිද්දී සහ ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ කාලසීමාවේදී, මෙම ක්ෂේත්‍රයන් දෙකෙහිදීම මෙන්ම, වෙනත් ඕනෑම ක්‍රියාකාරිත්ව ක්ෂේත්‍රයකදී ද, නිර්ධන පංතිය ජයගත යුතු වන දුෂ්කරතාවයන්, නැතහොත්, නිදසුන් ලෙසට, ධනපති පංතියේ පිරිස් අතරින් එන අයගේ සේවාව නිර්ධන පංතියේ උවමනාවන් ඉටු කිරීමට උපයෝගි කර ගැනීම, ධනපති බුද්ධිමත්වාදී පූර්ව මත හා බලපෑම් තුරන් කිරීම සහ සුළු ධනපති වාතාවරණයේ ප්‍රතිරෝධය දුර්වල කිරීම (සහ අවසානයේදී එය සම්පූර්ණ-

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

යෙන්ම පරිණාම කිරීම) වැනි ඒ විශේෂ ගැටළු මඟ හැර යාම කළ හැක්කක් නොවේ.

පාර්ලිමේන්තුවාදයට එරෙහිව කෝපයෙන් පුපුරමින්, ධනපති පංතියෙන් කෙලෙසුනු පාර්ලිමේන්තු සමාජවාදීන්ට ගරහමින්, ඔවුන්ගේ බඩවඩා ගැනීම තදබල ලෙස හෙළා දකිමින් යනාදී වශයෙන් ක්‍රියා කළ නමුත්, ඒ අතරම, තමන්ම පුවත් පත් කලාව මගින්, නැතහොත්, සම්මේල (වෘත්තීය සමිති) මගින්, කිසියම් වර්ගයක ධනපති වෘත්තියක යෙදී සිටි අන්ත ''වාම'' අරාජිකවාදීන්, සම්මේලවාදීන් හා වෙනත් අය රාශියක් දෙනා, සියළුම රටවල සිටි 1914–1918 යුද්ධයට පෙර කාලයේදී අපට දක්නට ලැබුණා නොවේද? ප්‍රංශයට සීමා වී කථා කරතොත් ජුඕ ගේ සහ මේර්හෙයිම් ගේ නිදර්ශනය හරියටම මෙයට ගැලපෙනවා නොවේද?

පාර්ලිමේන්තුවට සහභාගි වීම ''ප්‍රතික්ෂේප'' කරන්නවුන්ගේ ළාමක කම සංයුක්ත වී තිබෙන්නේ, විප්ලවවාදී යයි කියනු ලබන එතරම් ''සරල'' හා ''පහසු'' ක්‍රමයකින් කම්කරු පංති ව්‍යාපාරය අභ්‍යන්තරයේ පවතින ධනපති ප්‍රජාතන්ත්‍රවාදී බලපෑම්වලට විරුද්ධව සටන් කිරීම පිළිබඳ ප්‍රශ්නය ''විසඳා ගත'' හැකිය යන ඔවුන්ගේ සිතුවිල්ලෙනි. ඔවුන් එසේ සිතීමෙන් ඇත්ත වශයෙන් කරන්නේ ඔවුන්ගේම සෙවනැලිවලින් ඈතට දිව යාමක් පමණකි. එය වූකලී දුෂ්කරතාවයන් දෙස නොබලා ඇස් වසා ගනිමින්, හුදෙක් වචනවල පමණක් පිහිටෙන් ඒවා මගහැරීමට දරන ප්‍රයත්නයකි. ඉතාමත් නිර්ලජ්ජිත ආකාරයේ බඩවඩා ගැනීම, පාර්ලිමේන්තු ආසන ධනපතිකම් සඳහා උපයෝගි කර ගැනීම, ඉතා පැහැදිලිව පෙනෙන පරිදි පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වය ප්‍රතිසංස්කරණවාදී ලෙස විකෘති කිරීම සහ පහත් සුළු ධනපති ගතානුගතිකත්වය යන මේ සියල්ලම, ධනපති ක්‍රමය විසින් සෑම තැනකම ජනිත කරනු ලබන පොදු සහ සුලබ අංග-ලක්ෂණ වෙයි. ඒවා කම්කරු පංති ව්‍යාපාරයෙන් පිටත පමණක් නොව, එය අභ්‍යන්තරයෙහි ද දක්නට ලැබේ. නමුත්, ධනපති ක්‍රමයම සහ එහි බලපෑමෙන් ධනපති වාතාවරණයම (ධනපති පංතිය බලෙන් නෙරපා දැමීමෙන් පසුව වුවද එය පහව යන්නේ ඉතා හෙමින්ය. ඒ ගොවිජනතාව නිරන්තරවම ධනපති පංතිය පුනර් ජනනය කරන හෙයිනි) විසින් හුදෙක් ආකෘතිය අතින් පමණක් සුළු වෙනස් කම් සහිතව, සාරාර්ථ වශයෙන් එම ධනපති බඩවඩා ගැනීමම, එම ජාත්‍යොන්මාදවාදයම, එම සුළු ධනපති පහත් ගතියම ආදිය නිසැක වශයෙන් ජීවිතයේ සෑම ක්ෂේත්‍රයක දීම සහ කටයුත්තකදීම උද්ගත කරනු ලැබේ.

මා හිතවත් චර්ජකයිනි, පාර්ලිමේන්තුවාද විරෝධීනි, ඔබ ''ඉතාමත් විප්ලවවාදී'' යයි ඔබ සිතන්නහුය. නමුත්, ඇත්ත වශයෙන්ම, ඔබ කම්කරු පංතිය තුළ පවතින ධනපති බලපෑම්වලට විරුද්ධව සටන් කිරීම හා

සම්බන්ධ සංසන්දනීය වශයෙන් සුළු දුෂ්කරතාවයන් දැක බිය වී සිටිති. එසේ වුවත්, ඔබගේ ජයග්‍රහණය නිසා, එනම්, ධනපති පංතිය බලෙන් නෙරපා දැමීමෙන් හා නිර්ධන පංතිය දේශපාලන බලය අත්පත් කර ගැනීමෙන්, ඉදුරාම මෙම දුෂ්කරතාවයන්ම තවත් විශාල පරිමාණයකින්, අපරිමිත පරිමාණයකින් මතු වනු ඇත. අද ඔබ හමුවේ ඇති සුළු දුෂ්කර-තාවයක් දැක ඔබ ළදරුවන් මෙන් බියවී සිටිති. නමුත් හෙට හා අනිද්ද අපරිමිත තරම් විශාල පරිමාණයක් ගැනීම අතින් පමණක් වෙනස් වූ එම දුෂ්කරතාවයන්ටම මුහුණ දී ජයගැනීමට ඔබට සිදුවන බව ඔබ නොදනිති. ඉදිරියේදී ඔබට එය උගෙන ගන්නට සිදුවනු ඇත.

සෝවියට් පාලනය යටතේ ඔබගේත්, අපේත් නිර්ධන පංති පක්ෂය මීටත් වඩා අධික ධනපති බුද්ධිමතුන් සංඛ්‍යාවක ආක්‍රමණයට ලක් වනු ඇත. ඔවුන් සෝවියට් සභා තුළට, උසාවිවලට හා පරිපාලනය තුළට රිංගා ගනු ඇත. ඔවුන්ට එසේ කළහැකි වන්නේ, ධනපති ක්‍රමය නිර්මාණය කළ මිනිසුන්ගේ ආධාරයෙන් තොරව වෙනත් ආකාරයකින් කොමියු-නිස්ට් ක්‍රමය ගොඩනැගිය නොහැකි හෙයිනි. ඒ අනුව ධනපති බුද්ධිමතුන් පලවා හැරීම හා විනාශ කිරීම නො කළ හැකි හෙයිනි. අපට සිදුවී තිබෙන්නේ ඔවුන් දිනා ගැනීමට, යළි හැඩගස්වා ගැනීමට, සවි කර ගැනීමට හා නැවත උගන්වා ගැනීමට ය. එම කාර්යය ඉටු කළ හැකි වන්නේ නිර්ධන පංති ආඥාදායකත්වය පදනම් කර ගෙන කරන දීර්ඝ අරගලයක් තුළිනි. එය අප කළ යුත්තේ, එක පහරින්, ප්‍රාතිහාර්යයකින්, මරිය තුමියගේ අණින්, සටන්පාඨයේ, යෝජනාවේ, නැතහොත්, ආඥාවේ නියෝගයෙන් සුළු ධනපති දූර්මත අත් හැර නොදමන්නාවූ නිර්ධන පංතිකයන්ගේ එම දුර්වල කම, පොදුජන සුළු ධනපති බල පෑමට විරුද්ධව කරන දීර්ඝ සහ දුෂ්කර පොදුජන අරගලයක් මගින් ජයගෙන, ඔවුන්ට නැවත උගන්වා ගත යුතු ලෙසටමය. පාර්ලිමේන්තු විරෝධීන් ඉතා උඩඟු ලෙස, ඉතා උද්ධච්ච ලෙස, ඉතා ලඝුකොට සලකා සහ ඉතා ළාමක ලෙස අත ගසා දමා පැත්තකට දමන මෙම ප්‍රශ්නම සෝවියට් පාලනය යටතේ මතු වනු ඇත. සෝවියට් සභා තුළ, සෝවියට් පරිපාලනය තුළ, සෝවියට් ''අද්වකාත් වරුන්'' (රුසියාවේ අපි ධනපති නීතිඥ වෘත්තිය අහෝසි කර, නිවැරදි කර ඇතත්, ''සෝවියට් අද්වකාත්වරු''[78] යන කඩතුරාව යටතේ එය නැවතත් ඉස්මතු වෙමින් පවතී) අතර ඉදුරාම මෙම ප්‍රශ්නම උද්ගත වෙමින් පවතී. සෝවියට් ඉන්ජිනේරුවරු, සෝ-වියට් පාඨශාලා ගුරුවරු සහ වරප්‍රසාද ලත් කම්කරුවන්, එනම් සෝවියට් පැක්ටරිවල සිටින ඉතාමත් දක්ෂ සහ හොඳම තැන් ගත් කම්කරුවන් අතර ධනපති පාර්ලිමේන්තුවාදීන්ට විශේෂ වූ සියළුම නරක අංග ලක්ෂණ නිරතුරුවම පුනර් ජීවයක් ලබන බව අප දැක තිබේ. අපි ක්‍රම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ක්‍රමයෙන් මෙම උවදුර පරාජය කරමින් සිටින්නෙමු. නමුත්, එය කළහැක්කේ නිර්ධන පංති සංවිධානය හා විනය පදනම් කරගත් නොපසුබට, දීර්ඝ සහ අනවරථ අරගලයක් මගින් පමණකි.

ධනපති පංතියේ පාලනය යටතේ අපගේම, එනම් කම්කරුවන්ගේ, පක්ෂයෙන් ධනපති ගති සිරිත් තුරන් කිරීම ඉතා අසීරු කාර්යයක් බව ඇත්තකි. ධනපති දුර්මතවලින් සම්පූර්ණයෙන්ම කෙලෙසී සිටින සුපුරුදු පාර්ලිමේන්තු නායකයන් පක්ෂයෙන් නෙරපා දැමීම ''දුෂ්කරය''. ධනපති පංති පිරිස් අතරින් එන, (ඉතාමත් සීමා සහිත වුවත්) ඉතාමත් අවශ්‍ය පුද්ගලයන් සංඛ්‍යාව නිර්ධන පංති විනයට යටත් කිරීම අමාරුය. ධනපති පාර්ලිමේන්තුවක් තුළ, කම්කරු පංතියට ඉඳුරාම සරිලන අන්දමේ පාර්ලිමේන්තු කණ්ඩායමක් ඇති කිරීම අසීරුය. කොමියුනිස්ට් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ධනපති පාර්ලිමේන්තුවාදී පුහු වැඩ නොකර, පොදු ජනතාව අතර ඉතා හදිසි ප්‍රචාරක, උද්ඝෝෂණ සහ සංවිධාන කටයුතු කිරීමෙහි යෙදෙන්නට සැලැස්වීම ''අපහසුය''. ඇත්තෙන්ම මේ සියල්ලම දුෂ්කරය. රුසියාවේ එය දුෂ්කර කටයුත්තක් විය. ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදයයන් ආදිය වඩාත් ශක්තිමත් වී තිබෙන බටහිර යුරෝපයේ හා ඇමෙරිකාවේ එය ඊටත් වඩා බොහෝ සෙයින් දුෂ්කර වනු ඇත.

නිර්ධන පංති විප්ලවය අතර තුර සහ නිර්ධන පංතිය බලය අත්පත් කර ගැනීමෙන් පසුව යන කාල ද්වයෙහි දීම, කුමණ තත්වයක් යටතේ හෝ නිර්ධන පංතියට ඉතාමත් නිසැක ලෙසම විසඳන්නට සිදුවනු ඇති ඉඳුරාම මෙම වර්ගයේම වූ ප්‍රශ්න හා සමග සසඳා බලන විට, මෙම ''දුෂ්කරතාවයන්'' සියල්ලම ළමා ක්‍රීඩාවක් මෙන් සුළුය. නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ දශලක්ෂ ගණන් ගොවි ජනයා හා සුළු දේපල හිමියන්, ලක්ෂ ගණන් කාර්යාලීය සේවකයින්, නිලධාරීන් සහ ධනපති බුද්ධිමතුන් නැවත උගන්වා හැඩ ගසා ගැනීමේදී, ඔවුන් සියළු දෙනාම නිර්ධන පංති රාජ්‍යයට සහ නිර්ධන පංති නායකත්වයට යටත් කිරීමේදී, ඔවුන්ගේ ධනපති ගති සිරිත් හා සම්ප්‍රදයයන් තුරන් කිරීමේ ද, මෙම සැබෑ යෝධ ප්‍රශ්නය සමඟ සසඳන විට, ධනපති පංතියේ පාලනය යටතේ සහ ධනපති පාර්ලිමේන්තුවක් තුළ නියම නිර්ධන පංති පක්ෂයක නියම කොමියුනිස්ට් කණ්ඩායමක් ඇති කිරීම ළමා කාර්යයක් මෙන් පහසුය.

අපගේ ''වාම'' වාදී සහ පාර්ලිමේන්තුවාද විරෝධී සහෝදරවරු දැන් මෙවැනි දුෂ්කරතාවයක් වුවත් ජයගැනීමට උගෙන නොගනිත් නම්, එක්කෝ ඔවුන් නිර්ධන පංති ආඥාදායකත්වය ඇතිකිරීමට අපොහොසත් වනු ඇත. එසේම ධනපති බුද්ධිමතුන් හා ධනපති ආයතන යටත් කරගෙන පුළුල් පරිමාණයකින් නැවත හැඩ ගසා ගැනීමට අපොහොසත් වනු ඇත.

නැතහොත්, ඔවුන්ට ඉකමන්කාරී ලෙස ස්වකීය අධ්‍යාපනය සම්පූර්ණ කර ගැනීමට සිදුවනු ඇත. තවද, එසේ ඉක්මන්කාරී වීමෙන් ඔවුන් නිර්ධන පංතියේ සත් ව්‍යාපාරයට විශාල හානි සිදු කරනු ඇත. සාමාන්‍ය පමණට වැඩියෙන් වැරදි කරනු ඇත. සාමන්‍ය පමණට වැඩියෙන් දුර්වලකම් හා අකාර්යක්ෂමතාවයන් පෙන්නුම් කරනු ඇත. එබඳු තවත් අඩුපාඩු සිදුවනු ඇත.

ධනපති පංතිය බලයෙන් පහකර දමන තෙක් ද, ඉන් අනතුරුව, කුඩා පරිමාණ ආර්ථිකය සහ සුළු වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය අතුරුදහන් වන තෙක් ද, ධනපති වාතාවරණය, දේපල හිමි ගති සිරිත් සහ සුළු ධනපති සම්ප්‍රදයයන් විසින් කම්කරු පංති ව්‍යාපාරයෙන් බාහිරව මෙන්ම එය තුළත් කෙරෙන නිර්ධන පංති වැඩ කටයුතුවලට බාධා කෙරෙනු ඇත. ක්‍රියාකාරීත්වයේ එක ක්ෂේත්‍රයක දී පමණක් නොව, පාර්ලිමේන්තු කටයුතුවලදී පමණක් නොව, සමාජ ක්‍රියාකාරීත්වයේ සෑම ක්ෂේත්‍රයක දීම, විශේෂයක් නොමැතිව සියලුම සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හිදීම එම බාධක හමුවනු ඇත. කිසියම් එක ක්‍රියාකාරීත්ව ක්ෂේත්‍රයකදී හමුවන ''අප්‍රසන්න'' ගැටළු, නැතහොත්, දුෂ්කරතාවයන් පසෙකට තල්ලු කිරීමට, ඒවා තමන්ට සමීප නොවන සේ තමන් වටා වැටක් බැඳ ගැනීමට අයෙක් දරන ප්‍රයත්නය බරපතල වරදකි. එම වරද නිසා පසුව නිසැකවම දඬුවම් විඳින්නට සිදුවනු ඇත. කිසිම විශේෂයක් නැතිව සෑම ක්ෂේත්‍රයකම වැඩ සහ ක්‍රියාකාරීත්වය පිළිබඳව සාමාර්ථයක් ලැබීමටත්, සියලුම දුෂ්කරතාවයන් ජය ගැනීමට හා සෑම තැනෙකදීම සියලුම ධනපති පුරුදු, චාරිත්‍ර හා සම්ප්‍රදයයන් තුරන් කිරීමටත්, අපි උගෙන ගත යුත්තෙමු. වෙනත් කුමණ ආකාරයකින් හෝ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම නොසැලකිලිමත් කමකි. හුදු ළාමක කමකි.

1920 මැයි 12.

V

සමස්තයක් වශයෙන් ඕලන්ද කොමියුනිස්ට් පක්ෂය ජාත්‍යන්තර විප්ලවවාදී ප්‍රතිපත්තිය පිළිබඳ ක්ෂේත්‍රයෙහි දී කටයුතු කළ ආකාරය ගැන මෙම පොතේ රුසියානු සංස්කරණයෙහි මා කළ විස්තරය තරමක් වැරදි ය. එනිසා මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් අපගේ ඕලන්ද සහෝදරවරුන්ගෙන් ලැබුණු ලිපියක් පළ කිරීමටත්, රුසියානු සංස්කරණයෙහි මා යෙදූ ''ඕලන්ද ට්‍රිබියුන්වාදීන්'' යන පාඨය නිවැරදි කර, දැන් ඒ වෙනුවට

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

"ඕලන්ද කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන් සමහර දෙනෙක්" යන වචන යෙදීමටත් මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නෙමි.[79]

එන්. ලෙනින්.

වයින්කොප්ගේ ලිපිය

මොස්කව්. 1920 ජූනි 30.

ආදරණීය ලෙනින් සහෝදරය.

ඔබගේ කාරුණික අනුග්‍රහයට ස්තුති වන්නට, "වාමාංශික කොමියුනිස්ට්වාදය ළදරු වලිප්පුවකි" නැමති ඔබේ පොත යුරෝපීය භාෂාවලින් පළ කිරීමට පෙර, එය කියවා බැලීමේ අවස්ථාව කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනයට සහභාගි වූ ඕලන්ද නියෝජිත මණ්ඩලයේ අතට ලැබුණි. ඕලන්ද කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයින් සමහර දෙනෙක් ජාත්‍යන්තර දේශපාලනයෙහිදී පෑ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් ඔබගේ අප්‍රසාදය මෙම පොතේ කීප පලකම අවධාරණයෙන් දක්වා තිබේ.

නමුත්, ඔවුන්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් වගකීම කොමියුනිස්ට් පක්ෂයට පැවරීම ගැන අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමු. මෙය ඉතාමත් වැරදිය. එපමණක් නොව එය අසාධාරණ ද වේ. මන්ද යත්, ඔවුන් වර්තමාන පක්ෂ කටයුතුවලදී ඉතාමත් ස්වල්ප කොටසක් පමණක් ඉටු කරන, නැතහොත් කිසිම කොටසක් ඉටු නොකරන හෙයිනි. ඔවුන් උත්සාහ කරන්නේ විරුද්ධ පාර්ශ්වයේ සටන් පාඨ කෙළින්ම හෝ අනියම් ලෙස ඕලන්ද කොමියුනිස්ට් පක්ෂය තුළ ක්‍රියාත්මක කරවීමට ය. එනිසා, පක්ෂය සහ එහි සංවිධාන සියල්ලම එම සටන්පාඨවලට විරුද්ධව ඉතාමත් ධෛර්යමත් අරගලයක් ගෙන ගියේය. අද දක්වාම එම අරගලය දිගටම ගෙන යනු ලැබේ.

මෙයට, සහෝදරත්වයෙන් ඩී. ජේ. වයින්කොප්
(ඕලන්ද නියෝජිත මණ්ඩලය වෙනුවෙන්)

1920 මැයි-අප්‍රේල් හිදී ලියන ලදී.

1920 ජූනි මස පෙත්‍රොග්‍රාද්හිදී වෙනම පොතක් ලෙස මුද්‍රණය කරන ලදී	සම්පූර්ණ කෘති. 5 වැනි මුද්‍රණය, වෙළුම 41. පිටු 1–104

සංස්කාරකගේ සටහන්

1 මෙන්ෂෙවික්වරු — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීය ව්‍යාපාරය තුළ වූ සුළු ධනපති අවස්ථාවාදී උපනතියකි. 1903 දී පැවති රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී පක්ෂයේ මධ්‍යම සංවිධානවලට ඡන්දය විමසන විට ලෙනින්ගේ නායකත්වයෙන් යුත් විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට ඡන්ද බහුතර සංඛ්‍යාවක්ද අවස්ථාවාදීන්ට ඡන්ද අල්පතර සංඛ්‍යාවක්ද ලැබුණේය. එතැන්සිට ලෙනින්වාදී පිළට බොල්ෂෙවික්වාදීන් (බහුතරය) හා අවස්ථාවාදී පිළට මෙන්ෂෙවික්වාදීන් (අල්පතරය) යන හැඳින්වීම් ලැබිණ.

මෙන්ෂෙවික්වරු විප්ලවයේදී නිර්ධන පංතියට ඇති නායක කාර්යභාරයට විරුද්ධවද, කම්කරු පංතිය හා ගොවි ජනතාව අතර සංධානයට විරුද්ධවද ලිබරල් ධනපති පංතිය හා සමග සම්මුතියක් ඇතිකර ගැනීම සඳහාද ඉදිරිපත් වූහ.

1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු මෙන්ෂෙවික්වරු ධනපති තාවකාලික ආණ්ඩුවට ඇතුළු වූහ. ඔවුන් තාවකාලික ආණ්ඩුවේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියට සහයෝගය දුන් අතර සූදානම් වෙමින් තිබූ සාමාජවාදී විප්ලවයට විරුද්ධව සටන් කළහ.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව මෙන්ෂෙවික්වරු සෝවියට් බලය විනාශ කිරීම සඳහා කුමන්ත්‍රණ හා කැරැලි සංවිධානය කොට ඒවාට සහභාගි වූහ.

සමාජවාදී-විප්ලවවාදියෝ (එස්ආර්වරු) — 1901 අගදී හා 1902 මුලදී බිහිවූ රුසියාවේ සුළු ධනපති පක්ෂයකි.

1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු මෙන්ෂෙවික්වරු සමග එකතුව එස්ආර්වරු ධනපති තාවකාලික ආණ්ඩුවේ ප්‍රධානතම ආධාරකය ලෙස කටයුතු කළ අතර ඔවුන්ගේ නායකයෝ ආණ්ඩුවට ඇතුළු වූහ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු එස්ඒර්වරු ධනපති පංතිය, ඉඩම් හිමියන් හා ආක්‍රමණිකයින් සමග එකතුව සෝවියට් රජයට විරුද්ධව සටන් කළහ.

2 ස්පාටකස්වරු — ජර්මන් වාමාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විප්ලවවාදී සංවිධානයේ සමාජිකයෝ. පළමුවැනි ලෝක යුද්ධයේ ආරම්භයේදී කේ. ලීබ්නෙහ්ත්, රෝසා ලුක්සෙම්බුර්ග්, ෆ්‍රාන්ස් මේරිංග්, කේ. ට්සෙත්කින් හා වෙනත් අයගේ ප්‍රධානත්වයෙන් ස්පාටකස් කණ්ඩායම ආරම්භ කරන ලදී. ස්පාටකස්වරු පොදු ජනතාව අතර විප්ලවවාදී ප්‍රචාර ගෙන ගියහ. දූවැන්ත යුද්ධ විරෝධී සටන් සංවිධානය කළහ. වැඩ වර්ජන මෙහෙයවූහ. ලෝක යුද්ධයේ අධිරාජ්‍යවාදී ස්වභාවයත්, අවස්ථාවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නායකයින්ගේ ද්‍රෝහිභාවයත් හෙළිදරව් කළහ. 1917 අප්‍රේල් මාසයේදී ස්පාටකස්වරු ජර්මනියේ මධ්‍යස්ථවාදී ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට බැඳුන නමුත්, සංවිධානමය වශයෙන් ස්වාධීන ලෙස පැවතුනහ. 1918 නොවැම්බරයේ ජර්මන් විප්ලවය සමයේදී "ස්පාටකස් සංගමයට" සංවිධානය වූ ස්පාටකස්වරු 1918 දෙසැම්බර් 14 ද තමන්ගේම වැඩ පිළිවෙළක් නිකුත් කර "ස්වාධීනයන්ගෙන්" ඉවත් වූහ. 1918 දෙසැම්බර් 30 සිට 1919 ජනවාරි 1 දක්වා පවත්වන ලද ව්‍යවස්ථා සම්පාදන සම්මේලනයේදී ඔවුහු ජර්මන් කොමියුනිස්ට් පක්ෂය පිහිටවූහ.

3 ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයට තෝරා පත්කර ගැනීමේ මැතිවරණය පවත්වන ලද්දේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසුව, කලින් නියම කරගත් (1917 නොවැම්බර් 12 (25) දින දීය. එය පැවැත්වූයේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පෙර සකස්කරන ලද ඡන්ද ලැයිස්තුවලට අනුකූලව තාවකාලික ආණ්ඩුව විසින් පිළිගත් කොන්දේසිවලට, යටත්ව හා සමාජවාදී විප්ලවයේ වැදගත්කම පිළිබඳ නියම අවබෝධයක් ලබාගැනිමට ජනතාවට හැකියාවක් නොතිබූ අවස්ථාවකය. එයින් ප්‍රයෝජන ගත් දක්ෂිණාංශික එස්ඒර්වරු, අගනුවරින් හා කාර්මික මධ්‍යස්ථානවලින් වෙන්වූ ගුබේර්නියාවල හා ප්‍රදේශවල ඡන්ද බහුතරයක් ලබා ගැනීමට සමත් වූහ. ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය සෝවියට් රජය විසින් කැඳවනු ලදුව 1918 ජනවාරි 5 (18) දින පෙත්‍රොග්‍රාද්වලදී විවෘත කරන ලදී. මධ්‍යම විධායක කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ "වැඩ කරන ජනතාවගේ සහ සූරා කෑමට භාජනය වූ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයද සාමය, ඉඩම් සෝවියට් සභාවලට බලය පැවරීම ආදිය පිළිබඳ පනත්ද පිළිගැනීමට

ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලද නිසා මධ්‍යම විධායක කාරක සභාවේ පනතකින් 1918 ජනවාරි 6 (19) දින ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසුරුවා හරින ලදී.

4 මෙහි සඳහන් වන්නේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ ජයග්‍රහනයට පෙර චෙක් හා ස්ලොවාක් යුද හිරකරුවන් ගෙන් සංවිධානය වූ චෙක් යුද්ධ හමුදාවේ ආයුධ සන්නද්ධ කැරැල්ල ගැනය.

මෙන්ෂෙවික් වරුන්ගේ හා එස්ඒර් වරුන්ගේ සහභාගිත්වය ඇතිව බ්‍රිතාන්‍ය සහ ප්‍රංශ අධිරාජ්‍යවාදීන් විසින් කැරැල්ල සංවිධානය කරන ලදී. කැරැල්ල ආරම්භ වූයේ 1918 මැයි මාසයේදීය. ධවල හමුදාවේ සහ කුලාක්වරුන්ගේ ආධාරය ඇතිව චෙක් ප්‍රතිවිප්ලවීය හමුදාව විසින් උරාල්, වොල්ගා අසබඩ හා සයිබීරියාවේ විශාල කොටසක ධනපතීන්ගේ බලය පිහිටුවන ලදී.

වොල්ගා අසබඩ ප්‍රදේශ රතු හමුදාව විසින් නිදහස් කරන ලද්දේ 1918 සරත් සමයේදීය. 1919 අවසානයේදී ප්‍රතිවිප්ලවවාදී චෙක් හමුදාව සහමුලින්ම විනාශ කර දමන ලදී.

5 කෙරෙන්ස්කි සමය — එස්ඒර්වාදී කෙරෙන්ස්කි විසින් ධනපති තාවකාලික ආණ්ඩුවේ නායකත්වය දැරූ 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය හා ඔක්තෝබර් සමාජවාදී විප්ලවය අතර කාලය.

6 එන්ටෙන්ට් මිත්‍ර ගිවිසුම (ත්‍රිපාක්ෂක ගිවිසුම) — බ්‍රිතාන්‍යයේ, ප්‍රංශයේ හා සාර්වාදී රුසියාවේ අධිරාජ්‍යවාදී කඳවුර. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී එම කඳවුරට ඇමෙරිකාව, ජපානය, ඉතාලිය හා වෙනත් රටවල්ද සම්බන්ද විය.

7 දෙවැනි ජාත්‍යන්තරය — 1889 පිහිටුවන ලද සමාජවාදී පක්ෂවල ජාත්‍යන්තර සංගමය. පළමුවැනි ලෝක යුද්ධය (1914–1918) ආරම්භයේදී දෙවැනි ජාත්‍යන්තරයේ නායකයෝ සමාජවාදය පාවා දී තම අධිරාජ්‍යවාදී ආණ්ඩුවල පැත්ත ගත්හ. දෙවැනි ජාත්‍යන්තරය බිඳවැටුනේය. දෙවැනි ජාත්‍යන්තරයට සම්බන්දව සිටි වාමාංශික පක්ෂ හා කණ්ඩායම් 1919 මොස්කව්වල ආරම්භ කරන ලද කොමියුනිස්ට් (තුන්වැනි) ජාත්‍යන්තරයට එකතු වූහ.

1919 අවුරුද්දේදීම බර්න් (ස්විට්සර්ලන්තය) හි පවත්වන ලද සාකච්ඡා සභාවේදී දෙවැනි ජාත්‍යන්තරය නැවත පිහිටුවන ලදී. එයට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇතුළු වූයේ සමාජවාදී ව්‍යාපාරයේ දක්ෂිණාංශයේ හා අවස්ථාවාදී පිළේ නියෝජිතයෝ පමණකි.

8 රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවේ නායකත්වයෙන් යුත් පෙරදිග ලෝකයේ ජනතාවගේ කොමියුනිස්ට් සංවිධානවල මධ්‍යම බියුරෝව විසින් කැඳවන ලද එහි දෙවැනි සමස්ත රුසියා සම්මේලනය 1919 නොවැම්බර් 22 සිට දෙසැම්බර් 3 දක්වා මොස්කව්හිදී පැවැත්විණ.

9 මෙහි සඳහන්වන්නේ ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයේ සාමාජිකයින්ගේ කමිටුව කමුච් නමින් සමාරාහි පිහිටුවනු ලැබූ ධවල හමුද-එස්ඒර්-මෙන්ෂෙවික් රජය පිළිබඳවය. එය පිහිටුවන ලද්දේ 1918 ජූනි මාසයේදී චෙක් ප්‍රතිවිප්ලවවාදී කැරැලි කාරයන් සමාරා අල්ලා ගනු ලැබීමෙන් පසුවය. 1918 අගෝස්තු වන විට කමුච් විසින් වොල්ගා අසබඩ ප්‍රදේශ හා උරාල් ප්‍රදේශවල ගුබෙර්නියා කීපයක්ම යටත් කර ගනු ලැබිණ. එම අවුරුද්දේ ශරත් කාලයේදී රතු හමුදාවේ පහර දීම නිසා එම ප්‍රතිවිප්ලවවාදී රජය විනාශ විය.

10 වර්සයිල් සාම ගිවිසුම — 1914–1918 අවුරුදුවල පැවති ප්‍රථම ලෝක යුද්ධය කෙළවර කළ මෙම ගිවිසුම, එක් අතකින් ඇමෙරිකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය, ප්‍රංශය, ඉතාලිය, ජපානය හා අනෙකුත් මිත්‍ර රටවල්ද අනෙක් අතින් ජර්මනියද විසින් 1919 ජූනි 28 වැනි දින අත්සන් කෙරිණ. වර්සයිල් සාම ගිවිසුමේ ඉලක්කය වූයේ ජයග්‍රහණය කළ රටවලට වාසිදායක වන අන්දමට ධනවාදී ලෝකය නැවත බෙදගැනීම, සෝවියට් රුසියාවේ ගෙල මිරිකා දැමීම හා ලෝක විප්ලවවාදී ව්‍යාපාරය විනාශ කිරීම සඳහා එම රටවල් අතර සම්බන්ධතා ක්‍රමයක් ඇති කිරීමය.

11 බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කරන ලද්දේ රුසියාවට ඉතාමත් දුෂ්කර කොන්දේසි සහිතව සෝවියට් රුසියාව හා ජර්මන් කඳවුරට අයත් රටවල් (ජර්මනිය, ඔස්ත්‍රියා-හංගේරියාව, බල්ගේරියාව හා තුර්කිය) අතර 1918 මාර්තු 3 වැනි දින බ්‍රෙස්ට් හිදීය. සාම ගිවිසුම අත්සන් කිරීමට විරුද්ධව ඉදිරිපත් වූ එල්. ඩී. ට්‍රොට්ස්කිට හා පක්ෂ විරෝධී "වාම කොමියුනිස්ට්වාදීන්ට" විරුද්ධව කරන ලද දැඩි සටනක් මධ්‍යයේ මෙම ගිවිසුම අත්සන් කරන ලදී. වී. අයි. ලෙනින්ගේ දැඩිතම උත්සාහය නිසා ජර්මනිය සමග සාම ගිවිසුම අත්සන් කිරීමට හැකි විය. රාජාණ්ඩුව පෙරලා දැමූ ජර්මන් විප්ලවය ජයගැනීමෙන් පසු 1918 නොවැම්බර් 13 දින සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව විසින් එම කොල්ලකාරී ගිවිසුම අවලංගු කරන ලදී.

12 කෘෂිකර්මය පිළිබඳ මහජන කොමිසාර් මණ්ඩලය විසින් කැඳවනු ලැබූ ගොවිජන කොමියුන්වල හා කෘෂිකාර්මික ආටලවල පළමුවැනි සම්මේලනය 1919 දෙසැම්බර් 3–10 දිනවල මොස්කව්හි පැවැත්විණ. සම්මේලනයට සහභාගි වූ නියෝජිතයන් 140 ගෙන් 93 ක් කොමියුනිස්ට් වාදීන් වූහ. සම්මේලනයේ දෙවැනි දිනයේ ලෙනින් දේශනයක් කළේය. සම්මේලනය විසින් ශ්‍රමකරු කෘෂිකාර්මික නිෂ්පාදකයින්ගේ සමිතිවල (කොමියුන් හා ආටල) සමස්ත රුසියානු සංගමයක් පිළිබඳ පනතක් සම්මත කරගන්නා ලදුව පසුව කෘෂිකර්මය පිළිබඳ මහජන කොමිසාර් මණ්ඩලය විසින් පිළිගන්නා ලදී. සියළුම කෘෂිකාර්මික සමිති එකම නිෂ්පාදන සංගමයකට ඒකාබද්ධ කිරීම සමාජමය ලෙස ඉඩම් ගොවිතැන් කිරීමේ අදහස ප්‍රචාරය කිරීම හා අවට ගොවීන්ට, විශේෂයෙන්ම රතුහමුද සොල්දාදුවන්ගේ පවුල්වලට හා ගම්බද දුප්පතුන්ට ප්‍රායෝගික උපකාර දීම සංගමයේ ප්‍රධානතම කර්තව්‍යය බව පනතින් පිළිගැනින.

13 සියක් කෝටියක මුදල් — සෝවියට් මහජන කොමිසාර් මණ්ඩලයේ 1918 නොවැම්බර් 2 දින දරන ආඥාවට අනුකූලව, කෘෂිකර්මය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සහ සමාජවාදී ලෙස එය ප්‍රතිසංවිධානය කිරීම කඩිනම් කිරීමේ අරමුණ ඇතිව පිහිටුවන ලදී. වෙන් වෙන්ව ගොවිතැන් කිරීමේ සිට සාමූහික ලෙස ගොවිතැන් කිරීම දක්වා පරිවර්තනය වීමේ කොන්දේසිය යටතේ කෘෂිකාර්මික කොමියුනවලට, ශ්‍රම සංගම්වලට හා ග්‍රාමීය සමිති නොහොත් ගොවි කණ්ඩායම්වල ගොවිපළවලට එම අරමුදලෙන් නය හා ආධාර මුදල් දෙන ලදී.

14 සමාජවාදී ඉඩම් සංවර්ධන හා සමාජවාදී ගොවිතැනට පරිවර්තනය වීමේ පියවරයන් පිළිබඳ නීතිය — 1919 පෙබරවාරි මාසයේදී මධ්‍යම විධායක කාරක සභාව විසින් පිළිගන්නා ලදී. එයට පදනම් වූයේ, 1918 දෙසැම්බර් මාසයේ පවත්වන ලද ඉඩම් අංශවල, දුප්පතුන්ගේ කාරක සභාවල හා කොමියුන්වල පළමුවැනි සමස්ත රුසියානු සම්මේලනය ගත් තීරණයන්ය. එම නීතිය පිළියෙළ කිරීමේදීද එය සංස්කරණය කිරීමේදී ලෙනින් එයට කෙලින්ම සහභාගි විය. කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීම, ගොවිතැන් කරන ඉඩම් ප්‍රමාණය ව්‍යාප්ත කිරීම, ගොවිතැන සමාජවාදී පදනමක් මත ප්‍රතිසංවිධානය කිරීම ආදිය සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගණනාවක්ම එම නීති වලින් ප්‍රකාශ කර තිබිණ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

15 සමස්ත උක්‍රෙනියානු යුද-විප්ලවවාදී කාරක සභාව — මධ්‍යම විධායක කාරක සභාව හා උක්‍රෙනියානු මහජන කොමිසාර් මණ්ඩලය විසින් 1919 දෙසැම්බර් 11 දින පිහිටුවන ලද උක්‍රෙනියාවේ විප්ලවවාදී පාලනයේ තාවකාලික නිල සංවිධානය. මධ්‍යම විධායක කාරක සභාවේ හා උක්‍රෙනියාවේ මහජන කොමිසාර් මණ්ඩලයේද කටයුතු පවරනු ලබූ එම විප්ලවවාදී කොමිටියේ කර්තව්‍යයන් වූයේ ධවල හමුදව සම්පූර්ණයෙන්ම විනාශ කිරීමේ කටයුත්ත සඳහා රතු හමුදව සමස්තයක් ලෙස සංවිධානය කිරීම; නින්දගම් හිමියන් හා නින්දගම් අහෝසි කිරීම; සෝවියට් උක්‍රෙනියාවේ ශක්තිමත් කම්කරු-ගොවි පාලනයක් පිහිටුවීම; උක්‍රෙනියාවේ විශාල කොටසක් නිදහස් කළ සැනෙකින්ම සෝවියට් සභාවල සමස්ත උක්‍රෙනියානු සම්මේලනයක් කැඳවීම ආදී කටයුතු ය.

16 බරොත්බා වරු — උක්‍රෙනියන් සමාජවාදී-විප්ලවවාදී පක්ෂය භේදවීමෙන් පසු 1918 මැයි මස බිහිවූ ජාතිකවාදී සුළුධනපති පක්ෂයේ සාමාජිකයෝ. පක්ෂයේ මධ්‍යම නිල පත්‍රයේ නාමය වන බරොත්බා (සටන) නමින් එය හැඳින්විණ. 1919 මාර්තු මස සිට එය සමාජවාදී-විප්ලවවාදී කොමියුනිස්ට් බරොත්බා වරුන්ගේ උක්‍රෙනියානු පක්ෂය යනුවෙන්ද අගෝස්තු මාසයේ සිට බරොත්බා වරුන්ගේ උක්‍රෙනියානු කොමියුනිස්ට් පක්ෂය යනුවෙන්ද හැඳින්විණ.

බොල්ෂෙවික් වරුන්ගේ හා ගොවි ජනතාවගේ බලපෑම වර්ධනය වීම නිසාද උක්‍රෙනියාවෙහි සෝවියට් පාලනයේ ප්‍රතිඵලයක් වශයෙන් ලැබුනු උසස් ප්‍රතිඵල නිසාද තම පක්ෂය විසුරුවා හැරීම තීරණය කිරීමට බරොත්බාවරුන්ට සිදුවිය. 1920 මාර්තු වලදී පැවති උක්‍රෙනියානු කො. (බො) පක්ෂයේ හතරවැනි සම්මේලනයේදී බරොත්බාවරු උක්‍රෙනියාවේ කොමියුනිස්ට් පක්ෂයට බඳවා ගැනීම ගැන සාකච්ඡා කරන ලදී. එහෙත් පසුව වරොත්බාවරු බොහෝ දෙනෙක් සෝවියට් විරෝධී කටයුතු ගෙන ගිය අතර උක්‍රෙනියාවේ ප්‍රතිවිප්ලවවාදී, ධනපති-ජාතිකවාදී කොටස්වල සටනට නායකත්වය දුන්හ.

17 ජාතීන්ගේ සංගමය — පළමුවැනි ලෝක යුද්ධයේ සිට දෙවැනි ලෝක යුද්ධය දක්වා පැවති ජාත්‍යන්තර සංවිධානයකි. පළමුවැනි ලෝක යුද්ධයේ ජයග්‍රාහක රාජ්‍යයන්ගේ පැරිස් සාම සම්මේලන සභාව විසින් එය 1919 දී ආරම්භ කරන ලදී.

1920–1934 කාලයේදී ජාතීන්ගේ සංගමය සෝවියට් රජයට සතුරු ආකල්පයක් දක්වූයේය. 1920–1921 අවුරුදුවලදී සෝවියට් දේශයට විරුද්ධව අධිරාජ්‍යවාදීන් ගෙන ගිය යුද්ධ ආක්‍රමණ සංවිධානය කළ මධ්‍යස්ථානය ලෙස එය කටයුතු කළේය.

1934 සැප්තැම්බර් 15 දින ප්‍රංශ රාජ්‍යතන්ත්‍රික අංශයේ මූලිකත්වයෙන් ජාතීන්ගේ සංගමයේ නියෝජිත රාජ්‍යයන් 34 ක් සෝවියට් රාජ්‍යයෙන් එම සංගමයට බැඳෙන ලෙස ඉල්ලා සිටියේය. ලෝක සාමය තහවුරු කිරීමේ අරමුණ ඇතිව සෝවියට් රාජ්‍යය ජාතීන්ගේ සංගමයට එකතු විය. එහෙත් සාම පෙරමුණක් ගොඩනැගීමට සෝවියට් සංගමය ගත් උත්සාහය බටහිර ප්‍රතිගාමී කොටස්වල විරුද්ධත්වය නිසා අසාර්ථක විය. ජාතීන්ගේ සංගමය 1946 අප්‍රෙල් දක්වා පැවතිණ.

18 රු. සෝ. ෆෙ. ස. සමූහාණ්ඩුව හා ලිත්වි‍යාව අතර සාම ගිවිසුම අත්සන් කරන ලද්දේ 1920 ජූලි 20 දින මොස්කව්හිදීය. රු. සෝ. ෆෙ. ස. සමූහාණ්ඩුව හා ලත්වියාව අතර සාම ගිවිසුම අත්සන් කරන ලද්දේ 1920 අගෝස්තු 11 දින රීගා හිදීය.

19 රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවේ දේශපාලන බියුරෝ සභාව (පොලිට්බියුරෝ) හා සංවිධාන බියුරෝ සභාව (ඕර්ග්බියුරෝ), පක්ෂයේ අටවැනි සම්මේලනයේදී පත්වූ මධ්‍යම කාරක සභාව විසින් එහි පළමුවැනි පූර්ණ රැස්වීමේදී, ස්ථිරව ක්‍රියාත්මකවන ආයතන ලෙස, 1919 මාර්තු 25 දින පිහිටුවන ලදී. එය පිහිටුවන ලද්දේ පක්ෂයේ අටවැනි සම්මේලනයේදී සම්මත කර ගත් සංවිධානය පිළිබඳ ප්‍රශ්න ගැන වූ යෝජනාවට අනුකූලවය.

20 මෙහි සඳහන් වන්නේ රු. කො. (බො) ප. සම්මේලනයට පෙර රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවේ ඉස්වෙස්තියා හි 1920 මාර්තුවලදී ප්‍රසිද්ධ කරන ලද මධ්‍යම කාරක සභාවේ හා එහි අංශවල වාර්තා ගැනය.

21 1918 ජනවාරි මාසයේදී පින්ලන්තයේ විප්ලවය සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කම්කරුවන් අතට බලය හිමි විය. පින්ලන්තයේ සමාජවාදී කම්කරු සමූහාණ්ඩුව බිහි විය.

එහෙත් නිර්ධන පංතික විප්ලවය ජයග්‍රහණය කළේ දකුණු පින්ලන්තයේ පමණකි. රටේ උතුරු ප්‍රදේශයේ ඒකරාශී වූ ප්‍රතිවිප්ලවවාදී බලවේග ජර්මන් කෙයිසර් යුද හමුදවේ ආධාර ඉල්ලා සිටියේය.

දරුණු සිවිල් යුද්ධයකට පසු පිංලන්ත විප්ලවය වර්ධනය කරන ලදී. රට තුළ ත්‍රස්තය පැන නැංගේය. විප්ලවවාදී කම්කරුවන් හා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගොවීන් දහස් ගණනක් මරා දමන ලද අතර බොහෝ දෙනෙකු සිරගෙවල දමා වද බන්දන කළහ.

[22] 1919 මාර්තු 21 වැනි දින හංගේරියාව සෝවියට් සමූහාණ්ඩුවක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. හංගේරියානු සමාජවාදී විප්ලවය සංසන්දනීය ලෙස ගත් කල සාමකාමී සවරූපක් ගත්තේය. විප්ලවවාදී ව්‍යාපාරය පාගා දැමීමට සහ බාහිර අසීරුතාවයන්ට මුහුණ පෑමට අසමත් වූ හංගේරියානු ධනපති පංතිය විප්ලවය වර්ධනය වීමට බාධා කිරීමේ අරමුණ ඇතිව දක්ෂිණාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට රාජ්‍ය බලය පැවරීමට තීරණය කළේය. එහෙත් ඒ වන විට හංගේරියානු කොමියුනිස්ට් පක්ෂය මහජනතාව අතර කොතරම් ජනප්‍රියව තිබුනේද යත් හා කොමියුනිස්ට් පක්ෂය සමග සංධානයකට පැමිණීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාන්‍ය සාමාජිකයින්ගේ ඉල්ලීම කොතරම් තීරණාත්මක වූයේද යත්, එක්ව රජයක් පිහිටුවීම සඳහා සිරගතව සිටි කොමියුනිස්ට් පක්ෂයේ නායකයින්ගෙන් ඉල්ලා සිටීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයින්ට සිදුවිය. සෝවියට් ආණ්ඩුවක් පිහිටුවීම, ධනපති පංතිය නිරායුධ කිරීම, රතු හමුදාව හා මහජන මිලීෂියා හමුදාවක් පිහිටුවීම නින්දගම් රජය සතු කිරීම කර්මාන්තය ජනසතු කිරීම සෝවියට් රුසියාව සමග සංධානයකට එළඹීම ආදී කොමියුනිස්ට් පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි වලට එකඟවීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයින්ට සිදුවිය. ඒ අතරම පක්ෂ දෙක එකතු කර හංගේරියානු සමාජවාදී පක්ෂය පිහිටුවීමේ ගිවිසුමකටද අත්සන් කරන ලදී. ප්‍රතිසංස්කරණ වාදී කොටස් වෙන් කිරීමකින් තොරව යාන්ත්‍රික සංකලනයක් මාර්ගයෙන් පක්ෂ දෙක එකතු කිරීම වැනි වැරදි රාශියත් පක්ෂ සමගිය ඇති කිරීමේදී සිදු විය. ඒවා පසුව පක්ෂ වැඩ කටයුතු වලට බල පෑවේය.

බාහිර අධිරාජ්‍යවාදී ආක්‍රමණ හා අභ්‍යන්තර ප්‍රතිවිප්ලවවාදී කටයුතු මගින් 1919 අගෝස්තු 1 දින හංගේරියානු සෝවියට් පාලනය බිඳ දමන ලදී.

[23] 1920 මාර්තු 25 දින පින්ලන්තයේ විදේශ කටයුතු භාර අමාත්‍යාංශය, තාවකාලික මායිම් ලකුණු කරන ලෙස සෝවියට් ආණ්ඩුවට යෝජනා කර සිටියේය. එය සාම සාකච්ඡා කිරීමේ ප්‍රායෝගික ආරම්භයක් විය. 1920 ඔක්තෝබර් 14 වැනි දින සෝවියට්-පින්ලන්ත සාම ගිවිසුම අත්සන් කරන ලදී.

[24] සාකච්ඡා ආරම්භ කිරීමට පෝලන්තය එකඟවීම සෝවියට් සංගමයට

විරුද්ධව එහි යුද්ධ සූදනම වසංකරන ක්‍රියාවක් පමණක් වූයේය. සාකච්ඡා ආරම්භ කරන ලෙස කීපවතාවක්ම (1919 දෙසැම්බර් 22, 1920 ජනවාරි 28 පෙබරවාරි 2 මාර්තු 6) සෝවියට් ආණ්ඩුව යෝජනා කර සිටි නමුත් පෝලන්ත ආණ්ඩුව එකඟත්වය දෙන ලද්දේ 1920 මාර්තු 27 වැනි දය. යුද පෙරමුණට අයත් බරීසව් හි, එහි පමණක් යුද්ධය නතර කර සාකච්ඡා ආරම්භ කරන ලෙස පෝලන්ත ආණ්ඩුව යෝජනා කළේය. යුද්ධය සම්පූර්ණයෙන්ම අත්හිටවා මධ්‍යස්ථ රටක සාකච්ඡා පැවැත්වීමට සෝවියට් ආණ්ඩුව කළ යෝජනාව පෝලන්ත ආණ්ඩුව අන්ත ඉල්ලීම්වාදී ලෙස ප්‍රතික්ෂේප කරමින් පිළිතුරු දුන්නේය. සාකච්ඡා කඩාකප්පල් කළ පෝලන්ත ප්‍රතිගාමී කොටස් සෝවියට් ආණ්ඩුවට විරුද්ධව අප්‍රේල් 25 දින යුද්ධ ආරම්භ කළහ.

රතු හමුදාවේ ජයග්‍රහණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, 1920 සරත් සමයේදී සාම ගිවිසුමක් අත්සන් කිරීමට එකඟත්වය පළ කිරීමට පෝලන්ත ආණ්ඩුවට සිදු විය.

[25] කර්නිලව් කැරැල්ල — 1917 අගෝස්තුවේදී ධනපති පංතිය හා ඉඩම් හිමියන් විසින් සංවිධානය කරන ලද කැරැල්ලකි. එය මෙහෙයවන ලද්දේ යුද හමුදාවේ සේනාධිනායක සාර්වාදී ජෙනරල් කර්නිලව් විසිනි. පෙත්‍රොග්‍රාදය අල්ලා ගෙන, බොල්ෂෙවික් පක්ෂය විනාශ කර සෝවියට් සභා විසුරුවා හැර මිලිටරි ආඥාදායකත්වයක් පිහිටුවා රාජාණ්ඩුව පුනරුත්ථාපනය කිරීම ඔවුන්ගේ ඉලක්කය විය. බොල්ෂෙවික්වරුන්ගේ මෙහෙයවීම යටතේ කම්කරුවන් හා ගොවීන් විසින් කැරැල්ල මැඩ පවත්වන ලදී.

ජර්මන් කර්නිලව් වර්ගයේ කැරැලි කුමන්ත්‍රණය — ප්‍රතිගාමී ජර්මන් හමුදාව විසින් මෙහෙයවන ලද මිලිටරි-රාජාණ්ඩුවාදී, ඊනියා "කාප් කුමන්ත්‍රණය." කුමන්ත්‍රණයේ සංවිධායකයින් වූයේ කාප් ඉඩම් හිමියා, ලුදෙන්දෝර්ෆ්, සෙක්ත් හා ලුත්විත්ස් ආදී ජෙනරාල්වරු ය. කුමණ්ත්‍රන කරුවෝ පෙරලියට සූදනම් වූයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවේ ද අනුමැතිය ඇතිවය. ආණ්ඩුවේ කිසිම බාධකයක් නොමැතිව බර්ලින් දක්වා ගිය කුමන්ත්‍රණ කරුවෝ මිලිටරි ආඥාදායකත්වයක් පිහිටවූහ. ජර්මන් කම්කරුවෝ සමස්ත මහා වැඩ වර්ජනයකින් පෙරලියට පිළිතුරු දුන්හ. නිර්ධන පංතියේ බලපෑම නිසා කාප්ගේ ආණ්ඩුව මාර්තු 17 වැනිද බිඳවැටුනු අතර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු නැවතත් බලයට පැමිණියහ.

[26] මෙහි සඳහන් වන්නේ ගෝතා හි පැවති ව්‍යවස්ථා සම්පාදක සම්මේලනයේදී බිහිවූ මධ්‍යස්ථවාදී පක්ෂයක් වන ජර්මනියේ ස්වාධීන සමාජ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ගැනය. මධ්‍යස්ථවාදී වදන්පාඨ වලට මුවාවී සමාජ-ජාත්‍යාන්මාදවාදීන් සමග සම්මුතියක් ගැන දේශනා කළ "ස්වාධීනයෝ" පංති සටනින් ඉවතට තල්ලුවී ගියහ. පක්ෂයේ ප්‍රධාන අරටුව වූයේ රෙයිහ්ස්ටාග් හි කෞට්ස්කිවාදී "ශ්‍රම සහයෝගීතා" සංවිධානය ය.

1920 ඔක්තෝබර් මස හල්ලේ හි පැවති ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සම්මේලනයේදී එය භේද භින්න විය. ඉන් බහුතරය 1920 දෙසැම්බර් මාසයේදී ජර්මන් කොමියුනිස්ට් පක්ෂයට බැඳුනහ. වෙනම පක්ෂයක් පිහිටුවූ ස්වාධීන වාදීන් ගේ දක්ෂිණාංශික කොටස එයට ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය යන පැරණි නාමයම දුන්හ. 1922 දක්වා පක්ෂය පැවතිනි.

27 ලොන්ගේවාදීන් — ප්‍රංශ සමාජවාදී පක්ෂයේ ජාන් ලොන්ගේ ගේ ප්‍රධානත්වයෙන් යුත් අල්පතරයේ ආධාර කරුවෝ. පළමුවැනි ලෝක අධිරාජ්‍යවාදී යුද්ධය (1914–1918) කාලයේදී ලොන්ගේවාදී හු සමාජ-ජාත්‍යාන්මාදවාදීන් හා සම්බන්ධව ගත් කළ සම්මුතිගත වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. විප්ලවවාදී අරගලය ප්‍රතික්ෂේප කළ ඔවුහු අධිරාජ්‍යවාදී යුද්ධයේදී "රට ආරක්ෂා කිරීමේ" ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. 1917 ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ ජයග්‍රහනයෙන් පසු වචනයෙන් නිර්ධන පංතික ආඥාදායකත්වය පැත්ත ගත් නමුත් ව්‍යවහාරයේදී එහි විරුද්ධවාදීන් ලෙස ක්‍රියා කළහ. 1920 දෙසැම්බර් මාසයේදී ලොන්ගේවාදීහු විවෘත ප්‍රතිසංස්කරණවාදීන් සමග පක්ෂයෙන් ඉවත්ව ඊනියා දෙකහමාරේ ජාත්‍යන්තරයට ඇතුළත් වූහ.

28 ස්මෝල්නි — 1918 මාර්තුවලදී මොස්කව්වලට ගෙන ඒමට පෙර සෝවියට් ආණ්ඩුවේ ප්‍රධාන මධ්‍යස්ථානය පිහිටා තිබූ පෙට්‍රොග්‍රාඩයේ විද්‍යා ආයතන ගොඩනැගිල්ල.

29 රුසියානු කොමියුනිස්ට් (බොල්ෂෙවික්) පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ඉස්වෙස්තියා — පාක්ෂික ජීවිතය පිළිබඳ ප්‍රශ්න සාකච්ඡා කළ මධ්‍යම කාරක සභාවේ සන්නිවේදන බුලටිනය. රු. කො. (බො) පක්ෂයේ අටවැනි සම්මේලනයේ තීරණයක් පරිදි ආරම්භ කළ එය 1919 මැයි 28 වැනි දින සිට මොස්කව්හි පළවීමට පටන්ගති. පළමුවැනි කලාප ප්‍රාව්ද පත්‍රයේ සතිපතා අතිරේකයක් ලෙස පළ වූ නමුත් 1920 ඔක්තෝබර් සිට එය වෙනම පුවත් පතක් ලෙස පිට විය.

30 ලෙනින් මෙහි අදහස් කරන්නේ, රු. කො. (බො) ප. මොස්කව් කාරක සභාවේ ක්‍රියාරම්භකත්වයෙන් 1920 අප්‍රේල් 20 දින පළකරන ලද එක් දින කොමියුනිස්ට් සුබොත්නික් (කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන ව්‍යාපාරය) නැමැති පුවත් පත ගැනය. එම පුවත්පත, මොස්කව් පුවත් පත් ප්‍රකාශක ආයතන වන ප්‍රාව්ද, ඉස්වෙස්තිය එව්සික්, බෙද්නතා, එකොනමීව්ස්කයා ෂිස්න්, කොමුනිස්තිචෙස්කි ත්‍රුද් හා ටෙලිෆෝන් ආයතනයක් වන රොස්ත විසින් අප්‍රේල් 10 දින සුබොත්නික් ව්‍යාපාරයේදී පිළියෙළ කරන ලදී. රු. කො. (බො) ප. මොස්කව් කාරක සභාවේ එම ක්‍රියාරම්භකත්වයට, මුද්‍රණ කරුවන්ගේ පළමුවැනි සුබෝත්නික් ව්‍යාපාරයට මහත් උනන්දුවෙන් සහභාගි වූ සියළුම මුද්‍රණ කරුවෝ සහයෝගය දුන්හ. මධ්‍යම විධායක කාරක සභාවේ (එව්සික්) මුද්‍රණාලයේ මුද්‍රණ කරුවන් විසින් එම පුවත් පත මුද්‍රණය කරන ලදුව අප්‍රේල් 11 දින බෙද හරින ලදී.

31 වාමාංශික කොමියුනිස්ට් වාදය ළදරු වලිප්පුවකි නැමැති පොත ලෙනින් විසින් ලියන ලද්දේ කොමියුනිස්ට්වාදී ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයට කලිනි.

ලෙනින් පොත ලිවීම 1920 අප්‍රේල්වලදී (අප්‍රේල් 27 වැනි දින වනවිට අත් පිටපත සූදානම්ව තිබිණ) අවසාන කළේය. පොතට අතිරේක කොටස් එකතු කරන ලද්දේ මැයි 12 දින ශෝද්‍ය පත්‍ර කියවන අවස්ථාවේදිය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනයට පෙර පොත පළවීම අවශ්‍යව තිබූ නිසා ලෙනින් අකුරු ඇමිණීම හා මුද්‍රණය කිරීම ගැන පෞද්ගලිකවම පරීක්ෂාවෙන් සිටියේය. 1920 ජුනි 12 දින පොත මුද්‍රණයෙන් පිටවූ අතර, ජූලි මාසයේදී එක්වරම එය ඉංග්‍රිසි හා ප්‍රංශ භාෂාවලින් සෝවියට් රුසියාවෙහි පළ විය. කොමින්ටෙර්නයේ දෙවැනි සම්මේලනයට සහභාගි වූ සියළු දෙනාටම පොත බෙද දෙන ලදී. වාමාංශික කොමියුනිස්ට් වාදය ළදරු වලිප්පුවකි නැමති පොතෙහි එන වැදගත් කොන්දේසි හා යෝජනා සම්මේලනය ගත් තීරණවලට බොහෝසෙයින්ම අත්තිවාරම් විය.

32 Weltrevolution (ලෝක විප්ලවය) පොත ලියන ලද්දේ ඔත්තෝ බෞවර් විසිනි.

33 ඉස්ක්‍රා (පැරණි ඉස්ක්‍රා) ලෙනින් විසින් 1900 දී ආරම්භ කරන ලද පළමුවැනි නීතිවිරෝධී සමස්ත රුසියානු මාක්ස්වාදී පත්‍රයයි. මෙම පත්‍රය රුසියාවේ කම්කරු පංතියේ විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයක් පිහිටුවීමේදී තීරණාත්මක කර්තව්‍යයක් ඉටු කළේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

1903 ජූලි — අගෝස්තු මාසවලදී පැවති පක්ෂයේ දෙවැනි සම්මේලනයට පසු මෙන්ෂෙවික්වරු ප්ලෙහානව්ගේ ආධාරයද ඇතිව ඉස්ක්‍රා පත්‍රය තම අතට ගත්හ. පත්‍රයේ පනස් දෙවැනි කලාපයේ සිට විප්ලවවාදී මාක්ස්වාදයේ පත්‍රයක් ලෙස එයට තිබූ ස්ථානයද අහිමි විය.

34 මෙහි සඳහන් වන්නේ රු. ස. ප්‍ර. ක. පක්ෂය තුළ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙහි දක්ෂිණාංශික, අවස්ථාවාදී පිළ නියෝජනය කළ මෙන්ෂෙවික් වරුන් හා සමාජවාදී-විප්ලවවාදී (එස්එර්) පක්ෂය ගැනය. පළමුවැනි සටහන බලන්න.

35 මෙහි අදහස් වන්නේ 1912 අප්‍රේල් 4 දින සයිබීරියාවේ ලේනා රත්රන් ආකරවල නිරායුධ කම්කරුවන් වෙඩිතබා මරාදැමීම ය. ලේනා හි සිදුවූ මෙම ප්‍රචන්ඩ ක්‍රියාව පිළිබඳ ආරංචිය ලැබීමෙන් පසු රුසියානු කම්කරු පංතිය කැළඹීමට පත් විය. පෙළපාලි, රැස්වීම් හා වැඩවර්ජන රට පුරාම පැතිර ගියේය.

36 <u>රාජ්‍ය දූමා සභාව</u> — 1905 විප්ලවවාදී සිද්ධීන්වල ප්‍රතිඵලයක් වශයෙන් සාර්වාදී ආණ්ඩුවට කැඳවීමට සිදුවූ නියෝජිත මන්ත්‍රීමණ්ඩලය. නාමික වශයෙන් රාජ්‍ය දූමා සභාව ව්‍යවස්ථා සම්පාදක සභාවක් විය. එහෙත් ව්‍යවහාරික වශයෙන් එයට කිසිම බලයක් නොතිබිණ. රාජ්‍ය දූමා සභාවට තෝරා පත්කිරීම වක්‍ර, අසමානාත්මක හා පොදු ජන නොවන ඡන්ද විමසීමකින් සිදුවිය. වැඩකරන ජනතාවගේද එසේම රුසියාවේ ජීවත් වූ රුසියානු නොවන ජනතාවගේද ඡන්ද බලය කප්පාදු කරන ලදී. කම්කරුවන්ගේ හා ගොවීන්ගේ වැඩි කොටසකට සම්පූර්ණයෙන්ම ඡන්ද බලය අහිමි විය. පළමුවැනි (1906 අප්‍රේල් — ජූලි) හා දෙවැනි (1907 පෙබරවාරි — ජූනි) රාජ්‍ය දූමා සභා සාර්වාදී ආණ්ඩුව විසින් විසුරුවා හරින ලදී. 1907 ජූනි 3 දින රාජ්‍ය පෙරලියක් කළ ආණ්ඩුව, ගොවියන්ගේ, කම්කරුවන්ගේ හා නගරබද සුළු ධනපති පංතියේ ඡන්ද බලය තව තවත් කප්පාදු කරමින්ද, තුන්වැනි (1907–1912) හා හතරවැනි (1912–1917) රාජ්‍ය දූමා සභාවල සම්පූර්ණ බලතල ඉඩම් හිමියන්ට සහ මහා ධන කුවේරයන්ට ලැබීම සහතික වන අන්දමේද, නව මැතිවරන නීතියක් ප්‍රකාශ කළේය.

37 මෙහි සඳහන් වන්නේ හතරවැනි රාජ්‍ය දූමා සභාවේ සිටි ඒ. ඊ. බදයෙව්, එම්. කේ. මුරානොව්, ජී. අයි. පෙත්‍රොව්ස්කි, එෆ්. එන්. සමොයිලොව් හා එන්. පී. ෂාගොව් යන බොල්ෂෙවික්වරුන් ගැනය. 1914 ජූලි 26 (අගෝස්තු 8) දින පැවති සැසිවාරයේදී, බොල්ෂෙවික් කණ්ඩායම, රුසියාව අධිරාජ්‍යවාදී යුද්ධයට සහභාගිවීම ගැන තම තීරණාත්මක විරුද්ධතාවය ප්‍රකාශ කළේය. එය යුද්ධ නය සඳහා ඡන්දය දීමෙන් වැලකී සිටි අතර පොදු ජනතාව අතර විප්ලවවාදී ප්‍රචාර ගෙන ගියේය. 1914 නොවැම්බර් මස බොල්ෂෙවික් නියෝජිතවරු හිරභාරයට ගන්නා ලද අතර 1915 පෙබරවාරියේදී අධිකරණයක් ඉදිරියට පමුණුවා තුරුහාන් ප්‍රදේශයට (නැගෙනහිර සයිබීරියාව) ජීවිතාන්තය දක්වා පිටුවහල් කරන ලදී. සාර්ගේ ඒකාධිපති පාලනය හෙළිදරව් කරමින් උසාවියේදී බොල්ෂෙවික් කණ්ඩායම කළ කථා, අධිරාජ්‍ය විරෝධී ප්‍රචාරයේදී ද වැඩකරන ජනතාවගේ පංති විඥානය විප්ලවවාදී ලෙස වැඩි දියුණු කිරීමේදී ද විශාල කර්තව්‍යයක් ඉටු කළේය.

38 <u>බ්‍රිතාන්‍ය ස්වාධීන කම්කරු පක්ෂය</u> Independent Labour Party — 1893 දී ''නව වෘත්තීය සංගම්වල'' නායකයින් විසින් පිහිටුවන ලද ප්‍රතිසංස්කරණවාදී සංවිධානය. පක්ෂයේ නායකයින් වූයේ කේ. හාර්ඩි හා පී. මැක්ඩොනල්ඩ් ය. ස්. ක. පක්ෂය පාර්ලිමේන්තු ආකාරයේ අරගලවලට හා ලිබරල් පක්ෂය සමග පාර්ලිමේන්තුව තුළ ගෙන යන සම්බන්ධතාවය සඳහා ප්‍රධාන ස්ථානයක් දුන්නේය. ස්වාධීන කම්කරු පක්ෂය ගැන විග්‍රහයක් කළ ලෙනින් එය ''ව්‍යවහාරයේදී සැමදම ධනපති පංතියේ ආධාරකය මත පවතින අවස්ථාවාදී පක්ෂයක්'' යැයි පැවසුවේය.

39 <u>ෆේබියන්වරු</u> — 1884 දී පිහිටුවන ලද බ්‍රිතාන්‍ය ප්‍රතිසංස්කරණවාදී සංවිධානයේ, ෆේබියන් සමාජයේ සාමාජිකයෝ. නූතන පූර්ව තුන්වැනි ශත වර්ෂයේදී රෝමයේ විසූ යුද්ධ සේනාපතියෙකු වූ ෆේබියස් මක්සිමුස් ගේ නමින් එම සමාජය හැඳින්විණ. හැනිබාල් සමග කළ යුද්ධයේදී ඔහුගේ හෙමින් හෙමින් උපක්‍රම හා තීරණාත්මක සටන්වලදී ඉන් ඉවත්ව යෑම නිසා ඔහුට ''කුන් ක්තාතොර්'' (සුනංගුවා) නැමති නාමය පටබඳින ලදී. මෙම සමාජයේ බහුතරය ධනපති බුද්ධිමත්හු — විද්‍යාඥයෝ, ලේඛකයෝ, දේශපාලන නායකයෝ — වූහ. නිර්ධන පංතියේ පංති සටනක හා සමාජවාදී විප්ලවයක ඇති අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කළ ඔවුහු ප්‍රතිසංස්කරනවාදී ක්‍රියා මගින් ක්‍රම ක්‍රමයෙන් සමාජය වෙනස් කරමින් සමාජවාදය වෙත යා හැකි බව කියා සිටියහ. 1900 දී ෆේබියන් සමාජය කම්කරු පක්ෂය සමග එකතු විය.

40 <u>''අමාත්‍යාංශවාදී'' උපක්‍රමය</u> (නොහොත් ''අමාත්‍යාංශවාදී සමාජවාදය'' එයම ''මිලෙරාන්වාදය'') — ධනපති ප්‍රතිගාමී ආණ්ඩුවලට සමාජවාදීන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහභාගීවීමේ අවස්ථාවාදී උපක්‍රමය යි. 1899 දී වල්දෙක්-රූසෝ ධනපති ආණ්ඩුවට ප්‍රංශ සමාජවාදීයෙකු වූ මිලෙරාන් ඇතුළු වීම නිසා මෙම පදය භාවිතා කරන්නට විය.

41 මෙහි අදහස් වන්නේ බොල්ෂෙවික් වරුන්ගේ සහරාවක් වූ ප්‍රොස්විශේනිය හි 1914 අප්‍රේල් මාසයේ පළ වූ ලෙනින්ගේ ජර්මන් කම්කරු ව්‍යාපාරයෙන් පිටපත් කර නොගත යුත්තේ කුමක්ද නැමැති ලිපිය ගැනය. ලෙනින් එම ලිපියෙන්, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ කේ. ලේගින් ඇමෙරිකාවට ගිය අවස්ථාවේදී නිලධාරීන් හා ධනපති පක්ෂ වර්ණනා කර ඇමෙරිකානු කොන්ග්‍රෙස් සභාව අමතමින් කළ ද්‍රෝහී ක්‍රියාව හෙළිදරව් කළේය.

42 මෙහි සඳහන් වන්නේ 1875 මාර්තු 18–28 කාලයේදී එංගල්ස් බේබෙල්ට ලියූ ලිපිය ගැනය.

43 මෙහි සඳහන් වන්නේ ඔත්සොවිස්ට් වරුන් (කැඳවන්නන්) හා අන්ත ඉල්ලීම්කරුවන් ගැනය. 1908 දී ඔවුහු සටන් වැදුනහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1909 දී ඔත්සොවිස්ට් නායක ඒ. බග්දනව් බොල්ෂෙවික් පක්ෂයෙන් නෙරපීමට සිදු විය. විප්ලවවාදී වදන්මාලාවලට මුවා වෙමින්, තුන්වැනි දූමා සභාවෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නියෝජිතයන් ආපසු කැඳවිය යුතුයයි ඉල්ලා සිටි ඔත්සොවිස්ට්වරු, වෘත්තීය සමිති, සමූපකාර සංගම් ආදී නීත්‍යානුකූල සංවිධානවල වැඩ අත්හිටවිය යුතු බව කියා සිටියහ. අන්ත ඉල්ලීම්වාදය ඔත්සොවිස්ට්වාදයේ එක් ආකාරයකි. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නියෝජිතයන් සමග අධිෂ්ඨාන සහගත ලෙස සහ උදර ලෙස වැඩ කිරීමේද ඔවුන් ස්ථිර විප්ලවවාදී පාර්ලිමේන්තු නියෝජිතයින් වශයෙන් පුහුණු කිරීමේද අවශ්‍යතාවය තේරුම් නොගත් අන්ත ඉල්ලීම්වාදියෝ, පක්ෂ මධ්‍යම කාරක සභාවේ තීරණ විවාදයෙන් තොරව පිළිගන්නා ලෙසත් එසේ නොකළහොත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම රාජ්‍ය දූමා සභාවෙන් ආපසු කැඳවන බවටත් තර්ජනය කර එම කණ්ඩායමට දන්වන ලෙස යෝජනා කළහ. 1909 ජූනි මාසයේ බොල්ෂෙවික්වාදී ප්‍රලිතාරි පත්‍ර කර්තෘ මණ්ඩලයේ පැවැති සාකච්ඡා සභාවේදී ගත් තීරණ වල, "රු. ස. ප්‍ර. ක. ප. නිශ්චිත ප්‍රවනතාවයක් වන බොල්ෂෙවික්වාදයට ඔත්සොවිවාදය හා අන්ත ඉල්ලීම්වාදය සමග පොදු වූ කිසිම සම්බන්ධයක් නොමැති" බව සඳහන්ව තිබිණ. "ඔත්සොවිස්ට් වාදීන්ගේ එම විප්ලවවාදී මාක්ස්වාදයෙන් පිට පැණීමට විරුද්ධව තීරණාත්මක ලෙස සටන් කරන" ලෙස ද එය බොල්ෂෙවික් වරුන්ගෙන් ඉල්ලා සිටියහ.

44 රාජ්‍ය දූමා සභාව ව්‍යවස්ථා ගත කිරීමේ හා එයට තෝරා පත් කිරීම පිළිබඳ නීතිය, එනම්, සාර්ගේ ප්‍රකාශනය 1905 අගෝස්තු 6 (19) දින ප්‍රසිද්ධ කරන ලදී. සාර් දූමා සභා නීති කෙටුම්පත පිළියෙල කිරීම ස්වදේශ කටයුතු භාර ඇමති ඒ. ජී. බුලීගින්ට පැවරුවේය. එම නිසා දූමා සභාව ඔහුගේ නමින් හැඳින්වේ. කෙටුම්පත අනුව නීති සම්පාදනය සඳහා දූමා සභාවට කිසිම අයිතිවාසිකමක් නැත. එයට නිදහස දෙන ලද්දේ සාර් යටතේ පැවති සම්මන්ත්‍රන සභාවක් ලෙස සමහර ප්‍රශ්න සාකච්ඡාවට භාජනය කිරීමට පමණකි. බුලීගින් දූමා සභාව වර්ජනය කරන ලෙස බොල්ෂෙවික්වරු කම්කරුවන්ගෙන් හා ගොවීන්ගෙන් ඉල්ලා සිටියහ. බුලීගින් දූමා සභාව වර්ජනය කිරීමේ ප්‍රචාරක කටයුතු, විප්ලවවාදී බලවේගයන් ඒකරාශී කිරීම සඳහාද, පොදු ජන දේශපාලන වැඩ වර්ජන සංවිධානය කිරීම හා අවිගත් නැගිටීම සූදනම් කිරීම සඳහාද බොල්ෂෙවික්වරු ප්‍රයෝජනයට ගත්හ. දූමා සභාවට නියෝජිතයින් පත්කර ගැනීමේ මැතිවරන නොපවත්වන ලදී. එමනිසා එය කැඳවීමට ආණ්ඩුවට නොහැකි විය. විප්ලවවාදී උද්යෝගය හා 1905 සමස්ත රුසියානු ඔක්තෝබර් දේශපාලන වැඩ වර්ජනය නිසා දූමා සභාව විසුරුවා හරින ලදී.

45 මෙහි සඳහන් වන්නේ 1905 පැවති සමස්ත රුසියානු ඔක්තෝබර් දේශපාලන වැඩ වර්ජනය ගැනය. එම වැඩවර්ජනය ගෙනයන ලද්දේ සාර්වාදී ඒකාධිපති පාලනය පෙරලා දැමීම, බුලීගින් දූමා සභාව වර්ජනය කිරීම, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයක් කැඳවීම, ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිහිටුවීම ආදී සටන්පාඨ මුල් කරගෙනය. සමස්ත රුසියානු දේශපාලන වැඩ වර්ජනය කම්කරු ව්‍යාපාරයේ ශක්තිය හා බලයද පෙන්නුම් කළ අතර එය ගමේ, හමුදාවේ හා නෞකා හමුදාවේ විප්ලවවාදී අරගල පැතිරවීම සඳහා ගැම්මක් දෙන ලදී.

46 ලේබර්වරු බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයේ Labour Party සාමාජිකයෝ. මෙම පක්ෂය වෘත්තීය සංගම් සමාජවාදී සංවිධාන හා කණ්ඩායම් විසින් පාර්ලිමේන්තුව තුළ කම්කරුවන් නියෝජනය කිරීමේ (කම්කරු නියෝජිත කාරක සභාව) අරමුණ ඇතිව 1900 දී පිහිටුවන ලද්දකි. 1906 දී කාරක සභාව කම්කරු (ලේබර්) පක්ෂය ලෙස නම මාරු කරන ලදී. ආරම්භයේදී කම්කරු පක්ෂයක් ලෙස පිහිටවූ ලෙයිබර් පක්ෂය, පසුව, එහි සාමාජික කොටස් (ඉදිරියේදී එහි සාමාජිකත්වයට සුළු ධනපතීහු බොහෝ දෙනෙක් ඇතුළු වූහ) අනුව ගත් කල තම දෘෂ්ටිය හා උපක්‍රම අනුව අවස්ථාවාදී සංවිධානයක් බවට පත් විය. පක්ෂය පිහිටවූ මොහොතේ සිටම එහි නායකයෝ ධනපති පංතිය සමග පංති සහයෝ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගිතාවය දක්වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී (1914–1918) ලෙයිබර් පක්ෂයේ නායකයෝ (ඒ. හෙන්ඩර්සන් ආදීහු) සමාජ-ජාත්‍යාන්මාදවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් රාජකීය ආණ්ඩුවට ඇතුළු විය. ඔවුන්ගේ සහයෝගය ඇතිව කම්කරු විරෝධී පනත් ගණනාවක්ම (රටවල් මිලිටරි පාලනයට යටත් කිරීම) ආණ්ඩුව විසින් සම්මත කරන ලදී.

47 කැඩෙට්වරු — මෙසේ හඳුන්වන ලද්දේ ව්‍යවස්ථානුකූල-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයින්ය. එය ලිබරල්-රාජාණ්ඩුවාදී ධනපති පංතියේ ප්‍රධාන පක්ෂය විය. 1905 ඔක්තෝබරයේදී පිහිටුවන ලද මෙම පක්ෂය ධනපති පංතියේ ද ඉඩම් හිමි සෙම්සත්ව නායකයන්ගේද ධනපති බුද්ධිමතුන්ගේද නියෝජිතයින්ගෙන් සමන්විත විය. අනතුරුව කැඩෙට් පක්ෂය අධිරාජ්‍යවාදී ධනපති පංතියේ පක්ෂය බවට පත් විය. කැඩෙට්වරු ප්‍රථම ලෝක යුද්ධයේදී සාර්වාදී ආණ්ඩුවේ කොල්ලකාරී විදේශ ප්‍රතිපත්තියට ආධාර කළහ. 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේදී රාජාණ්ඩුව බේරා ගැනීමට උත්සාහ කළහ. ධනපති තාවකාලික ආණ්ඩුවේ ප්‍රමුඛ තැනක් ගත් ඔවුහු පොදු ජන විරෝධී ප්‍රතිවිප්ලවවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණයෙන් පසුව සෝවියට් රාජ්‍ය බලයේ පරම හතුරන් බවට පත් කැඩෙට්වරු ආයුධ සන්නද්ධ ප්‍රතිවිප්ලවවාදී සටන් සියල්ලටමත්, විදේශ ආක්‍රමණ ව්‍යාපාර සියල්ලටමත් සහභාගි වූහ.

48 ප්‍රතිපත්තිය රකින විරුද්ධ පාර්ශ්වය — අරාජිකවාදී-සින්ඩිකල්වාදී අදහස් දේශනා කළ ජර්මන් "වාමාංශික" කොමියුනිස්ට් කණ්ඩායමක්. 1919 ඔක්තෝබර් මාසයේ හෙයිදෙල්බර්ග් හි පැවති ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී විරුද්ධ පාක්ෂිකයෝ පක්ෂයෙන් නෙරපන ලදී. 1920 අප්‍රේල් වලදී එය ජර්මන් කොමියුනිස්ට් කම්කරු පක්ෂය (ජ. කො. ක. ප.) නමින් නැවත බිහි විය. 1920 නොවැම්බර් මාසයේදී, ජර්මනියේ සියළුම කොමියුනිස්ට් බලවේගයන් ඒකාබද්ධ වීම ලිහිල් කිරීම සඳහාද ජ. කො. ක. ප. හි දියුණුතම නිර්ධන පංතිකයින්ට සහයෝගය දක්වීමක් වශයෙන්ද එය නිරීක්ෂක සාමාජිකයකු මෙන් තාවකාලිකව කොමියුනිස්ට් ජාත්‍යන්තරයට බඳවා ගන්නා ලදී. එහෙත්, බලය ලත් එකම කණ්ඩායම ලෙස කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ විධායක මණ්ඩලය විසින් පිළිගන්නා ලද්දේ ජර්මනියේ ඒකාබද්ධ කොමියුනිස්ට් පක්ෂය ය. ජ. කො. ක. ප. නියෝජිතයින්

කො. ජාත්‍යන්තරයට බඳවා ගන්නා ලද්දේ ජර්මනියේ ඒකාබද්ධ කොමියුනිස්ට් පක්ෂය සමග සංකලනය වීම හා එහි සියළුම කටයුතුවලට සහයෝගය දක්වීම යන කොන්දේසි යටතේය. ජ. කො. ක. ප. නායකයෝ කො. ජාත්‍යන්තරයේ විධායක සභාවේ නියමයන් පිළි නොපැද්දහ. කො. ජාත්‍යන්තරයේ තුන්වැනි සම්මේලනය, තවමත් ජ. කො. ක. ප. සමග සිටි කම්කරුවන් වෙනුවෙන් සටන් කරමින්, එයට මාස 2–3 ක කල්දීමක් කළේය. එම කාලය තුළ එය පක්ෂ සම්මේලනයක් කැඳවා ඒකාබද්ධ වීම පිළිබඳ ප්‍රශ්නය විසඳිය යුතුව තිබිණ. ජ. කො. ක. ප. නායකයෝ තුන්වැනි සම්මේලනයේ තීරණයන් ක්‍රියාත්මක නොකළ අතර තම කඩාකප්පල්කාරී වැඩ කටයුතු දිගටම කරගෙන ගියහ. කො. ජාත්‍යන්තරයේ විධායක සභාවට ජ. කො. ක. ප. සමග සම්බන්ධකම් අත්හැර දැමීමට සිදුවිය. එය කො. ජාත්‍යන්තරයෙන් නෙරපිණ. පසුව ජ. කො. ක. ප. කම්කරු පංතියේ ආධාරයෙන් තොර ජර්මනියේ කම්කරු පංතියට හතුරු වූ නිකායවාදී කණ්ඩායමක් බවට පත් විය.

49 කොමියුනිස්ට් කම්කරු පත්‍රය Kommunistische Arbeiter-Zeitung — ජර්මනියේ "වාමාංශික" කොමියුනිස්ට්වරුන්ගේ අරාජික-සින්ඩිකල්වාදී කණ්ඩායමේ නිල පත්‍රය. 1919 සිට 1927 දක්වා හැම්බර්ග්හි එම පත්‍රය පළ විය.

ජී. ලවුෆේපන්බර්ග්ගේ සාහිත්‍ය ආරූඪ නාමය වන කාර්ල් එර්ලෙර් නාමය ලෙනින් මෙහි සඳහන් කරයි.

50 මෙහි සඳහන් වන්නේ 1905 දී ලෙනින් විසින් ආරම්භ කරන ලද කම්කරු පංතියේ විමුක්තිය සඳහා අරගල සංගමය ගැනය. අරගල සංගමයට පෙට්‍රොග්‍රෑඩ්වල මාක්ස්වාදී කව විස්සක් ඒකාබද්ධ විය. අරගල සංගමයේ ප්‍රධාන ස්ථානය වී. අයි. ලෙනින්, ඒ. ඒ. වනේයෙව්, පී. කේ. සපරෝෂෙට්ස්, ජී. එම්. ක්‍රිෂිෂනොව්ස්කි, එන්. කේ. කෲප්ස්කයා, එල්. මාර්තව්, එම්. ඒ. සිල්වින්, වී. වී. ස්තර්කොව් ආදීන්ගෙන් සැදුම් ලත් මධ්‍යම මණ්ඩලයක් විසින් දරන ලදී. ලෙනින්ගේ ප්‍රධානත්වයෙන් යුත් සාමාජිකයෝ පස් දෙනෙක් එහි නායකත්වය දැරූහ. සංවිධානය දිස්ත්‍රික්ක කණ්ඩායම් වලට බෙදී තිබිණ. දියුණු කම්කරුවෝ (අයි. වී. බාබුෂ්කින්, වී. ඒ ෂෙල්ගුනොව් ආදී) එම කණ්ඩායම් පැක්ටරි හා කම්හල් සමග සම්බන්ධ කළහ.

ලෙනින් සඳහන් කළ පරිදි, "කම්කරු පංතියේ විමුක්තිය සඳහා අරගල සංගමය" කම්කරු පංතිය මත පිහිටා ඇති හා නිර්ධන පංතියේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පංති අරගලයෙන් නායකත්වය ලබන විප්ලවවාදී පක්ෂයේ කලල රූපයක් විය.

[51] මෙහි අදහස් වන්නේ පක්ෂ විරෝධී "ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යස්ථ වාදීන්ගේ" කණ්ඩායම ගැනය. රු. කො. (බො) ප. නවවැනි සම්මේලනයේදී ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යවාදීහු ආර්ථිකය ගොඩනැගීම පිළිබඳ ප්‍රශ්න ගැන හා සංවිධානාත්මක ප්‍රශ්න ගැන තම වාර්ථා ඉදිරිපත් කළහ. ප්‍රජාතන්ත්‍ර-වාදී මධ්‍යස්ථවාදය පිළිබඳ වදන්වලට මුවාවෙමින් ව්‍යවහාරයේදී එම මූලධර්ම කනපිට පෙරලූ මධ්‍යස්ථවාදියෝ නිෂ්පාදනයේදී ඒක පුද්ගල පාලනයේ අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කළ අතර දැඩි පාක්ෂික හා රාජ්‍ය විනයට විරුද්ධ වූහ, සෝවියට් සභා තුළ හා වෘත්තීය සංගම් තුළ පක්ෂයේ නායක කාර්යභාරයට විරුද්ධ වූහ, කාණ්ඩ වාදයට හා කණ්ඩායම් ගැසීමට නිදහස ඉල්ලා සිටියහ. 1923 දී "ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යස්ථවාදී" කණ්ඩායම බිඳ වැටිණ. එහි නායකයෝ ට්‍රොට්ස්කිගේ විරුද්ධ පිළේ කඳවුරු බැඳ ගත්හ.

[52] තෲදවික්වරු — නරෝද්නික්වාදී අදහස් දරූ ගොවීන්ගෙන් හා බුද්ධිමතු-න්ගෙන් සැදුම් ලත් රාජ්‍ය දූමා සභාවේ සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කණ්ඩායම.

[53] 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු 1919 දක්වා පක්ෂ සාමාජික සංඛ්‍යාව පහත දැක්වෙන ආකාරයට ඉහළ නැංගේය: 1917 රු. ස. ප්‍ර. ක. (බො) ප. සමස්ත රුසියානු හත්වැනි සාකච්ඡා සභාව (අපෙල්හි පැවති) වන විට පක්ෂ සාමාජික සංඛ්‍යාව 80 000; රු. ස. ප්‍ර. ක. (බො) ප. හය වැනි සම්මේලනය (1917 ජූලි — අගෝස්තු) වන විට 240 000 ක් පමණ; රු. කො. (බො) ප. හත්වැනි සම්මේලනය (1919 මාර්තු) වන විට 300 000 නොඅඩුව; රු. කො. (බො) ප. අටවැනි සම්මේලනය (1919 මාර්තු) වන විට සාමාජික සංඛ්‍යාව 313766 කි.

[54] මෙහි සඳහන් වන්නේ පක්ෂයේ සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම පිළිබඳව රු. කො. (බො) ප. අටවැනි සම්මේලනය ගත් තීරණයේ පදනම මත පවත්වන ලද "පක්ෂ සතිය" ගැනය. සැප්තැම්බර් අගදී පක්ෂ මධ්‍යම කාරක සභාව බෙද හැරි චක්‍ර ලේඛනයක් මගින්, පක්ෂ සතිය තුළ දී පක්ෂ සාමාජිකයින් වශයෙන් කම්කරුවන්, කම්කරු කාන්තාවන්, රතු හමුද සොල්දදුවන්, සේලරුවන්, ගොවීන් හා ගෙවිලියන් පමණක් බඳවා ගන්නා ලෙස සියළුම පක්ෂ සංවිධානවලට දන්වන ලදී. පක්ෂ සතිය පැවැත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් රුසියානු සෝවියට් ෆේඩරේෂන් සමාජවාදී සමූහාණ්ඩුවේ යුරෝපීය ගුබේර්නියා 38 ක පමණක් ලක්ෂ දෙකකට අධික සංඛ්‍යාවක් පක්ෂයට බැඳුනහ. ඉන් අඩකට වැඩි ප්‍රමාණයක් කම්කරුවෝය. යුද පෙරමුණුවල යුද හමුදවෙන් හා නාවික හමුදවෙන් සියයට 25 ක් පක්ෂයට බැඳුනහ.

[55] කොමියුනිස්ට් ජාත්‍යන්තරය — කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ විධායක කාරක සභාවේ නිල ප්‍රකාශනය වූ සඟරාවක්. රුසියානු ජර්මන්, ප්‍රංශ, ඉංග්‍රිසි, ස්පාඤ්ඤ හා ඉතලියානු යන භාෂාවලින් මුද්‍රණය විය. 1919 මැයි 1 දින පළමුවැනි කලාපය පිට විය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ වාර්ථා හා න්‍යායාත්මක ලිපි සඟරාවෙහි පළ විය. ලෙනින්ගේ ලිපි ගණනාවක්ද එහි පළ විය.

[56] මෙහි සඳහන් වන්නේ 1858 ඔක්තෝබර් 7 දින එංගල්ස් විසින් කාල් මාක්ස්ට ලියන ලද ලිපිය ගැන).

[57] Folkets Dagblad Politiken (මහජන දේශපාලන දිනපතා පත්‍රය) — ස්වීඩනයේ වාම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ පත්‍රය. 1916 අප්‍රේල් සිට පළමුව දින දෙකට වතාවක්ද අනතුරුව දිනපතාද ස්ටොක්හොල්ම් හි පළ විය (1917 නොවැම්බර් දක්වා Politiken නමින් හැඳින්විණ).

[58] ලෝක කාර්මික කම්කරු සංවිධානය Industrial Workers of the World — ඇමරිකා එක්සත් ජනපදයේ කම්කරුවන්ගේ වෘත්තීය සංවිධානයකි. එය ආරම්භ කරන ලද්දේ 1905 දීය. ප්‍රධාන වශයෙන් විවිධ වෘත්තීන්හි නියුතු නුපුහුණු හා අඩු වැටුප් ලබන කම්කරුවන් මෙයින් ඒකාබද්ධ කැරිණ. එය පිහිටුවීමට ඇමෙරිකානු කම්කරු ව්‍යාපාරයේ නායකයින් වන ඩී. ද ලියොන්, යූ. ඩෙබ්ස්, අයි. හෙයිවුඩ් ආදීහු සහභාගි වූහ. එසේම කැනඩාව, ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍යය, ලතින් ඇමෙරිකාව, දකුණු අප්‍රිකාව යන රටවලද ලෝක කාර්මික කම්කරුවන්ගේ සංවිධාන පිහිටුවන ලදී. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී පෙඩරල් සංගමයේ සහභාගිත්වයෙන් ඇමෙරිකානු කම්කරුවන් මෙහෙයවූ යුද්ධ විරෝධී රැස්වීම් ගණනාවක්ම පවත්වන ලදී. සංවිධානයේ ක්‍රියාකාරිත්වය තුළ අරාජිකවාදී-සින්ඩිකල්වාදී ස්වභාවක් දක්නට ලැබිණ: එය නිර්ධන පංතියේ දේශපාලන අරගල පිළි නොගත්තේය, පක්ෂයේ නායක කාර්යභාරයට, හා නිර්ධන පංතික ආඥදායකත්වයට විරුද්ධ විය, ඇමෙරිකානු ශ්‍රම පෙඩරල් සංගමයට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අයත් වෘත්තීය සංගම් සාමාජිකයින් අතර වැඩ කිරීම ප්‍රතික්ෂේප කළේය. නායකයින්ගේ අවස්ථාවාදී පිළිවෙතෙහි ප්‍රතිඵලයක් වශයෙන් කම්කරු ව්‍යාපාරය කෙරෙහි බලපෑමට ඇති හැකියාව අහිමි වූ ලෝක කාර්මික කම්කරු සංවිධානය නිකායවාදී සංවිධානයක් බවට පත්විය.

59 1918 දෙසැම්බර් මාසයේ පැවති ජර්මන් කොමියුනිස්ට් පක්ෂ සම්මේලනයේදී ජාතික මන්ත්‍රණ සභා මැතිවරණයට සහභාගි වීම පිළිබඳ ප්‍රශ්න සාකච්ඡා කරන ලදී. මැතිවරණයට සහභාගි වීමට පක්ෂව කතා කළ කාර්ල් ලිබ්ක්නෙහ්ත් හා රෝසා ලුක්සෙම්බුර්ග්, විප්ලවවාදී සටන් පාඨ පොදු ජනතාව අතර ජනප්‍රිය කිරීම සඳහා පාර්ලිමේන්තු වේදිකාව ප්‍රයෝජනයට ගැනීමේ ඇති අවශ්‍යතාවය ඔප්පුකර සිටියහ. එහෙත් සම්මේලනයේ බහුතරය මැතිවරනයට සහභාගි වීමට විරුද්ධ වූ අතර නියමිත යෝජනා සම්මත කළහ.

60 වාමාංශික සමාජවාදී-විප්ලවවාදීයෝ (වාමාංශික එස්ආර්වරු) — 1917 නොවැම්බර් 19–28 (දෙසැම්බර් 2–11) පවත්වන ලද තම පළමුවැනි සමස්ත රුසියානු සම්මේලනයේදී සංවිධානාත්මක ලෙස බිහි වූ වාමාංශික එස් ආර්වරුන්ගේ පක්ෂය. ඊට පෙර වාමාංශික එස්ආර් වරු සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ වාමාංශික කණ්ඩායමක් ලෙස ක්‍රියා කළහ. පළමුවැනි ලෝක යුද්ධය ආරම්භයේදී සිටම එම කණ්ඩායම පැවතිණ.

සෝවියට් සභාවල දෙවැනි සමස්ත රුසියානු සම්මේලනයේදී වාමාංශික එස්ආර්වරු එස්ආර් කණ්ඩායමේ බහුතරය වූහ. සම්මේලනයට සහභාගි වීම පිළිබඳ ප්‍රශ්නයේදී ඔවුහු භේද වූහ. දක්ෂිණාංශික එස්ආර් වරු එස්ආර් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ තීරණ පිළිපදිමින් සම්මේලනයෙන් ඉවත්ව ගියහ. වාමාංශික එස්ආර්වරු සම්මේලනයට සහභාගි වූ අතර වැදගත් ප්‍රශ්නවලදී බොල්ෂෙවික්වරුන් සමග ඡන්දය දුන්හ. එම කාලයේදී ගොවීන් අතර තම පාක්ෂිකයින් බහුතරයක් සිටි වාමාංශික එස්ආර් පක්ෂය සමග එකම කඳවුරකට පැමිණීම සුදුසු යැයි කල්පනා කළ බොල්ෂෙවික් වරු සෝවියට් ආණ්ඩුවට ඇතුළු වන ලෙස වාමාංශික එස්ආර්වරුන්ට යෝජනා කළහ. එහෙත් එස්ආර්වරු එම යෝජනාව ප්‍රතික්ෂේප කළහ. 1917 නොවැම්බර්-දෙසැම්බර් මාසවලදී බොල්ෂෙවික්වරු හා වාමාංශික එස්ආර්වරුන් අතර පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් එස්ආර්වරු ආණ්ඩුවට ඇතුළු වීමටඑකඟ වූහ. මහජන කොමිසාර් මණ්ඩලයේ පොදු ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියාකිරීමට වාමාංශික එස්ආර්වරු පොරොන්දු වූහ. ඔවුන්

මහජන කොමිසාර් මණ්ඩලයටද පත් කරන ලදී. බොල්ෂෙවික්වරුන් සමග සහයෝගීතාවයෙන් වැඩකිරීමේ මාර්ගයට පිවිසි නමුත් වාමාංශික එස්ආර්වරු සමාජවාදය ගොඩනැගීමේ මූලික ප්‍රශ්නවලදී වෙනස් මත දරූහ, නිර්ධන පංතියේ ආඥාදායකත්වයට ද විරුද්ධ වූහ. 1918 ජනවාරි-පෙබරවාරි මාසවලදී වාමාංශික එස්ආර් පක්ෂයේ මධ්‍යම කාරක සභාව බ්‍රෙස්ට් සාම ගිවිසුමට විරුද්ධව සටන ආරම්භ කළේය. එය අත්සන් කර 1918 මාර්තු මස සෝවියට් සභාවල හතරවැනි සම්මේලනයේදී සම්මත කළ පසු ඔවුහු මහජන කොමිසාර් මණ්ඩලයෙන් ඉවත් වූහ. සමාජවාදී විප්ලවය ගම්බද පැතිරයාමත් දුප්පතුන්ගේ කාරක සභා සංවිධානය කිරීමත් සමගම වාමාංශික එස්ආර්වරුන් අතර සෝවියට් විරෝධී මනෝභාවය වැඩෙන්නට විය. බ්‍රෙස්ට් සාම ගිවිසුම විනාශ කොට සෝවියට් දේශය හා ජර්මනිය අතර යළිත් යුද්ධයක් ඇවිලවීම සඳහා 1918 ජූලි මාසයේදී වාමාංශික එස්ආර් පක්ෂයේ මධ්‍යම කාරක සභාව මොස්කව්හි ජර්මන් තානාපතිවර මීර්බාහ් මරා දැමීම සංවිධාන කළේය. එමෙන්ම සෝවියට් රජයට විරුද්ධව අවිගත් කැරැල්ලක් සංවිධාන කළේය. එම කැරැල්ල මැඩපැවැත්වීමෙන් පසුව සෝවියට් සභාවල පස්වැනි සමස්ත රුසියානු සම්මේලනයේදී එම පක්ෂ නායකත්වයේ ආපද්පන්න ක්‍රියාකලාපය පිළිගත් සාමාජිකයින් සෝවියට් සභාවලින් නෙරපීමට තීරණය විය. මහජන ආධාර නැතිවී ගියෙන් වාමාංශික එස්ආර්වරු සෝවියට් රජයට විරුද්ධව අවිගත් සටනක් ආරම්භ කළහ. බොල්ෂෙවික්වරුන් සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට සූදනම් වූ සමාජවාදී විප්ලවවාදීහු "මහජන-කොමියුනිස්ට්" හා "විප්ලවවාදී-කොමියුනිස්ට්" නමින් පක්ෂ පිහිටුවා ගත්හ. පසුව එම පක්ෂවල සාමාජිකයින්ගෙන් බහුතරය කොමියුනිස්ට් පක්ෂයට බැඳුනහ.

61 සෝවියට් I — 1 Soviet — 1918 සිට 1922 දක්වා නෙයාපල් හි මුද්‍රණය වූ ඉතලියානු සමාජවාදී පක්ෂයේ පුවත් පතකි. 1920 සිට ඉතලියානු සමාජවාදී පක්ෂයේ කොමියුනිස්ට් කණ්ඩායමේ නිල පත්‍රය ලෙස පළ විය.

62 Comunismo — 1919 සිට 1922 දක්වා මිලාන්හි දෙසතියකට වරක් පළවූ ඉතලියානු සමාජවාදී පක්ෂයේ සඟරාවකි. මෙහි ප්‍රධාන කර්තෘ ලෙස කටයුතු කළේ ඕ. සෙරාති ය.

63 ඉතලියානු සමාජවාදී පක්ෂය පිහිටුවන ලද්දේ 1892 දීය. පක්ෂය ආරම්භ කළ මොහොතේ පටන්ම පක්ෂ අභ්‍යන්තරයෙහි අවස්ථාවාදී හා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විප්ලවවාදී යන ප්‍රවනතාවයන් දෙක අතර තියුණු දෘෂ්ටිමය අරගලයක් පැවතිණ. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ඉතාලියානු සමාජවාදී පක්ෂයේ සාමාජිකයින් අතර වාමාංශික පිළ ශක්තිමත් විය. 1919 ඔක්තෝබර් 5–8 දිනවල බලොනියා හි පැවති පක්ෂයේ දහසයවැනි සම්මේලනයේ දී පක්ෂය තුන්වැනි ජාත්‍යන්තරයට සහභාගි වීමට තීරණය කළේය. ඉ. ස. ප. නියෝජිතයෝ කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනයටද සහභාගි වූහ. නියෝජිත මණ්ඩලයේ නායක, මධ්‍යස්ථවාදී අදහස් දරූ ඩී. එම්. සෙරාති සාකච්ඡා සම්මේලනයට පසු ප්‍රතිසංස්කරණවාදීන්ගෙන් ඉවත්වීමට විරුද්ධව නැගී සිටියේය. 1921 ජනවාරි වල ලිවොර්නො හි පැවති පක්ෂයේ දහහත්වැනි සම්මේලනයේදී බහුතර සංඛ්‍යාවක් සිටි මධ්‍යස්ථවාදීහු ප්‍රතිසංස්කරණවාදීන්ගෙන් ඉවත්වීම හා කො. ජාත්‍යන්තරයට බඳවා ගැනීමේ කොන්දේසි සම්පූර්ණයෙන්ම පිළිගැනීමද ප්‍රතික්ෂේප කළහ. 1921 ජනවාරි 21 වැනි දින සම්මේලනයෙන් ඉවත් වූ වාමාංශික නියෝජිතවරු ඉතාලියානු කොමියුනිස්ට් පක්ෂය පිහිටවූහ.

64 බ්ලාන්කිවාදය — ප්‍රමුඛ විප්ලවවාදියෙක් සහ ප්‍රංශ මනෝරාජික කොමියුනිස්ට්වාදයේ නියෝජිතයෙක් වූ ලුවී ඔගියුස්ට් බ්ලාන්කිගේ (1805–1881) නායකත්වයෙන් යුතු වූ ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ එක් උපනතියකි. විප්ලවවාදී පක්ෂයක ක්‍රියාකාරිත්වය වෙනුවට රහස් කුමන්ත්‍රණ කාරයින් කුඩා පිරිසක් කරන කැරැල්ලක් ආදේශ කළ බ්ලාන්කිවරු කැරැල්ලක ජයග්‍රහණය සඳහා අවශ්‍ය කොන්දේසි ගැන නොසලකා හැරියහ. පොදු ජනතාව සමග සම්බන්ධය ඉවත ලූහ.

බ්ලාන්කිවරු පංති සටන ප්‍රතික්ෂේප කළහ, "කුලී වහල්භාවයෙන් මානව සංහතිය නිදහස් කිරීම, පංති සටනක මාර්ගයෙන් නොව බුද්ධිමතුන් අල්පතරයක කුමන්ත්‍රණයක් මාර්ගයෙන් කළ හැකියයි" කල්පනා කළහ."

65 Der Volksstaat (ජනතා රජය) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (එයිසනාහ්වරුන්ගේ පක්ෂයේ) මධ්‍යම පත්‍රය. එය වී. ලිබ්ක්නෙහ්ත්ගේ සංස්කරණය යටතේ 1868–1876 අවුරුදුවලදී පළ විය. කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් ද පත්‍රයේ සේවය කළහ.

66 ඇමෙරිකාවේ වාසය කරන ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් "න්‍යායය" සලකන්නේ "පොතේගුරුවාදයක් ලෙස විනා ක්‍රියාකාරී වැඩ සඳහා උපදේශ මාලාවක් ලෙස නොවන" බව සඳහන් කර ඔවුන්ගේ වැඩකටයුතුවල නිකායවාදී ස්වරූපය විවේචනය කරමින් එංගල්ස් එෆ්. ඒ සොර්ගෙට ලියූ 1886 නොවැම්බර් 29 දරන ලිපිය ගැනය මෙහි සඳහන් වන්නේ.

67 ඇමෙරිකානු අර්ථ ශාස්ත්‍රඥ ජී. එච්. කේරිගේ "ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිට ලියන දේශපාලන-ආර්ථික ලිපි" නැමැති පොත සඳහා විචාරක ලිපියක් ලියූ එන්. ජී. චෙර්නිෂෙව්ස්කි, "ඓතිහාසික මාර්ගය යනු නෙව්ස්කි මාවතේ පදික වේදිකාව නොවේ; එය සම්පූර්ණයෙන්ම, දූවිලිවලින්, මඩ ගොහුරු වලින්, දිය කඩිතිවලින්, දුරුමාර්ග වලින් වැසුනු ක්ෂේත්‍රයක් තුළින් ගමන් කරයි, දූවිලි කෑමට පාවහන් අපිරිසිදු කර ගැනීමට බියවන්නෙක් නම් සමාජ කටයුතුවලට අත නොතබන්න" යයි ලීවේය.

68 මෙහි අදහස් වන්නේ ට්සිමර්වොල්ඩ්හි හා කීන්තාල්හි පැවති අන්තර්ජාතික සමාජවාදී සාකච්ඡා සභාවය.

ට්සිමර්වොල්ඩ් නැතහොත් පළමුවැනි අන්තර්ජාතික සාකච්ඡා සභාව 1915 සැප්තැම්බර් 5–8 දිනවල පැවැත්විණ.

කීන්තාල් නැතහොත් දෙවැනි අන්තර් ජාතික සමාජවාදී සාකච්ඡා සභාව 1916 අප්‍රේල් 24-30 දිනවල කීන්තාල් නැමති ස්ථානයේ පවත්වන ලදී.

බටහිර යුරෝපීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ වාමංශික කොටස් දෘෂ්ටිමය පදනමක් මත සමගි කිරීමට ට්සිමර්වොල්ඩ් හා කීන්තාල් සාකච්ඡා සභා උපකාරී විය.

69 විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂය සංවිධානාත්මක ලෙස පිහිටුවන ලද්දේ 1918 සැප්තැම්බර් 25–30 දිනවල මොස්කව්හි පැවති වොලිය තෘද පත්‍රය වටා සිටි කණ්ඩායමේ සම්මේලනයේදීය. "බොල්ෂෙවික්වරුන් සමග වංචාවෙන් තොරව හා සත්‍ය ලෙසම සහයෝගීතාවයෙන් කටයුතු කරන" බව සම්මේලනයේ වාර්තාවල සඳහන්ව තිබිණ. වි. කො. ප. මධ්‍යම කාරක සභාවට ඒ. අලෙක්සාන්ද්‍රව්, එම්. දබ්රහෝතව්, ඒ. කලෙගායෙව් හා වෙනත් අයද ඇතුලත් වූහ. 1920 වන තුරු කුඩා කණ්ඩායමක් ලෙස මෙම පක්ෂය පැවතිණ. 1920 සැප්තැම්බර් මස පැවති එම පක්ෂයේ හයවැනි සම්මේලනය පක්ෂය රු. කො. (බො.) පක්ෂයට ඇතුලත් කිරීමට තීරණය කළේය. 1920 ඔක්තෝබර් මාසයේදී රු. කො. (බො.) පක්ෂයේ මධ්‍යම කාරක සභාව විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂයේ හිටපු සාමාජිකයින් රු. කො. (බො.) පක්ෂයට බඳවා ගැනීමට පක්ෂ සංවිධානවලට අවසර දුන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

70 බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය (British Socialist Party — B. S. P.) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වෙනත් සමාජවාදී කණ්ඩායම් හා සම්බන්ධවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1911 මැන්චෙස්ටර්හිදී පිහිටුවන ලදී. "බ්‍රි. ස. පක්ෂය මාක්ස්වාදී දෘෂ්ටියට එකඟව ප්‍රචාරක කටයුතු ගෙන ගිය අතර එය අවස්ථාවාදී පක්ෂයක්ද නොවිය" යි ලෙනින් සඳහන් කළේය.

බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය පිළිගත්තේය. විදේශීය ආක්‍රමණිකයින්ගෙන් සෝවියට් රුසියාව ආරක්ෂා කිරීම සඳහා බ්‍රිතාන්‍ය වැඩකරන ජනතාව ගෙනගිය සටනේදී බ්‍රි. ස. ප. ඉටුකළ කර්තව්‍යයද අති විශාලය.1919 දී පක්ෂ සංවිධානයේ බහුතරය (සියයට 98 ක් පමණ) කොමියුනිස්ට් ජාත්‍යන්තරයට සහභාගි වීමට පක්ෂව ඉදිරිපත් වූහ. බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමේදී බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය, ඒකාබද්ධ කොමියුනිස්ට් කණ්ඩායම සමග ප්‍රධාන කාර්ය කොටසක් ඉටු කළේය. 1920 පැවති පළමුවැනි ඒකාබද්ධ සම්මේලනයේදී බ්‍රි. ස. ප. ප්‍රාදේශීය සංවිධානවල අති බහුතරය කොමියුනිස්ට් පක්ෂයට බැඳුනහ.

71 සමාජවාදී කම්කරු පක්ෂය (Socialist Labour Party) — 1903 දී ස්කොට්ලන්තයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පෙඩරල් සංගමයෙන් හා වාමාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කැඩී ගිය කොටස විසින් පිහිටුවන ලද විප්ලවවාදී මාක්ස්වාදී සංවිධානය. මෙහි සාමාජික සංඛ්‍යාවෙන් වැඩි කොටස ස්කොට්ලන්ත ජාතිකයෝ වූහ.

දකුණු වේල්ස් සමාජවාදී සමාජය (South Wales Socialist Society) — වේල්ස්හි විප්ලවවාදී පතල්කරුවන්ගෙන් සැදි කුඩා කණ්ඩායමක්. පතල් කටයුතු වල ප්‍රතිසංස්කරන සඳහා ව්‍යාපාරය, මෙම ව්‍යාපාරය තම ආරම්භය ලෙස ගත්හ. එම ව්‍යාපාරයේ දියුණුව පළමුවැනි ලෝක යුද්ධ ආරම්භයේදීම දක්නට ලැබිණ.

කම්කරු සමාජවාදී පෙඩරල් සංගමය (Worker's Socialist Federation) — කාන්තාවන්ගේ මැතිවරන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවන ලද සමාජය තුළින් 1918 මැයි මස බිහි වූ එක් සංවිධානයකි. මෙහි සාමාජික සංඛ්‍යාව වැඩි වශයෙන්ම කාන්තාවන් විය.

පාර්ලිමේන්තු මැතිවරනවලට සහභාගි වීම හා ලේබර් පක්ෂයට ඇතුළුවීම තම වැඩ පිළිවෙළට එකතු කළ බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමේදී (1920 ජූලි 31 — අගෝස්තු 1 දිනවල ව්‍යවස්ථා සම්පාදක සම්මේලනය පැවතිණ) නිකායවාදී වැරදි කළ ඉහත සඳහන් පක්ෂ කොමියුනිස්ට් පක්ෂයට එකතු නොවිය. "කොමියුනිස්ට් පක්ෂය (තුන්වැනි ජාත්‍යන්තරයේ බ්‍රිතාන්‍ය අංශය)" නමින් හැඳින්වුණු දකුණු වේල්ස් සමාජවාදී සමාජය හා කම්කරු සමාජවාදී පෙඩරල් සංගමය මහා බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයට එකතු විය. සමාජවාදී කම්කරු පක්ෂයේ නායකයෝ එකතු වීම ප්‍රතික්ෂේප කළහ.

72 කම්කරුවන්ගේ ඩ්‍රෙඩ්නෝට් (Worker's Dreadnought) 1914 මාර්තු සිට 1924 ජූනි දක්වා ලන්ඩන්හි මුද්‍රණය විය. 1917 ජූලි දක්වා එය පළ වූයේ Woman's Dreadnought නමිනි. 1918 දී කම්කරු සමාජවාදී පෙඩරල් සංගමය පිහිටුවීමෙන් පසු මෙය එහි නිල පත්‍රය බවට පත් විය.

73 Manchester Guardian — බ්‍රිතාන්‍ය ධනපති පත්‍රවලින් වඩාත් පුළුල් ලෙස බෙදා හරින ලද සහ බලගතු ධනපති-ලිබරල්වාදී පත්‍රයකි. මෙය 1821 දී ආරම්භ කරන ලද්දකි.

74 ද්‍රෙයිෆුස් සිද්ධිය — ඔත්තු බැලීම හා රාජ්‍ය ද්‍රෝහිත්වය පිළිබඳ බොරු චෝදනා කොට ප්‍රංශ යුදහමුද මූලස්ථානයේ නිලධාරියෙකු වූ යුදෙව් ජාතික ද්‍රෙයිෆුස්ට විරුද්ධව 1894 දී ප්‍රංශ හමුදවේ ප්‍රතිගාමී-රාජාණ්ඩුවාදී කොටස් විසින් සංවිධානය කරන ලද ප්‍රකෝපකාරී නඩුවිමසීම මෙයින් අදහස් වේ. යුද්ධාධිකරණය විසින් ද්‍රෙයිෆුස්ට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් නියම කරන ලදී. 1899 දී සමාජමය බලපෑම නිසා ඔහුට සමාව දී සිරෙන් නිදහස් කළ අතර අභියාචනා උසාවියෙන් ඔහු වැරැදිවලින් නිදහස් කර නැවත හමුදවට ගනු ලැබුවේ 1906 දීය.

75 රතු ධජය (Die Rote Fahne) — ස්පාටකස් සංගමයේ මධ්‍යම පත්‍රය ලෙස කේ. ලිබ්නෙෂ්ත් සහ ආ. ලුක්සෙම්බුර්ග් විසින් ආරම්භ කරන ලද පුවත්පතය. පසුව එය ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම නිල පත්‍රය බවට පත් විය. 1918 නොවැම්බර් 9 සිට එය බර්ලින් වල පළ විය. ජර්මන් ආණ්ඩුවේ තාඩනවලට සහ තහනම් කිරීම්වලට පත්‍රය කීප වරක්ම ගොදුරු විය. ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ සභාපති ඒ. තෙල්මන් පත්‍රයේ උද්යෝගීමත් ලෙස වැඩ කළ කෙනෙකි.ජර්මනියෙහි පැසිස්ට් ආඥාදායකත්වය පිහිටුවීමෙන් පසු Die Rote Fahne තහනම් කරන ලද නමුත් එය නීතිවිරෝධී ලෙස පළ විය. 1935 දී පත්‍රය ප්‍රාග්වලද, 1936 ඔක්තෝබර් සිට 1939 සරත් සමය දක්වා බ්‍රසල්ස් (බෙල්ජියම) හිද පළ විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

[76] Die Freiheit (නිදහස) — 1918 නොවැම්බර් සිට 1922 ඔක්තෝබර් දක්වා ජර්මනියේ පළ වූ, ජර්මන් ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ දිනපතා නිල පත්‍රය.

[77] Die Rote Fahne (රතු ධජය) — ඔස්ත්‍රියානු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම නිල පත්‍රය. 1918 නොවැම්බර් සිට වියානාහි පළ විය. ප්‍රථමයෙන් එය Der Weckruf (සටන් පාඨය) නමින්ද, 1919 ජනවාරි සිට Die Soziale Revolution (සමාජ විප්ලවය) නමින්ද 1919 ජූලි සිට Die Rote Fahne නමින්ද පළවිය. 1933 දී Die Rote Fahne පත්‍රයට නීතිවිරෝධී තත්ත්වයට පත්වීමට සිදුවිය. 1945 අගෝස්තු සිට එය Österreichische Volksstimme (ඔස්ත්‍රියානු ජන හඬ) නමින් පළ විය. 1957 පෙබරවාරි 21 සිට එය Volksstimme නමින් හැඳින්වේ.

[78] සෝවියට් අද්වකාත්වරු — 1918 පෙබරවාරිවලදී කම්කරු, ගොවි, සොල්දදු, කොසැක් හමුද නියෝජිතයන්ගේ සෝවියට් සභා යටතේ පිහිටුවන ලද නීති ආරක්ෂක මණ්ඩලය. මෙහි බොහෝ තැන්වල ධනපති අධිනිතිඥයින්ගේ බලපෑම දක්නට ලැබිණ. ඔවුහු සෝවියට් අධිකරණ නීති කනපිට පෙරළූ අතර තම තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් වැරැදි කළහ. 1920 ඔක්තෝබර් වලදී එම මණ්ඩලය විසුරුවා හරින ලදී.

[79] මෙම උපදේශය පදනම් කර ගනිමින් වී. අයි. ලෙනින්ගේ සම්පූර්ණ කෘති 5 වැනි මුද්‍රණයෙහිද මෙම සිංහල මුද්‍රණයෙහි "වාමාංශික කොමියුනිස්ට් වාදය ළදරු වලිප්පුවකි" යන ලිපියෙහිද "ඕලන්ද ට්‍රබියුනිස්ට් වරු" යන යෙදුම වෙනුවට "ඕලන්ද කොමියුනිස්ට් පක්ෂයේ සමහර සාමාජිකයෝ" යන වචන යොදා ඇත.

නාමාවලිය

අද්ලර් (Adler) ප්‍රිද්‍රිහ් (1879–1960) — ඔස්ත්‍රියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයා ය. 1918 ඔස්ත්‍රියානු විප්ලවයට පසු ප්‍රතිවිප්ලවවාදීන්ගේ කඳවුරට මාරු විය. මධ්‍යස්ථවාදී දෙක හමාරේ ජාත්‍යන්තරය සංවිධානය කිරීමටද සහභාගි වූ ඔහු අනතුරුව ඊනියා සමාජවාදී කම්කර ජාත්‍යන්තරයේ නායකයකු බවට පත්විය.

අක්සල්රොද්, පාවෙල් බරීසවිච් (1850–1928) — මෙන්ෂෙවික්වාදයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාදනවාදී වාග් පාඨවලට මුවාවී, ඇත්ත වශයෙන්ම සමාජ-ජාතොය්න්මාදවාදී පිළිවෙතක් අනුගමනය කළේය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් ඉක්බිතිව පෙත්‍රොග්‍රාද් විධායක කාරක සභාවේ සාමාජිකයෙකු බවට පත්වී ධනපති තාවකාලික රජයට සහයෝගය දක්වූ ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සතුරු ආකල්පයක් දක්වූයේය. පසුව විදේශගත වූ ඔහු සෝවියට් රුසියාවට විරුද්ධව ආයුධ සන්නද්ධ කටයුතු ගෙන ගියේය.

අවුස්තෙර්ලිත්ස් Austerlitz ප්‍රිද්‍රිහ් (1862-1931) — ඔස්ත්‍රියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ එක් නායකයෙකු වූ මොහු එම පක්ෂයේ මධ්‍යම පත්‍රය වූ Arbeiter-Zeitung (කම්කරු පත්‍රය) හි ප්‍රධාන කර්තෘ ධුරයද ඉසිලුවේය. වියනා නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී සමාජ-ජාතොය්න්මාදවාදියෙකු බවට පත් විය.

ඇස්ක්විත් (Asquith) හර්බට් හෙන්රි (1852-1928) — බ්‍රිතාන්‍ය දේශපාලන හා රාජ්‍ය සේවකයෙකි. ලිබරල් පක්ෂයේ නායකයා ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කීප වරක්ම ඔහු රජයේ ඇමැති ධුර දරූ අතර 1908 සිට 1916 දක්වා රාජ්‍ය නායක ධුරය දැරුවේය. ඔහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ධනපති පංතියේ අදහස් හා ඔවුන්ගේ රටවල් ඈඳා ගැනීමේ ප්‍රතිපත්තිය නියෝජනය කළේය

ඉන්ක්පින් (Inkpin) ඇල්බට් (1884-1944) — බ්‍රිතාන්‍ය කම්කරු ව්‍යාපාරයේ නායකයෙකි. 1904 අවුරුද්දේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පෙඩරේෂනයට බැඳුනේය. 1913 දී බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම් තනතුරට තේරී පත් විය. සමාජ-ජාත්‍යෝන්මාදවාදී ජී. හයින්ඩ්මන්ට විරුද්ධව වැඩ කළේය. බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ 1920 ප්‍රාරම්භකයින්ගෙන් කෙනෙකි. 1920 සිට 1929 දක්වා බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ලෙස වැඩ කළේය.

එයර් (Eire) ලින්කන් — ඇමෙරිකානු ධනපති පුවත්පතක් වන The world පත්‍රයේ වාර්තා කරුවෙකි.

එර්ලෙර්, කේ — ලවුෆේපන්බෙර්ග්, හෙන්රික් බලන්න

කොල්චාක්, අලෙක්සාන්දර් වසීලියවිච් (1873-1920) — සාර්ගේ නාවුක හමුදාවේ ඇඩ්මිරල් වරයෙකු වූ මොහු රාජාණ්ඩුවාදියෙකි. එන්ටෙන්ට් මිත්‍ර ගිවිසුමේ රූකඩ නියෝජිතයාය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් ඉක්බිතිව, ඇමෙරිකානු, බ්‍රිතාන්‍ය හා ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ගේ ආධාරය ඇතිව තමා රුසියාවේ උත්තරීතර පාලකයා බවට ඔටුනු පළඳවා දමා ගත් අතර උරාල්වල, සයිබීරියාවේ හා ඈත පෙරදිග මිලිටරි රදළ -ධනපති ආඥාදායකත්වයට නායකත්වය දුන්නේය. රතු හමුදාවේ පහරදීම හා විප්ලවවාදී-ගරිල්ලා ව්‍යාපාරයේ වර්ධනය නිසා කොල්චාක් හමුදාව විනාශ විය. සිරභාරයට ගත් කොල්චාක් පසුව වෙඩි තබා මරා දමන ලදී.

කර්නිලව්, ලවර් ගෙයෝර්ගියෙවිච් (1870-1918) — සාර් හමුදාවේ රාජාණ්ඩුවාදී ජෙනරල් වරයෙකි. 1917 ජූලි-අගෝස්තුවලදී රුසියානු යුද හමුදාවේ උත්තරීතර අනදෙන නිලධාරී තනතුර දැරුවේය. අගෝස්තු මාසයේදී ප්‍රතිවිප්ලවවාදී කැරැල්ල මෙහෙයවූයේය. කැරැල්ල මැඩ පැවැත්වීමෙන් පසු ඔහු සිරභාරයට ගත් නමුත් ඉන් දොන් ප්‍රදේශයට පැන ගොස් ධවල හමුදාවේ ''ස්වේච්ඡා සේනාංකයේ'' සංවිධායකයෙක් හා පසුව එහි අනදෙන නිලධාරියා බවට පත් විය. පසුව යෙකතිරිනදර් අසල සටනකදී මැරුම් කෑවේය.

කාමිනෙව් (රොසෙන්පෙල්ද්)*, ලියෙව් බරිසවිච් (1883–1936) — 1901 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. 1917 පෙබරවාරි විප්ලවයෙන් අනතුරුව සමාජවාදී විප්ලවය පිළිබඳ ලෙනින්වාදී පිළිවෙතට විරුද්ධ විය. 1917 ඔක්තෝබර් මාසයේදී, තමා හා සිනෝවියෙව්ද වෙනුවෙන්, ආයුධ සන්නද්ධ නැගිටීමකට මධ්‍යම කාරක සභාව සම්මත කළ යෝජනාවකට විරුද්ධ අර්ධ මෙන්ෂෙවික් පත්‍රයක් වූ නෝවය ෂිස්න් හි ප්‍රකාශනයක් ප්‍රසිද්ධ කළේය. මෙය පක්ෂයේ රහස් හෙළිකිරීමක් හා විප්ලවය පාවාදීමක්ද විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු පක්ෂ හා සෝවියට් පාලන කටයුතුවල නියලුනේය. කිහිප වතාවක්ම පක්ෂයේ ලෙනින්වාදී පිළිවෙතට විරුද්ධ විය. පසුව පක්ෂ විරෝධී වැඩ කටයුතු නිසා පක්ෂයෙන් නෙරපන ලදී.

කාප් (Kapp) වොල්ප්ගංග් (1858–1922) — ජර්මන් යුන්කර්වරුන්ගේ හා අධිරාජ්‍යවාදී යුධකාමීන්ගේ නියෝජිතයෙකි. 1917 ප්‍රතිගාමී ''දේශීය පක්ෂය'' ගොඩනැගූ අයගෙන් කෙනෙකි. 1920 දී ප්‍රතිවිප්ලවවාදී මිලිටරි-රාජාණ්ඩුවාදී රාජ්‍ය පෙරළියට නායකත්වය දුන්නේය.

කෙරෙන්ස්කි, අලෙක්සාන්දර් පියෝද්රවිච් (1881-1970) — එස්ආර් වරයෙකි. 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු අධිකරණ ඇමති තනතුරද, යුද හා නෞකා ඇමති තනතුරද පසුව ධනපති තාවකාලික ආණ්ඩුවේ අගමැති තනතුර හා උත්තරීතර අනදෙන නිලධාරී තනතුරද ඉසිලුවේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව සටන් මෙහෙයවූයේය. 1918 දී විදේශයට පැනගියේය.

ක්‍රිස්පින් (Crispien) අර්තුර් (1875-1946) ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ එක් නායකයෙකි. 1917-1920 අවුරුදුවලදී ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ දක්ෂිනාංශයට නායකත්වය දුන්නේය. 1920 දී කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනයට සහභාගි විය. සම්මේලනයෙන් පසු ජර්මනියට පැමිණි ඔහු කොමියුනිස්ට් ජාත්‍යන්තරයට සම්බන්ධ වීමට විරුද්ධව නැගී සිටියේය. 1922 දී ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට බැඳුනේය.

---

* සත්‍ය නාමය වරහන් තුළ දැක්වේ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෞට්ස්කි (Kautsky) කාර්ල් (1854–1938) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ නායකයෙකි. ඔහු පළමුව මාක්ස්වාදියෙකු වුවද පසුව මාක්ස්වාදයේ ද්‍රෝහියෙකු බවට පත්විය. අවස්ථාවාදයේ ඉතාම භයානක හා හානිදායක වර්ගය වන මධ්‍යස්ථවාදයේ (කෞට්ස්කිවාදයේ) න්‍යායවාදියා ය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු නිර්ධන පංතික විප්ලවයට හා කම්කරු පංතියේ ආඥාදායකත්වයට විරුද්ධවද බොල්ෂෙවික් පක්ෂයට හා සෝවියට් රජයට විරුද්ධවද ඉදිරිපත් විය.

ක්ලයින්ස් (Clynes), ජෝන් රොබට් (1869–1949) — බ්‍රිතාන්‍ය දේශපාලනඥයෙකි, බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී සමාජ-ජාතෝන්මාදවාදී පිළිවෙතක් අනුගමනය කළේය. මැක්ඩොනල්ඩ්ගේ කම්කරු ආණ්ඩුවල රාජ්‍ය මුද්‍රා භාර සාමි හා ස්වදේශ කටයුතු භාර ඇමති ධුර ඉසිලූ ඔහු කම්කරු විරෝධී පිළිවෙතක් ක්‍රියාවේ යෙදවූයේය.

ක්ලෙමන්සෝ (Clemenceau), ජෝර්ජ් බෙන්ජමෙන් (1841-1929) — ප්‍රංශ දේශපාලනඥයෙක් හා රාජ්‍ය සේවකයෙකි. 1906-1909 හා 1917-1920 අවුරුදුවලදී ප්‍රංශයේ ආණ්ඩු නායකයා විය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ජාතෝන්මාදවාදී ලෙස ක්‍රියා කළේය. සෝවියට් රුසියාවට විරුද්ධව කළ සන්නද්ධ ආක්‍රමණයට හා වැටලීමට දිරිදුන් එහි එක් සංවිධායකයෙකි

ගැලකර් (Gallacher) විලියම් (1881-1965) — බ්‍රිතාන්‍ය කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේද එක් නායකයෙකි. ඔහු වාම නිකායවාදී වැරදි කළේය. ධනපති පාර්ලිමේන්තුවට කොමියුනිස්ට්වාදීන් සහභාගී වීමටද ඔවුන් කම්කරු (ලේබර්) පක්ෂයට ඇතුල් වීමටද විරුද්ධව නැගී සිටියේය. විවේචනවල බලපෑම නිසා ඉක්මනින්ම ඔහු තම වැරදි නිවැරදි කර ගත්තේය. 1921 දී බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයට බැඳුනු අතර කීප වතාවක් පක්ෂයේ මධ්‍යම කාරක සභාවටද මධ්‍යම කාරක සභාවේ දේශපාලන බල මණ්ඩලයටද තේරී පත්විය.

ගුසෙව්, සෙර්ගෙයි ඉවානවිච් (ද්‍රබ්කින් වයි. ඩී.) (1874–1933) — වෘත්තීය විප්ලවවාදියෙකි, බොල්ෂෙවික් වරයෙකි. 1918-1920 කාලයේදී රතු හමුදාවේ දේශපාලන කටයුතු කළේය. පක්ෂ ඉතිහාසය, හමුදා හා ආර්ථික ප්‍රශ්න පිළිබඳ පොත් ගණනාවක්ම ඔහු විසින් ලියන ලදී.

ගේද් (Guesde), ජුල් (1845–1922) — ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ එක් සංවිධායකයෙක් හා නායකයෙකි. මාක්ස්වාදී දෘෂ්ටිය පැතිරවීමට හා සමාජවාදී ව්‍යාපාරය ප්‍රංශයෙහි වර්ධනය කිරීමට ගේද්ගෙන් ඉටුවූ සේවය අති මහත් ය. එහෙත් දක්ෂිණාංශික සමාජවාදීන්ගේ ප්‍රතිපත්තිවලට විරුද්ධව කථා කිරීමේදී ගේද් න්‍යායාත්මක මෙන්ම උපක්‍රම පිළිබඳ ප්‍රශ්නවලදී නිකායවාදී ස්වරූපයේ වැරදි කළේය. පළමුවැනි ලෝක යුද්ධය ආරම්භයේදී සමාජ-ජාතෝන්මාදවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ ගේද් ප්‍රංශයේ ධනපති ආණ්ඩුවට ඇතුළු විය. 1920 දී කොමියුනිස්ට් ජාත්‍යන්තරයට ඇතුළු වීමට තීරණය කළ, ප්‍රංශ සමාජවාදී පක්ෂයේ තූර්ස් සාකච්ඡා සම්මේලනයේ බහුතරයට සම්බන්ධ වීමට ගේද් ප්‍රතික්ෂේප කළේය.

ගොම්පර්ස් (Gompers), සැමුවෙල් (1850-1924) — ඇමෙරිකානු වෘත්තීය සමිති ව්‍යාපාරයේ යෙදුණේය. ඇමෙරිකානු කම්කරු පෙඩරේෂනයේ නායකයෙකි. ධනපති පංතිය සමග සහයෝගීතාව දැක්වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ හෙතෙම කම්කරු පංතියේ විප්ලවවාදී අරගලයට විරුද්ධව නැගී සිටියේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට හා සෝවියට් රජයට සතුරු ආකල්පයක් දැක්වූයේය.

චර්චිල් (Churchill), වින්ස්ටන් (1874–1965) — බ්‍රිතාන්‍යයේ කොන්සර්වේටිව් දේශපාලනඥයෙකි. 1918–1921 අවුරුදුවලදී යුද්ධ කටයුතු පිළිබඳ ඇමතිවරයා ලෙස සෝවියට් රුසියාවට විරුද්ධව සන්නද්ධ ආක්‍රමණ සංවිධානය කිරීම දිරිගැන්වීය.

ජුඕ (Jouhoux), ලියොන් (1879–1954) — ප්‍රංශ හා ජාත්‍යන්තර වෘත්තීය සංගම් ව්‍යාපාරයේ ප්‍රතිසංස්කරණවාදී නායකයෙකි. ඇම්ස්ටර්ඩෑම්හි පැවති වෘත්තීය සංගම් ජාත්‍යන්තරයේ දක්ෂිණාංශික නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේ ජාතෝන්මාදවාදී ප්‍රතිපත්තියක් ගෙන ගියේය.

චෙර්නොව්, වික්තර් මිහායිලවිච් (1876–1952) — සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ එක් නායකයෙක් හා න්‍යායාචාර්ය වරයෙකි. 1917 මැයි-අගෝස්තු කාලයේදී ධනපති තාවකාලික ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමති

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ධූරය දරුවේය. නින්දගම් අල්ලාගත් ගොවීන්ට විරුද්ධව දඬි පිළිවෙතක් අනුගමනය කළේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව කැරැලි සංවිධානය කිරීමට සහය දුන්නේය. 1920 දී රටින් පැන ගොස් විදේශ ගත විය.

චෙර්නිෂෙව්ස්කි, නිකලායි ගව්රීලවිච් (1828–1889) — රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදියෙක් හා විද්‍යාඥයෙක්, ලේඛකයෙක් හා සාහිත්‍ය විචාරයෙකි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සම්භාවණීය ප්‍රාරම්භකයින්ගෙන් කෙනෙක්.

තුරාටි (Turati), ෆිලිපො (1857–1932) — ඉතලියානු කම්කරු ව්‍යාපාරයේ නායකයෙකි. ඉතාලියානු සමාජවාදී පක්ෂය ආරම්භ කළ අයගෙන් කෙනෙකි. එහි දක්ෂිණාංශික ප්‍රතිසංස්කරණවාදී පිළේ නායකයාය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේ මධ්‍යස්ථවාදියෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සතුරු ආකල්පයක් දැක්වීය. ඉතලියානු සමාජවාදී පක්ෂය භේදවීමෙන් පසු (1922) ප්‍රතිසංස්කරණවාදී යුනිටැරියන් සමාජවාදී පක්ෂයට නායකත්වය දුන්නේය.

ත්‍රෙවෙස් (Treves), ක්ලාව්දියෝ (1868–1933) — ඉතාලියානු සමාජවාදී පක්ෂයේ එක් ප්‍රතිසංස්කරණවාදී නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේ මධ්‍යස්ථවාදියෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සතුරු ආකල්පයක් දැක්වූයේය. ඉතලියානු සමාජවාදී පක්ෂය භේදවීමෙන් පසු (1922) ප්‍රතිසංස්කරණවාදී යුනිටැරියන් සමාජවාදී පක්ෂයේ එක් නායකයෙකු බවට පත් විය.

ද ලියොන් (De Leon), දනියෙල් (1852–1914) — ඇමෙරිකා එක්සත් ජනපදයේ කම්කරු ව්‍යාපාරයේ නායකයෙකි. 1890 ගණන්වලදී සමාජවාදී කම්කරු පක්ෂයේ නායකයා හා දෘෂ්ටිවාදියා බවට පත්විය. සාහිත්‍යධරයෙකි. ලෝක කාර්මික කම්කරුවන්ගේ වෘත්තීය සමිති සංගමයේ එක් ප්‍රාරම්භකයෙකි.

දිත්ස්ගෙන් (Dietzgen), යෝසිෆ් (1828–1888) — ස්වෝත්සාහයෙන්ම දයලෙක්තික ද්‍රව්‍යවාදය කරා ළඟාවූ සම්භාවණීය ජර්මන් දර්ශනවාදියෙකි; සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි.

දුගෝනි (Dugoni), එන්රිකො (1874–1945) — ඉතාලියානු සමාජවාදියෙකි. පළමුවැනි ලෝක යුද්ධයට ප්‍රථම තුරාටි-ත්‍රෙවෙස් ප්‍රතිසංස්කරණවාදී කණ්ඩායමට හේත්තු විය. 1920 දී ඉතාලියානු සමාජවාදීන්ගේ කණ්ඩායමක නියෝජිතයෙක් වශයෙන් සෝවියට් රුසියාවට පැමිණි ඔහු ඉතාලියට ආපසු යෑමෙන් පසු රුසියාවේ විප්ලවය පිළිබඳ අසත්‍ය තොරතුරු රැගත් පොතක් ප්‍රසිද්ධ කළේය.

දෙනීකින්, අන්තොන් ඉවානවිච් (1872–1947) — සාර් හමුදවේ ජෙනරාල්වරයෙකි. විදේශීන්ගේ යුද්ධ ආක්‍රමණය හා සිවිල් යුද්ධය කාලයේදී (1918-1920) දකුණු රුසියාවේ ධවල හමුදවේ අනදෙන නිලධාරී ලෙස කටයුතු කළේය. සෝවියට් හමුද විසින් ධවල හමුදව හා විදේශීය ආක්‍රමණිකයින් පරාජය කිරීමෙන් පසු විදේශයට පැන ගියේය.

ද්‍රෙයිෆුස් (Dreyfus), අල්ප්‍රෙඩ් (1859–1935) — රාජ ද්‍රෝහී ක්‍රියා පිළිබඳව බොරු චෝදනා කොට 1894 දී ජීවිතාන්තය දක්වා සිරගෙට නියම කරන ලද ප්‍රංශ හමුද මූලස්ථානයේ නිලධාරියෙකි. කම්කරු පංතිය සහ ප්‍රගතිශීලී බුද්ධිමතුන් ද්‍රෙයිෆුස් ආරක්ෂා කිරීමට ඉදිරිපත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1899 දී ඔහුට සමාව දී 1906 දී නැවත පැරණි තත්ත්වයටම පත් කරන ලදී.

නන්සෙන් (Nancen), ෆ්‍රිතියොෆ් (1861–1930) — සම්භාවණීය නොර්වේජියානු විද්‍යාඥයෙකි. ඔහු ආර්ථික ක්ෂේත්‍රයේ පරීක්ෂණ කටයුතුවල යෙදුණේය. සුප්‍රසිද්ධ සමාජ සේවකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී නන්සෙන් විවිධ රටවල සිටි යුධ හිරකරුවන්ගේ තත්ත්වය උසස් කිරීම සඳහා වැඩ කරගෙන ගියේය. යුද්ධය අවසාන වීමෙන් පසුව ජාතීන්ගේ සංගමයේ යුධ හිරකරුවන් පිළිබඳ උත්තරීතර කොමිසාර් ලෙස කටයුතු කළේය. 1921 රුසියාවේ දුර්භික්ෂය කාලයේදී සාගින්නෙන් පෙළෙන ජනතාවට ආධාර දීමේ ජාත්‍යන්තර කොමිසමක් සංවිධානය කළේය. 1922 දී සාමය පිළිබඳ නොබල් තෑග්ග ඔහුට හිමි විය.

නතන්සොන්, මාර්ක් අන්ද්‍රෙයවිච් (1850-1919) — විප්ලවවාදී නරොද්නික්වරුන්ගේ සභාපති වූ මොහු පසු එස්ඒර්වාදියෙක් බවට පත්විය. 1869 සිට විප්ලවවාදී ව්‍යාපාරයෙහි නිරත විය. 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු වාමාංශික එස්ඒර් පක්ෂය, සංවිධානය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීමට සහභාගි වූ අයගෙන් කෙනෙකි. 1918 සෝවියට් පාලනයට විරුද්ධව වාමාංශික එස්එර්වරු කළ කැරැල්ල හෙලා දැක්කේය.

දෙවැනි නිකොලායි (රොමානොව්) (1868–1918) — රුසියාවේ අවසාන අධිරාජයා. 1894 සිට 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය දක්වා රජකම් කළේය.

නොස්කෙ (Noske), ගුස්තාව් (1868–1946) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ එක් අවස්ථාවාදී නායකයෙකි. 1918 දී ජර්මනියේ නොවැම්බර් විප්ලවය අවස්ථාවේ කීල්හි නාවුක හමුදාවේ විප්ලවවාදී ව්‍යාපාරය පාගා දැමීමට සහභාගී වූයේය. 1919–1920 අවුරුදුවලදී හමුදා කටයුතු භාර ඇමැති ධුරය දැරූ ඔහු බර්ලින් කම්කරුවන් මර්ධනය කිරීම හා කේ. ලීබ්නෙහ්ත් හා රෝසා ලුක්සෙම්බුර්ග් මරා දැමීම සංවිධානය කළේය.

පන්ක්හර්ස්ට් (Pankhurst), සිල්වියා එස්තෙලා (1882–1960) — බ්‍රිතාන්‍ය කම්කරු ව්‍යාපාරයේ කාරකවරියකි. 1917 ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රුසියාවට විරුද්ධව කළ සන්නද්ධ ආක්‍රමණය නතර කරන ලෙස ඉල්ලා නැගී සිටියාය. අන්ත වාමාංශික කම්කරු සමාජවාදී පෙඩරල් සංගමයේ නායක තනතුරු ඉසිලුවාය, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයට සහභාගී වූවාය. 1921 දී කොමියුනිස්ට් පක්ෂයට බැඳුනු නමුත් පක්ෂ විනය පිළිපැදීම ප්‍රතික්ෂේප කළ නිසා පක්ෂයෙන් නෙරපන ලදී.

පනෙකුක් (Panneckoek), අන්තොනි (හොර්නෙර්, කේ.) (1873–1960) — ඕලන්දයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ජාත්‍යන්තරවාදියෙක් ලෙස කටයුතු කළේය. 1918–1921 අවුරුදුවලදී ඕලන්ද කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙකු වූ මොහු කොමියුනිස්ට් ජාත්‍යන්තරයට උද්යෝගයෙන් සහභාගි විය. අන්ත වාමාංශික නිකායවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1921 දී කොමියුනිස්ට් පක්ෂයෙන් ඉවත් වූ පනෙකුක් පසුව දේශපලන ජීවිතයෙන්ද ඉවත් විය.

පූල් (Poole), ඩුවයිට් ක්ලින්ටන් (1885–1952) — ඇමෙරිකානු රාජ්‍යතන්ත්‍රිකයෙකි. 1917 ජූලි සිට මොස්කව්හි සිටි කොන්සුල් වරයාය. 1918 නොවැම්බර් සිට 1919 ජූනි දක්වා "උතුරු ප්‍රදේශයෙහි' ධවල සේනාව යටතේ පැවති "තාවකාලික ආණ්ඩුවේ" බලය ලත් ඇමෙරිකානු තාවකාලික රාජ්‍යතන්ත්‍රිකයා විය. සෝවියට් රුසියාවට විරුද්ධව එන්ටේන්ට් මිත්‍ර රටවල් කළ සන්නද්ධ ආක්‍රමණයේද, රට තුළ වූ ප්‍රතිවිප්ලවවාදී එක් සංවිධායකයෙකි.

පොත්‍රෙසව් අලෙක්සාන්දර් නිකලායවිච් (1868–1934) — මෙන්ෂෙවික්වරුන්ගේ එක් නායකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු විදේශගත වී සෝවියට් රුසියාවට විරුද්ධව සටන් කළේය.

ප්ලෙහානව්, ගියෝර්ගි වලෙන්තීනවිච් (1856–1918) — රුසියානු හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවණීය නායකයෙකි. මාක්ස්වාදය පළමුවෙන්ම රුසියාවේ ප්‍රචාරය කළේය. 1903 දී රු. ස. ප්‍ර. ක. ප. දෙවෙනි සම්මේලනයට පසු අවස්ථාවාදය කෙරෙහි සැනසුම් ප්‍රතිපත්තියක් අනුගමනය කළ ඔහු අවසානයේදී මෙන්ෂෙවිකයින්ගේ කඳවුරට එකතු විය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී සමාජ-ජාතෝන්මාදවාදී පිළිවෙතක් අනුගමනය කළේය.

1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු මෙන්ෂෙවික්-ආරක්ෂකයින්ගේ අන්ත දක්ෂිණාංශයට, "යෙදින්ස්ත්වො" කණ්ඩායමට නායකත්වය දුන්නේය. සමාජවාදය සඳහා රුසියාව තවම සූදනම්ව නැති බව සිතූ ප්ලෙහානව් බොල්ෂෙවික්වරුන්ට විරුද්ධවද සමාජවාදී විප්ලවයට විරුද්ධවද නැගී සිටියේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට ප්‍රතිවිරුද්ධ ආකල්පයක් දැක්වූ නමුත් සෝවියට් රුසියාවට විරුද්ධ සටන්වලට සහභාගි නොවීය.

ෆේපාෂ් (Foch), ෆේපර්දිනන්ද් (1851–1929) — ප්‍රංශ යුධ නිලධාරියෙකි හමුද මාර්ෂල් වරයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ප්‍රංශ හමුද අනදෙන නිලධාරි තනතුර දැරුවේය. පසුව ප්‍රංශයේ හමුද මූලස්ථාන ප්‍රධාන නිලධාරියා වශයෙන් කටයුතු කර එන්ටේන්ට් මිත්‍ර ගිවිසුමට අයත් රටවල හමුද ප්‍රධාන අනදෙන නිලධාරි තනතුරට පත් විය. උත්තරීතර මිත්‍ර යුධ බල මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරමින් 1918-1920 අවුරුදුවලදී සෝවියට් රුසියාවට විරුද්ධව යුද ආක්‍රමණ සංවිධානය කළේය. වර්සයිල්ස් ගිවිසුම සකස් කළ එක් අයෙකි.

බර්න්ෂ්ටයින් (Bernstein), එදුවාර්ද් (1850-1932) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ අන්ත අවස්ථාවාදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අංශයේ නායකයෙකි. ප්‍රතිසංස්කරණවාදයේ හා සංශෝධනවාදයේ න්‍යායාචාර්ය වරයාය. අවස්ථාවාදී න්‍යාය පාඨයක් වන "ව්‍යාපාරය සියල්ලම වවී, ඉලක්කය කිසිවක් නොවවී" යන්න ඉදිරිපත් කළ බර්න්ෂ්ටයින් කම්කරු ව්‍යාපාරයේ ප්‍රධාන තම කර්තව්‍ය වන්නේ ධනපති ක්‍රමය යටතේ කම්කරුවන්ගේ තත්ත්වය උසස් කිරීම කරා යොමු වූ ප්‍රතිසංස්කරණ සඳහා සටන් කිරීම යැයි කියා සිටියේය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී මධ්‍යස්ථවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ ඔහු සමාජ-ජාතෛයාන්මාදවාදය ජාත්‍යන්තරවාදය පිළිබඳ සටන් පාඨවලින් වසන් කළේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයටද විරුද්ධ වැඩ කළේය.

බුලිට් (Bullitt), විලියම් ක්‍රිස්ටියන් (උපත 1891) — ඇමෙරිකානු ප්‍රතිගාමී පත්‍ර කලාවේදියෙක් හා රාජ්‍යතන්ත්‍රිකයෙකි. ඔහු උග්‍ර සෝවියට් විරෝධියෙකි. 1919 දී විශේෂ කටයුත්තක් සඳහා විල්සන් හා ලොයිඩ් ජෝජ් විසින් ඔහු සෝවියට් රුසියාවට එවන ලදී.

බුහාරින්, නිකලායි ඉවානවිච් (1888–1938) — ආර්ථික විද්‍යාඥයෙක් හා සාහිත්‍යධරයෙකි. 1906 සිට රු. ස. ප්‍ර. ක. ප. සාමාජිකත්වය දැරුවේය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට අනතුරුව ප්‍රාව්දා පත්‍රයෙහි කර්තෘවරයෙක් ලෙසද මධ්‍යම කාරක සභාවේ දේශපාලන බල මණ්ඩලයේ හා කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ විධායක කාරක සභාවේ සාමාජික තනතුරුද ඉසිලුවේය. එහෙත් කීපවතාවක්ම පක්ෂයේ ලෙනින්වාදී ප්‍රතිපත්තිවලට විරුද්ධව නැගී සිටියේය: පක්ෂ විරෝධී කණ්ඩායමක් වූ "වාමාංශික කොමියුනිස්ට් වරුන්ට" 1918 දී නායකත්වය දුන්නේය; වෘත්තීය සංගම් පිළිබඳ වාදයේදී ඔහු මධ්‍යස්ථ පිළිවෙතක් අනුගමනය කළ නමුත් පසුව ට්‍රොට්ස්කිවාදී කණ්ඩායමට එකතු විය; 1928 සිට පක්ෂයේ දක්ෂිණාංශික විරුද්ධ පිළට නායකත්වය දුන්නේය. පක්ෂ විරෝධී වැඩ කටයුතු නිසා 1937 දී පක්ෂයෙන් නෙරපන ලදී.

බෙබෙල් (Bebel) අව්ගුස්ත් (1840–1913) — ජර්මන් සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ සම්භාවණීය නායකයෙකි. 1890 ගණන්වල මුලදී හා 1900 ආරම්භයේදී ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකත්වය තුළ වූ ප්‍රතිසංස්කරණවාදයට හා සංශෝධනවාදයට විරුද්ධව නැගී සිටියේය. ඔහු දක්ෂ සංවිධායකයෙක් හා

සාහිත්‍යධරයෙකි. ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ දියුණුව සඳහා කැපව සිටියේය.

බොර්දිග, (Bordiga), අමදේයෝ (උපත 1889) —ඉතාලියානු දේශපාලනඥයෙකි. 1910 සිට ඉතාලියානු සමාජවාදී පක්ෂයේ නායකත්වය දැරුවේය. ඔහු එහි අරාජිකවාදයට නැඹුරු වූ උපනතියට නායකත්වය දුන්නේය. 1919 සිට ධනපති පාර්ලිමේන්තුව වර්ජනය කිරීමේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළේය. 1921 දී ඉතාලියානු කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමට සහභාගි වූ අතර එහි වාමාංශික නිකායවාදී ප්‍රතිපත්තියක් ගෙනගියේය.

බෞවර් (Bauer), ඕත්තෝ (වේබෙර්, හෙන්රිහ්) (1882–1938) — ඕස්ත්‍රියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ එක් නායකයෙකි. මාක්ස්වාදී වදන් පාඨවලට මුවා වී විප්ලවවාදී මාක්ස්වාදය හා නිර්ධන පංති සටන ප්‍රතික්ෂේප කළ ඊනියා "ඕස්ත්‍රො-මාක්ස්වාදය්" න්‍යායාචාර්ය වරයාය.

බ්ලාන්කි (Blanqui), ලුයී ඔගියුස්ත් (1805–1881) — සම්භාවණීය ප්‍රංශ විප්ලවවාදියෙක් වූ මොහු මනෝරාජික කොමියුනිස්ට්වාදයේ ප්‍රධාන පෙළේ නියෝජිතයෙකි. ඔහු රහසිගත විප්ලවවාදී සංගම් කීපයකටම නායකත්වය දුන්නේය. විප්ලවවාදී-කුමන්ත්‍රණ කරුවන්ගේ කුඩා කණ්ඩායමක් මාර්ගයෙන් බලය අල්ලා ගත හැකියයි කල්පනා කළ ඔහු, විප්ලවවාදී අරගල සඳහා මහජනතාව සංවිධානය කිරීමේ ඇති තීරණාත්මක වැදගත්කම තේරුම් නොගත්තේය.

මලිනොව්ස්කි, රොමාන් වත්ස්ලවවිච් (1876–1918), — හතරවැනි රාජ්‍ය දූමා සභාව තුළ මොස්කව් ගුබෙර්නියාවේ කම්කරුවන් නියෝජනය කළ මන්ත්‍රීවරයා ය. ඔහු දූමා සභාවේ බොල්ෂෙවික් කණ්ඩායමට ඇතුලත් විය. ඔහු ප්‍රකෝපකාරයෙකු බව හා සාර් ආරක්ෂක අංශයේ ඒජන්තවරයෙකු බව පසුව හෙළි විය. 1918 දී ඔහුට විරුද්ධව නඩු විභාග කළ සමස්ත රුසියානු මධ්‍යම විධායක කාරක සභාවේ ඉහළ උසාවියේ තීරණය පරිදි මරණීය දණ්ඩනයට පමුණුවන ලදී.

මාර්තව්, එල්. (ට්සේදෙර්බාවුම් යූලි ඕසිපවිච්) (1873–1923) — මෙන්ෂෙවික්වාදයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1917 පෙබරවාරි ධනපති-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු ලෙනින්ග්‍රෑඩ් කම්කරු හා සොල්දදු නියෝජිතයින්ගේ සෝවියට් සභාවල විධායක කාරක සභාවේ සිටියේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව කටයුතු කළේය.

මැක්ඩොනල්ඩ් (MacDonald), ජේම්ස් රැම්සේ (1866–1937) — බ්‍රිතාන්‍ය දේශපාලනඥයෙකි. බ්‍රිතාන්‍ය ස්වාධීන පක්ෂය හා ලෙයිබර් පක්ෂය ආරම්භ කළ එහි එක් නායකයෙකි, ඔහු අවස්ථාවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර පංති සහයෝගීතාවය හා ධනපති ක්‍රමය ක්‍රමයෙන් සමාජවාදී ක්‍රමය කරා පරිවර්තනය කිරීම යන න්‍යායය දේශනා කළේය. සෝවියට් විරෝධී ආක්‍රමණවලට විරුද්ධව නැගී සිටි බ්‍රිතාන්‍ය කම්කරුවන්ට බාධා කිරීමට 1918-1920 අවුරුදුවලදී උත්සාහ කළේය. 1924 දී හා 1929–1931 අවුරුදුවලදී බ්‍රිතාන්‍ය අගමැති ධුරය දැරුවේය.

මිලෙරාන් (Millerand), අලෙක්සාන්දර් එතියෙන් (1859–1943) — ප්‍රංශ දේශපාලනඥයෙකි. 1890 ගණන්වලදී ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ අවස්ථාවාදී උපනතියට නායකත්වය දුන්නේය. 1899 දී ප්‍රංශයේ ප්‍රතිගාමී ධනපති ආණ්ඩුවට ඇතුළු විය. 1904 දී සමාජවාදී පක්ෂයෙන් නෙරපන ලදුව හිටපු සමාජවාදීන් (බ්‍රියාන්, විවියානි) සමග එකතුව ''ස්වාධීන සමාජවාදීන්ගේ'' කණ්ඩායම සංවිධානය කළේය. ඔහු කීප වතාවක්ම විවිධ ඇමැති ධුර ඉසිලූ අතර 1920–1924 අවුරුදුවලදී ප්‍රංශ ජනාධිපති ධුරය දැරුවේය.

මෙර්හෙයම් (Merrheim), අල්ෆොන්ස් (1881-1925) — ප්‍රංශ වෘත්තීය සමිති නායකයෙකි, සින්ඩිකල්වාදියෙකි. ප්‍රංශයේ ශ්‍රමය පිළිබඳ සමස්ත මහා සාකච්ඡා සභාව සංවිධානය කළ එහි නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ප්‍රථමයෙන් ජාත්‍යන්තරවාදියෙකුව සිටි නමුත් පසුව විවෘතවම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. සෝවියට් සංගමයට හතුරු ආකල්පයක් දැක්වූයේය.

මොදිලියානි (Modigliani), විතෝරියා එමනුවැල් (1861-1930) — ඉතලියානු සමාජවාදී පක්ෂයේ ඉතාමත් පැරණි සාමාජිකයින්ගෙන් අයෙකි, ප්‍රතිසංස්කරණවාදියෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී (1914-1918) මධ්‍යස්ථවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය.

ට්සිමර්වොල්ඩ් හා කීන්තාල් සාකච්ඡා සභාවලට සහභාගි වූ ඔහු ට්සිමර්වොල්ඩ්වාමාංශයට විරුද්ධව ඉදිරිපත් විය.

යුදේනිච්, නිකලායි නිකලායෙවිච් (1862-1933) — සාර් හමුදාවේ ජෙනරල්වරයෙක්: ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ප්‍රතිවිප්ලවවාදී ''වයඹ දිග පලාතේ ආණ්ඩුවේ'' සාමාජිකයෙකුව සිටි අතර වයඹදිග පලාතේ ධවල හමුදාවේ ප්‍රධාන අනදෙන නිලධාරියා ලෙස කටයුතු කළේය. එන්ටෙන්ට් මිත්‍ර ගිවිසුමට අයත් අධිරාජ්‍යවාදී රටවල ආධාරය ඔහුට නොඅඩුවම ලැබිණ. 1919 නොවැම්බර් මාසයේදී රතු හමුදාවෙන් පරාජය ලැබ එස්තෝනියාවට පසු බැස පසුව එංගලන්තයට පැන ගියේය.

රාදෙක්, කාර්ල් බෙර්න්ගාර්දවිච් (1885-1939) — ගලීසියේ, පෝලන්තයේ හා ජර්මනියේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට සහභාගි විය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී (1914-1918) ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1917 සිට බොල්ෂෙවික් වාදියෙක් වූ නමුත් පක්ෂයේ ලෙනින්වාදී ප්‍රතිපත්තියට විරුද්ධව කීප වතාවක්ම නැගී සිටියේය. බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කල කාලයේදී ''වාමාංශික කොමියුනිස්ටවාදියෙකි''. 1923 සිට ට්‍රොට්ස්කිවාදී විරුද්ධ පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු විය. පක්ෂ විරෝධී වැඩ කටයුතු නිසා පසුව පක්ෂයෙන් නෙරපන ලදී.

රෙනෙර් (Renner), කාර්ල් (1870–1950) — ඕස්ත්‍රියානු දේශපාලනඥයෙකි, ඕස්ත්‍රියානු දක්ෂිණාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයෙක් හා න්‍යායාචාර්යවරයාය. ඊනියා ''ඕස්ත්‍රොමාක්ස්වාදයේ' එක් දෘෂ්ටිවාදියෙකි.පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී සමාජ-ජාත්‍යොන්මාදවාදී ප්‍රතිපත්තියක් ගෙනගිය මොහු 1919-1920 අවුරුදුවලදී ඕස්ත්‍රියාවේ චාන්සලර් ධුරය දැරුවේය.

රෙනොදෙල් (Renaudel), පියෙර් — ප්‍රංශ සමාජවාදී පක්ෂයේ එක් ප්‍රතිසංස්කරණවාදී නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී (1914–1918) සමාජ-ජාත්‍යොන්මාදවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1914 සිට 1920 දක්වා L'Hamanité (මනුෂ්‍යත්වය) පත්‍රයෙහි කර්තෘ ධුරයද 1924 මන්ත්‍රණ සභාවේ නියෝජිත ධුරයද ඉසිලුවේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රොද්සියන්කො, මිහයිල් ව්ලදීමිරවිච (1859–1924) — මහා නින්දගම් හිමියෙකි. ඔක්තෝබර්වාදී පක්ෂයේ එක් නායකයෙක් වූ මොහු රාජාණ්ඩුවාදියෙක් විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය කාලයේදී ප්‍රතිවිප්ලවවාදී මධ්‍යස්ථානයක් වූ රාජ්‍ය දූමා සභාවේ තාවකාලික කාරක සභාවද පසුව දූමා සභාවේ නියෝජිතයින්ගේ පෞද්ගලික සම්මන්ත්‍රනයද සංවිධානය කළේය. කර්නිලව් කැරැල්ලේ එක් අළුගෝසුවෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු දෙනීකින් වෙත පැන ගිය ඔහු සියළුම ප්‍රතිවිප්ලවවාදී බලවේග සෝවියට් රාජ්‍යයට විරුද්ධව ඒකාබද්ධ කිරීමට උත්සාහ ගත්තේය. පසුව විදේශයට පැන ගියේය.

ලවුෆෙන්බර්ග් (Laufenberg), හෙන්රිහ් (එර්ලර් (Erler), කාර්ල්) (1872–1932) — ජර්මානු වාමාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. 1918 නොවැම්බර් විප්ලවයෙන් අනතුරුව ජර්මන් කොමියුනිස්ට් පක්ෂයට බැඳුනු ඔහු පසුව එහි, අරාජික-සින්ඩිකල්වාදී අදහස් හා ඊනියා "ජාතික බහුතරය" නමින් වූ ධනපති-ජාතිකවාදී වැඩ පිළිවෙළ ඉදිරිපත් කළ 'වාමාංශික" විරුද්ධ පිළට නායකත්වය දුන්නේය. 1919 දී ජර්මන් කොමියුනිස්ට් පක්ෂ භේදය සංවිධානය කිරීමට හා 1920 දී ඊනියා ජර්මන් කම්කරු කොමියුනිස්ට් පක්ෂය බිහි කිරීමට සහභාගි විය. 1920 අවසානයේදී ජර්මන් කම්කරු කොමියුනිස්ට් පක්ෂයෙන් නෙරපන ලදී.

ලාන්ස්බරි (Lansbury), ජෝර්ජ් (1859–1940) — බ්‍රිතාන්‍ය ලෙයිබර් (කම්කරු) පක්ෂයේ එක් නායකයෙකි. ඔහු පර්ලිමේන්තු නියෝජිත-යෙකුවද සිටියේය.

ලීබ්නෙහ්ත් (Liebknecht), කාර්ල් (1871–1919) — ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවණීය නායකයෙකි. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ වාමාංශික අංශයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී විප්ලවවාදී-ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1914 දෙසැම්බර් 2 දින රෙයිහ්ස්ටාග් හිදී යුද්ධ ණය දීම්වලට විරුද්ධව ඡන්දය දුන් එකම නියෝජිතයාය. 1918 නොවැම්බර් මාසයේදී ජර්මනියේ හටගත් විප්ලවයේදී රෝසා ලුක්සම්බුර්ග් සමග එකතුව ජර්මන් කම්කරුවන්ගේ විප්ලවවාදී පෙරමුණු බල ඇණියට නායකත්වය දුන්නේය. ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ එක් මූලාරම්භකයෙකි. 1919 ජනවාරි මාසයේදී සිදුවූ බර්ලින් කම්කරු කැරැල්ලේ නායකයෙක් විය. කැරැල්ල පරාජය වීමෙන් පසු ප්‍රතිවිප්ලවවාදීන් විසින් සාහසික ලෙස මරා දමන ලදී.

ලිත්වීනොව්, මක්සිම් මක්සිමවිච් (1876–1951) — පක්ෂ හා රාජ්‍ය සේවකයෙකි. ප්‍රධාන පෙළේ සෝවියට් රාජ්‍යතන්ත්‍රිකයෙකි. බොල්ෂෙවික්වාදියෙක් වූ මොහු 1898 සිටම රු. ස. ප්‍ර. ක. ප. සාමාජිකයෙකුව සිටියේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු තානාපති සේවයෙහි වැඩ කළේය. 1921–1930 විදේශ කටයුතු භාර නියෝජ්‍ය මහජන කොමිසාර් ධුරය ඉසිලුවේය.

ලුක්සෙම්බුර්ග් (Luxemburg), රෝසා (1871–1919) — ජර්මන් පෝලන්ත හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායිකාවකි. දෙවැනි ජාත්‍යන්තරයේ වාමාංශික පිළේ ද නායිකාවකි. ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ එක් ප්‍රාරම්භ නායිකාවකි, 1918 නොවැම්බර් මාසයේදී ජර්මනියේ හටගත් විප්ලවයේදී ජර්මන් කම්කරුවන්ගේ විප්ලවවාදී පෙරමුණු බල ඇණියට නායකත්වය දුන්නාය. 1919 ජනවාරි මාසයේදී ප්‍රතිවිප්ලවවාදීන් විසින් මෘග ලෙස මරා දමන ලදී.

ලුත්විත්ස් (Lüttwitz), වාල්ටර් (1859–1942) — ජෙනරල්වරයෙකි. ජර්මන් අධිරාජ්‍යවාදී රනකාමියෙකි. 1920 දී, රාජාණ්ඩුව පුනරුත්ථාපනය කිරීමේ හා ජර්මනියෙහි මිලිටරි ආඥාදායකත්වයක් පිහිටුවීමේ අරමුණ ඇතිව ජර්මන් රනකාමීන් විසින් සංවිධානය කරන ලද ප්‍රතිවිප්ලවවාදී කැරැල්ල වූ "කාප් කුමණ්ත්‍රනයේ" එක් නායකයෙකි.

ලේගින් (Legien), කාර්ල් (1861–1920) — ජර්මන් දක්ෂිණාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ මොහු ජර්මනියේ වෘත්තීය සංගම් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී උග්‍ර සමාජ-ජාත්‍යොන්මාදවාදියෙකි. ඔහු නිර්ධන පංතියේ විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව සටන් කළේය.

ලෙදබුර් (Ledebour), ගියොර්ග් (1850–1947) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. ජර්මනියේ මධ්‍යස්ථවාදී ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ එක් නායකයෙකි.

ලෙනින් (උල්‍යානව්), ව්ලදීමිර් ඉල්යිච් (1870–1924)

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලොයිඩ් ජෝර්ජ් (Lloyd George), ඩේවිඩ් (1863–1945) — බ්‍රිතාන්‍ය රාජ්‍ය නායකයෙක් හා රාජ්‍යතන්ත්‍රිකයෙකි. ලිබරල් පක්ෂයේ නායකයාය. 1916–1922 අවුරුදුවලදී අගමැති ධුරය දැරුවේය. රුසියාවේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රුසියාවට විරුද්ධව යුද ආක්‍රමණ සංවිධානය කළ අයගෙන් කෙනෙකි.

ලොංගේ (Longuet), ජාන් (1876–1938) — ප්‍රංශ සමාජවාදී පක්ෂයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධ කාලයේදී ප්‍රංශ සමාජවාදී පක්ෂයේ මධ්‍යස්ථවාදී-සමාදානකාමී අල්පතරයේ නායකත්වය දැරීය. සමාජවාදී පක්ෂය කොමියුනිස්ට් ජාත්‍යන්තරයට සහභාගී වීමට හා ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමට ඔහු විරුද්ධ විය.1921 සිට දෙක හමාරේ ජාත්‍යන්තරයේ විධායක කාරක සභාවේ සාමාජිකයෙකි. 1923 සිට ඊනියා සමාජවාදී කම්කරු ජාත්‍යන්තරයේ නායකත්වය දැරුවේය.

වයින්කොප් (Wynkoop), දවිද් (1877–1941) — ඕලන්ද වාමාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රයෙකි, පසුව කොමියුනිස්ට්වාදියෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ජාත්‍යන්තරවාදියෙකු ලෙස කටයුතු කළේය. ඔහු ට්සිමර්වොල්ඩ් වාමාංශයේ නිල පත්‍රය වූVorb ote හිද සේවය කළේය. කොමියුනිස්ට් පක්ෂයේ නායකයෙකුව සිටියදීම ඔහු අන්ත වාමාංශික නිකායවාදී ප්‍රතිපත්තියක් ගෙන ගියේය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයේදී එහි විධායක කාරක සභාවට තේරී පත් විය.

වලයාන් (Vaillant), එදුවර්ද් මරි (1840–1915) — ප්‍රංශ සමාජවාදියෙකු වූ මොහු දෙවැනි ජාත්‍යන්තරයේද එක් නායකයෙකි. ප්‍රංශ සමාජවාදී පක්ෂය පිහිටවූ අයගෙන් එකෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී සමාජ-ජාතෝන්මාදවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය.

වීගන්ද් (Wigand), කාර්ල් — ඇමෙරිකානු Universal Service සන්නිවේදන ආයතනයේ බර්ලින් වාර්තාකරුවෙකි.

විල්සන් (Wilson), වුඩ්රෝ (1856–1924) — 1913–1921 අවුරුදුවල ඇමෙරිකාවේ ජනාධිපතිවරයා ය. සෝවියට් රුසියාවට විරුද්ධව අධිරාජ්‍යවාදී රාජ්‍යයන් කළ යුද්ධ ආක්‍රමණය සංවිධානය කළ අයගෙන් කෙනෙකි.

වෙන්දෙල් (Wendel), ෆ්‍රිද්‍රිහ් (1886–1960) — වාමාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. 1918 දී ජර්මන් කොමියුනිස්ට් පක්ෂයට බැඳී එහි, ආරාජික සින්ඩිකල්වාදී අදහස් ඉදිරිපත් කළ ''වාමාංශික'' විරුද්ධ අංශයට හේත්තු විය. ජර්මන් කොමියුනිස්ට් පක්ෂයෙන් ''වාමාංශික'' විරුද්ධ අංශය නෙරපීමෙන් පසු ඊනියා ජර්මන් කොමියුනිස්ට් කම්කරු පක්ෂය පිහිටුවීමට සහභාගි විය. 1920 අගදී ජ. කො. ක. පක්ෂයෙන්ද නෙරපන ලදී. අනතුරුව ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට නැවතත් බැඳුනේය.

වොල්ෆ්හෙයිම් (Wolfheim), ෆ්‍රිට්ස් — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ මොහු සාහිත්‍යධරයෙකි. 1918 නොවැම්බර්වල ජර්මනියේ සිදුවූ විප්ලවයට පසු ජර්මන් කොමියුනිස්ට් පක්ෂයට බැඳී හෙන්රිහ් ලවුෆෙන්බර්ග් සමග එකතු වී එහි ආරාජික-සින්ඩිකල්වාදී අදහස් ඉදිරිපත් කළ ''වාමාංශික'' විරුද්ධ අංශයට නායකත්වය දුන්නේය. ජර්මන් කොමියුනිස්ට් පක්ෂයෙන් ''වාමාංශික'' විරුද්ධ අංශය නෙරපීමෙන් පසු ඊනියා ජර්මන් කොමියුනිස්ට් කම්කරු පක්ෂය පිහිටුවීමට සහභාගි විය. 1920 දී ජ. කො. ක. පක්ෂයෙන් නෙරපන ලදී. පසුව කම්කරු ව්‍යාපාරයෙන් ඉවත් විය.

ෂයිදමාන් (Scheidemann), ෆිලිප් (1865–1939) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ උග්‍ර දක්ෂිණාංශික, අවස්ථාවාදී පිළේ නායකයෙකි. 1918 නොවැම්බර් විප්ලවය අවධියේදී, ප්‍රතිවිප්ලවවාදී ධනපති පංතියේ අවශ්‍යතාවයන් ඉදිරිපත් කළ ඊනියා මහජන බලධාරී මණ්ඩලයට ඇතුලත් විය. 1919 පෙබරවාරි ජූනි කාලයේදී වෙයිමර් සමූහාණ්ඩුවේ සභාග ආණ්ඩුවේ නායක ධුරය දැරුවේය. 1918–1921 අවුරුදුවල ජර්මන් කම්කරු ව්‍යාපාරය මෘග ලෙස පාගා දැමීම සංවිධානය කළ අයගෙන් කෙනෙකි.

ෂෙරෝදෙර් (Schröder), කාර්ල් (1884–1950) — ජර්මන් වාමාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. සාහිත්‍යධරයෙක් හා ලේඛකයෙකි. 1918 නොවැම්බර් මස ජර්මනියේ ඇති වූ විප්ලවයට පසු ජර්මන් කොමියුනිස්ට් පක්ෂයට බැඳී එහි ලවුෆෙන්බර්ගේ හා වොල්ෆ්හෙයිම්ගේ ප්‍රධානත්වයෙන් යුත් ''වාමාංශික'' විරුද්ධ අංශයට හේත්තු විය. පසුව අරාජික-සින්ඩිකල්වාදී අදහස් දේශනා කිරීමට පටන් ගත්තේය. 1919 දී ජ. කො. පක්ෂයෙන් ''වාමාංශික'' විරුද්ධ පිළ නෙරපීමෙන් පසු ෂෙරෝදෙර් ඊනියා ජර්මන් කොමියුනිස්ට් කම්කරු පක්ෂය පිහිටුවීමට සහභාගි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විය. කල් නොගොස්ම ජ. කො. ක. පක්ෂයෙන් ඉවත්වී ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ආපසු ඇතුළු විය.

සසූලිච්, වේරා ඉවානව්නා (1849–1919) — නරෝද්නික් ව්‍යාපාරයට මහත් උද්යෝගයෙන් සහභාගි වූවාය. පසුව රුසියාවේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙහි නියලූනාය. "ශ්‍රම විමුක්ති" කණ්ඩායම පිහිටුවීමට හා එහි වැඩ කටයුතුවලටද සහභාගි වූවාය. 1900 දී ඉස්ක්‍රා හා සර්යා පුවත්පත්වල සේවය කළාය. රු. ස. ප්‍ර. ක. පක්ෂයේ දෙවැනි සම්මේලනයට පසු මෙන්ෂෙවික්වාදයේ නායිකාවක බවට පත් වූ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සතුරු ආකල්පයක් දක්වූවාය.

සුබාතව්, සෙර්ගේයි වසීල්යෙවිච් (1864–1917) — පොලිස් කර්නල්-වරයෙකි. "පොලිස් සමාජවාදය" (සුබාතව්වාදය) සංවිධානය කළේද මොහු ය. සුබාතව්, කම්කරුවන් විප්ලවවාදී සටන්වලින් ඉවතට හැරවීමේ අරමුණ ඇතිව 1901–1903 අවුරුදුවලදී කම්කරු සංගම් සංවිධානය කළේය. තම ප්‍රකෝපකාරී වැඩ පිළිවෙළ කඩාකප්පල් වීමෙන් පසු පොලිස් සේවයෙන් ඉවත් වූ හෙතෙම දේශපාලන ජීවිත-යෙන්ද ඉවත් විය.

සෙරෙද, සෙමියොන් පෆ්ජ්නුත්යෙවිච් (1871–1938) — ප්‍රධාන පෙළේ සෝවියට් රාජ්‍ය සේවකයෙකි. 1903 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. 1918–1921 අවුරුදුවලදී කෘෂිකර්මය පිළිබඳ රු. පෙ. සො. සමූහාණ්ඩුවේ මහජන කොමිසාර් ධුරය දැරුවේය. 1921 සිට උත්තරීතර ජනතා ආර්ථික මණ්ඩලයේ සභාපති මණ්ඩලයේ සාමාජික තනතුරද රු. පෙ. සො. ස. මධ්‍යම සංඛ්‍යා ලේඛන ආයතනයේ නියෝජ්‍ය කළමනාකාර තනතුර හා පසුව ප්‍රධාන කළමනාකාර තනතුරද දැරුවේය.

සෙරාටි (Serrati), ජචින්තො මෙනොති (1872–1926) — ඉතාලියානු කම්කරු ව්‍යාපාරයේ ප්‍රධාන පෙළේ නායකයෙකි. ඉතාලියානු සමාජවාදී පක්ෂයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ජාත්‍යන්තරවාදියෙකු ලෙස කටයුතු කළේය. ට්සිමර්වොල්ඩ් හා කීන්තාල් සාකච්ඡා සභාවලට සහභාගි විය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයේදී ඉතාලියානු නියෝජිත කණ්ඩායමේ නායකත්වය දැරුවේය. කොන්දේසි විරහිතව ප්‍රතිසංස්-කරණවාදීන්ගෙන් වෙන්වීමට විරුද්ධ විය. 1924 දී ඉතාලියානු කො-මියුනිස්ට් පක්ෂයට බැඳුනේය.

ස්වෙර්ද්ලොව්, යාකව් මිහායිලවිච් (1885-1919) — කොමියුනිස්ට් පක්ෂයේ හා සෝවියට් රජයේ සම්භාවණීය නායකයෙකි, 1901 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සූදනම් වීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී එයට සහභාගි විය. 1917 නොවැම්බර් සිට සමස්ත රුසියානු මධ්‍යම විධායක කාරක සභාවේ සභාපති වරයා ය.

ස්නෝඩන් (Snowden), ෆිලිප් (1864–1937) — බ්‍රිතාන්‍ය දේශපාලනඥ-යෙකි. බ්‍රිතාන්‍ය ස්වාධීන කම්කරු පක්ෂයේ දක්ෂිණාංශික පිළේ සභාපති වූ හෙතෙම 1903–1906 හා 1917–1920 අවුරුදුවලදී පක්ෂයේ සභාපති ධුරයද දැරුවේය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී මධ්‍යස්ථවාදියෙකි. ඔහු ධනපති පංතිය සමග සභාගයකට කැමැත්තක් දක්වූවේය.

ස්පාටකස් (Spartacus), (ක්‍රි. පූ 71 වැනි වර්ෂයේදී විපතට පත්විය) — ක්‍රි. පූ 74 හෝ 73 වැනි වර්ෂයේදී පුරාණ රෝමයේ හටගත් වහලුන්ගේ කැරැල්ලේ නායකයාය.

ස්තෲවේ, පියෝතර් බෙර්න්ගාර්දවිච් (1870–1944) — ධනපති අර්ථ ශාස්ත්‍රඥයෙක් හා සාහිත්‍යධරයෙකි. කැඩෙට් පක්ෂයේ එක් නායකයෙකි. 1890 ගණන්වලදී බෙර්න්ෂ්ටයින්වාදයේ රුසියානු ආකාරයක් වූ "නීත්‍යානුකූල මාක්ස්වාදයේ ප්‍රධාන පෙළේ නියෝජිතයෙකු විය. රුසියානු අධිරාජ්‍යවාදයේ න්‍යායාචාර්ය වරයෙකි. ඔක්තෝබර් සමා-ජවාදී විප්ලවයට පසු විරාන්ගල් ප්‍රතිවිප්ලවවාදී ආණ්ඩුවට ඇතුළු වී පසුව විදේශ ගත විය.

හයින්ඩමන් (Hyndman), හෙන්රි මයර්ස් (1824–1921) — බ්‍රිතාන්‍ය සමාජවාදියෙක්, ප්‍රතිසංස්කරණවාදියෙකි. බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ එක් නායකයෙකි. පක්ෂයේ සොල්ෆෝර්ඩ් සාකච්ඡා සාභාවේදී, අධිරාජ්‍යවාදී යුද්ධය කෙරෙහි ඔහු දක්වූ සමාජ-ජාත්‍යොන්මාදවාදී ආකල්පය විවේචනයට භාජනය කිරීමෙන් පසු 1916 ඔහු පක්ෂයෙන් ඉවත් විය. ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සතුරු ආකල්පයක් දක්වූවේය.

හිල්ෆර්ඩිංග් (Hilferding), රුදොල්ෆ් (1877–1941) — ජර්මන් සමාජ -ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ එක් අවස්ථා-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වාදී නායකයෙකි. ඊනියා ''ඕස්ත්‍රෝ මාක්ස්වාදයේ'' න්‍යායාචාර්ය වරයෙකි. ''සංවිධානාත්මක ධනවාදයේ,'' එනම් රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයේ කර්තෘ වරයා ලෙස ඉදිරිපත් විය. 1917 සිට ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයා ය.

හෙන්ඩර්සන් (Henderson), ආතර් (1863–1935) — බ්‍රිතාන්‍ය ලෙයිබර් (කම්කරු) පක්ෂයේ හා බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති ව්‍යාපාරයේ එක් නායකයෙකි. 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු අධිරාජ්‍යවාදී යුද්ධය තවදුරටත් කිරීමට උද්ඝෝෂණ ගෙනයෑම සඳහා රුසියාවට පැමිණියේය. 1919 දී බර්න් (දෙවැනි) ජාත්‍යන්තරය සංවිධානය කිරීමට සහභාගි විය. බ්‍රිතාන්‍යයේ ධනපති ආණ්ඩුවලට කීප වතාවක්ම ඇතුලත් විය.

හොග්ලුන්ද් (Hoglund), කාර්ල් ට්සෙත් කොන්ස්තන්තීන් (1884–1956) — ස්වීඩනයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී, එමෙන්ම තරුණ සමාජවාදී ව්‍යාපාරවල නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. ට්සිමර්වොල්ඩ් වාමාංශයට ඇතුළු විය. 1917–1924 අවුරුදුවලදී ස්වීඩන් කොමියුනිස්ට් පක්ෂයේ එක් නායකයෙක් බවට පත් විය.

හොර්නෙර්, කේ. — පනෙකුක්, අන්තොනි බලන්න.

පාඨකයින් වෙතටයි

මෙම පොතේ අනුවාදය, මුද්‍රණය හා සකස්කිරීම පිළිබඳව ඔබගේ අදහස්ද, ඔබගේ වෙනත් කිසියම් යෝජනාවක් වේතොත් එයද දන්වා එවීමෙන් ප්‍රගති ප්‍රකාශක මන්දිරයේ කෘතඥතාවය ඔබට හිමි වේ.

අපේ ලිපිනය:

17 Zubovsky Boulevard,
Progress Publishers,
Moscow, USSR

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 10
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 288
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com